පටුන

මෙම පොතෙහි අඩංගු කරුණු අන්තර්ජාලය තුළ
භාවිතයට පහසු යුනිකෝඩ් අකුරු ක්‍රමයට සකසා
http://pitaka.lk වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත.

# අංගුත්තර නිකාය

# 3

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

# අනුශාසක මණ්ඩලය

පැලියගොඩ විද්‍යාලංකාර පරිවෙණාධිපති ගරු කිරිවත්තුඩුවේ ප්‍රඥාසාර නායක මාහිමියන්වහන්සේ

මාලිගාකන්දේ විද්‍යොදය පිරිවෙනේ B.A., PH.D. උපාධිධාරී පණ්ඩිත ගරු දෙහිගස්පේ ප්‍රඥාසාර නායක ස්ථවිරයන් වහන්සේ

කළුතර පුලිනතලාරාමාධිපති ගරු බේරුවල ශ්‍රීසුමංගල ශ්‍රීනිවාසාභිධාන මහානායක මාහිමියන්වහන්සේ

අම්බලම්ගොඩ මහා විහාරස්ථ විද්‍යාලොක විද්‍යාලයාධිපති ශ්‍රී සද්ධර්මභාරතීශ්වර පණ්ඩිතාචාර්ය විලේගොඩ ශ්‍රී ධර්මානන්ද මහාස්ථවිරපාදයන් වහන්සේ

වැලිතර මහාකප්පිණ මුදලින්දාරාමස්ථ රාජපක්ෂ පරිවෙණාධිපති ගරු රත්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන්වහන්සේ

බළන්ගොඩ ශ්‍රී ධර්මානන්ද පරිවෙණාධිපති ගරු ආනන්ද මෛත්‍රෙය ස්ථවිරයන්වහන්සේ

බෙල්ලන ධර්මපාල පරිවෙණාධිපති පණ්ඩිත බෙල්ලන ඥාණවිමල ස්ථවිරයන්වහන්සේ

රත්දොඹේ මහාචෛතිය පරිවෙණාධිපති ගරු වලගෙදර පණ්ඩිත සොමාලොක නායක ස්ථවිරයන්වහන්සේ

අඹගහපිටියේ සුගත ශාසනොදය පරිවෙණාධිපති අහුංගල්ලේ පණ්ඩිත විමලකිත්ති නායක ස්ථවිරයන් වහන්සේ

අම්බලන්ගොඩ අග්ගාරාමාධිපති අග්ග මහා පණ්ඩිත ගරු පොල්වත්තේ බුද්ධදත්ත මහා ස්ථවිරයන්වහන්සේ

ගාල්ලේ ගල්වඩුගොඩ විද්‍යාරාජ පරිවෙණාධිපති පණ්ඩිත සුමංගල නායක ස්ථවිරයන්වහන්සේ

බම්බලපිටියේ වජිරාරාමවාසී ගරු නාරද මහා ස්ථවිරයන්වහන්සේ

මාදම්පේ සුනන්දොදය පරිවෙණාධිපති ගල්පොත්තාවෙල ශ්‍රී ප්‍රඥානන්ද ප්‍රධාන නායක ස්ථවිරයන්වහන්සේ

මරදානේ ශ්‍රීලංකා විද්‍යාලයාධිපති ගරු බද්දේගම පණ්ඩිත විමලවංශ ස්ථවිරයන්වහන්සේ

පණ්ඩිත එච්. නන්දසාර මහතා

ආචාර්ය්‍ය ආර්‍ය්‍යරත්න පේ‍රේරුකාන මහතා

# අංගුත්තර නිකාය

# 3

ධර්මවිනය උගත් පණ්ඩිත

**මහාස්ථවිරයන් වහන්සේලාගේ**

ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**

**ඒ. පී. ද සොයිසා මහතා**

**විසින්**

**සිංහලට පරිවර්තනය කරන ලදී.**

**සීමාසහිත**
**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පටුන



ප්‍රථම මුද්‍රණය - 1955
දෙවැනි මුද්‍රණය - 2013

**ත්‍රිපිටකය**

**අංගුත්තර නිකාය 3**

© කුමාරි ජයවර්ධන

ISBN 978-955-

පිටුවැසුම සැකසුම :
පාලිත සේනානායක

අක්ෂර සංයෝජනය:
නෙල්කා අබේවික්‍රම

ප්‍රකාශනය:
සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
661,665,675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණය:
චතුර මුද්‍රණාලය
69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

------------

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# ත්‍රිපිටක සිංහල පරිවර්තනය

බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මය මුලින්ම සඳහන් වූයේ මාගධී භාෂාවෙන් හෙවත් පසුකලක ‘පාළි’ නමින් හැඳින්වුණ භාෂාවෙනි. ප්‍රථම ද්විතීය හා තෘතීය ධර්ම සංගායනාවලින් සංගෘහීත වූයේත් ශ්‍රී ලංකාවේදී ග්‍රන්ථාරූඪ වූයේත් මෙම පාළි ත්‍රිපිටකයමය. පසුකාලවලදී එම ත්‍රිපිටකයට අට්ඨකථා හා ටීකා ඉතා වැඩි කොටසක් ලියවුණේ එම පාළි භාෂාවෙන් මය, ශ්‍රී ලංකාවේ දී මය. සිංහල භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමුඛත්වයෙනි. මේ නිසා මූලික ලෙස බුදුදහම හදාළ හැකිව පැවැතුණේ පාළි භාෂාවෙන් මය. සන්න සහ පිටපොත් වශයෙන් සමහර පාළි පොත්වල කොටස් සිංහල භාෂාවට නගා ලියා තිබුණ නමුත් සම්පූර්ණ පරිවර්තනයක් සිදුවී නොතිබිණ. ජාතකට්ඨ කථාව හා විනය පොත්වල කොටස් බොහෝ දුරට සිංහල භාෂාවට පරිවර්තිතව පැවැතිණ. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය පටන්ගැනුනේ මේ තත්ත්වය මතය. වටිනා ඥාණ සම්භාරයක් ඇතුළත්වන සිංහල ජාතිය සන්තකයැයි කිව හැකි බෞද්ධ සාහිත්‍යය සිංහල පාඨකයන්ට කියවා තේරුම් ගත හැකි තත්ත්වයේ වැඩ පිළිවෙළක අවශ්‍යතාව බෙහෙවින් දැනෙන්නට විය.

මේ අවස්ථාවේ නොයෙක් විෂයයන් කෙරෙහි මනස යොමු කළ පඬිවරයෙක් මෙදෙසට යොමු විය. එනම් ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාය. නීතිය, දර්ශනය, විවිධ භාෂා ආදිය ප්‍රගුණ කොට දේශපාලනයට පිවිසි ඒ මහතා දකුණු කොළඹ ආසනයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරුණේය. එක්වරකින්ම එම මග අත්හල එතුමා යොමුවූයේ ධර්ම ශාස්ත්‍රීය කටයුතු වෙතටය. එහි ඵලයක් වූයේ පාළි බෞද්ධ සාහිත්‍යය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමය.

සිංහලයන් සතුව පැවැතුණද ඉතා සුළු පිරිසකට තේරුම් ගත හැකිව තුබූ පාළි ත්‍රිපිටකය හා ඒ සඳහා ලියැවුණ අට්ඨකතා ද ඒවා සඳහා ලියැවුණ ටීකා ග්‍රන්ථද ගත් කල විශාල පොත් සමූහයකි. එම පොත් සමූහය තනිවම සිංහල භාෂාවට නැගීමට කෙනෙකු සිතීම පවා ආශ්චර්යකි. එම අසිරිමත් කාර්යයට සිතත් අතත්

යොමු කළ වීරයා වූයේ ආචාර්ය ඒ. පී. ද සොයිසා ශ්‍රීමතාය. එවකට ශ්‍රී ලංකාවේ ටික දෙනෙකුට ලැබිය හැකිව තුබූ එංගලන්තයට ගොස් පශ්චාත් උපාධියක් ලැබීමට වරම් ලත් එතුමා ශ්‍රී ලංකාවට පැමිණ පිය තැබූ නීති වෘත්තිය මෙන්ම දෙවන වරට යොමු වූ දේශපාලනය ද සිත් නොගත් නිසාදෝ ඒවා වෙනුවට ග්‍රන්ථ රචනයට බැස්සේ තමාගේම තෝරාගැනීමක් ලෙසය.

විසිවන සියවසේ මැද භාගය වනවිට එංගලන්තයේ පාළි පොත් සමාගම පාළි ත්‍රිපිටකයෙන් බොහෝ කොටසක් ඉංග්‍රීසි භාෂාවට පෙරළා මුද්‍රණය කර තිබිණ. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණ බවක් ලබා සිටි ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතා බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ සිංහලට නැගීමේදී ඉංග්‍රීසි පරිවර්තන උපයෝගී කරගන්ට ඇත. ඒ සමග එවකට ශ්‍රී ලංකාවේ සිටි ධර්මවිනයධර මහතෙරවරුන්ගේ උපදෙස් ද ලබා ගත් බව එතුමාම පවසා ඇත. මුද්‍රණ පහසුකම් අඩුවෙන් පැවැති එම කාලයේ නිරවුල්ව ස්වකීය ග්‍රන්ථ ප්‍රකාශනය කිරීමට සිතූ එතුමා ධර්මසමය නමින් මුද්‍රණාලයක් ද පටන්ගත්තේය. පාළි ත්‍රිපිටක ග්‍රන්ථවල සිංහල පරිවර්තනයේ සමහර තැන් වියතුන්ගේ විවේචනයටද භාජනද විය.

පාළි භාෂාවෙන් සඳහන් වී ඇති කරුණු පැහැදිලි කිරීමේදී අට්ඨකතාවල පවා මතභේද සහිත තැන් දක්නට ඇත. මේ සෑම ආගමකම දක්නා දෙයකි. බුදුසසුනද වෙන වෙන නිකායවලට බෙදුනේ බුද්ධ දේශනාවන් විවිධව තේරුම් කිරීම නිසාය. විශේෂයෙන් සූත්‍ර පිටකයේ ඇතුළත් වෙන ගැඹුරු අදහස් වෙනත් භාෂාවකින් පැවැසීම සුළුපටු කාර්යයක් නොවේ. ඒ ගැන සලකන විට ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාට ලොකු සම්මානයක් හිමිය. අඩසියවසකින් පැරැණි වූ එම ග්‍රන්ථ මේ වන විට වෙළඳපොලේ දක්නට නැති බව සලකා ආචාර්ය ඒ. පී. ද සොයිසා සූරීන් පළ කළ සිංහල ත්‍රිපිටකය නැවත මුද්‍රණය කිරීමෙන් එම අඩුව පිරවීමට සිරිසුමන ගොඩගේ සිරිමතාණන් ගත් පියවර ප්‍රශංසනීයය. ඇතැම් පොත් සොයා ගැනීමත් දුෂ්කරය. අපහසුකම් නොසලකා ගත් මෙම පියවර නොපමාව නිම කිරීමට එතුමාට හැකිවේවායි මම ප්‍රාර්ථනා කරමි.

**බෙල්ලන ඤාණවිමල මහානායක ස්ථවිර**

# පෙරවදන

බෞද්ධ ග්‍රන්ථ අතර මුදුන්මල්කඩ ත්‍රිපිටකයයි. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය මුළුමනින්ම ග්‍රන්ථාරූඪ කර ඇති ත්‍රිපිටකය පළ වී ඇත්තේ පාළි භාෂාවෙනි. එනිසාම වැඩිදෙනෙකුට ත්‍රිපිටකය කියවා අවබෝධ කර ගැනීම බලවත් ගැටලුවක් විය. 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් සංස්කරණය කරන ලද ත්‍රිපිටකය බොහෝවිට උගතුන්ට පමණක් සීමා විය. පසුකාලයේ බොහෝ වියතුන් ත්‍රිපිටකය සිංහලට නැගුවද එම පරිවර්තන ද එතරම් ලිහිල් බසින් පළ නොවිනි.

මෙරට විසූ ප්‍රකට බුද්ධිමතකු මෙන්ම සිංහල, පාළි හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙහි මනා ප්‍රවීණත්වයක් ලද විද්වතකු ද වූ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එවක මෙරට විසූ ධර්ම විනය උගත් පණ්ඩිත මහස්ථවිරයන් වහන්සේලාගේ ආධාර ඇතිව ත්‍රිපිටකය සරල බසින් සිංහලට නැගුවේ එබැවිනි. ත්‍රිපිටකයේ දැනට පළ වී ඇති සිංහල පරිවර්තන අතුරෙන් කියවා පහසුවෙන් අවබෝධ කරගත හැකි, කාටත් වැටහෙන බසින් ලියැවුණ පොත් පෙළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ මෙම පොත් පෙළ බව අපගේ වැටහීමයි. ත්‍රිපිටකය මෙතරම් සරල සිංහලෙන් ලියැවුණ වෙනත් ග්‍රන්ථ මාලාවක් බිහිවී නැත. එබැවින් බොහෝ දෙනා අපෙන් කළ ඉල්ලීම් ද සලකා බලා ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට අප අදහස් කළේ බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය සරල සිංහලෙන් කියවා අවබෝධ කරගනු රිසි පාඨකයන් වෙනුවෙනි.

මෙම බැරෑරුම් කටයුත්තේදී අප මුහුණ දුන් බලවත් ගැටලුව වූයේ පනහ දශකයේ මුල් භාගයේ කාණ්ඩ 48 කින් පළවූ එම සම්පූර්ණ ග්‍රන්ථ මාලාව සොයා ගන්නේ කෙසේද යන්නයි. ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එම පොත් පෙළ සංස්කරණය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

කරන සමයෙහි එම කාර්යය සඳහා ඒ මහතාට මඟ පෙන්වූ මහතෙරුන් වහන්සේලා අතුරෙන් අද ජීවතුන් අතර වැඩසිටින එකම භික්ෂූන් වහන්සේ වන කොල්ලුපිටියේ වාලුකාරාමාධිපති අතිපූජ්‍ය බෙල්ලන ඤාණවිමල මහනායක ස්වාමිපාදයාණන් වහන්සේගේ මඟ පෙන්වීම මෙහිදී අපට විශාල ශක්තියක් විය.

ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටකය සරල සිංහල පොත් පෙළ අප වෙත ලබාදීමට කටයුතු කළ විද්‍යෝදය පරිවෙණාධිපති බලන්ගොඩ සෝභිත නාහිමිපාණන් වහන්සේටත්, දොඩන්දූව පූජ්‍ය පණ්ඩිත ගංතලාවේ ගුණානන්ද නායක ස්ථවිරයන් වහන්සේටත්, පූජ්‍ය විද්‍යානිධි අම්බලන්ගොඩ සුමේධානන්ද ස්ථවිරයන් වහන්සේටත්, අරිසෙන් අහුබුදු මහත්මියටත්, ශ්‍රීනාත් ගනේවත්ත මහතාටත්, ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක මිලින්ද මොරගොඩ මහතාට සහ එස්. අයි. ගමගේ මහතාටත් අපගේ කෘතගුණපූර්වක ස්තුතිය හිමිවේ.

මෙම ග්‍රන්ථ මාලාව යළි මුද්‍රණය කිරීමට අනුමැතිය පළ කළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතාගේ දියණිය වන ආචාර්ය කුමාරි ජයවර්ධන මහත්මියටත්, පරිගණක අක්ෂර සංයෝජනය කළ නෙල්කා අබේවික්‍රම මහත්මියටත්, මුද්‍රණ සම්බන්ධීකරණයෙන් දායක වුණු පාලිත සේනානායක මහතාටත්, සෝදුපත් කියැවූ මිල්ටන් මද්දුමගේ මහතාටත් අපගේ ස්තුතිය හිමිවිය යුතුය.

**සිරිසුමන ගොඩගේ**

2013 අගෝස්තු

# සංඥාපනය

සූත්‍ර පිටකයේ හතරවෙනි නිකායවූ අංගුත්තර නිකාය නිපාත එකොළහකින් යුක්තයි. එක අඞ්ගයකින් යුත් ධර්ම පළමුවෙනි නිපාතයෙහිද, අඞ්ග දෙකකින් යුතු ධර්ම දෙවෙනි නිපාතයෙහිද යනාදී වශයෙන් ඒ ඒ නිපාත වෙන්කර තිබේ. පළමුවන සංඝායනාවේදී මේ නිකාය ආරක්ෂා කිරීමට භාරවූයේ අනුරුද්ධ මහ රහතුන්වහන්සේටය. මේ පොතට අංගුත්තර නිකායේ 5 නිපාතයේ 4 පණ්ණාසකයේ සිට 8 නිපාතයේ 5 වර්ගයේ අවසානය දක්වාද ඇතුල් කළෙමි.

මේ පොත් ලියා ප්‍රසිද්ධ කිරීමට නොයෙක් පළාත්වල සංඝයා වහන්සේලා දුන් ආධාරය මහත් උපකාරයක් විය.

මේ පොත් පෙළ කියවීමට නොයෙක් තරාතිරම් වල පින්වතුන් දක්වන උනන්දුව ප්‍රීතියට කරුණක් වේ. සමහර පාඨශාලා ශිෂ්‍යයන් විසින්ද මේ පොත් පිළිවෙළට කියවීමට පටන් ගෙන තිබේ.

බොහෝ වැඩ කටයුතුවල යෙදී සිටින කාලයක, ශාසන ආලයෙන් ආචාර්ය ආයසිරත්න රේරුකාන මහත්මයා මේ ව්‍යාපාරයට කරගෙන යන උපකාර මහත් බව නැවතත් දන්වමු.

මේ පොත සඳහා සියලු ආකාරයෙන් අපට ආයසිරත්න රේරුකාන මහත්මයාගෙන් ආධාර ලැබුණා පමණක් නොව රත්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන් වහන්සේද, පණ්ඩිත පින්කන්දේ පඤ්ඤාවාස ස්ථවිරයන් වහන්සේද, පැල්මඩුල්ලේ ශ්‍රී සද්ධම්මොදය පිරිවෙනාධිපති පණ්ඩිත කේ. පඤ්ඤාරාම ස්ථවිරයන් වහන්සේද, පණ්ඩිත විමල වීරසූරිය මහතාද, ඩී. එන්. ඒ. මුදලිගේ මහතාද, ඒ. ඇස්. බී. ඩබ්ලිව්. නානායක්කාර මහතාද, ඇල්. ජී. පෙරේරා මහතාද ආධාර කළෝය.

මේ පොත් ලිවීමට නොයෙක් උපදෙස් සහිත ලියුම් එවා තිබෙන උගත් භික්ෂූන් වහන්සේලාටත් බෞද්ධ උපාසක පින්වතුන්ටත් සාමාජිකයින් වශයෙන් පොත් ගැනීමට බැඳී සිටින පින්වතුන්ටත් අපේ ගෞරව ස්තුතිය පිරිනමමු.

මීට,

**ඒ. පී. ද සොයිසා**

26 - 11 - 55.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

*x*

පටුනේ සඳහන් එක් එක් පරිච්ඡේද වලට පිවිසීම සඳහා ඒ නම් මත **click** කරන්න, නැතිනම් වම් පස **bookmarks** තීරුව භාවිතා කරන්න.

# පටුන

පිට


**පඤ්චක නිපාතය**

සතරවෙනි පණ්ණාසකය

16. සද්ධර්ම වර්ගය 935

17. ආඝාත වර්ගය 946

18. උපාසක වර්ගය 964

19. අරඤ්ඤ වර්ගය 979

20. බ්‍රාහ්මණ වර්ගය 981

පස්වෙනි පණ්ණාසකය

21. කිම්බිල වර්ගය 1002

22. අක්කොසක වර්ගය 1008

23. දීඝ චාරිකා වර්ගය 1012

24. ආවාසික වර්ගය 1017

25. දුච්චරිත වර්ගය 1022

හයවෙනි පණ්ණාසකය

උපසම්පදා වර්ගය 1026

**ඡක්ක නිපාතය**

පළමුවෙනි පණ්ණාසකය

1. ආයුණෙයාය වර්ගය 1033

2. සාරාණීය වර්ගය 1039

3. අනුත්තරිය වර්ගය 1057

4. දේවතා වර්ගය 1070

5. ධම්මික වර්ගය 1084

දෙවෙනි පණ්ණාසකය

6. මහා වර්ගය 1111

7. දේවතා වර්ගය 1155

8. අරහන්ත වර්ගය 1163

9. සීති වර්ගය 1168

10. ආනිසංස වර්ගය 1172


මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

11. තික වර්ගය 1176
12. සාමඤ්ඤ වර්ගය 1179

**සත්තක නිපාතය**

පළමුවෙනි පණ්ණාසකය

1. ධන වර්ගය 1182
2. අනුසය වර්ගය 1188
3. වජ්ජිසත්තක වර්ගය 1193
4. දේවතා වර්ගය 1203
5. මහායඤ්ඤ වර්ගය 1213

දෙවෙනි පණ්ණාසකය

6. අව්‍යාකත වර්ගය 1234
7. මහා වර්ගය 1264
8. විනය වර්ගය 1299
9. සමණ වර්ගය 1303
10. ආහුණෙය්‍ය වර්ගය 1304

**අට්ඨක නිපාතය**

පළමුවෙනි පණ්ණාසකය

1. මෙත්තා වර්ගය 1307
2. මහා වර්ගය 1327
3. ගහපති වර්ගය 1360
4. දාන වර්ගය 1385
5. උපොසථ වර්ගය 1396


මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# අංගුත්තර නිකාය.

## පඤ්චක නිපාතය.

### සතරවෙනි පණ්ණාසකය.

## 160. සද්ධම්ම වර්ගය.

**1. අනෙකග්ග චිත්ත සූත්‍රයඃ-** (මේ වර්ගයේ 1-8 දක්වා ඒ ඒ සූත්‍රවල 3 ඡේදය 1 ඡේදය මෙනි. 6 ඡේදය 4 ඡේදය මෙනි.)

1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූයේ සද්ධර්මය අසන්නේද, කුශල ධර්මයන්හි සම්පූර්ණ කරණලද මාර්ග නියමයට බැසගන්ට නුසුදුසු වේ.

2. "කවර පසකින්ද යත්, ධර්ම කථාවට පරිභව කෙරේද, කථිකයාට පරිභව කෙරේද, තමාට පරිභව කෙරේද, වික්ෂිප්ත සිත් ඇත්තේ ධර්මය අසාද, එකග නොවූ සිත් ඇත්තේ නුනුවණින් මෙනෙහි කෙරේද, යන පසිනි.

4. මහණෙනි, කරුණු පසකින් යුක්තව සද්ධර්මය අසන්නේ කුශල ධර්මයන්හි සම්පූර්ණ කරණලද මාර්ග නියමයට බැස ගන්ට සුදුසු වේ.

5. "කවර පසකින්ද යත්? කථාවට පරිභව නොකෙරේද, කථිකයාට පරිභව නොකෙරේද, තමාට පරිභව නොකෙරේද, වික්ෂිප්ත නොවූ සිත් ඇත්තේ ධර්මය අසාද, එකග සිත් ඇත්තේ නුවණින් මෙනෙහි කෙරේද, යන පසිනි.

**2. දුප්පඤ්ඤ සූත්‍රයඃ-** 1. "මහණෙනි කරුණු පසකින් යුක්තව සද්ධර්මය අසන්නේද, කුශල ධර්මයන්හි සම්පූර්ණ කරණලද මාර්ග නියමයට බැසගන්ට නුසුදුසු වේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. "කවර පසකින්ද යත්, කථාවට පරිභව කෙරේද, කථිකයාට පරිභව කෙරේද, තමාට පරිභව කෙරේද, ජඩවූ කෙළතොලුවූ දුෂ්ප්‍රාඥයෙක් වේද, නොදන්නා ලද්දේහි දන්නා ලද්දෙමි යන සිත් ඇත්තේ වේද යන පසිනි.

4. "මහණෙනි, කරුණු පසකින් යුක්තව සද්ධර්මය අසන්නේ කුශල ධර්මයන්හි සම්පූර්ණ කරණලද මාර්ග නියමයට බැසගන්ට සුදුසු වේ.

5. "කවර පසකින්ද යත්, කථාවට පරිභව නොකෙරේද, කථිකයාට පරිභව නොකෙරේද, තමාට පරිභව නොකෙරේද, ජඩ නොවූ කෙළතොළු නොවූ ප්‍රඥා ඇත්තෙක් වේද, නොදන්නා ලද්දෙහි දනිමි යන සිත් ඇත්තේ නොවේද (යන පසිනි.)

3. **ඝාතමානී සූත්‍රය**:- 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තව බණ අසන්නේද, කුශල ධර්මයන්හි සම්පූර්ණ කරණ ලද මාර්ග නියමයට බැසගන්ට නුසුදුසු වේ.

2. 'කවර පසකින්ද යත්? ගුණමකු වූයේ ගුණමකු බැවින් මඩනා ලද සිත් ඇත්තේ ධර්මය අසාද, හෙළා දක්නා සිත් ඇත්තේ සිදුරු සොයමින් ධර්මය අසාද, ධර්ම දෙශකයා කෙරෙහි ගටනා සිත් ඇත්තේ හටගත් ක්‍රොධ හුල් ඇත්තේ වේද, ජඩවූ කෙළතොලුවූ දුෂ්ප්‍රාඥයෙක් වේද, නොදන්නා ලද්දෙහි දන්නා ලද්දේ වෙමි යන සිත් ඇත්තේ වේද, (යන පසිනි.)

4. "මහණෙනි, කරුණු පසකින් යුක්තව බණ අසන්නේ කුශල ධර්මයන්හි සම්පූර්ණ කරණලද මාර්ග නියමයට බැසගන්ට සුදුසු වේ.

5. "කවර පසකින්ද යත්? ගුණමකු නොවූයේ ගුණමකු බැවින් නොමඩනා ලදදේ ධර්මය අසාද, හෙළාදක්නා සිත් නැත්තේ සිදුරු සෙවීම නැත්තේ ධර්මය අසාද, ධර්ම දෙශකයා කෙරෙහි නොගටනා සිත් ඇත්තේ හටගත් ක්‍රොධ හුල් රහිත වේද, ජඩ නොවූයේ කෙළතොළු නොවූයේ ප්‍රඥා ඇත්තේ වේද, නොදන්නා ලද්දෙහි දන්නා ලද්දේ වෙමි යන සිත් ඇති නොවේද, යන පසිනි."

4. **පඨම සද්ධම්මන්තරධාන සූත්‍රයඃ**- 1. "මහණෙනි, මේ ධර්ම පසක් සද්ධර්මයාගේ මුවහවීම පිණිස අතුරුදහන්වීම පිණිස පවතිත්.

2. "කවර පසක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂූහු සකස්කොට ධර්මය නොඅසත්ද, සකස්කොට ධර්මය නොපිරිවහත්ද, සකස්කොට ධර්මය නොදරත්ද, සකස්කොට දරණලද ධර්මයන්ගේ අර්ථය පරීක්ෂා නොකරත්ද, සකස්කොට අර්ථය දැන ධර්මය දැන ධර්මයට අනු ධර්මයෙහි නොපිළිපදිද්ද යන පසයි.

4. "මහණෙනි, මේ ධර්ම පසක් සද්ධර්මයාගේ පැවැත්ම පිණිස මුවහ නොවීම පිණිස අතුරුදහන් නොවීම පිණිස පවතිත්.

5. "කවර පසක්ද යත්, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂූහු සකස්කොට ධර්මය අසත්ද, සකස් කොට ධර්මය පිරිවහද්ද, සකස්කොට ධර්මය දරත්ද, සකස් කොට දරණලද ධර්මයන්ගේ අර්ථය පරීක්ෂා කරත්ද, සකස්කොට අර්ථය දැන ධර්මය දැන ධර්මයට අනු ධර්මයෙහි පිළිපදිත්ද යන පසයි."

5. **දුතිය සද්ධම්මන්තරධාන සූත්‍රයඃ**- 1. "මහණෙනි, මේ ධර්ම පසක් සද්ධර්මයාගේ මුවහවීම පිණිස අතුරුදන්වීම පිණිස පවතිත්.

2. "කවර පසක්ද යත්, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂූහු සූත්‍රය, ගෙය්‍යය, වෙය්‍යාකරණය, ගාථාය, උදානය, ඉතිවුත්තකය, ජාතකය, අබ්භූත ධර්මය, වෙදල්ලය යන ධර්මය නොපිරිවහද්ද, මහණෙනි, මේ පළමුවන ධර්මයතෙම සද්ධර්මයාගේ මුවහවීම පිණිස අතුරුදන්වීම පිණිස පවතී.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂූහු අසනලද පරිදි පිරිවහනලද පරිදි ධර්මය විස්තර වශයෙන් අනුන්ට දෙශනා නොකෙරෙත්ද, මහණෙනි, මේ දෙවන ධර්මයතෙම සද්ධර්මයාගේ මුවහවීම පිණිස අතුරුදන්වීම පිණිස පවතියි.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂූහු අසනලද පරිදි පිරිවහන ලද පරිදි ධර්මය විස්තර වශයෙන් අනුන්ට

නොකියවත්ද, මහණෙනි, මේ තුන්වන ධර්මයතෙම සද්ධර්මයාගේ මුවහවීම පිණිස අතුරුදන්වීම පිණිස පවතී.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂූහු අසනලද පරිදි පිරිවහන ලද පරිදි ධර්මය විස්තර වශයෙන් සජ්ඣායනා නොකරත්ද, මහණෙනි, මේ සතරවන ධර්මයතෙම සද්ධර්මයාගේ මුවහවීම පිණිස අතුරුදන්වීම පිණිස පවතියි.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂූහු අසනලද පරිදි පිරිවහන ලද පරිදි ධර්මය සිතින් අනුව කල්පනා නොකෙරෙත්ද, සිතින් අනුව සළකා නොබලත්ද, මහණෙනි, මේ පස්වන ධර්මයතෙම සද්ධර්මයාගේ මුවහවීම පිණිස අතුරුදන්වීම පිණිස පවතියි.

4. "මහණෙනි, මේ ධර්ම පසක් සද්ධර්මයාගේ පැවැත්ම පිණිස මුවහනොවීම පිණිස අතුරුදන් නොවීම පිණිස පවතිත්.

5. "කවර පසක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂූහු සූත්‍රය, ගෙය්‍යය, වෙය්‍යාකරණය, ගාථාය, උදානය, ඉතිවුත්තකය, ජාතකය, අබ්භූත ධර්මය, වෙදල්ලය යන ධර්මය පිරිවහද්ද, මහණෙනි, මේ පළමුවන ධර්මයතෙම සද්ධර්මයාගේ පැවැත්ම පිණිස මුවහ නොවීම පිණිස අතුරුදන් නොවීම පිණිස පවතියි.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂූහු අසනලද පරිදි පිරිවහන ලද පරිදි ධර්මය විස්තර වශයෙන් අනුන්ට දෙශනා කෙරෙත්ද, මහණෙනි, මේ දෙවන ධර්මයතෙම සද්ධර්මයාගේ පැවැත්ම පිණිස මුවහනොවීම පිණිස අතුරුදන් නොවීම පිණිස පවතියි.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂූහු අසනලද පරිදි පිරිවහණලද පරිදි ධර්මය විස්තර වශයෙන් අනුන්ට කියවත්ද, මහණෙනි, මේ තුන්වන ධර්මයතෙම සද්ධර්මයාගේ පැවැත්ම පිණිස මුවහ නොවීම පිණිස අතුරුදන් නොවීම පිණිස පවතී.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂූහු අසනලද පරිදි පිරිවහන ලද පරිදි ධර්මය විස්තර වශයෙන් සජ්ඣායනා

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කෙරෙත්ද, මහණෙනි, මේ සතරවෙනි ධර්මයතෙම සද්ධර්මයාගේ පැවැත්ම පිණිස මුවහ නොවීම පිණිස අතුරුදන් නොවීම පිණිස පවතියි.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂූහු අසනලද පරිදි පිරිවහන ලද පරිදි ධර්මය සිතින් අනුව කල්පනා කරත්ද, අනුව සොයත්ද, සිතින් අනුව සලකා බලත්ද, මහණෙනි, මේ පස්වෙනි ධර්මයතෙම සද්ධර්මයාගේ පැවැත්ම පිණිස මුවහ නොවීම පිණිස අතුරුදන් නොවීම පිණිස පවතියි.

**6. තතිය සද්ධම්මන්තරධාන සූත්‍රය:-** 1. 'මහණෙනි, මේ ධර්ම පසක් සද්ධර්මයාගේ මුවහ වීම පිණිස අතුරුදන් වීම පිණිස පවතිත්.

2 "කවර පසක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂූහු නොමනා කොට ගන්නා ලද සූත්‍රාන්තය නපුරුකොට බහණලද පද ව්‍යඤ්ජනවලින් යුක්තව පිරිවහද්ද, මහණෙනි, අයහපත්කොට බහණලද පද ව්‍යඤ්ජන ඇත්තහුගේ අර්ථයද දුරවබෝධ වේ. මහණෙනි, මේ පළමුවන ධර්මයතෙම

2. (ii) "සද්ධර්මයාගේ මුවහවීම පිණිස අතුරුදන්වීම පිණිස පවතියි.

(iii) "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂූහු නපුරු වචන ඇත්තාහු අකීකරුභාවය කරන්නාවූ ධර්මයන්ගෙන් යුක්ත වූවාහු නොඉවසන්නාහු අනුශාසනාව පැදකුණු කිරීමෙන් නොගන්නාහු වෙත්ද, මහණෙනි, මේ දෙවන ධර්මයතෙම සද්ධර්මයාගේ මුවහවීම පිණිස අතුරුදන්වීම පිණිස පවතියි.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. බහුශ්‍රැතවූ පැමිණි ආගම ඇත්තාවූ ධර්මය දරන්නාවූ විනය දරන්නාවූ මාතෘකා දරන්නාවූ යම් ඒ භික්ෂූහු වෙත්ද, ඒ භික්ෂූහු සකස් කොට සූත්‍රාන්තය අනිකාට නොකියවත්ද, ඔවුන්ගේ ඇවෑමෙන් සූත්‍රාන්තයතෙම සුන්වූ මුල් ඇත්තේ පිළිසරණ රහිත වේ. මහණෙනි, මේ තුන්වන ධර්මයතෙම (මෙහි 2 (ii) ඡෙදය යෙදිය යුතුයි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. ස්ථවිර භික්ෂූහු ප්‍රත්‍ය බහුල කොට ඇත්තාහු සස්න ලිහිල් කොට ගත්තාහු නීවරණයන්ට බැස ගැන්මෙහි පෙරදැරි වූවාහු උතුම් විවේකයෙහි බහා තබනලද ධූර ඇත්තාහු වෙද්ද, නොපැමිණියහුගේ පැමිණීම පිණිස නොලබන ලද්දහුගේ ලැබීම පිණිස, ප්‍රත්‍යක්ෂ නොකරණ ලද්දහුගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස වීය්‍ර්‍යය පටන් නොගණිද්ද, ඔවුන්ගේ පශ්චිම ජනතාව දෘෂ්ටානුගතියට පැමිණේ. ඒ ජනතාවද ප්‍රත්‍ය බහුලකොට ඇත්තී සස්න ලිහිල් කොට ගැණීම් ඇත්තී නීවරණයන්ට බැස ගැන්මෙහි පෙරදැරිවූවා උතුම් විවේකයෙහි බහා තබනලද ධූර ඇත්තී වේ. නොපැමිණියහුගේ පැමිණීම පිණිස නොලබන ලද්දහුගේ ලැබීම පිණිස ප්‍රත්‍යක්ෂ නොකරණ ලද්දහුගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස වීය්‍ර්‍යය පටන් නොගණියි. මහණෙනි, මේ සතර වන ධර්මයතෙම (මෙහි 2 (ii) ඡේදය යෙදිය යුතුයි.)

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. සංඝතෙම බිඳුනේ වේද, මහණෙනි, භික්ෂු සංඝයා බිඳුනු කල්හි වනාහි ඔවුනොවුන්ට ආක්‍රොෂ කරන්නාහුද වෙත්. ඔවුනොවුන්ට නින්දා කරන්නාහුද වෙත්. ඔවුනොවුන් දුරු කරන්නාහුද වෙත්. ඔවුනොවුන් හැර දමන්නාහුද වෙත්. එහි අප්‍රසන්න වූවාහුද නොපහදිත්. ප්‍රසන්නවූද ඇතැම් කෙනෙකුන්ගේ අන් පරිදි බව වේ. මහණෙනි, මේ පස්වන ධර්මයතෙම (මෙහි 2 (ii) ඡේදය යෙදිය යුතුයි.)

4. "මහණෙනි, මේ ධර්ම පසක් සද්ධර්මයාගේ පැවැත්ම පිණිස මුවහනොවීම පිණිස අතුරුදන් නොවීම පිණිස පවතිත්.

5. "කවර පසක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂූහු මනාව ගන්නාලද සූත්‍රාන්තය මනාව බහනලද පද ව්‍යඤ්ජනවලින් යුක්තව පිරිවහද්ද, මහණෙනි, මනාව බහණ ලද පද ව්‍යඤ්ජන ඇති සූත්‍රාන්තයාගේ අර්ථයද සුඛාවබොධ වේ. මහණෙනි, මේ පළමුවන ධර්මයතෙම 5 (ii) සද්ධර්මයාගේ පැවැත්ම පිණිස මුවහ නොවීම පිණිස අතුරුදන් නොවීම පිණිස පවතියි.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂූහු යහපත් වචන ඇත්තාහු සුවචභාවය කරන්නාවූ ධර්මයන්ගෙන් යුක්තවූවාහු ඉවසන්නාහු අනුශාසනාව පැදකුණු කිරීමෙන් ගන්නාහු වෙත්ද, මහණෙනි, මේ දෙවන ධර්මයතෙම (මෙහි 5 (ii) ඡේදය යෙදිය යුතුයි.)

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. බහුශ්‍රැතවූ දැනගත් පිටකත්‍රය ඇත්තාවූ, ධර්මය දරන්නාවූ, විනය දරන්නාවූ, මාතෘකා දරන්නාවූ යම් ඒ භික්ෂූහු වෙත්ද, ඔව්හු සකස්කොට අනිකාට කියවත්ද, ඔවුන්ගේ ඇවෑමෙන් සූත්‍රාන්තය තෙම සුන්වූ මුල් ඇත්තේ නොවේ. පිළිසරණ සහිතවේ. මහණෙනි, මේ තුන්වන ධර්මයතෙම (මෙහි 5 (ii) ඡේදය යෙදිය යුතුයි.)

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. ස්ථවිර භික්ෂූහු ප්‍රත්‍යය බහුල කොට ඇත්තාහු නොවෙද්ද ශාසනය ලිහිල් කොට ගත්තාහු නොවෙද්ද, නීවරණයන්ට බැස ගැන්මෙහි බහා තබණලද ධූර ඇත්තාහු උතුම් විවේකයෙහි පෙරදැරි වූවාහු වෙද්ද, නොපැමිණියහුගේ පැමිණීම පිණිස නොලද්දහුගේ ලැබීම පිණිස ප්‍රත්‍යක්ෂ නොකරණලද්දහුගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස වීර්‍ය්‍යය පටන් ගනිත්ද, ඔවුන්ගේ පශ්චිම ජනතාව දෘෂ්ටානුගතියට පැමිණේ. ඒ ජනතාවද ප්‍රත්‍ය බහුල කොට ඇත්තී නොවේ. සස්න ලිහිල් කොට ගැන්ම ඇත්තී නොවේ. නීවරණයන්ට බැසගැන්මෙහි බහා තබනලද ධූර ඇත්තී උතුම් විවේකයෙහි පෙරදැරි වේ. නොපැමිණියහුගේ පැමිණීම පිණිස නොලද්දහුගේ ලැබීම පිණිස ප්‍රත්‍යක්ෂ නොකරණ ලද්දහුගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස වීර්‍ය්‍යය පටන් ගණියි. මහණෙනි, මේ සතරවන ධර්මයතෙම (මෙහි 5 (ii) ඡේදය යෙදිය යුතුයි.)

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. සංඝතෙම සමගි වූයේ සතුටුවනු ලබන්නේ විවාද නොකරන්නේ එක්ව උදෙසීම් ඇත්තේ පහසුවෙන් වාසය කෙරේද, මහණෙනි, සංඝයා වනාහි සමගිවූ කල්හි ඔවුනොවුන්ට ආක්‍රොෂ කරන්නාහුද නොමවෙත්. ඔවුනොවුන්ට නින්දා නොකරන්නාහුද වෙත්. ඔවුනොවුන් දුරුකරන්නාහුද නොවෙත්. ඔවුනොවුන් හැරදමන්නාහුද

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නොවෙත්. එහි අප්‍රසන්නවූවාහුද පහදිත්. ප්‍රසන්නවූවන්ගේද බහුලභාවය වේ. මහණෙනි, මේ පස්වන ධර්මය තෙම (මෙහි 5 (ii) ඡේදය යෙදිය යුතුයි.)

7. **දුක්කථා සූත්‍රය**:- 1. "මහණෙනි, පුද්ගලයන් පස් දෙනෙකුන්ට ඒ ඒ පුද්ගලයා සඳහා කථාව අයහපත් කථාව වෙයි.

2 "කවර පස්දෙනෙකුන්ටද යත්? මහණෙනි, ශ්‍රද්ධාව නැත්තහුට ශ්‍රද්ධා ඇත්තවුන් පිළිබඳ කථාව අයහපත් කථාව වෙයි. දුශ්ශීලයාහට සිල් ඇත්තන් පිළිබඳ කථාව අයහපත් කථාව වෙයි. නූගතාහට උගතුන් පිළිබඳ කථාව අයහපත් කථාව වෙයි. මසුරුකම් ඇත්තාහට ත්‍යාගවන්තයන් පිළිබඳ කථාව අයහපත් කථාව වෙයි. ප්‍රඥා නැත්තහුට ප්‍රඥාවන්තයන් පිළිබඳ කථාව අයහපත් කථාව වෙයි.

3 "මහණෙනි, කුමක් හෙයින් ශ්‍රද්ධා නැත්තහුට ශ්‍රද්ධාවන්තයන් පිළිබඳ කථාව අයහපත් කථාව වේද, මහණෙනි, ශ්‍රද්ධා නැත්තේ ශ්‍රද්ධාවන්තයන් පිළිබඳ කථාව කරණු ලබන කල්හි ගැටෙයි.

3 (ii) "කිපෙයි, විරුද්ධ බවට පැමිණෙයි. තද බවට පැමිණෙයි. කෝපයද ද්වෙෂයද නොසතුටද පහළ කෙරෙයි. ඊට හේතු කවරේද යත්?

"මහණෙනි, හෙතෙම ඒ ශ්‍රද්ධා සම්පත්තිය තමා කෙරෙහි නොදකියි. ඒ හේතුවෙන් ප්‍රීති ප්‍රමොද්‍යය නොලබයි. එහෙයින් ශ්‍රද්ධා නැත්තහුට ශ්‍රද්ධා ඇත්තවුන් පිළිබඳ කථාව අයහපත් කථාව වෙයි.

"මහණෙනි, කුමක් හෙයින් දුශ්ශීලයාහට ශීලවන්තයන් පිළිබඳ කථාව අයහපත් කථාව වේද, මහණෙනි, දුශ්ශීලතෙම සීලවන්තයන් පිළිබඳ කථාව කරනු ලබන කල්හි ගැටෙයි. (මෙහි 3 (ii) ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, ඒ ශීල සම්පත්තිය වනාහි හෙතෙම තමා කෙරෙහි නොදකියි. ඒ හේතුවෙන් ප්‍රීතිය හා ප්‍රමුදිත භාවයද නොලබයි. එහෙයින් දුශ්ශීලයාහට සීලවන්තයන් පිළිබඳ කථාව අයහපත් කථාව වේ.

"මහණෙනි, කුමක් හෙයින් නූගතාහට උගතුන් පිළිබඳ කථාව අයහපත් කථාව වේද, මහණෙනි, නූගතා උගතුන් පිළිබඳ කථාව කරණු ලබන කල්හි ගැටෙයි. (මෙහි 3 (ii) ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, ඒ උගත්කම වනාහි හෙතෙම තමා කෙරෙහි නොදකියි. ඒ හේතුවෙන් ප්‍රීතිය හා ප්‍රමුදිත භාවයද නොලබයි. එහෙයින් නූගතාහට උගතුන් පිළිබඳ කථාව අයහපත් කථාව වෙයි.

"මහණෙනි, කුමක් හෙයින් මසුරුකම් ඇත්තාහට ත්‍යාගයන් පිළිබඳ කථාව අයහපත් කථාව වේද? මහණෙනි, මසුරු තැනැත්තේ ත්‍යාගයන් පිළිබඳ කථාව කරණු ලබන කල්හි ගැටෙයි. මහණෙනි, ඒ ත්‍යාගසම්පත්තිය වනාහි හෙතෙම තමා කෙරෙහි නොදකියි. ඒ හේතුවෙන් ප්‍රීතිය හා ප්‍රමුදිත භාවයද නොලබයි. එහෙයින් මසුරුකම් ඇත්තාහට ත්‍යගයන් පිළිබඳ කථාව අයහපත් කථාව වේ.

"මහණෙනි, කුමක් හෙයින් ප්‍රඥා නැත්තාහට ප්‍රඥාවන්තයන් පිළිබඳ කථාව අයහපත් කථාව වේද? මහණෙනි, ප්‍රඥා නැත්තේ ප්‍රඥාවන්තයන් පිළිබඳ කථාව කරනු ලබන කල්හි ගැටෙයි. මහණෙනි, ඒ ප්‍රඥා සම්පත්තිය වනාහි හෙතෙම තමා කෙරෙහි නොදකියි. ඒ හේතුවෙන් ප්‍රීතිය හා ප්‍රමුදිත භාවයද නොලබයි. එහෙයින් ප්‍රඥා නැත්තාහට ප්‍රඥාවන්තයන් පිළිබඳ කථාව අයහපත් කථාව වේ.

4 "මහණෙනි, පුද්ගලයන් පස්දෙනෙකුන්ට ඒ ඒ පුද්ගලයා ඇතුළත් කොට කියන ලද කථාව යහපත් කථාව වේ.

5 "කවර පස්දෙනෙකුන්ටද යත්? මහණෙනි, ශ්‍රද්ධාව ඇත්තහුට ශ්‍රද්ධා ඇත්තවුන් පිළිබඳ කථාව යහපත් කථාව වේ. සිල්වත්හට සිල්වතුන් පිළිබඳ කථාව යහපත් කථාවවේ. උගතාට උගතුන් පිළිබඳ කථාව යහපත් කථාව වේ. ත්‍යාග වන්තයාට ත්‍යාගයන් පිළිබඳ කථාව යහපත් කථාව වේ. ප්‍රඥාවන්තයාට ප්‍රඥාවන්තයන් පිළිබඳ කථාව යහපත් කථාව වේ.

"මහණෙනි, කුමක් හෙයින් ශ්‍රද්ධාව ඇත්තාට ශ්‍රද්ධාව ඇත්තවුන් පිළිබඳ කථාව යහපත් කථාව වේද, මහණෙනි, ශ්‍රද්ධාව

ඇත්තේ ශ්‍රද්ධාවන්තයන් පිළිබඳ කථාව කරණු ලබන කල්හි නොගැටෙයි.

5 (ii) නොකිපෙයි. විරුද්ධ බවට නොපැමිණෙයි. තද බවට නොපැමිණෙයි. කෝපයද ද්වෙෂයද නොසතුටද පහළ නොකෙරෙයි. ඊට හේතු කවරේද?

"මහණෙනි, ඒ ශ්‍රද්ධා සම්පත්තිය වනාහි හෙතෙම තමා කෙරෙහි දකියි. ඒ හේතුවෙන් ප්‍රීතිය හා ප්‍රමුදිත භාවයද ලබයි. එහෙයින් ශ්‍රද්ධා ඇත්තහුට ශ්‍රද්ධා ඇත්තවුන් පිළිබඳ කථාව යහපත් කථාව වේ.

"මහණෙනි, කුමක් හෙයින් සිල්වතාට සිල්වතුන් පිළිබඳ කථාව යහපත් කථාව වේද? මහණෙනි, සිල්වත් තෙමේ සිල්වතුන් පිළිබඳ කථාව කියනු ලබන කල්හි නොගැටෙයි. (මෙහි 5 (ii) ඡෙදය යෙදිය යුතුයි.)

"මහණෙනි, ඒ සීල සම්පත්තිය වනාහි හෙතෙම තමා කෙරෙහි දකියි. ඒ හේතුවෙන් ප්‍රීතිය හා ප්‍රමුදිත භාවයද ලබයි. එහෙයින් සිල්වතාට සිල්වතුන් පිළිබඳ කථාව යහපත් කථාව වේ.

"මහණෙනි, කුමක් හෙයින් උගතාට උගතුන් පිළිබඳ කථාව යහපත් කථාව වේද? මහණෙනි, උගත් තැනැත්තේ උගතුන් පිළිබඳ කථාව කියනු ලබන කල්හි නොගැටෙයි. මෙහි 5 (ii) ඡෙදය යෙදිය යුතුයි.)

"මහණෙනි, ඒ උගත්කම වනාහි හෙතෙම තමා කෙරෙහි දකියි. ඒ හේතුවෙන් ප්‍රීතිය හා ප්‍රමුදිතභාවයද ලබයි. එහෙයින් උගතාට උගතුන් පිළිබඳ කථාව යහපත් කථාව වේ.

"මහණෙනි, කුමක් හෙයින් ත්‍යාගවන්තයාට ත්‍යාගයන් පිළිබඳ කථාව යහපත් කථාව වේද? මහණෙනි, ත්‍යාගවන්තයා ත්‍යාගයන් පිළිබඳ කථාව කියනු ලබන කල්හි නොගැටෙයි. (මෙහි 5 (ii) ඡෙදය යෙදිය යුතුයි.) මහණෙනි, ඒ ත්‍යාග සම්පත්තිය වනාහි හෙතෙම තමා කෙරෙහි දකියි. ඒ හේතුවෙන් ප්‍රීතිය හා ප්‍රමුදිත භාවයද ලබයි. එහෙයින් ත්‍යගවන්තයාට ත්‍යාගයන් පිළිබඳ කථාව යහපත් කථාවවේ.

"මහණෙනි, කුමක් හෙයින් ප්‍රඥාවන්තයාට ප්‍රඥාවන්තයන් පිළිබඳ කථාව යහපත් කථාව වේද? මහණෙනි, ප්‍රඥාවන්ත තෙම ප්‍රඥාවන්තයන් පිළිබඳ කථාව කියනු ලබන කල්හි නොගැටෙයි. මහණෙනි, ඒ ප්‍රඥා සම්පත්තිය වනාහි හෙතෙම තමා කෙරෙහි දකියි. ඒ හේතුවෙන් ප්‍රීතිය හා ප්‍රමුදිත භාවයද ලබයි. එහෙයින් ප්‍රඥාවන්තයාට ප්‍රඥාවන්තයන් පිළිබඳ කථාව යහපත් කථාව වේ.

**8. සාරජ්ජොක්කන්ත සූත්‍රයඃ-** 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම දොම්නසට බැසගත්තේ වෙයි.

2 "කවර පසකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම ශ්‍රද්ධා නැත්තේ වේද, දුශ්ශීල වේද, අල්පශ්‍රැත වේද, කුසීත වේද, දුෂ්ප්‍රාඥ වේද යන පසිනි.

4 "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම විශාරද වූයේ හෙවත් සොම්නසට පැමිණියේ වෙයි.

5 "කවර පසකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම ශ්‍රද්ධා ඇත්තේවේද සිල්වත් වේද, බහුශ්‍රැත වේද, පටන්ගන්නා ලද වීර්‍ය්‍ය ඇත්තේ වේද, ප්‍රඥා ඇත්තේ වේද යන පසිනි."

**9. දුක්කර ධම්ම දෙසනා සූත්‍රයඃ-** 1 "එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසඹෑනුවර ඝොෂිතාරාමයෙහි වැඩවසන සේක. එසමයෙහි වනාහි ආයුෂ්මත් උදායී ස්ථවිර තෙම මහත්වූ ගිහි පිරිසකින් පිරිවරණ ලද්දේ ධර්මදෙශනා කරමින් හුන්නේ වෙයි. ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම මහත්වූ ගිහි පිරිසකින් පිරිවරණලදුව ධර්මය දේශනා කරමින් උන්නාවූ ආයුෂ්මත් උදායි ස්ථවිරයන් දුටුයේමය. දැක, භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පස්ව හුන්නේය.

2 "එකත්පස්ව හුන්නාවූම ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකෙළේය. "ස්වාමීනි ආයුෂ්මත් උදායි ස්ථවිරතෙම මහත්වූ ගිහි පිරිසකින් පිරිවරණ ලද්දේ ධර්මය දෙශනා කෙරේයයි"

3 "ආනන්දය, අනුන්ට ධර්මය දෙශනා කරන්ට පහසු නොවේමැයි. ආනන්දය, අනුන්ට ධර්මය දෙශනා කරන්නහු විසින් ධර්ම පසක් තමන් කෙරෙහි පිහිටුවා අනුන්ට ධර්මය දෙශනා කටයුතු වේ.

4 "කවර පසක්ද යත්? පිළිවෙළ කථාව කියන්නෙමියි අනුන්ට ධර්මය දෙශනා කටයුතුවේ. කරුණු දැක්වීම ඇත්තේ කථාව කියන්නෙමියි අනුන්ට ධර්මය දෙශනා කටයුතු වේ. අනුකම්පා ඇති බව නිසා කථාව කියන්නෙමියි අනුන්ට ධර්මය දෙශනා කටයුතුවේ. ආමිෂ ලාභය බලාපොරොත්තු නොවන්නේ කථාව කියන්නෙමියි අනුන්ට ධර්මය දෙශනා කටයුතුවේ. තමන්ද අනුන්ද ගුණයෙන් නොපෙලා කථාව කියන්නෙමියි අනුන්ට ධර්මය දෙශනා කටයුතුවේ. (යන පසයි).

5 (මේ ඡෙදය මේ සූත්‍රයේ 3 ඡෙදය මෙනි)

**10 දුප්පටිවිනොදය සූත්‍රයඃ-** 1 "මහණෙනි, උපන්නාවූ මේ පසක් දුරුකරන්ට නොහැකි වෙත්.

2 "කවර පසක්ද යත්? උපන්නාවූ රාගය තෙම දුරු කිරීමට නොහැකිවේ. උපන්නාවූ ද්වෙෂයතෙම දුරුකිරීමට නොහැකිවේ. උපන්නාවූ මොහය තෙම දුරුකිරීමට නොහැකි වේ. උපන්නාවූ වැටහීම (හෙවත්) කියනු කැමති බව දුරු කිරීමට නොහැකිවේ. උපන්නාවූ ගමන් යාමෙහි සිත දුරු කිරීමට නොහැකිවේ. යන පසයි. මහණෙනි, මේ පස වනාහි උපන්නාවූ දුරුකිරීමට නොහැකි වෙත්යයි වදාළේය."

---

## 17 අඝාත වර්ගය.

**11 ආඝාත පටිවිනය සූත්‍රයඃ-** 1 "මහණෙනි, යම් අරමුණෙක්හි උපන්නාවූ ක්‍රොධය සියලු ආකාරයෙන් දුරු කටයුතුද ඒ මේ ක්‍රොධ සංසිඳීම් පසක් වෙත්.

2 "කවර පසක්ද යත්? ii මහණෙනි, යම් පුද්ගලයෙක් කෙරෙහි ක්‍රොධය උපදීනම්, ඒ පුද්ගලයා කෙරෙහි (iii) මෛත්‍රිය

වැඩිය යුතුයි. (iv) මෙසේ ඒ පුද්ගලයා කෙරෙහි ක්‍රොධය දුරුකටයුතු වේ.

3 (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) කරුණාව වැඩිය යුතුයි. (මෙහි 2 (iv) යෙදිය යුතුයි.)

4 (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) ඒ පුද්ගලයා කෙරෙහි උපෙක්ෂාව වැඩිය යුතුයි. (මෙහි 2 (iv) යෙදිය යුතුයි.)

5 (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) ඒ පුද්ගලයා කෙරෙහි සිහි නොකිරීමට මෙනෙහි නොකිරීමට පැමිණිය යුතුයි. (මෙහි 2 (iv) යෙදිය යුතුයි.

6 (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) ඒ පුද්ගලයා කෙරෙහි ආයුෂ්මත් තෙමේ කර්මය ස්වකීය කොට ඇත්තේ කර්මය උරුම කොට ඇත්තේ කර්මය උත්පත්ති කාරණාකොට ඇත්තේ කර්මය නෑයන් කොට ඇත්තේය. කර්මය පිහිට කොට ඇත්තේය, යහපත්වූ හෝ ලාමකවූ හෝ යම් කර්මයක් කරන්නේ එයට උරුමඇත්තෙක් වන්නේයයි කර්මය ස්වකීය කොට ඇති බව අධිෂ්ඨාන කළයුතුයි. (මෙහි 2 (iv) යෙදිය යුතුයි.)

7 (මෙය මේ සූත්‍රයේ 1 ඡෙදය මෙනි)

**12 සාරිපුත්ත ආඝාතක විනය සූත්‍රයඃ-** 1 "එකල්හි වනාහි ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරතෙම "ඇවැත්නි, මහණෙනියි" භික්ෂූන්ට ඇමතූසේක. 'ඇවැත්නි' කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් සාරීපුත්‍ර ස්ථවිරයන්ට ප්‍රතිවචන දුන්හ. ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරතෙම මෙය වදාළේය.

2 "ඇවැත්නි, යම් අරමුණක භික්ෂූහුගේ උපන්නාවූ ක්‍රොධය සියලු ආකාරයෙන් දුරුකළ යුතුද ඒ මේ ක්‍රොධ සංසිඳීම් පසක් වෙත්.

3 "කවර පසක්ද යත්? ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් තෙම අපිරිසිදුවූ කයින් හැසිරීම ඇත්තේ පිරිසිදුවූ වචනයෙන් හැසිරීම ඇත්තේ වෙයිද, (ii) ඇවැත්නි, මෙබඳු පුද්ගලයා කෙරෙහිද ක්‍රොධය දුරු කටයුතු වේ.

4. (i) "ඇවැත්නි, මේ ශාසනයෙහි වනාහි ඇතැම් පුද්ගලයෙක් අපිරිසිදුවූ වචනයෙන් හැසිරීම ඇත්තේ පිරිසිදුවූ කයින් හැසිරීම ඇත්තේ වේද, (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

5 (i) ඇවැත්නි, මේ ශාසනයෙහි වනාහි ඇතැම් පුද්ගලයෙක් තෙම අපිරිසිදුවූ කයින් හැසිරීම ඇත්තේ අපිරිසිදුවූ වචනයෙන් හැසිරීම ඇත්තේ වේද, කලින් කල චිත්තයා සම්බන්ධ අවකාශයක් චිත්තයා සම්බන්ධ ප්‍රසාදයකුත් ලබාද, (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

6 ඇවැත්නි, මේ ශාසනයෙහි වනාහි ඇතැම් පුද්ගලයෙක් තෙම අපිරිසිදුවූ කයින් හැසිරීම ඇත්තේ, අපිරිසිදුවූ වචනයෙන් හැසිරීම ඇත්තේවේද, කලින් කල චිත්තයාගේ අවකාශයක් චිත්තයාගේ ප්‍රසාදයකුත් නොලබාද (ii) මෙහි 3 (ii) ඡේද යෙදිය යුතුයි.)

7 (i) ඇවැත්නි, මේ ශාසනයෙහි වනාහි ඇතැම් පුද්ගලයෙක් තෙම පිරිසිදුවූ කයින් හැසිරීම ඇත්තේ පිරිසිදුවූ වචනයෙන් හැසිරීම ඇත්තේ වේද, කලින් කල චිත්තයාගේ අවකාශයක් චිත්තයාගේ ප්‍රසාදයකුත් ලබාද, (මෙහි 3 (ii) ඡේද යෙදිය යුතුයි.)

8 (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) කෙසේ ඒ පුද්ගලයා කෙරෙහි ක්‍රොධය දුරුකටයුතුද? ඇවැත්නි, යම්සේ පංසුකූලික භික්ෂුවක් තෙම විථියෙහි රෙදිකඩක් දැක වම්පයින් මැඩ දකුණු පයින් දිගහැර එහි යම් තද කොටසක් වේද, එය පලා ගෙණයන්නේද, ඇවැත්නි, මෙපරිද්දෙන්ම යම් මේ පුද්ගලයෙක් තෙම අපිරිසිදුවූ කයින් හැසිරීම ඇත්තේ පිරිසිදුවූ වචනයෙන් හැසිරීම ඇත්තේද මොහුගේ යම් අපිරිසිදු කයින් හැසිරීම් බවක් වේද, ඒ කාලයෙහි මොහුගේ එය මෙනෙහි නොකටයුතුයි. මොහුගේ යම් පිරිසිදු වචනයෙන් හැසිරීම් බවක් වේනම් ඕ තොමෝ එකල්හි මෙනෙහි කළ යුත්තීය. (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

9 (මෙහි 4 (i) යෙදිය යුතුයි.) කෙසේ ඒ පුද්ගලයා කෙරෙහි ක්‍රොධය දුරුකට යුතුද? ඇවැත්නි, යම්සේ පොකුණක් සෙවෙල් පරඬැල් වලින් ගැවසුනී වේද, ඉක්බිති ග්‍රීෂ්මයෙන් තැවුනාවූ ග්‍රීෂ්මයෙන් පෙළුනාවූ ක්ලාන්තවූ හටගත් තෘෂ්ණා ඇත්තාවූ

පැන් බොනු කැමතිවූ පුරුෂයෙක් එන්නේද, හෙතෙම ඒ පොකුණට බැස දෙඅතින් එහා මෙහා සෙවෙල් පරඬැල් ඉවත්කොට හස්තපූටයෙන් පානයකොට යන්නේද, ඇවැත්නි, මෙපරිද්දෙන්ම යම් මේ පුද්ගලයෙක් තෙම අපිරිසිදු වචනයෙන් හැසිරීම ඇත්තේ පිරිසිදු කයින් හැසිරීම ඇත්තේද, මොහුගේ යම් අපිරිසිදු වචනයෙහි හැසිරීම් බවක් වේද, ඕතොමෝ එකල්හි මෙනෙහි නොකටයුත්තීය. මොහුගේ යම් පිරිසිදු කයින් හැසිරීම් ඇති බවකුත් වේනම් ඕතොමෝ එකල්හි මෙනෙහි කටයුත්තීය. (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

10 (මෙහි 5 (i) යෙදිය යුතුයි.) කෙසේ ඒ පුද්ගලයා කෙරෙහි ක්‍රොධය දුරුකට යුතුද? ඇවැත්නි, යම්සේ ගව පිය වරෙහි ස්වල්පවූ ජලයක් වේද, ඉක්බිති ග්‍රීෂ්මයෙන් තැවුනාවූ ග්‍රීෂ්මයෙන් පෙළුනාවූ ක්ලාන්තවූ හටගත් තෘෂ්ණා ඇත්තාවූ පැන් බොනු කැමතිවූ පුරුෂයෙක් එන්නේද, ඕහට මෙබඳු සිතක් වන්නේය. 'මේ ගව පියවරෙහි ජලය වනාහි ස්වල්පය ඉදින් මම හස්තපුටයෙන් හෝ බොන්නෙම්ද, භාජනයෙන් හෝ කළඹන්නෙම්ද, එය අවුල් කරන්නෙම්ද, එය නොපිය යුත්තක්ද කරන්නෙමි. මම දැතින් හා දෙදනින් හෙව ගවයෙකු බොන්නාක් මෙන් පානයකොට යන්නෙම්නම් යෙහෙකැයි' හෙතෙම දැතින් හා දෙදනින් හෙව ගවයෙකු බොන්නාක් මෙන් පානයකොට යන්නේද (මෙහි 5 (i) යෙදිය යුතුයි.) මොහුගේ යම් අපිරිසිදු කයින් හැසිරෙන බවක් වේද, ඕතොමෝ එකල්හි මෙනෙහි නොකට යුත්තීය. මොහුගේ යම් අපිරිසිදු වචනයෙන් හැසිරීම් බවකුත් වේද ඕතොමෝද එකල්හි මෙනෙහි නොකට යුත්තීය. හෙතෙම කලින් කල චිත්තයාගේ යම් අවකාශයකුත් චිත්තයාගේ යම් ප්‍රසාදයකුත් ලබයිද, මොහුගේ එයම එකල්හි මෙනෙහි කටයුතුයි. (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

11 (මෙහි 6 (i) යෙදිය යුතුයි.) කෙසේ ඒ පුද්ගලයා කෙරෙහි ක්‍රොධය දුරුකට යුතුද? ඇවැත්නි, යම්සේ පුරුෂයෙක් හටගත් ආබාධ ඇත්තේ දුකින් පෙළුනේ දැඩි ගිලන් වූයේ දික් මගට පිළිපන්නේ වේද, ඔහුගේ ඉදිරියෙනුත් ගම දුරවන්නේ වේද, පසුභාගයෙනුත් ගම දුරවන්නේද, හෙතෙම හිතවූ භෝජන

නොලබන්නේ නම්, හිතවූ බෙහෙත් නොලබන්නේ නම් සුදුසු උපස්ථායකයෙකු නොලබන්නේ නම් ගමෙහි අධිපතියෙකු නොලබන්නේ නම් දීර්ඝ මාර්ගයට පිළිපන්නාවූ එක්තරා පුරුෂයෙක් ඔහු දක්නේද, හෙතෙම ඒ පුරුෂයා කෙරෙහි කරුණාව ඇති බවම පිහිටු වන්නේය. දයාව ඇති බවම පිහිටුවන්නේය. අනුකම්පාවම පිහිටු වන්නේය. මේ පුරුෂතෙම හිතවූ භෝජන ලබන්නේ නම් හිතවූ බෙහෙත් ලබන්නේ නම් සුදුසු උපස්ථායකයෙකු ලබන්නේ නම්, ගමෙහි අධිපතියෙකු ලබන්නේ නම් ඉතා යෙහෙක ඊට හේතු කවරේද? මේ පුරුෂතෙම හානියට ව්‍යසනයට නොපැමිණේවායි ඇවැත්නි, මෙපරිද්දෙන්ම යම් මේ (මෙහි 6 (i) යෙදිය යුතුයි) ඇවැත්නි, මෙබඳු පුද්ගලයා කෙරෙහිද කරුණාව ඇති බවම පිහිටුවිය යුතුයි. දයාවම පිහිටුවිය යුතුයි. අනුකම්පාවම පිහිටුවිය යුතුයි. මේ ආයුෂ්මත් තෙමේ කයෙහි දුශ්චරිතය හැර කයෙහි සුචරිතය වඩන්නේ නම් වචනයෙහි දුශ්චරිතය හැර වචනයෙහි සුචරිතය වඩන්නේ නම් සිතෙහි දුශ්චරිතය හැර සිතෙහි සුචරිතය වඩන්නේ නම් ඉතා යෙහෙක. ඊට හේතු කවරේද, මේ ආයුෂ්මත් තෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැප නැත්තාවූ දුකට පිහිටවූ විවසව පතිත වන්නාවූ නරකයෙහි නූපදීවායි (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

12 (මෙහි 7 (i) යෙදිය යුතුයි.) කෙසේ ඒ පුද්ගලයා කෙරෙහි ක්‍රොධය දුරුකට යුතුද? ඇවැත්නි, යම්සේ ප්‍රසන්න ජලය ඇත්තාවූ මිහිරි ජලය ඇත්තාවූ සිහිල් දිය ඇත්තාවූ සුදුපැහැ ඇත්තාවූ මනාකොට ඇත්තාවූ සිත්කළුවූ නොයෙක් ගස්වලින් ගැවසීගත්තාවූ පොකුණක් වේද, ඉක්බිති ග්‍රීෂ්මයෙන් තැවුනාවූ ග්‍රීෂ්මයෙන් පෙළුනාවූ ක්ලාන්තවූ හටගත් තෘෂ්ණාව ඇත්තාවූ පැන් බොනු කැමැතිවූ පුරුෂයෙක් එන්නේද හෙතෙම ඒ පොකුණට බැස ස්නානය කොටද පැන් බීද ගොඩ නැගී එහිම රුක් සෙවණෙහි හිඳින්නේ හෝ නිදන්නේ හෝ වන්නේද, ඇවැත්නි, මෙපරිද්දෙන්ම (මෙහි 7 (i) යෙදිය යුතුයි.) මොහුගේ යම් පිරිසිදුවූ කයින් හැසිරීම ඇති බවකුත් වේද, ඕතොමෝ මොහුගේ එකල්හි සිහිකට යුත්තීය. මොහුගේ යම් පිරිසිදු

වචනයෙන් හැසිරීම ඇති බවකුත් වේද, ඕතොමෝද මොහු පිළිබඳව එකල්හි සිහිකට යුත්තීය. හෙතෙම කලින් කල යම් සිතේ අවකාශයකුත් සිතේ ප්‍රසාදයකුත් ලබාද, එයද මොහු පිළිබඳව එකල්හිම මෙනෙහි කටයුතුයි. (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) ඇවැත්නි, හාත්පසින් ප්‍රසාද එළවන්නාවූ පුද්ගලයා නිසා සිත පහදියි.

13 "ඇවැත්නි, මොහු වනාහි (මෙහි 2 ඡේදය යෙදිය යුතුයි.)

13 **අලංසාකච්ඡ සූත්‍රයː-** (මේ ඡේදය මේ වර්ගයේ 12 සූත්‍රයේ 1 ඡේදය මෙනි)

2 "ඇවැත්නි, ධර්ම පසකින් යුක්තවූ භික්ෂූතෙම බ්‍රහ්මචාරීන්ගේ සාකච්ඡාවට සුදුසු වෙයි.

3 "කවර පසකින්ද යත්? ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුතෙම තෙමේත් ශීලයෙන් යුක්තවේද, ශීල සම්පත්තිය පිළිබඳ කථාවෙහි ආවාවූ ප්‍රශ්නය ප්‍රකාශ කරන්නේත් වේද, තෙමේත් සමාධියෙන් යුක්ත වේද, සමාධි සම්පත්තිය පිළිබඳ කථාවෙහි ආවාවූ ප්‍රශ්න විසඳන්නේත් වේද, තෙමේත් ප්‍රඥාවෙන් යුක්තවේද, ප්‍රඥා සම්පත්තිය පිළිබඳ කථාවෙහි ආවාවූ ප්‍රශ්නය විසඳන්නේත් වේද, තෙමේත් විමුක්තියෙන් යුක්ත වේද, විමුක්ති සම්පත්තිය පිළිබඳ කථාවෙහි ආවාවූ ප්‍රශ්නය විසඳන්නේත් වේද, තෙමේත් විමුක්තිඥාන දර්ශනයෙන් යුක්ත වේද, විමුක්ති ඥානදර්ශන සම්පත්තිය පිළිබඳ කථාවෙහි ආවාවූ ප්‍රශ්නය විසඳන්නේත් වේද යන පසිනි.

4 (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි)

14 **අලංසාජීව සූත්‍රයː-** 2. "ඇවැත්නි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම සබ්‍රම්සරුන්ගේ සමාන ජීවිකාවට සුදුසුවේ.

3 (මෙය මේ වර්ගයේ 13 සූත්‍රයේ 3 ඡේදය මෙනි)

4 (මෙය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

15 **පඤ්හ පුච්ඡන සූත්‍රයː-** 2 "ඇවැත්නි, යම්කිසිවෙක් වනාහි අනිකෙකුගෙන් ප්‍රශ්න අසයිද, ඒ සියල්ල කරුණු පසකින් හෝ මොවුන්ගෙන් එක්තරා කරුණකින් හෝ වෙයි.

3 "කවර පසකින්ද යත්? නුවණ මඳ බැවින් ඉතා මුළා වන බැවින් අනිකෙකුගෙන් ප්‍රශ්න අසයි. ලාමක ආසා ඇත්තේ ආසාවෙන් මඩනා ලද්දේ අනිකාගෙන් ප්‍රශ්න අසයි. පරිභව කරන්නේ අනිකාගෙන් ප්‍රශ්න අසයි. දැනගණු කැමැත්තේ අනිකාගෙන් ප්‍රශ්න අසයි. නොහොත් ඉතා කිපෙමින් අනිකාගෙන් ප්‍රශ්න අසයි. ඉදින් මා විසින් ප්‍රශ්නය අසන ලද්දේ මනාකොටම ප්‍රකාශ කරන්නේනම් මෙසේ මෙය යහපති. ඉදින් මා විසින් ප්‍රශ්නය අසන ලද්දේ මනාකොටම ප්‍රකාශ නොකරන්නේ නම් මම මොහුට මනාකොටම ප්‍රකාශ කරන්නෙමියි'

4 (මෙය මේ සූත්‍රයේ 2 ඡේදය මෙනි)

5 "ඇවැත්නි, 'මම වනාහි මෙබඳු සිත් ඇත්තේ අනිකාගෙන් ප්‍රශ්නය අසමි. ඉදින් මා විසින් ප්‍රශ්නය අසනලද්දේ මනාකොටම ප්‍රකාශ කරන්නේ නම් මෙසේ මේ යහපති, ඉදින් මා විසින් ප්‍රශ්නය අසන ලද්දේ මනාකොටම ප්‍රකාශ නොකරන්නේ නම්, මම මොහුට මනාකොටම ප්‍රකාශ කරන්නෙමියි' වදාළේය.

**16 වෙදයිත නිරොධ සූත්‍රයඃ- 2** "ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුතෙම ශීලයෙන් යුක්තවූයේ සමාධියෙන් යුක්තවූයේ ප්‍රඥාවෙන් යුක්තවූයේ සංඥා වේදයිත නිරොධ සමාපත්තියට සමවදින්නේද වේ. එයින් නැගිටින්නේද වේ. යන මේ කරුණ ඇත්තේය. ඉදින් මේ ආත්මයෙහිම රහත් බවට නොපැමිණෙන්නේ නම් (ii) කැබලිකොට බුදින්නාවූ ආහාර ඇති, දෙවියන්ගේ සහභාවය ඉක්මවාම එක්තරා සිතින් නිපදවූ බ්‍රහ්ම කයකට පැමිණියේ සංඥා වේදයිත නිරොධ සමාපත්තියට පැමිණෙන්නේද එයින් නැගිටින්නේද (iii) යන මේ කරුණ ඇත්තේයයි' මෙසේ කීකල්හි ආයුෂ්මත් උදායි ස්ථවිරතෙම ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන්ට මේ කීයේය.

3 "ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයෙනි, මෙය කරුණු රහිතයි අවකාශ රහිතය. ඒ භික්ෂුතෙම කබලීකාහාරය අනුභව කරන්නාවූ දෙවියන්ගේ සහභාවය ඉක්මවාම එක්තරා මනොමය බ්‍රහ්ම කයකට පැමිණියේ සංඥා වේදයිත යන නිරොධසමාපත්තියට

සමවදින්නේද, එයින් නැගිටින්නේද යන යමක් ඇද්ද, මේ කරුණ නැත්තේය.

4 'දෙවනුවද ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරතෙම භික්ෂූන්ට ආමන්ත්‍රණය කෙළේය. (මෙහි 2, 3 ඡේද යෙදිය යුතුයි.)

5 "තුන්වෙනුවද ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිර තෙම භික්ෂූන්ට ආමන්ත්‍රණය කෙළේය.

6 "ඉක්බිති ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන්ට මේ අදහස විය. තුන්වෙනි වර දක්වාම ආයුෂ්මත් උදායි ස්ථවිර තෙම මාගේ වචනය වළක්වයි. කිසි භික්ෂුවක්තෙම මාගේ වචනය අනුමෝදන් නොවෙයි. මම භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණෙන්නෙම් නම් ඉතා යෙහෙක කියායි. ඉක්බිති ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන්වහන්සේ වැඳ එකත්පස්ව හුන්නේය. එකත්පස්ව හුන්නාවූ ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරතෙම භික්ෂූන්ට ආමන්ත්‍රණය කෙළේය. (මෙහි 2, 3 ඡේද යෙදිය යුතුයි.)

7-8 (මේ ඡේද මේ සූත්‍රයේ 4, 5 ඡේද මෙනි.)

9 (මේ ඡේදය මේ සූත්‍රයේ 2, 3 ඡේද මෙන් වෙත්)

10 "ඉක්බිති ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන්ට මේ සිත විය. භාග්‍යවතුන් වහන්සේ හමුවෙහිද ආයුෂ්මත් උදායි ස්ථවිර තෙම තුන්වෙනි වර දක්වා වළක්වයි. මාගේ වචනය කිසි භික්ෂුවක් තෙම අනුමෝදන් නොවෙයි, මම නිශ්ශබ්ද වන්නෙම් නම් ඉතා යෙහෙක කියායි. ඉක්බිති ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිර තෙම නිශ්ශබ්ද වූයේය.

11 "එකල්හි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් උදායි ස්ථවිරයන්ට ආමන්ත්‍රණය කළසේක. "උදායිය නුඹ වනාහි කවර නම් ධ්‍යාන සිතින් නිපදවන ලද බ්‍රහ්ම කයක් බලාපොරොත්තු වෙහිද?"

"ස්වාමීනි, රූප නැත්තාවූ සංඥාවෙන් නිපන් යම් දෙවි කෙනෙක් වෙද්ද? ඔව්හු යයි" කීයේය.

"උදායීය, අඥානවූ අව්‍යක්තවූ තොපගේ කීමෙන් කවර ප්‍රයෝජනයක්ද? නුඹත් කියයුත්තෙකුකොට හඟින්නෙහිද?" වදාළේය.

12 "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට ආමන්ත්‍රණය කළසේක. ආනන්දය, ස්ථවිර භික්ෂූහු වෙහෙසනු ලබන්නහුට උපෙක්ෂා වන්නහු නම් ඇත්තාහුද? ආනන්දය, ස්ථවිර භික්ෂුව වෙහෙසනු ලබන කල්හි කරුණාව ඇති බවකුත් නොවන්නේද? එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක.

13 "මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම ශීලයෙන් යුක්තවූයේ සමාධියෙන් යුක්තවූයේ සංඥාවෙදයිත නිරෝධ සමාපත්තියට සමවදින්නේයයිද එයින් නැගිටින්නේයයිද මේ කාරණය ඇත්තේය. ඉදින් මේ ආත්මයෙහිම අර්හත්වයට නොපැමිණෙන්නේ නම් කබලීකාහාර බුදින්නාවූ දෙවියන්ගේ සහභාවය ඉක්මවාම එක්තරා ධ්‍යාන සිතින් නිපදවන ලද බ්‍රහ්මකයකට පැමිණියේ සංඥා වේදයිත නිරෝධ සමාපත්තියට සමවදින්නේයයිද, එයින් නැගිටින්නේයයිද, මේ කාරණය ඇත්තේයයි" භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සුගතයන් වහන්සේ මෙය වදාරා හුනස්නෙන් නැගිට විහාරයට වැඩියසේක.

14 ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේ වැඩිය නොබෝ කල්හි ආයුෂ්මත් උපවාන ස්ථවිර තෙම යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් උපවාන ස්ථවිරයන්ට මෙය කීවේය. 'ආයුෂ්මත් උපවාන ස්ථවිරයෙනි, අන්‍යයෝ ස්ථවිර භික්ෂූන්ට වෙහෙසත්. අපි ඔවුන් නොවිචාරමු. ආයුෂ්මත් උපවාන ස්ථවිරයෙනි, භාග්‍යවතුන් වහන්සේ සවස් වේලෙහි පල සමවතින් නැඟී සිටිසේක්, මෙයම අරභයා ප්‍රකාශ කරන්නේ නම් මෙය වනාහි ආශ්චර්‍ය්‍යයක් නොවේ. යම්සේ ආයුෂ්මත් උපවාන ස්ථවිරයන්ටම මෙහි ප්‍රතිවචන වැටහෙන්නේද, එසේයි. දැන්මම අපට දොම්නස ඇතුල්වීයයි" කීයේය.

15 ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් වේලෙහි පලසමවතින් නැගී සිටිසේක් උපස්ථාන ශාලාව යම් තැනෙක්හිද එතැනට පැමිණිසේක. පැමිණ, පනවන ලද අස්නෙහි වැඩහුන්සේක. වැඩහිඳ භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් උපවාන ස්ථවිරයන්ට මෙය වදාළසේක. 'උපවානය, කෙතෙක් ධර්මවලින් යුක්තවූ ස්ථවර භික්ෂුතෙම බ්‍රහ්මචාරීන්ට ප්‍රියයෙක්ද මනාපවූවෙක්ද ගරු කටයුත්තෙක්ද බුහුමන් කටයුත්තෙකුත් වේද?"

16 "ස්වාමීනි, ධර්ම පසකින් යුක්තවූ ස්ථවිර භික්ෂුතෙම බ්‍රහ්මචාරීන්ට ප්‍රියවූවෙක්ද, මනාපවූවෙක්ද ගරු කටයුත්තෙක්ද බුහුමන් කටයුත්තෙක්ද වේ.

17 "කවර පසකින්ද යත්? ස්වාමීනි, මේ ශාසනයෙහි ස්ථවිර භික්ෂුතෙම සිල්වත් වේද, ප්‍රාතිමොක්ෂ සංවරයෙන් යුක්තවූයේ වේද, ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තවූයේ ස්වල්ප තරම් වරදවල භය දක්නා ගති ඇතුව වාසය කෙරේද, ශික්ෂාපදයන්හි සමාදන්ව හික්මේද, බහුශ්‍රැතවේද, ඇසූ දෙය දරන්නේ අසනලද්දවුන්ගේ රැස් කිරීම ඇත්තේ වේද, දෘෂ්ටියෙන් මනාව ප්‍රතිවේධ කරණ ලද්දේ වේද, යහපත් වචන ඇත්තේ, යහපත් වචන ඝෝෂා ඇත්තේ විහිදුවන ලද කෙළතොලු නොවූ අර්ථය හඟවන්නාවූ පුරවැසි වචනයෙන් යුක්තවූයේ වේද, උතුම් සිතෙහි හටගත්තාවූ මේ ආත්මයෙහි සැප විහරණ ඇත්තාවූ සතර ධ්‍යානයන්ගේ කැමැති පරිදි ලැබීම ඇත්තේ පහසුවෙන් ලැබීම ඇත්තේ බහුලව ලැබීම ඇත්තේ වේද, ආශ්‍රවයන් නැසීමෙන් ආශ්‍රව රහිත අර්හත් ඵල සමාධිය, අර්හත්ඵල ප්‍රඥාව මෙලොවදීම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කෙරේද යන පසිනි."

18 (මෙය 16 ඡෙදය මෙනි.)

19 "උපවානය, යහපති, යහපති. උපවානය, මේ ධර්ම පසින් වනාහි යුක්තවූ ස්ථවිර භික්ෂුතෙම බ්‍රහ්මචාරීන්ට ප්‍රිය වූවෙක්ද, මනාපවූවෙක්ද, ගරු කටයුත්තෙක්ද, බුහුමන් කටයුත්තෙක්ද වේ. උපවානය, ඉදින් මේ පඤ්ච ධර්මයෝ ස්ථවිර භික්ෂුහුගේ

විද්‍යමාන නොවන්නාහු නම් කවර කාරණයකින් ඔහුට බ්‍රහ්මචාරීහු සත්කාර කරන්නාහුද, ගෞරව කරන්නාහුද, බුහුමන් කරන්නාහුද, පූජා කරන්නාහුද, දත් වැටුනු බැවින්ද, හිස පැසුනු බැවින්ද, ඇඟ රැලි වැටුනු බැවින්ද උපවානය යම් හෙයකිනුත් මේ පඤ්ච ධර්මයෝ ස්ථවිර භික්ෂූහුගේ පවතිද්ද, එහෙයින් ඔහුට බ්‍රහ්මචාරීහු සත්කාර කරත් ගෞරව කරත්, බුහුමන් කරත්. පූජා කරත්යයි" වදාළේය.

17 චොදක ධම්ම සූත්‍රයඃ- 2 "ඇවැත්නි, අනිකාට චෝදනා කරනු කැමතිවූ චෝදක භික්ෂූහු විසින් කරුණු පසක් තමන් කෙරෙහි පිහිටුවා අන්‍යයා චෝදනා කටයුතුවේ.

3 "කවර පසක්ද යත්? සුදුසු කාලයෙහි නොකියන්නෙමි. වූවකින් කියන්නෙමි නුවූවකින් නොකියන්නෙමි. මෘදු වශයෙන් කියන්නෙමි. පරුෂ වශයෙන් නොකියන්නෙමි. වැඩ සහිතවූවකින් කියන්නෙමි. අවැඩ සහිතවූවකින් නොකියන්නෙමි. මෛත්‍රී සිතින් කියන්නෙමි. ද්වෙෂ සිතින් නොකියන්නනෙමියි යන පසයි.

4 (මෙය 2 ඡෙදය මෙනි.)

5 "ඇවැත්නි, මේ ශාසනයෙහි මම අකාලයෙහි චෝදනා කරන්නාවූ සුදුසු කාලයෙහි චෝදනා නොකරන්නාවූ කිපියාවූ ඇතැම් පුද්ගලයෙකු දක්නෙමි. අභූතයෙන් චෝදනා කරණු ලබන්නාවූ භූතයෙන් චෝදනා නොකරන්නාවූ කිපියාවූද පරුෂ වශයෙන් චෝදනා කරන්නාවූ මෘදුවශයෙන් චෝදනා නොකරන්නාවූ කිපියාවූද, අවැඩ යුක්තවූවකින් චෝදනා කරන්නාවූ වැඩ සහිතවූවකින් චෝදනා නොකරන්නාවූ කිපියාවූද, ද්වෙෂ සිතින් චෝදනා කරන්නාවූ මෛත්‍රී සිතින් චෝදනා නොකරන්නාවූ කිපියාවූද ඇතැම් පුද්ගලයෙකු දක්නෙමි. ඇවැත්නි, අධර්මයෙන් චෝදනා කරණ ලද භික්ෂුහට පස් ආකාරයකින් විපිළිසර වීම ඉපදවිය යුතුයි.

6 "ආයුෂ්මත් තෙමේ නුසුදුසු කල්හි චෝදනා කරණ ලද්දේ සුදුසු කල්හි නොවේ. තොපට විපිළිසර වීමට සුදුසුය. ආයුෂ්මත් තෙමේ අසත්‍යයෙන් චෝදනා කරණලදී සත්‍යයෙන් නොවේ.

තොපට විපිළිසර වීමට සුදුසුය. ආයුෂ්මත් තෙමේ ඵරුෂ වශයෙන් චෝදනා කරණ ලදී. මෘදු වශයෙන් නොවේ. තොපට විපිළිසර වීමට සුදුසුය. ආයුෂ්මත් තෙමේ අවැඩ සහිත වූවකින් චෝදනා කරණ ලදී. වැඩ සහිත වූවකින් නොවේ. තොපට විපිළිසර වීමට සුදුසුය. ආයුෂ්මත් තෙමේ ද්වෙෂ සිතින් චෝදනා කරණ ලදී. මෛත්‍රී සිතින් නොවේ. තොපට විපිළිසර වීමට සුදුසුය.

7 "ඇවැත්නි, අධර්මයෙන් චෝදනා කරණ ලද භික්ෂුහට මේ පස් ආකාරයෙන් විපිළිසර වීම ඉපදවිය යුතුයි. ඇවැත්නි, අධර්මයෙන් චෝදනා කරන්නාවූ භික්ෂුහට පස් ආකාරයකින් විපිළිසරය ඉපදවිය යුතුයි. (මෙහි 6 ඡේදය යෙදිය යුතුයි.) ඇවැත්නි, අධර්මයෙන් චෝදනා කරන්නාවූ භික්ෂුහට මේ පස් ආකාරයෙන් විපිළිසරය ඉපිදවිය යුතුයි. ඊට හේතු කවරේද? යම්සේ අන්‍ය භික්ෂුවක් තෙමේද අසත්‍යයෙන් චෝදනා කටයුතු කොට නොහඟින්නේද එසේයි.

8 "ඇවැත්නි, මෙහි වනාහි මම සුදුසු කල්හි චෝදනා කරණු ලබන්නාවූ නොකල්හි චෝදනා නොකරන්නාවූ කිපුනාවූ ඇතැම් පුද්ගලයෙකු දකිමි. සත්‍යයෙන් චෝදනා කරන්නාවූ අසත්‍යයෙන් චෝදනා නොකරන්නාවූ කිපුනාහුද, මෘදු වශයෙන් චෝදනා කරන්නාවූ ඵරුෂ වශයෙන් චෝදනා කරන්නාවූ කිපුනාහුද වැඩ සහිතවූවකින් චෝදනා කරන්නාවූ අවැඩ සහිතවූවකින් චෝදනා නොකරන්නාවූ කිපුනාහුද, මෛත්‍රී සිතින් චෝදනා කරන්නාවූ ද්වෙෂ සිතින් චෝදනා නොකරන්නාවූ කිපුනාහුද, ඇතැම් පුද්ගලයෙකු දක්නෙමි. ඇවැත්නි, ධර්මයෙන් චෝදනා කරණ ලද භික්ෂුහට පස් ආකාරයකින් විපිළිසරය නොඉපදවිය යුතුයි.

9 "ආයුෂ්මත් තෙමේ සුදුසු කල්හි චෝදනා කරණ ලදී. නුසුදුසු කල්හි නොවේ. තොපට විපිළිසර නොවීමට සුදුසුය. ආයුෂ්මත් තෙමේ සත්‍යවූවකින් චෝදනා කරණ ලදී. අසත්‍යයෙන් නොවේ. තොපට විපිළිසර නොවීමට සුදුසුය. ආයුෂ්මත් තෙමේ මෘදු වශයෙන් චෝදනා කරණ ලදී. ඵරුෂ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වශයෙන් තොපට විපිළිසර නොවීමට සුදුසුය. ආයුෂ්මත් තෙමේ වැඩ සහිත වූවකින් චෝදනා කරණ ලදී. අවැඩ සහිත වූවකින් නොවේ. තොපට විපිළිසර නොවීමට සුදුසුය. ආයුෂ්මත් තෙමේ මෛත්‍රී සිතින් චෝදනා කරණ ලදී. ද්වෙෂ සිතකින් නොවේ. තොපට විපිළිසර නොවීමට සුදුසුයයි.

10 "ඇවැත්නි, ධර්මයෙන් චෝදනා කරණ ලද භික්ෂුහට මේ පස් ආකාරයෙන් විපිළිසරය ඉපදවිය යුතුයි. ඇවැත්නි, ධර්මයෙන් චෝදනා කරන්නාවූ භික්ෂුහට පස් ආකාරයකින් නොවිපිළිසර වීම ඉපදවිය යුතුයි. (මෙහි 9 ඡෙදය යෙදිය යුතුයි.) ඇවැත්නි, ධර්මයෙන් චෝදනා කරන්නාවූ භික්ෂුහට මේ පස් ආකාරයෙන් නොවිපිළිසර වීම ඉපදවිය යුතුයි. ඊට හේතු කවරේද? යම්සේ අන්‍ය භික්ෂුවක් තෙමේත් සත්‍ය වූවකින් චෝදනා කටයුතු කොට හඟින්නේද, එසේයි.

11 "ඇවැත්නි, චෝදනා ලද පුද්ගලයා විසින් සත්‍යයෙහිද නොකිපීමෙහිද යන ධර්ම දෙක්හි පිහිටිය යුතුයි. ඇවැත්නි, ඉදින් මටම සුදුසු කල්හි හෝ නුසුදුසු කල්හි සත්‍යයෙන් හෝ අසත්‍යයෙන් හෝ මෘදු වශයෙන් හෝ ඵරුෂ වශයෙන් හෝ වැඩ සහිතවූවකින් හෝ අවැඩ සහිතවූවකින් හෝ මෛත්‍රී සිතින් හෝ ද්වෙෂ සිතකින් හෝ අන්‍යයෝ චෝදනා කරන්නාහු නම් මමද සත්‍යයෙහිද නොකිපීමෙහිද යන ධර්ම දෙක්හිම පිහිටන්නෙමි. ඉදින් මා කෙරෙහි මේ ධර්මය ඇතැයි දන්නෙම්නම් මේ ධර්මය මා කෙරෙහි ඇත්තේයයි ඒ කියන්නෙමි. ඉදින් මේ ධර්මය මා කෙරෙහි නැත්තේයයි දන්නෙම් නම් මේ ධර්මය මා කෙරෙහි නැත්තේයයි එය කියන්නෙමියි" කීයේය.

18. **සීල විපන්න සූත්‍රය**:- 2. "ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, මෙසේද ඔව්හු කියනු ලබන්නාහුය. 'එතකුදු වුවත් මෙහි ඇතැම් හිස් පුරුෂයෝ පැදකුණු කිරීම් වශයෙන් නොගනිත් යයි' ස්වාමීනි, යම් ඒ පුද්ගලයෝ ශ්‍රද්ධා නැත්තාහු ජීවිකාව ප්‍රයෝජන කොට ඇත්තාහු වෙද්ද, ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූවාහු නොවෙද්ද, කෛරාටිකවූවාහු මායා ඇත්තාහු කෙටුභ

ශාස්ත්‍ර දන්නාහු උඩඟු වූවාහු, ඔසවා ගත් මාන නල ඇත්තාහු, චපල වූවාහු, දොඩමළු වූවාහු විසුරුණු වචන ඇත්තාහු ඉන්ද්‍රියන්හි නොරක්නාලද දොරටු ඇත්තාහු, භෝජනයෙහි පමණ නොදන්නාහු, නිදි දුරුකිරීමෙහි නොයෙදුනාහු, ශ්‍රමණ භාවයෙහි අපේක්ෂා නැත්තාහු ශික්ෂාවෙහි දැඩි ගෞරව නැත්තාහු, ප්‍රත්‍යය බහුලකොට ඇත්තාහු, සස්න ලිහිල් කොට ගත්තාහු, නීවරණයන්ට බැස ගැන්මෙහි පෙරදැරි වූවාහු, ප්‍රකර්ෂ විවේකයෙහි බහා තබන ලද ධුර ඇත්තාහු අලස වූවාහු ලාමක වීර්‍ය්‍ය ඇත්තාහු මුළාසිහි ඇත්තාහු, මනා නුවණ නැත්තාහු සිත් එකඟ නුවූවාහු, විශෙෂයෙන් කැරකුණු සිත් ඇත්තාහු, කෙළතොලු වූවාහු වෙද්ද, ඔව්හු මා විසින් මෙසේ කියනු ලබන්නාහු පැදකුණු වශයෙන් නොගණිත්,

3. "ස්වාමීනි, (ii) යම් ඒ කුල පුත්‍රයෝ වනාහි ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූවාහු, කෛරාටික නොවූවාහු මායා නැත්තාහු, කෙටුභ නොදන්නාහු, උඩඟුනොවූවාහු, උද්ගත මාන නල නැත්තාහු, චපල නුවූවාහු, දොඩමළු නුවූවාහු, නොවිසුරුණු වචන ඇත්තාහු. ඉන්ද්‍රියන්හි රක්නාලද දොරටු ඇත්තාහු, භෝජනයෙහි පමණ දන්නාහු, නිදි දුරු කිරීමෙහි යෙදුනාහු, ශ්‍රමණ භාවයෙහි අපේක්ෂා ඇත්තාහු, ශික්ෂාවෙහි දැඩි ගෞරව ඇත්තාහු, ප්‍රත්‍ය බහුලකොට නැත්තාහු, සස්න ලිහිල් කොට නොගත්තාහු, නීවරණයන්ට බැස ගැන්මෙහි බහා තබනලද ධුර ඇත්තාහු, ප්‍රකර්ෂ විවේකයෙහි පෙරදැරි වූවාහු, පටන්ගන්නාලද වීර්‍ය්‍ය ඇත්තාහු, හරණලද ආත්මාලය ඇත්තාහු, එළඹ සිටි සිහි ඇත්තාහු, මනා නුවණ ඇත්තාහු, සමාධි වූවාහු, එකඟවූ සිත් ඇත්තාහු, ප්‍රඥා ඇත්තාහු, කෙලතොලු නොවූවාහු වෙද්ද, (iii) ඔව්හු මා විසින් මෙසේ කියනු ලබන්නාහු පැදකුණු වශයෙන් ගණිත්යයිද," කීයේය.

4. "ශාරීපුත්‍රය, යම් ඒ පුද්ගලයෝ ශ්‍රද්ධා නැත්තාහු ජීවිකාව ප්‍රයෝජන කොට ඇත්තාහු ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි නොවූවාහු, කෛරාටික වූවාහු, මායා ඇත්තාහු, කෙටුභ ඇත්තාහු, උඩඟු වූවාහු උද්ගත මාන නල

ඇත්තාහු, චපල වූවාහු දොඩමළු වූවාහු, විසුරුණු වචන ඇත්තාහු, ඉන්ද්‍රියන්හි නොරක්නා ලද දොරටු ඇත්තාහු, භෝජනයෙහි පමණ නොදන්නාහු, නිදි දුරු කිරීමෙහි නොයෙදුනාහු ශ්‍රමණ භාවයෙහි අපේක්ෂා නැත්තාහු, ශික්ෂාවෙහි දැඩි ගෞරව නැත්තාහු, ප්‍රත්‍ය බහුලකොට ඇත්තාහු, සස්න ලිහිල්කොට ගත්තාහු, නීවරණයන්ට බැසගැන්මෙහි පෙරදැරිවූවාහු, ප්‍රකර්ෂ විවේකයෙහි බහා තබනලද ධුර ඇත්තාහු, අලසවූවාහු, ලාමක වීයර්‍ය ඇත්තාහු, මුළාසිහි ඇත්තාහු, මනා නුවණ නැත්තාහු, එකග නොවූ සිත් ඇත්තාහු, විශෙෂයෙන් කැරකුණු සිත් ඇත්තාහු, ප්‍රඥා නැත්තාහු, කෙලතොලු වූවාහු වෙද්ද, ඔව්හු සිටිත්වා.

5. "ශාරිපුත්‍රය, (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

ශාරිපුත්‍රය, ඔවුන්ට නුඹ කියව, ශාරිපුත්‍රය, සබ්‍රම්සරුන්ට අවවාද කරව, ශාරිපුත්‍රය, සබ්‍රම්සරුන් අසද්ධර්මයෙන් නැගිටුවා සද්ධර්මයෙහි පිහිටුවන්නෙමියි, සබ්‍රම්සරුන්ට අනුශාසනා කරව, ශාරිපුත්‍රය, මෙසේ වනාහි තොප විසින් හික්මිය යුතුයයි" වදාළේය."

19. **බිප්පනිසන්තී සූත්‍රයඃ-** 2. "ඇවැත්නි, 2 (ii) ශීල විපත්තියට පැමිණියාවූ දුශ්ශීලයාහට සම්‍යක් සමාධිය කරුණු රහිතවේ. සම්‍යක් සමාධිය නැතිකල්හි සම්‍යක් සමාධිහුගේ විපතට පැමිණියහුට තත්වූ පරිදි නුවණින් දැකීම හේතු රහිතවේ. තත්වූ පරිදි නුවණින් දැකීම නැති කල්හි තත්වූ පරිදි නුවණින් දැක්මෙහි විපතට පැමිණියහුට කලකිරීමෙන් නොඇල්ම හේතු රහිතවේ. කලකිරීමෙන් නොඇල්මෙහි විපතට පැමිණියහුට කෙලෙසුන් ගෙන් මිදීම, නුවණින් මිදීම, නුවණින් දැකීම හේතු රහිතවේ.

3 "ඇවැත්නි, යම්සේ වෘක්ෂය අතුපතරින් විපතට පැමිණියේද, ඒ වෘක්ෂයාගේ පතුරද සම්පූර්ණවීමට නොපැමිණේද, සිවියද, එලයද, හරයද, සම්පූර්ණවීමට නොපැමිණේද, ඇවැත්නි, මෙපරිද්දෙන්ම (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4. "ඇවැත්නි, ශීලයෙන් යුක්තවූ, සිල්වත්හට සම්‍යක් සමාධිය හේතු සහිතවේ. සම්‍යක් සමාධිය ඇතිකල්හි, සම්‍යක් සමාධියෙන් යුක්තවූවහුට තත්වූ පරිදි නුවණින් දැකීම හේතු සහිතවේ. තත්වූපරිදි නුවණින් දැකීම ඇතිකල්හි තත්වූ පරිදි නුවණින් දැකීමෙන් යුක්තවූවහුට කලකිරීමෙන් නොඇල්ම හේතු සහිතවේ. කලකිරීමෙන් නොඇල්ම ඇති කල්හි කලකිරීමෙන් නොඇල්මෙන් යුක්තවූවහුට කෙලෙසුන් කෙරෙන් මිදීම, නුවණින් දැකීම හේතු සහිතවේ.

5. "ඇවැත්නි, යම්සේ වෘක්ෂයක්තෙම අතුපතරින් ගැවැසීගත්තේ ඒ වෘක්ෂයාගේ පතුරත් සම්පූර්ණවීමටයේද, සිවියත්, ඵලයත්, හරයත් සම්පූර්ණවීමට යේද, ඇවැත්නි, මෙ පරිද්දෙන්ම ශීලයෙන් යුක්තවූ සිල්වත්හට සම්‍යක් සමාධිය හේතු සහිතවේ. සම්‍යක් සමාධිය ඇතිකල්හි සම්‍යක් සමාධියෙන් යුක්තවූවහුට තත්වූ පරිදි නුවණින් දැකීම හේතු සහිතවේ. තත්වූපරිදි නුවණින් දැකීම ඇතිකල්හි තත්වූපරිදි නුවණින් දැකීමෙන් යුක්තවූවහුට කලකිරීමෙන් නොඇල්ම හේතු සහිතවේ. කලකිරීමෙන් නොඇල්ම ඇතිකල්හි කලකිරීමෙන් නොඇල්මෙන් යුක්තවූවහුට කෙලෙසුන්ගෙන් මිදී නුවණින් දැකීම හේතු සහිත වේයයි කීයේය.

6. "ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් සමග සතුටුවූයේය. සතුටු වියයුතු, සිහිකටයුතු කථාවකොට නිමවා එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූම ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන්ට මෙය කීයේය.

7. "ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයෙනි, කොපමණකින් වනාහි භික්ෂුතෙම කුශල ධර්මයන්හි වහා සැලකීම ඇත්තේ වේද, මනාව ගන්නා ලද්දක්කොට ගැණීම ඇත්තේවේද, බොහෝකොටත් ගණීද, මොහු විසින් ගන්නා ලද්දක් මුළා නොකෙරේද?"

"ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ වනාහි බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තේවේ. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ටම මෙය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

වැටහේවායි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයෙනි, එසේ වීනම් අසව, මනාකොට මෙනෙහිකරව, කියන්නෙමියි" කීයේය. "එසේය ඇවැත්නියි," ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිර තෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට ප්‍රතිවචන දුන්නේය.

8. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම මෙය කීයේය. "ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම අර්ථ කීමෙහි දක්ෂයෙකුත් වේද පාලි ධර්මයෙහි දක්ෂයෙකුත් වේද, නිරුත්තර වචනයන්හි දක්ෂයෙකුත්වේද, අක්ෂරප්‍රභෙදයන්හි දක්ෂයෙකුත්වේද, පූර්වාපරයන්හි දක්ෂයෙකුත්වේද, ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයෙනි, මෙතෙකින් වනාහි භික්ෂු තෙම කුශල ධර්මයන්හි වහා සැලකීම් ඇත්තේදවේ. මනාව ගන්නාලද්දක්කොට ගැණීම ඇත්තේද වේ. බොහෝකොට ගණියි. මොහු විසින් ගන්නාලද්ද ද, මුළා නොකෙරේයයි" කීයේය.

9 "ඇවැත්නි, ආශ්චර්‍ය්‍යය ඇවැත්නි, අද්භූතය, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් විසින් මෙය ඉතාම යහපත් කොට කියනලද්දක්දවේ. අපි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් මේ කරුණු පසින් යුක්තවූවෙකු කොට සලකමු. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ අර්ථ කීමෙහි දක්ෂයෙක පාලි ධර්මයෙහි දක්ෂයෙක. නිරුක්ති වචනයන්හි දක්ෂයෙක. අක්ෂර ප්‍රභෙදයන්හි දක්ෂයෙක පූර්වාපර දෙක්හි දක්ෂයෙක" කියායි.

**20. භද්දජී-ආනන්ද සූත්‍රයඃ-** 1. එක් කලෙක්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම කොසඹෑ නුවර ඝෝෂිතාරාමයෙහි වැඩ වසයි. එකල්හි වනාහි ආයුෂ්මත් භද්දජී ස්ථවිරතෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් සමග සතුටුවූයේය. සතුටු විය යුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පසෙක හුන්නේය.

2. එකත්පසෙක උන්නාවූම ආයුෂ්මත් භද්දජී ස්ථවිරයන්ට ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම මෙය කීයේය. "ආයුෂ්මත් භද්දජී ස්ථවිරයෙනි, කුමක් නම් දර්ශනයන්ගෙන් අග්‍රද, කුමක්

ශ්‍රවණයන්ගෙන් අග්‍රද, කුමක් සැපයන්ගෙන් අග්‍රද, කුමක් සංඥාවන්ගෙන් අග්‍රද, කුමක් භවයන්ගෙන් අග්‍රද?”

3. “ඇවැත්නි, අනුන් මැඩපවත්නාවූ තමන් නොමැඩ පවත්වනලද්දාවූ ඒකාන්තයෙන් සියල්ල දක්නාවූ සියලු දෙනා වසඟයෙහි පවත්වන්නාවූ බ්‍රහ්මතෙම ඇත්තේය. යමෙක් ඒ බ්‍රහ්මයා දකීද, මෙය දර්ශනයන්ගෙන් අග්‍රය, ඇවැත්නි, සැපයෙන් විශෙෂයෙන් පිනාගියාවූ හාත්පසින් පිනාගියාවූ ආභාශ්වර නම් දෙවියෝ ඇත්තාහ. ඔව්හු කිසිකලෙක ‘අනේ සැපය, අනේ සැපයයි’ ප්‍රීතිවාක්‍ය පවත්වත්. යමෙක් ඒ ශබ්දය අසාද, මෙය ශ්‍රමණයන්ගෙන් අග්‍රය. ඇවැත්නි, ශුභකිණ්ණක නම් දෙවියෝ ඇත්තාහ. ඔව්හු සුවපත් භාවය ඇත්තාහුම සුවය විඳිත්. මේ සැපයන් ගෙන් අග්‍රය. ඇවැත්නි, ආකිඤ්චඤ්ඤායතන බඹ ලොවට පැමිණියාවූ දෙවියෝ ඇත්තාහ. මෙය සංඥාවන්ගෙන් අග්‍රය. ඇවැත්නි, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණියාවූ දෙවියෝ ඇත්තාහ. මෙය භවයන්ගෙන් අග්‍රයයි” කීයේය.

4. “ආයුෂ්මත් භද්දජී ස්ථවිරයන්ගේ යම් මේ කීමෙක් වේද, මෙය බොහෝ දෙනා හා සමවේයයි’ කීයේය.

“ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ වනාහි බහුශ්‍රැතවේ. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට මෙය වැටහේවාය” යි කීයේය,

“ආයුෂ්මත් භද්දජී ස්ථවිරයෙනි, එසේ වීනම් අසව, මනා කොට මෙනෙහිකරවයි කියන්නෙමියි” කීයේය. “ඇවැත්නි, එසේයයි” ආයුෂ්මත් භද්දජී ස්ථවිරතෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට ප්‍රතිවචන දුන්නේය. ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම මෙය කීයේය. “ඇවැත්නි, යම්සේ දක්නහුට වනාහි අනතුරුව ආශ්‍රවයන්ගේ නැසීමවේද, මෙය දර්ශනයන්ගෙන් අග්‍රය. යම්සේ අසන්නහුට අනතුරුව ආශ්‍රවයන්ගේ නැසීම වේද, මෙය ශ්‍රවණයන්ගෙන් අග්‍රය. යම්සේ සුවපත්වූවහුට අනතුරුව ආශ්‍රවයන්ගේ නැසීම වේද, මෙය සැපයන්ගෙන් අග්‍රය. යම්සේ සංඥා ඇත්තහුට ආශ්‍රවයන්ගේ නැසීමවේද, මෙය සංඥාවන්ගෙන් අග්‍රය. යම්සේ වූවහුට අනතුරුව ආශ්‍රවයන්ගේ නැසීම වේද, මෙය භවයන්ගෙන් අග්‍රය’යි කීයේය.

---

## 18. උපාසක වර්ගය.

**21. සාරජ්ජොක්කන්ත සූත්‍රය:-** 1. (මෙය පඤ්ච නිපාතයේ 1 පණ්ණාසකයේ 1 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ උපාසකතෙම දොම්නසට බැසගත්තේ වෙයි.

3. "කවර පසකින්දයත්? ප්‍රාණඝාත කරන්නේවේද, අදත්තාදානය කරන්නේවේද, කාමමිථ්‍යාචාරය ඇත්තේ වේද, මුසාවාද ඇත්තේවේද? මදයට හා ප්‍රමාදයට කරුණුවූ රහමෙර පානය ඇත්තේ වේද යන පසිනි. මහණෙනි, මේ කරුණු පසින්.

4. (මෙය 2 ඡේදය මෙනි.)

5. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ උපාසකතෙම භය නැත්තෙක්වේ.

6. "කවර පසකින්දයත්? ප්‍රාණඝාතයෙන් වැළකුණේ වේද, අදත්තාදානයෙන් වැළකුණේවේද, කාමමිථ්‍යාචාරයෙන් වැළකුණේවේද, මුසාවාදයෙන් වැළකුණේවේද, මදයට හා ප්‍රමාදයට කරුණුවූ රහමෙර පානයෙන් වැළකුණේවේද යන පසිනි.

7. (මෙය 5 ඡේදය මෙනි.)

**22. විසාරද සූත්‍රය:-** 1 "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ උපාසකතෙම භය ඇතිව ගිහිගෙයි වාසය කරයි.

2. (මෙය මේ වර්ගයේ 21 සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

3. (මෙය 1 ඡේදය මෙනි.)

4. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ උපාසකතෙම භය නැතිව ගිහිගෙයි වාසය කරයි.

5 (මෙය මේ වර්ගයේ 21 සූත්‍රයේ 6 ඡේදය මෙනි.)

6 (මෙය 4 ඡේදය මෙනි.)

**23 යථාභත සූත්‍රය:-** 1 "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ උපාසක තෙම ගෙනෙනලද්දාවූ බරක් බහා තබන ලද්දේ යම්සේද, මෙසේ නරකයෙහි උපදී.

2. (මේ ඡෙදය මේ වර්ගයේ 2 සූත්‍රයේ 3 ඡෙදය මෙනි.)

3 (මෙය 1 ඡෙදය මෙනි.)

4 "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ උපාසකතෙම ගෙනෙන ලද බරක් බහා තබන ලද්දේ යම්සේද, මෙසේ ස්වර්ගයෙහි උපදී.

5 මෙය මේ වර්ගයේ 21 සූත්‍රයේ 6 ඡෙදය මෙනි.)

6 (මෙය 4 ඡෙදය මෙනි.)

24 **වෙරභය සූත්‍රයඃ-** 1 "ඉක්බිති අනේපිඬු සිටුතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පස්ව හුන්නේය. එකත්පස්ව හුන්නාවූම අනේපිඬු සිටුහට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. "(ii) ගෘහපතිය, වෛරවූ භෙවත් අකුශල් වූ භය පසක් දුරු නොකොට සිටියේ දුශ්ශීලයායයිද කියනු ලැබේ. නරකයෙහිද උපදී.

2 (මෙය මේ වර්ගයේ 21 සූත්‍රයේ 3 ඡේදය මෙනි)

3 (මෙය 1 (ii) ඡෙදය මෙනි)

4 ගෘහපතිය, වෛරවූ භය පසක් දුරුකොට සිටියේ ශිලවන්තයායයිද කියනු ලැබේ. සුගතියෙහිද උපදී.

5 (මෙය මේ වර්ගයේ 21 සූත්‍රයේ 6 ඡෙදය මෙනි)

6 (මෙය 4 ඡෙදය මෙනි)

7 "ගෘහපතිය, ප්‍රාණඝාත කරන්නේ ප්‍රාණඝාත හේතුවෙන් (ii) මේ ආත්මයෙහිවූද, යම් වෛර භයක් රැස්කෙරේද පරලෙව්හි වන්නාවූද යම් වෛර භයක් රැස් කෙරේද, සිතෙහි හටගන්නාවූද දුක්වූ දොම්නසක් විඳීද (iii) සතුන් මැරීමෙන් වැළකුනේ (iv) මේ ආත්මයෙහිවූ වෛර භය නොම රැස් කරයි. පරලෙව්හිවූ වෛර භය රැස් නොකරයි. සිතෙහි හටගන්නාවූ දුක්වූ දොම්නස නොවිඳියි. (v) ප්‍රාණඝාතයෙන් වැළකුනහුගේ මෙසේ ඒ වෛර භය සංසිඳුනේ වේ.

8 "ගෘහපතිය, සොරකම් කරන්නේ සොරකම් කිරීමේ හේතුවෙන් (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) සොරකම් කිරීමෙන් වැළකුනේ (මෙහි 7 (iv) යෙදිය යුතුයි.) සොරකම් කිරීමෙන් වැළකුනහුගේ මෙසේ ඒ වෛර භය සංසිඳුනේ වේ.

9 'කාමයන්හි වරදවා හැසිරෙන්නේ කාමයන්හි වරදවා හැසිරීමේ හේතුවෙන් (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනේ (මෙහි 7 (iv) යෙදිය යුතුයි.) කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනහුගේ මෙසේ ඒ වෛර භය සංසිඳුනේ වේ.

10 "බොරු කියන්නේ බොරුකීමේ හේතුවෙන් (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) බොරු කීමෙන් වැළකුනේ (මෙහි 7 (iv) යෙදිය යුතුයි.) බොරු කීමෙන් වැළකුනහුගේ මෙසේ ඒ වෛර භය සංසිඳුනේ වේ.

11 'මදයට හා ප්‍රමාදයට කරුණුවූ රහමෙර පානය හේතු කොට ගෙණ (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) මදයට හා ප්‍රමාදයට කරුණුවූ රහමෙර පානය කිරීමෙන් (මෙහි 7 (iv) යෙදිය යුතුයි.) මදයට හා ප්‍රමාදයට කරුණුවූ රහමෙර පානයෙන් වැළකුනහුගේ මෙසේ ඒ වෛර භය සංසිඳුනේ වේයයි" වදාළේය.

1 "ලෝකයෙහි යමෙක්තෙම ප්‍රාණඝාත කෙරේද, මුසාවාදය කියාද, නුදුන් දෙය ගණීද, අන් අඹුවන් කරා යේද

2 "යම් මනුෂ්‍යයෙක් තෙම රහමෙර පානයෙහි යෙදේද, මේ අකුශල් පස දුරුනොකොට සිටියේ දුශ්ශීලයායයි කියනු ලැබේ. ඒ දුෂ්ප්‍රාඥ තෙම ශරීරයාගේ බිඳීමෙන් පසු නරකයෙහිද උපදී.

3 'ලෝකයෙහි යමෙක් තෙම ප්‍රාණඝාත නොකෙරේද, මුසාවාද නොකියාද, නුදුන් දෙය නොගණීද, අන් අඹුවන් කරා නොයේද,

4 "යම් මනුෂ්‍යයෙක් තෙම රහමෙර පානයෙහි නොයෙදේද, යන මේ අකුශල්වූ වෛර පස දුරුකොට

සිටියේ සිල්වත්යයිද කියනු ලැබේ. ඒ නුවණ ඇති තැනැත්තේ ශරීරයාගේ බිඳීමෙන් පසු සුගතියෙහි උපදීයයි" වදාළේය.

**25 උපාසක චණ්ඩාල සූත්‍රයඃ-** 1 "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ උපාසක තෙම උපාසක චණ්ඩාලයෙක්ද උපාසක කිළුටක්ද, උපාසක පශ්චිමකයෙක්ද වේ.

2 "කවර පසකින්ද යත්, ශ්‍රද්ධා නැත්තේ වේද, දුශ්ශීල වේද, කෝතුහල මංගල ඇත්තේවේද, (හෙවත් දුටු ඇසූ ස්පර්ශ කළ දෙය මඟුල්යයි ගන්නෙක් වේද) මංගලය පතාද, කර්මය නොපතාද, මේ ශාසනයෙන් පිටත් හිද දක්ෂිණාවට සුදුස්සෙකු සොයාද, එහිද පළමු දානමානාදී කටයුතු කෙරේද යන පසිනි.

3 (මෙය 1 ඡෙදය මෙනි)

4 "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ උපාසකතෙම උපාසක රත්නයද, උපාසක පද්මයද, උපාසක හෙළ පියුමද වේ.

5 "කවර පසකින්ද යත්, ශ්‍රද්ධාව ඇත්තේ වේද, සිල්වත් වේද, කෝතුහල මංගල නැත්තෙක් වේද, කර්මය බලාපොරොත්තු වේද, මංගලය බලාපොරොත්තු නොවේද, මේ ශාසනයෙන් පිටත්හි දක්ෂිණාවට සුදුස්සෙකු නොසොයාද මෙහි මේ ශාසනයෙහිම දාන මානාදී පළමු කටයුතු දෙය කෙරේද යන පසිනි.

6 (මෙය 4 ඡෙදය මෙනි)

**26 පවිවේකපීති සූත්‍රයඃ-** 1 "ඉක්බිති අනේපිඬු සිටු තෙම පන්සියයක් පමණ උපාසකවරුන් විසින් පිරිවරණ ලද්දේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පස්ව හුන්නේය. එකත්පස්ව උන්නාවූ අනේපිඬු සිටුහට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2 "ගෘහපතිය, තෙපිද වනාහි භික්ෂු සංඝයාට චීවරය පිණ්ඩපාතය ශයනාසනය ගිලන් පස බෙහෙත් පිරිකර යන

මෙයින් එළඹ උපස්ථාන කරන ලද්දාහුය. ගෘහපතිය, 'අපි භික්ෂුසංඝයාට එළඹ උපස්ථාන කරණ ලද්දෝ වෙමුයි' එපමණකින්ම සතුට ඇතිකළයුතු නොවෙත්. ගෘහපතිය එහෙයින් මෙහි චීවරය, පිණ්ඩපාතය සයනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකර යන මෙයින් මෙසේ හික්මිය යුතුයි. කවරනම් උපායකින් 'අපි කලින් කල උතුම් විවේකය ඇති ප්‍රීතියට පැමිණ වාසය කරන්නෙමුදැයි,' ගෘහපතිය, මෙසේ වනාහි තොප විසින් හික්මිය යුතුයයි.

3 මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, ආශ්චර්‍ය්‍යය, ස්වාමීනි අද්භූතය, ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ විසින් (මෙහි 2 ඡෙදය යෙදිය යුතුයි.) යන මෙය ඉතාම යහපත් කොට වදාරණ ලදී.

4 "ස්වාමීනි, යම් කලෙක්හි ආර්‍ය්‍යශ්‍රාවක තෙම උතුම් විවේක ඇති ප්‍රීතියට පැමිණ වාසය කෙරේද, කරුණු පසක් මොහුට එකල්හි නොවෙත්.

5 "මොහුට කාමයන් අරභයා උපදනාවූ යම් දුකක් දොම්නසක් වේද එයද මොහුට ඒ කාලයෙහි නොවේ. මොහුට කාමයන් අරභයා උපදනාවූ යම් සැපයක් සොම්නසක් වේද, එයද මොහුට ඒ කාලයෙහි නොවේ. අකුශල් අරභයා උපදනාවූ යම් දුකක් දොම්නසක් වේද, එයද මොහුට ඒ කාලයෙහි නොවේ. මොහුට අකුශල් අරභයා උපදනාවූ යම් සැපයක් සොම්නසක් වේද, එයද මොහුට ඒ කාලයෙහි නොවේ. ස්වාමීනි, මොහුට කුශල් අරභයා උපදනාවූ යම් දුකක් දොම්නසක් වේද, එයද මොහුට ඒ කාලයෙහි නොවේ. ස්වාමීනි, යම්කලෙක්හි ආර්‍ය්‍යශ්‍රාවකතෙම උතුම් විවේකය ඇති ප්‍රීතියට පැමිණ වාසය කෙරේද, එකල්හි මොහුට මේ කරුණු පස නොවෙත්යයි" කීයේය.

6 "සාරිපුත්‍රය, යහපත, යහපත. සාරිපුත්‍රය, යම් කලෙක්හි ආර්‍ය්‍යශ්‍රාවකතෙම උතුම් විවේකය ඇති ප්‍රීතියට පැමිණ වාසය කෙරේද, එකල්හි මොහුට කරුණු පසක් නොවෙත්. (මෙහි 5

ඡේදය යෙදිය යුතුයි.) සාරීපුත්‍රය, යම් කලෙක්හි ආර්‍යශ්‍රාවකතෙම උතුම් විවේකය ඇති ප්‍රීතියට පැමිණ වාසය කෙරේද, මෙහි මේ කරුණු පස එකල්හි නොවෙත්යයි” වදාළේය.

27 **අකරණීය වණිජ්ජා සූත්‍රයඃ-** 1 “මහණෙනි, උපාසකයා විසින් නොකටයුතු මේ වෙළඳාම් පසක් වෙත්.

2 “කවර පසක්ද යත්? ආයුධ වෙළඳාමය, සතුන් වෙළඳාමය, මස් පිණිස සතුන් වෙළඳාමය, මත් ද්‍රව්‍ය වෙළඳාමය, විෂ ද්‍රව්‍ය වෙළඳාමය යන පසයි.

3 (මෙය 1 ඡේදය මෙනි.)

28 **රාජදණ්ඩ සූත්‍රයඃ-** 1 “මහණෙනි, ඒ කුමකැයි හඟිව්ද? (ii) මේ පුරුෂතෙම ප්‍රාණඝාතය හැර ප්‍රාණඝාතයෙන් වැළකුනේ වේයයි ඔහු රජහු අල්වාගෙණ ප්‍රාණඝාතයෙන් වැළකීම හේතුකොට ගෙණ නසත්යයි හෝ බඳිත්යයි හෝ රටින් පිට කරත්යයි හෝ සුදුසු පරිදි හෝ කෙරෙත්යයි (iii) තොප විසින් දක්නා ලද්දේ හෝ අසන ලද්දේ හෝ වේද?” “ස්වාමීනි මේ නොවේමැයි”

2 “මහණෙනි, යහපත (මෙහි (ii) යෙදිය යුතුයි) මහණෙනි, මා විසිනුදු මෙය වනාහි නොම දක්නා ලදී. නොම අසන ලදී.

3 “එසේද වුවත් මේ පුරුෂතෙම ස්ත්‍රියක හෝ පුරුෂයෙකු හෝ ජීවිතයෙන් තොර කෙළේයයි ඒ මොහු රජහු අල්වාගෙණ ප්‍රාණඝාතය හේතුකොට ගෙණ,

4 “නසතියි හෝ බඳිතියි හෝ රටින් නෙරපතියි හෝ සුදුසු පරිද්දක් හෝ කරතියි,

5 “එසේම මොහුගේ පාප කර්මයම ප්‍රකාශ කරත්. තොප විසින් මෙබඳුවූවෙකු දක්නා ලද්දේ හෝ අසන ලද්දේ හෝ වේද?’ “ස්වාමීනි, අප විසින් දක්නා ලද්දේද වේ අසන ලද්දේද වේ. අසන්ට ලැබෙන්නේයයි” ද කීවාහුය.

6 “මහණෙනි, ඒ කුමකැයි හඟිව්ද? (ii) මේ පුරුෂ තෙම අදත්තාදානයෙන් වැළකුනේයයි ඒ මොහු රජහු අල්වා ගෙණ අදත්තාදානයෙන් වැළකීම හේතුකොටගෙණ නසතියි හෝ

බඳිතියි හෝ රටින් නෙරපතියි හෝ සුදුසු පරිද්දෙන් හෝ කරතියි (iii) තොප විසින් දක්නා ලද්දේ හෝ අසන ලද්දේ වේද?' (iv) "ස්වාමීනි, මේ නොවේමැයි"

7 "මහණෙනි, යහපත, (මෙහි 6 (ii) යෙදිය යුතුයි) මෙය වනාහි මා විසිනුදු නොම දක්නා ලදී. නොම අසන ලදී.

8. "එතකුදු වුවත් මේ පුරුෂතෙම ගමින් හෝ වනයෙන් හෝ නුදුන් දෙය සොර සිතින් ගණීද, ඔහු රජහු අල්වාගෙණ අදත්තාදාන හේතුවෙන් (මෙහි 4, 5 ඡෙද යෙදිය යුතුයි.)

9 "මහණෙනි, එය කුමකැයි හඟිව්ද? (ii) මේ පුරුෂ තෙම කාමයන්හි වරදවා හැසිරීම හැර කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනේවේයයි ඔහු රජහු අල්වාගෙණ කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකීම හේතුකොට ගෙණ නසතියි හෝ බඳිතියි හෝ රටින් නෙරපතියි හෝ අදහස් පරිදි හෝ කරතියි (iii) තොප විසින් දක්නා ලද්දේ හෝ අසන ලද්දේ හෝ වේද?" "ස්වාමීනි, මෙය නොවෙයි."

10 "මහණෙනි, යහපත. මහණෙනි, (මෙහි 9 (ii) යෙදිය යුතුයි) මා විසිනුදු මෙය නොම දක්නා ලදී. නොම අසන ලදී.

11 "එතකුදු වුවත් මේ පුරුෂතෙම පරස්ත්‍රීන් කෙරෙහි අන් කුමරියන් කෙරෙහි හැසුරුම් ඇති බවට පැමිණේද ඔහු රජහු අල්වාගෙණ කාමයන්හි වරදවා හැසිරීම හේතුකොට ගෙණ (මෙහි 4, 5 ඡෙද යෙදිය යුතුයි)

12 "මහණෙනි, එය කුමකැයි හඟිව්ද? (ii) මේ පුරුෂ තෙම මුසාවාදය හැර මුසාවාදයෙන් වැළකීම හේතුකොටගෙණ නසතියි හෝ බඳිතියි හෝ රටින් නෙරපතියි හෝ අදහස් පරිදි හෝ කරතියි, (iii) තොප විසින් දක්නා ලද්දේ හෝ අසන ලද්දේ හෝ වේද?"-'ස්වාමීනි, මෙය නොවේමය."

13 "මහණෙනි, යහපත. මහණෙනි, (මෙහි 12 (ii) යෙදිය යුතුයි.) මා විසිනුදු එය නොමදක්නා ලදී. නොම අසන ලදී.

14 "එතකුදු වුවත් මේ පුරුෂතෙම ගෘහපතියෙකුගේ හෝ ගෘහපති පුත්‍රයෙකුගේ හෝ බොරු කීමෙන් වස්තුව නසායයි

ඔහු රජවරු අල්වාගෙණ බොරුකීම හේතුකොට ගෙණ (මෙහි 4, 5 ඡේද යෙදිය යුතුයි.)

15 "මහණෙනි, එය කුමකැයි හඟිව්ද? (ii) මේ පුරුෂ තෙම මදයට හා ප්‍රමාදයට කරුණුවූ රහමෙර පානය හැර මදයට හා ප්‍රමාදයට කරුණුවූ රහමෙර පානයෙන් වැළකුනේ වේයයි ඔහු රජහු අල්වා ගෙණ මදයට හා ප්‍රමාදයට කරුණුවූ රහමෙර පානයෙන් වැළකීම හේතුකොට ගෙණ නසතියි හෝ බඳිතියි හෝ රටින් නෙරපති හෝ අදහස් පරිදි හෝ කරතියි, (iii) තොප විසින් දක්නා ලද්දේ හෝ අසන ලද්දේ වේද?"-"ස්වාමීනි, මෙය නොවේමැයි"

16 "මහණෙනි, යහපත. මහණෙනි, (මෙහි 15 (ii) යෙදිය යුතුයි) මා විසිනුදු මෙය නොම දක්නා ලදී. නොම අසන ලදී.

17 "එතකුදු වුවත් මේ පුරුෂතෙම මදයට හා ප්‍රමාදයට කරුණුවූ රහමෙර පානයෙහි යෙදුනේ ස්ත්‍රියෙකු හෝ පුරුෂයෙකු හෝ ජීවිතයෙන් තොර කෙළේය. මේ පුරුෂතෙම මදයට හා ප්‍රමාදයට කරුණුවූ රහමෙර පානයෙහි යෙදුනේ ගමින් හෝ වනයෙන් හෝ නුදුන් දෙය සොර සිතින් ගනී. මේ පුරුෂතෙම මදයට හා ප්‍රමාදයට කරුණුවූ රහමෙර පානයෙහි යෙදුනේ අන්‍ය ස්ත්‍රීන් කෙරෙහි අන්‍ය කුමාරිකාවන් කෙරෙහි හැසිරීම් බවට පැමිණෙයි. මේ පුරුෂතෙම මදයට හා ප්‍රමාදයට කරුණුවූ රහමෙර පානයෙහි යෙදුනේ ගෘහපතියෙකුගේ හෝ ගෘහපති පුත්‍රයෙකුගේ හෝ මුසාවාදයෙන් වස්තුව විනාශ කෙරේයයි, ඔහු රජහු අල්වාගෙණ මදයට හා ප්‍රමාදයට කරුණුවූ රහමෙර පානය හේතුකොට ගෙණ (මෙහි 4, 5 ඡේද යෙදිය යුතුයි.)

**29. ගිහි ව්‍යාකරණ සූත්‍රය:- 1.** "ඉක්බිති අනේපිඬු සිටු තෙම පන්සියයක් පමණ උපාසකවරුන් විසින් පිරිවරණ ලද්දේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පස්ව හුන්නේය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන්ට ආමන්ත්‍රණය කළසේක.

2. "ශාරීපුත්‍රය, ශික්ෂා පද පසෙක්හි සංවරවූ කර්මාන්ත ඇති උතුම් සිතෙහි හටගත්තාවූ මේ ආත්මයෙහි සැප විහරණ සතරක් කැමති පරිදි ලබන්නාවූ පහසුවෙන් ලබන්නාවූ බහුලව ලබන්නාවූ යම්කිසි සුදු වස්ත්‍ර හඳනා ගිහියෙකු දන්නහුද, හෙතෙම කැමතිවනු ලබන්නේ ක්ෂයවූ නිරය ඇත්තේ ක්ෂයවූ තිරිසන් යෝනිය ඇත්තේ ක්ෂයවූ ප්‍රේත අපාය ඇත්තේ ක්ෂයවූ සැප නැත්තාවූ දුකට පිළිසරණවූ නපුරුසේ පතිතවීම් ඇත්තේ වෙමියි. 'මම නපුරුසේ පතිතවන ස්වභාව නැත්තේ නියතවූ සම්බොධිය පිහිට කොට ඇත්තේ සෝවාන්වූයේ වෙමියි' තෙමේම තමන් ප්‍රකාශ කරන්නේය.

3. "කවර නම් ශික්ෂාපද පසෙක්හි සංවරවූ කර්මාන්ත ඇත්තේ වේද යත්? ශාරීපුත්‍රය, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම (මෙහි මේ වර්ගයේ 21 සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.) මේ ශික්ෂා පද පසෙහි සංවරවූ කර්මාන්ත ඇත්තේ වෙයි.

4. "කවර නම් සිවු වැදෑරුම්වූ උතුම් සිතෙහි හටගත්තාවූ මේ ආත්මයෙහිවූ සැප විහරණයන් කැමැති පරිදි ලැබීම ඇත්තේ බහුලව ලැබීම ඇත්තේ වේද, ශාරීපුත්‍රය, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම (මෙහි 11 සොතාපත්ති සංයුත්තයෙහි 7 සූත්‍රයේ 13 ඡේදයේ පළමුවෙනි කොටස යෙදිය යුතුයි පිට 3123) මේ පළමුවන උතුම් සිතෙහි හටගන්නාවූ (ii) මේ ආත්මයෙහිවූ සැප විහරණය තෙම අපිරිසිදු චිත්තයාගේ පිරිසිදු වීම පිණිස නිර්මල නුවූ චිත්තයාගේ නිර්මල වීම පිණිස, මොහු විසින් ලබන ලද්දේ වෙයි.

5. "ශාරීපුත්‍රය, නැවත අනිකක්ද කියමි. ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම (මෙහි 11 සොතාපත්ති සංයුත්තයෙහි 7 සූත්‍රයේ 13 ඡේදයේ දෙවෙනි කොටස යෙදිය යුතුයි. පිට 3123) මේ දෙවන උතුම් සිතෙහි හටගන්නාවූ (මෙහි 4 (iii) යෙදිය යුතුයි)

6. "ශාරීපුත්‍රය, නැවත අනිකක්ද කියමි. ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම (මෙහි 11 සොතාපත්ති සංයුත්තයෙහි 7 සූත්‍රයේ 13 ඡේදයේ 3 කොටස යෙදිය යුතුයි. පිට 3123) මේ මොහු විසින් තුන් වන උතුම් සිතෙහි හටගන්නාවූ (මෙහි 4 (ii) යෙදිය යුතුයි)

7. "ශාරීපුත්‍රය, නැවත අනිකක්ද කියමි. ආයර්‍ය ශ්‍රාවක තෙම නොකඩවූ නොසිදුරුවූ කබර සහිත නොවූ තිත් සහිත නොවූ දාසකමින් මිදුනාවූ නුවණැත්තන් විසින් පසස්නා ලද්දාවූ තෘෂ්ණා දෘෂ්ටීන් පරාමර්ෂණය නොකරණ ලද්දාවූ සමාධිය පිණිස පවත්නාවූ ආයර්‍යයන් කැමතිවූ ශීලයන්ගෙන් යුක්තවේද, මේ මොහු විසින් සතරවන උතුම් සිතෙහි හට ගන්නාවූ (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) මේ සිවු වැදෑරුම්වූ කුශල් සිත්හි හටගන්නාවූ ආත්මයෙහිවූ සැප විහරණයන් කැමති පරිදි ලැබීම ඇත්තේ සුවසේ ලැබීම ඇත්තේ බහුලව ඇත්තේ වේ.

8. (මෙය 2 ඡේදය මෙනි)

1. "නරකයන්හි භය දැක පව් දුරු කරන්නේය. පණ්ඩිතතෙම ආයර්‍ය ධර්මය හෙවත් පඤ්ච ශීලය සමාදන්ව පව් දුරු කරන්නේය.

2. "උත්සාහය ඇති කල්හි පණ ඇති සතුන් නොනසන්නේය. දැනගෙණ බොරුවද නොකියන්නේය. නුදුන් දෙය නොඅල්ලන්නේය.

3. "සිය අඹුවන් හා සතුටුවූයේ අන් අඹුවකටද නොඇලෙන්නේය. සත්වතෙම සිත මුළා කරන්නාවූ සිව් වැදෑරුම්වූ මේරයද පස් වැදෑරුම්වූ සුරාවද නොබොන්නේය.

4. "බුදුන් සිහි කරන්නේය. ධර්මයද අනුව කල්පනා කරන්නේය. නිදුක්වූ හිතවූ භාවනා සිත බඹ ලොව ඉපදීම පිණිස වඩන්නේය.

5. "දියයුතු වස්තුව එළඹ සිටි කල්හි පිනෙන් ප්‍රයෝජන ඇති පින් සොයන්නහු විසින් පළමුකොට බුද්ධාදී සත්පුරුෂයන් විෂයෙහි දෙනලද දක්ෂිණා තොමෝ මහත් ඵල ඇත්තී වේ. ශාරීපුත්‍රය, සත්පුරුෂයන් කියන්නෙමි. මාගේ කීම අසව.

**(6-7)** "මෙසේ කළුවූ හෝ සුදුවූ හෝ රතුවූ හෝ පළාවන්වූ හෝ ලප සහිතවූයේ වස්සන් හා සමාන රූප

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඇත්තාවූ හෝ පරෙවියන්ට බඳු පැහැ ඇත්තාවූ හෝ යම්කිසි මේ දෙනුන් අතරෙහි දැමුනාවූ බර ඉසිලීමට සුදුසුවූ ශක්ති ඇත්තාවූ යහපත් වේගයෙන් යන්නාවූ ශ්‍රෙෂ්ඨ ගවයෙක් උපදීද,

(8-9) "ඒ ගවයාම බර ඇති කල්හි යොදත්. මොහුගේ පැහැය නොබලත්. මෙපරිද්දෙන්ම මනුෂ්‍යයන් අතරෙහි යම්කිසි ජාතියෙක් හි ක්ෂත්‍රිය කුලයෙහිද බමුණු කුලයෙහිද වෛශ්‍ය කුලයෙහිද ශුද්‍ර කුලයෙහිද සැඩොල් කුලයෙහි හා පුප් සඩු කුලයෙහිද යන මේ කිසියම් ජාතියෙක්හි දැමුනාවූ මනා පැවතුම් ඇත්තෙක් උපදීද,

(10-11) "ධර්මයෙහි පිහිටියාවූ හෙතෙම ශීලයෙන් යුක්තවේද, සත්‍ය වචන ඇත්තේද, ලජ්ජා ඇත්තේද, දුරුකළාවූ ජාතිය හා මරණය ඇත්තේද, බ්‍රහ්මචර්‍ය්‍යාව සම්බන්ධ සියල්ලෙන් යුක්තවේද, බහා තබනලද ස්කන්ධාදී බර ඇත්තේද, සසරින් වෙන්වූයේද, සිව් මගින් කළ කටයුතු ඇත්තේද, ආශ්‍රව රහිතවේද, සියලු ධර්මයන්ගේ පරතෙරට පැමිණියේද, උපාදාන රහිතව කෙළෙසුන්ගෙන් නිවියේද,

(12-13) "කෙළෙස් රජස් නැත්තාවූ ඒ ක්ෂෙත්‍රයෙහිම දෙනලද දක්ෂිණාතොමෝ මහත් ඵල ඇත්තී වේ. ක්ෂෙත්‍රය නොදන්නාවූ නුවණ නැත්තාවූ අශ්‍රැතවත්වූ අඥානයෝද මේ ශාසනයෙන් පිටත්හි දානයන් දෙත්. සත්පුරුෂයන් කරා නො එළඹෙත්. ප්‍රාඥයන් විසින් සම්මත කරණලද ප්‍රඥා සහිතවූ සත්පුරුෂයන් කරා යම් කෙනෙක් එළඹෙත්ද,

14. "ඔවුන්ගේ ශ්‍රද්ධාවද සුගතවූ බුදුන් කෙරෙහි හටගත් මුල් ඇතිව පිහිටියාය. ඔව්හු දෙව්ලොවටද පැමිණෙත්. මේ ලෝකයෙහි උසස් කුලයෙක්හි හෝ උපදිත්. පණ්ඩිතවූ ඔව්හු පිළිවෙළින් නිර්වාණයට පැමිණෙත් යයි" වදාළේය.

**30. ගවෙසී උපාසක සූත්‍රය**:- 1 "එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසොල් දනව්වල මහත්වූ භික්ෂු සංඝයා සමග සැරිසරණ සේක. දීර්ඝවූ මාර්ගයට පිළිපන්නාවූ භාග්‍යවතුන්

වහන්සේ එක්තරා ප්‍රදෙශයෙක්හි මහත්වූ සල්වනයක් දුටුසේක. දැක මාර්ගයෙන් ඉවත්ව ඒ සල්වනය යම්තැනෙක්හිද එතැනට ඇතුල්ව එක්තරා පෙදෙසෙක්හි සිනා පහළ කළසේක. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට මෙබඳු සිතක් වීය.

(ii) ‘භාග්‍යවතුන් වහන්සේගේ සිනා පහළකිරීමට හේතුව කවරේද, ප්‍රත්‍යය කවරේද? තථාගතයෝ නිකරුනේ සිනා පහළ නොකෙරෙතියි,

(iii) “එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය.

2. “ස්වාමීනි, (මෙහි 1 (ii) යෙදිය යුතුයි.)

“ආනන්දය, පෙරවූවක් කියමි. මේ ප්‍රදෙශයෙහි සමෘද්ධවූද, ඉතා සමෘද්ධවූද බොහෝ ජනයා ඇති මිනිසුන්ගෙන් ගැවසී ගත් නුවරක් වීය. ආනන්දය, ඒ නුවර වනාහි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කාශ්‍යප භාග්‍යවත්තෙම ඇසුරුකොට වාසය කෙළේය. ආනන්දය, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ වනාහි පංචශීලයන්හි සම්පූර්ණකිරීම නැත්තාවූ ගවෙසී නම් උපාසකයෙක් වූයේය. ආනන්දය, ගවෙසී නම් උපාසකයා විසින් පන්සියයක් පමණ උපාසකවරු සරණයන්හි පිහිටුවන ලද්දාහු සමාදන් කරවන ලද්දාහු ශීලයන්හි සම්පූර්ණ කිරීම නැත්තෝ වූහ.

3. (i) “ආනන්දය, ඉක්බිති ගවේසි නම් උපාසකයාහට මෙබඳු සිතක් විය. ‘මම වනාහි මේ පන්සියයක් උපාසකවරුන්ට බොහෝ උපකාර ඇත්තෙක් පෙරටුව යන්නෙක් සමාදන් කරවන්නෙක් වෙමි.

(ii) මමද ශීලයන්හි සම්පූර්ණ කිරීම නැත්තේ වෙමි. මේ පන්සියයක් උපාසකවරුද ශීලයන්හි සම්පූර්ණකිරීම නැත්තාහුය.

(iii) මෙසේ මෙය සමසමවේ. කිසි විශෙෂයක් නැත එබැවින් මම විශෙෂය පිණිස පිළිපදිමි.’

4. (i) “ආනන්දය, ඉක්බිති ගවේසී නම් උපාසකතෙම ඒ පන්සීයයක් උපාසකයන් යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ, ඒ පන්සියයක් උපාසකයන්ට මෙය කීයේය.

(ii) 'ආයුෂ්මත්නි, අද පටන් මා ශීලයන්හි සම්පූර්ණකිරීම ඇත්තෙකු කොට දරව්"

5. (i) "ආනන්දය, එකල්හි ඒ පන්සියයක් උපාසකයන්ට මෙබඳු සිතක්විය. 'ගවේසී නම් ආයසීතෙමේ වනාහි අපට බොහෝ උපකාර ඇත්තේය. පෙරටුව ගමන්කරන්නේය. සමාදන් කරවන්නෙකි.

(ii) ගවේසී නම් ආයසීතෙමේ වනාහි ශීලයන්හි සම්පූර්ණ කිරීම ඇත්තෙක් වන්නේය අපි වනාහි කවර කාරණයකින් එසේ නොවන්නෙමුදැයි'

6. (i) "ආනන්දය, ඉක්බිති ඒ පන්සියයක් උපාසකවරු ගවේසී නම් උපාසකතෙම යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ ගවේසීනම් උපාසකයාට මෙය කීවාහුය.

(ii) 'ගවේසී නම් ආයසීතෙමේ අද පටන් මේ පන්සියයක් උපාසකවරු ශීලයන්හි සම්පූර්ණ කිරීම ඇත්තාහුයයි දරණ සේක්වායයි'

7. (මෙහි 3, 1 යෙදිය යුතුයි.) මමද ශීලයන්හි සම්පූර්ණ කිරීම ඇත්තේ වෙමි. මේ පන්සියයක් උපාසකවරුද ශීලයන්හි සම්පූර්ණ කිරීම ඇත්තාහු වෙත්. (මෙහි 3 (iii) යෙදිය යුතුයි)

8 (මෙහි 4 (i) යෙදිය යුතුයි.) 'ආයුෂ්මත්නි, අද පටන් මා ගම්වැසියන්ගේ ස්වභාවක්වූ මෛථුනයෙන් වැළකුණාවූ කාමයන්ගෙන් දුරවූ හැසුරුම් ඇති, බ්‍රහ්මචාරියෙකුකොට දරව්.'

9. (මෙහි 5 (i) යෙදිය යුතුයි.) ගවේසී නම් ආයසීතෙමේ වනාහි ගම්වැසියන්ගේ ස්වභාවවූ මෛථුන සේවනයෙන් වැළකුණාවූ, කාමයන්ගෙන් දුරවූ හැසුරුම් ඇති බ්‍රහ්මචයසීා ඇත්තෙක් වන්නේය. අපි වනාහි කවර කාරණයකින් එසේ නොවන්නෙමුදැයි'

10. (මෙහි 6 (i) යෙදිය යුතුයි.)

"ගවේසී නම් ආයසීතෙමේ අද පටන් මේ පන්සියයක් උපාසකයන්ද, ග්‍රාම්‍ය ධර්ම වූ මෛථුන සේවනයෙන් දුරුවූ කාමයන්ගෙන් දුරුවූ හැසුරුම් ඇති බ්‍රහ්මචයසීා ඇත්තවුන් කොට දරණසේක්වායි,

11. (මෙහි 3 (i) යෙදිය යුතුයි.) මමද ශීලයන්හි සම්පූර්ණකිරීම ඇත්තේ වෙමි. මේ පන්සියයක් උපාසකවරුද ශීලයන්හි සම්පූර්ණ කිරීම ඇත්තෝ වෙත්. මමද ග්‍රාම්‍ය ධර්මවූ මෛථුන සේවනයෙන් වැළකුනේ කාමයන්ගෙන් දුරවූ, හැසුරුම් ඇත්තේ බ්‍රහ්මචර්‍ය්‍යා ඇත්තෙක් වෙමි. මේ පන්සියයක් උපාසකවරුද, ග්‍රාම්‍ය ධර්මවූ මෛථුන සේවනයෙහි වැළකුනාහු කාමයන්ගෙන් දුරවූ හැසුරුම ඇති බ්‍රහ්මචර්‍ය්‍යා ඇත්තාහු වෙත්. මෙසේ මෙය සමසම වේ. කිසි විශෙෂයක් නැත. එබැවින් මම විශෙෂය පිණිස පිළිපදිමියි'

12. (මෙහි 4 (i) යෙදිය යුතුයි.) 'ආයුෂ්මත්නි, අද පටන් මා විකල් බොජුනෙන් වැළකුනාවූ රාත්‍රි භෝජනයෙන් තොර වූ එකවේලේ වළඳන බත් ඇත්තෙකු කොට දරව්"

13 (මෙහි 5 (i) යෙදිය යුතුයි.) ගවේසී නම් ආයර්‍ය්‍ය තෙමේ වනාහි විකල් බොජුනෙන් වැලකුනේ රාත්‍රි භෝජනයෙන් තොරවූයේ එක වේලේ බත් ඇත්තෙක් වන්නේය. අපි වනාහි කවර කාරණයකින් එසේ නොවන්නෙමුද?

14. (මෙහි 6 (i) යෙදිය යුතුයි.) ගවේසී නම් ආයර්‍ය්‍ය තෙමේ අද පටන් මේ පන්සියයක් උපාසකවරුද විකල් බොජුනෙන් වළකුනාවූ රාත්‍රි භෝජනයෙන් තොරවූ එක වේලේ බත් ඇත්තවුන් කොට දරණසේක්වායි'

15. (මෙහි 3 (i) යෙදිය යුතුයි.) මමද ශීලයන්හි සම්පූර්ණ කිරීම ඇත්තේ වෙමි. මේ පන්සියයක් උපාසකවරුද ශීලයන්හි සම්පූර්ණකිරීම ඇත්තාහුය. මමද ග්‍රාම්‍යධර්මවූ මෛථුන සේවනයෙන් වැළකුණාවූ, කාමයන්ගෙන් දුරවූ හැසුරුම් ඇති බ්‍රහ්මචර්‍ය්‍යා ඇත්තෙක් වෙමි. මේ පන්සියයක් උපාසකවරුද, ග්‍රාම්‍ය ධර්මවූ මෛථුන සේවනයෙන් වැළකුනාවූ හැසුරුම් ඇති බ්‍රහ්මචර්‍ය්‍යා ඇත්තාහුය. මමද විකල් බොජුනෙන් වැළකුනාවූ රාත්‍රි භෝජනයෙන් තොරවූ එක වේලේ බත් ඇත්තෙක් වෙමි. මේ පන්සියයක් උපාසකවරුද විකල් බොජුනෙන් වැළකුනාවූ රාත්‍රි භෝජනයෙන් තොරවූ එක වේලේ බත් ඇත්තාහුය. මෙසේ

මෙය සමසමවේ. කිසි විශෙෂයක් නැත. එබැවින් මම විශෙෂය පිණිස පිළිපදිමියි'

16. "ආනන්දය, ඉක්බිති ගවේසී උපාසකතෙම අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කාශ්‍යප භාග්‍යවතුන්වහන්සේට මෙය කීයේය. ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි ප්‍රව්‍රජ්‍යාව ලබන්නෙමියි උපසම්පදාවද ලබන්නෙමියි' කීයේය.

17. "ආනන්දය, ගවේසී නම් උපාසකතෙම අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි ප්‍රව්‍රජ්‍යාව ලැබුයේය. උපසම්පදාවද ලැබුයේය. ආනන්දය, උපසපන්වූ නොබෝකල් ඇති ගවේසී භික්ෂු තෙමේ වනාහි එකලා වූයේ වෙන්ව වාසය කිරීම ඇත්තේ (ii) අප්‍රමාද වූයේ කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ හරණලද ආත්මාලය ඇතිව වාසය කරන්නේ නොබෝකලකින්ම යමක් සඳහා කුලපුත්‍රයෝ මනාකොටම ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙද්ද, එය උතුම් කොට ඇති බ්‍රහ්මචර්‍ය්‍යාව කෙළවර කොට ඇති මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට පැමිණ වාසය කෙළේය. ජාතිය ක්ෂයකරණ ලදී. මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලදී. සතර මගින් කටයුත්ත කරණ ලදී. මේ භවය පිණිස අනිකක් නැතැයි දැනගත්තේය. ආනන්දය, ගවේසී භික්ෂුතෙම රහතුන්ගෙන් එක්තරා කෙනෙක්ද වූයේය.

18. (මෙහි 5 (i) යෙදිය යුතුයි.) ගවේසී නම් ආර්‍ය්‍ය තෙමේ වනාහි හිසකේ රැවුල් බාවා කසට වස්ත්‍ර හැඳ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වන්නේය. කවර කාරණයකින් වනාහි අපි පැවිදි නොවන්නෙමුද,

19. "ආනන්දය, එකල්හි ඒ පන් සියයක් උපාසකවරු අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට එළඹියාහුය. එළඹ අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේට මෙය කීවාහුය.

ස්වාමීනි, අපි භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි ප්‍රව්‍රජ්‍යාව ලබන්නෙමු. උපසම්පදාවද ලබන්නෙමුයි'

**20.** "ආනන්දය, ඒ පන්සියයක් උපාසකවරු අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි ප්‍රව්‍රජ්‍යාව ලැබුවාහුය, උපසම්පදාවද ලැබුවාහුය.

**21.** "ආනන්දය, ඉක්බිති ගවේසී නම් භික්ෂූහට මෙබඳු සිතක් විය. 'මම වනාහි මේ උතුම්වූ විමුක්ති සැපය කැමති පරිදි ලැබීම ඇත්තේ සුවසේ ලැබීම ඇත්තේ බහුලව ලැබීම ඇත්තේ වෙමි. මේ පන් සියයක් භික්ෂූහුද මේ උතුම්වූ විමුක්ති සැපය කැමති පරිදි ලබන්නෝ සුවසේ ලබන්නෝ බහුලව ලබන්නෝ වන්නාහු නම් ඉතා යෙහෙක' කියායි. ආනන්දය, ඉක්බිති ඒ පන්සියයක් භික්ෂූහු වෙන්ව වාසය' ඇත්තාහු (මෙහි 17 (ii) යෙදිය යුතුයි.)

**22.** "ආනන්දය, මෙසේ වනාහි ඒ ගවේසී භික්ෂු ප්‍රධාන කොට ඇති පන්සියයක් භික්ෂූහු මතු මත්තෙහි උතුම් වශයෙන් උත්සාහ කරන්නාහු උතුම්වූ විමුක්ති සැපය ප්‍රත්‍යක්ෂ කළාහුය ආනන්දය, එහෙයින් මේ ශාසනයෙහි මතු මත්තෙහි උතුම් වශයෙන් උත්සාහ කරන්නාහු උතුම්වූ විමුක්ති සැපය ප්‍රත්‍යක්ෂ කරන්නෙමියි මෙසේ හික්මිය යුතුයි. ආනන්දය, මෙසේ වනාහි තොප විසින් හික්මිය යුතුයයි" වදාළේය.

---

## 19. ආරඤ්ඤක වර්ගය.

**31.** පඤ්ච ආරඤ්ඤක සූත්‍රය:- 1. "මහණෙනි, මේ අරණ්‍යයෙහි වාසය කරන්නාහු පස් දෙනෙක් වෙත්.

**2.** "කවර පස් දෙනෙක්ද යත්? නුවණ මද බැවින්, ඉතා මුළා බැවින් අරණ්‍යයෙහි වාසය කරන්නෙක් වේ. ලාමක ආසා ඇත්තේ ආසාවෙන් මඩනා ලද්දේ අරණ්‍යයෙහි වාසය කරන්නෙක් වේ. උමතු බැවින් චිත්ත වික්ෂෙපයෙන් අරණ්‍යයෙහි වාසය කරන්නෙක් වේ. බුදුවරයන් විසින් බුද්ධ ශ්‍රාවකයන් විසින් වර්ණනා කරණ ලදැයි අරණ්‍යයෙහි වාසය කරන්නෙක් වේ.

මද ආසා ඇති බවම නිසා සතුට ඇති බවම නිසා සැහැල්ලු බවම නිසා උතුම් විවේකයම නිසා මෙයම අර්ථ කොට ඇති බවම නිසා ආරණ්‍යයෙහි වසන්නෙක් වේ. යන පස් දෙනයි.

3. (මෙය 1 ඡේදය මෙනි)

4 "මහණෙනි, අරණ්‍යයෙහි වාසය කරන්නාවූ මේ පස් දෙනාගෙන් වනාහි යම් මේ ආරණ්‍යයෙහි වාසය කරන්නෙක් තෙම අල්පෙච්ඡ බවම නිසා සන්තුෂ්ටියම නිසා සැහැල්ලු බවම නිසා උතුම් විවේකයම නිසා මෙයම අර්ථකොට ඇති බවම නිසා ආරණ්‍යයෙහි වසන්නෙක් වේද, මෙතෙම මේ ආරණ්‍යයෙහි වසන්නාවූ පස්දෙනා අතුරෙන් අග්‍රවූවෙක්ද ශ්‍රේෂ්ඨ වූවෙක්ද ප්‍රධානවූවෙක්ද උතුම්වූවෙක්ද අධිපති වූවෙක්ද වේ.

5. "මහණෙනි, යම්සේ දෙනගෙන් කිරිද කිරෙන් දීද, දීවලින් වෙඬරුද වෙඬරුවෙන් ගිතෙල්ද, ගිතෙලින් ගිතෙල් මණ්ඩයතෙම එහි අග්‍රයයි කියනු ලැබේද, මහණෙනි, මෙපරිද්දෙන්ම (මෙහි 4 ඡේදය යෙදිය යුතුයි)

(32-39 සූත්‍රවල 3 ඡේදය ඒ ඒ සූත්‍රවල 1 ඡේදය මෙනි.)

32. **පඤ්චපංසුකූලික සූත්‍රයः-** 1. "මහණෙනි, මේ පංසුකූල දරන්නාහු පස්දෙනෙක් වෙත්. (මෙහි 2, 4, 5 ඡේද මේ වර්ගයේ 31 සූත්‍රයේ 2, 4, 5 මෙන් වෙත්. එහි අරණ්‍යයෙහි වාසයකරන්නාහු' වෙනුවට 'පංසුකූල දරන්නහු' යෙදිය යතුයි.

33 **පඤ්චරුක්ඛමූලික සූත්‍රයः-** 1. "මහණෙනි, මේ රුක්මුල්හි වසන්නාහු පස්දෙනෙක් වෙත් (මෙහිද 32 සූත්‍රයේ මෙන් 'අරණ්‍යයෙහි' වෙනුවට 'රුක්මුල්හි' යෙදිය යුතුයි.)

34. **පඤ්ච සොසානික සූත්‍රයः-** 1. "මහණෙනි, මේ සොහොනෙහි වසන්නාහු පස් දෙනෙක් වෙත්. (මෙහිද 32 සූත්‍රයේ මෙන් 'අරණ්‍යය' වෙනුවට 'සොහොනෙහි' යෙදිය යුතුයි.

35. **පඤ්චබ්භොකාසික සූත්‍රයः-** 1. "මහණෙනි, මේ අභ්‍යවකාශයෙහි වසන්නාහු පස් දෙනෙක් වෙත්. (මෙහිද 32 සූත්‍රයේ මෙන් 'අරණ්‍යයෙහි' වෙනුවට 'අභ්‍යවකාශයෙහි' යෙදිය යුතුයි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**36. පඤ්චනෙසජ්ජික සූත්‍රය**:- 1. "මහණෙනි, මේ නෙසජ්ජික වූවාහු පස්දෙනෙක් වෙත්. (මෙහි 32 සූත්‍රයේ මෙන් 'අරණ්‍යයෙහි වාසය කරන්නාවූ' වෙනුවට නෙසජ්ජික වූවාහු' යෙදිය යුතුයි.

**37. පඤ්ච යථාසන්ථනික සූත්‍රය**:- 1. "මහණෙනි, මේ යථාසන්තනික වූවාහු පස්දෙනෙක් වෙත්. (මෙහි 32 සූත්‍රයේ මෙන් 'අරණ්‍යයෙහි වාසය කරන්නාවූ' වෙනුවට 'සන්තනික වූවාහු' යෙදිය යුතුයි.)

**38. පඤ්ච එකාසනික සූත්‍රය**:- 1. "මහණෙනි, මේ ඒකාශනික වූවාහු පස්දෙනෙක් වෙත්. (මෙහි 32 සූත්‍රයේ මෙන් 'අරණ්‍යයෙහි වාසය කරන්නාවූ' වෙනුවට 'ඒකාශනික වූවාහු' යෙදිය යුතුයි.)

**39. පඤ්චඛලුපච්ඡාභත්තික සූත්‍රය**:- 1. "මහණෙනි, මේ ඛලුපච්ඡාභත්තික වූවාහු පස්දෙනෙක් වෙත්. (මෙහි 32 සූත්‍රයේ මෙන් 'අරණ්‍යයෙහි වාසය කරන්නාවූ' වෙනුවට 'ඛලුපච්ඡාභත්තික වූවාහු' යෙදිය යුතුයි.)

**40. පඤ්චපත්තපිණ්ඩික සූත්‍රය**:- 1. "මහණෙනි, මේ පත්තපිණ්ඩිකවූවාහු පස්දෙනෙක් වෙත්.

2 (මෙහි 32 සූත්‍රයේ මෙන් 'අරණ්‍යයෙහි වාසය කරන්නාවූ' වෙනුවට 'පත්තපිණ්ඩිකවූවාහු' යෙදිය යුතුයි.)

---

## 20. බ්‍රාහ්මණ වර්ගය.

**41. සුනඛ ධම්ම සූත්‍රය**:- 1. "මහණෙනි, මේ පුරාණවූ බ්‍රාහ්මණ ධර්ම පසක් මේ කාලයෙහි ශුනඛයන් කෙරෙහි දක්නා ලැබෙත්. බ්‍රාහ්මණයන් කෙරෙහි නොදක්නා ලැබෙත්.

2 "කවර පසක්ද යත්? මහණෙනි, පෙර වනාහි බ්‍රාහ්මණයෝ බැමිණිය වෙතම පැමිණෙත්. නොබැමිණිය වෙත නොපැමිණෙත්. මහණෙනි, මේ කාලයෙහි බ්‍රාහ්මණයෝ බැමිණිය වෙතද පැමිණෙත්. නොබැමිණිය වෙතද පැමිණෙත්. මහණෙනි, මේ කාලයෙහි බල්ලෝ බැල්ලිය වෙතම පැමිණෙත්.

බැල්ලියන් නොවූවන් වෙත නොපැමිණෙත්. මහණෙනි, මේ පළමුවන පුරාණ වූ බ්‍රාහ්මණ ධර්මයතෙම,

(ii) මේ කාලයෙහි ශුනඛයන් කෙරෙහි දක්නාලැබේ. බ්‍රාහ්මණයන් කෙරෙහි නොදක්නා ලැබේ.

3. "මහණෙනි, පෙර වනාහි බ්‍රාහ්මණයෝ ඔසප්වූම බැමිණිය වෙතම පැමිණෙත්. ඔසප් නොවූ බැමිණිය වෙත නොපැමිණෙත්. මහණෙනි, මේ කාලයෙහි ඔසප්වූද බැමිණිය වෙත පැමිණෙත්. ඔසප් නොවූද බැමිණිය වෙත පැමිණෙත්. මහණෙනි, මේ කාලයෙහි බල්ලෝ ඔසප්වූම බැල්ලිය වෙත පැමිණෙත්. ඔසප් නොවූ බැල්ලිය වෙත නොපැමිණෙත්. මහණෙනි, මේ දෙවන පුරාණවූ බ්‍රාහ්මණ ධර්මයතෙම (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

4. "මහණෙනි, පෙර වනාහි බ්‍රාහ්මණයෝ බැමිණිය මිලදී නොම ගනිත්. නොවිකුණත් ස්වකීය පුරුෂයා සමගම සංවාසය සංසර්ගය පිණිස පවත්වත්. මහණෙනි, මේ කාලයෙහි බ්‍රාහ්මණයෝ බැමිණිය මිලදී ගැණීමද කෙරෙත්. විකිණීමද කෙරෙත්. ස්වකීය ප්‍රියයා සමගද සංවාසය සංසර්ගය පිණිස පරම්පරාව ගැළපීම පිණිස පවත්වත්. මහණෙනි, මේ කාලයෙහි බල්ලෝ බැල්ලිය මිළදී නොමගනිත්. නොවිකුණත්. ස්වකීය ප්‍රිය වූවෙකු සමගම සංවාසය සංසර්ගය පිණිස පවත්වත්. මහණෙනි, මේ තුන්වනවූ බ්‍රාහ්මණ ධර්මයතෙම (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

5. "මහණෙනි, පෙර වනාහි බ්‍රාහ්මණයෝ ධනයද ධාන්‍යයද, රිදීද, රත්‍රංද, රැස්කොට තැබීම නොකෙරෙත්. මහණෙනි, මේ කාලයෙහි බ්‍රාහ්මණයෝ ධනයද, ධාන්‍යයද, රිදීද, රත්‍රංද රැස්කොට තැබීම කරත්. මහණෙනි, මේ කාලයෙහි බල්ලෝ ධනයද, ධාන්‍යයද, රිදීද, රත්‍රංද රැස්කොට තැබීම නොකරත්. මහණෙනි, මේ සතරවන පුරාණවූ බ්‍රාහ්මණ ධර්මයතෙම (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

6. "මහණෙනි, පෙර වනාහි බ්‍රාහ්මණයෝ සවස්හි සවස බත පිණිසද, උදෑසන උදය බත පිණිසද, ආහාරය සොයත්. මහණෙනි, මේ කාලයෙහි බ්‍රාහ්මණයෝ කැමති පමණ බඩ

ගන්නාතුරු අනුභවකොට ඉතිරි දෙය හැරගෙණ යත් මහණෙනි, මේ කාලයෙහි බල්ලෝ සවස්හි සවස බත පිණිසද, උදෑසන උදය බත පිණිසද ආහාර සොයත් මහණෙනි, මේ පස්වන පුරාණවූ බ්‍රාහ්මණ ධර්මයතෙම (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

7. (මේ ඡෙදය 1 ඡෙදය මෙනි.)

**42. වුද්ධාපචායන සූත්‍රයඃ-** 1. "ඉක්බිති ද්‍රොණ නම් බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූයේය. සතුටුවියයුතුවූ සිහිකටයුතුවූ කථාවකොට නිමවා එකත්පස්ව හුන්නාවූම ද්‍රොණ නම් බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකෙළේය. "භවත් ගෞතමයන් වහන්ස, ශ්‍රමණ භවත් ගෞතමතෙම (ii) ජරාවෙන් ජීර්ණවූ වයසින් වැඩිසිටි ජාතියෙන් මහළුවූ කල්ගියාවූ පශ්චිම වයසට පැමිණියාවූ බ්‍රාහ්මණයන්ට නොවඳීයයිද, දැක හුනස්නෙන් නොනැගිටියයිද, ආසනයෙන් හෝ නොපවරායයිද,

(iii) යන මෙය මා විසින් අසනලදී. භවත් ගෞතමයන් වහන්ස, ඒ මේ කාරණය එසේමය. භවත් ගෞතම තෙමේ (මෙහි මේ ඡෙදයේ (ii) යෙදිය යුතුයි) භවත් ගෞතමයන් වහන්ස, ඒ මේ කාරණය නුසුදුසුමයයි" කීයේය.

3. "ද්‍රොණය, නුඹත් බ්‍රාහ්මණයෙකැයි ප්‍රතිඥා කරන්නෙහිදැ" යි ඇසීය.

"භවත් ගෞතමයන් වහන්ස, ඒ යමෙකුට වනාහි මනාකොට කියනුලබන්නෙක් කියන්නේද, බ්‍රාහ්මණතෙමේ,

(ii) මව්පසින්ද පියපසින්ද යන දෙපසින් මනාව උපන්නේ පිරිසිදු පිළිසිඳ ගැණීම් ඇත්තේය. සත්වන පියමහ යුගය දක්වා බැහැර නොදමන ලද්දේය. ජාතිවාදයෙන් නින්දා නොකරණ ලද්දේය වේදය හදාරන්නේය. මන්ත්‍ර දරන්නේය නිඝණ්ඩු කෙටුභ සහිතවූ අක්ෂර ප්‍රභෙද සහිතවූ ඉතිහාසය පස්වෙනිකොට ඇත්තාවූ ත්‍රිවේදයන්ගේ පරතෙරට ගියේය. පද දන්නේය. ව්‍යාකරණ දන්නේය. ලොකායත මහා පුරුෂ ලක්ෂණයන්හි

දක්ෂවූවෙකැයි, භවත් ගෞතමයන් වහන්ස, මනාකොට කියනු ලබන්නෙක් එය මටම කියන්නේය.

4. "භවත් ගෞතමයන් වහන්ස, මම වනාහි (මෙහි 3 (ii) යෙදිය යුතුයි)

5. "ද්‍රොණය, පූර්ව කාලයෙහිවූ බ්‍රාහ්මණයන්ගෙන් මන්ත්‍ර කරන්නාවූ මන්ත්‍ර පවත්වන්නාවූ යම් ඍෂිහු වෙද්ද, යම් කෙනෙකුන්ගේද, මේ කාලයෙහි බ්‍රාහ්මණයෝ පුරාණවූ ගායනා කරණලද, කියනලද, රැස්කරණලද, මේ වේද මන්ත්‍රයට අනුව ගායනා කෙරෙද්ද, එයට අනුව කියද්ද, කියනලද්ද අනුව කියද්ද, හදාරණ ලද්ද අනුව හදාරද්ද, කියවන ලද්ද, අනුව කියවද්ද, එනම් අට්ටකය, වාමකය, වාමදේවය, වෙස්සාමිත්තය, යමතග්ගිය. අංගීරසය, භරද්වාජය, වාසෙට්ඨය, කාශ්‍යපය, භගුය යන මොව්හු බ්‍රාහ්මණයන් පස්දෙනෙක් පනවත්. බ්‍රහ්මසමය, දේවසමය, මර්‍යාදය, සම්භින්න මර්‍යාදය, බ්‍රාහ්මණ චණ්ඩාල යන මොහුම පස්වෙනිකොට ඇත්තේය. ද්‍රොණය, ඔවුන්ගෙන් නුඹ බ්‍රාහ්මණවෙහිදැ"යි? ඇසීය.

6. "භවත් ගෞතමයන් වහන්ස, අපි මේ බ්‍රාහ්මණයන් පස්දෙනා නොදනිමු. වැළිදු අපි බ්‍රාහ්මණයෝ යයිම දනිමු. භවත් ගෞතමතෙමේ යම්සේ මම මේ බ්‍රාහ්මණයන් පස්දෙනා දැනගන්නෙම්ද, එසේ මට ධර්මය දෙශනාකරණ සේක්වා මැනවයි කියේය.

7. "බ්‍රාහ්මණය, එසේවීනම් අසව, මනාකොට මෙනෙහි කරව, කියන්නෙමියි" කීයේය. "එසේය, පින්වතුන්වහන්සැයි" කියා ද්‍රෝණ නම් බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

8. "ද්‍රෝණය, කෙසේ නම් බමුණුතෙම බ්‍රහ්මසමවේද? ද්‍රෝණය, මෙහි බමුණුතෙම (ii) මව් පසින්ද පිය පසින්ද යන දෙපසින් මනාව උපන්නේවේද, පිරිසිදු පිළිසිඳ ගැණීම් ඇත්තේවේද, සත්වන පිය මහ යුගය දක්වා බැහැර නොදමන ලද්දේවේද, ජාතිවාදයෙන් නින්දා නොකරණලද්දේ වේද, හෙතෙම අටසාළිස් වසක් මන්ත්‍ර හදාරමින් ළමා බ්‍රහ්මචර්‍යාවෙහි

හැසිරේද, අටසාළිස් වසක් ළමා බ්‍රහ්මචර්‍යාවෙහි හැසිර මන්ත්‍ර හදාරා ගුරුවරයාට ගුරුවැටුප් දැහැමින්ම සොයයි. නොදැහැමින් නොවේ.

9. "ද්‍රෝණය, එහි ධර්මය කවරේද? සීසෑමෙන් නොව වෙළඳාමෙන් නොව, ගෙරි රැකීමෙන් නොව, දුනුශිල්පයෙන් නොව, රාජපුරුෂයෙකු වීමෙන් නොව, එක්තරා ශිල්පයකින් නොව, හුදු භික්ෂාචර්‍යාවෙන් කබල ඉක්මවා නොහගින්නේ වේ.

(ii) හෙතෙම ගුරුවරයාට ගුරු වැටුප් පාවාදී හිසකේ රැවුල් බාවා, කසට වත් හැඳ, ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවේද, මෙසේ පැවිදිවූම හෙතෙම (මෙහි දීඝනිකායේ 17 සූත්‍රයේ 2 බණවරෙහි 4 ඡේදයේ 'මෛත්‍රී සහගත සිතින්' යන තැන සිට යොදාගත යුතුයි.)

හෙතෙම මේ සතර බ්‍රහ්ම විහරණයන් වඩා ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගති නම්වූ බඹලොව උපදී. ද්‍රෝණය මෙසේ වනාහි බ්‍රාහ්මණතෙම බ්‍රහ්මසම නම් වේ.

10. "ද්‍රෝණය, කෙසේ නම් බ්‍රාහ්මණතෙම දේවසම නම් වේද? ද්‍රෝණය, මේ ලෝකයෙහි බ්‍රාහ්මණතෙම (මෙහි 8 (ii) යෙදිය යුතුයි.)

11. (මෙහි 9 (i) යෙදිය යුතුයි.) හෙතෙම ගුරුවරයාට ගුරු වැටුප්දී, අඹුවක් සොයයි ධර්මයෙන්ම වේ. අධර්මයෙන් නොවේ.

(ii) ද්‍රෝණය, එහි ධර්මය නම් කවරේද? මිළදී ගැණීමෙන් නොවේ, විකුණා ගැනීමෙන් නොවේ, අතපැන් වත්කර දෙන ලද බැමිණියක්මය. හෙතෙම බැමිණියක් වෙතමයයි. ක්ෂත්‍රියාවක් වෙත නොයයි. වෛශ්‍ය වංස ඇත්තියක් වෙත නොයයි. ශුද්‍රියක් වෙත නොයයි. සැඩොලියක් වෙත නොයයි. වැදි ස්ත්‍රියක් වෙත නොයයි. කුළුපොතු ස්ත්‍රියක් වෙත නොයයි. රියකරු ස්ත්‍රියක් වෙත නොයයි, කසලසොධක ස්ත්‍රියක් වෙත නොයයි, ගැබිණියක් වෙත නොයයි. කිරි පොවන ස්ත්‍රියක් වෙත නොයයි. ඔසප් නොවූ ස්ත්‍රියක්වෙත නොයයි.

12. "ද්‍රෝණය, කුමක් හෙයින් බ්‍රාහ්මණ තෙම ගැබිණියක් වෙත නොයාද, ද්‍රෝණය ඉදින් බ්‍රාහ්මණතෙම ගැබිණියක් වෙත යේ නම් ඒ මානවකයා හෝ මානවිකාව ඉතා අපවිත්‍රයෙහි උපන්නෙක් නම් වේ.

(iii) ද්‍රෝණය, එහෙයින් බ්‍රාහ්මණතෙම ගැබිණිය වෙත නොයයි. ද්‍රෝණය, කුමක් හෙයින් බ්‍රාහ්මණතෙම කිරි පොවන්නියකු වෙත නොයයිද? ද්‍රෝණය, ඉදින් බ්‍රාහ්මණ තෙම කිරි පොවන්නියකු වෙත යේ නම් ඒ දරුවා හෝ දැරිය අපවිත්‍රව පානයකරණ ලද්දේ නම් වේ. ද්‍රෝණය, එහෙයින් බ්‍රාහ්මණතෙම කිරි පොවන්නියක වෙත නොයයි. ද්‍රෝණය, කුමක් හෙයින් බ්‍රාහ්මණතෙම ඔසප් නොවූ ස්ත්‍රියක් වෙත නොයේද, ද්‍රෝණය, ඉදින් බ්‍රාහ්මණතෙම ඔසප් නොවූ ස්ත්‍රියක් වෙත යේ නම් ඒ බ්‍රාහ්මණයාට මේ බැමිණීතොමෝ කාමය පිණිස නොවන්නීය. ක්‍රීඩා පිණිස නොවන්නීය. ඇළුම් පිණිස නොවන්නීය, දරුවන් පිණිස නොවන්නීය.

13. "හෙතෙම පුතෙකු හා දුවක උපදවා හිසකේ රැවුල් බාවා, කසට වත් හැඳ, ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවේ. (මෙහි 2 පණ්ණාසකයේ තිකනිපාතයෙහි 6 සූත්‍රයේ 4 ඡෙදය යෙදිය යුතුයි. පිට 296)

"හෙතෙම මේ සතර ධ්‍යානයන් වඩා සිරුර බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග නම් බ්‍රහ්ම ලෝකයෙහි උපදී. ද්‍රෝණය, මෙසේ වනාහි බ්‍රාහ්මණතෙම දේවසම නම් වේ.

14. "ද්‍රෝණය, කෙසේ නම් බ්‍රාහ්මණතෙම මර්‍යාදා නම් වේද? ද්‍රෝණය, මේ ලෝකයෙහි බ්‍රාහ්මණතෙම (මෙහි 8 (ii) යෙදිය යුතුයි.)

15 (මෙහි 9 (i) යෙදිය යුතුයි.) හෙතෙම ගුරුවරයාට ගුරු වැටුප් පාවාදී අඹුවක් සොයයි. එයද ධර්මයෙන් මැයි. අධර්මයෙන් නොවේ. (මෙහි 11 (ii) යෙදිය යුතුයි.)

16. (මෙය 12 ඡෙදය මෙනි.)

17. "හෙතෙම පුතෙකු හා දුවක උපදවා ඒ පුත්‍ර ප්‍රේමයෙන්ම කැමතිවෙමින් පවුලෙහිම වසයි. ගිහිගෙන් නික්ම ශාසනයෙහි නොපැවිදි වෙයි. පුරාණවූ බමුණන්ගේ සීමාව දක්වා එහි සිටියි. එය නොඉක්මවයි. පුරාණවූ බ්‍රාහ්මණයන්ගේ සීමාව දක්වා එහි බ්‍රාහ්මණතෙම සිටියේ, එය නො ඉක්මවා යයි කියා ද්‍රෝණය, එහෙයින් බ්‍රාහ්මණ තෙම මයර්‍යාද නම් වේයයි, කියනු ලැබේ. ද්‍රෝණය, මෙසේ වනාහි බ්‍රාහ්මණතෙම මයර්‍යාද නම් වේ.

18. "ද්‍රෝණය, කෙසේ නම් බ්‍රාහ්මණතෙම සම්භින්න මයර්‍යාද නම් වේද? ද්‍රෝණය, මේ ලෝකයෙහි බ්‍රාහ්මණතෙම (මෙහි 8 (ii) යෙදිය යුතුයි.)

19. (මෙහි 9 (i) යෙදිය යුතුයි.) හෙතෙම ගුරුවරයාට ගුරු වැටුප් පාවාදී අඹුවක් සොයයි. ධර්මයෙන්ද අධර්මයෙන්ද මිළදී ගැණීමෙන්ද විකුණා ගැණීමෙන්ද අත පැන් වත්කොට දෙනලද බැමිණියක්ද වේ. (ii) හෙතෙම බැමිණිය වෙතද යයි ක්ෂත්‍රියාව වෙතද යයි. වෛශ්‍ය ස්ත්‍රිය වෙතද යයි. ශූද්‍රිය වෙතද යයි. චණ්ඩාලිය වෙතද යයි. වැදි ස්ත්‍රිය වෙතද යයි. කුළු පොතු ස්ත්‍රිය වෙතද යයි. සොම්මරු ස්ත්‍රිය වෙතද යයි. කසලශොධක ස්ත්‍රිය වෙතද යයි. ගැබිණිය වෙතද යයි. කිරි පොවන ස්ත්‍රිය වෙතද යයි. ඔසප්වූ ස්ත්‍රිය වෙතද යයි. ඔසප් නොවූ ස්ත්‍රිය වෙතද යයි. ඒ බ්‍රාහ්මණයාට මේ බැමිණිතොමෝ කාමය පිණිසද ක්‍රීඩාව පිණිසද, ඇල්ම පිණිසද, දරුවන් පිණිසද වන්නීය.

20 "ද්‍රෝණය, පුරාණවූ බ්‍රාහ්මණයන්ගේ සීමාව දක්වා එහි බ්‍රාහ්මණතෙම නොසිටියේ එය ඉක්මවා යයි කියාම එහෙයින් බ්‍රාහ්මණතෙම බිඳිනලද සීමාව ඇත්තේයයි කියනු ලැබේ. ද්‍රෝණය, මෙසේ වනාහි බ්‍රාහ්මණතෙම සම්භින්න මයර්‍යාද නම් වේ.

"ද්‍රෝණය, කෙසේනම් බ්‍රාහ්මණතෙම බ්‍රාහ්මණ චණ්ඩාලවේද? ද්‍රෝණය, මේ ලෝකයෙහි බ්‍රාහ්මණතෙම (මෙහි 8 (i) යෙදිය යුතුයි.)

21. (මෙහි 9 (i) යෙදිය යුතුයි.) හෙතෙම ගුරුවරයාට ගුරු වැටුප් පාවාදී අඹුවක් සොයයි. ධර්මයෙන්ද අධර්මයෙන්ද මිලදී

ගැණීමෙන්ද විකුණා ගැණීමෙන්ද, අත පැන් වත්කොට දෙන තැනැත්තියක්ද වේ. (මෙහි 19 (ii) යෙදිය යුතුයි) හෙතෙම සියලු කර්මාන්තවලින් ජීවිකාව කරයි. ඔහුට බ්‍රාහ්මණයෝ මෙසේ කීවාහුය. කුමක් හෙයින් පින්වත් තෙමේ බ්‍රාහ්මණ යයි ප්‍රතිඥා කෙරෙමින් සියලු කර්මාන්ත වලින් ජීවිකාව කෙරේද, හෙතෙම මෙසේ කීය. 'පින්වත, යම්සේ ගින්න පවිත්‍රවූවක් දවාද, අපවිත්‍රවූවක් දවාද, එයින් ගින්න නොතැවරේද, පින්වත මෙපරිද්දෙන්ම සියලු කර්මාන්ත වලින්ම බ්‍රාහ්මණතෙම ජීවිකාව කෙරේද, පයින් බ්‍රාහ්මණතෙම නොතැවරේ.

22. "ද්‍රෝණය, සියලු කර්මාන්තවලින් ජීවිකාව කෙරේ යයි එහෙයින් බ්‍රාහ්මණතෙම බ්‍රාහ්මණ චණ්ඩාලයයි කියනු ලැබේ. ද්‍රෝණය, මෙසේ වනාහි බ්‍රාහ්මණතෙම බ්‍රාහ්මණ චණ්ඩාල නම් වේ. ද්‍රෝණය, බ්‍රාහ්මණයන්ගේ පූර්වකාලයෙහිවූ මන්ත්‍ර කරන්නාවූ මන්ත්‍ර පවත්වන්නාවූ යම් ඒ ඍෂිහු වූවාහුද, යම් කෙනෙකුන්ගේත් ගායනා කරණලද කියනලද රැස් කරණලද මේ මන්ත්‍ර පදය මේ කාලයෙහි බ්‍රාහ්මණයෝ එයට අනුව ගායනා කරද්ද, එයට අනුව කියද්ද, කියන ලද්ද අනුව කියද්ද, හදාරණ ලද්ද අනුව හදාරද්ද, කියවන ලද්ද අනුව කියවද්ද, එනම් අට්ටකය, වාමකය, වාමදේවය, වෙස්සාමිත්තය, යමතග්ගිය, අංගීරශය, භාරද්වාජය, වාසෙට්ඨය, කාශ්‍යපය, භගුය යන මොහු මේ බ්‍රාහ්මණයන් පස් දෙනා පණවත්, බ්‍රහ්මසමය, දෙවසමය, මයඪාදයා සම්භින්නමයඪාදය, බ්‍රාහ්මණ චණ්ඩාලයාම පස්වෙනි කොට ඇත්තේය. ද්‍රෝණය, ඔවුන්ගෙන් නුඹ කවරෙක් වෙහිද?"

23 "භවත් ගෞතමයන් වහන්ස, මෙසේ ඇති කල්හි අපි බ්‍රාහ්මණ චණ්ඩාල පමණවත් නොපිරෙමු. භවත් ගෞතමයන වහන්ස, (මේ ඡේදය චතුක්ක නිපාතයේ 2 පණ්ණාසකයේ 51 සූත්‍රයේ 6 ඡේදය මෙනි.)

**43. සංගාරව සූත්‍රය:-** 1. ඉක්බිති සංගාරව නම් බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූයේය සතුටු විය යුතු සිහි කටයුතු කථාව කොට නිමවා, එකත්පසෙක ඉඳගත්තේය.

2. "එකත්පසෙක උන්නාවූම සංගාරව නම් බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය. "භවත් ගෞතමයන් වහන්ස, යම් හෙයකින් එක් කලෙක්හි බොහෝ කලක් සජ්ඣායනා කළාවූද මන්ත්‍රයෝ නොවැටහෙත්. සජ්ඣායනා නොකළාහු කියනුම කවරේද? ඊට හේතු කවරේද? ප්‍රත්‍ය කවරේද? භවත් ගෞතමයන් වහන්ස, යම්හෙයකින් එක් කලෙක බොහෝ කලක් සජ්ඣායනා නොකළාවූද මන්ත්‍රයෝ වැටහෙත්. සජ්ඣායනා කළාහු කියනුම කවරේද? ඊට හේතු කිම, ප්‍රත්‍ය කවරේදැයි?

3. "බ්‍රාහ්මණය, යම් කලෙක්හි කාම රාගයෙන් මඩනා ලද්දාවූ කාම රාගයෙන් පෙළුනාවූ සිතින් යුක්තව වාසය කෙරේද, උපන්නාවූද කාම රාගයාගේ දුරු කිරීම තත්වූ පරිද්දෙන් නොදනීද, ඒ කාලයෙහි,

(ii) තමහට වැඩද තත්වූ පරිද්දෙන් නොදනියි. නොදකියි. අනුන්හට වැඩද ඒ කාලයෙහි තත්වූපරිද්දෙන් නොදනියි. නොදකියි. දෙපසට වැඩද එකල්හි තත්වූපරිද්දෙන් නොදනියි. නොදකියි. බොහෝ කලක් හැදෑරුවාවූද, මන්ත්‍ර නොවැටහෙත්. නොහැදෑරුවාහු කියනුම කවරේද?

4. "බ්‍රාහ්මණය, යම්සේ ජල පාත්‍රයතෙම ලාකඩදියෙන් හෝ කෂා වර්ණයෙන් හෝ නීලවර්ණයෙන් හෝ මදටිය පැහැයෙන් හෝ ගැවසුනේවේද, එහි ඇස් ඇති පුරුෂයෙක් ස්වකීය මුඛ නිමිත්ත බලන්නේ තත්වූ පරිද්දෙන් දැන නොගන්නේද, නොදන්නේද, බ්‍රාහ්මණය, මෙපරිද්දෙන්ම (මෙහි 3 ඡේදය යෙදිය යුතුයි)

5. "බ්‍රාහ්මණය නැවත අනිකක්ද කියමි.

(ii) "යම් කලෙක්හි ක්‍රොධයෙන් වඩනාලද, ක්‍රෝධයෙන් පෙළුනාවූ සිතින් යුක්තව වාසය කෙරේද, උපන්නාවූද ක්‍රොධයාගේ දුරුකිරීම තත්වූ පරිද්දෙන් නොදනීද, (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

6. "බ්‍රාහ්මණය, යම්සේ දිය භාජනය තෙම ගින්නෙන් තවනලද්දේ, කකියවන ලද්දේ, උනුකරණ ලද්දේවේද, එහි ඇස්

ඇති පුරුෂතෙම ස්වකීය මුඛ මණ්ඩලය පරීක්ෂාකර බලන්නේ තත්වූ පරිද්දෙන් දැන නොගන්නේද, නොදකින්නේද, බ්‍රාහ්මණය, මෙපරිද්දෙන්ම (මෙහි 5 (ii) සහ 3 (ii) යෙදිය යුතුයි.)

7. "බ්‍රාහ්මණය, නැවත අනිකක්ද කියමි.

(ii) "යම් කලෙක්හි සිතෙහි හා කයෙහි අලසබවවූ ථීනමිද්ධයෙන් මඩනාලද්දාවූ ථීනමිද්ධයෙන් පෙළුනාවූ සිතින් යුක්තව වාසය කෙරේද, උපන්නාවූ ථීනමිද්ධයාගේ දුරුකිරීම තත්වූ පරිද්දෙන් නොදනීද, (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

8. "බ්‍රාහ්මණය, යම්සේ දියබඳුනතෙම සෙවෙල්පරඬැල් වලින් ගැවසීගන්නා ලද්දේවේද, එහි ඇස් ඇති පුරුෂතෙම ස්වකීය මුඛ මණ්ඩලය ප්‍රත්‍ය වෙක්ෂාකරන්නේ තත්වූපරිද්දෙන් දැන නොගන්නේද, නොදකින්නේද, බ්‍රාහ්මණය මෙපරිද්දෙන්ම (මෙහි 7 (ii) සහ 3 (ii) යෙදිය යුතුයි.)

9. "බ්‍රාහ්මණය, නැවත අනිකක්ද කියමි

(ii) "යම් කලෙක්හි උඩගු බැවින් හා කුකුස් බැවින් මඩනාලද, උඩගු බැවින් හා කුකුස් බැවින් පෙළුනාවූ සිතින් යුක්තව වාසයකෙරේද, උපන්නාවූද උද්ධච්චකුක්කුච්චයාගේ දුරුකිරීම තත්වූ පරිද්දෙන් නොදනීද (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

10. "බ්‍රාහ්මණය, යම් සේ දිය භාජනයතෙම වාතයෙන් කම්පාවූයේ සැළුනේ කැරකුනේ, හටගත් රළ ඇත්තේවේද, එහි ඇස් ඇති පුරුෂතෙම ස්වකීය මුඛ මණ්ඩලය බලන්නේ තත්වූ පරිද්දෙන් දැන නොගන්නේද, නොදකින්නේද, බ්‍රාහ්මණය, මෙපරිද්දෙන්ම (මෙහි 9 (ii) සහ 3 (ii) යෙදිය යුතුයි.)

11. "බ්‍රාහ්මණය, නැවත අනිකක්ද කියමි. (ii) යම් කලෙක්හි විචිකිච්ඡාවෙන් මඩනාලද විචිකිච්ඡාවෙන් පෙළුනාවූ සිතින් යුක්තව වාසයකෙරේද, උපන්නාවූ විචිකිච්ඡාවගේ දුරුකිරීම තත්වූපරිද්දෙන් නොදනීද, (මෙහි 3 (ii) යෙදිය යුතුයි)

12. "බ්‍රාහ්මණය, යම්සේ දිය භාජනයතෙම අවුල්වූයේ කැළඹුනේ, මඩවූයේ, අඳුරෙහි බහාතබන ලද්දේවේද, එහි ඇස් ඇති පුරුෂයෙක්තෙම ස්වකීය මුඛ මණ්ඩලය සොයා බලන්නේ,

තත්වූ පරිද්දෙන් නොදන්නේද, නොදක්නේද බ්‍රාහ්මණය, මෙපරිද්දෙන්ම (මෙහි 11 (ii) සහ 3 (ii) යෙදිය යුතුයි.)

13 "බ්‍රාහ්මණය, යම් කලෙක වනාහි කාම රාගයෙන් නොමඩනා ලද කාම රාගයෙන් නොපෙළුනාවූ සිතින් යුක්තව වාසය කෙරේද, උපන්නාවූ කාමරාගයාගේ දුරුකිරීම තත්වූ පරිද්දෙන් දනීද, එකල්හි තමහට වැඩද තත්වූ පරිද්දෙන් දනියි දකියි. (ii) එකල්හි අනුන්හට වැඩද තත්වූ පරිද්දෙන් දනියි. දකියි. එකල්හි දෙපසට වැඩද තත්වූ පරිද්දෙන් දනියි, දකියි බොහෝ කලක් නොහදාළාවූද මන්ත්‍ර වැටහෙත්. හදාළාහු කියනුම කවරේද?

14 "බ්‍රාහ්මණය, යම්සේ දිය භාජනය තෙම ලාකඩ දියෙන් හෝ කෂා වර්ණයෙන් හෝ නීල වර්ණයෙන් හෝ මදටිය වර්ණයෙන් හෝ නොගැවසෙන ලද්දේ වේද, එහි ඇස් ඇති පුරුෂතෙම ස්වකීය මුඛ මණ්ඩලය පරීක්ෂාකර බලන්නේ තත්වූ පරිද්දෙන් දැනගන්නේද, දකින්නේද බ්‍රාහ්මණය, මෙපරිද්දෙන්ම (මෙහි 13 ඡේදය යෙදිය යුතුයි.)

15 "බ්‍රාහ්මණය, නැවත අනිකක්ද කියමි. (ii) යම් කලෙක්හි ව්‍යාපාදයෙන් නොමඩනා ලද ව්‍යාපාදයෙන් නොපෙලුනාවූ සිතින් යුක්තව වාසය කෙරේද, උපන්නාවූද ව්‍යාපාදයාගේ දුරුකිරීම තත්වූ පරිද්දෙන් දනීද, (ii) (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

16 "බ්‍රාහ්මණය, යම්සේ දිය භාජනය තෙම ගින්නෙන් නොතවන ලද්දේ නොපැසවන ලද්දේ උණු නොකරණ ලද්දේ වේද, එහි ඇස් ඇති පුරුෂතෙම ස්වකීය මුඛමණ්ඩලය සොයා බලන්නේ තත්වූ පරිද්දෙන් දැන ගන්නේද, දකින්නේද බ්‍රාහ්මණය, මෙපරිද්දෙන්ම, (මෙහි 15 (ii) සහ 13 (ii) යෙදිය යුතුයි.)

17 "බ්‍රාහ්මණය, නැවත අනිකක්ද කියමි. (ii) යම් කලෙක්හි ථීනමිද්ධයෙන් නොමඩනා ලද්දාවූ ථීනමිද්ධයෙන් නොපෙළුනාවූ සිතින් යුක්තව වාසය කෙරේද, උපන්නාවූද ථීනමිද්ධයාගේ දුරුකිරීම තත්වූ පරිද්දෙන් දනීද, (මෙහි 13 (ii) යෙදිය යුතුයි)

18 "බ්‍රාහ්මණය, යම්සේ දිය භාජනය තෙම සෙවෙල් පරඬැල් වලින් නොගැවසෙන ලද්දේද, එහි ඇස් ඇති පුරුෂ තෙම ස්වකීය මුඛ මණ්ඩලය සොයා බලන්නේ තත්වූ පරිද්දෙන් දැනගන්නේද, දැකගන්නේද, බ්‍රාහ්මණය මෙපරිද්දෙන්ම (මෙහි 17 (ii) සහ 13 (ii) යෙදිය යුතුයි.)

19 'බ්‍රාහ්මණය, නැවත අනිකක්ද කියමි. (ii) යම් කලෙක්හි උද්ධච්ච කුක්කුච්චයෙන් නොමඩනා ලද්දාවූ උද්ධච්ච කුක්කුච්චයෙන් නොපෙළුනාවූ සිතින් යුක්තව වාසය කෙරේද, උපන්නාවූද උද්ධච්ච කුක්කුච්චයාගේ දුරුකිරීම තත්වූ පරිද්දෙන් දනීද, (මෙහි 13 (ii) යෙදිය යුතුයි.)

20 "බ්‍රාහ්මණය, යම්සේ දිය භාජනය තෙම සුළඟින් කම්පා නොවූයේ නොසැලුනේ නොකැරකුනේ හටගත් රළ නැත්තේ වේද, එහි ඇස් ඇති පුරුෂ තෙම ස්වකීය මුඛ මණ්ඩලය පරීක්ෂා කරන්නේ තත්වූ පරිද්දෙන් දැනගන්නේද දැකගන්නේද, බ්‍රාහ්මණය, මෙපරිද්දෙන්ම (මෙහි 19 (ii) සහ 13 (ii) යෙදිය යුතුයි)

21 'බ්‍රාහ්මණය, නැවත අනිකක්ද කියමි (ii) යම් කලෙක්හි විචිකිච්ඡාවෙන් නොමඩනා ලද්දාවූ විචිකිච්ඡාවෙන් නොපෙළුනාවූ සිතින් යුක්තව වාසය කෙරේද, උපන්නාවූද විචිකිච්ඡාවගේ දුරුකිරීම තත්වූ පරිද්දෙන් දනීද, (මෙහි 13 (ii) යෙදිය යුතුයි.)

22 "බ්‍රාහ්මණය, යම්සේ දිය භාජනය තෙම නිර්මලවූයේ විශෙෂයෙන් පැහැදුනේ නොකැළඹුනේ ආලෝකයෙහි තබන ලද්දේ වේද එහි ඇස් ඇති පුරුෂතෙම ස්වකීය මුඛ මණ්ඩලය සොයා බලන්නේ තත්වූ පරිද්දෙන් දැනගන්නේද, දැක ගන්නේද, බ්‍රාහ්මණය, මෙපරිද්දෙන්ම යම් කලෙක්හි (මෙහි 21 (ii) සහ 13 (ii) යෙදිය යුතුයි.)

23 'බ්‍රාහ්මණය, යම්හෙයකින් එක්කලෙක බොහෝ කලක් හදාළාවූද මන්ත්‍ර නොවැටහෙත්. නොහදාළාහු කියනුම කවරේද? ඊට මේ හේතුවේ. මේ ප්‍රත්‍යයවේ. බ්‍රාහ්මණය යම් හෙයකින් එක්කලෙක බොහෝකලක් නොහදාළාවූද මන්ත්‍ර වැටහෙත්.

හදාළාහු කියනුම කවරේදැයි යන මෙයට මේ හේතුව වේ. මෙය ප්‍රත්‍යවේයයි" වදාළේය.

24 (මේ ඡේදය චතුක්ක නිපාතයේ 2 පණ්ණාසකයේ 51 සූත්‍රයේ 6 ඡේදය මෙනි)

44 **කාරණපාළී සූත්‍රය**:- 1 "එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ විසල් නුවර මහවන වෙහෙර කූටාගාර ශාලාවෙහි වැඩවසන සේක. එකල්හි වනාහි කාරණපාලී නම් බ්‍රාහ්මණතෙම ලිච්ඡවි රජුන්ගේ කර්මාන්තයක් කරයි. කාරණපාලී නම් බ්‍රාහ්මණතෙම පිංගියානි නම් බ්‍රාහ්මණයා එන්නහු දුරදීම දුටුයේය. දැක පිංගියානී නම් බ්‍රාහ්මණයාට මෙය කීයේය. එබැවින් භවත් පිංගියානි තෙමේ මධ්‍යාහ්ණයෙහි කොහි සිට එන්නේද?

"පින්වත, මම මේ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ ගේ සමීපයෙහි සිට එමියි."

"භවත් පිංගියානි තෙමේ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේගේ ප්‍රඥාපටුත්වය ඒ කුමකැයි හඟීද? පණ්ඩිතයෙකැයි සිතන්නේද?"

"පින්වත, මම කවරෙක්ද? කවරෙක් නම් වෙම්ද ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ප්‍රඥාපටුත්වය කවරෙක් නම් දන්නෙම්ද? යමෙක් තෙම ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ප්‍රඥා පටුත්වය දන්නේ නම් හෙතෙමේද ඒකාන්තයෙන් එබන්දෙක්ම වන්නේය

2 "භවත් පිංගියානි තෙමේ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේට මහත්වුම ප්‍රශංසාවකින් ප්‍රශංසා කෙරේයයි"

"පින්වත, මම කවරෙක්ද, කෙබඳුවූ නම් මම ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේට ප්‍රශංසා කරන්නෙම්ද ඒ භවත් ගෞතම තෙමේ පසස්නාලද්දාවුන් විසිනුත් පසස්නා ලද්දාවූම දෙව්මිනිසුන්ට ශ්‍රේෂ්ඨ වේය."

"භවත් පිංගියානි තෙමේ ශ්‍රමණ භවත් ගෞතමයන් කෙරෙහි කිනම් කරුණක් දකිමින් මෙසේ විශෙෂයෙන් පැහැදුනේද?"

3 "පින්වත, යම්සේ පුරුෂයෙක් තෙම උතුම්වූ රසයෙන් ඉතා තෘප්තියට පැමිණියේ අන්‍යවූ ලාමකවූ රසයන් නොකැමති වේද, පින්වත, මෙපරිද්දෙන්ම යම් යම් තැනකින් ඒ භවත් ගෞතමයන් වහන්සේගේ ධර්මය අසයිද, සූත්‍රවශයෙන් හෝ ගෙය්‍ය වශයෙන් හෝ වෙය්‍යාකරණ වශයෙන් හෝ අද්භූත ධර්ම වශයෙන් හෝ ඒ ඒ තැනින් අන්‍යවූ බොහෝ මහණ බමුණන්ගේ වාදයන්ට නොකැමැති වෙයි. පින්වත, යම්සේ පුරුෂතෙම බඩසයින්වූ දුර්වල බැවින් පෙළුනේ මී පිඩුවක් ලබන්නේද, හෙතෙම යම් යම් තැනකින් රස විඳින්නේද, අන් රසයකින්ද මිශ්‍රවූ මිහිරි රසයම ලබාද පින්වත, මෙපරිද්දෙන්ම යම් යම් තැනින් ඒ ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ධර්මය අසයිද, සූත්‍ර වශයෙන් හෝ ගෙය්‍ය වශයෙන් හෝ වෙය්‍යාකරණ වශයෙන් හෝ අද්භූත ධර්ම වශයෙන් හෝ ඒ ඒ තැනින් සතුට ඇති බව ලබාමය. චිත්තයාගේ ප්‍රසාදය ලබාමය.

4 "පින්වත, යම්සේ පුරුෂයෙක්තෙම රන්වන් සඳුන් හෝ රත් සඳුන් හෝ සඳුන් ගැටයක් ලබන්නේද, හෙතෙම යම් යම් තැනකින් ආඝ්‍රාණය කරන්නේද, මුලින් හෝ මැදින් හෝ කෙළවරින් හෝ අන් සුවඳකින් මිශ්‍රනොවූ යහපත් සුවඳම ලබාද, මෙපරිද්දෙන්ම (ii) යම් යම් තැනකින් ඒ භවත් ගෞතමයන්ගේ ධර්මය අසාද සූත්‍ර වශයෙන් හෝ ගෙය්‍ය වශයෙන් හෝ වෙය්‍යාකරණ වශයෙන් හෝ අද්භූත ධර්ම වශයෙන් හෝ (iii) ඒ ඒ තැනින් ප්‍රමුදිත භාවය ලබයි. සතුට ලබයි.

5 "පින්වත යම්සේ පුරුෂයෙක් හටගත් ආබාධ ඇත්තේ දුකින් පෙළුනේ දැඩි ගිලන් වේද, දක්ෂවූ වෙදෙක් ස්ථාන වශයෙන් ඔහුගේ ආබාධය දුරුකරන්නේද, පින්වත මෙපරිද්දෙන්ම (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) ඒ ඒ තැනින් ශොකපරිදෙව දුක් දොම්නස් උපායාසයෝ නැසීමට යෙත්.

6 "පින්වත, යම්සේ නිර්මල ජලය ඇති මිහිරි ජලය ඇති සිහිල් ජලය ඇති සුදුපැහැ ඇති මනාකොට ඇති සිත් කළු පොකුණක් වේද, ඉක්බිති ග්‍රීෂ්මයෙන් තැවුනාවූ ග්‍රීෂ්මයෙන් පෙළුනාවූ ක්ලාන්තවූ හටගත් තෘෂ්ණා ඇත්තාවූ පැන්බොනු

කැමතිවූ පුරුෂයෙක් එන්නේද, හෙතෙම ඒ පොකුණට බැස ස්නානය කොටද පානය කොටද සියලු වෙහෙස මහන්සි දැවිලි සංසිඳවා ගන්නේද, පින්වත, මෙපරිද්දෙන්ම (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) ඒ ඒ තැනින් සියලු ක්ලෙශදරථ කෙලෙස් දැවිල්ලෙන් සංසිඳෙත්යයි" කීයේය.

7 "මෙසේ කීකල්හි කාරණපාලි නම් බ්‍රාහ්මණ තෙම හුනස්නෙන් නැගිට උතුරුසළුව ඒකාංශකොට දකුණු දණ මඬල බිම හැනගෙණ භාග්‍යවතුන් වහන්සේ යම් දිශාවෙක්හිද ඒ දිශාවට ඇඳිලි බැඳගෙණ තුන්වරක් ප්‍රීතිවාක්‍ය ප්‍රකාශ කෙළේය. 'ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා, ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා. ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවායි,

8 "භවත් පිංගියානිය ඉතා යහපත, භවත් පිංගියානිය ඉතා යහපත. භවත් පිංගියානිය, යම්සේ යටිකුරුකොට තබන ලද්දක් උඩුකුරු කරන්නේ හෝ වේද, වසන ලද්දක් විවෘත කරන්නේ හෝ වේද, මංමුළා වූවෙකුට මග කියන්නේ හෝ වේද, ඇස් ඇත්තෝ රූප දකිත්වායි අන්ධකාරයෙහි තෙල් පහණක් දල්වන්නේ හෝ වේද, මෙපරිද්දෙන්ම භවත් පිංගියානි විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය ප්‍රකාශ කරණ ලදී. භවත් පිංගියානිය, ඒ මම ඒ භවත් ගෞතමයන් වහන්සේද ධර්මයද භික්ෂු සංඝයාද සරණකොට යමි. භවත් පිංගියානි තෙම මා අද පටන් දිවිහිමියෙන් සරණගියාවූ උපාසකයෙකැයි දරණ සේක්වායි" කීයේය.

**45. පිංගියානී සූත්‍රය:-** 1 "එක්කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ විසල් නුවර මහවන වෙහෙර කූටාගාර ශාලාවෙහි වැඩවසන සේක. එකල්හි වනාහි පන්සියයක් පමණ ලිච්ඡවි රජවරු භාග්‍යවතුන් වහන්සේ ඇසුරු කරත්. ඇතැම් ලිච්ඡවීහු නීලවර්ණවූ නිලවර්ණ වස්ත්‍ර ඇත්තාහු නීලවර්ණ ආභරණ ඇත්තාහු නිල්පැහැවූවාහු වෙත්. ඇතැම් ලිච්ඡවීහු පීතවර්ණවූ පීතවර්ණ වස්ත්‍ර ඇත්තාවූ පීතවර්ණ ආභරණ ඇත්තාවූ රන්වන්

වූවාහු වෙත්. ඇතැම් ලිච්ඡවීහු ලෝහිතක වර්ණවූ ලෝහිතක වර්ණ වස්ත්‍ර ඇත්තාහු ලෝහිතක වර්ණ ආභරණ ඇත්තාවූ රතු පැහැ වූවාහු වෙත්. ඇතැම් ලිච්ඡවීහු ස්වෙත වර්ණවූ ස්වෙත වර්ණ වස්ත්‍ර ඇත්තාවූ ස්වෙත වර්ණ ආභරණ ඇත්තාවූ සුදු පැහැ ඇත්තාහු වෙත්. භාග්‍යවතුන් වහන්සේ වර්ණයෙන්ද යශසින්ද ඒ හැමදෙනම ඉක්මවා බබළයි.

2 'එකල්හි පිංගියානි බ්‍රාහ්මණ තෙම හුනස්නෙන් නැගිට උතුරුසළුව ඒකාංශකොට භාග්‍යවතුන් වහන්සේ යම් දිශාවෙක්හිද ඒ දිශාවට ඇඳිළි බැඳගෙණ භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය.

"භාග්‍යවතුන් වහන්ස, මට වැටහෙයි. සුගතයන් වහන්ස, මට වැටහේයයි"

"පිංගියානිය, තට වැටහේවායි" භාග්‍යවතුන් වහන්සේ වදාළේය.

3 "එකල්හි පිංගියානි බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි සුදුසුවූ ගාථාවකින් ස්තුති කෙළේය.

1 "යම්සේ උදෑසන පිපියාවූ සුවඳ ඇත්තාවූ පහව නොගිය සුවඳ ඇති රත් පියුමක් වන්නේද, එමෙන් අහසෙහි බබළන්නාවූ සූර්‍ය්‍යයා මෙන් බබළන්නාවූ සර්වඥයන් වහන්සේ බලවයි කීයේය.

ඉක්බිති ඒ ලිච්ඡවීහු උතුරුසළු පන්සියයකින් පිංගියානි බමුණා පිදූහ. ඉක්බිති පිංගියානි බ්‍රාහ්මණ තෙම ඒ උතුරුසළු පන්සියයෙන් භාග්‍යවතුන් වහන්සේ පිදුයේය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ ලිච්ඡවීන්ට මෙය වදාළසේක.

4 "ලිච්ඡවීනි, රත්න පසක්හුගේ පහළවීම ලෝකයෙහි දුර්ලභවේ

5 "කවර පසක්හුගේද යත්? අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේගේ පහළවීම ලෝකයෙහි දුර්ලභවේ. තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරන ලද්දාවූ ධර්ම විනය දෙශනාකරන්නාවූ පුද්ගලතෙම ලෝකයෙහි දුර්ලභවේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

තථාගතයන් වහන්සේ විසින් වදාරණ ලද ධර්මවිනය දෙශනා කරණ ලද්ද දැනගන්නා පුද්ගල තෙම ලෝකයෙහි දුර්ලභවේ. තථාගතයන් වහන්සේ විසින් වදාරණ ලද ධර්ම විනය දෙශනා කළ කල්හි දන්නා ලද ධර්මානු ධර්ම ප්‍රතිපදාවට පිළිපන්නාවූ පුද්ගලතෙම ලෝකයෙහි දුර්ලභවේ. කෘතඥවූ කළගුණ දන්නාවූ පුද්ගලතෙම ලෝකයෙහි දුර්ලභවේ. යන පසයි.

6 (මේ ඡෙදය 4 ඡෙදය මෙනි.)

**46. මහාසුපින සූත්‍රයː-** 1. "මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන්ට සම්බොධියෙන් පූර්වයෙහිම අභිසම්බුද්ධ නොවූ බොධිසත්ව වූවහුටම මහාස්වප්න පසක් පහළවූහ.

2. "කවර පසක්දයත්? (ii) මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන්ට සම්බොධියෙන් පූර්වයෙහිම සම්බොධියට නොපැමිණියාවූ බොධිසත්ව වූවහුටම (iii) මේ මහා පෘථිවිතොමෝ මහත්වූ සයනය වූයේය. හිමවත් පර්වත රාජයා කොට්ටය විය. පෙරදිග මුහුදෙහි වම් අත පිහිටියේ විය. අවරදිග මුහුදෙහි දකුණු අත පිහිටියේ විය. දකුණුදිග මුහුදෙහි දෙපා පිහිටියාහුය. (iv) මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන්ට සම්බෝධියෙන් පූර්වයෙහිම බුදුබවට නොපැමිණියාවූ බොධිසත්ව වූවහුටම (v) මේ පළමුවන මහා ස්වප්නය පහළවූයේය.

3. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) (ii) තියර්‍යා නම් තෘණ ජාතිය හෙවත් (කුශතණ ගසක්) නාභියෙන් පැන නැග අහසට හැපී සිටියේය (iii) මෙහි 2 (ii) යෙදිය යුතුයි.) මේ දෙවන මහා ස්වප්නය පහළවූයේය.

4. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) (ii) සුදුවූ කළුහිස ඇත්තාවූ ප්‍රාණීහු පාවලින් උඩට නැගී දන මඩල දක්වා වසාගත්තාහුය. (iii) (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) මේ තුන්වන මහා ස්වප්නය පහළවිය.

5. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) නොයෙක් වර්ණ ඇති ලිහිණි සතරදෙනෙක් සතර දිගින්

අවුත් පාමුලවැටී සියල්ල සුදුබවට පැමිණියාහුය. (iii) (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) මේ සතරවන මහා ස්වප්නය පහළවූයේය.

6. 'මහණෙනි, නැවත අනිකක්ද කියමි. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) (ii) මහත්වූ අශුචි පර්වතයක්හුගේ මතුමත්තෙහි අශුචියෙන් නොතැවරෙමින් සක්මන් කරයි. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) මේ පස්වන මහා ස්වප්නය පහළවූයේය.

7. (මෙහි 2 (ii) සහ 2 (iii) යෙදිය යුතුයි.) අත පිහිටියේය. යන යමකුත්වීද, මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් විසින් නිරුත්තරවූ සම්‍යක් සම්බෝධිය අවබෝධ කරණලදී. ඒ අභිසම්බොධිය සඳහා මේ පළමුවන මහා ස්වප්නය පහළවූයේය.

8. (මෙහි 2 (ii) සහ 3 (ii) යෙදිය යුතුයි.) යන යමකුත් වීද, මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ තථාගතයන් විසින් ආය්‍ර්‍ය අෂ්ටාංගික මාර්ගයතෙම බුදුබවට පැමිණ යම්තාක් දෙව් මිනිසුන් හා මනාව ප්‍රකාශකරණ ලද්දේද, ඔහුගේ අවබෝධය පිණිස මේ දෙවන මහා ස්වප්නය පහළවූයේය.

9. (මෙහි 2 (ii) සහ 4 (ii) යෙදිය යුතුයි.) යන යමකුත් වීද, මහණෙනි, සුදුවත් හැන්දාවූ බොහෝ ගෘහස්ථයෝ තථාගතයන් දිවිහිමියෙන් සරණ ගියාහුය. එය අවබොධකිරීම පිණිස මේ තුන්වන මහා ස්වප්නය පහළවූයේය.

10. (මෙහි 2 (ii) සහ 5 (ii) යෙදිය යුතුයි.) යන යමකුත් වීද, මහණෙනි, මේ ක්ෂත්‍රියයෝය. බ්‍රාහ්මණයෝය. වෛශ්‍යයෝය, ශූද්‍රයෝයයි වර්ණ සතරක් වෙත්. ඔව්හු තථාගතයන් විසින් වදාරණලද ධර්මවිනයෙහි ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිව නිරුත්තරවූ ක්ලේශ විමුක්තිය ප්‍රත්‍යක්ෂ කරත්. ඔහුගේ අවබොධ කිරීම පිණිස මේ සතරවන මහා ස්වප්නය පහළවූයේය.

11. (මෙහි 2 (ii) සහ 6 (ii) යෙදිය යුතුයි.) යන යමකුත්වීද, මහණෙනි, තථාගතතෙම චීවරය, පිණ්ඩපාතය, සයනාසනය, ගිලන්පස, බෙහෙත් පිරිකරය යන මොවුන්ගේ ලැබීම ඇත්තේ වෙයි. එහිද තථාගතතෙම ගැට නොගැසුනේ මුසපත් නොවූයේ,

නොවැද ගත්තේ, ආදීනව දක්නා ස්වභාව ඇත්තේ, නික්මෙන නුවණ ඇත්තේ වළඳයි. ඔහුගේ අවබෝධය පිණිස මේ පස්වන මහා ස්වප්නය පහළවූයේය.

12. (මේ ඡේදය 1 ඡේදය මෙනි.)

47. **වස්සන්තරාය සූත්‍රය**:- 1. "මහණෙනි, නිමිති කියන්නාහු යමක් නොදනිද්ද, නිමිති කියන්නවුන්ගේ ඇස යම් තැනෙක්හි කායඅීක්ෂම නොවේද, (ii) එබඳු වූ මේ වර්ෂාවට අන්තරායයෝ පසක් වෙත්.

2. "කවර පසක්දයත්? මහණෙනි, මතු ආකාශයෙහි තෙජොධාතුව කිපෙයි. එයින් උපන්නාවූ මේඝයෝ පහව යෙත්. (මෙහි 1 යෙදිය යුතුයි) මේ පළමුවන වර්ෂාවගේ අන්තරාය වේ.

3. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. මතු ආකාශයෙහි වායෝ ධාතුව කිපෙයි. එයින් උපන්නාවූ මේඝයෝ පහවයෙත්. (මෙහි 1 (i) යෙදිය යුතුයි.) ඒ මේ දෙවන වර්ෂාවගේ අන්තරාය වේ.

4 "මහණෙනි, නැවත අනිකක්ද කියමි. රාහු අසුරෙන්ද්‍ර තෙමේ අත්ලෙන් ජලය පිළිගෙණ මහමුහුදෙහි හැර දමයි. (මෙහි 1 (i) යෙදිය යුතුයි.) ඒ මේ තුන්වන වර්ෂාවගේ අන්තරාය වේ.

5. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. වස්සවළාහක නම් දෙවියෝ ප්‍රමාදවූවාහු වෙත්. (මෙහි 1 (i) යෙදිය යුතුයි.) ඒ මේ සතරවන වර්ෂාවගේ අන්තරාය වේ.

6. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. මනුෂ්‍යයෝ අධාර්මිකයෝ වෙද්ද, (මෙහි 1 (i) යෙදිය යුතුයි.) ඒ මේ පස් වන වර්ෂාවගේ අන්තරාය වේ යන පසයි.

7. (මෙය 1 ඡේදය මෙනි.)

48. **සුභාසිතවාචා සූත්‍රය**:- 1. "මහණෙනි, අංග පසකින් යුක්තවූ වචනය සුභාසිත නම් වේ. දුර්භාසිත නම් නොවේ. නිරවද්‍යද නුවණැත්තන් විසින් දොස් නොකිය යුත්තීද වේ.

2 "කවර පසකින්දයත්? සුදුසු කාලයෙහි කියනලද්දී වේද, සත්‍යවූවක්ම කියනලද්දී වේද, සිළුටුවූවක් කියනලද්දී වේද, වැඩ සහිත වූවක් කියනලද්දී වේද, මෛත්‍රී සිතින් කියන ලද්දීවේද යන පසිනි.

3. (මෙය 1 ඡේදය මෙනි.)

**49. කුලූප සංකමන සූත්‍රය**:- 1. "මහණෙනි, යම් කලෙක්හි සිල්වත්වූ ප්‍රව්‍රජිතයෝ කුලයට එළඹෙත්ද, එහි මිනිස්සු කරුණු පසකින් බොහෝ පින් රැස් කරත්.

2. "කවර පසකින්දයත්? (ii) මහණෙනි, යම් කලෙක්හි කුලයට එළඹෙන්නාවූ, සිල්වත්වූ ප්‍රව්‍රජිතයන් දැක (ii) මිනිස්සු සිත් පහදවද්ද, මහණෙනි, එකල්හි ඒ කුලය ස්වර්ග සැප පිණිස පවත්නාවූ ප්‍රතිපදාවට පිළිපන්නේ වෙයි.

3. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) මිනිස්සු හුනස්නෙන් නැගිටිද්ද, මනාකොට වඳිද්ද, ආසනය දෙද්ද, මහණෙනි, එකල්හි ඒ කුලය උසස් කුල ඇතිවීම පිණිස පවත්නාවූ ප්‍රතිපදාවට පිළිපන්නේ වේ.

4 (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) මසුරුමල දුරු කෙරෙද්ද මහණෙනි, එකල්හි ඒ කුලය මහත් පිරිවර ඇතිබැව් පිණිස පවත්නාවූ ප්‍රතිපදාවට පිළිපන්නේවේ.

5. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) මිනිස්සු ශක්තිවූ පරිද්දෙන් බලයවූ පරිද්දෙන් දාන සංවිභාගය කෙරෙද්ද, මහණෙනි, එකල්හි ඒ කුලය මහත් සම්පත් ඇතිබැව් පිණිස පවත්නාවූ ප්‍රතිපදාවට පිළිපන්නේවේ.

6. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) මිනිස්සු කරුණු විචාරද්ද, ප්‍රශ්න කෙරෙද්ද, ධර්මය අසද්ද. මහණෙනි, එකල්හි ඒ කුලය මහත් ප්‍රඥාව ඇති බැව් පිණිස පවත්නාවූ ප්‍රතිපදාවට පිළිපන්නේවේ.

7. (මෙය 1 ඡේදය මෙනි.)

**50. නිස්සාරණීය ධාතු සූත්‍රය**:- 1. "මහණෙනි, බැහැර කළයුතු මේ ධාතු පසක් වෙත්.

2. "කවර පසක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි කාමයන් මෙනෙහි කරන්නාවූ භික්ෂුහුගේ කාමයන්හි (ii) සිත ඇතුල් නොවේද, නොපහදීද, නොපිහිටාද, නොමිදේද,

3. නෛෂ්ක්‍රම්‍යය වනාහි සිහිකරන්නාවූ මොහුගේ නෛෂ්ක්‍රම්‍යයෙහි (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) (ii) ඔහුගේ ඒ සිත මනාව ගමන් කරණ ලද්දේ මනාව වඩනා ලද්දේ, මනාව නැගී සිටියේ, මනාව මිදුනේ (iii) කාමයන්ගෙන් මනාව වෙන්වූයේ වෙයි. කාම හේතුවෙන් දුක්වූ පරිඩාහ ඇති යම් ආශ්‍රවයෝ උපදිද්ද, හෙතෙම ඔවුන්ගෙන් මිදුනේ වේ. හෙතෙම ඒ වේදනාව නොවිඳිනු ලබයි. මෙය කාමයන්ගේ බැහැර කිරීමයයි කියනලදී.

4. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. ව්‍යාපාදය මෙනෙහි කරන්නාවූ භික්ෂුහුගේ ව්‍යාපාදයෙහි සිත ඇතුල් නොවේද, නොපහදීද නොපිහිටාද, නොමිදේද, අව්‍යපාදය වනාහි මෙනෙහි කරන්නාවූ මොහුගේ අව්‍යාපාදයෙහි (මෙහි 2 (ii) සහ 3 (iii) යෙදිය යුතුයි.) ව්‍යාපාදයෙන් මනාව වෙන්වූයේ වේ ව්‍යාපාද හේතුවෙන් දුක්වූ පරිඩාහ ඇති යම් ආශ්‍රවයෝ උපදිද්ද. හෙතෙම ඔවුන්ගෙන් මිදුනේ වේ. හෙතෙම ඒ වේදනාව නොවිඳිනු ලැබේ. මේ ව්‍යාපාදයාගේ දුරුකිරීමයයි කියන ලදී.

5. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. විහිංසාව මෙනෙහි කරන්නාවූ භික්ෂුහුගේ විහිංසාවෙහි සිත ඇතුල් නොවේද, නොපහදීද, නොපිහිටාද, නොමිදේද, අවිහිංසාව වනාහි මෙනෙහි කරන්නාවූ මොහුගේ අවිහිංසාවෙහි (මෙහි 2 (ii) සහ 3 (iii) යෙදිය යුතුයි.) විහිංසාවෙන් මනාව වෙන්වූයේ වේ. විහිංසාව හේතුකොට ගෙණ දුක්වූ පරිඩාහ ඇති යම් ආශ්‍රවයෝ උපදිද්ද, හෙතෙම ඔවුන්ගෙන් මිදුනේ වේ. හෙතෙම ඒ වේදනාව නොවිඳිනු ලැබේ. මෙය විහිංසාවගේ දුරුකිරීම යයි කියන ලදී.

6. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. රූපය මෙනෙහි කරන්නාවූ භික්ෂුහුගේ රූපයෙහි සිත නොවදීද, නොපහදීද, නොපිහිටාද, නොමිදේද, අරූපය වනාහි මෙනෙහි කරන්නාවූ මොහුගේ අරූපයෙහි (මෙහි 2 (ii) සහ 3 (iii) යෙදිය යුතුයි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

රූපයන්ගෙන් මනාව වෙන්වූයේ වෙයි. රූප හේතුවෙන් දුක්වූ පරිඩාහ ඇති යම් ආශ්‍රවයෝ උපදිද්ද, හෙතෙම ඔවුන්ගෙන් මිදුනේ හෙතෙම ඒ වේදනාව නොවිඳිනු ලැබේ. මෙය රූපයන්ගේ දුරුකිරීම යයි කියන ලදී

7. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. සත්කාය මෙනෙහි කරන්නාවූ භික්ෂුහුගේ ස්වකීය කයෙහි සිත නොවදීද, නොපහදීද, නොපිහිටාද, නොමිදේද, සත්කාය නිරෝධය වනාහි මෙනෙහි කරන්නාවූ මොහුගේ සත්කාය නිරෝධයෙහි (මෙහි 2 (ii) සහ 3 (iii) යෙදිය යුතුයි.) සත්කායයෙන් මනාව වෙන්වූයේ වේ. සත්කාය හේතුවෙන් දුක්වූ පරිඩාහ ඇති යම් ආශ්‍රවයෝ උපදිද්ද, හෙතෙම ඔවුන්ගෙන් මිදුනේය. හෙතෙම ඒ වේදනාව නොවිඳිනු ලැබේ මෙය සත්කායයාගේ දුරුකිරීම යයි කියන ලදී. ඔහුට කාමයන් පිළිබඳ සතුටද නූපදී. ව්‍යාපාදයන් පිළිබඳ සතුටද නූපදී. විහිංසාව පිළිබඳ සතුටද නූපදී. රූපය පිළිබඳ සතුටද නූපදී. ස්වකීය කය පිළිබඳ සතුටද නූපදියි. හෙතෙම කාමය පිළිබඳ සතුට නොඉපදීමෙන්ද ව්‍යාපාදය පිළිබඳ සතුට නො ඉපදීමෙන්ද විහිංසාව පිළිබඳ සතුට නොඉපදීමෙන්ද රූපය පිළිබඳ සතුට නො ඉපදීමෙන්ද ස්වකීය කය පිළිබඳ සතුට නො ඉපදීමෙන්ද, මහණෙනි, මේ භික්ෂුතෙම අනුශය රහිතවූයේ තෘෂ්ණාව සින්දේය. සංයෝජනය පෙරළුයේය. මනාකොට මානය සංසිඳවීමෙන් දුක කෙළවර කෙළේයයි" කියනු ලැබේ.

8. (මෙය 1 ඡෙදය මෙනි)

**සතරවන පණ්ණාසකය නිමි.**

---

**පස්වෙනි පණ්ණාසකය.**

## 21. කිම්බිල වර්ගය.

1. **කිම්බිල සූත්‍රය:-** 1. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ කිම්බිලා නම් නුවර මිදෙල්ල වනයෙහි වාසය කරණ සේක. එකල්හි වනාහි ආයුෂ්මත් කිම්බිල ස්ථවිරතෙම භාග්‍යවතුන්

වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස්ව හුන්නේය. එකත්පස්ව හුන්නාවූම ආයුෂ්මත් කිම්බිල ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය.

2 "ස්වාමීනි, යමකින් තථාගතයන් පිරිනිවි කල්හි සද්ධර්මයතෙම බොහෝ කල් පැවැත්ම ඇත්තක් නොවේද? ඊට හේතු කවරේද? ප්‍රත්‍ය කවරේද?"

3. "කිම්බිලය, මේ ශාසනයෙහි තථාගතයන් පිරිනිවි කල්හි භික්ෂුහුද භික්ෂුණීහුද උපාසකයෝද උපාසිකාවෝද ශාස්තෘන් කෙරෙහි ගෞරව නැත්තාහු ආදර නැත්තාහු වාසය කෙරෙද්ද, ධර්මය කෙරෙහි ගෞරව නැත්තාහු ආදර නැත්තාහු වාසය කෙරෙද්ද, සංඝයා කෙරෙහි ගෞරව නැත්තාහු ආදර නැත්තාහු වාසය කෙරෙද්ද, ශික්ෂාව කෙරෙහි ගෞරව නැත්තාහු ආදර නැත්තාහු වාසය කෙරෙද්ද, ඔවුනොවුන්ට ගෞරව නැත්තාහු ආදර නැත්තාහු වාසය කෙරෙද්ද කිම්බිලය, යමකින් තථාගතයන් පිරිනිවි කල්හි සද්ධර්මය තෙම බොහෝ කල් පැවැත්ම ඇත්තේ නොවේද, මේ ඊට හේතුව වේ. මේ ඊට ප්‍රත්‍යය වේයයි වදාළේය.

4 "ස්වාමීනි, යමකින් තථාගතයන් පිරිනිවි කල්හි සද්ධර්මය තෙම බොහෝකල් පැවැත්ම ඇත්තේ වේද, ඊට හේතු කවරේද? ප්‍රත්‍ය කවරේදැ?"යි ඇසුයේය.

5 "කිම්බිලය, මේ ශාසනයෙහි තථාගතයන් පිරිනිවි කල්හි භික්ෂුහුද භික්ෂුණීහුද උපාසකයෝද උපාසිකාවෝද ශාස්තෘන් කෙරෙහි ගෞරව සහිත වූවාහු ආදර සහිත වූවාහු වාසය කෙරෙද්ද, ධර්මය කෙරෙහි ගෞරව සහිතව ආදර සහිතව වාසය කෙරෙද්ද, සංඝයා කෙරෙහි ගෞරව සහිතව ආදර සහිතව වාසය කෙරෙද්ද, ශික්ෂාව කෙරෙහි ගෞරව සහිතව ආදර සහිතව වාසයකෙරෙද්ද, ඔවුනොවුන්ට ගෞරව සහිතව ආදර සහිතව වාසය කෙරෙද්ද, කිම්බිලය, යමකින් තථාගතයන් පිරිනිවි කල්හි සද්ධර්මය තෙම බොහෝකල් පැවතුම් ඇත්තේ වේද, එයට මෙය වනාහි හේතුව වේ. මෙය ප්‍රත්‍යය වේයයි" වදාළේය.

2 **ධම්ම සවණානිසංස සූත්‍රය**:- 1 "මහණෙනි, ධර්ම ශ්‍රවණයෙහි මේ ආනිශංස පසක් වෙත්.

2 "කවර පසක්ද යත්? නොඅසන ලද්ද අසයි. අසන ලද්ද පිරිසිදු කෙරෙයි. සැකය දුරුකෙරෙයි, දෘෂ්ටිය ඍජු කෙරෙයි. මොහුගේ සිත පහදියි යන පසයි.

3 (මෙය 1 ඡේදය මෙනි)

3 **අස්සාජානීය සූත්‍රය**:- 1 "මහණෙනි, අංග පසකින් යුක්තවූ රජුගේ සොඳුරුවූ ආජානීය අශ්වතෙම රජුන්ට සුදුසුවේ. රජුන්ගේ පරිභෝගයට සුදුසුවේ. රජහුගේ අංගය කැයි යන සංඛ්‍යාවට පැමිණේ.

2 "කවර පසකින්ද යත්? ඍජු බැවින්ද, ජවයෙන්ද, මෘදු බැවින්ද, ඉවසීමෙන්ද, කීකරු බැවින්ද යන පසිනි.

3 (මෙය 1 ඡේදය මෙනි)

4 "මහණෙනි, මෙපරිද්දෙන්ම ධර්ම පසකින් යුක්තවූ භික්ෂුතෙම පූජාවට සුදුසුවේ. දුරසිට ගෙනෙනලද සත්කාරයට සුදුසුවේ. දක්ෂිණාවට සුදුසුවේ. ඇඳිළි කිරීමට සුදුසුවේ, ලෝකයාගේ නිරුත්තරවූ පුණ්‍යක්ෂෙත්‍රය වේ.

5 "කවර පසකින්ද යත්, ඍජු භාවයෙන්ද, ඥාන ජවයෙන්ද, මෘදුභාවයෙන්ද, ඉවසීමෙන්ද, පවිත්‍ර භාවයෙන්ද යන පසිනි.

6 (මෙය 4 ඡේදය මෙනි)

4 **පඤ්චබල සූත්‍රය**:- 1 "මහණෙනි, මේ බල පසක් වෙත්.

2 "කවර පසක්ද යත්? ශ්‍රද්ධාබලය, හිරි බලය, ඔත්තප්ප බලය, වීර්‍ය්‍ය බලය, ප්‍රඥා බලය යන පසයි. මහණෙනි, මොහු වනාහි බලපස වෙත්යයි වදාළේය."

5 **චෙතොඛිල සූත්‍රය**:- 1 "මහණෙනි, මේ සිතේ තද බැව් පසක් වෙත්.

2 "කවර පසක්ද යත්? (ii) මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම ශාස්තෘන් කෙරෙහි සැක කරයි. (iii) සොයමින් වෙහෙසෙයි. අදහසට නොපැමිණෙයි, නොපහදියි.

3 (මෙහි 2 (ii) සහ 2 (iii) යෙදිය යුතුයි.) ඔහුගේ සිත (ii) කෙළෙස් තැවීම පිණිස නැවත නැවත යෙදීම පිණිස සතතයෙන් කිරීම පිණිස වීර්‍ය්‍ය කිරීම පිණිස (iii) නොනැමෙයි

4 "යමෙකුගේ සිත නොනැමේද, මේ පළමුවන චෙතොඛිලය හෙවත් සිතේ තද බව වේ.

5 "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුතෙම ධර්මයෙහි සැක කරයි. (මෙහි 2 (iii) යෙදිය යුතුයි.) සංඝයා කෙරෙහි සැක කරයි. (මෙහි 2 (iii) යෙදිය යුතුයි.) ශික්ෂාව කෙරෙහි සැක කරයි. මෙහි 2 (iii) යෙදිය යුතුයි.) සබ්‍රම්සරුන් කෙරෙහි කිපියේ නොසතුටු සිත් ඇත්තේ ගැටුනාවූ සිත් ඇත්තේ හටගත් තද බැව් ඇත්තේවේ. මහණෙනි, යම් ඒ භික්ෂුවක් තෙම සබ්‍රම්සරුන් කෙරෙහි කිපුනේ නොසතුටු සිත් ඇත්තේ ගැටුනු සිත් ඇත්තේ හටගත් තද බැව් ඇත්තේ වේද, ඔහුගේ සිත (මෙහි 3 (ii) සහ 3 (iii) යෙදිය යුතුයි.) යමෙකුගේ සිත කෙළෙස් තැවීම පිණිස නැවත නැවත යෙදීම පිණිස සතතයෙන් කිරීම පිණිස වීර්‍ය්‍යය කිරීම පිණිස නොනැමේද, මේ පස්වන චෙතොඛිලය හෙවත් සිතේ තද බවවේ. (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි.)

**6 විනිබන්ධ සූත්‍රය:-** 1 "මහණෙනි, මේ සිතේ බැඳ ගැණීම් පසක් වෙත්.

2 "කවර පසක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම කාමයන්හි පහනොවූ රාගය ඇත්තේ පහනොවූ ආලය ඇත්තේ පහනොවූ ප්‍රේමය ඇත්තේ පහව නොගිය කාම පිපාසා ඇත්තේ පහව නොගිය පරිඩාහ ඇත්තේ පහව නොගිය තෘෂ්ණා ඇත්තේ වේ.

3 "මහණෙනි, යම් ඒ භික්ෂුවක් තෙම කාමයන්හී (ii) පහව නොගිය රාග ඇත්තේ පහව නොගිය ආසා ඇත්තේ පහව නොගිය ප්‍රේම ඇත්තේ පහව නොගිය පිපාසා ඇත්තේ පහව නොගිය පරිඩාහ ඇත්තේ පහව නොගිය තෘෂ්ණා ඇත්තේ වේද, ඔහුගේ සිත කෙළෙස් තැවීම පිණිස නැවත නැවත යෙදීම

පිණිස සතතයෙන් කිරීම පිණිස වීර්‍ය්‍ය කිරීම පිණිස නොනැමෙයි. (iii) මේ පළමුවන සිතේ බැඳ ගැනීම වේ.

4 "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂූතෙම කයෙහි (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) රූපයෙහි (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) කැමතිතාක් බඩ ගන්නාතෙක් වළඳා ශයන සැපයෙහි ස්පර්ශසැපයෙහි නිද්‍රාසැපයෙහි යෙදී වාසය කෙරෙයි. හෙතෙම එක්තරා දිව්‍ය නිකායක් ප්‍රාර්ථනා කොට (ii) 'මම මේ ශීලයෙන් හෝ ව්‍රත්තයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්‍ය්‍යාවෙන් හෝ දෙවියෙක් හෝ වන්නෙමි. දෙවියන්ගෙන් එක්තරා කෙනෙක් හෝ වන්නෙමියි' එක්තරා දිව්‍ය නිකායක් ප්‍රාර්ථනාකොට බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙයි.

5 "මහණෙනි, යම් ඒ භික්ෂුවක් තෙම (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) ඔහුගේ සිත (ii) කෙළෙස් තැවීම පිණිස නැවත නැවත යෙදීම පිණිස සතතයෙන් කිරීම පිණිස වීර්‍ය්‍ය කිරීම පිණිස (iii) නොනැමෙයි.

6 "යමෙකුගේ සිත (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) නොනැමේද මේ තෙම පස්වන සිතෙහි බැඳ ගැණීම වේ (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

7 **යාගුදානානිසංස සූත්‍රය:-** "මහණෙනි, මේ කැඳෙහි අනුසස් පසක් වෙත්. කවර පසක්ද යත්? බඩගින්න නසයි, පිපාසය දුරු කෙරෙයි, වාතය අනුලොම් කරයි. වස්තිය පිරිසිදු කෙරෙයි, අමුව ඉතිරි දෙය පැසවයි. යන පසයි. මහණෙනි, මේ පස වනාහි කැඳෙහි අනුසස් වෙත්යයි" වදාළේය.

8 **දන්ත කට්ඨානිසංස සූත්‍රය:-** 1 "මහණෙනි, දැහැටි දඬු නොවැළඳීමෙහි මේ දෝෂ පසක් වෙත්.

2 "කවර පසක්ද යත්? ඇස්වලට අහිතවේ. මුඛය දුර්ගන්ධවේ. රස නහර නොපිනවත්. පිතද සෙමද බත වැළඳ ගනිත්. බත මොහුට නොකැමැති වේ යන පසයි. (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි)

3 "මහණෙනි, දැහැටි දඬු වැළඳීමෙහි මේ අනුසස් පසක් වෙත්.

4 "කවර පසක්ද යත්. ඇස්වලට හිතවේ. මුඛය දුර්ගන්ධ නොවේ. රස නහර පිනවත්. පිතද සෙමද බත නොවැළඳ ගනිත්. බත මොහුට රුචිවේ යන පසයි. (මෙහි 3 ඡේදය යෙදිය යුතුයි)

9 **ගීතස්සර සූත්‍රය**:- 1 "මහණෙනි, දික්වූ ගීතිකාස්වරයෙන් බණ කියන්නහුගේ මේ දෝෂ පසක් වෙත්.

2 "කවර පසක්ද යත්? තෙමේද ඒ ස්වරයෙහි ඇලෙයි, අන්‍යයෝද ඒ ස්වරයෙහි ඇලෙත්, ගෘහපතීහුද යම් පරිද්දකින්ම අපි ගායනා කරමුද, එපරිද්දෙන්ම මේ ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ ගායනා කෙරෙත්යයි, හෙළා දකිත්. හඬනඟා කීමද කැමතිවන්නහුගේ සමාධිය භංගවේ. පශ්චිම ජනතාව දෘෂ්ටානුගතියට පැමිණේ යන පසයි.

3 (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි)

10 **නිද්දොක්කමන සූත්‍රය**:- 1 මහණෙනි, මුළාවූ සිහි ඇතිව මනාදැනීම නැතිව නින්දට බැසගන්නහුගේ මේ දෝෂ පසක් වෙත්

2 "කවර පසක්ද යත්? දුකසේ නිදයි, දුකසේ පිබිදෙයි. ලාමකවූ සිහින දකියි, දෙවියෝ නොරකිත්, අශුචි මෝචනය වේ. යන පසයි.

3 (මෙය 1 ඡේදය මෙනි)

4 "මහණෙනි, එළඹ සිටි සිහි ඇතිව මනාදැනුම් ඇතිව නින්දට බැසගන්නහුගේ මේ අනුසස් පසක් වෙත්.

5 "කවර පසක්ද යත්? සුවසේ නිදයි. සුවසේ පිබිදෙයි, ලාමකවූ සිහින නොදකියි, දෙවියෝ රකිත්, අශුචි මෝචනය නොවේ. යන පසයි.

6 (මේ ඡේදය 4 ඡේදය මෙනි.)

---

# 22 අක්කොසක වර්ගය.

11 **අක්කොසක සූත්‍රය:-** 1 "මහණෙනි, යම් ඒ භික්ෂුවක් තෙම බ්‍රහ්මචාරීන්ට නින්දා පරිභව කරන්නේ ආර්‍ය්‍යයන්ට දොස් කියන්නේ වේද, ඔහුගේ දෝෂ පසක් කැමතිවිය යුතුය.

2 "කවර පසක්ද යත්? සිඳින ලද ලෝකෝත්තර මාර්ග ඇති පාරාජිකාවට පැමිණියෙක් හෝ වේ. එක්තරා ඉතා කිළුටු ඇවතකට හෝ පැමිණෙයි. දැඩිවූ බලවත් ව්‍යාධියක් හෝ ස්පර්ශ කරයි. ඉතා මුළාවූයේ කළුරිය කරයි. ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි සැප නැති දුකට පිහිටවූ නපුරු සේ පතිත වන්නාවූ නරකයෙහි උපදියි යන පසයි.

3 (මෙය 1 ඡේදය මෙනි.)

(මේ වර්ගයේ 3 ඡේද ඒ ඒ සූත්‍රවල 1 ඡේදය මෙන්ද 6 ඡේදය 4 ඡේදය මෙන්ද වෙත්)

12 **භණ්ඩන කාරක සූත්‍රය:-** 1 "මහණෙනි, යම් ඒ භික්ෂුවක් තෙම දබර කරන්නෙක් කළහ කරන්නෙක් විරුද්ධ වාද කරන්නෙක් විරුද්ධ කථාබස් කරන්නෙක් සංඝයා කෙරෙහි අධිකරණ කරන්නෙක් වේද, ඔහුට දෝෂ පසක් කැමතිවිය යුතුයි.

2 "කවර පසක්ද යත්? නොලබන ලද්ද නොලබයි, ලබනලද්ද පිරිහෙළයි. ලාමකවූ කීර්ති ශබ්දයක් පැන නගියි, ඉතා මුළාවූයේ කළුරිය කරයි. ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැප නැති දුකට පිහිටවූ නපුරුසේ පතිතවන්නාවූ නරකයෙහි උපදියි යන පසයි."

13 **සීලවිපත්‍යාදීනව සූත්‍රය:-** 1 "මහණෙනි, දුශ්ශීලයාගේ ශීල විපත්තියෙහි මේ දෝෂ පසක් වෙත්.

2 "කවර පසක්ද යත්? (ii) මහණෙනි මේ ශාසනයෙහි සීල විපත්තියට පැමිණියාවූ දුශ්ශීල තෙමේ ප්‍රමාදය හේතු කොට ගෙණ මහත්වූ සම්පත් පිරිහීමට පැමිණේ. මහණෙනි, දුශ්ශීලයාගේ සීලවිපත්තියෙහි මේ පළමුවන දෝෂයවේ.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. ශීල විපත්තියට පැමිණියාවූ දුශ්ශීලයාගේ ලාමකවූ කීර්ති ශබ්දයක් පැන නගියි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මහණෙනි, දුශ්ශීලයාගේ ශීලවිපත්තියෙහි මේ දෙවන දෝෂයවේ. (iv) මහණෙනි, නැවත අනිකක්ද කියමි. සීල විපත්තියට පැමිණියාවූ දුශ්ශීල තෙමේ ක්ෂත්‍රිය පිරිසකට හෝ බ්‍රාහ්මණ පිරිසකට හෝ ගෘහපති පිරිසකට හෝ ශ්‍රමණ පිරිසකට හෝ යම් යම්ම පිරිසකට පැමිණේද, විශාරද නොව මතුවූයේ පැමිණෙයි. මහණෙනි, දුශ්ශීලයාගේ ශීලවිපත්තියෙහි මේ තුන්වන දෝෂය වේ. (v) මහණෙනි, නැවත අනිකක්ද කියමි. සීල විපත්තියට පැමිණියාවූ දුශ්ශීල තෙම ඉතා මුළාවූයේ කළුරිය කරයි. මහණෙනි, දුශ්ශීලයාගේ සීලවිපත්තියෙහි මේ සතර වන දෝෂය වේ. (vi) 'මහණෙනි, නැවත අනිකක්ද කියමි. සීල විපත්තියට පැමිණියාවූ දුශ්ශීලතෙමේ ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැප නැති දුකට පිහිටවූ නපුරුසේ පතිත වන්නාවූ නරකයෙහි උපදී. මහණෙනි, දුශ්ශීලයාගේ සීල විපත්තියෙහි මේ පස්වන දෝෂය වේ.

4 "මහණෙනි, සිල්වත්හුගේ සීලවිපත්තියෙහි මේ අනුසස් පසක් වෙත්.

5 "කවර පසක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි සීලයෙන් යුක්තවූ සිල්වත් තෙමේ අප්‍රමාදය හේතුකොට ගෙණ මහත්වූ සම්පත් රාශියට පැමිණේ. මහණෙනි, සිල්වත්හුගේ සීල සම්පත්තියෙහි මේ පළමුවන 'ආනිශංසයවේ. (ii) මහණෙනි, නැවත අනිකක්ද කියමි. සීලයෙන් යුක්තවූ සිල්වත්හුගේ යහපත්වූ ගුණ ඝෝෂාවක් පැන නගියි මහණෙනි, සිලවත්හුගේ සීල සම්පත්තියෙහි මේ දෙවෙනි ආනිශංසවේ. (iii) "මහණෙනි, නැවත අනිකක්ද කියමි. සීලයෙන් යුක්තවූ සිල්වත් තෙමේ ක්ෂත්‍රිය පිරිසකට හෝ බ්‍රාහ්මණ පිරිසකට හෝ ගෘහපති පිරිසකට හෝ ශ්‍රමණ පිරිසකට හෝ යම් යම්ම පිරිසකට පැමිණියේද නිර්භයව මකු නොවී පැමිණෙයි. මහණෙනි, සිල්වත්හුගේ සීල සම්පත්තියෙහි මේ තුන්වෙනි ආනිශංසයවේ. (iv) මහණෙනි, නැවත අනිකක්ද කියමි. සීලයෙන් යුක්තවූ සිල්වත් තෙමේ මුළානොවූයේ කළුරිය කරයි. මහණෙනි, සිල්වත්හුගේ සීල සම්පත්තියෙහි මේ සතරවන ආනිශංසයවේ (v) මහණෙනි, නැවත අනිකක්ද කියමි. සීලයෙන් යුක්තවූ සිල්වත් තෙමේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගති නම් දිව්‍ය ලෝකයෙහි උපදියි. (vi) මහණෙනි, සිල්වත්හුගේ සීල සම්පත්තියෙහි මේ පස්වන ආනිශංසය වේ”

**14 බහුභාණ්‍යාදීනව සූත්‍රය**:- 1 “මහණෙනි, බොහෝ කොට කථාකරන්නාවූ පුද්ගලයා කෙරෙහි මේ දෝෂ පසක් වෙත්.

2 “කවර පසක්ද යත්? බොරු කියයි. කේලාම් කියයි, ඵරුෂවචන කියයි, හිස් වචන කියයි. ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැප නැති දුකට පිහිටවූ නපුරුසේ පතිත වන්නාවූ නරකයෙහි උපදියි. යන පසයි.

4 “මහණෙනි, පමණ දැන කථාකරණ පුද්ගලයා කෙරෙහි මේ අනුසස් පසක් වෙත්.

5 “කවර පසක්ද යත්, බොරු නොකියයි, කේලාම් නොකියයි. ඵරුෂවචන නොකියයි, හිස්වචන නොකියයි ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගති නම් දිව්‍ය ලෝකයෙහි උපදියි යන පසයි.

**15 පඨම අක්ඛන්ත්‍යාදීනව සූත්‍රය**:- 1. “මහණෙනි, නොඉවසීමෙහි මේ දොෂපසක් වෙත්.

2. “කවර පසක්දයත්. බොහෝදෙනාට අප්‍රියවූ අමනාප වූවෙක්වේ. වෛර බහුලකොට ඇත්තේද වේ. වරද බහුල කොට ඇත්තේද වේ. ඉතා මුළා වූයේ කළුරිය කරයි. ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැප නැති දුකට පිහිටවූ නපුරුසේ පතිතවන්නාවූ නරකයෙහි උපදියි යන පසයි.

4. “මහණෙනි, ඉවසීමෙහි මේ අනුසස් පසක් වෙත්.

5 “කවර පසක්දයත්? බොහෝ දෙනාට ප්‍රියවූවෙක් මන වඩන්නෙක්වේ. වෛර බහුලකොට ඇත්තෙක් නොවේ. වරද බහුලකොට ඇත්තක් නොවේ. මුළා නොවූයේ කළුරිය කරයි. ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගති නම් දිව්‍යලෝකයෙහි උපදියි යන පසයි.

**16. දුතිය අක්ඛන්ත්‍යාදීනව සූත්‍රය**:- 1. “මහණෙනි, නොඉවසීමෙහි මේ දෝෂ පසක් වෙත්.

2. "කවර පසක්දයත්? බොහෝ දෙනාට අප්‍රියවූවෙක් අමනාපවූවෙක්වේ රෞද්‍රවූවෙක්ද වේ. විපිලිසර ඇත්තෙක්ද වේ. ඉතා මුළාවූයේ කළුරිය කරයි. ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැප නැති දුකට පිහිටවූ නපුරුසේ පතිතවන්නාවූ නරකයෙහි උපදියි යන පසයි.

4. "මහණෙනි, ඉවසීමෙහි මේ අනුසස් පසක් වෙත්.

5. "කවර පසක්දයත්? බොහෝ දෙනාට ප්‍රියවූවෙක් මනවඩන්නෙක් වේ. රෞද්‍ර නොවූවෙක්ද වේ. විපිළිසර නැත්තෙක්දවේ. මුළානොවූයේ කළුරිය කරයි. ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගති නම් දිව්‍ය ලෝකයෙහි උපදියි යන පසයි."

17. **පඨම අපාසාදික සූත්‍රයː-** 1. "මහණෙනි, ප්‍රසාද නොඑලවීමෙහි මේ දොෂ පසක් වෙත්.

2. "කවර පසක්දයත්? තෙමේද තමාට දොස් කියයි. දැන නුවණැත්තෝ නින්දා කරත්. ලාමකවූ කීර්ති ශබ්දයක් පැනනගියි. ඉතා මුළා වූයේ කළුරිය කරයි, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැප නැති දුකට පිහිටවූ නපුරුසේ පතිත වන්නාවූ නරකයෙහි උපදියි යන පසයි.

4. "මහණෙනි, ප්‍රසාද එලවීමෙහි මේ අනුසස් පසක් වෙත්.

5. "කවර පසක්දයත්? තෙමේද තමාට දොස් නොකියයි. දැනනුවණැත්තෝ ප්‍රශංසා කරත්. යහපත්වූ ගුණ ඝෝෂාවක් පැනනගියි. මුළා නොවූයේ කළුරිය කරයි ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගති නම් දිව්‍ය ලෝකයෙහි උපදියි යන පසයි."

18. **දුතිය අපාසාදික සූත්‍රයː-** 1. "මහණෙනි, ප්‍රසාද නොඑලවීමෙහි මේ දෝෂ පසක් වෙත්.

2. "කවර පසක්දයත්? ප්‍රසන්න නුවූවාහු නොපහදිත්. ප්‍රසන්නවූද, ඇතැමුන්ගේ අන්පරිදි බවවේ. ශාස්තෘන් වහන්සේගේ අනුශාසනය නොකරණ ලද්දේවේ. පශ්චිම ජනතාව දෘෂ්ටානුගතියට පැමිණේ. මොහුගේ සිත නොපහදියි යන පසයි.

4. "මහණෙනි, ප්‍රසාද එළවීමෙහි මේ අනුසස් පසක් වෙත්.

5. "කවර පසක්ද යත්? ප්‍රසන්න වූවාහු පහදිත්. ප්‍රසන්න වූවන්ගේද, වැඩිවීමවේ. ශාස්තෘන් වහන්සේගේ අනුශාසනය කරණ ලද්දේවේ. පශ්චිම ජනතාව දෘෂ්ටානුගතියට පැමිණේ. මොහුගේ සිත පහදියි යන පසයි."

19. අග්ගයාදීනව සූත්‍රයඃ- 1. "මහණෙනි, ගින්නෙහි මේ දෝෂ පසක් වෙත්.

2. "කවර පසක්ද යත්? ඇස්වලට හිත නොවේ. දුර්වර්ණ කරන්නේවේ. දුර්වල කරන්නේවේ. ගණසංගනිකාව (රැස්වීම) වඩන්නේ වෙයි. තිරිසන් කථා පවත්වන්නේ වෙයි යන පසයි.

20. මධුරාදීනව සූත්‍රයඃ- 1. "මහණෙනි, මධුරා නම් නුවරෙහි මේ දෝෂ පසක් වෙත්.

2 "කවර පසක්ද යත්? විෂම වේ. බොහෝ රජස් ඇත්තී වේ. චණ්ඩ ශුනඛයන් ඇත්තීය. වල් යකුන් ඇත්තීය. දුර්ලභ ආහාර ඇත්තීය යන පසයි."

---

## 23. දීඝචාරිකා වර්ගය.

21. පඨම දීඝචාරිකා සූත්‍රයඃ- 1. "මහණෙනි, අවස්ථාවට සුදුසු නොවූ දීර්ඝ චාරිකාවෙහි යුක්තව වාසය කරන්නහුට මේ දෝෂ පසක් වෙත්. කවර පසක්ද යත්? නොඅසනලද්ද නොඅසයි. අසනලද්ද පිරිසිදු නොකෙරෙයි. අසනලද ඇතමකින් විශාරද නොවෙයි. දැඩිවූ රෝගාබාධයක් ස්පර්ශ කරයි. මිත්‍රයන් ඇත්තෙක්ද නොවේ. යන පසයි මහණෙනි, මොහු වනාහි දික්වූ හැසිරීමෙහි අනියම් හැසිරීමෙහි යෙදී වාසය කරන්නහුගේ දෝෂ පස වෙත්.

"මහණෙනි, නියමවූ හැසිරීමෙහි මේ අනුසස් පසක්වෙත්. කවර පසක්දයත්, නො අසනලද්ද අසයි. ඇසූදෙය පිරිසිදු කරයි. අසනලද සමහරකින් විශාරද වේ. දැඩිවූ රෝගාබාධය ස්පර්ශ නොකරයි. මිත්‍රයන් ඇත්තේද වෙයි. යන පසයි.

**22. දුතිය දීඝචාරිකා සූත්‍රයඃ-** 1. "මහණෙනි, දික්වූ හැසිරීමෙහි අනියම් හැසිරීමෙහි යෙදී වාසය කරන්නහුට මේ දෝෂ පසක් වෙත්.

2 "කවර පසක්දයත්? නොලබන ලද්ද නොලබයි. ලබනලද්ද පිරිහෙළයි. ලබනලද සමහරකින් නිර්භය නොවෙයි. දැඩිවූ රෝගාබාධ ස්පර්ශ කරයි. මිත්‍රයන් ඇත්තේද නොවේ, යන පසයි."

4. "මහණෙනි, නියම කරණලද හැසිරීමෙහි මේ අනුසස් පසක් වෙත්.

5. "කවර පසක්දයත්? නොලබනලද්ද ලබයි. ලබන ලද්ද නොපිරිහෙයි ලබනලද සමහරකින් නිර්භයවේ. දැඩිවූ රෝගාබාධ ස්පර්ශ නොකරයි. මිත්‍රයන් ඇත්තේද වෙයි යන පසයි."

**23. අති නිවාසාදීනව සූත්‍රයඃ-** 1. "මහණෙනි, වැඩි කලක් නැවතී වාසය කිරීමෙහි මේ දෝෂ පසක් වෙත්.

2. "කවර පසක්දයත්? බොහෝ බඩු රැස්කිරීම ඇත්තේ බහු භණ්ඩිකවේ. බොහෝ බෙහෙත් ද්‍රව්‍ය එකතුකිරීම ඇත්තේ බහුභෙසජ්ජවේ. බොහෝ කටයුතු ඇත්තේ පිළිවිස කටයුතුවල ව්‍යක්තවූයේ බහුකිච්චවේ ගෘහස්ත ප්‍රව්‍රජිතයන් හා නුසුදුසුවූ ගිහි සංසර්ගයෙන් යුක්තව වාසය කෙරෙයි. ඒ ආවාසයෙන්ද බැහැර යන්නේ අපේක්ෂා සහිතවම බැහැරයයි යන පසයි.

4. "මහණෙනි, නියමවූ වාසයෙහි මේ අනුසස් පසක් වෙත්.

5. "කවර පසක්ද යත්? බොහෝ කොට බඩු රැස්කිරීම නැත්තේ බහුභාණ්ඩික නොවේ. බොහෝ බෙහෙත් ද්‍රව්‍ය රැස් කිරීම නැත්තේ බහුභෙසජ්ජ නොවේ. පිළිවිස කටයුතුවල ව්‍යක්ත නොවූයේ බොහෝ කටයුතු නැත්තේ බහුකිච්ච නොවේ. ගෘහස්ත ප්‍රව්‍රජිතයන් සමග නුසුදුසුවූ ගිහි සංසර්ගයෙන් යුක්ත නොව වාසය කරයි. ඒ ආවාසයෙන්ද බැහැර යන්නේ අපේක්ෂාවක් නැතිව බැහැර යයි, යන පසයි."

**24. පඤ්ච මච්ඡරිය සූත්‍රයඃ-** 1. "මහණෙනි, වැඩිකල් එකතැන විසීමෙන් මේ දෝෂ පසක් වෙත්.

2. "කවර පසක්දයත්? ආවාසයෙහි මසුරුකම් ඇත්තෙක්වේ. කුලයන්හි මසුරුකම් ඇත්තෙක්වේ. ලාභයෙහි මසුරුකම් ඇත්තෙක්වේ. ගුණ වර්ණනායෙහි මසුරුකම් ඇත්තෙක් වේ ධර්මයෙහි මසුරුකම් ඇත්තෙක් වේ යන පසයි"

4 "මහණෙනි, සමව පවත්වනලද නිවාසයෙහි මේ අනුසස් පසක් වෙත්.

5. "කවර පසක්දයත්? ආවාසයෙහි මසුරුකම් ඇත්තෙක් නොවේ. කුලයන්හි මසුරුකම් ඇත්තෙක් නොවේ. ලාභයෙහි මසුරුකම් ඇත්තෙක් නොවේ. ගුණ කීමෙහි මසුරුකම් ඇත්තෙක් නොවේ, ධර්මයෙහි මසුරුකම් ඇත්තෙක් නොවේ යන පසයි.

25. **පඨම කුලුපගාදීනව සූත්‍රයඃ-** 1. "මහණෙනි, කුලයට එළඹෙන්නහු කෙරෙහි මේ දෝෂ පසක්වෙත්.

2. "කවර පසක්ද යත්? අනාමන්තචාර (වැඩිහිටියන් නොවිචාරා යෑමේ) ශික්ෂාපදයෙහි ඇවතට පැමිණේ. රහසිගතව හිඳීමෙන් වන ඇවතට පැමිණේ. වැසුනාවූ ආසනයෙහි හිඳීමෙන් වන ඇවතට පැමිණේ. ස්ත්‍රියකට වචන පහකින් හයකින් වැඩි ධර්මයක් දෙශනා කරන්නේ ඇවතට පැමිණේ. කාම සංකල්පනා බහුලකොට ඇත්තේ වාසය කරයි යන පසයි."

26. **දුතිය කුලුපගාදීනව සූත්‍රයඃ-** 1. "මහණෙනි, පමණ ඉක්මවා කුලයන්හි ගැවසී වාසය කරන්නාවූ කුළුපග භික්ෂූහට මේ දෝෂ පසක් වෙත්.

2. "කවර පසක්දයත්? ස්ත්‍රිය පිළිබඳවූ නිතර දැකීමද දැකීම ඇතිකල්හි සංසර්ගයද සංසර්ගය ඇතිකල්හි විශ්වාසයද විශ්වාසයද ඇතිකල්හි මෛථුන රාගයට බැසගැන්මද, බැසගත් සිත් ඇත්තහුට මෙය කැමතිවියයුතුයි. නොඇළුනේ හෝ බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙන්නේය. එක්තරා ඉතා කිළුටුවූ ඇවැතකට හෝ පැමිණෙන්නේය. ශික්ෂාව හෝ හැරදමා ගිහි බවට පෙරලෙන්නේය. යන පසයි."

27. **භොගාදීනව සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ භොගයන්හි ආදීනව පසක් වෙත්.

2. "කවර පසක්ද යත්? සම්පත් ගින්න හා සාධාරණ වෙත් සම්පත් ජලය හා සාධාරණ වෙත්. සම්පත් රජුන් හා සාධාරණවෙත්. සම්පත් සොරුන් හා සාධාරණවෙත්, සම්පත් අප්‍රියවූ දායාදයන් හා සාධාරණ වෙත් යන පසයි.

4. "මහණෙනි, භෝගයන්හි මේ අනුසස් පසක් වෙත්.

5. "කවර පසක්දයත්? භෝගයන් හෙවත් සම්පත් නිසා තමන් සුවපත් කරයි පිනවයි. මනාව සුවසේ පරිහරණය කරයි. මව්පියන් සුවපත් කරවයි, පිනවයි. මනාව සැපසේ පරිහරණය කරයි අඹුදරුවන්ද දැසිදස් කම්කරු පුරුෂයන්ද සුවපත් කරවයි. පිනවයි. මනාව සුවසේ පරිහරණය කරයි. මිත්‍රාමාත්‍යයන් සුවපත්කරයි පිනවයි, මනාව සුවසේ පරිහරණය කරයි, ශ්‍රමණ බ්‍රාහ්මණයන් කෙරෙහි මතු භවයන්හි උතුම් විපාක ඇත්තාවූ ස්වර්ග සැපයට හිතවූ සැප විපාක ඇත්තාවූ ස්වර්ග සැප පිණිස පවත්නාවූ දක්ෂිණාව පිහිටුවයි යන පසයි."

28. **උස්සූර භත්ත සූත්‍රයඃ-** 1. "මහණෙනි, ඉතා දාවල්ව පිසන බත් ඇති කුලයෙහි මේ දෝෂ පසක්වෙත්.

2. "කවර පසක්ද යත්? යම් ඒ පිදියයුතු ආගන්තුග කෙනෙක් වෙත්ද, ඔවුන් සුදුසු කාලයෙහි නො පුදත්. යම් ඒ පූජා පිළිගන්නාවූ දෙවියෝ වෙද්ද, ඔවුන් සුදුසු කාලයෙහි නොපුදත්. එකවේලේ බත් ඇත්තාවූ රාත්‍රි භෝජනයෙන් වෙන්වූ විකල් බොජුනෙන් වැළකුණාවූ යම් ඒ ශ්‍රමණබ්‍රාහ්මණයෝ වෙද්ද, ඔවුන්ට සුදුසු කාලයෙහි නො පුදත්. දැසිදස් කම්කරු පුරුෂයෝ අසතුටු මුහුණින් කර්මාන්ත කරත්. එපමණකින්ම නුසුදුසු කාලයෙහි අනුභව කරණලදීද, ඕජාව පතුරුවන්ට නොහැකිවේ, යන පසයි.

4. "මහණෙනි, සුදුසු කල්හි පිසන බත් ඇති කුලයෙහි මේ අනුසස් පසක්වෙත්.

5. "කවර පසක්දයත්? යම් ඒ පිදියයුතු ආගන්තුගයෝ වෙද්ද, ඔවුන්ට සුදුසු කාලයෙහි පුදත් යම් ඒ පූජා පිළිගන්නාවූ දෙවියෝ වෙද්ද, ඔවුන්ට සුදුසු කාලයෙහි පුදත්, එකවේලේ බත් ඇති රාත්‍රි භොජනයෙන් වැළකුණාවූ විකල් බොජුනෙන් තොරවූ

යම් මේ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ වෙද්ද, ඔවුන්ට සුදුසු කාලයෙහි පුදත්. දැසි දස් කම්කරු පුරුෂයෝ සතුටු මුහුණින් කර්මාන්ත කරත්, එතෙකින්ම සුදුසු කාලයෙහි අනුභව කරණලද්ද ඕජා පතුරුවන්ට හැකිවේ යන පසයි."

**29. පඨම කණ්හ සප්ප සූත්‍රයඃ-** 1. "මහණෙනි, කෘෂ්ණ සර්පයා කෙරෙහි මේ දෝෂ පසක් වෙත්.

2. "කවර පසක්දයත්, අපවිත්‍රවේ. දුර්ගන්ධවේ. භය සහිත වේ. හෙවත් නිද්‍රා සහිත වේ. ප්‍රතිභය සහිත වේ. මිත්‍රද්‍රෝහි වේ. යන පසයි."

4. "මහණෙනි, මෙපරිද්දෙන්ම ස්ත්‍රිය කෙරෙහි යම් දෝෂ පසක් වෙත්.

"කවර පසක්දයත්? අපවිත්‍රවේ. දුර්ගන්ධවේ. භය ජනක වේ. හෙවත් නිද්‍රාසහිතවේ. ප්‍රතිභය සහිතවේ. මිත්‍ර ද්‍රෝහිවේ. යන පසයි."

**30. දුතිය කණ්හ සප්ප සූත්‍රයඃ-** 1. "මහණෙනි, කෘෂ්ණ සර්පයා කෙරෙහි මේ දෝෂ පසක් වෙත්.

2 "කවර පසක්ද යත්? කිපෙනසුළු වේ, බද්ධ වෛර ඇති වේ. දරුණු විෂ ඇති වේ. දිව් දෙකක් ඇති වේ. මිත්‍ර ද්‍රෝහි වේ, යන පසයි.

4. "මහණෙනි, මෙපරිද්දෙන්ම ස්ත්‍රිය කෙරෙහි දෝෂ පසක් වෙත්.

5. "කවර පසක්ද යත්? කිපෙන සුළු වේ. බද්ධ වෛර ඇති වේ. දරුණු විෂ ඇති වේ. දිව් දෙකක් ඇති වේ. මිත්‍ර ද්‍රෝහි වේ.

"මහණෙනි, බොහෝ සෙයින් ස්ත්‍රිය තියුණුවූ රාග ඇති වේද, මහණෙනි, එහි මෙය ස්ත්‍රියගේ දරුණු විෂය වේ. මහණෙනි, බොහෝ සෙයින් ස්ත්‍රිය කේලාම් කියන්නේවේද, මහණෙනි, මෙය එහි ස්ත්‍රියගේ දිව් දෙකක් ඇති බව වේ. මහණෙනි, බොහෝ සෙයින් ස්වාමියා ඉක්මවා හැසිරෙන්නී වේද, මහණෙනි, මෙය ස්ත්‍රියගේ මිත්‍ර ද්‍රෝහි බව වේ යන පසයි."

---

# 24 ආවාසික වර්ගය

**31. අභාවනීය වාසික සූත්‍රයඃ-** 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ ආවාසික භික්ෂුතෙම නොවැඩිය යුතුවේ, හෙවත් බුහුමන් නොකටයුතුවේ.

2. "කවර පසකින්ද යත්? ශ්‍රමණ සංකල්පයන්ගෙන් යුක්ත නොවූයේ වත් සම්පන්න නොවේද, බහුශ්‍රැත නොවූයේ ඇසූ දෙය දරන්නේ නොවේද, සැහැල්ලු පැවතුම් ඇති බව නොවූයේ විවේකයෙහි ඇළුම් නැත්තේ වේද, යහපත් වචන නැත්තේ යහපත් වචනයෙන් කරණ කටයුතු ඇත්තේ නොවේද, ජඩවූ කෙළතොලුවූ දුෂ්ප්‍රඥයෙක් වේද යන පසිනි.

4 "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ ආවාසික භික්ෂුතෙම වැඩිය යුත්තෙක් හෙවත් බුහුමන් කටයුත්තෙක් වේ.

5. "කවර පසකින්ද යත්? ශ්‍රමණ සංකල්පයෙන් යුක්ත වූයේ වත් සම්පන්නයෙක් වේද, බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තේ ඇසූ දෙය දරන්නෙක් වේද, සැහැල්ලු බැව් ඇත්තේ විවේකයෙහි ඇලුනෙක් වේද, යහපත් වචන ඇත්තේ යහපත් වචනයෙන් කරණ කටයුතු ඇත්තේ වේද, ජඩ නොවූ කෙළතොලු නොවූ ප්‍රඥා ඇත්තෙක් වේද, යන පසිනි."

**32. පිය මනාපාවාසික සූත්‍රයඃ-** 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ ආවාසික භික්ෂුතෙම බ්‍රහ්මචාරීන්ට ප්‍රිය වූවෙක්ද මන වඩන්නෙක්ද ගරු කටයුත්තෙක්ද බුහුමන් කටයුත්තෙක්ද වේ.

2. "කවර පසකින්ද යත්? සිල්වත් වේද, ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සංවරවූයේ ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තව වාසය කෙරේද, ස්වල්ප තරම් වරදවල භය දක්නා සුළු වූයේ ශික්ෂා පදයන්හි සමාදන්ව හික්මේද, බහුශ්‍රැත වූයේ ඇසූ දෙය දරන්නේ අසන ලද්දවුන්ගේ රැස් කිරීම ඇත්තෙක් වේද, මුල යහපත්වූ මැද යහපත්වූ කෙළවර යහපත්වූ අර්ථ සහිතවූ ව්‍යඤ්ජන සහිතවූ යම් ඒ ධර්මයෝ සියල්ලෙන් සම්පූර්ණවූ පිරිසිදුවූ බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශ කෙරෙද්ද, එබඳු ධර්මයෝ මොහු

විසින් බොහෝ කොට අසන ලද්දාහු දරණ ලද්දාහු වචනයෙන් පුරුදු කරණ ලද්දාහු සිතින් සලකන ලද්දාහු දෘෂ්ටියෙන් මනාව ප්‍රතිවේධ කරණ ලද්දාහු වෙද්ද, යහපත් වචන ඇත්තේ, යහපත් වචනයෙන් කරණ කටයුතු ඇත්තේ මනොඥවූ කෙළතොලු නොවූ අර්ථය හඟවන්නාවූ පුරවැසි වචනයෙන් යුක්තවූයේවේද, උතුම් සිතෙහි හටගන්නාවූ මේ ආත්මයෙහි සැප විහරණ ඇති, සතර ධ්‍යානයන් කැමති පරිදි ලබන්නෙක් පහසුවෙන් ලබන්නෙක් බහුලව ලබන්නෙක්වේද, ආශ්‍රවයන් නැසීමෙන් ආශ්‍රව රහිතවූ චිත්ත විමුක්තියටද ප්‍රඥා විමුක්තියටද මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කෙරේද, යන පසිනි."

33. **ආවාස සොභණ සූත්‍රයඃ-** 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ ආවාසික භික්ෂුතෙම ආවාසය හොබවයි. (මෙහි පඤ්චක නිපාතයේ 2 පණ්ණාසකයේ 37 සූත්‍රයේ 2, 6 ඡේද යෙදිය යුතුයි.) යහපත් වචන ඇත්තේ යහපත් වචනයෙන් කරණ කටයුතු ඇත්තේ මනොඥවූ කෙළතොලු නොවූ අර්ථ හඟවන්නාවූ පුරවැසි වචනයෙන් යුක්තවූවෙක් වේද, ලඟට පැමිණෙන්නෙකු දැහැමි කථාවෙන් කරුණු දක්වන්ට සමාදන් කරවන්ට තෙද ගන්වන්ට සතුටු කරවන්ට සමර්ථයෙක් වේද, උතුම් සිතෙහි හටගන්නාවූ මේ ආත්මයෙහි සැප විහරණ ඇත්තාවූ සතර ධ්‍යානයන් කැමති පරිදි ලබන්නෙක් සුවසේ ලබන්නෙක් බහුලව ලබන්නෙක්වේද, යන පසිනි."

34. **බහුපකාරාවාසික සූත්‍රයඃ-** 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ ආවාසික භික්ෂුතෙම ආවාසයට බොහෝ උපකාර ඇත්තේ වේ.

2. (මෙහි පඤ්චක නිපාතයේ 2 පණ්ණාසකයේ 37 සූත්‍රයේ 2, 6 ඡේද යෙදිය යුතුයි.) කැඩුම් බිඳුම් ප්‍රතිසංස්කරණය කෙරේද, මහත්වූ භික්ෂු සංඝතෙම පැමිණියේවේද, නොයෙක් පිටරට භික්ෂූහු වෙද්ද, ගිහියන් වෙතට පැමිණ ඇවැත්නි, මහත්වූ භික්ෂු සංඝතෙමේ පැමිණියේය. නොයෙක් පිටරට භික්ෂූහු වෙත්. පින් කරව්, පින්කරන්ට සුදුසු කාලයයි' සැළ කෙරේද, උතුම් සිතෙහි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

හටගන්නාවූ මේ ආත්මයෙහි සැප විහරණ ඇත්තාවූ සතර ධ්‍යානයන් කැමති පරිදි ලබන්නෙක් සුවසේ ලබන්නෙක් බහුලව ලබන්නෙක් වේද, යන පසිනි.”

35. **අනුකම්පකා වාසික සූත්‍රයඃ-** 1. “මහණෙනි, කරුණු පසකින් යුක්තවූ ආවාසික භික්ෂුතෙම ගිහියන්ට අනුකම්පා කරයි.

2. “කවර පසකින්ද යත්? පඤ්ච ශීලයන් සමාදන් කරවාද, චතුස්සත්‍ය ධර්ම දර්ශනයෙහි පිහිටුවාද, ගිලනුන් කරා එළඹ ‘ආයුෂ්මත්නි, සුදුසු බවට ගියාවූ සිහිය එළවව්යයි’ සිහිය උපදවාද, මහත්වූ භික්ෂු සංඝයා වනාහි පැමිණියේ වේද, නොයෙක් නොරටවැසි භික්ෂූහු වෙද්ද, ගිහියන් වෙතට පැමිණ ඇවැත්නි, මහා භික්ෂු සංඝ තෙමේ පැමිණියේය. නොයෙක් වෙන රටවල වැඩි භික්ෂූහු වෙත්. පින් කරව්, පින් කරන්ට සුදුසු කල් වේයයි’ සැළ කෙරේද, රූක්ෂවූ හෝ ප්‍රණීතවූ හෝ යම් භෝජනයක් වනාහි මොහුට දෙද්ද, එය තෙමේ වළඳාද ශ්‍රද්ධාවෙන් දුන් දෙය ඉවත නොදමාද, යන පසිනි.”

35. **යථාභතාවාසික සූත්‍රයඃ-** 1. “මහණෙනි, කරුණු පසකින් යුක්තවූ ආවාසික භික්ෂුතෙම ගෙනෙනලද බරක් බහා තබන ලද්දේ යම්සේද එමෙන් නරකයෙහි උපදී.

2. “කවර පසකින්ද යත්? නොදැන නොසොයා අගුණ කියයුත්තහුගේ ගුණ කියාද, නොදැන නොසොයා ගුණ කිය යුත්තහුගේ අගුණ කියාද, නොදැන නොසොයා නොපැහැදිය යුතු තන්හි පැහැදීම පහළ කෙරේද, නොදැන නොසොයා පැහැදිය යුතු තන්හි නොපැහැදීම පහළ කෙරේද, ශ්‍රද්ධාවෙන් දුන් දෙය ඉවත දමාද, යන පසිනි.

“මහණෙනි, කරුණු පසකින් යුක්තවූ ආවාසික භික්ෂු තෙම ගෙනෙන ලද බරක් බහා තබන ලද්දේ යම්සේද, එමෙන් ස්වර්ගයෙහි උපදී.

“කවර පසකින්ද යත්? දැන සොයා අගුණ කිය යුත්තහුගේ අගුණ කියාද, දැන සොයා ගුණ කිය යුත්තහුගේ ගුණ කියාද දැන සොයා නොපැහැදිය යුතු තන්හි නොපැහැදීම පහළ

කෙරේද, දැන සොයා පැහැදිය යුතු තන්හි පැහැදීම පහළ කෙරේද, ශ්‍රද්ධාවෙන් දුන් දෙය විනාශ නොකෙරේද, යන පසිනි.”

37. **අවණ්ණභාසකාවාසික සූත්‍රය**:- 1. “මහණෙනි, කරුණු පසකින් යුක්තවූ ආවාසික භික්ෂුතෙම ගෙනෙන ලද බරක් බහා තබන ලද්දේ යම්සේද, එමෙන් නරකයෙහි උපදියි.

2. “කවර පසකින්ද යත්? නොදැන නොසොයා අගුණ කිය යුත්තහුගේ ගුණ කියාද, නොදැන නොසොයා ගුණ කිය යුත්තහුගේ අගුණ කියාද, ආවාසයෙහි මසුරුකම් ඇත්තේ, ආවාසයෙහි බලවත් ගිජුකම ඇත්තේවේද, කුලයන්හි මසුරුකම් ඇත්තේ කුලයන්හි බලවත් ගිජුකම් ඇත්තේවේද, ශ්‍රද්ධාවෙන් දුන් දෙය විනාශ කෙරේද, යන පසිනි

4. “මහණෙනි, කරුණු පසකින් යුක්තවූ ආවාසික භික්ෂු තෙම ගෙනෙන ලද බරක් බහා තබන ලද්දේ යම්සේද, එමෙන් ස්වර්ගයෙහි උපදියි.

5. “කවර පසකින්ද යත්? දැන සොයා ගුණ කිය යුත්තහුගේ ගුණ කියාද, දැන සොයා අගුණ කිය යුත්තහුගේ අගුණ කියාද, ආවාසයෙහි මසුරුකම් ඇත්තෙක් ආවාසයෙහි බලවත් ගිජුකම් ඇත්තෙක් නොවේද, කුලයන්හි මසුරුකම් ඇත්තෙක් කුලයන්හි බලවත් ගිජුකම් ඇත්තෙක් නොවේද, ශ්‍රද්ධාවෙන් දුන් දෙය විනාශ නොකෙරේද, යන පසිනි”

38. **මච්ඡරාවාසික සූත්‍රය**:- 1. “මහණෙනි, කරුණු පසකින් යුක්තවූ ආවාසික භික්ෂුතෙම ගෙනෙන ලද බරක් බහා තබන ලද්දේ යම්සේද, එමෙන් නරකයෙහි උපදියි.

2. “කවර පසකින්ද යත්? නොදැන නොසොයා අගුණ කියයුත්තහුගේ ගුණ කියාද, නොදැන නොසොයා ගුණ කිය යුත්තහුගේ අගුණ කියාද, ආවාසයෙහි මසුරුකම් ඇත්තේ වේද, කුලයන්හි මසුරුකම් ඇත්තේ වේද, ලාභයන්හි මසුරුකම් ඇත්තේවේද, යන පසිනි.

4. “මහණෙනි, කරුණු පසකින් යුක්තවූ ආවාසික භික්ෂුතෙම ගෙනෙන ලද බරක් බහා තබන ලද්දේ යම්සේද, එමෙන් ස්වර්ගයෙහි උපදියි.

5. "කවර පසකින්ද යත්? දැන සොයා අගුණ කිය යුත්තහුගේ අගුණ කියාද, දැන සොයා ගුණ කියයුත්තහුගේ ගුණ කියාද, ආවාසයන්හි මසුරුකම් නැත්තේ වේද, කුලයන්හි මසුරුකම් නැත්තේ වේද, ලාභයන්හි මසුරුකම් නැත්තේ වේද, යන පසිනි.

39. **සද්ධාදෙය්‍ය විනිපාතක සූත්‍රය:-** 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ ආවාසික භික්ෂුතෙම ගෙනෙන ලද බරක් බහා තබන ලද්දේ යම්සේද, එමෙන් නරකයෙහි උපදියි.

2 "කවර පසකින්ද යත්? ආවාසයන්හි මසුරුකම ඇත්තේවේද, කුලයන්හි මසුරුකම ඇත්තේවේද, ලාභයන්හි මසුරුකම ඇත්තේවේද, ගුණවර්ණනායෙහි මසුරුකම ඇත්තේ වේද, ශ්‍රද්ධාවෙන් දුන් දෙය විනාශ කෙරේද, යන පසිනි.

4. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ ආවාසික භික්ෂුතෙම ගෙනෙන ලද බරක් බහා තබන ලද්දේ යම්සේද, එමෙන් ස්වර්ගයෙහි උපදියි.

5. "කවර පසකින්ද යත්? ආවාසයන්හි මසුරුකම් ඇත්තේ නොවේද, කුලයන්හි මසුරුකම් ඇත්තේ නොවේද, ලාභයන්හි මසුරුකම් ඇත්තේ නොවේද, ගුණ වර්ණනායෙහි මසුරුකම් ඇත්තේ නොවේද ශ්‍රද්ධාවෙන් දුන් දෙය විනාශ නොකෙරේද යන පසිනි."

40. **ආවාසමච්ඡරිය සූත්‍රය:-** 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ ආවාසික භික්ෂුතෙම ගෙනෙන ලද බරක් බහා තබන ලද්දේ යම්සේද, එමෙන් නරකයෙහි උපදියි.

2. 'කවර පසකින්ද යත්? ආවාසයන්හි මසුරුකම් ඇත්තේවේද, කුලයන්හි මසුරුකම් ඇත්තේවේද, ලාභයන්හි මසුරුකම් ඇත්තේවේද, ගුණ වර්ණනායෙහි මසුරුකම් ඇත්තේවේද, ධර්මයෙහි මසුරුකම් ඇත්තේවේද යන පසිනි.

4. 'මහණෙනි, කරුණු පසකින් යුක්තවූ ආවාසික භික්ෂු තෙම ගෙනෙන ලද බරක් බහා තබන ලද්දේ යම්සේද, එමෙන් ස්වර්ගයෙහි උපදියි.

5. "කවර පසකින්ද යත්? ආවාසයන්හි මසුරුකම් ඇති නොවේද, කුලයන්හි මසුරුකම් ඇති නොවේද, ලාභයන්හි මසුරුකම් ඇති නොවේද, ගුණ වර්ණනායෙහි මසුරුකම් ඇති නොවේද, ධර්මයෙහි මසුරුකම් ඇති නොවේද, යන පසිනි"

## 25. දුච්චරිත වර්ගය.

(මේ වර්ගයේ සූත්‍රවල 3, 6 ඡේද නැති තැන්හි ඒ ඒ සූත්‍රවල 1, 4 ඡේද යොදාගත යුතුයි)

**41 දුච්චරිතාදීනව සූත්‍රයඃ-** 1 "මහණෙනි, මේ දුශ්චරිතයෙහි දෝෂ පසක් වෙත්.

2 "කවර පසක්ද යත්? තෙමේද තමන්ට දොස් කියයි. දැනගෙණ නුවණැත්තෝ ගරහත්. ලාමකවූ ගුණ ඝොෂයක් පැනනගියි. ඉතා මුළා වූයේ කළුරිය කරයි. ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි සැප නැති දුකට පිහිටවූ නපුරුසේ පතිත වන්නාවූ නරකයෙහි උපදියි. යන පසයි.

4 "මහණෙනි, සුචරිතයෙහි මේ අනුසස් පසක් වෙත්.

5 "කවර පසක්ද යත්? තෙමේද තමන්ට දොස් නොකියයි, දැනගෙණ නුවණැත්තෝ ප්‍රශංසා කරත්. යහපත්වූ ගුණ ඝෝෂාවෙක් පැන නගියි. මුළානොවූයේ කළුරිය කරයි. ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගති නම්වූ දිව්‍යලෝකයෙහි උපදියි යන පසයි."

**42 කාය දුච්චරිතාදීනව, 43 වචීදුච්චරිතාදීනව, 44 මනො දුච්චරිතාදීනව සූත්‍රඃ-** 1 "මහණෙනි, කාය දුශ්චරිතයෙහි මේ දෝෂ පසක් වෙත්.

2 (මෙය මේ වර්ගයේ 1 සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

4 කාය සුචරිතයෙහි මේ අනුසස් පසක් වෙත්. (මෙය මේ වර්ගයේ 1 සූත්‍රයේ 5 ඡේදය මෙනි.) වාග් දුශ්චරිතයෙහි මේ දෝෂ පසක් වෙත්. (මෙය මේ වර්ගයේ 1 සූත්‍රයේ 2 ඡේදය මෙනි.) වාක් සුචරිතයෙහි මේ අනුසස් පසක් වෙත්. (මෙය මේ

වර්ගයේ 1 සූත්‍රයේ 5 ඡේදය මෙනි) මනො දුශ්චරිතයෙහි මේ දෝෂ පසක් වෙත්. (මෙය මේ වර්ගයේ 1 සූත්‍රයේ 5 ඡේදය මෙනි.) මනො සුචරිතයෙහි මේ අනුසස් පසක් වෙත්. (මෙය මේ වර්ගයේ 1 සූත්‍රයේ 5 ඡේදය මෙනි.)

**45 සුචරිතානිසංස සූත්‍රයː-** 1 "මහණෙනි, දුශ්චරිතයෙහි මේ දෝෂ පසක් වෙත්.

2 "කවර පසක්ද යත්? තෙමේද තමාට දොස් කියයි. දැනගෙණ නුවණැත්තෝ ගරහත් ලාමකවූ ගුණ ඝෝෂාවක් පැන නගියි. සද්ධර්මයෙන් නැගී සිටියි හෙවත් දශකුශල ධර්මයෙන් නැගී සිටියි. අසද්ධර්මයෙහි හෙවත් දශ අකුසල ධර්මයෙහි පිහිටයි යන පසයි.

4 "මහණෙනි, සුචරිතයෙහි මේ අනුසස් පසක් වෙත්.

5 "කවර පසක්ද යත්? තෙමේද තමාට දොස් නොකියයි. දැනගෙණ නුවණැත්තෝ ප්‍රශංසා කරත් යහපත්වූ ගුණ ඝෝෂාවක් පැන නගියි. දශ අකුසල ධර්මයෙන් නැගී සිටියි. දශ කුශල ධර්මයෙහි පිහිටයි. යන පසයි."

**46 කාය සුචරිතානිසංස, 47 වචී සුචරිතානිසංස, 48 මනො සුචරිතානිසංස සූත්‍රː-** 1 "මහණෙනි, කාය දුශ්චරිතයෙහි මේ දෝෂ පසක් වෙත්.

2 (මේ ඡේදය මේ පණ්ණාසකයේ 45 සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

4 කාය සුචරිතයෙහි මේ අනුසස් පසක් වෙත්. (මෙය මේ පණ්ණාසකයේ 45 සූත්‍රයේ 5 ඡේදය මෙනි) වාක් දුශ්චරිතයෙහි මේ දෝෂ පසක් වෙත්. (මේ ඡේදය මේ පණ්ණාසකයේ 45 සූත්‍රයේ 2 ඡේදය මෙනි) වාක් සුචරිතයෙහි මේ අනුසස් පසක් වෙත් (මෙය මේ පණ්ණාසකයේ 45 සූත්‍රයේ 5 ඡේදය මෙනි.) මනො දුශ්චරිතයෙහි මේ දෝෂ පසක් වෙත්. (මේ ඡේදය මේ පණ්ණාසකයේ 45 සූත්‍රයේ 2 ඡේදය මෙනි.) මනො සුචරිතයෙහි මේ අනුසස් පසක් වෙත්. (මෙය මේ පණ්ණාසකයේ 45 සූත්‍රයේ 5 ඡේදය මෙනි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**49 සීවථිකාදීනව සූත්‍රය:-** 1 "මහණෙනි, අමුසොහොනෙහි මේ දෝෂ පසක් වෙත්. කවර පසක්ද යත්?

2 "අපවිත්‍රවේ, දුර්ගන්ධවේ, ප්‍රතිභය සහිතවේ, චණ්ඩ අමනුෂ්‍යයන්ට ආවාසවේ. බොහෝදෙනා අඬන තැනවේ. යන පසයි.

4 "මහණෙනි, මෙපරිද්දෙන්ම අමුසොහොනට බඳු උපමා ඇති පුද්ගලයා කෙරෙහි මේ දෝෂ පසක් වෙත්.

5 "කවර පසක්ද යත්? මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් (ii) අපිරිසිදු කාය කර්මයෙන් යුක්ත වේද, අපිරිසිදු වාක් කර්මයෙන් යුක්ත වේද, අපිරිසිදු මනො කර්මයෙන් යුක්ත වේද,

(iii) මෙය මොහුගේ අපිරිසිදු බවයයි කියමි "මහණෙනි, ඒ සොහොන යම් සේ අපිරිසිදුවේද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳුයයි කියමි. (මෙහි 5 (ii) යෙදිය යුතුයි) ඔහුගේ ලාමකවූ ගුණ ඝෝෂාවක් පැන නගියි මෙය මොහුගේ දුර්ගන්ධ භාවයයි කියමි. මහණෙනි, යම්සේ ඒ සොහොන දුර්ගන්ධවේද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳුයයි කියමි. (මෙහි 5 (ii) යෙදිය යුතුයි.

ඔහු ප්‍රියසීලී බ්‍රහ්මචාරීහු දුරින් දුරුකෙරෙත්. මෙය මොහුගේ ප්‍රතිභය සහිතවීම යයි කියමි. මහණෙනි, ඒ සොහොණ යම්සේ ප්‍රතිභය සහිත වේද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳුයයි කියමි. (මෙහි 5 (ii) යෙදිය යුතුයි) හෙතෙම සභාගවූ (තමන්ගේ ගුණයන්ට සමාන) පුද්ගලයන් සමග වාසය කෙරේද, මෙය මොහුගේ චණ්ඩ අමනුෂ්‍යයන් හා වාසය කිරීමයයි කියමි. මහණෙනි, යම්සේ ඒ සොහොණ චණ්ඩවූ අමනුෂ්‍යයන්ට වාසස්ථාන වේද, මම මේ පුද්ගලයා එබඳුයයි කියමි. (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) ඔහු ප්‍රියශීලීවූ සබ්‍රහ්මචාරීහු දැක ගුණගටා කියයුතු බවට පැමිණෙත්. යම්බඳුවූ අපි මෙබඳු පුද්ගලයන් සමග වාසය කරමුද, අපට ඒකාන්තයෙන් දුකය කියායි. මෙය මොහුගේ හඬන තැන්වීමයයි කියමි. මහණෙනි, යම්සේ ඒ සොහොන

බොහෝදෙනාට හඬන තැන් වේද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳුයයි කියමි.

6. (මේ ඡේදය 4 ඡේදය මෙනි.)

**50. පුග්ගලප්පසාද සූත්‍රය:-** 1. 'මහණෙනි, පුද්ගලයෙකුට පැහැදීමෙහි මේ දෝෂ පසක් වෙත්.

2 "කවර පසක්දයත්? (ii) මහණෙනි, යමෙක් යමෙකු කෙරෙහි පුද්ගලයෙක් විශෙෂයෙන් ප්‍රසන්නවේද, යම්බඳු ඇවතකින් සංඝතෙම සමාගමෙන් ඉවත්කෙරේද, ඕහටමෙබඳු සිතක් වෙයි. යම් මේ පුද්ගලයෙක් වනාහි මට ප්‍රියද මනාපද හෙතෙම සංඝයා විසින් සමාගමෙන් ඉවත් කරණ ලද්දේයයි' (ii) භික්ෂූන් කෙරෙහි නොපැහැදීම බහුලකොට ඇත්තේවේද, භික්ෂූන් කෙරෙහි නොපැහැදීම බහුලකොට ඇත්තේම සෙසු භික්ෂූන් සේවනය නොකෙරේද, සෙසු භික්ෂූන් සේවනය නොකරන්නේ සද්ධර්මය නොඅසයි. සද්ධර්මය නොඅසන්නේ සද්ධර්මයෙන් පිරිහෙයි. මහණෙනි, පුද්ගලයෙකුට පැහැදීමෙහි මේ පළමුවන දෝෂය වේ.

3. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. යම් පුද්ගලයෙකු කෙරෙහි පුද්ගලයෙක් තෙම විශෙෂයෙන් ප්‍රසන්නවේද හෙතෙම යම්බඳු ඇවතකින් සංඝතෙම අසුන් කෙළවර හිඳුවාද, එබඳු ඇවතකට පැමිණියේවේද, ඕහට මෙබඳු සිතක් වෙයි. යම් මේ පුද්ගලයෙක් වනාහි මටප්‍රියද මනාපද හෙතෙම සංඝයා විසින් අසුන් කෙළවර හිඳුවන ලද්දේයයි (මෙහි 2 (iii) යෙදිය යුතුයි.) මහණෙනි, පුද්ගලයෙකුට පැහැදීමෙහි මේ දෙවෙනි දෝෂයවේ.

4. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. යම් පුද්ගලයෙකු කෙරෙහි පුද්ගලයෙක් තෙම විශෙෂයෙන් පැහැදුනේ වේද, හෙතෙම අන්දිශාවකට ගියේවේද, ඕහට මෙබඳු සිතක් වෙයි. යම් මේ පුද්ගලයෙක් වනාහි මට ප්‍රියද මනාපද හෙතෙම අන්දිසාවකට ගියේයයි (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, පුද්ගලයෙකුට පැහැදීමෙහි මේ තුන්වෙනි දෝෂය වේ.

"හෙතෙම ගිහිවූයේවේද, ඕහට මෙබඳු සිතක් වෙයි" 'යම් මේ පුද්ගලයෙක් වනාහි මට ප්‍රියද මනාපද හෙතෙම ගිහිවූයේ

වෙයි.' හෙතෙම කළුරිය කෙළේවේද, ඕහට මෙබඳු සිතක්වෙයි. 'යම් මේ පුද්ගලයෙක් වනාහි මට ප්‍රියද, මනාපද හෙතෙම,

කළුරිය කෙළේයයි' අන්‍ය භික්ෂූන් සේවනය නොකෙරේද, අන්‍ය භික්ෂූන් සේවනය නොකරන්නේ සද්ධර්මය නොඅසාද, සද්ධර්මය නොඅසන්නේ සද්ධර්මයෙන් පිරිහෙයි. මහණෙනි, පුද්ගල ප්‍රසාදයෙහි මේ පස්වන දෝෂයවේ. මහණෙනි, මොහු වනාහි පුද්ගල ප්‍රසාදයෙහි දෝෂ පස වෙත්යයි වදාළේය."

---

## හයවෙනි පණ්ණාසකය.

## 26 උපසම්පදා වර්ගය

**1. උපසම්පාදෙතබ්බ සූත්‍රය:-** 1 "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුව විසින් උපසම්පදා කටයුතුයි.

2 "කවර පසකින්දයත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම අශෛක්ෂවූ ශීලස්කන්ධයෙන් යුක්තවේද, අශෛක්ෂ වූ සමාධිස්කන්ධයෙන් යුක්තවේද, අශෛක්ෂවූ ප්‍රඥාස්කන්ධයෙන් යුක්තවේද අශෛක්ෂවූ විමුක්තිස්කන්ධයෙන් යුක්තවේද, අශෛක්ෂවූ විමුක්ති ඥාණදර්ශන ස්කන්ධයෙන් යුක්තවේද, යන පසිනි."

**2 නිස්සයදාන සූත්‍රය:-** 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුව විසින් ආචාර්‍ය්‍යව නිශ්‍රය දියයුතුයි.

2. (මෙය මේ වර්ගයේ 1 සූත්‍රයේ 2 ඡෙදය මෙනි.)

**3 උපට්ඨාපන සූත්‍රය:-** 1. "සාමණේරතෙම උපස්ථාන කටයුතුයි.

2. (මෙය මේ වර්ගයේ 1 සූත්‍රයේ 2 ඡෙදය මෙනි) ශීල ස්කන්ධයෙන් යන පසිනි.

**4. පතිකිට්ඨමච්ඡරිය සූත්‍රය:-** 1. "මහණෙනි, මේ මසුරුකම් පසක් වෙත්.

2. "කවර පසක්ද යත්? ආවාසයන්හි මසුරුකමය, කුලයන්හි මසුරුකමය ලාභයන්හි මසුරුකමය, ගුණවර්ණනායෙහි මසුරාකමය, ධර්මයෙහි මසුරුකමය යන පසයි.

4. "මහණෙනි, මසුරුකම් පසක්හුගේ දුරුකිරීම පිණිස මුල් සිදීම පිණිස බඹසර වසන්නේය.

5 "කවර පසක්හුගේදයත්? ආවාසයන්හි මසුරුකම (ii) දුරුකිරීම පිණිස මුල් සිදීම පිණිස බඹසර වසන්නේය. (iii) කුලයන්හි මසුරුකම (මෙහි 5 (ii) යෙදිය යුතුයි ලාභයන්හි මසුරුකම මෙහි 5 (ii) යෙදිය යුතුයි.) ගුණ කීමෙහි මසුරුකම (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) ධර්මයෙහි මසුරුකම (මෙහි 5 (ii) ඡෙදය යෙදිය යුතුයි.) යන පසය.

7. "මහණෙනි, මේ මසුරුකම් පස අතුරෙන් මේ ධර්මයෙහි මසුරුකමක් වේද, මෙය පිළිකුල් වේයයි" වදාළේය."

**5. මච්ඡරියප්පහාණ සූත්‍රයඃ-** 1 "මහණෙනි, මේ ධර්ම පසක් දුරුනොකොට පළමුවන ධ්‍යානයට පැමිණ වාසය කරන්ට සුදුසු නොවේ.

2. (මෙය මේ වර්ගයේ 4 සූත්‍රයේ 2 ඡෙදය මෙනි)

**6. පඨමජ්ඣානාධිගම සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ ධර්ම පස දුරුකොට පළමුවන ධ්‍යානයට පැමිණ වාසය කරන්ට සුදුසුවේ.

2. (මෙය මේ වර්ගයේ 4 සූත්‍රයේ 2 ඡෙදය මෙනි.)

**7-13. ජ්ඣානාධිගම සොතාපත්ති, සකෘදාගාමී, අනාගාමි අරහත්ත. ඵලාධිගම සූත්‍රඃ-** 1. "මහණෙනි, මේ ධර්මපස දුරුනොකොට දෙවන ධ්‍යානය, තුන්වන ධ්‍යානය, සතර වන ධ්‍යානය, සෝවාන්ඵලය, සකෘදාගාමීඵලය, අනාගාමි ඵලය, අර්හත්ඵලය ප්‍රත්‍යක්ෂ කරන්ට සුදුසු නොවේ.

2. (මෙය මේ වර්ගයේ 4 සූත්‍රයේ 2 ඡෙදය මෙනි.)

4. "මහණෙනි, මේ ධර්මපස දුරුකොට දෙවන ධ්‍යානය, තුන්වන ධ්‍යානය, සතරවන ධ්‍යානය, සෝවාන් ඵලය,

සකෘදාගාමී ඵලය, අනාගාමි ඵලය, අර්හත් ඵලය ප්‍රත්‍යක්ෂ කරන්ට සුදුසුවේ.

5. (මෙය මේ වර්ගයේ 6 සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

**14 පඨමජ්ඣානූපසම්පදා සූත්‍රයː-** 1. "මහණෙනි, මේ ධර්මපස වනාහි දුරුනොකොට පළමුවන ධ්‍යානයට පැමිණ වාසය කරන්ට සුදුසු නොවේ.

2. "කවර පසක්දයත්? ආවාසයන්හි මසුරුකමය, කුලයන්හි මසුරුකමය, ලාභයන්හි මසුරුකමය, ගුණවර්ණනාවෙහි මසුරුකමය, කළ උපකාර නොදන්නාබව කළ උපකාර නොසළකන බවය යන පසයි.

4. "මහණෙනි, මේ ධර්ම පස දුරුකොට පළමුවන ධ්‍යානයට පැමිණ වාසය කරන්ට සුදුසුවේ. කවර පසක්ද යත්

5. (මෙය මේ සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

**15-29 දුතිය, තතිය, චතුත්ථජ්ඣානූපසම්පදා සූත්‍රද, සොතාපත්ති සකෘදාගාමි, අනාගාමි, අරහත්ත ඵලූපසම්පදා සූත්‍රː-** 1. "මහණෙනි, මේ ධර්මපස දුරුනොකොට දෙවන ධ්‍යානය, තුන්වන ධ්‍යානය, සතරවන ධ්‍යානය, සෝවාන් ඵලය, සකෘදාගාමී ඵලය, අනාගාමී ඵලය, අර්හත් ඵලය ප්‍රත්‍යක්ෂ කරන්ට සුදුසු නොවේ.

2. "කවර පසක්දයත්? ආවාසයන්හි මසුරුකමය, කුලයන්හි මසුරුකමය, ලාභයන්හි මසුරුකමය, වර්ණයන්හි මසුරුකමය අකෘතඥබව හා අකෘතවේදී බවය යන පසයි.

4. "මහණෙනි, මේ ධර්ම පස වනාහි දුරුකොට අර්හත් ඵලය ප්‍රත්‍යක්ෂ කරන්ට සුදුසුවේ.

5. (මෙය මේ සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

**30. පඨම භත්තුද්දෙසක සූත්‍රයː-** 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භත්තුද්දෙසක තෙම සම්මත නොකටයුතුයි.

2. "කවර පසකින්දයත්? ඡන්දයෙන් අගතියට යේද, ද්වෙෂයෙන් අගතියට යේද, මොහයෙන් අගතියට යේද, භයින්

පටුන



අගතියට යේද, දක්වන ලද්ද හා නොදක්වන ලද්ද දනීද යන පසිනි.

4 "මහණෙනි, මේ කරුණු පසකින් යුක්තවූ භත්තුද්දෙසකතෙම සම්මත කටයුතුවේ.

5 "කවර පසකින්ද යත්? ඡන්දයෙන් අගතියට නොයේද, ද්වෙෂයෙන් අගතියට නොයේද, මෝහයෙන් අගතියට නොයේද, භයින් අගතියට නොයේද, දක්වන ලද්ද හා නොදක්වන ලද්ද දනීද, යන පසිනි.

(මෙහි පහත දක්වන සූත්‍රවල එකක් හැර එකකට පළමුව මේ වර්ගයේ 30 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි. ඊලඟ සූත්‍රයට එසේම 30 සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි. ඒ ඒ සූත්‍රවල 3 ඡේද 1 ඡේද මෙනි. 6 ඡේදය 4 ඡේදය මෙනි)

**31-34 දුතිය, තතිය, චතුත්ථ, පඤ්චම භත්තුද්දෙසක සූත්‍රඃ-** 1. "මහණෙනි, මේ කරුණු පසකින් යුක්තවූ භත්තුද්දෙසකතෙම සම්මත නොකටයුතුයි. සම්මත කරණ ලද්දේද නොයැවිය යුතුවේ (මෙහි මේ වර්ගයේ 30 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) 4. "සම්මත කරණ ලද්දේ යැවිය යුතුවේ (මෙහි මේ වර්ගයේ 31 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.) (32) 1. 'අඥානයායයි දතයුතුවේ. 4. "පණ්ඩිතයා යයි දතයුතුවේ. (33) 1. "සාරා දමනලද ගුණ ඇති නසන ලද ගුණ ඇති තමා පරිහරණය කරයි 4. "නොසාරා දමන ලද ගුණ ඇති නොනසන ලද ගුණ ඇති තමා පරිහරණය කරයි. (මෙහි මේ වර්ගයේ 31 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) (34) 1. "ගෙනෙන ලද බරක් බහා තබන ලද්දේ යම්සේද, එමෙන් නරකයෙහි උපදියි. 4. "ගෙනෙන ලද බරක් බහා තබන ලද්දේ යම්සේද, එමෙන් ස්වර්ගයෙහි උපදියි.

**35. සේනාසන පඤ්ඤාපත්ති සූත්‍රඃ-** 1. "මහණෙනි, මේ කරුණු පසකින් යුක්තවූ සෙනසුන් පනවන්නෙක් සම්මත නොකටයුතුයි. 4. "සෙනසුන් පනවන්නෙක් සම්මත කටයුතුයි. (36) 1. "පනවන ලද්ද නොපනවන ලද්ද නොදනීද. 4. "පනවන ලද්ද නොපනවන ලද්ද දනීද, (37) 1. "සෙනසුන් ගන්වන්නෙක් සම්මත නොකට යුතුයි. 4 "සෙනසුන් ගන්වන්නෙක් සම්මත කටයුතුයි. (38) 1

පනවන ලද්ද නොපනවන ලද්ද නොදනීද, 4. "පනවන ලද්ද නොපනවන ලද්ද දනීද, 39. පඨම භාණ්ඩාගාරික සූත්‍රයඃ- 1. " භාණ්ඩාගාරික තෙම සම්මත නොකට යුතුයි. 4. "භාණ්ඩාගාරික තෙම සම්මත කටයුතුයි (40) 1. "රක්නා ලද්ද නොරක්නා ලද්ද නොදනීද, 4. "රක්නා ලද්ද නොරක්නා ලද්ද දනීද,

41. **පඨම චීවර පටිග්ගාහක සූත්‍රයඃ-** 1. "සිව්රු පිළිගන්නෙක් සම්මත නොකටයුතුයි. 4. "සිව්රු පිළිගන්නෙක් සම්මත කටයුතුයි. (42) 1. "ගන්නා ලද්ද නොගන්නා ලද්ද නොදනීද, 4. ගන්නාලද්ද නොගන්නාලද්ද දනීද, 43. "සිව්රු බෙදන්නා සම්මත නොකට යුතුයි. 4. "සිව්රු බෙදන්නා සම්මත කටයුතුයි. (44) කැඳ බෙදන්නා සම්මත නොකටයුතුයි. 4. කැඳ බෙදන්නා සම්මත කටයුතුයි (45) පළතුරු බෙදන්නා සම්මත නොකටයුතුයි. 4. පළතුරු බෙදන්නා සම්මත කටයුතුයි. (46) කැවිලි බෙදන්නා සම්මත නොකට යුතුයි. 4. "කැවිලි බෙදන්නා සම්මත කටයුතුයි (47) බෙදන ලද්ද නොබෙදන ලද්ද නොදනීද, ස්වල්ප තරමින් හැර දමන්නෙක් සම්මත නොකට යුතුයි 4. ස්වල්ප තරමින් හැර දමන්නෙක් සම්මත කටයුතුයි. (48) හැර දමනලද්ද හැර නොදමන ලද්ද නොදනීද. 4 හැර දමනලද්ද හැර නොදමන ලද්ද දනීද, (49) වැසි සළු ගන්වන්නෙක් සම්මත නොකට යුතුයි. 4. "වැසි සළු ගන්වන්නෙක් සම්මත කටයුතුයි. (50) ගන්නාලද්ද නොගන්නා ලද්ද නොදනීද, 4. "ගන්නාලද්ද නොගන්නා ලද්ද දනීද, (51) පාත්‍රය ගන්වන්නෙක් සම්මත නොකට යුතුයි. (56) 4. "පාත්‍රය ගන්වන්නෙක් සම්මත කටයුතුයි. (52) ගන්නාලද්ද නොගන්නාලද්ද නොදනීද, 4. "ගන්නාලද්ද නොගන්නා ලද්ද දනීද. (53) ආරාමිකයන් යවන්නෙක් සම්මත නොකට යුතුයි. 4. "ආරාමිකයන් මෙහෙය වන්නෙක් සම්මත කටයුතුයි. (54) යවනලද්ද නොයවනලද්ද නොදනීද, 4. යවනලද්ද නොයවන ලද්ද දනීද, (55) සාමණේරයන් මෙහෙයවන්නෙක් සම්මත නොකටයුතුයි. 4. "සාමණේරයන් මෙහෙය වන්නෙක් සම්මත කටයුතුයි. (56) සම්මත කරණ ලද්දේද, නොමෙහෙය විය යුත්තේය. 4 "සම්මත කරණ ලද්දේ මෙහෙය වියයුතුයි. (57) අඥාන තෙම දතයුතුයි. 4. "පණ්ඩිත තෙම දතයුතුයි. (58)

සාරාදමනලද නසන ලද ගුණ ඇති තමා පරිහරණය කරයි. 4 " නොසාරා දමන ලද නොනසන ලද ගුණ ඇති තමා පරිහරණය කරයි (59) ගෙනෙන ලද බරක් බහා තබන ලද්දේ යම්සේද, එමෙන් නරකයෙහි උපදියි. 4. "මෙහෙයවන ලද්ද නොමෙහෙය වන ලද්ද නොදනියි. (60) ගෙනෙන ලද බරක් බහා තබන ලද්දේ යම්සේද, එමෙන් ස්වර්ගයෙහි උපදියි. (61) 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම ගෙනෙන ලද බරක් බහා තබන ලද්දේ යම්සේද, එමෙන් නරකයෙහි උපදී.

2. "කවර පසකින්ද යත්? සතුන් මරන්නේ වේද, සොරකම් කරන්නේ වේද, අබ්‍රහ්මචාරී වේද, බොරු කියන්නේ වේද, මදයට හා ප්‍රමාදයට කරුණුවූ රහමෙර පානය කරන්නේ වේද යන පසිනි.

4. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම ගෙනෙන ලද බරක් බහා තබන ලද්දේ යම්සේද, එමෙන් ස්වර්ගයෙහි උපදියි.

5. "කවර පසකින්ද යත්? සතුන් මැරීමෙන් වැළකුනේ වේද, සොරකම් කිරීමෙන් වැළකුනේ වේද, අබ්‍රහ්මචර්‍ය්‍යාවෙන් වැළකුනේවේද, බොරු කීමෙන් වැළකුනේ වේද මදයට හා ප්‍රමාදයට කරුණුවූ රහමෙර පානයෙන් වැළකුනේ වේද, යන පසිනි.

**62-65** "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුණී තොමෝ ශික්ෂාමානා තොමෝ සාමණේර තෙම, සාමණේරී තොමෝ උපාසක තෙම, උපාසිකා තොමෝ, ගෙනෙන ලද බරක් බහාතබන ලද්දී යම්සේද, එමෙන් නරකයෙහි උපදියි.

2 "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ උපාසිකා තොමෝ ගෙනන ලද බරක් බහා තබන ලද්දී යම්සේද, එමෙන් ස්වර්ගයෙහි උපදියි.

**66. පඨම අප්පමත්ත විස්සජ්ජක සූත්‍රය:-** 1 "මහණෙනි, කරුණු පසකින් වනාහි යුක්තවූ ආජීවක තෙම හෙවත් නග්න ශ්‍රමණතෙම ගෙනෙන ලද බරක් බහා තබන ලද්දේ යම්සේද එමෙන් නරකයෙහි උපදියි.

**67-75** "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ නිගණ්ඨ තෙම, නිගණ්ඨ ශ්‍රාවක තෙම, තාපස තෙම, පරිබ්‍රාජක තෙම, මාගන්දික තෙම, තෙදණ්ඩික තෙම, අරුද්ධක තෙම, ගොතමක තෙම, දෙව ධර්මක තෙම, ගෙනෙන ලද බරක් බහා තබන ලද්දේ යම්සේද, එමෙන් නරකයෙහි උපදියි.

**76. පඨම රාගාභිඤ්ඤා සූත්‍රය:-** 1 "මහණෙනි, රාගයාගේ විශිෂ්ට ඥානයෙන් දැනීම පිණිස ධර්ම පසක් වැඩිය යුතුයි

2 "කවර පසක්ද යත්? අශුභ සංඥාවය, මරණ සංඥාවය ආදීනව සංඥාවය, ආහාරයෙහි ප්‍රතික්කූල සංඥාවය, සියලු ලෝකයෙහි අනභිරත සංඥාවය යන පසයි.

77. 1 "මහණෙනි, රාගයාගේ විශිෂ්ඨ ඥානයෙන් දැනීම පිණිස ධර්ම පසක් වැඩිය යුතුයි.

2 "කවර පසක්ද යත්? අනිත්‍ය සංඥාවය, අනාත්ම සංඥාවය, මරණ සංඥාවය, ආහාරයෙහි ප්‍රතික්කූල සංඥාවය, සියලු ලෝකයෙහි අනභිරත සංඥාව යන පසයි."

78-1 "මහණෙනි, රාගයාගේ විශිෂ්ට ඥානයෙන් දැනීම පිණිස ධර්ම පසක් වැඩිය යුතුයි.

2. "කවර පසක්ද යත්? අනිත්‍ය සංඥාවය, අනිත්‍යයෙහි දුක්ඛ සංඥාවය, දුකෙහි අනාත්ම සංඥාවය, ප්‍රහාණ සංඥාවය, විරාග සංඥාවය යන පසයි.

79-1 "මහණෙනි, රාගයාගේ විශිෂ්ට ඥානයෙන් දැනීම පිණිස ධර්ම පසක් වැඩිය යුතුයි.

2 "කවර පසක්ද යත්? ශ්‍රද්ධෙන්ද්‍රිය, වීර්‍යෙන්ද්‍රිය, සතින්ද්‍රිය සමාධින්ද්‍රිය, ප්‍රඥෙන්ද්‍රිය යන පසයි.

80-1 "මහණෙනි, රාගයාගේ විශිෂ්ට ඥානයෙන් දැනීම පිණිස ධර්ම පසක් වැඩිය යුතුයි.

2 "කවර පසක්ද යත්? ශ්‍රද්ධා බලය, වීර්‍ය බලය, ස්මෘති බලය, සමාධි බලය, ප්‍රඥා බලය යන පසයි.

(මෙහි පහත දක්වන වචන යෙදීමෙන් ඒ ඒ සූත්‍ර සකස් කළ යුතුයි)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මහණෙනි, රාගයාගේ පිරිසිඳ දැනීම් පිණිස, හාත්පසින් නැසීම පිණිස, දුරුකිරීම පිණිස, ක්ෂය කිරීම පිණිස, විනාශ කිරීම පිණිස, නොඇලීම පිණිස, නිරුද්ධ කිරීම පිණිස, අත් හැරීම පිණිස, දුරලීම පිණිස මේ ධර්ම පසක් වැඩිය යුතුයි,

ද්වෙෂයාගේ, මෝහයාගේ, ක්‍රොධයාගේ, බද්ධවෛරයාගේ, මක්ඛයාගේ, අනුන්ටදොස්කීමේ, ඊෂ්‍යාවගේ, මාත්සර්‍යයාගේ මායාවගේ, කෛරාටික භාවයාගේ දැඩි බැව්හුගේ, එකටඑකකිරීමේ, මානයාගේ, අධික මානයාගේ, මදයාගේ, ප්‍රමාදයාගේ, පිරිසිඳ දැනීම පිණිස, හාත්පසින් නැසීම පිණිස, දුරුකිරීම පිණිස, විනාශය පිණිස, නොඇලීම පිණිස, නිරුද්ධ කිරීම පිණිස, හැරදැමීම පිණිස, ක්ෂය කිරීම පිණිස, දුරලීම පිණිස මේ ධර්ම පස වැඩිය යුතුයයි" වදාළේය.

**(6 සවන පණ්ණාසකය නිමි)**

(5 පඤ්චක නිපාතය නිමි.)

---

# ඡක්ක නිපාතය.

## 1. ආහුණෙය්‍ය වර්ගය.

1. **උපෙක්ඛකාහුණෙය්‍ය සූත්‍රයඃ-** 1. මා විසින් අසන ලදී එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජෙතවනාරාමයෙහි වාසය කරණසේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන්ට ආමන්ත්‍රණය කළ සේක. ඒ භික්ෂූහු 'පින්වතුන් වහන්සැයි' භාග්‍යවතුන් වහන්සේට ප්‍රති වචන දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, කරුණු සයකින් යුක්තවූ මහණතෙම (ii) දුර සිට ගෙනා දෙය පිදීමට සුදුසු වේ. ඈතට ගෙන යන දෙය පිදීමට සුදුසු වේ. දක්ෂිණා නම් දානයට සුදුසු වේ දොහොත් මුදුන් තබා වැඳීමට සුදුසු වේ. ලොකයාගේ උතුම් පින් කෙතවේ.

3. "කිනම් කරුණු සයකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ඇසින් රූපයක් දැක (ii) සතුටු සිත් ඇත්තේත් නොවේද, නොසතුටු සිත් ඇත්තේත් නොවේද, සිහි ඇතිව, යහපත් නුවණින් යුක්තව මධ්‍යස්ථවූයේ වේද, (iii) කණින් ශබ්දයක් අසා (3 (ii) යෙදිය යුතුයි.) නාසයෙන් ගඳ සුවඳක් ආඝ්‍රාණය කොට (3 (ii) යෙදිය යුතුයි.) දිවෙන් රසයක් විඳ (3 (ii) යෙදිය යුතුයි.) ශරීරයෙන් ස්පර්ශයක් දැනී (3 (ii) යෙදිය යුතුයි.) 4. (මෙය මේ සූත්‍රයේ 2 ඡේදය මෙනි.) 5. "භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටු සිත් ඇත්තාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවට සතුටුවූහ."

(2-4 සූත්‍රවල 1 ඡේදය 1 සූත්‍රයේ 2 ඡේදය මෙනි. මේ වර්ගවල ඒ ඒ සූත්‍රයෙහි 3 ඡේද 1 ඡේද මෙන් වෙත්.)

**2. ඡලභිඤ්ඤාහුණෙය්‍ය සූත්‍රය:-** 2 'කවර සයකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම නානාප්‍රකාර ඉර්ධි කොටස් පවත්වයි (මෙහි දීඝනිකායේ 2 සූත්‍රයේ 69 ඡේදයේ 'හේ නොයෙක් ඍධිවිධි' සිට 'වසඟබව කෙරෙයි' දක්වාද එම සූත්‍රයේ 70 ඡේදයේ 'ඒ භික්ෂුව' සිට 'ශබ්දයන් අසයි' ද එම සූත්‍රයේ 72 ඡේදයේ 'අන්‍යසත්වයන්ගේ' සිට ඡේදය අවසානයටද, 74 ඡේදයේ නොයෙක් විදියේ පෙර විසීම් සිට ඡේද අවසානය දක්වාද 76 ඡේදයේ 'මිනිස් ඇස සිට ඡේදය යෙදිය යුතුයි) කෙලෙසුන් ක්ෂයවීමෙන්. කෙලෙසුන්නැති අර්හත් ඵල සමාධියටද අර්හත්ඵල ප්‍රඥාවටද, මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කරයි.

**3. ආහුණෙය්යින්ද්‍රිය සූත්‍රය:-** 2 "කිනම් කරුණු සයකින්ද යත්? අධිපති ශ්‍රද්ධාවෙන්ද, අධිපති වීර්‍ය්‍යයෙන්, අධිපති සිහියෙන්, අධිපති සමාධියෙන්, අධිපති ප්‍රඥාවෙන්, කෙලෙසුන් ක්ෂයවීමෙන් කෙලෙස් නැති අර්හත් ඵල සමාධියද, අර්හත් ඵල ප්‍රඥාවද මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට පැමිණ වාසය කරයි."

**4. ආහුණෙය්‍ය බල සූත්‍රය:-** 2. "කිනම් සයකින්ද යත්? බලවත් ශ්‍රද්ධාවෙන්, බලවත් වීර්‍ය්‍යයෙන්, බලවත් සිහියෙන්,

බලවත් සමාධියෙන්, බලවත් ප්‍රඥාවෙන් කෙලෙස් ක්ෂය කිරීමෙන් කෙලෙස් නැති අර්හත් ඵල සමාධියද, අර්හත් ඵල ප්‍රඥාවද, මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට පැමිණ වාසය කරයි.

5. **වණ්ණජානීය සූත්‍රයඃ-** 1. "මහණෙනි, රජුගේ කරුණු සයකින් යුක්තවූ යහපත් ආජානෙය අශ්වයා රජුට සුදුසුවේ, රජුගේ වස්තුව වේ, රජුගේ අවයවයකැයි යන සංඛ්‍යාවට යයි.

2. "කවර සයකින්ද යත්? මහණෙනි, මේ ලොකයෙහි රජුගේ යහපත් ආජානෙය අශ්වතෙම (ii) රූප ඉවසන්නේ වේද, ශබ්ද ඉවසන්නේවේද, ගන්ධ ඉවසන්නේවේද, රස ඉවසන්නේ වේද, ස්පර්ශ ඉවසන්නේ වේද, ලක්ෂණයෙන් යුක්ත වේද,

4. "මහණෙනි, එසේම කරුණු සයකින් යුක්තවූ මහණ තෙම (මෙහි මේ වර්ගයේ 1 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

5. "කිනම් සයකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම (මෙහි 2. (ii) යෙදිය යුතුයි.)

6. **බලාජානීය සූත්‍රයඃ-** 1. (5 වෙනි සූත්‍රයේ 1 වෙනි ඡේදය යෙදිය යුතුයි.)

2 මේ වර්ගයේ 5 වෙනි සූත්‍රයේ 2 ඡේදය ලක්ෂණයෙන් යුක්තවේ යන්නට බලයෙන් යුක්තවේ කියා වෙනස් කර සම්පූර්ණයෙන් යොදාගත යුතුයි.)

7. **ජවාජානීය සූත්‍රයඃ-** 1 (5 වෙනි සූත්‍රය ලක්ෂණයෙන් යුක්තවේ යන්න වෙනුවට වේගයෙන් යුක්තවේ කියා වෙනස්කර සම්පූර්ණයෙන් යොදාගත යුතුය.)

8. **සංඛිත්තානුත්තරිය සූත්‍රයඃ-** 1 'මහණෙනි, ශ්‍රෙෂ්ඨ ධර්ම සයක් වෙත්.

2. "කිනම් සයක්ද යත්? ශ්‍රෙෂ්ඨ දැකීම, ශ්‍රෙෂ්ඨ ඇසීම, ශ්‍රෙෂ්ඨ ලාභය, ශ්‍රෙෂ්ඨ හික්මීම, ශ්‍රෙෂ්ඨ වත් පිළිවෙත්, ශ්‍රෙෂ්ඨ සිහිය යන සයයි"

9. **අනුස්සතිට්ඨාන සූත්‍රයඃ-** "මහණෙනි, නැවත නැවත සිහිය පිහිට වියයුතු තැන් සයක් වෙති.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. "කිනම් සයක්ද යත්? බුදුන් අරමුණුකොට ඇති සිහිය, ධර්මය අරමුණුකොට ඇතිවන සිහිය, සංඝයා අරමුණු කොට ඇතිවන සිහිය. ශීලය අරමුණුකොට ඇතිවන සිහිය. පරිත්‍යාගය අරමුණුකොට ඇතිවන සිහිය. දේවතාවන් සාක්ෂිවශයෙන් තබා ඇතිවන සිහිය යනුයි."

10. **මහානාම ආගතඵල සූත්‍රයː-** 1. "එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි කිඹුල්වත් නුවර නිග්‍රොධාරාමයෙහි වාසයකරණ සේක. ඉක්බිති මහානාම ශාක්‍යතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක උන් මහානාම ශාක්‍ය තෙම භාග්‍යවතුන් වහන්සේට 'ස්වාමීනි, පැමිණ මාර්ගඵල ඇති දැනගත් ශාසනය ඇති යම් ඒ ආර්‍ය්‍ය ශ්‍රාවකයෙක් වේද, හෙතෙම කවර විසීමකින් වැඩිවශයෙන් වාසය කෙරේ දැයි ඇසුයේය.

2 "මහානාමය, පැමිණි මාර්ගඵල ඇති දැනගත් ශාසනය ඇති යම් මේ ආර්‍ය්‍ය ශ්‍රාවකයෙක් වේද හෙතෙම මෙහි පහත පෙන්වන විසීමෙන් වැඩිවශයෙන් වාසය කරයි.

"මහානාමය, මේ ශාසනයෙහි ආර්‍ය්‍යශ්‍රාවක තෙම (ii) ඒ භාග්‍යවතුන් වහන්සේ යම් කාරණයෙන්ද අර්හත්‍ය, සම්‍යක් සම්බුද්ධය, විද්‍යාචරණයන්ගෙන් යුක්තය, සුගතය, ලෝකය දත්තේය. පුරුෂයන් දමනය කරන ශ්‍රෙෂ්ඨ උත්තමයාය, දෙව්මිනිසුන්ගේ ශාස්තෘවරයාය, බුද්ධය භාග්‍ය ඇත්තේයයි (iii) තථාගතයන් වහන්සේ සිහිකරයි.

3 "මහානාමය, යම් කාලයක ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම තථාගතයන් වහන්සේ සිහිකරයිද, ඒ කාලයෙහි ඔහුගේ සිත රාගයෙන් මැඩපැවැත්වූයේ නොවේ. ද්වෙෂයෙන් මැඩපැවැත්වූයේ නොවේ. මෝහයෙන් මැඩපැවැත්වූයේ නොවේ. ඒ කාලයේ ඔහුගේ සිත ඇදනැති බවට ගියේවේ. මහානාමය තථාගතයන් වහන්සේ අරභයා ඇද නැති බවට ගිය සිත් ඇති ආර්‍ය්‍යශ්‍රාවකතෙම ප්‍රතිපදාවන්ගෙන් සතුට ලබයි. නව ලොකොත්තර ධර්මයෙන් සතුට ලබයි. ධර්මය හා මිශ්‍රවූ

ප්‍රමෝදය ලබයි, ප්‍රමෝද වූවහුට ප්‍රීතිය උපදියි. ප්‍රීති සිත් ඇත්තහුගේ ශරීරය බර ඇරෙයි. බර ඇරුනු ශරීරය ඇත්තා සැපක් විඳී, සැප ඇත්තාගේ සිත එකග වෙයි. මහානාමය, ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම විෂමවූ සත්වයන් අතර සමව පවතිමින් වාසය කරයි. ක්‍රොධ සහිත සත්වයන් අතර ක්‍රොධනැතිව වාසයකරයි. ධර්ම නැමැති සැඩපහරට බැස්සේ බුදුන් අරමුණුකොට ඇති සිහිය වඩයි.

4 "මහානාමය, නැවතද ආර්‍ය්‍යශ්‍රාවක තෙම (ii) භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාකොට වදාරණ ලදී. ඇස් ඉදිරිපිට දැක්කහැකි ගුණ ඇත්තේය, කල් නොයවා දෙන විපාක ඇත්තේය. එව බලවයි කීමට සුදුසුය. තමා වෙත පමුණුවා ගතයුතු ගුණ ඇත්තේය. නුවණැත්තන් තමා විසින්ම දතයුත්තේයයි ධර්මය සිහි කරයි.

5 "මහානාමය, යම් කලෙක්හි ආර්‍ය්‍යශ්‍රාවක තෙම ධර්මය සිහිකරයිද ඒ කාලයෙහි ඔහුගේ සිත රාගයෙන් (මේ සූත්‍රයෙහි 3 ඡෙදය 'තථාගතයන් වහන්සේ' යන්න වෙනුවට ධර්මය කියාද, 'බුදුන් අරමුණුකොට ඇති' යන්න වෙනුවට 'ධර්මය අරමුණු කොට ඇති' කියාද වෙනස් කර යොදා ගත යුතුයි.)

6 "මහානාමය, නැවතද ආර්‍ය්‍යශ්‍රාවක තෙම (ii) භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා යහපත්ව පිළිපන්නේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා ඇද නැතිව පිළිපන්නේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගයට පිළිපන්නේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා සතුටු සාමීචි කථාවට පිළිපන්නේය යම් මේ පුරුෂ යුග සතරක් වෙත්ද, පුද්ගලයින් අටදෙනෙක් වෙත්ද මේ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා (iii) දුරසිට ගෙනා දෙය පිළිගැනීමට සුදුසුය. ඈතට ගෙන යායුතු දේ පිළිගැනීමට සුදුසුය. දන්දීමට සුදුසුය. දොහොත් මුදුන්දී වැඳීමට සුදුසුය, ලෝකයාගේ ශ්‍රෙෂ්ඨ පින් කෙතයයි (iv) සංඝයා සිහි කරයි. (මේ සූත්‍රයේ 3 ඡෙදය 'තථාගතයන්වහන්සේ වෙනුවට සංඝයා කියාද, 'බුදුන් අරමුණුකොට' වෙනුවට 'සංඝයා අරමුණුකොට' කියාද වෙනස් කර යොදා ගත යුතුයි.)

7 "මහානාමය, නැවතද ආර්‍ය්‍යශ්‍රාවක තෙම තමාගේ නොකැඩුනු සිදුරුනොවූ පුල්ලිනොගැසුනු කිලිටි නොවූ නිදහස් නුවණැත්තන් විසින් ප්‍රශංසා කළ තණ්හා මාන දෘෂ්ටිවලට අසුනොවූ සමාධිය පිණිස පවත්නා සීලයත් සිහිකරයිද (මෙහි 3 ඡෙදය 'තථාගතයන් වහන්සේ' යන්නට ශීලය කියාද 'බුදුන් අරමුණ' වෙනුවට 'සීලය අරමුනු' කියාද වෙනස් කර යොදා ගත යුතුයි)

8 "මහානාමය, නැවත ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම මට ඒකාන්තයෙන් ලාභයක. මා විසින් ඒකාන්තයෙන් මනාකොට ලබන ලදී. යම්බඳුවූ මම මසුරු මලින් මැඩගත් සත්වයන් අතරෙහි පහවූ කිළුටෙන් හා මසුරු කමෙන් යුත් සිතින් ගිහිගෙයි වසමි. ත්‍යාගය පිණිස මුදන ලද්දේ සෝදන ලද අත්ල ඇත්තේ, නිවනෙහි ඇළුනේ, ඉල්ලීමට සුදුසුවූයේ බෙදාදීමෙහි ඇළුනේයයි තමාගේ ත්‍යාග ගුණය සිහිකරයි. (මෙහි මේ සූත්‍රයේ 3 ඡෙදය තථාගතයන් වහන්සේ' යන්න වෙනුවට 'ත්‍යාග' කියාද 'බුදුන් අරමුණුකොට' වෙනුවට 'ත්‍යාගය අරමුණු' කියාද වෙනස්කරයොදා ගත යුතුයි)

9 "මහානාමය, නවතද ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම 'චාතුර් මහාරාජිකවූ දෙවියෝ ඇත්තාහ. තව්තිසා වැසි දෙවියෝ ඇත්තාහ යාම දෙවියෝ ඇත්තාහ තුෂිත දෙවියෝ ඇත්තාහ. නිර්මාන රතී දෙවියෝ ඇත්තාහ. පරනිර්මිත වසවර්ති දෙවියෝ ඇත්තාහ. බ්‍රහ්ම කාය ඇති දෙවියෝ ඇත්තාහ. ඊටත් උසස් දෙවියෝ ඇත්තාහ. යම්බඳු ශ්‍රද්ධාවකින් යුක්තවූ ඒ දෙවියෝ මෙයින් චුතවූවාහු එහි උපන්නාහුද මමද එබඳු ශ්‍රද්ධාවක් විද්‍යමානවේ. මෙබඳු ශීලයකින් යුක්තවූ ඒ දෙවියෝ මින් චුතවූවාහු එහි උපන්නාහුද, මටද එබඳු සීලයක් ඇත්තේය, යම්බඳු ඇසීමකින් යුක්තවූ ඒ දෙවියෝ මින් චුත වූවාහු එහි උපන්නාහුද, මටද එබඳු ඇසීමක් ඇත්තේය. යම්බඳු ත්‍යාගයකින් යුක්තවූ ඒ දෙවියෝ මින් චුතවූවාහුද මටද එබඳු ත්‍යාගයක් ඇත්තේය යම්බඳු ප්‍රඥාවකින් යුත් ඒ දෙවියෝ මින් චුතවූවාහු එහි උපන්නාහුද මටද එබඳු ප්‍රඥාවක් ඇත. මහානාමය, යම් කාලයෙක්හි ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම තමාගේද ඒ දෙවියන්ගේද, ශ්‍රද්ධාවද, සීලයද

ඇසීමද, ත්‍යාගයද ප්‍රඥාවද සිහිකරයිද, (මෙහි මේ සූත්‍රයෙහි 3 ඡෙදයේ තථාගතයන් වහන්සේ අරහයා' යන්නට 'දේවතාවන් අරහයා' කියාද 'බුදුන් අරමුණු කොට' යන්න වෙනුවට 'දේවතාවන් අරමුණු කොට' කියාද යෙදිය යුතුයි.)

10 "මහානාමය, පැමිණි මාර්ගඵල ඇති දැනගත් බුද්ධ ශාසනය ඇති යම් ඒ ආර්‍ය්‍ය ශ්‍රාවකයෙක් වේද හෙතෙම මේ විහරණයෙන් වැඩි වශයෙන් වාසය කරයි" යයි වදාළසේක.

(පළමුවැනි ආහුණෙය්‍ය වර්ගය නිමි.)

---

## 2. සාරාණීය වර්ගය

11. **සාරාණීයධම්ම සූත්‍රය:-** 1. "මහණෙනි, මේ සිහි කටයුතු ධර්ම සයක් වෙත්.

2. "ඒ සය කවරහුද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුවට බ්‍රහ්මචාරීන් කෙරෙහි ප්‍රකටවද අප්‍රකටවද මෛත්‍රී සහගත කාය කර්මය එළඹ සිටියේවේද, මෙයද සිහිකටයුතු ධර්මයකි. මහණෙනි, නැවතද භික්ෂුවට සබ්‍රහ්මචාරීන් කෙරෙහි ප්‍රකටවද, අප්‍රකටවද මෛත්‍රී සහගත වාක් කර්මය එළඹ සිටියේවේද, මෙයද සිහිකටයුතු ධර්මයකි. මහණෙනි, නැවතද භික්ෂුවට සබ්‍රහ්මචාරීන් කෙරෙහි ප්‍රකටවද අප්‍රකටවද, මෛත්‍රී සහගත මනස් කර්මය එළඹ සිටියේ වේද මෙයද සිහි කටයුතු ධර්මයකි. මහණෙනි, නැවතද, මහණතෙම යම් ඒ ධාර්මිකවූ දැහැමින් ලැබුනාවූ යටත් පිරිසෙයින් පාත්‍රයට ලැබුනාවූ ලාභයෝ පවා වෙද්ද, එබඳු ලාභයන් ශීලවන්තවූ සබ්‍රහ්මචාරීන් හා සමානව බෙදා පරිභොග කරන්නේවේද, මෙයද සිහිකටයුතු ධර්මයකි. මහණෙනි, නැවතද මහණතෙම යම් ඒ නොකැඩුනාවූ නොසිදුරුවූ කබර නොවූ කැළැල්නොවූ උසස්වූ නුවණැත්තන් විසින් පසස්නාලද තෘෂ්ණාදෘෂ්ටීන් හා පරාමර්ශනොවූ සමාධිය ඇතිකරවන්නාවූ ශීලයෝ වෙද්ද, එබඳු ශීලයන්ගෙන් බ්‍රහ්මචාරීන් කෙරෙහි ප්‍රකටවද අප්‍රකටවද සමාන සිල් ඇතිබවට පැමිණියේ වාසය කෙරේද, මෙයද සිහිකටයුතු ධර්මයකි. මහණෙනි, නැවතද

මහණතෙම යම්බඳු දෘෂ්ටියක් එය කරන්නහුගේ මනාකොට දුක් දුරුකිරීම පිණිස පවතීද නෛර්‍යාණිකවූ, ආර්‍යවූ එබඳුවූ ශීලයන්ගෙන් බ්‍රහ්මචාරීන් හා ප්‍රකටවද, අප්‍රකටවද, දෘෂ්ටියෙන් සමාන බවට පැමිණ වාසය කෙරේද, මෙයද සිහිකටයුතු ධර්මයකි.”

**12. පියකරණ ධම්ම සූත්‍රයː-** 1. “මහණෙනි, මේ ප්‍රිය කරන්නාවූ ගරු කරන්නාවූ සිහි කටයුතු ධර්ම සයක් සංග්‍රහ පිණිස අවිවාද පිණිස සමගිය පිණිස එක්වීම පිණිස පවතිත්. 2. “ඒ සය කවරහුද? ‘මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුවට ප්‍රකටවද අප්‍රකටවද සබ්‍රහ්මචාරීන් කෙරෙහි මෛත්‍රී සහගත කාය කර්මය එළඹ සිටියේ වේද, (ii) මෙයද ප්‍රිය කරන්නාවූ ගරු කරන්නාවූ සිහි කටයුතු ධර්මයකි. මෙයද සංග්‍රහ පිණිස අවිවාදය පිණිස, සමගිය පිණිස, එක්වීම පිණිස පවතිත්.

3 “මහණෙනි, නැවතද භික්ෂුවට සබ්‍රහ්මචාරීන් කෙරෙහි ප්‍රකටවද අප්‍රකටවද මෛත්‍රී සහගත වාක් කර්මය එළඹ සිටියේවේද, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

4 “මහණෙනි, නැවත භික්ෂුවට සබ්‍රහ්මචාරීන් කෙරෙහි ප්‍රකටවද අප්‍රකටවද මෛත්‍රී සහගත මනස් කර්මය එළඹ සිටියේ වේද, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

5. “මහණෙනි, නැවතද මහණතෙම යම් ඒ ධාර්මිකවූ දැහැමින් ලැබුනාවූ යටත් පිරිසෙයින් පාත්‍රයට ලැබුනාවූ පවා ලාභයෝ වෙද්ද, එබඳුවූ ලාභයන් ශීලවන්තවූ සබ්‍රහ්මචාරීන් හා සමානව බෙදා පරිභොග කරන්නේ වේද, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

6. “මහණෙනි, නැවතද මහණතෙම යම් ඒ නොකැඩුනාවූ නොසිදුරුවූ කබර නොවූ කැළැල් නොවූ උසස්වූ නුවණැත්තන් විසින් පසස්නා ලද තෘෂ්ණා දෘෂ්ටීන් හා පරාමර්ශ නොවූ සමාධිය ඇති කරවන්නාවූ ශීලයෝ වෙද්ද, එබඳු ශීලයන්ගෙන් සබ්‍රහ්මචාරීන් කෙරෙහි ප්‍රකටවද අප්‍රකටවද සමාන සිල් ඇති බවට පැමිණ වාසය කෙරේද, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

7. "මහණෙනි, නැවතද මහණතෙම යම්බඳු දෘෂ්ටියක් එය කරන්නහුගේ මනාකොට දුක් දුරු කිරීම පිණිස පවතීද නෛර්‍යාණිකවූ ආර්‍යවූ එබඳු ශීලයන්ගෙන් සබ්‍රහ්මචාරීන් හා ප්‍රකටවද අප්‍රකටවද දෘෂ්ටියෙන් සමාන බවට පැමිණ වාසය කෙරේද, (මෙහි (ii) යෙදිය යුතුයි.)

**13. නිස්සාරණීය ධාතු සූත්‍රය**:- 1. "මහණෙනි, ඉවත් කළයුතු අදහස් හෙවත් කරුණු සයක් වෙති.

2. "ඒ සය කවරහුද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම මෙසේ කියන්නේය. 'මවිසින් මෛත්‍රී චෙතො විමුක්තිය වනාහි (ii) භාවිත කරණ ලද්දේ බහුල වශයෙන් කරණ ලද්දේ, ඉතා පුහුණු කරණ ලද්දේ, අධිතාලමක් මෙන් මනාසේ පුහුණු කරණලද්දේ නොනැගිට පුහුණු කරණලද්දේ පුරුදු කරණ ලද්දේ බලවත් සේ ආරම්භ කරණ ලද්දේ වෙයි. (iii) එසේ නමුදු මාගේ ව්‍යාපාදය සිත පැතිර සිටියි' යනුවෙනි. එය එසේ නොකිය යුතුයයි කියයුතු වන්නේය. (iv) 'ආයුෂ්මතුනි, එසේ නොකියන්න. භාග්‍යවතුන් වහන්සේට අභූතයෙන් දොස් නොකියන්න. භාග්‍යවතුන් වහන්සේට අභූතයෙන් දොස් කීම යුතු නොවේ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ නොකියන්නේය ඇවැත්නි, මෙය දොස් කීමට අයොග්‍ය තැනකි. අනවකාශ තැනකි. (v) යමෙකු මෛත්‍රී චෙතො විමුක්තිය (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) එසේ නමුදු ඔහුගේ ව්‍යාපාදය සිත පැතිර පවතීය යන කාරණය විද්‍යමාන නොවේ. යම් ඒ මෛත්‍රී චෙතො විමුක්තියක් ඇද්ද ඇවැත්නි, එය ව්‍යාපාදය බැහැර කරණ තැනකි.

3. "මේ ශාසනයෙහි මහණතෙම මෙසේ කියන්නේය. 'මා විසින් කරුණා චෙතො විමුක්තිය වනාහි (මෙහි (ii) යෙදිය යුතුයි.) එසේ නමුදු මාගේ හිංසාව සිත පැතිර සිටියි. එය එසේ නොකිය යුතුයයි කියයුතු වන්නේය. (මෙහි 2. (iv) යෙදිය යුතුයි.) යමෙකු කරුණා චෙතො විමුක්තිය (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) එසේ නමුදු ඔහුගේ විහිංසාව සිත පැතිර පවතීය යන කාරණය විද්‍යමාන නොවේ. යම් ඒ චෙතො විමුක්තියක් ඇද්ද එය විහිංසාව බැහැර කරණ තැනකි.

4. "මේ ශාසනයෙහි මහණතෙම මෙසේ කියන්නේය. මා විසින් මුදිතා චෙතො විමුක්තිය (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) එසේ නමුදු මාගේ කුශල ධර්මයන්හි) නොඇල්ම සිත පැතිර සිටියි. එය එසේ නොකිය යුතුයයි කියයුතු වන්නේය (මෙහි 2 (iv) යෙදිය යුතුයි.) යමෙකු මුදිතා චෙතො විමුක්තිය (මෙහි 2 (ii) යෙදිය යුතුයි. එසේ නමුදු ඔහුගේ කුශල ධර්මයන්හි නොඇල්ම සිත පැතිර පවතීය යන කාරණය විද්‍යමාන නොවේ. යම් ඒ මුදිතා චෙතො විමුක්තියක් ඇද්ද එය අරතිය බැහැර කරණ තැනකි.

5. "මේ ශාසනයෙහි මහණතෙම මෙසේ කියන්නේය. මවිසින් උපෙක්ෂා චෙතො විමුක්තිය (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) එසේ නමුදු මාගේ රාගය සිත පැතිර පවතියි. එය එසේ නොකිය යුතුයයි කියයුතු වන්නේය. (මෙහි 2 (iv) යෙදිය යුතුයි.) යමෙකු උපෙක්ෂා චෙතො විමුක්තිය භාවිත (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) එසේ නමුදු ඔහුගේ රාගය සිත පැතිර පවතීය යන කාරණය විද්‍යමාන නොවේ යම් ඒ උපෙක්ෂා චෙතො විමුක්තියක් ඇද්ද එය රාගය බැහැර කරණ තැනකි.

6. "මේ ශාසනයෙහි මහණතෙම මෙසේ කියන්නේය. 'මවිසින් අනිමිත්ත චෙතො විමුක්තිය (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) එසේ නමුදු මාගේ නිමිත්ත අනුව ඇතිවන විඥ්ඥානය වේය' යනුවෙනි. එය එසේ නොකිය යුතුයයි කියයුතු වන්නේය. (මෙහි 2 (iv) යෙදිය යුතුයි) යමෙකු අනිමිත්ත චෙතො විමුක්තිය භාවිත (මෙහි 2 (ii) යෙදිය යුතුයි) එසේ නමුදු ඔහුගේ නිමිත්ත අනුව ඇතිවන විඥ්ඥානය වේය යන කාරණය විද්‍යමාන නොවේ. යම් ඒ අනිමිත්ත චෙතො විමුක්තියක් ඇද්ද එය නිමිත්ත අනුව ඇතිවන විඥ්ඥානය බැහැර කරණ තැනකි.

7 "මේ ශාසනයෙහි මහණතෙම මෙසේ කියන්නේය. 'මාගේ වෙමියි යන අදහස දුරුවිය. මෙය මම වෙමියි යන අදහසද නොදකින්නෙමි. එසේ නමුදු මාගේ විචිකිච්ඡා සැකය නමැති හුල සිත පැතිර පවතියි. එය එසේ නොකිය යුතුයයි කියයුතු වන්නේය. ආයුෂ්මතුනි, එසේ නොකියන්න. භාග්‍යවතුන්

වහන්සේට අභූතයෙන් දොස් නොකියන්න. භාග්‍යවතුන් වහන්සේට අභූතයෙන් දොස් කීම යුතු නොවේ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ නොකියන්නේය. ඇවැත්නි, මෙය දොස් කීමට අයොග්‍ය තැනකි, අනවකාශ තැනකි. යමෙකු කෙරෙහි වෙමියි යන අදහස පහව ගිය කල්හි 'මෙය මම වෙමියි' යන අදහස නොදක්නේය. එසේ හෙයින් විචිකිච්ඡා සැකය නමැති හුල සිත පැතිර පවතියි යන කාරණය විද්‍යමාන නොවේ. යම් ඒ මමය යන මාන්තය දුරුවීම විචිකිච්ඡා සැකය නමැති හුල දුරුවීමේ හේතුවකි

8. (මෙය 1 ඡේදය මෙනි)

14. **භද්දකමරණ සූත්‍රයː-** 1. "එකල්හි වනාහි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ 'ආයුෂ්මත් භික්ෂුවරුනියි' භික්ෂූන්ට ඇමතූහ. 'ආයුෂ්මත්නි'යි ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට ප්‍රතිවචන දුන්හ. ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙය ප්‍රකාශ කළහ.

2. "ඇවැත්නි, ඒ ඒ පරිදි භික්ෂුතෙම වාසය කෙරේද යම් යම් පරිදි වාසය කරන්නාවූ ඔහුට යහපත් මරණයක් නොවේ. කාලක්‍රියාව යහපත් නොවේ.

3. "මහණෙනි, භික්ෂූතෙම ඒ ඒ පරිදි වාසය කෙරේද යම් යම් පරිදි වාසය කරන්නාවූ ඔහුට යහපත් මරණයක් කෙසේ නම් නොවේද? කාලක්‍රියාව යහපත් නොවේද,"

"මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව වැඩෙහි නියුක්ත වූයේ වේද, වැඩෙහි ඇළුනේවේද, වැඩෙහි නියුක්ත බව අනුව යෙදුනේවේද, කථාකිරීමෙහි නියුක්තවූයේවේද, කථාකිරීමෙහි ඇළුනේ කථාකිරීමේ නියුක්තබව අනුව යෙදුනේවේද නිදීමෙහි නියුක්තවූයේවේද, නිදීමෙහි ඇළුනේ වේද, නිදීමෙහි ඇළුනුබව අනුව යෙදුනේවේද, සමූහය මැද හිඳිමෙහි නියුක්තවූයේවේද, සමූහය මැද හිඳිමෙහි ඇළුනේ වේද, සමූහය මැද හිඳීමෙහි ඇළුනබව අනුව යෙදුනේවේද, එක්වීමෙහි යෙදුනේවේද, එක්වීමෙහි ඇළුනේවේද, එක්වීමෙහි ඇළුනබව අනුව

යෙදුනේවේද, ප්‍රමාදයෙහි නියුක්ත වූයේවේද, ප්‍රමාදයෙහි ඇළුනේවේද, ප්‍රමාදයෙහි නියුක්තබව අනුව යෙදුනේවේද,

4. (මෙය 2 ඡෙදය මෙනි.)

5. "ඇවැත්නි, මේ භික්ෂුව ආත්මදෘෂ්ටියෙහි යෙදුනේ වෙයි. ආත්මදෘෂ්ටියෙන් මනාකොට දුක් කෙළවර කිරීම නොහැකිවේ.

6. "ඇවැත්නි, ඒ ඒ පරිදි භික්ෂුව වාසය කෙරේද, යම් යම් පරිදි වාසය කරන්නාවූ ඔහුට යහපත් මරණයක් වෙයි. කාලක්‍රියාව යහපත්වෙයි.

7. "ඇවැත්නි, භික්ෂුව ඒ ඒ පරිදි වාසය කෙරේද, යම් යම් පරිදි වාසය කරන්නාවූ ඔහුට කෙසේ නම් යහපත් මරණයක්වේද, කාලක්‍රියාව යහපත්වේද?

8. "ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුතෙම වැඩෙහි නියුක්ත නුවූයේවේද, වැඩෙහි නොඇළුනේවේද, වැඩෙහි නියුක්තබව අනුව නොයෙදුනේවේද, කථාකිරීමෙහි නියුක්ත නුවූයේවේද, කථාකිරීමෙහි නොඇළුනේවේද, කථා කිරීමෙහි නියුක්තබව අනුව නොයෙදුනේවේද, නිදීමෙහි නියුක්ත නොවූයේවේද නිදීමෙහි නොඇළුනේවේද, නිදීමෙහි නියුක්තබව අනුව නොයෙදුනේවේද, සමූහයා මැද සිටීමේ නොයෙදුනේවේද, සමූහයා මැද සිටීමේ නො ඇළුනේවේද, සමූහයා මැද සිටීමේ නියුක්තබව අනුව නොයෙදුනේවේද, ප්‍රමාදයෙහි නියුක්ත නොවූයේවේද, ප්‍රමාදයෙහි නොඇළුනේ වේද, ප්‍රමාදයෙහි නියුක්තබව අනුව නොයෙදුනේවේද,

9. (මෙහි 6 ඡෙදය යෙදිය යුතුයි.) මහණෙනි, මේ භික්ෂුව නිර්වාණයෙහි ඇළුනේ ආත්ම දෘෂ්ටිය දුරුකළේය. මනාකොට දුක් කෙළවර කිරීමෙහි යෙදුනේය.

10. 1. "යමෙක් තෙම ප්‍රමාදයෙහි යෙදුනේද, මෘගයෙකුසේ කෙලෙස් පමාබැව්හි ඇලුනේද, හෙතෙම කාමාදීබැම්වලින් නිදහස ලත් එයට වඩා ශ්‍රෙෂ්ඨතැනක් නැති නිර්වාණය වරද්දා ගන්නේවේ."

2. "යමෙක්තෙම ප්‍රමාදය අත්හැර නිර්වාණයෙහි ඇලුනේද, හෙතෙම කාමාදී බැම්වලින් නිදහස ලත් එයට වඩා ශ්‍රෙෂ්ඨ තැනක් නැති නිවණ සොයා ගන්නේය"

**15. අනුතප්පකාලකිරියා සූත්‍රයඃ-** 1. (මෙය මේ වර්ගයේ 14 වෙනි සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2 "ඇවැත්නි, භික්ෂුව ඒ ඒ පරිදි වාසය කෙරේද යම් යම් පරිදි වාසය කරන්නාවූ ඔහුගේ කාලක්‍රියාව පසුතැවිල්ලට හේතුවේ.

3-10 (මේ ඡෙද යොදාගැනීමට මේ වර්ගයේ 14 සූත්‍රයේ 3-10 ඡෙදවලට 'කාලක්‍රියාව යහපත් නොවේ' වෙනුවට 'කාල ක්‍රියාව පසුතැවිල්ලට හේතුවේ' කියාද කාලක්‍රියාව යහපත්වේ' වෙනුවට 'කාලක්‍රියාව පසුතැවිල්ලට හේතුනොවේ' කියාද යෙදිය යුතුයි.)

**16 සාපෙඛන කුලපිතු සූත්‍රයඃ-** 1 "එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ භගුරට සුංසුමාර පර්වතය අසල මෘගදාය නම්වූ භෙසකලා වනයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි නකුල පිතා ගෘහපති තෙමේ හටගත් ආබාධ ඇත්තේ දුක්වූයේ දැඩිසේ ගිලන්වූයේ වෙයි. ඉක්බිති නකුල මාතා ගෘහපතිනිය නකුල පිතා ගෘහපතියාට මෙසේ කීවාය.

2 "ගෘහපතිය, ඔබ (ලෞකික) බලාපොරොත්තු ඇතිව කාලක්‍රියා නොකරන්න. (ii) ගෘහපතිය, බලාපොරොත්තු ඇතිව කාලක්‍රියා කිරීම දුක්ය. බලාපොරොත්තු ඇතිව කාල ක්‍රියා කිරීම භාග්‍යවතුන් වහන්සේ විසින් නින්දා කරණ ලදී. (iii) ගෘහපතිය, ඔබට මෙබඳු අදහසක් වන්නේය. 'මාගේ ඇවෑමෙන් නකුල මාතා ගෘහපතිනිය දරුවන් පෝෂණය කරන්නට ගෘහවාසයේ යෙදෙන්නට නොහැකි වන්නේය' යනුවෙනි. ගෘහපතිය, ඒ කරුණ ගැන එසේ නොසිතිය යුතුය. ගෘහපතිය, මම කපු කටින්නටද ගෙතු හිසකේ අවුල් හරින්නටද දක්ෂවෙමි. ගෘහපතිය, ඔබගේ ඇවෑමෙන් දරුවන් පොෂණය කිරීමට ගෘහවාසයේ යෙදෙන්නට හැකිවන්නෙමි. ගෘහපතිය, එබැවින් ඔබ බලාපොරොත්තු ඇතිව කාලක්‍රියා නොකරන්න. (මෙහි 2

(ii) යෙදිය යුතුයි.) ගෘහපතිය, ඔබට මෙබඳු අදහසක් වන්නේය. 'මාගේ ඇවෑමෙන් නකුල මාතෘ ගෘහපතිනිය අනික් පුරුෂයකු පාවාගන්නේය යනුවෙනි' ගෘහපතිය, එසේ නොසිතිය යුතුය. යම්කලෙක ඔබ දහසය වසක් ගෘහස්ථ බ්‍රහ්මචර්‍ය්‍යාව සමාදන් වන ලදී. එය ඔබද මමද දන්නෙමු. එබැවින් ගෘහපතිය ඔබ බලාපොරොත්තු ඇතිව කාලක්‍රියා නොකරන්න (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) ගෘහපතිය, ඔබට මෙබඳු අදහසක් වන්නේය. 'මාගේ ඇවෑමෙන් නකුල මාතා ගෘහපතිනියට භාග්‍යවතුන් වහන්සේද භික්ෂු සංඝයාද දැකීමට නොලැබෙන්නේය' යනුයි. ගෘහපතිය එසේ නොසිතිය යුතුයි. ඔබ ඇවෑමෙන් මම භාග්‍යවතුන් වහන්සේ අතිශයින් දකිනු කැමැත්තියක් වන්නෙමි. භික්ෂු සංඝයා අතිශයින් දකිනු කැමැත්තියක් වන්නෙමි. එබැවින් ගෘහපතිය ඔබ බලාපොරොත්තු ඇතිව කාලක්‍රියා නොකරන්න. (මෙහි 2 (ii) යෙදිය යුතුයි) ගෘහපතිය, ඔබට මෙබඳු අදහසක් වන්නේය 'මාගේ ඇවෑමෙන් නකුල මාතෘ ගෘහපතිනිය, සිල් පුරන්නියක් නොවන්නීය' යනුවෙනි. ගෘහපතිය මෙසේ නොසිතිය යුතුය ගෘහපතිය ඒ භාග්‍යවතුන් වහන්සේගේ ගිහිවූ සුදු වස්ත්‍ර හඳින්නාවූ සිල් පුරන්නාවූ ශ්‍රාවිකාවෝ යම්තාක් ඇද්ද මමද ඒ තැනැත්තියන්ගෙන් එක්තරා ශ්‍රාවිකාවක් වන්නෙමි. (iv) යමක වනාහි සැකයක් හෝ විමතියක් හෝ වන්නේ නම් ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ භගුරට සුංසුමාර පර්වතය ආසන්නයේ මෘගදාය නම් භෙසකලා වනයෙහි වැඩවසන සේක. එය භාග්‍යවතුන් වහන්සේගෙන් විචාරාවා!

(v) එබැවින් ගෘහපතිය ඔබ බලාපොරොත්තු ඇතිව කාලක්‍රියා නොකරන්න. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) ගෘහපතිය ඔබට මෙබඳු අදහසක් වන්නේය. 'නකුල මාතෘ ගෘහපතිනිය අධ්‍යාත්මික චිත්ත සමථය ලබන්නියක් නොවන්නීය' යනුවෙනි. ගෘහපතිය, මෙසේ නොසිතිය යුතුය. ගෘහපතිය ඒ භාග්‍යවතුන් වහන්සේගේ යම්තාක් ගිහිවූ සුදු වස්ත්‍ර හඳින්නාවූ අධ්‍යාත්මික චිත්ත සමථය ලැබුවාවූ ශ්‍රාවිකාවෝ වෙද්ද, මමද ඒ තැනැත්තියන්ගෙන් එක්තරා ශ්‍රාවිකාවක් වන්නෙමි. (මෙහි 2

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

(iv) යෙදිය යුතුයි.) එබැවින් ගෘහපතිය, ඔබ බලාපොරොත්තු ඇතිව කාලක්‍රියා නොකරන්න. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) එබැවින් ගෘහපතිය ඔබ බලාපොරොත්තු ඇතිව කාලක්‍රියා නොකරන්න. ගෘහපතිය ඔබට මෙබඳු අදහසක් වන්නේය. 'නකුල මාතා ගෘහපතිනිය මේ ධර්ම විනයයයි නම් ලත් ශාසනයෙහි බැසගත්තී සැනසීම් ඇත්තී තරණය කළ විචිකිච්ඡාව ඇත්තී වෙන්වූ සැක ඇත්තී විශාරදත්වය ඇත්තී ශාස්තෘ ශාසනයෙහි උසස් ගුණ විශෙෂයන් ලැබීම ඇත්තී වාසය නොකරන්නීය' යනුවෙනි. ගෘහපතිය එසේ නොසිතිය යුතුයි ගෘහපතිය යම්තාක් ඒ භාග්‍යවතුන්වහන්සේගේ ශාසනයෙහි බැසගත්තාවූ වෙන්වූ සැනසීම් ඇත්තාවූ තරණය කළ විචිකිච්ඡාව ඇත්තාවූ සැක ඇත්තාවූ විශාරදත්වය ඇත්තාවූ ශාස්තෘ ශාසනයෙහි උසස් ගුණ විශෙෂයන් ලැබීම ඇත්තාවූ යම්තාක් ගිහිවූ සුදු වස්ත්‍ර හඳින්නාවූ ශාසනයෙහි වාසය කරන්නාවූ ශ්‍රාවිකාවෝ වෙත්නම් මමද ඒ තැනැත්තියන් ගෙන් එක්තරා ශ්‍රාවිකාවක් වන්නෙමි. (මෙහි 2 (iv) යෙදිය යුතුයි) එබැවින් ගෘහපතිය, ඔබ බලාපොරොත්තු ඇතිව කාලක්‍රියා නොකරන්න. (මෙහි 2 (ii) යෙදිය යුතුයි)

3 "ඉක්බිත්තෙන් නකුල මාතෘ ගෘහපතිනිය විසින් මේ අවවාදයෙන් අවවාද කළ නකුල මාතෘ ගෘහපතියාගේ ඒ ආබාධය එතෙකින් සංසිඳුනේය. නකුල පිතෘ ගෘහපති තෙමේ ඒ ආබාධයෙන් නැගිට්ටේය. නකුල පිතෘ ගෘහපතියාගේ ඒ ආබාධය එසේ සංසිඳුනේය. ඉක්බිත්තෙන් නකුල පිතෘ ගෘහපති තෙමේ ආබාධයෙන් නැගිට ටික කලකින් ගිලන් බව නිසා සැරයටියක් ආධාරකොට භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතනට පැමිණියේය. එසේ පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය.

4 එකත්පසෙක හුන්නාවූ නකුල පිතෘ ගෘහපතියාට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. (ii) ගෘහපතිය ඔබට ලාභයක් විය. ඔබ යහපත් ලැබීමක් ලබන ලදී. තොපගේ යම්බඳු නකුල මාතෘ ගෘහපතිනියක් ඇද්ද, ඇය අනුකම්පා ඇත්තීය. වැඩ කැමැත්තීය, අවවාද දෙන්නීය, අනුශාසනා කරන්නීය, (iii)

ගෘහපතිය, යම්බඳු මාගේ ගිහිවූ සුදු වස්ත්‍ර හඳින්නාවූ අභ්‍යන්තර චිත්ත සමථය ඇත්තාවූ ශ්‍රාවිකාවෝ වෙද්ද, ඔවුනතුරෙන් ඇය එක්තරා ශ්‍රාවිකාවකි. ගෘහපතිය, ගිහිවූ සුදු වස්ත්‍ර හඳින්නාවූ මේ ශාසනයෙහි බැසගත්තාවූ සැනසීම් ඇත්තාවූ තරණය කළ විචිකිච්ඡාව ඇත්තාවූ වෙන්වූ සැක ඇත්තාවූ විශාරදත්වය ඇත්තාවූ උසස් ගුණ විශෙෂයන් ඇත්තාවූ යම්තාක් ශ්‍රාවිකාවෝ වෙද්ද, නකුල මාතෘ ගෘහපතිනිය ඔවුනතුරෙන් එක්තරා ශ්‍රාවිකාවකි ගෘහපතිය, (මෙහි 4 (ii) යෙදිය යුතුයි)

**17 අචිර පබ්බජිත සූත්‍රයඃ-** 1 "එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු මහ සිටුහුගේ ජේතවනාරාමයෙහි වැඩවසන සේක. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි විවේකයෙන් නැගිටි සේක් උපස්ථාන ශාලාව යම්තැනකද එතැනට පැමිණිසේක. පැමිණ පැනවූ අස්නෙහි වැඩසිටිසේක. ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේද සවස් කාලයෙහි විවේකයෙන් නැගිටි සේක් උපස්ථාන ශාලාව යම්තැනකද එතැනට පැමිණියහ. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියහ. ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් මහාකොට්ඨිත ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් මහා චුන්ද ස්ථවිරයන් වහන්සේද ආයුෂ්මත් මහා කප්පින ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේද සවස් කාලයෙහි විවේකයෙන් නැගිටියාහු, උපස්ථාන ශාලාව යම්තැනකද එතැන්හි පැමිණියහ.

2 "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ රෑ බොහෝ වේලාවක් වැඩහිඳීමෙන් කාලය ගෙවා අස්නෙන් නැගිට විහාරයට වැඩිසේක. ඒ ආයුෂ්මතුන් වහන්සේලාද භාග්‍යවතුන් වහන්සේ අස්නෙන් නැගිට ස්වල්ප වේලාවකින්ම වැඩවසන තැන් වලට වැඩියහ. එහි නවකවූ පැවිදිව වැඩි කලක් නැති මේ ශාසනයට අලුතෙන් පැමිණි යම් ඒ භික්ෂූහු වූවාහුද උන්වහන්සේලා හිරු නැගෙනතුරුම ගොරවමින් නිදාගත්හ. භාග්‍යවතුන් වහන්සේ

පිරිසුදුවූ මනුෂ්‍යත්වය ඉක්මවූ දිවැසින් හිරු නැගෙනතෙක් ගොරවමින් නිදාගන්නාවූ ඒ භික්ෂූන් දැක උපස්ථානශාලාව යම්තැනකද එතැනට පැමිණිසේක පැමිණ පැනවූ අස්නෙහි වැඩසිටිසේක. වැඩහිඳ වනාහි භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූන්ට ඇමතූසේක.

3 "මහණෙනි, ශාරිපුත්‍රයන් වහන්සේ කොහිද? මොග්ගල්ලානයන් වහන්සේ කොහිද? මහා කාශ්‍යපයන් වහන්සේ කොහිද? මහා කච්චායනයන් වහන්සේ කොහිද? මහා කොට්ඨිතයන් වහන්සේ කොහිද? මහා චුන්දයන් වහන්සේ කොහිද? මහා කප්පිනයන් වහන්සේ කොහිද? අනුරුද්ධයන් වහන්සේ කොහිද? රේවතයන් වහන්සේ කොහිද? ආනන්දයන් වහන්සේ කොහිද? මහණෙනි, ඒ ස්ථවිර ශ්‍රාවකයෝ කොහි ගියාහුද?

4 "ස්වාමීනි, ඒ ආයුෂ්මතුන් වහන්සේලාද භාග්‍යවතුන් වහන්සේ වැඩමවා ටික වේලාවකින්ම වැඩවසන තැන්වලට වැඩියහ.

"මහණෙනි, කවර හෙයකින් ස්ථවිරවූද නවකවූද යුෂ්මත්හු හිරු නැගෙන තෙක් ගොරවමින් නිදාගත්තාහුද? මහණෙනි, එය කුමකැයි සිතන්නහුද? අභිෂෙක ලත් ක්ෂත්‍රිය රජතෙම ඇතිතාක් නිදාගැන්මෙහි සුවයද ස්පර්ශ සුවයද මැලිගතියේ සුවයද අනුව යෙදෙමින් දිවි ඇතිතාක් වාසය කරන්නේ රාජ්‍යයට හෝ ජනපදයට හෝ ප්‍රියවූයේ මනාප වූයේදැයි යුෂ්මතුන් දැක තිබේද? අසා තිබේද? "ස්වාමීනි, එය දැක නැත, අසා නැත."

5 "මහණෙනි, යහපති. අභිෂෙක ලත් ක්ෂත්‍රිය රජතෙම ඇතිතෙක් නිදාගැනීමේ සුවයද ස්පර්ශ සුවයද මැලිගතියේ සුවයද අනුව යෙදෙමින් දිවි ඇතිතාක් රාජ්‍යය කරන්නේ රාජ්‍යයට හෝ ජනපදයට ප්‍රියවූයේ මනාපවූයේයයි මා විසින්ද නොදක්නා ලදී. නොඅසන ලදී. මහණෙනි, එය කුමකැයි සිතන්නහුද? පියාගේ උරුමය ඇති රටවල් අධිපතියෙක්, සේනාපතියෙක් ගම් සමූහයක අධිපතියෙක් ඇතිතාක් නිදාගැනීමේ සුවයද ස්පර්ශ සුවයද මැලිගතියේ සුවයද අනුව

යෙදෙමින් වාසය කරන්නේ දිවි ඇතිතාක් ගම් සමූහයට අධිපතිකම් කරන්නේ ගම් සමූහයට හෝ ප්‍රියවූයේ මනාප වූයේදැයි යුෂ්මතුන් විසින් දැක තිබේද, අසා තිබේද?"

"ස්වාමීනි, එය දැක නැත. අසා නැත"

6. "මහණෙනි, යහපති (ii) ගම් සමූහයකට අධිපතියෙක් ඇතිතාක් නිදාගැනීමේ සුවයද ස්පර්ශ සුවයද මැලිගතියේ සුවයද අනුව යෙදෙමින් වාසය කරන්නේ දිවි ඇතිතාක් ගම් සමූහයකට අධිපතිකම කරන්නේ ගම් සමූහයට ප්‍රියවූයේ මනාපවූයේ යයි මා විසින්ද දැක නැත, අසා නැත. මහණෙනි, එය කුමකැයි සිතන්නහුද? ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ ඇතිතාක් නිදා ගැන්මේ සුවයද ස්පර්ශ සුවයද මැලිගතියේ සුවයද අනුව යෙදුනේ ඉන්ද්‍රියයන්හි නොවැසූ දොර ඇත්තේ භෝජනයෙහි ප්‍රමාණය නොදන්නේ නිදි දුරලීමේ නොයෙදුනේ පෙර රාත්‍රියද පසු රාත්‍රියද කුශල ධර්මයන් විශෙෂයෙන් නොදක්නේ බොධිපාක්ෂික ධර්මයන් භාවනාවෙහි නොයෙදුනේ ආශ්‍රවයන්ගේ ක්ෂය වීමෙන් අනාශ්‍රවවූ චිත්ත විමුක්තියද ප්‍රඥා විමුක්තියද මෙලොවම තෙමේ මනා නුවණින් ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාසය කරන්නේ යයි (iii) යුෂ්මතුන් විසින් දැක තිබේද? අසා තිබේද?"-"ස්වාමීනි දැක නැත. අසා නැත"

7 "මහණෙනි, මා විසින්ද (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) නොදක්නා ලදී. නොඅසන ලදී.

8. "මහණෙනි, එහෙයින් මෙහිලා මෙසේ හික්මිය යුතුයි. 'ඉන්ද්‍රියයන්හි වැසූ දොර ඇත්තෝ වන්නෙමු. භෝජනයෙහි ප්‍රමණය දන්නේ නිදි දුරලීමෙහි යෙදුනේ පෙර රාත්‍රියද පසු රාත්‍රියද කුශල ධර්මයන් විශෙෂයෙන් දක්නේ බොධිපාක්ෂික ධර්මයන් භාවනාවෙහි යෙදුනේ වාසය කරන්නෙමුයි' මහණෙනි, මෙසේ වනාහි හික්මිය යුතුයි"

18. **මච්ඡබන්ධ සූත්‍රය**:- 1. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මහත්වූ භික්ෂු සංඝයා සමග කොසොල් රට චාරිකාවෙහි හැසිරෙන සේක. දුර මගට පිළිපන් භාග්‍යවතුන් වහන්සේ එක්තරා ප්‍රදෙශයක මසුන් මර මරා විකුණනු ලබන

මසුන් අල්ලන්නෙකු දැකිසේක්මය. දැක මගින් ඉවත්ව එක්තරා රුක් මුලක පැනවූ අස්නෙහි වැඩ සිටිසේක. වැඩ හිඳ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූසේක.

**2.** "මහණෙනි, අර මසුන් මර මරා විකුණනු ලබන මසුන් මරන්නා යුෂ්මත්හු දැක්කහුද?" "එසේය, ස්වාමීනි,"

**3.** "මහණෙනි, එය කුමකැයි සිතන්නහුද? (ii) මසුන් මර මරා විකුණනු ලබන මසුන් මරන්නෙක් ඒ කර්මයෙන් ඒ ජීවත්වීමෙන් (iii) ඇතුන් පිට යන්නේ හෝ අසුන් පිට යන්නේ හෝ රථයෙන් යන්නේ හෝ අන්‍ය යානයකින් යන්නේ හෝ භොගයන් අනුභව කරන්නේ හෝ මහත්වූ සම්පත් ලබා සිටින්නේ හෝ (iv) යුෂ්මතුන් විසින් දැක තිබේද අසා තිබේද?"- "ස්වාමීනි, එය දැක නැත, අසා නැත."

**4.** "මහණෙනි, යහපති, (මෙහි 3 (ii) සහ (iii) යෙදිය යුතුයි) මා විසිනුදු නොදක්නා ලදී. නො අසන ලදී. එයට හේතු කවරේද? මහණෙනි, හෙතෙම මසුන් මරණ කල්හි මැරීමට ගන්නා මසුන් දෙස පාපීවූ සිතින් බලයි. එහෙයින් හෙතෙම (මෙහි 3 (iii) යෙදිය යුතුයි.) නොවේ.

**5.** "මහණෙනි, එය කුමකැයි සිතන්නහුද? මහණෙනි, ගවයන් මර මරා විකුණනුලබන ගොඝාතකයෙක් (ii) ඒ කර්මයෙන් ඒ ජීවත් වීමෙන් (මෙහි 3 (iii) සහ (iv) යෙදිය යුතුයි)

**6.** "මහණෙනි, යහපති, ගවයන් මර මරා විකුණනු ලබන ගොඝාතකයෙක් (ii) ඒ කර්මයෙන් ඒ ජීවත්වීමෙන් (මෙහි 3 (iii) යෙදිය යුතුයි.) මා විසිනුදු නොදක්නා ලදී. එයට හේතු කවරේද? (iii) මහණෙනි හෙතෙම ගවයන් මරණ කල්හි මැරීමට ඉදිරිපත් කරණ ගවයන් කෙරෙහි පාපීවූ සිතින් බලයි. එහෙයින් හෙතෙම (මෙහි 3 (iii) යෙදිය යුතුයි.) නොවන්නේය.

**7.** "මහණෙනි, එය කුමකැයි සිතන්නහුද? බැටළුවන් මරා විකුණනු ලබන බැටළුවන් මරන්නෙක් (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

8. "මහණෙනි, යහපති, බැටලුවන් මරා විකුණනුලබන බැටලුවන් මරන්නෙක් (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, හෙතෙම බැටළුවන් මරණකල්හි මැරීමට ඉදිරිපත් කරන බැටලුවන් කෙරෙහි පාපීවූ සිතින් බලයි. එහෙයින් හෙතෙම (මෙහි 3 (iii) යෙදිය යුතුයි.) නොවන්නේය.

9. "මහණෙනි, එය කුමකැයි සිතන්නහුද? මහණෙනි, ඌරන් මරා විකුණන සූකරිකයෙක් (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

10. "මහණෙනි, ඌරන් මරා විකුණන සූකරිකයෙක් (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, හෙතෙම ඌරන් මරණ කල්හි මැරීමට ඉදිරිපත්කරන ඌරන් කෙරෙහි පාපීවූ සිතින් බලයි. එහෙයින් හෙතෙම (මෙහි 3 (iii) යෙදිය යුතුයි.) නොවන්නේය.

11. "මහණෙනි, එය කුමකැයි සිතන්නහුද? මහණෙනි, පක්ෂීන් මරා විකුණන සාකුන්තිකයෙක් (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

12. "මහණෙනි, යහපති, පක්ෂීන් මරා විකුණන සාකුන්තිකයෙක් (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, හෙතෙම පක්ෂීන් මරණකල්හි මැරීමට ඉදිරිපත් කරන පක්ෂීන් කෙරෙහි පාපීවූ සිතින් බලයි. එහෙයින් හෙතෙම (මෙහි 3 (iii) යෙදිය යුතුයි) නොවන්නේය.

13. "මහණෙනි, එය කුමකැයි සිතන්නහුද? මහණෙනි, මුවන් මරා විකුණනු ලබන මෘගවිකයෙක් (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

14. "මහණෙනි, යහපති, මුවන්මරා විකුණනු ලබන මෘගවිකයෙක් (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, හෙතෙම තිරිසන්ගත ප්‍රාණීන් මරණ කල්හි මැරීමට ඉදිරිපත්කරන ප්‍රාණීන් කෙරෙහි පාපීවූ සිතින් බලන්නේ නොවන්නේය.

15. "යම් මනුෂ්‍යාවූවකු මැරීමේදී මරණයට ඉදිරිපත් කරන්නා දෙස පාපීවූ සිතින් බලාද (එයින් ඇතිවන විපාකය) කියනුම කවරේද? මහණෙනි, එය වනාහි ඔහුට බොහෝ කලක් අහිත පිණිස දුක් පිණිස වෙයි. කායයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් තොරවූ අයහපත් ගති ඇති නපුරු සේ වැටෙන නරකයෙහි උපදනේය."

**19. පඨම මරණසති සූත්‍රයः-** 1. "එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ නාදිකගම්හි ගිඤ්ජකාවසථයෙහි වැඩ වසනසේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක. "මහණෙනි, මරණසතිය වඩන ලද්දේ බහුල වශයෙන් පුරුදුකරණ ලද්දේ මහත්පල ඇත්තේ වෙයි. මහානිශංස ඇත්තේ වෙයි නිවණට බැසගත්තේ නිවණ කෙළවරකොට ඇත්තේ වෙයි.

2. "මරණ සතිය කෙසේ වඩනලද්දේ කෙසේ බහුල වශයෙන් පුරුදු කරණ ලද්දේ මහත්ඵල ඇත්තේවේද? මහානිශංස ඇත්තේවේද, නිර්වාණයට බැසගත්තේද නිර්වාණය කෙළවරකොට ඇත්තේවේද, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම දාවල් කාලය ඉක්මගිය කල්හි රාත්‍රි කාලයෙහි විවේකව හිඳ මෙසේ කල්පනා කරයි. (ii) 'මාගේ මරණයට බොහෝ කරුණු පැමිණඇත. සර්පයකු හෝ මා දෂ්ටකරන්නේය. ගෝනුස්සෙකු හෝ මා දෂ්ටකරන්නේය, පත්තෑයකු හෝ මා දෂ්ටකරන්නේය. එයින් මාගේ මරණය වන්නේය. එය මට අන්තරායක් වන්නේය. මා පැකිලී හෝ වැටේ නම්, මා විසින් අනුභව කරණලද බත හෝ වෙනසකට පැමිණියේ නම් මාගේ පිත හෝ කිපෙන්නේය. සෙම හෝ කිපෙන්නේය. මාගේ ශස්ත්‍රක නම් වාතය කිපෙන්නේය. එයින් මාගේ මරණය වන්නේය. එය මාගේ අන්තරාය පිණිස වන්නේය.

3. (i) "එහෙයින් මහණෙනි, භික්ෂුව විසින් මෙසේ කල්පනා කටයුතුයි. 'මාගේ ලාමකවූ අප්‍රහීනවූ පාප ධර්මයෝ ඇත්තාහ. (ii) යම් හේතුවකින් මා රාත්‍රිකාලයෙහි කාලක්‍රියා කළේ නම් එය අන්තරාය පිණිස වන්නේය.

4. "එහෙයින් මහණෙනි, භික්ෂුව විසින් (ii) ඒ ලාමකවූ අකුශල ධර්මයන්ගේ දුරුකිරීම පිණිස බලවත්වූ කැමැත්තද ව්‍යායාමයද උත්සාහයද මහත් උත්සාහයද පසු නොබැසීමද සිහියද විමසන නුවණද කටයුතුය. (iii) මහණෙනි, හිස ගිනි ගත්තෙක් හෝ වස්ත්‍ර ගිනිගත්තෙක් හෝ ඒ හිස හෝ වස්ත්‍ර හෝ නිවීම පිණිස බලවත් කැමැත්තද ව්‍යායාමයද උත්සාහයද මහත් උත්සාහයද පසු නොබැසීමද සිහිනුවණද ඇතිව වැඩ කරන්නේය.

5. "එපරිද්දෙන්ම මහණෙනි, (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, ඉදින් වනාහි භික්ෂුතෙම විමසා බලන්නේ මෙසේ දනියි. මාගේ ලාමකවූ අකුශල ධර්මයෝ නැත. (ii) එය ප්‍රහීන නොවූයේ නම් රාත්‍රියෙහි කාලක්‍රියා කරන්නහුට අන්තරාය වන්නේය. (iii) මහණෙනි, එබැවින් භික්ෂුව විසින් ඒ බලවත් ප්‍රීතියෙන් වාසය කටයුතුය. රෑ දාවල් කුශලධර්මයන්හි හික්මීම කටයුතුයි.

6. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම රාත්‍රිය ඉක්මගිය දවසෙහි විවේකව මෙසේ කල්පනා කරයි. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

7. (මෙහි 3 (i) යෙදිය යුතුයි.) යම් හේතුවකින් මා දාවල් කාලයෙහි කාලක්‍රියා කළේනම් එය අන්තරාය පිණිස වන්නේය.

8. (මෙහි 4 ඡේදයද 5 (i) ද යෙදිය යුතුයි. එය ප්‍රහීන නොවූයේ නම් දවාලෙහි කාලක්‍රියා කරන්නහුට අන්තරාය වන්නේය. (මෙහි 5 (iii) යෙදිය යුතුයි.)

9. "මහණෙනි, මෙසේ වනාහි මරණ සතිය වඩනලද්දේ බහුල වශයෙන් පුරුදුකරණ ලද්දේ මහත්ඵල ඇත්තේ වෙයි. මහානිශංස ඇත්තේ නිවණට බැසගත්තේ නිවණ කෙළවර කොට ඇත්තේදවෙයි."

**20. දුතිය මරණසති සූත්‍රයː-** 1. (මෙය මේ වර්ගයේ 19 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. "මහණෙනි, යුෂ්මත්හු මරණ සතිය වඩව්,' මෙසේ වදාළ කල්හි එක්තරා භික්ෂුවක් මෙය කීයේය. "ස්වාමීනි, මම මරණ සතිය වඩමි" යනුයි.

"මහණෙනි, යුෂ්මතා කෙසේ වනාහි මරණ සතිය වඩන්නේද?"

3. "ස්වාමීනි, මට මෙහි මෙසේ අදහස්වෙයි. 'මම රෑ දාවල් ජීවත්වන්නෙම් භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය සිහි කරන්නෙම් නම් ඉතා යෙහෙක. ඒකාන්තයෙන් මා විසින් බොහෝ දේ කරණ ලද්දේය යනුයි.' ස්වාමීනි, මම මෙසේ මරණ සතිය වඩමි."

4. අනායවූද භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය, "ස්වාමීනි, මමද මරණසතිය වඩමි." යනුයි. "මහණෙනි, යුෂ්මතා කෙසේ වනාහි මරණසතිය වඩන්නේද?"

5. "ස්වාමීනි, මට මෙසේ අදහස් වෙයි. මම දවසක් ජීවත්වන්නෙම් භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය සිහිකරන්නෙම් නම් ඉතා යෙහෙක. මවිසින් බොහෝ දේ කරණ ලද්දේය,' ස්වාමීනි, මම මෙසේ මරණ සතිය වඩමි"

6. (මෙය 4 ඡෙදය මෙනි)

7. "ස්වාමීනි, මට මේ අදහසවෙයි, 'මම යම් අතර කාලයක් ජීවත්වන්නෙම් ඒ අතර කාලයෙහි එක් පිණ්ඩාහාරයක් වළඳමි, භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය සිහිකරන්නෙම් නම් එය යෙහෙක. මවිසින් බොහෝ දේ කරණ ලද්දේය, මම මෙසේ මරණ සතිය වඩමි."

8. (මෙය 4 ඡෙදය මෙනි.) "ස්වාමීනි, මට මේ අදහස වෙයි. 'මම යම් අතර කාලයක් ජීවත්වන්නෙම් ඒ අතර කාලයක බත් පිඩු හතරක් පහක් මනාසේ විකා ගිලිමි. භාග්‍යවතුන්වහන්සේගේ ධර්මය සිහි කරන්නෙම් නම් එය යෙහෙක, මවිසින් බොහෝ දේ කරණ ලද්දේය යනුයි. ස්වාමීනි, මම මෙසේ මරණ සතිය වඩමි."

9. (මෙය 4 ඡෙදය මෙනි) "ස්වාමීනි, මට මේ අදහස වෙයි, 'මම යම් අතර කාලයක් ජීවත් වන්නෙම් ඒ අතර කාලයෙහි එක බත්පිඩුවක් මනාසේ විකා ගිලිමි, භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය සිහිකරන්නෙම් නම් යෙහෙක, මවිසින් බොහෝ දේ කරණ ලද්දේය යනුයි."

10. (මෙය 4 ඡෙදය මෙනි) ආශ්වාස කොට ප්‍රශ්වාස කරමි. ප්‍රශ්වාසකොට ආශ්වාස කරමි. (මෙහි මේ සූත්‍රයේ 4, 5 ඡෙද යෙදිය යුතුයි.)

11. මෙසේ කී කල්හි භාග්‍යවතුන්වහන්සේ ඒ භික්ෂූන්ට මෙසේ වදාළසේක. "මහණෙනි, යම් මේ භික්ෂුවක් 'මම රෑ දාවල් ජීවත්වන්නෙම් භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය සිහි

කරන්නෙම් නම් යෙහෙක, මවිසින් බොහෝ දේ කරණ ලද්දේයයි මෙසේ මරණ සතිය වඩාද, මහණෙනි, යම් මේ භික්ෂුවක්, මම දවසක් ජීවත්වන්නෙම් භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය සිහිකරන්නෙම්නම් යෙහෙක, මවිසින් බොහෝ දේ කරණ ලද්දේයයි' මෙසේ මරණ සතිය වඩාද මහණෙනි, යම් භික්ෂුවක් 'මම යම් අතර කාලයක් ජීවත්වන්නෙම් ඒ අතර කාලයෙහි එක් පිණ්ඩාහාරයක් වළඳමි භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය සිහිකරන්නෙම් නම් එය යෙහෙක. මා විසින් බොහෝ දේ කරණ ලද්දේයයි' මෙසේ මරණ සතිය වඩාද. මහණෙනි, යම් භික්ෂුවක් මම යම් අතර කාලයක් ජීවත් වන්නෙම් ඒ අතර කාලයෙහි බත් පිඩු හතරක් පහක් මනාසේ විකා ගිලිමි. භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය සිහි කරන්නෙම් නම් එය යෙහෙක, මවිසින් බොහෝ දේ කරණ ලද්දේයයි' මෙසේ මරණ සතිය වඩාද, මහණෙනි, මේ භික්ෂූහු ප්‍රමාදව වාසය කරත්, ආශ්‍රවයන්ගේ ක්ෂය පිණිස මෝඩ මරණ සතිය වඩත්, මහණෙනි, යම් භික්ෂුවක් 'මම යම් අතර කාලයක් ජීවත්වන්නෙම් ඒ අතර කාලයෙහි එක බත් පිඩුවක් මනාසේ විකා ගිලිමි. භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය සිහිකරන්නෙම් නම් යෙහෙක, මවිසින් බොහෝ දේ කරණ ලද්දේයයි' මරණ සතිය වඩාද, මහණෙනි, යම් භික්ෂුවක් 'මම යම් අතර කාලයක් ජීවත්වන්නෙම් නම් ඒ අතර ආශ්වාසකොට ප්‍රශ්වාස කරමි, ප්‍රශ්වාසකොට ආශ්වාස කරමි. භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය සිහි කරන්නෙම් නම් යෙහෙක, මවිසින් බොහෝ දේ කරණ ලද්දේයයි' මරණ සතිය වඩාද, මහණෙනි, මේ භික්ෂූහු අප්‍රමාදව වාසය කරත්. ආශ්‍රවයන්ගේ ක්ෂය පිණිස ඥානවන්තවූ මරණ සතිය වඩත්.

12. "මහණෙනි, එබැවින් මෙහිලා මෙසේ හික්මිය යුතුයි. අප්‍රමාදව වාසය කරන්නෙමු. ආශ්‍රවයන්ගේ ක්ෂය පිණිස ඥානවන්තවූ මරණ සතිය වඩන්නෙමුය' යි මහණෙනි, යුෂ්මතුන් විසින් මෙසේ හික්මිය යුතුයි."

---

## 3. අනුත්තරිය වර්ගය.

21. **සාමගාම සූත්‍රය**:- එක් සමයෙක භාග්‍යවත්තෙමේ ශාක්‍ය ජනපදයෙහි සාමගාම පොක්ඛරණියාවෙහි වෙසෙයි. ඉක්බිත්තෙන්, වනාහි එක්තරා දෙවතා කෙනෙක්, එළඹ සිටි රැයෙහි අභිරූප වර්ණ ඇත්තේ සියලු පොක්ඛරනියාව බබුළුවා භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙකද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ඒ දෙවිතෙම භාග්‍යවතුන්වහන්සේට මෙය කීය.

2 "ස්වාමීනි, දැරීම් තුනක් මහණහුගේ පිරිහීමෙහි පවතී. ඒ තුන කවරේද යත්? කම්මාරාමතාව (කටයුතු වලටම ඇලීම) භස්සාරාමතාව (කථා කරමින් ඉඳීමේ ඇල්ම). නිද්දාරාමතාව (නින්දටම ඇලීමයි), ස්වාමීනි, මේ තුන් දැරීමම භික්ෂුවගේ පිරිහීමෙහි පවතී යයි" ඒ දෙවිතෙම මෙය කීය. ශාස්තෘතෙම එය මනාව අනුදත්තේය.

3 "ඉක්බිති ඒ දෙවිතෙම ශාස්තෘතෙමේ මට එකඟවීයයි භගවත්හු වැඳ, පැදකුණු කොට එහිම නොපෙනී ගියේය.

4. "ඉක්බිති භගවත්තෙමේ ඒ රැය ගෙවී ගිය කල්හි භික්ෂූන් ඇමතීය." "මහණෙනි, මේ රැයෙහි එක්තරා දෙවතාවෙක් එළඹ සිටි රැයෙහි අභිරූප වර්ණ ඇත්තේ සියලු පොක්ඛරණියාව බබුලුවා මම යම් තැනෙකද එහි පැමිණියේය. පැමිණ මට වැඳ එක් පසෙක සිටියේය. එක් පසෙක සිටි ඒ දෙවිතෙම මට මෙය කීය (මෙහි 2 ඡේදය යෙදිය යුතුයි.)

5. "තොපට කුසල් දහම් වලින් පිරිහීම ඇති කල්හි යම් ඒ දෙවතාවෝද දනිත්ද, ඒ තොපට මහණෙනි (ඔවුහු) ලද නොහැක්කෝය. ලැබීමට දුෂ්කරයෝය.

6. "මහණෙනි, අනෙකුත් පිරිහෙන දරා ගැනීම් තුනක් දෙසන්නෙමි. එය අසව්, හොඳින් සලකව්, කියන්නෙමි" "එසේය, ස්වාමීනි යි" භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

7. "මහණෙනි, පිරිහීමේ දරා ගැනීම් තුන කෙසේද? සංගණිකාරාමතාව (කාණ්ඩ ගැසීමේ ඇල්ම) යි, දොවචස්සතාව'

(නරක වචන ඇති බව) යි පාප මිත්තතා (නරක යහළුවන් ආශ්‍රය) යි. මේ වනාහි පිරිහීමේ දරාගැනීම් තුනයි.

8. "මහණෙනි, යම් කිසිවෙක් පෙර කල්හි (ii) කුසල් දහමින් පිරිහුණේද, ඒ සියල්ලෝම කුසල් දහම් වූ මේ දහම් සයෙන් පිරිහුණේමය. (iii) යම් කිසිවෙක් අනාගත කාලයෙහි (මෙහි 8 (ii) යෙදිය යුතුයි) යම් කිසිවෙක් දැන් කාලයෙහි (මෙහි 8 (ii) යෙදිය යුතුයි.)

**22. අපරිහානිය ධම්ම සූත්‍රය:-** 1. "මහණෙනි, මේ නොපිරිහෙන දැරීම් හය දෙසන්නෙමි," "එසේය ස්වාමීනී යි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

2. "මහණෙනි, ඒ නො පිරිහෙන දහම් සය කවරේද? කම්මාරාමතා (කටයුතු වලටම ඇලුම්) නොවීමයි. භස්සාරාමතා (කථාවෙහි ඇලුනු බව) නොවීමයි, නිද්දාරාමතා (නිදා ගැනීමේ ඇලුම්) නොවීමයි, සංගණිකාරාමතා (කාණ්ඩ ගැසීමේ ඇලුම්) නොවීමයි, සොවචස්සතා (හොඳ වචන ඇති බව) යි. කල්‍යාණ මිත්තතා (යහපත් මිතුරන් ඇති බව) යි. මේ නොපිරිහෙන දැරීම් හයයි. (මෙහි 21 සූත්‍රයේ 8 ඡේදය යෙදිය යුතුයි)

**23. කාම භය සූත්‍රය:-** 1. "මහණෙනි, භය යනු කාමයන්ට මේ නමෙකි. මහණෙනි, දුක යනු කාමයන්ට නමකි, ලෙඩ යනු කාමයන්ට නමකි, ගඩ යනු කාමයන්ට නමකි, සංග යනු කාමයන්ට නමකි, (කෙලෙස්) මඩ යනු කාමයන්ට මේ නමකි, භය යනු (කාමයන්ට නමකි.)

2. "කවර හෙයින් කාමයන්ට මේ නම්ද? මහණෙනි, කාම රාගයෙන් ඇලී සිටී, ඡන්ද රාගයෙන් තදින් නිතර බැඳී සිටී මේ තෙමේ මෙලොවත් භයින් නොමිදෙයි. පරලොවත් භයින් නොමිදේ. (ii) එහෙයින් භය යනු කාමයන්ට මේ නමෙකි.

3. "දුක යනු (මෙහි 2 (ii) ඡේදය යෙදිය යුතුයි.) ලෙඩ යනු (මෙහි 2 (i) ඡේදය යෙදිය යුතුයි.) ගඩ යනු (මෙහි 2 (i) ඡේදය යෙදිය යුතුයි.) සංග යනු (මෙහි 2 (i) ඡේදය යෙදිය යුතුයි.) මඩ යනු (මෙහි 2 ඡේදය යෙදිය යුතුයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"භයද දුකද ලෙඩද ගඩද සංගයද මඩද යන මොහු පෘථජ්ජන සත්වයා මෙහි කැමැති වන බැවින් කාමයෝ යයි කියනු ලැබෙත්.

4. "ඉපදීම හා මරණය පහළවන පස් උපාදානයෙහි භය දැක, ඉපදීම හා මරණ ඇති සංස්කාරයන් නොගෙන විශෙෂයෙන් මිදෙත්.

5 "නිර්භයට පත්, සැපවත්, මෙලොවදීම මනාව නිවී ගිය, සියලු වෛර හා භය ඉක්මවූ ඔහු සියලු දුකින් එතරව ගියාහුය."

**24. හිමවන්තපදාලන සූත්‍රයː-** 1. "මහණෙනි, කරුණු සයකින් යුතු භික්ෂුව හිමවත්පව්ව පළා ලන්නේ නම් ලාමක වූ මුලාව ගැන කවර කථාද?

2. "කවර සයකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂූතෙමේ හිත එකඟයට සමවැදීමේ දක්ෂයෙක් වේද, සිත එකඟයෙහි සිටීමේ දක්ෂයෙක් වේද, සිත එකඟයෙන් නැඟ සිටීමේ දක්ෂයෙක් වේද, නිරෝගිතාවෙන් දක්ෂයෙක් වේද, අරමුණ ගැනීමෙහි දක්ෂයෙක් වේද, ඉදිරියට ගෙන ඒමෙහි දක්ෂයෙක්වේද,

3. (මෙය 1 ඡේදය මෙනි.)

**25. ඡානුස්සතිට්ඨාන සූත්‍රයː-** 1. "මහණෙනි, මේ (යමක්) සිහි කිරීමේ කරුණු සයක් වේ.

2. "කවර කරුණු සයක්ද යත්?

"මහණෙනි, මේ ශාසනයෙහි ආර්ය ශ්‍රාවක තෙමේ මෙසේද ඒ භගවත් තෙමේ (මෙහි 1. ආහුණෙය්‍ය වර්ගයේ 8 සූත්‍රයේ 2 (ii) ඡේදය යෙදිය යුතුයි.) තථාගතයන් අනුස්මරණය කරයි.

3. "මහණෙනි, යම්විටක ආර්ය ශ්‍රාවකතෙමේ තථාගතයන් අනුස්මරණය කෙරේද, එසමයෙහි ඔහුගේ සිත රාගයෙන් නැඟිටුණේ නොවේ, කෝපයෙන් නැඟිටුණේ නොවේ, මෝහයෙන් නැඟිටුණේ නොවේ, එසමයෙහි ඔහුගේ සිත කෙළින් සිටියේම වේ. (කාම ගුණයන්හි) ගිජුකමින් නික්මුණේ, මිදුණේ, නැඟිටියේම වේ. මහණෙනි, ගිජුකම යනු පස්කම්

ගුණයනටම නම්. මහණෙනි, මෙයම අරමුණුකොට මේ ලොකයෙහි ඇතැම් සත්ව කෙනෙක් පිරිසුදු වෙත්මය.

4. "මහණෙනි, නැවතද වනාහි ආර්ය ශ්‍රාවක තෙමේ (මෙහි 1. ආහුණෙය්‍ය වර්ගයේ 8 සූත්‍රයේ 4 (ii) ඡෙදය යෙදිය යුතුයි.) ධර්මය අනුස්මරණය කරයි.

4. "මහණෙනි, නැවතද ආයර්‍යශ්‍රාවකතෙම (මෙහි 1 වර්ගයේ 10 වෙනි සූත්‍රයේ 4, 5 ඡෙද යෙදිය යුතුයි) (ii) පස්කම් සැපට ගිජුකමින් නික්මුනේය. මිදුනේය. නැගී සිටියේය. මහණෙනි, ගෙධය යනු පස්කම් සැපට නමකි. මහණෙනි, මෙයද අරමුණුකොට මෙසේ මේ ලෝකයෙහි ඇතැම් සත්වයෝ පිරිසිදු වෙත්

5. "මහණෙනි, නැවතද ආයර්‍යශ්‍රාවකතෙම මේ වර්ගයේ 10 සූත්‍රයේ 6 ඡෙදයේ (i) (ii) (iii) හා මෙහි 4 (ii) යෙදිය යුතුයි

6. "මහණෙනි, නැවතද ආයර්‍යශ්‍රාවකතෙම (මෙහි 1 වර්ගයේ 10 සූත්‍රයේ 7 ඡෙදයේ (i) (ii) සහ 4 (ii) යෙදිය යුතුයි.)

7. "මහණෙනි, නැවතද ආයර්‍යශ්‍රාවකතෙමේ (මේ වර්ගයේ 10 වෙනි සූත්‍රයේ 8 ඡෙදය හා 4 (ii) යෙදිය යුතුයි.)

8. "මහණෙනි, නැවතද ආයර්‍යශ්‍රාවකතෙමේ (මේ වර්ගයේ 10 සූත්‍රයේ 9 වෙනි ඡෙදය හා 4 (ii) යෙදිය යුතුයි.)

**26. මහාකච්චාන ඔකාසාධිගම සූත්‍රය:-** 1. "ඉක්බිත්තෙන් ආයුෂ්මත් මහකාත්තායනයන් වහන්සේ 'ඇවැත් භික්ෂුනි'යි භික්ෂූන් ඇමැතීය.

'ඇවැත්නි'යි ඒ භික්ෂූහු ආයුෂ්මත් මහා කාත්තායනයන් වහන්සේට පිළිතුරු දුන්හ. ආයුෂ්මත් මහාකාත්තායනයන් වහන්සේ මෙය වදාළසේක.

2. "භාග්‍යවත්වූ දන්නාවූ, දක්නාවූ, අර්හත්වූ ඒ සම්මා සම්බුදුන් විසින් යම්තාක් මෙය මනාකොට කියනලදද (එය) ඇවැත්නි, අසිරියි. ඇවැත්නි, පුදුමයි. යම් මේ අනුස්මෘතිකාරණ සයෙක් වේද, සත්වයන්ගේ පිරිසුදු බවට, හැඬීම් වැලපීම් නැතිකිරීමට, දුක් දොම්නස් අස්තංගත කිරීමට දතයුත්ත

දැනගැනීමට නිවන අත්කිරීමට, මද අවකාශයෙහි අවසරය පරිදි තේරුම් ගතයුතුය. අනුව අවබොධ කළයුතුයි.

3. "කවර සයක්දයත්? ඇවැත්නි, මේ ශාසනයෙහි ආයර්‍ය ශ්‍රාවකතෙම 25 සූත්‍රයේ 2, 3 ඡෙද හා 4 යෙදිය යුතුයි.)

4. "ඇවැත්නි, ඒ මේ ආයර්‍යශ්‍රාවකතෙමේ හැම අතින්ම අහස සමවූ මහත්වූ මහත්භාවයට පැමිණි අප්‍රමාණවූ වෛර නැත්තාවූ ක්‍රොධ නැත්තාවූ සිතින් වාසය කරයිද, ඇවත්නි, මෙයද අරමුණුකොට මෙසේ මේ ලොකයෙහි ඇතැම් සත්වයෝ පිරිසිදු ස්වභාව ඇත්තෝ වෙත්.

5. (i) "ඇවැත්නි, නැවත ආයර්‍යශ්‍රාවකතෙම (මෙහි මේ වර්ගයේ 10 සූත්‍රයේ 4 (ii) හා 5 ඡෙද යෙදිය යුතුයි.)

6. (මේ සූත්‍රයේ 5 ඡෙදයේ (i) හා මේ වර්ගයේ 10 සූත්‍රයේ 6 (ii) ඡෙදයද යෙදිය යුතුයි.)

7. (මේ සූත්‍රයේ 5 ඡෙදයේ (i) හා මේ වර්ගයේ 10 සූත්‍රයේ 7 (ii) ඡෙදයද යෙදිය යුතුයි.)

8. (මේ සූත්‍රයේ 5 ඡෙදයේ (i) ද මේ වර්ගයේ 10 සූත්‍රයේ 8 (ii) ඡෙදයද යෙදිය යුතුයි.)

9. (මේ සූත්‍රයේ 5 ඡෙදයේ (i) ද මේ වර්ගයේ 10 සූත්‍රයේ 9 (ii) ඡෙදයද යෙදිය යුතුයි.)

10. (26 වෙනි සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි)

**27. පඨම උපගමනසමය සූත්‍රයඃ-** 1. "ඉක්බිති එක්තරා භික්ෂුනමක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. ඒකත්පසෙක සිටි ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, සිත දියුණු කළ භික්ෂුව වෙත පැමිණීමට අවස්ථා කීයක්වේදැයි" ඇසීය.

"මහණ, සිත දියුණුකළ භික්ෂුව වෙත පැමිණීමට මේ අවස්ථා සයකි.

2. "කවර සයක්දයත්?

3 (i) "මේ ශාසනයෙහි මහණතෙම යම් කාලයක කාම ආශාවෙන් පෙළුනු සිතින් යුක්තව වාසය කරයිද, කාමාශාවට භාජනවූ ඔහු විසින් උපන් කාමරාගයෙන් නික්මීම තත්වූපරිද්දෙන් නොදනීද, (ii) ඒ කාලයෙහි සිත දියුණු කළයුතු භික්ෂුව වෙත පැමිණ ඇවැත්නි, මම වනාහි කාමාශාවෙන් පෙළුනු සිතින් වාසය කරමි. කාමාශාවට භාජනවූ මා විසින් උපන් කාමරාගයෙන් නික්මීම තත්වූපරිද්දෙන් නොදනිමි. ඒකාන්තයෙන් ආයුෂ්මත්තෙමේ මට කාම රාගය ප්‍රහීන කිරීමට බණ වදාරණු මැනවයි' මෙසේ කිවයුතුය. (iii) උන්වහන්සේට සිත වැඩිය යුතු මහණතෙම කාමාශාව ප්‍රහීන කිරීම පිණිස බණ වදාරයි. මහණ, සිත වැඩියයුතු භික්ෂුව දැකීමට පැමිණීමට පළමුවෙනි කාලය මෙයයි.

4 "මහණ, නැවතද යම් කාලයක මහණතෙම ව්‍යාපාදයෙන් පෙළුනු සිතින් (3 ඡේදය යෙදිය යුතුයි.) කාමාශාව වෙනුවට 'ව්‍යාපාදය' කියා යොදාගත යුතුයි.)

5. "මහණ, නැවතද යම්කාලයක මහණතෙම (3 ඡේදය යෙදිය යුතුයි. කාමාශාව වෙනුවට 'ථිනමිද්ධය' (සිතේ කයේ නිදිබර ගතිය ගත යුතුයි.)

6. "මහණ, නැවතද මහණතෙම (3 ඡේදය මෙහි යෙදිය යුතුයි. 'කාමාශාව' වෙනුවට 'උද්ධච්චකුක්කුච්චය' කියා යොදා ගත යුතුයි) මහණ, නැවතද මහණතෙම (3 ඡේදය යෙදිය යුතුයි. 'කාමාශාව' වෙනුවට 'විචිකිච්ඡාව' කියා යොදාගතයුතුයි.)

7. "මහණෙනි, නැවතද වනාහි භික්ෂුතෙමේ යම් නිමිත්තක් මෙනෙහි කරනවිට (ii) (සිතෙහි) ඇතුළත වැගිරෙන පව්බල ගෙවී යාම වේද, ඒ (ජලය, ගින්න වැනි) ඒ නිමිත්ත නොදනීද, නොදකීද, එසමයෙහි (මෙහි 3 (ii) ඡේදය යුතුයි.)

"ඇවැත්නි, මම වනාහි යම් නිමිත්තකට පැමිණ යම් නිමිත්තක් මෙනෙහි කරන්නාහට (මට) (මෙහි 7 (ii) ඡේදය යෙදියයුතුයි.) වැගිරෙන පව් ගෙවීයාමට බණ කියවා සිත වැඩියයුතු භික්ෂුව ආශ්‍රවයන් ගෙවීමට බණ කියයි. සවන (මෙහි 3 (iii) ඡේදය යෙදියයුතුයි.)

8. "මහණෙනි, සිත වැඩියයුතු භික්ෂුවගේ දැකීම සඳහා එළඹීමට මේ අවස්ථා සයයි."

28. **දුතිය උපගමනසමය සූත්‍රයः-** 1. "එක් සමයෙක බරණැස මෘගයන්ට අභය ස්ථානවූ ඉසිපතන (විහාර)යෙහි බොහෝ ස්ථවිර භික්ෂූහු වෙසෙත්.

ඉක්බිති වනාහි පස්වරුවෙහි පිණ්ඩපාතයෙන් වැළකුනාහු කවාකාර මලුයෙහි රැස්ව වැඩහුන් ඒ ස්ථවිරයන් වහන්සේලා අතර මේ අතුරු කථාව පහළවූවාය.

'ඇවැත්නි, සිත වැඩියයුතු භික්ෂුවගේ දැකීම පිණිස එළඹීමට අවස්ථාව කවරේද?"

2. "මෙසේ කීකල, එක්තරා භික්ෂුවක් ඒ භික්ෂූන්ට මෙය කීය. (ii) 'ඇවැත්නි, සිත වැඩියයුතු භික්ෂුතෙමේ පස්වරුයෙහි අහරින් වැළකුනේ යම් විටෙක පා සෝදා පළඟ බැඳ කය කෙළින් සිටුවා සිහිය පෙරමුණුකොට, හුන්නේවේද. ඒ වනාහි සිත වැඩියයුතු භික්ෂුවගේ දැකීම පිණිස එළඹීමට කාලයයි."

3. මෙසේ කීකල එක්තරා භික්ෂුවක් ඒ භික්ෂුවට මෙය කීය. "ඇවැත්නි, සිත වැඩියයුතු භික්ෂුවගේ දැකීමට එළඹිය යුතු අවස්ථාව මෙය නොවේ.

4. "ඇවැත්නි, යම්විටෙක සිත වැඩියයුතු භික්ෂුව (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

4. එසමයෙහි ඔහුගේ චාරිත්‍රය නිසාවූ ක්ලාන්තයද නො සංසිඳුණේ වෙයි. ඔහුගේ ආහාරය නිසාවූ ක්ලාන්තයද නො සන්සිඳුණේ වෙයි. (ii) එහෙයින් සිත වැඩියයුතු භික්ෂුවගේ දැකීම පිණිස එළඹීමට ඒ අකාලයයි.

5. "ඇවැත්නි, සිත වැඩියයුතු භික්ෂුව යම්විටෙක සවස් කාල විවේකයෙන් නැගිටියේ වෙහෙර පස සෙවණැල්ලෙහි (ii) පළක්බැඳ කය කෙළින් තබා සිහිය පෙරමුණුකොට හුන්නේවේද, සිත වැඩිය යුතු භික්ෂුව දැකීම පිණිස එළඹීමට ඒ කාලයයි."

6. "මෙසේ කීකල්හි එක්තරා භික්ෂුවක් ඒ භික්ෂුවට මෙය කීවේය. "සිත වැඩියයුතු භික්ෂුව දකිනු පිණිස පැමිණීමට ඒ අකාලයයි. ඇවැත්නි, යම් විටක සිත වැඩියයුතු භික්ෂුව පා සෝදා පළඟ බැඳ කය කෙළින් සිටුවා සිහිය පෙරටුකොට හුන්නේවේද, දහවල් ඔහු යම් සමාධියක් සඳහා නිමිත්තක් මෙහෙයීම කරණ ලද්දේද, ඒම ඔහුට ඒ අවස්ථාවෙහිද පවතියි. එහෙයින් සිත වැඩියයුතු භික්ෂුව දැකීමට ඒ අකාලයයි.

7. "යම් කාලයක සිත වැඩියයුතු භික්ෂුව රාත්‍රී අළුයම් කාලයෙහි නැගිට (මෙහි 6 (ii) යෙදිය යුතුයි.)

8. "මෙසේ කී කල්හි එක්තරා භික්ෂුවක් ඒ භික්ෂුවට මෙය කීවේය. "සිත වැඩිය යුතු භික්ෂුව දකිනු පිණිස පැමිණීමට ඒ අකාලයයි. එසමයෙහි ඔහුගේ කය ඕජසෙහි සිටියේවේද, එසමයෙහි බුදු සස්න මෙනෙහි කරන්නට පහසු වේ. එහෙයින් සිත වැඩිය යුතු භික්ෂුව දකිනු පිණිස පැමිණීමට ඒ අකාලයයි."

9. මෙසේ කී කල්හි ආයුෂ්මත් මහා කාත්‍යායනයන් වහන්සේ ස්ථවිර භික්ෂූන්ට මෙසේ කීහ. "ඇවැත්නි, මෙය භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි අසන ලදී. උන්වහන්සේ හමුවෙහිදී පිළිගන්නා ලදී.

"මහණෙනි, සිත වැඩිය යුතු භික්ෂුවගේ දැකුමට පැමිණීමට මේ අවස්ථා සයෙකි. කවර සයෙක්ද යත්? (මෙහි 27 සූත්‍රයේ 3-8 ඡෙද යෙදිය යුතුයි.)

29. උදායි අනුස්සතිට්ඨාන සූත්‍රයඃ- 1. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් උදායි තෙරුන් ඇමතූසේක. 'උදායීනි, අනුස්මෘති කාරණා කෙතෙක්ද?' මෙසේ විචාල කල්හි ආයුෂ්මත් උදායි ස්ථවිරතෙම නිශ්ශබ්ද විය. දෙවනුවත් ඇමතූසේක. දෙවනුවත් නිශ්ශබ්ද විය, තුන්වෙනුව ඇමතූ සේක. තුන් වෙනුවත් නිශ්ශබ්ද විය.

2. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම ආයුෂ්මත් උදායි ස්ථවිරයන්ට මෙසේ කීය. ඇවැත් උදායීනි, ශාස්තෘන් වහන්සේ ඔබ අමතන සේක. ආයුෂ්මත් ආනන්දයෙනි, මම භාග්‍යවතුන්

වහන්සේ හට ඇහුම්කන් දෙමි. ස්වාමීනි, මේ සස්නෙහි භික්ෂූහු නන් වැදෑරුම් ලෙස පෙර විසූ ජාතීන් සිහි කරත්. කෙසේද? (මෙහි අංගුත්තර නිකායේ දුතිය පණ්ණාසකයේ 1 බ්‍රහ්මණ වර්ගයේ 8 සූත්‍රයේ 4 ඡෙදය යෙදිය යුතුයි.)

3. ඉක්බිති වනාහි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද තෙරුන් ඇමතූසේක. 'ආනන්දය මේ උදායි හිස් පුරුෂතෙම අධිචිත්තයෙහි යෙදී වාසය නොකරණ බව මම දනිමි. ආනන්දය, අනුස්මෘති කාරණා කෙතෙක්ද, පසෙකි. ඒ පස කවරේද?"

"ස්වාමීනි, මේ සස්නෙහි භික්ෂුවක් කාමයන්ගෙන් වෙන්ව (1 අංගුත්තර නිකායේ දුතිය පණ්ණාසකයේ බ්‍රාහ්මණ වර්ගයේ 8 සූත්‍රයේ අන්තිම කොටස යෙදිය යුතුයි.) තුන්වන ධ්‍යානයට පැමිණ වෙසෙයි. ස්වාමීනි, මේ අනුස්මෘති කාරණයයි, මෙසේ වඩනා ලද්දේ මෙසේ දියුණු කරණ ලද්දේ මෙලොව පහසුවිහරණය පිණිස පවතියි. ස්වාමීනි, නැවතද වනාහි භික්ෂූතෙමේ ආලොකය යන හැඟීම මෙනෙහි කෙරේද, දහවල යන හැඟීම ඉටාද, දහවල යම්සේද රැයද එසේය. රැය යම් සේද දහවල්ද, එසේයයි නොවැසුන පිරිසිදු සිතින් බැබලීම් සහිත සිත වඩාද, ස්වාමීනි, මේ අනුස්මෘති කාරණය මෙසේ වඩනා ලද්දේ මෙසේ දියුණු කරණ ලද්දේ ඥාන දර්ශනය ලැබීම පිණිස පවතියි."

4. "ස්වාමීනි, නැවතද වනාහි මහණතෙමේ මෙම කය පතුලෙන් උඩ, හිස කෙසින් යට සම අවසන් කොට පිරුණු නන් වැදෑරුම් අශුචි එකක් එකක් අනුව බලාද, මේ කයෙහි කෙස්ය, ලොම්ය, නියය, දත්ය, සමය, මස්ය, නහරය, ඇටය ඇටමිදුළුය, වකුගඩුවය, හදවතය, අක්මාය, දළඹුවය, බඩ දිවය, පපුවය, අතුනුය, බඩවැල්ය, නොපැසුන ආහාරය, මලය, පිතය, සෙමය, සැරවය, ලේය, ඩහදියය, මෙද තෙලය, කඳුළුය, වුරුණු තෙලය, කෙළය, සොටුය, සද මිදුළුය, මුත්‍රය, (යනුවෙනි)

5. "ස්වාමීනි, මේ අනුස්මෘති කාරණායි. මෙසේ වඩන ලද්දේ මෙසේ දියුණු කරන ලද්දේ කාම රාගය සංසිඳීම පිණිස පවතී.

**6.** "ස්වාමීනි, නැවතද භික්ෂුතෙමේ යම්සේ සොහොනේ දමන ලද මැරී දිනක් වූ හෝ මැරී දෙදිනක්වූ හෝ මැරී තුන් දිනක්වූ හෝ ඉදිමි හෝ ඉතා නිල්වූ හෝ ඉතා පැසවූ හෝ ශරීරයක් බලන්නේද හෙතෙමේ මේ කය වනාහි මෙබඳු ස්වභාව ඇත්තේය. මෙසේ වන සුලුය මෙය ඉක්මුණේ නැතැයිද මේ කය මෙසේ සම කොට බලයි.

**7.** "යම්සේ සොහොනෙහි හැර දැමූ, කවුඩන් විසින් කනු ලබන, උකුස්සන් විසින් හෝ කනු ලබන, ගිජුලිහිණින් විසින් හෝ කනු ලබන, බල්ලන් විසින් හො කනු ලබන සිවලුන් විසින් හෝ කනු ලබන, නන් වැදෑරුම් සත්ව සමූහයා විසින් කනු ලබන, ශරීරය බලන්නේද, මේ කයද මෙබඳු ස්වභාව ඇත්තේය. මෙසේ වන සුලුය. (ii) මෙය නොඉක්මවන ලද්දේයයි, හෙතෙමේ මෙම කයද එසේ සමකොට බලන්නේය.

**8.** "යම්සේ සොහොන්හි දමන ලද මස් ලේ සහිතවූ, නහරින් බැඳුණු, ඇට සැකිල්ලද, මස් නැති ලේ වැකුණු නහරින් බැඳුණු ඇට සැකිල්ලද, මස් ලේ නැති නහරින් බැඳුණු ඇට සැකිල්ලද, බැඳුම් කැඩී අත් ඇටය අන් තැනෙකය, පා ඇට අන් තැනෙකය, දත ඇටය අන් තැනෙකය, කලවා ඇටය අන් තැනෙකය, ඉඟ ඇටය අන් තැනෙකය, පිට ඇටය අන් තැනෙකය, ඉස්කබල අන් තැනෙක යයි නොයෙක් දිශාවල විසුරුණු, ශරීරය බලන්නේද, මේ කයද (මෙහි 7 (ii) යෙදිය යුතුයි.)

**9.** "යම්සේ සොහොනෙහි හැර දමන ලද, ඇට සුදුවූ හක් ගෙඩියකට බඳුවූද, ඇට ගොඩ ගැසුණාවූද, ඇට හවුරුදු තුන හතරක් වූද ඇට කුණුවූ සුනු වූද ශරීරය බලන්නේද, මේ කයද (මෙහි 7 (ii) යෙදිය යුතුයි.)

ස්වාමීනි, මේ අනුස්මෘති කාරණයයි. මෙසේ වඩන ලද්දේ මෙසේ දියුණු කරන ලද්දේ (මම) "වෙමි"යි යන මානය ඉගිලීම පිණිස පවතී.

**10.** "ස්වාමීනි, නැවතද වනාහි භික්ෂුතෙම (මෙහි අංගුත්තර නිකායේ තික නිපාතයේ 6 බ්‍රාහ්මණ වර්ගයේ 9 සූත්‍රයේ 4

ඡේදයේ 'සැපය පහවීමෙන්' සිට යොදාගත යුතුයි.) ස්වාමීනි, මේ අනුස්මෘති කාරණයයි. මෙසේ වඩනලද්දේ දියුණු කරන ලද්දේ නොයෙක් (ලෝක) ධාතූන් දැනගැනීම පිණිස පවතී. ස්වාමීනි, මේ පස් අනුස්මෘති කාරණයෝය."

11. "ආනන්ද, යහපති, යහපති, එසේනම් ඔබ මේ අනුස්මෘති සයත් දරව. "ආනන්දය, මේ සස්නෙහි භික්ෂු තෙම සිහි ඇත්තේම පෙරට යාද සිහි ඇත්තේම හැරීයේද සිහි ඇත්තේම සිටීද, සිහි ඇත්තේම හොවීද, සිහි ඇත්තේම කටයුතු කරයිද, ආනන්ද මේ අනුස්මෘති කාරණයයි. මෙසේ වඩනලද්දේ මෙසේ දියුණු කරන ලද්දේ සිහිය හා නුවණ ලැබීම පිණිස පවතී"

30. **ඡානුත්තරිය සූත්‍රයඃ-** 1. "මහණෙනි, ඉතා උතුම් (කාරණා) සයෙකි, කවර සයෙක්දයත්? ඉතා උතුම් දැකීම, උතුම් ඇසීම, උතුම් ලැබීම, උතුම් හික්මීම, උතුම් සේවය, උතුම් නැවත නැවත සිහිකිරීමය.

2. (i) "මහණෙනි, ඉතා උතුම් දැකීම කෙසේද? මහණෙනි, මේ ලොව එකෙක් ඇත් රුවන දැක්මට යයි අස් රුවන, මිණි රුවන, ලොකු කුඩා දෙය, වැරදි දැකීම් ඇති, වරදට පත් මහණකු හෝ බමුණකු දැක්මට යයි. මහණෙනි, මේ දැකීමක් වේද, මෙය නැතැයි නොකියමි. මහණෙනි, එහිද මේ දැකීම වනාහි හීනය. (ii) පහත්ය පුහුදුන් අයත්ය. ආර්ය නොවේ. වැඩ පිණිස නොවේ කලකිරීම පිණිස නොවේ. නොඇල්ම පිණිස නොවේ. සිත නිරුද්ධ (නැති) කිරීම පිණිස නොවේ. (සිත) සමනය පිණිස නොවේ. විශෙෂ දැනීම පිණිස නොවේ. මනාව දැනීම පිණිස නොවේ. නිවීම පිණිස නොවේ.

3. (i) "මහණෙනි, යමෙක් තෙම වනාහි පිහිටවූ සැදැහැ ඇත්තේ, පිහිටවූ ආදර ඇත්තේ, එකාන්තවූයේ, මනාව පැහැදුණේ (ii) තථාගතයන් හෝ තථාගත ශ්‍රාවකයකු හෝ දැකීමට යේද, මහණෙනි, මෙයම දැකීම් අතර ඉතා උතුම් ය. (iii) යමක් සත්වයන්ගේ පිරිසුදු බව පිණිසද, හැඬීම් වැලපීම් ඉක්මීමටද, දුක් දොම්නස් දුරු කිරීමටද, දතයුතු දේ දැනගැනීමටද, නිවන් අත්කිරීමටද පවතීද මේ, (යමෙක්) පිහිටවූ

සැදැහැ ඇත්තේ (මෙහි 3 (i) ඡේදය යෙදිය යුතුයි.) යයි යන කාරණයයි (iv) මහණෙනි, මෙය උතුම් දැකීමය කියනු ලැබේ. ඉතා උතුම් දැකීම මෙසේය. ඉතා උතුම් ඇසීම කෙසේවේද,

4. "මහණෙනි, මේ ලොව එකෙක් බෙර හඬ ඇසීමට යේද, වීණා හඬ ඇසීමට යේද, ගී හඬ ඇසීමට යේද, ලොකු කුඩා දෙය වැරදි දැකීම් ඇති, වරදට පැමිණි මහණකුගේ හෝ බමුණකුගේ හෝ බණ ඇසීමට යේද, මහණෙනි, ඒ ඇසීමක් වේද, මෙය නැතැයි නොකියමි. මහණෙනි, එහිද මේ දැකීම වනාහි හීනය (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

5. (මෙහි 3 (i) ඡේදය යෙදිය යුතුයි.) තථාගතයන් හෝ තථාගත ශ්‍රාවකයෙකු හෝ දැක බණ ඇසීමට යේද, මහණෙනි, මෙය ඇසීම් අතර ඒ ඉතා උතුම් ඇසීමය. (මෙහි 3 (iii) යෙදිය යුතුයි.) මෙය ඉතා උතුම් ඇසීමය කියනු ලැබේ. ඉතා උතුම් දැකීම හා ඇසීම මෙසේය. ඉතා උතුම් ලාභය කෙසේද?

6. "මහණෙනි, මේ ලොව එකෙක් දරුවන් ලැබීමද ලබයි භාර්යාවන් ලැබීමද ලබයි. ධනය ලැබීමද ලබයි. ලොකු කුඩා දෙය ලැබීමද ලබයි. වැරදි දැකීම් ඇති, වරදට පැමිණි මහණකු හෝ බමුණකු කෙරෙහි හෝ සැදැහැ උපදවයි. මහණෙනි ඒ ලාභයෙක් වේද, මෙය නැතැයි නොකියමි. මහණෙනි, එහිද මේ ලාභය වනාහි හීනය. (මෙහි 2 (ii) සහ 3 (i) යෙදිය යුතුයි.) මහණෙනි, යම් කිසිවෙක් තථාගතයන් හෝ තථාගත ශ්‍රාවකයන් කෙරෙහි හෝ ශ්‍රද්ධාව ලබාද තැන්පත් ශ්‍රද්ධාව ඇති, තැන්පත් ප්‍රෙමය ඇති, ඒකාන්ත යහපත් ගමනක්වූ අතිශයින් ප්‍රසන්නවූ ඉතා උතුම් ලාභය මෙසේය. ඉතා උතුම් දැකීම, ඉතා උතුම් ඇසීම, ඉතා උතුම් ලැබීම මෙසේය. ඉතා උතුම් හික්මීම කෙසේද?

7 "මහණෙනි, මේ ලොව එකෙක් ඇතු කෙරෙහි හික්මෙයි. අසු කෙරෙහි හික්මෙයි. රිය කෙරෙහි හික්මෙයි. දුනු කෙරෙහි හික්මෙයි, කඩු කෙරෙහි හික්මෙයි, ලොකු කුඩා දෙය කෙරෙහි හෝ හික්මෙයි. වැරදි දැකීම් ඇති වරදට පත් මහණෙකු හෝ බමුණෙකු කෙරෙහි හික්මෙයි. මහණෙනි, මේ හික්මීමක් වේද, මෙය නැතැයි නොකියමි. මහණෙනි, මේ දැකීම වනාහි හීනය.

(මෙහි 2 (ii) සහ 3 (i) යෙදිය යුතුයි.) පිහිටවූ සැදැහැ ඇත්තේ තථාගතයන් වදාළ දහමෙහි හා විනයෙහි උතුම් ශීලයෙහි හික්මේද උතුම් සමාධියෙහි හික්මේද, උතුම් නුවණෙහි හික්මේද, මහණෙනි, මේ උතුම් හික්මීමයයි කියනු ලැබේ. ඉතා උතුම් දැකීම මෙසේය. ඉතා උතුම් ඇසීම මෙසේය. ඉතා උතුම් ලැබීම මෙසේය. ඉතා උතුම් හික්මීම මෙසේය.

8 "ඉතා උතුම් සේවය කෙසේ වේද? මහණෙනි, මේ ලොව එකෙක් රජකු කෙරෙහි සේවය කෙරේද, සිටුවරයකු කෙරෙහි සේවය කෙරේද, ලොකු කුඩා කෙනකු කෙරෙහි හෝ සේවය කෙරේද වැරදි දැකීම ඇති වරදට පත් මහණෙකු හෝ බමුණකු කෙරෙහි සේවය කෙරේද, මෙය නැතැයි නොකියමි. මහණෙනි, එහිද මේ සේවය වනාහි හීනය. (මෙහි 2 (ii) සහ 3 (i) යෙදිය යුතුයි.) මහණෙනි, මෙය උතුම් සේවයයි කියනු ලැබේ. ඉතා උතුම් දැකීම මෙසේය. ඉතා උතුම් ඇසීම මෙසේය. ඉතා උතුම් ලැබීම මෙසේය. ඉතා උතුම් හික්මීම මෙසේය. ඉතා උතුම් සේවය මෙසේය. මහණෙනි, ඉතා උතුම් නැවත නැවත සිහිකිරීම කෙසේද?

**9** "මහණෙනි, මේ ලොව එකෙක් පුතකු ලැබීම නැවත නැවත සිහි කෙරේද, භාර්‍යාවක් ලැබීම නැවත නැවත සිහි කෙරේද, ධනය ලැබීම නැවත නැවත සිහිකෙරේද, ලොකු කුඩා දෙය ලැබීම නැවත නැවත සිහිකෙරේද, වැරදි දැකීම් ඇති වරදට පත් මහණෙකු හෝ බමුණෙකු හෝ සිහිකෙරේද, මෙය නැතැයි නොකියමි. මහණෙනි, එහිද මේ සිහිකිරීම වනාහි හීනය. පහත්ය. පුහුදුන් අයත්ය. ආර්ය නොවේ. වැඩ පිණිස නොවේ. කලකිරීම පිණිස නොවේ. නොඇල්ම පිණිස නොවේ. සිත නිරුද්ධ (නැති) කිරීම පිණිස නොවේ (සිත) සමනය පිණිස නොවේ. විශෙෂ දැනීම පිණිස නොවේ. මනාව දැනීම පිණිස නොවේ. නිවීම පිණිස නොවේ. "මහණෙනි, යමෙක් තෙම වනාහි පිහිටවූ සැදැහැ ඇත්තේ, පිහිටවූ ආදර ඇත්තේ, මනාව පැහැදුනේ තථාගතයන් හෝ තථාගත ශ්‍රාවකයෙකු හෝ සිහි කෙරේද, මහණෙනි, මේ දැකීම අතර ඉතා උතුම්ය.

10. "මහණෙනි, මෙය සත්වයන්ගේ පිරිසිදුවීම පිණිස ශෝක වැළපීම් නැති කිරීම පිණිස දුක් දොම්නස් දුරු කිරීම පිණිස සත්‍යය ලැබීම පිණිස යම් ඒ තථාගතයන් හෝ තථාගත ශ්‍රාවකයන් හෝ සිහි කෙරේද තැන්පත් ශ්‍රද්ධා ඇති තැන්පත් ප්‍රේමය ඇති ඒකාන්ත යහපත් ගමන් ඇති අතිශයින් ප්‍රශන්නවූ මේ ඉතා උතුම් සිහි කිරීම හේතුවේයයි කියමි. ඉතා උතුම් දැකීම මෙසේය. ඉතා උතුම් ඇසීම මෙසේය. ඉතා උතුම් ලැබීම මෙසේය. ඉතා උතුම් හික්මීම ඉතා උතුම් සේවය මෙසේය. මහණෙනි, මේ ඉතා උතුම් සිහි කිරීම වේ. මහණෙනි, මේ උතුම් කරුණු සය වෙති.

---

## 4. දෙවතා වර්ගය.

31. **සෙඛපරිහානධම්ම සූත්‍රය:-** 1. "මහණෙනි, මේ කරුණු සයක් ශෛක්ෂ භික්ෂුවගේ පිරිහීම පිණිස පවතිත්.

2. "කිනම් සයක්ද යත්? නුසුදුසු කර්මාන්තයෙහි ඇලුන බව, කථා බහුලබව, නින්දෙහි ඇලුනබව, පිරිසෙහි ඇලුනබව ඉන්ද්‍රියයන්හි නොවසනලද දොරටු ඇතිබව, ආහාරයෙහි පමණ නොදන්නාබව, යන සයයි."

32. **පඨම අපරිහානියධම්ම සූත්‍රය:-** 1. "මහණෙනි, මේ කරුණු සයක් ශෛක්ෂභික්ෂුවගේ නොපිරිහීම පිණිස පවතිත්.

2. (i) කිනම් සයක්ද යත්? නොසුදුසු කර්මාන්තයෙහි නො ඇලුනබව, කථාබහුල නැතිබව, නින්දෙහි නොඇලුනබව පිරිසෙහි නොඇලුන බව, ඉන්ද්‍රියයන්හි වසනලද දොරටු ඇති බව, ආහාරයෙහි පමණ දන්නාබව යන පසයි."

33. **දුතිය අපරිහානිය සූත්‍රය:-** 1. "ඉක්බිති එක්තරා දේවතාවෙක් මධ්‍යම රාත්‍රිය ඉක්මගිය කල්හි යහපත් වර්ණයෙන් යුක්තව මුළු ජේතවනාරාමය බබුලුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ඒ දෙවතාවා භාග්‍යවතුන් වහන්සේට

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. "ස්වාමීනි, මේ ධර්ම සයක් භික්ෂුවහට නොපිරිහීම පිණිස පවතිත්.

3. "කිනම් සයක්දයත්? ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව ඇති බව, ධර්මයෙහි ගෞරව ඇති බව, සංඝයා කෙරෙහි ගෞරව ඇතිබව, ශික්ෂාවන් කෙරෙහි ගෞරව ඇති බව, අප්‍රමාදයෙහි ගෞරව ඇති බව, පිළිසඳර කථාවෙහි ගෞරව ඇතිබව යන සයයි. (මෙහි 2 ඡේදය යෙදිය යුතුයි.)

4. "ඒ දෙවතාවා මෙසේ කීය. 'ශාස්තෲන්වහන්සේ යහපත්ව අනුදත්සේක.' ඉක්බිති ඒ දෙවතාවා 'ශාස්තෲන් වහන්සේ මගේ වචන පිළිගත්සේකැයි' භාග්‍යවතුන්වහන්සේ වැඳ ප්‍රදක්ෂිණාකොට එහිම අතුරුදහන් වූවාය.

5. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ රාත්‍රිය ඇවෑමෙන් භික්ෂූන් ආමන්ත්‍රණය කළසේක. මහණෙනි, මේ රාත්‍රියෙහි එක්තරා දෙවතාවෙක් රාත්‍රිය ඉක්ම ගිය පසු යහපත් වර්ණ ඇතිව මුළු ජේතවනාරාමය ආලොක කොට මා යම්තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ මා වැඳ එකත්පසෙක සිටියේය. මහණෙනි, එකත්පසෙක සිටි ඒ දෙවතාවා මට මෙසේ කීවාය.

6. "මහණෙනි, මේ කරුණු සයක් මහණහට නොපිරිහීම පිණිස පවතිත්.

7 "කිනම් සයක්දයත්? (මේ වර්ගයේ 2 සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මේ දෙවතාවා මෙසේ කීවාය. මෙය කියා මා වැඳ පැදකුණුකොට එහිම අතුරුදහන් වූයේයයි" වදාළසේක.

> 8 "අප්‍රමාදයට ගරුකරණ මහණතෙම ඉදින් ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගරුකරන්නේද ධර්මයට ගරුකරයිද සංඝයාකෙරෙහි තියුණු ගෞරව ඇත්තේද, පිළිසඳරෙහි ගෞරව ඇත්තේද පිරිහීමට නුසුදුසුය. නිර්වාණය සමීපයෙහිමවේ."

34 1. "මහණෙනි, රාත්‍රියෙහි එක්තරා දේවතාවෙක් රාත්‍රිය ඉක්මවා ගියකල්හි යහපත් වර්ණ ඇතිව මුළු ජේතවනාරාමය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ආලෝකකොට මම යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ මා වැඳ එකත්පසෙක හුන්නේය. මහණෙනි, එකත්පසෙක සිටි ඒ දෙවතාවා මට මෙසේ කීවේය.

2. 'ස්වාමීනි, කරුණු සයක් භික්ෂූහුගේ නොපිරිහීම පිණිස පවතිත්.

3. "කිනම් සයක්ද යත්, ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව ඇතිබව නවලොකොත්තර ධර්මයෙහි ගෞරව ඇති බව, සංඝයා කෙරෙහි ගෞරව ඇති බව, ශික්ෂාපදයන් කෙරෙහි ගෞරව ඇති බව, කීකරු බව, කළ්‍යාණ මිත්‍රයන් ඇති බව යන සයයි. මහණෙනි, මේ දෙවතාවා මෙය කියා මා වැඳ ප්‍රදක්ෂිණාකොට එහිම අතුරුදහන් වූවාය.

4. "ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරවයද ධර්මයෙහි ගෞරවයද සංඝයා කෙරෙහි තියුණු ගෞරවයද ඇත්තේද, ලජ්ජා, භය දෙකින් යුක්ත ගුරු ආශ්‍රය ඇති ගෞරව සහිතවූ ඒ භික්ෂුතෙම පිරිහීමට අයොග්‍යවේ. නිර්වාණයාගේම සමීපයෙහි වේ."

34. **තිස්සබ්‍රහ්ම සූත්‍රයඃ-** 1. "එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬුමහ සිටුහු විසින් කරවා පූජාකරණලද ජෙතවනාරාමයෙහි වාසයකරණ සේක. ඉක්බිති විවේකයට ගිය හුදකලාව වෙසෙන ආයුෂ්මත් මහ මුගලන් තෙරුන්ගේ සිතට මෙසේ සිතිවිල්ලක් පහළවිය.

2. "කිනම් දෙවිකෙනෙකුන්ට අපායට නොවැටෙන ස්වභාවය ඇති, සුගති නියතවූ, නිර්වාණය පිහිටකොට ඇති සෝවාන්වූ වෙමු යයි' මෙබඳු ඥාණයක් වේද" කියායි. ඒ කාලයෙහි තිස්ස නම් බ්‍රහ්ම තෙම කළුරියකොට අලුතවූයේ එක්තරා බ්‍රහ්මලෝකයක උපන්නේවිය. එහිදීද ඔහු මහත් සෘද්ධි ඇති, මහත් ආනුභාව ඇති තිස්ස බ්‍රහ්මයායයි මෙසේ දනිත්. ඉක්බිති ආයුෂ්මත් මහමුගලන් ස්ථවිරතෙමේ යම්සේ බලවත් පුරුෂයෙක් හකුළුවනලද අත දික්කරන්නේද, දික් කරනලද අත හකුළුවන්නේද, එසේ ජේතවනයෙහි අතුරුදහන්වූයේ ඒ බ්‍රහ්මලොකයෙහි පහළවිය. තිස්ස බ්‍රහ්ම තෙමේ දුර සිටම එන

ආයුෂ්මත් මහමුගලන් තෙරුන් දැක්කේය. දැක ආයුෂ්මත් මහමුගලන් තෙරුන්ට 'නිදුකාණනි, මුගලන් ස්ථවිරයෙනි, වඩින්න නිදුකාණෙනි, මුගලන් ස්ථවිරයෙනි, යහපත් පැමිණීමක් වේවා. නිදුකාණෙනි, මුගලන් ස්ථවිරයෙනි, බොහෝ කලකින් ඉර්ධියෙන් ඒම සංඛ්‍යාත මේ ක්‍රමය කෙළේය. නිදුකාණෙනි, මුගලන් ස්ථවිරයෙනි, මේ අස්නක් පැනවීමියයි' කීයේය.

3. ආයුෂ්මත් මහ මුගලන් ස්ථවිරතෙමේ පැනවූ අස්නෙහි හිඳගත්තේය. තිස්ස බ්‍රහ්මතෙමේද ආයුෂ්මත් මහ මුගලන් තෙරුන්ට වැඳ එකත්පසෙක සිටි තිස්ස බ්‍රහ්මයාට ආයුෂ්මත් මහමුගලන් ස්ථවිරතෙම "තිස්සය, කවර දෙවි කෙනෙකුන්ට අපායට නොවැටෙන සුගති නියතවූ නිර්වාණය පිහිටකොට ඇති සෝවාන්වූවමුයයි මෙබඳු ඥාණයක් වේද?'

4. "නිදුකාණෙනි, මුගලන් ස්ථවිරයෙනි, චාතුර්මහා රාජික දෙවියන්ට අපායට නොවැටෙන සුගති නියතවූ නිර්වාණය පිහිටකොට ඇති සෝවාන් වූවෙමුයයි මෙබඳු ඥාණයක්වේද?"

5 "තිස්සය, ඒ සියලු චාතුර්මහාරාජික දෙවියන්ටම අපායට නොවැටෙන සුගති නියතවූ නිර්වාණය පිහිටකොට ඇති සෝවාන් වූවෙමුයයි මෙබඳු ඥාණයෙක් වීය.

5 "නිදුකාණෙනි, මුගලන් ස්ථවිරයෙනි, සියලු චාතුර් මහාරාජික දෙවියන්ට අපායට නොවැටෙන සුගති නියතවූ නිර්වාණය පිහිට කොට ඇති සෝවාන්වූවෙමුයයි මෙසේ නුවණක් නොවේ. (ii) නිදුකාණෙනි මුගලන් ස්ථවිරයෙනි යම් ඒ චාතුර්මහාරාජික දෙවිකෙනෙක් බුදුන් කෙරෙහි නොසෙල්වෙන ශ්‍රද්ධාවෙන් යුක්ත නොවූවාහුද, ධර්මයෙහි නොසෙල්වෙන ශ්‍රද්ධාවෙන් යුක්තනොවූවාහුද සංඝයාකෙරෙහි නොසෙල්වෙන ශ්‍රද්ධාවෙන් යුක්තනොවූවාහුද, ආයර්‍යයන්ට සුදුසු ශීලයෙන් යුක්ත නොවූවාහුද, ඔවුන්ට අපායට නොවැටෙන සුගති නියතවූ නිර්වාණය පිහිටකොට ඇති සෝවාන් වෙමුයයි (iii) මෙබඳු නුවණක් නොවේ. (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) මෙබඳු නුවණක් ඇතිවේ,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

6 "තිස්සය චාතුර්මහාරාජික දෙවියන්ට පමණක් (ii) අපායට නොවැටෙන සුගති නියතවූ නිර්වාණය පිහිටකොට ඇති සෝවාන් වෙමුයයි මෙබඳු නුවණක් වේද (iii) නොහොත් තවුතිසා වැසි දෙවියන්ටත් (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) චාතුර්මහාරාජික වෙනුවටද තාවතිංස, යාම, තුසිත, නිර්මානරතී, පරනිර්මිත වසවර්ති යන පද යොදාද, තව්තිසා වාසිදෙවියන්ටත් යන්නට යාම තුසිත නිර්මානරතී පරනිර්මිත වාසී දෙවියන්ටත් කියාද යොදාගත යුතුයි. (මෙහි 4 (ii) ඡෙදයද 5 ඡෙදයද යෙදිය යුතුයි.) චාතුර්මහාරාජික යන පද වෙනුවට පරනිර්මිත වසවර්ති කියා යොදා ගන්න.)

7 "ඉක්බිති ආයුෂ්මත් මහමුගලන් ස්ථවිරයන් වහන්සේ තිස්ස බ්‍රාහ්මණයාගේ වචනයට සතුටුව පිළිගෙන යම්සේ බලවත් පුරුෂයෙක් හැකුලූ අත දිගු කරන්නේද දික්කල අත හකුළුවන්නේද එසේම බ්‍රහ්ම ලෝකයෙහි අතුරුදහන් වූයේ ජේතවනයෙහි පෙනී සිටිසේක."

35 **විජ්ජාභාගිය ධම්ම සූත්‍රය**:- 1 "මහණෙනි, විද්‍යාව භජනය කරණ මේ කරුණු සයකි.

2 "කිනම් සයක්ද යත්? අනිත්‍ය හැඟීමය, අනිත්‍යයෙහි දුකය යන හැඟීමය, දුකෙහි අනාත්මය යන හැඟීමය, දුරු කරණ හැඟීමය, නොඇලෙන හැඟීමය, නිවණ යන හැඟීමය. (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි)

36 **විවාදමූලක ධම්ම සූත්‍රය**:- 1 "මහණෙනි, මේ විවාදයට මුල් සයක් වෙත්.

2 "කිනම් සයක්ද යත්? ii මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ක්‍රොධකරන්නේ වේද, බද්ධ වෛර ඇත්තේ වේද, මහණෙනි යම් ඒ භික්ෂු නමක් ක්‍රොධ කරන්නේ වේද, බද්ධ වෛර ඇත්තේ වේද, හෙතෙම (ii) ශාස්තෲන් වහන්සේ කෙරෙහිද ගරුනැතිව යටහත් නැතිව වාසය කරයි. ධර්මයෙහිද ගරුනැතිව යටහත් නැතිව වාසය කරයි. සංඝයා කෙරෙහිද ගරු නැතිව යටහත් නැතිව වාසය කරයි. (iii) ශික්ෂාපද සම්පූර්ණ කොට නොරකින්නෙක් වේ.

3. "මහණෙනි, යම් ඒ භික්ෂුනමක්, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) වාසය කරයිද හෙතෙම යම් විවාදයක් බොහෝ දෙනාට අහිත පිණිස බොහෝ දෙනාට නොසැප පිණිස බොහෝ දෙනාට අනර්ථය පිණිස, අහිත පිණිස, දෙව්මිනිසුන්ට දුක් පිණිස සංඝයා අතරෙහි විවාද උපදවයි.

4. "මහණෙනි, තොප විසින් මෙබඳු විවාදයට මුල් කරුණු ඇතුළත හෝ පිටත දක්නහුද මහණෙනි, එහිදී තොප විසින් ඒ පවිටු විවාදයට මුල් කරුණු නැතිකිරීම පිණිස වෑයම් කරව්. මහණෙනි, ඉදින් තොප විසින් මෙබඳු විවාදයන්ට මුල්වූ කරුණු ඇතුළත හෝ පිටත හෝ නොදක්නහු නම්, මහණෙනි, තොප විසින් එහිදී ඒ ලාමක විවාදයට මුල මතු නොවීම පිණිස පිළිපදිව්. මෙසේ මේ ලාමක විවාදයට මුල ප්‍රහීනවීම වේ. මෙසේ මේ ලාමක විවාදයට මුල මතු නොවීම පිණිස වේ.

5. "නැවතද මහණතෙම ගුණමකුවේද, යුගග්‍රාහයෙන් යුක්තද (මෙහි 2 (ii) යෙදිය යුතුයි.

6. නැවතද මහණතෙම ඊර්‍ෂ්‍යාකරයිද, මසුරුවේද, කෛරාටිකවේද, මායාවෙන් යුක්තද, පවිටු අදහස ඇත්තේද, අයහපත් දෘෂ්ටි ඇත්තේද, තම අදහසම අල්වා ගත්තේ වේද, දුරු නොකරන්නේද බැහැරලීමට නොකැමැතිවේද, හෙතෙම (මෙහි 2 (iii) යෙදිය යුතුයි.)

37. **නන්දමාතු දක්ඛිණ සූත්‍රයඃ-** 1. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු මහසිටුහු විසින් කරවා පූජාකළ ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එකල්හි වනාහි වෙළුකණ්ඨකී නන්ද මාතා උපාසිකාව සැරියුත් මුගලන් ප්‍රධාන භික්ෂුසංඝයා කෙරෙහි අංග සයකින් යුත් දනක් දෙයි. භාග්‍යවතුන් වහන්සේ මිනිස් ඇස ඉක්මවා සිටි පිරිසිදුවූ දිවැසින් වෙළුකණ්ඨකීනන්ද මාතාව සැරියුත් මුගලන් දෙනම ප්‍රධාන භික්ෂුසංඝයාට අංග සයකින් යුත් දන දෙන්නීය දුටුසේක. දැක භික්ෂූන් ආමන්ත්‍රණය කළසේක.

2 "මහණෙනි, මේ වේළුකණ්ඨකී නන්ද මාතාවවූ උපාසිකා තොමෝ සැරියුත් මුගලන් දෙනම ප්‍රධාන භික්ෂුසංඝයා කෙරෙහි

අංග සයකින් යුත් දනක් දෙයි. මහණෙනි, දානය කෙසේ නම් අංග සයකින් යුක්තවේද? මහණෙනි, මේ සාසනයෙහි දායකයාට අංග තුනක් වෙත්. ප්‍රතිග්‍රාහකයන්ට අංගතුනක් වෙත්. දායකයාගේ අංගතුන කවරේද?

3. 'මහණෙනි, මේ ශාසනයෙහි දායකතෙම දන්දීමට පූර්වයෙන් සතුටු සිත් ඇත්තේ වේද, දෙමින් සිත පහදවයිද, දී සතුටු සිත් ඇත්තේ වේද මේ දායකයාගේ අංගතුනයි. ප්‍රතිග්‍රාහකයන්ගේ අංග තුන කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ප්‍රතිග්‍රාහකතෙම පහකළ රාග ඇත්තේ හෝ වෙත්ද, රාගය පහකිරීම පිණිස පටන්ගත්තාහු හෝ වෙත්ද, පහකළ ද්වෙෂ ඇත්තෝ හෝ වෙත්ද, ද්වෙෂය පහකිරීම පිණිස පටන්ගත්තාහු හෝ වෙත්ද, පහකළ මුළාව ඇත්තාහු වෙත්ද, මුළාව පහකිරීම පිණිස පිළිපන්නාහු වෙත්ද, මේ ප්‍රතිග්‍රාහකයන්ගේ අංගතුන වෙත්. මේ දායකයාගේ අංග තුනද, ප්‍රතිග්‍රාහකයන්ගේ අංග තුනද වෙත්. මහණෙනි, මෙසේ වනාහි දානය අංග සයකින් යුක්තවේ.

4. "මහණෙනි, මෙසේ අංග හයකින් යුත් දානයාගේ මෙලොව සැප ගෙනදෙන, මතු සැප පිණිස පවතින සැප විපාක ඇති, ස්වර්ගය පිණිස පවතින මෙපමණ පින් රැස්වීමක් මෙපමණ කුසල් රැස්වීමක් යහපත් බවට කාන්තබවට මන මැඩීමට හිත පිණිස, සැප පිණිස පවතිත්යයි පිනේ ප්‍රමාණයක් කිරීමට පහසු නොවේ. තවද ගණන්කළ නොහැකි, ප්‍රමාණකළ නොහැකි මහත් පින් රාශියකැයි ගණනට යයි.

5. "මහණෙනි, යම්සේ මහා සමුද්‍රයෙහි මෙපමණ දිය ලාස් ගණනකැයි කියාද මෙපමණ දිය ලාස් සියයකැයිද මෙපමණ දිය ලාස් දහසකැයිද මෙපමණ දිය ලාස් ලක්ෂයකැයිද දියෙහි ප්‍රමාණයක් කිරීමට නොහැකි වේ. තවද ගණන් කළ නොහැකි, ප්‍රමාණ කළ නොහැකි මහ දිය රාශියකැයි ගණනට යයි. මහණෙනි, එසේම මෙසේ අංග සයකින් යුත් දානයාගේ මෙලොව සැප ගෙනදෙන මතු සැප පිණිස පවතින සැප විපාක ඇති ස්වර්ගය පිණිස පවතින මෙපමණ පින් රැස්වීමක්, මෙපමණ කුශල් රැස්වීමක් යහපත් බවට කාන්තබවට මන වැඩීමට හිත

පිණිස සැප පිණිස, පවතිත් යයි පිනේ ප්‍රමාණයක් කිරීමට පහසු නොවේ. තවද ගණන් කළ නොහැකි ප්‍රමාණ කළ නොහැකි මහත් පින් රාශියකැයි ගණනට යා යයි" වදාළසේක.

6 1. "දීමෙන් පූර්වයෙහිම සතුටු සිත් ඇත්තේද දෙන්නේ සිත පහදවන්නේද දී සතුටු සිත් ඇතිවේද මෝ තොමෝ යාග සංඛ්‍යාත දානයාගේ පරිපූර්ණතා වන්නීය

2. "පහවූ රාගය ඇති පහවූ ද්වෙෂය ඇති පහවූ මොහය ඇති ආශ්‍රව රහිතවූ ශීලයෙන් සංයතවූ බ්‍රහ්මචාරීහු යාග සංඛ්‍යාත දානයට සම්පූර්ණවූ ක්ෂෙත්‍රය වෙත්.

3. "පිදියයුතු හෙයින් යාගයයි කියනලද මේ පරිත්‍යාගය තෙම තමා කෙරෙන්ද අනුන් කෙරෙන්ද මහත්ඵල වෙයි. තමා විසින්ම අත් පා ධොවනයකොට දී ස්වහස්තයෙන් මෙසේ ධාරණ ප්‍රඥා ඇති රත්නත්‍රයෙහි ගුණ අදහන්නාවූ පණ්ඩිතතෙම ලාභ මාත්සය්‍යාදියෙන් මිදුන සිතින් පුදා නිදුක්වූ මහත් සැප සොම්නස් ඇති දිව්‍යලෝකයේ උපදින්නේය."

38. **අත්තකාර පරකාර සූත්‍රය:-** 1. ඉක්බිති නාම ගොත්‍ර වශයෙන් අප්‍රසිද්ධ බ්‍රාහ්මණයෙක් භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග (කථාවෙන්) සතුටුවූයේය. සතුටු විය යුතුවූ සිහි කටයුතුවූ කථාවකොට නිමවා එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ඒ බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේට "භවත් ගෞතමයන් වහන්ස, මම වනාහි තමාගේ වැඩ කරන්නෙක් නැත අනුන්ගේ වැඩ කරන්නෙක් නැතැයි මෙසේ කියන්නෙක්මි. මෙබඳු දෘෂ්ටි ඇත්තෙක්මියි" කීයේය.

2. "මෙසේ කියන්නාවූ මෙබඳු දෘෂ්ටි ඇත්තාවූ බමුණකු නුදුටුයෙමි. නොඇසුයෙමි. තෙමේ ඉදිරියට යද්දී තෙමේ ආපසු එද්දී තමාගේ වැඩ කරන්නෙක් නැත. අනුන්ගේ වැඩ කරන්නෙක් නැතැයි කෙසේ නම් මෙසේ කියයිද, බමුණ ඒ කුමකැයි හඟින්නෙහිද? ප්‍රථමාරම්භ වීය්‍යීයක් ඇත්තේද? "පින්වතුන්වහන්ස, එසේය."

'පටන් ගත් වීර්‍යය ඇති පුද්ගලයන් දකින්ට ලැබෙත්දැ"යි ඇසීය. "පින්වත එසේය."

3 "බමුණ, යම්හෙයකින් පටන්ගත් වීර්‍යය ඇතිකල්හි වෑයම ඇති පුරුෂයන් පෙනෙත්ද, ඒ තෙමේ සත්වයන් අතර තමාගේ වැඩකරන්නෙකි. අනුන්ගේ වැඩ කරන්නෙකි.

4 "බමුණ, ඒ කුමකැයි හඟින්නෙහිද? පටන්ගත් වීර්‍යයට වඩා යම් වීර්‍යයෙන්ම නික්ම වෙන ස්වභාවයක් ඇද්ද? (ii) එසේය, පින්වත"

"නික්මෙන ස්වභාවයක් ඇති කල්හි නික්මෙන සත්වයෝ පෙනෙත්ද? "එසේය ස්වාමීනි" බමුණ යම්හෙයකින් නික්මෙන ස්වභාවයක් ඇති කල්හි නික්මෙන සත්වයෝ පෙනෙද්ද, මේ තෙමේ සත්වයන් අතර තමාගේ වැඩ කරන්නෙකි. අනුන්ගේ වැඩ කරන්නෙකි.

5 බමුණ, ඒ කුමකැයි හඟින්නෙහිද? සොයන වීර්‍යයට වඩා යම් වීර්‍යයෙන්ම නික්මෙන ස්වභාවයක් ඇද්ද (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

6 "බමුණ, ඒ කුමකැයි හඟින්නෙහිද? බලවත් වීර්‍යයට වඩා යම් වීර්‍යයෙන්ම නික්මෙන ස්වභාවයක් ඇද්ද (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

7 "බමුණ, ඒ කුමකැයි හඟින්නෙහිද? ස්ථිර වීර්‍යයෙන් නික්මෙන ස්වභාවයක් ඇද්ද (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

8 "බමුණ, ඒ කුමකැයි හඟින්නෙහිද? උපක්‍රම ස්වභාවයට වඩා යම් ඒ වීර්‍යයෙන්ම නික්මෙන ස්වභාවයක් ඇද්ද මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

9 "මම මෙසේ කියන්නාවූ මෙබඳු දෘෂ්ටියක් ඇත්තාවූ බමුණකු නොදුටුවෙමි. නොඇසුවෙමි. කෙසේ නම් තෙමේ ඉදිරියට යන්නේද ආපසු එන්නේද කෙසේ බොහෝ වැඩ කරන්නෙක්ද, අනුන්ගේ වැඩකරන්නෙක්ද නැත්තේයයි කෙසේ කියන්නේද? (මෙහි 2 අංගුත්තර නිකායේ 10 අසුර වර්ගයේ 51 සූත්‍රයේ 6 ඡේදය මෙනි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**39 කම්මනිදාන සූත්‍රය:-** 1 "මහණෙනි, කර්ම රැස්වීම පිණිස මේ හේතු තුනක් වෙත්.

2 "කිනම් තුනක්ද යත්? කර්ම රැස්වීම පිණිස ලොභය හේතුවක් වෙයි. කර්ම රැස්වීම පිණිස ද්වෙෂය නිදානයක් වෙයි කර්ම රැස්වීම පිණිස මෝහය නිදානයක් වෙයි. මහණෙනි, ලෝභයෙන් අලොභය පහළ නොවේ. මහණෙනි, තවද ලොභයෙන් ලොභයම පහළවෙයි. මහණෙනි, ද්වෙෂයෙන් අද්වෙෂය පහළ නොවේ. මහණෙනි, තවද ද්වෙෂයෙන් ද්වෙෂයම පහළ වේ. මහණෙනි මෝහයෙන් අමෝහය පහළ නොවේ. මහණෙනි, නැවතද මෝහයෙන් මෝහයම පහළවේ.

3 "මහණෙනි, ලොභයෙන් කළ කර්මයෙන් ද්වෙෂයෙන් කළ කර්මයෙන් මොහයෙන් කළ කර්මයෙන් දෙවියෝ නූපදිත්. මනුෂ්‍යයෝ නූපදිත්. අන් යම්කිසි කාම ස්වර්ගවලද නූපදීත්. මහණෙනි, තවද ලෝභයෙන් කළ කර්මයෙන් ද්වෙෂයෙන් කළ කර්මයෙන් නරකයෙහි උපදී. ප්‍රේත ලෝකයෙහි උපදී. යම් අන්කිසි දුගතිවල උපදී. මහණෙනි, කර්ම රැස්වීමට මේ නිදාන තුනයි.

4 (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි.)

5 "කිනම් තුනක්ද යත්? කර්ම රැස්වීම පිණිස අලොභය හේතුවක් වෙයි. කර්මය රැස්වීම පිණිස අද්වෙෂය නිදානයක් වෙයි. කර්මය රැස්වීම පිණිස අමොහය නිදානයක් වෙයි. මහණෙනි, අලොභයෙන් ලොභය පහළ නොවේ. මහණෙනි, අලොභයෙන් අලොභයම පහළ වෙයි. මහණෙනි, අද්වෙෂයෙන් ද්වෙෂයම පහළ නොවෙයි. මහණෙනි, අද්වෙෂයෙන් අද්වෙෂයම පහළ වෙයි. මහණෙනි, අමෝහයෙන් මෝහය පහළ නොවෙයි. මහණෙනි, අමෝහයෙන් අමෝහයම පහළ වෙයි.

"මහණෙනි, තවද අලොභයෙන් උපන් කර්මයෙන් අද්වෙෂයෙන් උපන් කර්මයෙන්, අමෝහයෙන් උපන් කර්මයෙන් දෙවියෝ උපදිත්. මනුෂ්‍යයෝ උපදිත්. අන් කිසියම් සුගතින්හි උපදියි. මහණෙනි, කර්ම රැස්වීමට මේ නිදාන තුනයි"

**40 කිම්බිල පඤ්හ සූත්‍රය**:- 1 "මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කිම්බිලා නුවර මිදෙල්ල වනයෙහි වාසය කරණ සේක. ඉක්බිති ආයුෂ්මත් කිම්බිල ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ආයුෂ්මත් කිම්බිල ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේට,

2 "ස්වාමීනි, තථාගතයන් වහන්සේ පිරිනිවන් පෑ පසු සද්ධර්මය බොහෝ කල් නොපවත්නේ වේද, ඊට හේතු කවරේද ඊට ප්‍රත්‍යය කවරේද?

3. "කිම්බිලය, තථාගතයන් වහන්සේ පිරිනිවන් පෑ පසු භික්ෂූහු, භික්ෂුණීහු, උපාසකවරු, උපාසිකාවෝ ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරව නැත්තෝව යටහත් නැත්තෝව වාසය කරත්. ධර්මයෙහි ගෞරව නැත්තෝව යටහත් නැත්තෝව වාසය කෙරෙත්. සංඝයා කෙරෙහි ගෞරව නැත්තෝව යටහත් නැත්තෝව වාසය කරත්. ශික්ෂා කෙරෙහි ගෞරව නැත්තෝව යටහත් නැත්තෝව වාසය කරත්. අප්‍රමාදයෙහි ගෞරව නැත්තෝව යටහත් නැත්තෝව වාසයකරත්. පිළිසඳර කථාවෙහි ගෞරව නැත්තෝව යටත් නැත්තෝව වාසය කරත්.

5. "කිම්බිලය, තථාගතයන් වහන්සේ පිරිනිවන් පෑපසු යම් කරුණකින් සද්ධර්මය බොහෝකල් නොපවතින්නේවේද, මේ ඊට හේතුය මේ ඊට ප්‍රත්‍යය.

6. "කිම්බිලය, තථාගතයන් වහන්සේ පිරිනිවන් පෑ පසු භික්ෂූහු, භික්ෂූණීහු, උපාසකවරු, උපාසිකාවෝ ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරව ඇත්තෝව යටහත් ඇත්තෝව වාසය කරත් ධර්මයෙහි ගෞරව ඇත්තෝව යටහත් ඇත්තෝව වාසය කරත්. සංඝයාකෙරෙහි ගෞරව ඇත්තෝව යටහත් ඇත්තෝව වාසය කරත්. ශික්ෂා කෙරෙහි ගෞරව ඇත්තෝව යටහත් ඇත්තෝව වාසය කරත්. අප්‍රමාදයෙහි ගෞරව ඇත්තෝව යටහත් ඇත්තෝව වාසය කරත්. පිළිසඳර කථාවෙහි ගෞරව ඇත්තෝව යටත් ඇත්තෝව වාසය කරත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"කිම්බිලය, තථාගතයන් වහන්සේ පිරිනිවන්පෑ පසු යම් කරුණකින් සද්ධර්මය බොහෝකල් පවත්නේවේද, මේ ඊට හේතුය මේ ඊට ප්‍රත්‍යය."

**41. දාරුක්ඛන්ධාධි මුච්චන සූත්‍රයඃ-** 1. "මා විසින් මෙසේ අසනලදී. එක් කාලයෙක්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ රජගහ නුවර ගිජුකුළු පව්වෙහි වාසය කරණසේක. ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ පෙරවරු හැඳ පොරවා පාත්‍ර සිවුරුගෙන බොහෝ භික්ෂූන් සමග ගිජුකුළු පවුවෙන් බසින්නේ එක්තරා තැනක මහත් දර කඳක් දුටුයේය. දැක භික්ෂූන්ට කථාකළහ.

2. "ඇවැත්නි, මේ මහත් දරකඳ දක්නහුද?" "ඇවැත්නි, එසේය"

(i) "ඇවැත්නි, ඍර්ධි ඇති සිත වසඟකරගත් මහණ තෙම කැමැත්තේනම් මේ දරකඳ, (ii) පොළොවම යයි පෙන්වයි. (මෙහි 2 (i) යෙදිය යුතුයි.) ජලයමයයි පෙන්වයි. (මෙහි 2 (i) යෙදිය යුතුයි.) ගින්නමයයි පෙන්වයි. (මෙහි 2 (i) යෙදිය යුතුයි.) වාතයමයයි පෙන්වයි. (මෙහි 2 (i) යෙදිය යුතුයි.) යහපත්යයි පෙන්වයි. (මෙහි 2 (i) යෙදිය යුතුයි. අයහපත්යයි පෙන්වයි.

3. "ඊට හෙතු කවරේද? ඇවැත්නි, යමක් ඇසුකොට ඍර්ධි ඇති සිත වසඟ කෙරෙත් භික්ෂුතෙම යම් අශුභයක් නිසා මේ දරකඳ අශුභයයි සිතුවේද මේ දරකඳෙහි ඒ අශුභ ගතිය ඇත එහෙයිනි."

**42. (නාගිත) යසස මාගම සූත්‍රයඃ-** 1. "මා විසින් මෙසේ අසනලදී. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මහත් භික්ෂු සමූහයක් සමග කොසොල් ජනපදයෙහි චාරිකාවෙහි හැසිරෙන්නේ ඉච්ඡානංගල නම් කොසොල් රටවාසීන්ගේ බමුණුගමක් වේද එහි වැඩිසේක. භාග්‍යවතුන් වහන්සේ එහි ඉච්ඡානංගල වනලැහැබෙහි වාසය කරණසේක.

2. "ඉච්ඡානංගල වාසී බමුණු ගෘහපතියෝ ශාක්‍යපුත්‍රවූ ශාක්‍යකුලයෙන් මහණවූ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ

ඉච්ඡානංගලයට වැඩියේ ඉච්ඡානංගල ගමෙහි ඉච්ඡානංගල වනලැහැබෙහි වාසය කෙරෙත්යයි ඇසුවාහුය. ඒ භාග්‍යවත් ගෞතමයන් වහන්සේ (මෙහි 1 ආහුණෙය්‍ය වර්ගයේ 10 සූත්‍රයේ 2 (ii) ඡේදය යෙදිය යුතුයි.) ඒ භාග්‍යවතුන් වහන්සේගේ යහපත් කීර්තිරාවයක් පැන නැංගේය. උන්වහන්සේ දෙවියන් සහිත මරුන් සහිත රහතන්ගේ දැක්ම සුදුසු වන්නේයයි කියායි.

3. ඉක්බිති ඉච්ඡානංගලිකවූ බමුණු ගැහැවියෝ ඒ රාත්‍රිය ඇවෑමෙන් බොහෝ කෑ යුතු බුදියයුතු දෑ රැගෙන ඉච්ඡානංගල වනලැහැබ යම් තැනෙක්හිද එහි පැමිණියාහුය. පැමිණ උස්හඬ මහ හඬ ඇතිව දොරටුවෙන් පිට පියස්ස යට සිටියාහුය. ඒ කාලයෙහි ආයුෂ්මත් නාගිත ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ උපස්ථායකයා විය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් නාගිත තෙරුන්ට නාගිතය, මසුන් අල්ලන කේවට්ටයින්ගේ වැනි ඒ උස් හඬ, මහ හඬ කුමක්දැයි ඇසූසේක

"ස්වාමීනි, මේ ඉච්ඡානංගලයෙහි බ්‍රාහ්මණ ගෘහපතියෝ භාග්‍යවතුන් වහන්සේටද, භික්ෂුසංඝයාටද, බොහෝ අනුභව කළයුතු බුදිය යුතු දේ රැගෙන දොරටුවෙන් පිට පියස්ස යට සිටියාහුය."

"නාගිතය, යසස සමග මම එක්වීමක් නැත. මා සමග යසස එක්වන්නේත් නැත. නාගිතය, යම්කෙනෙක් මේ නෛෂ්ක්‍රම්‍ය සැපය උසස් විවේක සැපය සන්සුන් සැපය නිවන් සැපය පහසුවෙන් නොලබන්නේද, නිදුකින් නොලබන්නේද මම ඒ යම් නෛෂ්ක්‍රම්‍ය සැපයක් උසස් විවේක සැපයක් සන්සුන් සැපයක් නිවන් සැපයක් පහසුවෙන් ලබන්නේ වෙමි, නිදුකින් ලබන්නේ වෙමි, හෙතෙම ඒ (ලෝකයා විසින් දෙන) අපවිත්‍ර නිදිබර ලාභ සත්කාර කීර්ති සැපය ඉවසන්නේයයි" වදාළ සේක.

"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, දැන් යමකින් යමකින්ම කල්ගත කරන්නේද බමුණු ගෘහපතියෝද නියම්ගම් දනවු වැස්සෝද ඊට නැමුනාහු වෙත්. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, දැන් ඉවසාවා, සුගතයන් වහන්සේ ඉවසාවා ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේට දැන් පිළිගැනීමට කල්ය.

"ස්වාමීනි, යම්සේ ලොකු වැසිබින්දු ඇති වර්ෂාව වසින කල්හි බෑවුම අනුව ජලය යත්ද' ස්වාමීනි, එසේම යමකින් යමකින්ම භාග්‍යවතුන්සේ යැපෙයිද බමුණු ගෘහපතියෝද නියම්ගම් දනවු වැස්සෝද ඊට නැමුනාහුම වෙත්. ඊට හේතු කවරේද, ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේගේ ශීලයෙන් ප්‍රකට වීම එසේමය. නාගිතය, යසස සමග මම එක්වීමක් නැත. මා සමග යසස එක්වන්නේත් නැත. නාගිතය යම්කෙනෙක් මේ නෛෂ්ක්‍රම්‍ය සැපය උසස් විවේක සැපය සන්සුන් සැපය නිවන් සැපය පහසුවෙන් නොලබන්නේද, දුකින් ලබන්නේද මම ඒ යම් නෛෂ්ක්‍රම්‍ය සැපයක් උසස් විවේක සැපයක් සන්සුන් සැපයක් නිවන් සැපයක් පහසුවෙන් ලබන්නේ වෙමි, නිදුකින් ලබන්නේ වෙමි, හෙතෙම ඒ (ලෝකය විසින් දෙන) අපවිත්‍ර, නිදිබර ලාභ සත්කාර කීර්ති සැපය ඉවසන්නේයයි" වදාළසේක. නාගිතය, මම ගමෙහි වාසය කරණ සමාධිගත සිත් ඇතිව සිටින භික්ෂුවක් දකිමි. නාගිතය, දැන් මේ ආයුෂ්මතුන් ආරාමයෙහි සිටින්නෙක් හෝ සාමණේර නමක් හෝ නැගිටුවන්නේය. ඒ සමාධියෙන් ඔහු මුදවන්නේයයි ඒ මට මෙසේ සිතක්වෙයි. නාගිතය, ඒ කාරණයෙන් මම ඒ භික්ෂුවගේ අරණ්‍යවාසය කැමති නොවෙමි.

"නාගිතය, අරණ්‍යවාසීවූ අරණ්‍යයෙහි නිදිමෙන් සිටි භික්ෂුවක් දකිමි. නාගිතය දැන් මේ ආයුෂ්මත් තෙමේ, මේ නිදි ක්ලාන්තගතිය දුරුකොට අරණ්‍යය යන හැඟීමම එකඟ බවම මෙනෙහි කරන්නේයයි' ඒ මට මේ සිත වේ. නාගිතය, ඒ කාරණයෙන් ඒ මහණහට අරණ්‍යයෙහි වාසයෙන් සතුටු වෙමි. නාගිතය, මම මේ ලොවෙහි අරණ්‍යවාසීවූ අරණ්‍යයෙහි සිත එකඟනොව සිටියාවූ භික්ෂුවක් දකිමි. නාගිතය, 'ඒ මට දැන් මේ ආයුෂ්මත්තෙමේ එකඟනොවූ සිත එකඟ කරන්නේය. එකඟවූ සිත ආරක්ෂා කරන්නේයයි' මෙසේ සිතක් වෙයි. නාගිතය, ඒ කරණකොට ගෙන මම ඒ මහණහට අරණ්‍යයෙහි විසීමෙන් සතුටුවෙමි. නාගිතය මෙහි මම අරණ්‍යවාසීවූ අරණ්‍යයෙහි සිත එකඟ කර සිටි භික්ෂුවක් දකිමි. නාගිතය, දැන් මේ ආයුෂ්මත් තෙමේ 'කෙලෙසුන්ගෙන් නොමිදුනු සිත

කෙලෙසුන්ගෙන් මුදන්නේය. මිදුනු සිත රකින්නේයයි' මෙබඳු සිතක්වෙයි නාගිතය ඒ කරණ කොටගෙණ මම ඒ භික්ෂුවගේ අරණ්‍ය වාසයෙන් සතුටුවෙමි.

"නාගිතය, මම මෙහි ගමෙහි වාසය කරණ සිවුරු පිණ්ඩපාත සෙනසුන් ගිලන්පස බෙහෙත් බඩු ලබන්නාවූ භික්ෂුවක් දකිමි. හෙතෙම ඒ ලාභ සත්කාර කීර්ති බලාපොරොත්තුවෙමින් විවේකය අත්හරියි. අරණ්‍යයෙහි වනයෙහිවූ ඈත සෙනසුන් අත්හරියි. ගම් නියම්ගම් රාජධානිවලට බැස වාසය කරයි. නාගිතය, මම ඒ භික්ෂුවගේ ගමෙහි වාසය කිරීමෙන් සතුටු නොවෙමි. නාගිතය, මෙහි අරණ්‍යයෙහිවූ සිවුරු පිණ්ඩපාත සෙනසුන් ගිලන්පස බෙහෙත් බඩු ලබන්නාවූ භික්ෂුවක් දකිමි. හෙතෙම ඒ ලාභ සත්කාර කීර්තියට සතුටුවී විවේකය අත්නොහරියි. අරණ්‍යයෙහි (වනයෙහි) පිහිටි ඈත සෙනසුන් අත්නොහරියි. නාගිතය, ඒ හේතුවෙන් මම ඒ භික්ෂුවගේ අරණ්‍යයෙහි විසීමෙන් සතුටු වෙමි. නාගිතය යම් කාලයෙක්හි මම දීර්ඝ මාර්ගයට බැස්සේ ඉදිරිපිටින් හෝ පසුපසින් හෝ කිසිවෙකු නොදක්නේ නම් නාගිතය, ඒ කාලයෙහි මට යටත් පිරිසෙයින් මළමුත්‍ර පහකිරීමට පවා පහසුයයි" වදාළසේක.

**සතරවෙනි දෙවතාවර්ගය නිමි.**

---

## 5 ධම්මික වර්ගය.

43. **සෙතනාග සූත්‍රයඃ**- 1 "එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසනසේක. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු රැගෙන සැවැත්නුවර පිඬු පිණිස හැසුරුණසේක. සැවැත්නුවර පිඬු පිණිස හැසිර පිණ්ඩපාතයෙන් වැළකුනේ සවස්කාලයෙහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට ඇමතුසේක. "ආනන්දය, යමු. මිගාරමාතුපාසාද නම් පූර්වාරාමය යම්තැනකද දිවාවිහරණය පිණිස එහි එළඹෙන්නෙමු"

'එසේය, ස්වාමීනියි" ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්හ.

2 "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ සමග මිගාර මාතු පාසාද නම් පූර්වාරාමය යම් තැනකද, එතැන්හි පැමිණිසේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි විවේකයෙන් නැගිටිසේක් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට ඇමතූසේක. "ආනන්දය, යමු පෙරදිග ජලකොටුව යම්තැනෙකද ඇඟ සේදීමට එහි යමු- "එසේය, ස්වාමීනියි" ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්හ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ සමග පෙරදිග ජලකොටුව යම්තැනකද ඇඟ සේදීමට එතැන්හි පැමිණිසේක. පෙරදිග ජල කොටුවෙහි ඇඟ සෝදා ගොඩනැගී ශරීරයේ තෙත සිඳවමින් අඳන සිවුර පමණක් ඇතිව වැඩ සිටිසේක. එසමයෙහි පසේනදී කොසොල් රජුගේ සෙත නම් ඇතා මහාතූර්‍යවාදන සහිතව ජල කොටුවෙන් ගොඩනගියි. මහජනතෙම ඒ ඇතා දැක 'රජුගේ මේ ඇතා දැකුම්කලුය. රජුගේ මේ ඇතා මනා රූ ඇත්තේය. රජුගේ මේ ඇතා දුටුවන් පහදවන්නේය. රජුගේ මේ ඇතා හොඳ ශරීරයකින් යුක්තයයි' මෙසේ කීකල්හි ආයුෂ්මත් උදායි ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළේය.

3 "ස්වාමීනි, මහත්වූ ශරීරයක් ඇති ඇතාම දැක ජන තෙම 'පින්වතුනි, ඇතෙක්යයි' කීයේද, නැතහොත් අනික් මහත් ශරීරයක් ඇති වෙන කෙනෙකු දැක 'පින්වතුනි, ඇතෙක්යයි' කීයේද?"

4 "උදායීනි, මහත්වූ ශරීරයක් ඇති ඇතෙකු හෝ දැක ජනතෙම 'ඇතෙක්ය! ඇතෙක්ය!' කියන්නේය. මහත්වූ ශරීරයක් ඇති අශ්වයකු හෝ දැක ජනතෙම 'ඇතෙක්ය, ඇතෙක්යයි' කියන්නේය. මහත්වූ ශරීරයක් ඇති ගොනෙකු හෝ දැක මහජනතෙම 'ඇතෙක්ය! ඇතෙක්යයි' කියන්නේය. උදායීනි, මහත්වූ ශරීරයක් ඇති සර්පයෙකු හෝ දැක මහජනතෙම

'ඇතෙක්ය ඇතෙක්යයි' කියන්නේය. මහත්වූ කඳක් ඇති ගසක් හෝ දැක මහජන තෙම 'ඇතෙක්ය! ඇතෙක්යයි' කියන්නේය. උදායීනි' මහත්වූ ශරීරයක් ඇති මිනිසකු හෝ දැක මහජනතෙම 'ඇතෙක්ය! ඇතෙක්යයි' කියන්නේය.

5 "උදායීනි, එසේ නමුදු යමෙක් දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයෙහි ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත ප්‍රජාවෙහි දෙවි මිනිසුන් අතරෙහි කයින් සිතින් හෝ වචනයෙන් වැරදි නොකෙරේද, මම ඔහුට ඇතෙක්යයි. (නාගයයි) කියමි."

6 "ස්වාමීනි, පුදුමයකි. ස්වාමීනි හේ නොවූ දෙයකි යම් යහපත් වචනයක් භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරණ ලද්දේය. (මෙහි 5 ඡේදය යෙදිය යුතුයි.) ස්වාමීනි මම මේ භාග්‍යවතුන් වහන්සේගේ යහපත් වචනය මේ ගාථා වලින් අනුමෝදන් වෙමි

7. (i) "තමා විසින් දැමුනාවූ එකඟවූ නිවන් මගෙහි වසන්නාවූ සිත සන්සිඳවීමෙහි ඇළුනාවූ මනුෂ්‍යවූ සියලු ධර්මයන්ගේ පරතෙරට ගියාවූ සම්‍යක් සම්බුද්ධවූ යමකු මනුෂ්‍යයෝ නමස්කාර කෙරෙද්ද, සියලු සංයෝජනයන් ඉක්මෙව්වාවූ ක්ලෙශ වනයෙන් නික්ම ක්ලෙශ වන රහිත නිර්වාණයට පැමිණියාවූ කාමයන් කෙරෙහි නික්මීමෙහි ඇලුනාවූ මේරු පර්වතයෙන් නිකුත් ස්වර්ණයට බඳු පැහැඇති උන්වහන්සේට දෙවියෝද නමස්කාර කරත්යයි මෙසේ අර්හත්වූ ඔබවහන්සේ සමීපයෙහි මා විසින් අසන ලද්දේය.

(2) "බුද්ධ නාගතෙම (ඇත්තෙම) අන්‍යවූ පර්වතයන් මැඩ බබලන්නාවූ හිමාලය පර්වත රාජයා සේ සියලු සත්වයන් ඉක්මවා බබලන සුලුය. නාග නම් ඇති එයට උතුම් අන්‍යයකු නැති සත්‍ය නම් ඇත්තේය.

(3) "යුෂ්මතුන්ට බුද්ධනාගයා ප්‍රකාශ කරන්නෙමි. ඒ බුද්ධ නාගතෙම පාපය නොකරනසේක. බුද්ධ නාගයාගේ ශුද්ධශීලයද කරුණාවද යන දෙක පාදයෝ වෙත්.

(4) "ධුතංග සමාදානයද ආයර්‍ය මාර්ග ශීලයද යන දෙක බුද්ධ නාගයාගේ අනික් පාදයෝ වෙත්. ඒ මහෝත්තම තෙම ශ්‍රද්ධාමයවූ සොඬින් යුක්තය. අංග සයක් ඇති උපෙක්ෂාමයවූ දළයෙන් යුක්තවේ.

(5) "හිස ආදියට බෙල්ල ආධාර මෙන් බුද්ධනාගයාගේ සෙසු ධර්මයන්ට සිහිය ග්‍රීවය වේ. බුද්ධනාගයාගේ සියලු ධර්මයන් දන්නාවූ සර්වඥතාඥාන හිස ඇත්තේ වේ. බුද්ධනාගයාගේ දහම් කොටස් පිරිසිඳ දැනගන්නාවූ දහම් සිතිවිලි නමැති සොඬ අග වන්නේය. ධ්‍යාන සමාධිය කුස නම් වන්නේය. ඒ බුද්ධ නාගයාහට විවේකය නමැති වාලධිය ඇත්තේය.

(6) "ඒ බුද්ධනාගතෙම ධ්‍යාන ඇත්තේය. ඵල සමාපත්තියෙහි ඇලීම ඇත්තේය. අධ්‍යාත්මයෙහි මනාව පිහිටවූ සිත් ඇත්තේය. බුද්ධ නාගතෙම වඩින්නේද එකඟවූයේය. සිටියේද එකඟවූයේය. බුද්ධනාගතෙම සැතපෙන්නේද එකඟවූයේය. වැඩසිටියේද එකඟවූයේය.

(7) "බුද්ධනාගතෙම සැතපෙන්නේද එකඟවූයේය. වැඩහුන්නේද එකඟවූයේය. බුද්ධනාගතෙම සෑම ඉරියව්වෙහිම සංවර ඇත්තේය. බුද්ධනාගයාගේ මේ සම්පූර්ණ බව වේ.

(8) "නිවැරදිවූ භොජනයෙන් වළඳනසේක. දොෂ සහිත භෝජනයන් නොවළඳනසේක. චීවර පිණ්ඩපාතය ලැබ එකතුකොට තැබීම දුරුකරන්නේය.

(9) "කුඩාවූද මහත්වූද සංයෝජනයයි කියනලද සියලු සංසාර බන්ධනය සිඳ යම් යම් දිශාභාගයක වඩින සේක්ද, ලෞකික බලාපොරොත්තු නැතිවම වඩින සේක.

(10) "යම්සේ ජලයෙහි හටගත් පිරිසිදු සුවඳ ඇති සිත්කලුවූ හෙළ පියුම වැඩේද ජලයෙන් උඩම සිටීද එපරිද්දෙන්ම මේ ලෝකයෙහි මනාව උපන්නාවූ සර්වඥ තෙම සත්වයා කෙරෙහි නොඇලෙයි. ලොකයා සමග ඇලී නොසිටිනසේක. ජලය හා නොගැටෙන පියුම මෙනි.

(11) "දැල්වෙන්නාවූ මහා ගිනිකඳ ගින්න වැඩීමට හේතු වන දේ නොලැබීමෙන් නිවේද, එමෙන්ම සංස්කාරයන් සන්සිඳුන කල්හි නිවුනේයයි කියනු ලැබේ.

(12) අර්ථය අඟවන්නාවූ මේ උපමාව නුවණැත්තාවූ කාලුදායි ස්ථවිරයන් විසින් (මෙයට පෙර) දෙශනා කරණලදී. කාළුදායි ස්ථවිරයන් විසින් දෙශනා කරණ ලද බුද්ධ නාගයා මහෝත්තමයෝ විශෙෂයෙන් දැන ගන්නාහුය.

(13) "පහවූ රාගය ඇතිව පහවූ ද්වෙෂය ඇති පහවූ මොහය ඇති සෙසු කෙලෙස් නැති බුද්ධනාගතෙම ශරීරය දුරුකරන්නේ ක්ලේශ පරිනිර්වාණයෙන් පිරිනිවි හෙයින් ස්කන්ධ පරිනිර්වාණයෙන්ද පිරිනිවෙන්නේය."

**44. මිගසාල සූත්‍රයඃ-** 1. "ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු රැගෙන මිගශාලා නම් උපාසිකාවගේ නිවාසය යම් තැනෙකද එතැන්හි පැමිණියහ. පැමිණ, පැනවූ අස්නෙහි වැඩහුන්හ. ඉක්බිති මිගශාලා උපාසිකාතොමෝ ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම් තැනකද එතැන්හි පැමිණියාය. පැමිණ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියාය. එසේ සිටියාවූ මිගශාලා උපාසිකාතොමෝ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙය සැළකළාය.

2. "ස්වාමීනි, ආනන්ද ස්ථවිරයන්වහන්ස, යම්සේ වනාහි බ්‍රහ්මචාරීද අබ්‍රහ්මචාරීද යන දෙදෙනා පරලොව සමසම ගති ඇතිවන්නාහු යයි භාග්‍යවතුන් වහන්සේ විසින් වෙනස්වූ ධර්මයක් කෙසේ කෙසේ නම් දෙශනාකරණ ලද්දේද? (ii) ස්වාමීනි, පුරාණ නම් වූ මාගේ පියා ග්‍රාම්‍ය ධර්මයක්වූ මෛථුන සේවනයයෙන් බොහෝ ඈත්වූ බඹසර ඇත්තෙක්විය. හෙතෙම කාලක්‍රියා කළේ සකෘදාගාමී කෙනෙක්ව තුෂිත දිව්‍යලෝකයෙහි උපන්නේයයි භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරණලදී. ස්වාමීනි, මට ප්‍රියවූ පිය පරම්පරාවෙන් පැවතෙන ගරුකටයුතු ඉසිදත්තතෙමේ ස්වකීය භාය්‍ය්‍යාවගෙන් සතුටුවූ

අබ්‍රහ්මචාරීකෙනෙක් විය. හෙතෙමේද කාලක්‍රියාකළේ සකෘදාගාමීව තුෂිත දෙව්ලොව උපන්නේයයි භාග්‍යවතුන් වහන්සේ විසින් (iii) දෙශනා කරණලදී. (මෙහි 2 (i) යෙදිය යුතුයි.)

"සොහොයුරිය, මෙසේම භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනාකරණ ලද්දේද?" ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ මිගශාලා උපාසිකාවගේ නිවාසයෙන් පිණ්ඩපාතය රැගෙන අස්නෙන් නැගිට වැඩියහ.

3. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ පිණ්ඩපාතයෙන් වැලකුනේ සවස් කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැන්හි පැමිණියහ. එකත්පසෙක හුන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළහ.

"ස්වාමීනි, මම පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු රැගෙන මිගශාලා උපාසිකාවගේ නිවාසය යම්තැනකද එතැන්හි පැමිණියෙමි. පැමිණ, පැනවූ අස්නෙහි හිඳගතිමි. ස්වාමීනි, ඉක්බිති මිගශාලා උපාසිකාතොමෝ මා යම්තැනකද එතැන්හි පැමිණියාය. පැමිණ මා වැඳ එකත්පසෙක සිටියාය. එකත්පසෙක සිටියාවූ මිගශාලා උපිසාකා තොමෝ මට මෙය සැළකළාය. (මෙහි 2 ඡෙදය යෙදිය යුතුයි) ස්වාමීනි, මෙසේ කීකල්හි මම මිගශාලා උපාසිකාවට මෙසේ කීමි. 'සොහොයුරිය මෙසේම භාග්‍යවතුන් වහන්සේ දෙශනා කරන ලද්දේද?" යනුවෙනි.

4. "ආනන්දය, පුරුෂ පුද්ගලයන් තෝරා කීමේ නුවණෙහි මිගශාලා උපාසිකාව මෝඩය, අව්‍යක්තය, ලාමක ප්‍රඥා ඇත්තීය. ආනන්දය, ලෝකයෙහි මේ පුද්ගලයෝ සදෙනෙක් වෙති, කවර සදෙනෙක්ද? ආනන්දය, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් හික්මුනේ යහපත් වාසය ඇත්තේ සබ්‍රහ්මචාරීන් හා එකතුව වාසයෙන් සතුටු වෙයි. හෙතෙම ඇසීමෙන්ද කටයුතු දේ නොකළේ වෙයි. බහුශ්‍රැත භාවයෙන්ද නොකළේ වෙයි. දෘෂ්ටියෙන්ද නොකළේ වෙයි. තැන්පත්වූ විමුක්තිය නොලබයි.

හෙතෙම කායයාගේ බිඳීමෙන් මරණින් මතු පිරිහීමට පැමිණෙයි. උසස් බව පිණිස නොපැමිණෙයි. හානගාමී වෙයි. විශෙෂගාමී නොවේ. ආනන්දය මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් හික්මුනේ යහපත් වාසය ඇත්තේ සබ්‍රහ්මචාරීන් හා එකතුව විසීමෙන් සතුටු වෙයි. හෙතෙම ශ්‍රවණයෙන්ද කටයුතු දේ කළේ වෙයි. බහුශ්‍රැත භාවයෙන්ද කළේ වෙයි. දෘෂ්ටියෙන්ද අවබොධ කළේ වෙයි. තැන්පත්වූ විමුක්තිය ලබයි. හෙතෙම කායයාගේ බිඳීමෙන් මරණින් මතු උසස් බව පිණිස යෙදෙයි. පිරිහීම පිණිස නොවේ. විශෙෂගාමී වෙයි. හානභාගී නොවේ. ආනන්දය, මෙහි නියම ප්‍රමාණය ප්‍රමාණ කළේය. මොහු හටද ඒ ධර්මයෝමය. අන්‍යයාටද ඒ ධර්මයෝමය.

5 "කුමක් හෙයින් එක් අයෙක් හීන වූයේද එක්අයෙක් උසස් වූයේද, ආනන්දය, මෙය ඔවුන්ට දිගු කලක් අහිත පිණිස දුක් පිණිස පවතියි. ආනන්දය, මෙහි යම් ඒ පුද්ගලයෙක් යහපත් හික්මීම් ඇත්තේ සැපවත් එකතුවීම් ඇත්තේ සබ්‍රහ්මචාරීන් හා එකතුව විසීමෙන් සතුටුවෙයි. හෙතෙම ඇසීමෙන්ද කළයුතු දේ කළේ වෙයි තැන්පත්වූ විමුක්තියද ලබයි. ආනන්දය, මේ පුද්ගලයා මුලින් කී ඒ පුද්ගලයාට වඩා උසස් වූයේද ප්‍රණීතතර වූයේද වෙයි. එයට හේතු කවරේද? ආනන්දය මේ පුද්ගලයා ධර්මය නමැති කණ ඇති කර ගනියි. මේ පුද්ගලයා තථාගතයන් වහන්සේ හැර කවරෙක් දැන ගන්නේද? ආනන්දය, එහෙයින් පුද්ගලයන් ප්‍රමාණ නොකරන්න. පුද්ගලයන් කෙරෙහි ප්‍රමාණය නොගන්න මේ ලෝකයෙහි පුද්ගලයන් ප්‍රමාණයට ගන්නා පීඩාවට පැමිණේ. ආනන්දය, මම පුද්ගලයන් ප්‍රමාණ කරන්නෙමි. මා වැනි අන් කෙනෙක් හෝ ප්‍රමාණ කරන්නේය.

6. (i) "ආනන්දය, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙකුට ක්‍රොධය හා මානය පිහිටියාහු වෙද්ද, කලින් කල ඔහුට ලොභ ධර්මයෝ උපදිත්. ඔහු ඇසීමෙන්ද කටයුතු දේ නොකළේ වෙයි. (ii) බහුශ්‍රැත භාවයෙන්ද නොකළේ වෙයි. දෘෂ්ටියෙන්ද අවබොධ නොකළේ වෙයි. තැන්පත් විමුක්තියද නොලබයි. හෙතෙම කායයාගේ බිඳීමෙන් මරණින් මතු පිරිහීමට පැමිණෙයි. උසස් බවට නොපැමිණෙයි. "හානගාමි වෙයි. විශෙෂගාමී නොවේ."

7 "ආනන්දය, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙකුට ක්‍රොධය හා මානය පිහිටියාහු වෙද්ද කලින් කල ඔහුට ලොභ ධර්මයෝ උපදිත්. ඔහු ඇසීමෙන්ද කළයුතු දේ කළේ වෙයි. හෙතෙම කායයාගේ බිඳීමෙන් මරණින් මතු පිරිහීමට පැමිණෙයි. උසස්වීමට නොපැමිණෙයි. හානගාමි වෙයි. විශෙෂගාමී නොවෙයි.

8 "ආනන්දය, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙකුට ක්‍රොධය හා මානය පිහිටියාහු වෙද්ද කලින් කල ඔහුට වචන ඉපදීමට උපකාර වන විතර්කයෝ උපදිත්. (මෙහි 6 ඡෙදයේ (ii) කොටස යෙදිය යුතුයි.)

9 (i) "ආනන්දය, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙකුට ක්‍රොධය හා මානය පිහිටියාහු වෙද්ද කලින් කල ඔහුට වචන ඉපදීමට උපකාරවන විතර්කයෝ උපදිත්. (ii) ඔහු ඇසීමෙන්ද කළයුතු දේ කළේ වෙයි. (මෙහි 6 ඡෙදයේ (ii) යෙදිය යුතුයි.) විශෙෂගාමී වෙයි. හානගාමී නොවේ. ආනන්දය, මෙහි නියම ප්‍රමාණය ප්‍රමාණ කළේය. මොහුහටද ඒ ධර්මයෝමය. අන්‍යයාටද ඒ ධර්මයෝමය. ආනන්දය, මෙහි යම් පුද්ගලයෙකුට ක්‍රොධය හා මානය උපන්නාහු වෙද්ද, කලින් කල ඔහුට වචන ඉපදීමට උපකාරවන විතර්කයෝ උපදිත්. (මෙහි 9 (ii) යෙදිය යුතුයි.)

10 "ආනන්දය, පුරුෂ පුද්ගලයන් තෝරා කීමේ නුවණෙහි මිගශාලා උපාසිකාව මෝඩය, අව්‍යක්තය, ලාමක ප්‍රඥා ඇත්තීය. ආනන්දය, මේ පුද්ගලයෝ සයදෙන ලෝකයෙහි විද්‍යමානවෙත්. ආනන්දය යම්බඳු ශීලයකින් පුරාණතෙමේ යුක්තවූයේ නම් එබඳු සීලයෙන් ඉසිදත්ත තෙමේ යුක්තනුවූයේය. මේ ලෝකයෙහි පුරාණතෙමේ ඉසිදත්තට වඩා ගතියෙන්ද වෙනස්ය. එබඳුවූ ප්‍රඥාවකින් පුරාණතෙම යුක්ත නොවූයේය. මේ ලෝකයෙහි ඉසිදත්තතෙමේ පුරාණට වඩා ගතියෙන්ද වෙනස්ය. මහණෙනි, මෙසේ වනාහි මේ පුද්ගලයන් දෙදෙනා එක් අංගයකින් වෙනස්ය."

45 දාළිද්දිය සූත්‍රයː- 1 "මහණෙනි, ලෝකයෙහි කාම භොගියාට දිළිඳුකම දුකකි."-"එසේය ස්වාමීනි,"

"මහණෙනි, යම් ඒ අසරණවූ දිළින්දෙක් වේ නම් ණය ගනියි. මහණෙනි, ලෝකයෙහි කාමභොගියාට ගත් ණයදීමද දුකකි. අසරණවූ දිළින්දා ණය රැගෙන පොළිය දීමට පොරොන්දු වෙයි. මහණෙනි, පොළිය දීමද මේ ලෝකයෙහි අසරණවූ දිළින්දාට දුකකි."-"එසේය, ස්වාමීනි."

2 "මහණෙනි, යම් ඒ අසරණවූ දිළින්දා පොලිය අසා ඔහුට දොස් පැවරුවේ නමුදු කලක් එකතුවූ පොළිය නොදෙයි. මහණෙනි, චෝදනාවද ලෝකයෙහි කාමභොගියාට දුකකි"-- "එසේය, ස්වාමීනි."

3 "මහණෙනි, යම් ඒ අසරණවූ දිළින්දා ඔහු පසුපස ගොස් දොස් කීවේ නමුදු නොදෙයි, මහණෙනි, ණය හිමියා ඔහු පසුපස යාමද ලෝකයෙහි කාමභොගියාට දුකකි"--"එසේය ස්වාමීනි"

4 "මහණෙනි, යම් ඒ අසරණ දිළින්දා පසුපස ගොස් බැන්දේ නමුදු නොදෙයි. මහණෙනි, බන්ධනයද ලෝකයෙහි කාමභොගියාට දුකකි."--"එසේය ස්වාමීනි"

5 "මහණෙනි, එමෙන්ම යම් කිසිවෙකුට කුශල ධර්මයන්හි ශ්‍රද්ධාව නැත්තේද, කුශල ධර්මයන් නොකළේයයි ලජ්ජාව නැත්තේද, කුශල ධර්මයන් නොකළේයයි භය නැත්තේද, කුශල ධර්මයන්හි වීය්‍ය්‍ය නැත්තේද, කුශල ධර්මයන්හි ප්‍රඥාව නැත්තේද, මහණෙනි, මෙය ආය්‍ය්‍ය විනයෙහි අසරණවූ දිළිඳුකමයයි කියනු ලැබේ. මහණෙනි, යම් ඒ දිළින්දා කුශල ධර්මයන්හි ශ්‍රද්ධාව නැතිකල්හි ලජ්ජා, භය, වීය්‍ය්‍ය, ප්‍රඥා, නැති කල්හි කයින් දුසිරිත් කරයි. වචනයෙන් දුසිරිත් කරයි. සිතින් දුසිරිත් කරයි. මේ ඔහුගේ ණය ගැනීමයයි කියමි.

6 හෙතෙම ඔහුගේ කාය දුශ්චරිතය (ii) වැසීමේ හේතුවෙන් පවිටු අදහස් ඇතිකරයි. මා අන්‍යයෝ නොදනිත්වායි සිතයි. (iii) කයින්ද උත්සාහ කෙරෙයි. හෙතෙම තමාගේ වාග් දුශ්චරිතය (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) වචනයෙන් කියයි. කයින් උත්සාහ කරයි. මෙය ඔහුගේ පොළිය වැඩිවීම යයි කියමි. ඔහුට ප්‍රියශීලි සබ්‍රහ්මචාරීහු මෙසේ කීහ. මේ ආයුෂ්මතුන් වහන්සේ මෙසේ

කරන්නේ මෙසේ කියන්නේ වෙයි කියායි. මෙය ඔහුට 'දොස්කීම' යයි කියමි. ඔහු වනයකට ගොස් හෝ රුක්මුලකට ගොස් හෝ ජනසුන්‍යස්ථානයකට ගොස් හෝ පසුතැවුන සිතින් ලාමකවූ අකුශල විතර්කයන්, රැස්කරයි. මේ ඔහුගේ "පසුපස යෑම" යයි කියමි. මහණෙනි, ඒ මේ දිළින්දා කයින් වචනයෙන් හෝ සිතින් දුසිරිත් කොට කායයාගේ බිඳීමෙන් මරණින් මතු අපාය බන්ධනයෙන් හෝ බැඳෙයි. තිරිසන් යෝනි බන්ධනයෙන් හෝ බැඳෙයි. මහණෙනි, මෙසේ දරුණුවූ මෙසේ කටුකවූ යම් ඒ නිරය බන්ධනයක් හෝ තිරිසන් යෝනි බන්ධනයක් හෝ ඇද්ද, ඒ සමාන නිරුත්තර නිර්වාණය ලැබීමට අනතුරු කරන්නාවූ එකද ධර්මයකුත් මම නොදක්නෙමි.

7. "මේ ලොකයෙහි ධනයෙන් දිළිඳුකමද ණය ගැනීමද දුක්යයි කියනු ලැබේ. දිළිදුවූයේ ණයගෙන ඉල්ලනුලබන්නේ වෙහෙසට පැමිණෙයි." එහෙයින් ඔහු පසුපස්සෙහි ලුහුබඳිත්. බන්ධනයටද පැමිණේ. කාම ලාභය ප්‍රාර්ථනා කරන්නවුන්ට බන්ධනයද දුකකි. එපරිද්දෙන්ම ආයෳී විනයෙහි යමෙකුගේ ශ්‍රද්ධාව නැත්තේද පාපයට ලජ්ජාව නැත්තේද පාපයට භය නැත්තේද පාප කර්මයෙහි විභාගයක් නැත්තේද කයින් වචනයෙන් හෝ සිතින් දුසිරිත් කොට මා නොදනීවායි කැමතිවේද, හෙතෙම් ඒ ඒ තැන්හි නැවත නැවත කයින්ද වචනයෙන්ද සිතින්ද පාපකර්මය වඩන්නේ කම්පාවේ.

'පාප කර්ම ඇති ඒ අඥාන තෙම තමන්ගේ දුශ්චරිත දන්නේ කුශල් නොකළ බැවින් දිළිඳුවූයේ පෙරකළාවූ අකුශල් නමැති ණය ගෙන චොදනා කරණු ලබන්නේ වෙහෙසට පැමිණේ.

8. 'එහෙයින් ගමෙහි හෝ නොහොත් වනයෙහි හෝ මොහුගේ සිත්තැවුල් වශයෙන් උපන්නාවූ දුක්වූ යම්බඳු කල්පනා සිත් නමැති ණය හිමියෝ ඔහු පසු පස්සෙහි ලුහු බඳිත්.

"පාප කර්ම ඇති ඒ අඥාන තෙම තමන්ගේ දුශ්චරිතය දන්නේ එක්තරා තිරිසන් යෝනියකට ගොස් බැඳෙයි. නැවත නරකයෙහි හෝ බැඳෙයි.

"යම් හෙයකින් මේ නිරය බන්ධනය වනාහි දුක්යයි කියනු ලැබේද, එහෙයින් නුවණැත්තාවූ පණ්ඩිතතෙම දැහැමින් ලද්දාවූ භොගයන් දෙන්නේ සිත පහද වන්නේය.

ගෘහවාසයෙහි වසන්නාවූ ශ්‍රද්ධා ඇත්තවුන්ගේ මේ ආත්මයෙහි හිත පිණිසද පරලොව සැප පිණිසද දෙලොවෙහි ජයග්‍රහණය පිණිස මෙය හිතවේ.

"මෙසේ ගෘහස්ථයන්ගේ ත්‍යාගයයි නම්වූ මේ පිනවැඩේද එපරිද්දෙන්ම යමෙකුගේ ශ්‍රද්ධා ආයර්‍ය විනයෙහි වැඩේද ලජ්ජාවෙන් යුක්ත සිත් ඇත්තේද, පාපය කෙරෙහි බියසුලු වූද, ප්‍රඥාවෙන් යුක්තවූද ශීලයෙන් හික්මුනාවූද මේතෙම ආයර්‍ය විනයෙහි සුවසේ ජීවත්වේයයි කියනු ලැබේ

**9.** "නිරන්තරයෙන් සම්පූර්ණ වීයර්‍ය ඇතිව පඤ්චනීවරණයන් හැර ධ්‍යාන තුන ඇසුරුකොට උපදනා සුවය ලැබ සතර වන ධ්‍යානය පිළිබඳ බලාපොරොත්තුවෙහි සිටීද ධ්‍යාන සතරට පැමිණ එකඟ සිත් ඇත්තේද ඥානය සිහිය යන දෙකින් යුක්තවූයේද මෙසේ තත්වූ පරිද්දෙන් දැන සියලු සංයෝජනයන් ක්ෂය කරන්නාවූ නිර්වාණයෙහි තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් නොගෙන මාර්ග සිත මනාකොට මිදේද, ඒ මනාකොට මිදුනාවූ රහතුන් වහන්සේගේ ඒකාන්තයෙන් සිහිකිරීමේ ඥානය ඇතිවේ.

**10.** "මාගේ භව සංයෝජනයන් නැතිකිරීම නම්වූ නිර්වාණයෙහි මිදීම වෙනස් කළ නොහැකිවේ. මේ මාර්ගඵල ඥානය වනාහි උත්තම ඥානයවේ. මෙය නිරුත්තර සුවයවේ. මෙය ශොක නැති රාග රජස් නැති උපද්‍රව නැති උතුම්වූ රාගාදී කෙලෙස් ණය නැති බව වේ."

**46 මහාචුන්ද සූත්‍රයː- 1** "මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් මහාචුන්ද ස්ථවිරයන් වහන්සේ චෙතිය රට සහජාතිය නම් ස්ථානයෙහි වාසය කරති. එකල්හි ආයුෂ්මත් මහා චුන්ද ස්ථවිරයන් වහන්සේ 'ආයුෂ්මතුනියි' භික්ෂූන් ඇමතූහ 'ආයුෂ්මත්නි'යි ඒ භික්ෂූහු ආයුෂ්මත් මහා චුන්ද ස්ථවිරයන්

වහන්සේට ප්‍රතිවචන දුන්හ. ආයුෂ්මත් මහා චුන්ද ස්ථවිරයන් වහන්සේ මෙසේ ප්‍රකාශ කළහ.

2 "ඇවැත්නි, මේ ශාසනයෙහි ධර්මයෙහි යෙදෙන භික්ෂූහු ධ්‍යාන කරණ භික්ෂූන් නොසතුටු කරවත්. මොවුහු ධ්‍යාන කරන්නෝ වෙමුයි සිතත්. දොස් කියත්. කුමක් නම් මොවුහු ධ්‍යාන කරත්ද, කෙසේ නම් මොවුහු ධ්‍යාන කරත්ද? යනුවෙනි, එහි ධර්මයෙහි යෙදෙන භික්ෂූහුද නොපහදිත්. ධ්‍යාන කරණ භික්ෂූහුද නොපැහැදෙත්.

3. "බොහෝදෙනාට හිත පිණිස බොහෝදෙනාට වැඩ පිණිස දෙවිමිනිසුන්ගේ හිත පිණිස සැප පිණිස (ii) යෙදුනාහු නොවෙත්. මහණෙනි, මෙහි ධ්‍යාන කරණ භික්ෂූහු ධර්මයෙහි යෙදෙන භික්ෂූන් නොසතුටු කරවත්. මොවුහු වනාහි ධර්මයෙහි යෙදෙන්නම්හ" ධර්මයෙහි යෙදෙන්නම්හ'යි උඩගුවූ මානයෙන් යුක්තවූ, චපලවූ, මුඛරිවූ විසුරුන වචන ඇති සිහිමුළාවූ නොදැමුන භ්‍රාන්ත සිත් ඇති ප්‍රකෘති ඉන්ද්‍රිය ඇති මොව්හු කෙසේ නම් ධර්මයෙහි යෙදෙත්ද? කුමක් නම් යොදවත්ද? යනුවෙනි, මෙහි ධ්‍යාන කරණ භික්ෂූහුද නොපහදිත්. ධර්මයෙහි යෙදෙන භික්ෂූහුද නොපැහැදෙත්. (මෙහි 3 (1) යෙදිය යුතුයි.) නොයෙදුනාහු වෙත්.

4 "ඇවැත්නි, මෙහි වනාහි ධර්මයෙහි යෙදෙන භික්ෂූන්ගේ ගුණය කියත්. ධ්‍යාන කරණ භික්ෂූන්ගේ ගුණ නොකියත්. එහි ධර්මයෙහි යෙදෙන භික්ෂූහුද නොපහදිත්. ධ්‍යාන කරන භික්ෂූහුද නොපහදිත්. (මෙහි 3 (i) යෙදිය යුතුයි) නොයෙදුනාහු වෙත්.

5 "මෙහි වනාහි ධ්‍යාන කරණ භික්ෂුව ධ්‍යාන කරණ භික්ෂූන්ගේ ගුණ කියත්. ධර්මයෙහි යෙදෙන භික්ෂූන්ගේ ගුණ නොකියත්. (මෙහි 3 (i) යෙදිය යුතුයි.) නොයෙදුනාහු වෙත්.

6 "ඇවැත්නි, මෙහි මෙසේ හික්මිය යුතුයි. 'ධර්මයෙහි යෙදෙන අපිද ධ්‍යාන කරණ භික්ෂූන්ගේ ගුණ කියන්නෙමු කියායි මෙහි යුෂ්මතුන් මෙසේ හික්මිය යුතුය. එයට හේතු කවරේද? ඇවැත්නි, යමෙක් අමෘතවූ නිර්වාණ ධාතුව කයින් ස්පර්ශ කොට

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වෙසෙත්ද එබඳු ආශ්චර්‍යවත් පුද්ගලයෝ ලෝකයෙහි දුර්ලභයහ. ඇවැත්නි, එහෙයින් මෙහි මෙසේ හික්මිය යුතුය. 'ධ්‍යාන කරන අපිද ධර්මයෙහි යෙදෙන භික්ෂූන්ගේ ගුණය කියන්නෙමු' කියායි. ඇවැත්නි, මෙසේ වනාහි හික්මිය යුතුය. එයට හේතු කවරේද? යම්කෙනෙක් ගැඹුරු අර්ථපදය නුවණින් විනිවිද බලත්ද, එබඳු ආශ්චර්‍යවත් පුද්ගලයෝ ලෝකයෙහි දුර්ලභ වෙත්."

**47 මොළිය සීවක සූත්‍රයː-** 1 "ඉක්බිති මෝලිය සීවක නම් පරිබ්‍රාජකතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු වියයුතු සිහි කටයුතු කථාව නිමවා එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ මෝලිය සීවක පරිබ්‍රාජකතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළකළේය.

2 "ස්වාමීනි, ධර්මය සාන්දෘෂ්ටිකය, ධර්මය සාන්දෘෂ්ටික යයි (තමා විසින්ම අවබොධ කටයුතුයයි) කියයි. ස්වාමීනි, කවර කරුණකින් ධර්මය සාන්දෘෂ්ටිකවේද කල් නොයවා දෙන ඵල ඇත්තේ වේද, එව බලව'යි කියයුතුවේද, සමීපයට පැමිණිය යුතු වේද නුවණැත්තන් විසින් වෙන වෙන දැන ගත යුතුයයි කියාද?" යනුයි.

3 "එසේනම් සීවකය එයම මෙහිලා විචාරන්නෙමි. යම්සේ ඔබ ඉවසන්නෙහි නම් එසේ මෙය ප්‍රකාශ කරව. සීවකය, කුමකැයි සිතන්නෙහිද? අධ්‍යාත්මයෙහි ඇත්තාවූ ලොභය 'මාගේ අධ්‍යාත්මයෙහි ලෝභය ඇත්තේයයි' දන්නෙහිද? අධ්‍යාත්මයෙහි නැත්තාවූ ලොභය 'මාගේ අධ්‍යාත්මයෙහි ලෝභය නැත්තේයයි' දන්නෙහිද? සීවකය, (ii) මෙසේ වනාහි ධර්මය සාන්දෘෂ්ටිකවූයේ වෙයි. අකාලික, එහිපස්සික ඔපනයික හා නුවණැත්තන් විසින් වෙන වෙනම දැනගත යුතු වෙයි.

4. සීවකය, කුමකැයි සිතන්නෙහිද? අධ්‍යාත්මයෙහි ද්වෙෂය, එසේම මෝහය, එසේම ලෝභධර්මය, ද්වෙෂධර්මය, මෝහධර්මය යන මේ කෙලෙස් ඇති කල්හි ඇත්තාහුයයි දන්නෙහිද? නැතිකල්හි නැත්තාහුයයි දන්නෙහිද?"-"එසේය, ස්වාමීනි."

5. "සීවකය, යම් හෙයකින් ඔබ අධ්‍යාත්මයෙහි ඇත්තාවූ මෝහධර්මය, 'මාගේ අධ්‍යාත්මයෙහි මෝහධර්මය ඇත්තේයයි' දන්නෙහිද? අධ්‍යාත්මයෙහි නැත්තාවූ මෝහධර්මය 'මාගේ අධ්‍යාත්මයෙහි මෝහධර්මය නැත්තේයයි' දන්නෙහිද? (මෙහි 3 (ii) යෙදිය යුතුයි. 2 අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ 10 අසුර වර්ගයේ 51 සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.)

48. **සන්දිඨික ධම්ම සූත්‍රය:-** 1. ඉක්බිති එක්තරා බ්‍රාහ්මණයෙක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන්වහන්සේ සමග සතුටු විය. සතුටුවිය යුතු සිහිකටයුතු කථාව නිමවා එකත්පස්ව හුන්නේය. එකත්පසෙක සිටියාවූ ඒ බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළකළේය.

2. (මෙහි මේ වර්ගයේ 47 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

3. "එසේ නම් බමුණ මෙහිලා එයම විචාරන්නෙමි. යම්සේ ඔබ ඉවසන්නෙහි නම් එසේ මෙය ප්‍රකාශ කරව, බ්‍රාහ්මණය, කුමකැයි සිතන්නෙහිද? ඇත්තාවූ අධ්‍යාත්මික රාගය මාගේ අධ්‍යාත්මයෙහි රාගය ඇත්තේයයි දන්නෙහිද, නැත්තාවූ අධ්‍යාත්මික රාගය මාගේ අධ්‍යාත්මයෙහි රාගය නැත්තේයයි දන්නෙහිද? පින්වත් බ්‍රාහ්මණය, මෙසේ ඔබ යම්හෙයකින් ඇත්තාවූ අධ්‍යාත්මික රාගය මාගේ අධ්‍යාත්මයෙහි රාගය ඇත්තේයයි දන්නෙහිද? නැත්තාවූ අධ්‍යාත්මික රාගය මාගේ අධ්‍යාත්මයෙහි රාගය නැත්තේයයි දන්නෙහිද? බමුණ, (මෙහි මේ වර්ගයේ 47 සූත්‍රයේ 3 (ii) යෙදිය යුතුයි)

4. "බ්‍රාහ්මණය, කුමකැයි සිතන්නෙහිද? ඇත්තාවූ අධ්‍යාත්මික ද්වෙෂය-මෝහය, කයෙහි නොහික්මීම, වචනයෙහි නොහික්මීම, සිතෙහි නොහික්මීම, ඇත්තාහුයයි දන්නෙහිද? නැත්තාවූ අධ්‍යාත්මික ද්වෙෂය, මෝහය, කයෙහි නොහික්මීම, වචනයෙහි නොහික්මීම, සිතෙහි නොහික්මීම නැත්තාහුයයි දන්නෙහිද? බ්‍රාහ්මණය, (මෙහි මේ වර්ගයේ 47 සූත්‍රයේ 3 (ii) යෙදිය යුතුයි.)

5. (2 අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ 10 අසුර වර්ගයේ 51 සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි)

**49. ඛෙම-සුමන සූත්‍රයඃ-** 1. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසයකරණ සේක. එසමයෙහි වනාහි ආයුෂ්මත් ඛෙම ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් සුමන ස්ථවිරයන් වහන්සේද භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියහ. පැමිණ භාග්‍යවතුන්සේ වැඳ එකත්පසෙක හුන්නාහ. එකත්පසෙක හුන්නාවූ ආයුෂ්මත් ඛෙම ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළ කළේය.

2. "ස්වාමීනි, යම් ඒ භික්ෂුවක් කෙළෙසුන් නැතිකළේ සම්පූර්ණ කළ කටයුතු ඇත්තේ සිව්මගින් කළ කටයුතු නිමවූයේ බහාතබනලද කෙළෙස් බර ඇත්තේ පැමිණි යහපත ඇත්තේ හීන කළ භව බැඳුම් ඇත්තේ මිදීම මනාකොට දත්තේ (අර්හත්) පූජාවට සුදුසු වේද, (ii) උන්වහන්සේට මට වඩා ශ්‍රෙෂ්ඨයෙක් හෝ සමයෙක් හෝ හීනයෙක් හෝ ඇත්තේයයි අදහසක් නොවෙයි." ආයුෂ්මත් ඛෙම ස්ථවිරයන් වහන්සේ මෙය ප්‍රකාශ කළහ. ශාස්තෲන් වහන්සේ අදහසට එකඟවූ සේක.

3. ඉක්බිති ආයුෂ්මත් ඛෙම ස්ථවිරයන් වහන්සේ ශාස්තෲන් වහන්සේ මාගේ අදහසට එකඟවූ සේකැයි අස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ ප්‍රදක්ෂිණාකොට බැහැර ගියහ.

4. ඉක්බිති ආයුෂ්මත් ඛෙම ස්ථවිරයන් වහන්සේ බැහැර ගොස් ටික වේලාවකින් ආයුෂ්මත් සුමන ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. (මෙහි 3 (i) යෙදිය යුතුයි.) උන්වහන්සේට මෙබඳු අදහසක් නොවෙයි. කෙබඳුද? "මට වඩා ශ්‍රෙෂ්ඨයෙක් හෝ නැත්තේය. මට වඩා සමානයෙක් හෝ නැත්තේය. මට වඩා හීනයෙක් හෝ නැත්තේය යනුවෙනි." ආයුෂ්මත් සුමන ස්ථවිරයන් වහන්සේ මෙය ප්‍රකාශ කළහ. ශාස්තෲන්වහන්සේ අදහසට එකඟවූ සේක.

5. ඉක්බිති ආයුෂ්මත් සුමන ස්ථවිරයන්වහන්සේ මාගේ අදහසට ශාස්තෲන්වහන්සේ එකඟවූ සේකැයි අස්නෙන් නැගිට

බැහැර ගියහ. ඉක්බිති ආයුෂ්මත් ඛෙම ස්ථවිරයන් වහන්සේද, සුමන ස්ථවිරයන් වහන්සේද බැහැර ගොස් ටික වේලාවකින් භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූසේක. "මහණෙනි, මෙසේ වනාහි කුලපුත්‍රයෝ (දැනීම) නොහොත් රහත් බව ප්‍රකාශකරත්. තෙමේ නොපැමිණි අර්ථයද දක්වන ලදී. එසේනමුදු ඇතැම් හිස්පුරුෂයෝ සිනහවෙන්නාහු අනිකක් ප්‍රකාශ කෙරෙත්යයි සිතමි. පසුව ඔවුහු විපතට පැමිණෙත්.

"උසස් පුද්ගලයන් කෙරෙහි නොඑළඹෙත්, හීන පුද්ගලයන් කෙරෙහි නොඑළඹෙත්. සමාන පුද්ගලයා කෙරෙහිද නොඑළඹෙත්. ඒ ක්ෂීණාශ්‍රවයන් වහන්සේ අර්හත් මාර්ගයෙන් ක්ෂයවූ ජාති ඇත්තීය. වැස නිමවනලද මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යා ඇත්තේ සියලු සංයෝජනයන් කෙරෙන් විශෙෂයෙන් මිදුනාහු හැසිරෙත්."

**50. සංවර විපන්න සූත්‍රයඃ-** 1. "මහණෙනි, ඉන්ද්‍රිය සංවරය නැති කල්හි විපතට පත් ඉන්ද්‍රිය සංවරය ඇත්තහුට ශීලයට හේතු නැත්තේවේ. ශීලය නැති කල්හි විපතට පත් ශීලය ඇත්තහුට සම්‍යක් සමාධියට හේතු නැත්තේ වේ. සම්‍යක් සමාධිය (මනාකොට සිත එකඟ කිරීම) නැතිකල්හි ඇතිතතු දැනීමේ නුවණට හේතු නැත්තේ වේ. ඇතිතතු දැනීමේ නුවණ නැති කල්හි ක්ලේශයන්ගෙන් නොඇලීමට හේතු නැත්තේ වේ. ක්ලේශයන්ගෙන් නොඇලීමට හේතු නැතිකල්හි විමුක්ති ඥානදර්ශනයට හේතු නැත්තේ වේ.

2. "මහණෙනි, යම්සේ ගසක අතු කොළ විපතට පත් වූයේද ඒ ගසේ පතුරද සම්පූර්ණ බවට නොපැමිණේ සිවියද සම්පූර්ණ බවට නොපැමිණේ. ඵලයද සම්පූර්ණ බවට නොපැමිණේ. අරටුවද සම්පූර්ණ බවට නොපැමිණේ. එමෙන්ම (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, ඉන්ද්‍රිය සංවරය ඇති කල්හි ඉන්ද්‍රිය සංවරය ඇත්තහුට ශීලයට හේතු ඇත්තේ වේ. ශීලය ඇති කල්හි, ශීල සම්පන්නහුට සම්‍යක් සමාධියට හේතු ඇත්තේ වේ. සම්‍යක් සමාධිය ඇති කල්හි, සම්‍යක් සමාධිසම්පන්නහුට ඇතිතතු

දැනීමේ නුවණට හේතු ඇත්තේ වේ. ඇතිතතු දැනීමේ නුවණ ඇතිකල්හි කෙළෙසුන්ගෙන් කළකිරීම ඇත්තේ වේ. කෙළෙසුන්ගෙන් කළකිරීම ඇති කල්හි විමුක්ති ඥාන දර්ශනයට හේතු ඇත්තේ වේ.

4 "මහණෙනි, ගස අතු හා කොළ ඇති කල්හි පතුරද සම්පූර්ණ බවට පැමිණේ. සිවියද සම්පූර්ණ බවට පැමිණේ. එලයද සම්පූර්ණ බවට පැමිණේ අරටුවද සම්පූර්ණ බවට පැමිණේ. එපරිද්දෙන්ම (මෙහි 3 ඡේදය යෙදිය යුතුයි.)

**51. අස්සුත සවන සූත්‍රය**:- 1. "ඉක්බිත්තෙන් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ, ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් තැනකද එතැන්හි පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සමග සතුටු විය. සතුටුවිය යුතු සිහි කටයුතු කථාව නිමවා එකත් පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මෙය ප්‍රකාශ කළහ.

2. "ඇවැත් ශාරීපුත්‍රයිනි, කොපමණකින් භික්ෂුව නොඇසුවාවූද ධර්මය අසාද, ඇසුවාවූද ධර්මය අමතකවීමට නොයේද, ඔහුගේ යම් ධර්මයෝ පෙර සිතින් ස්පර්ශ කරණ ලද්දේ එයද රැස්කරත්ද නොදන්නා ලද්දද දනිත්ද?" යනුයි. ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිර තෙම බහුශ්‍රැතවූයේ ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේටම එය වැටහේවා."

3. "එහෙයින් ආයුෂ්මත්වූ ශාරීපුත්‍රයෙනි, මනාකොට අසනු මැනවි. ප්‍රකාශ කරන්නෙමි."-"එසේය ඇවැත්නියි" ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට උත්තර දුන්හ. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ මෙය ප්‍රකාශ කළහ

4. "ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුව (ii) සූත්‍රය, ගෙය්‍යය, වෙය්‍යාකරණය, ගාථාය, උදානය, ඉතිවුත්තකය, ජාතකය, අද්භූත ධර්මය, වෙදල්ලය යන ධර්මයන් ප්‍රගුණ කරයිද ඇසුවාවූ දැරුවාවූ ධර්මයන් අනුන්ට විස්තර වශයෙන් කියවාද, ඇසුවාවූ දැරුවාවූ ධර්මයෝ ශබ්දනගා කියවයිද, ඇසුවාවූ දැරුවාවූ

ධර්මයෝ සිතින් කල්පනා කරයිද, විචාරයිද ඒ අනුව සිත යොදවාද, (iii) යම් ආවාසයක බොහෝ දේ දන්නා පැමිණි ධර්මය ඇත්තාවූ ධර්මධරවූ විනයධරවූ ප්‍රාතිමෝක්ෂයන් දන්නාවූ ස්ථවිර භික්ෂූහු වෙසෙත්ද ඒ ආවාසයෙහි වස් එළඹේද උන්වහන්සේලා වෙත කලින් කල අවුත් 'ස්වාමීනි, මෙය කෙසේද, මෙහි අර්ථය කෙසේදැයි' විචාරද්ද ප්‍රශ්න කෙරෙත්ද, ඒ ආයුෂ්මත්වරු ධර්මයාගේ නොදන්නා තැන් කියාදෙත්. ගැඹුරුතැන් ලිහිල්කර දෙත්. නොයෙක් සැක ඇති ධර්ම පදයන්හි සැක නැතිකර දෙත්. ශාරීපුත්‍රය, මෙතෙකින් වනාහි භික්ෂුව නො ඇසූ ධර්මය අසයි. ඇසුවාවූ ධර්මය අමතක නොකර ගනියි. ඔහුගේ යම් ධර්මයෝ පෙර සිතින් ස්පර්ශ කරණ ලද්දේ එයද රැස්කරත්. නොදන්නා ලද්ද දැනගනියි."

5. "ආනන්දයෙනි, පුදුමයකි. ආනන්දයෙනි, පෙර නොවූ දෙයකි. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්වහන්සේ විසින් යහපත් ප්‍රකාශයක් කරණලදී. අපි මේ ධර්ම සයින් යුක්තවූ ආනන්ද ස්ථවිරයන් සිහිපත්කර ගනිමු. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම (මෙහි 4 (ii) ඡේදය යෙදිය යුතුයි) ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම යම් ආවාසයක බහුශ්‍රැතවූ ධර්මයට පැමිණියාවූ, ධර්මධරවූ, විනයධරවූ, ප්‍රාතිමෝක්ෂයන් දරන්නාවූ ස්ථවිර භික්ෂූහු වෙසෙත්ද, ඒ ආවාසයෙහි වස් වෙසෙයි. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම කලින්කල උන්වහන්සේලා වෙත ගොස් 'ස්වාමීනි, මෙය කෙසේද? මෙහි අර්ථය කෙසේදැයි? විචාරයි. ප්‍රශ්න කරයි. ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන්ට උන්වහන්සේලා විස්තර නොවූ දෙය විස්තර කරත්. ගැඹුරු දෙය ලිහිල්කොට දෙත්. නොයෙක් සැකකටයුතු ධර්මයන්හි සැක නැති කොට දෙත්."

52. ඛත්තියාධිප්පාය සූත්‍රයː- 1. 'ඉක්බිති ජානුස්සෝනී බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු විය යුතු සිහි කටයුතු කථාව නිමවා එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ ජානුස්සෝනී බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. "භවත් ගෞතමයන් වහන්ස, රාජවංශිකයෝ (ii) කුමක් බලාපොරොත්තුවන්නහුද, කුමක් විචාරන්නෝද? කවර අධිෂ්ඨානයක් ඇත්තෝද? කවරකට ආලය ඇත්තෝද? කවර අවසානයක් ඇත්තෝද?

3. "බ්‍රාහ්මණය, රාජවංශිකයෝ භොගයන් බලාපොරොත්තු ඇත්තෝය. නුවණ විචාරන්නෝය. බලය අධිෂ්ඨාන කොට ඇත්තෝය. පොළොවට ආලය ඇත්තෝය. සම්පත් කෙළවරකොට ඇත්තෝය."

4. "භවත් ගෞතමයන් වහන්ස, බ්‍රාහ්මණයෝ (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

5. "බ්‍රාහ්මණය, බමුණෝ භොගය බලාපොරොත්තු ඇත්තෝය. නුවණ විචාරන්නෝය, මන්ත්‍ර අධිෂ්ඨානකොට ඇත්තෝය. යාගයෙහි ආලය ඇත්තෝය, බ්‍රහ්මලෝකය කෙළවරකොට ඇත්තෝය.

6. "භවත් ගෞතමයන් වහන්ස, ගෘහපතීහු (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

7. "බ්‍රාහ්මණය, ගෘහපතීහු භොගය බලාපොරොත්තු ඇත්තෝය, යාගය විචාරන්නෝය, ශිල්පය අධිෂ්ඨානකොට ඇත්තෝය කර්මාන්තයෙහි ඇලුනෝය. නිමවූ කර්මාන්තය අවසන්කොට ඇත්තෝද වෙති."

8. "භවත් ගෞතමයන් වහන්ස, ස්ත්‍රීතොම (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

9. "බ්‍රාහ්මණය, ස්ත්‍රිය පුරුෂයන් බලාපොරොත්තු ඇත්තීය. අලංකාරය විචාරන්නීය, පුත්‍රයින් අධිෂ්ඨානකොට ඇත්තීය. ස්වාමියා ආලයකොට ඇත්තීය, සම්පත් කෙළවර කොට ඇත්තීය.

10. භවත් ගෞතමයන් වහන්ස, සොරු (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

11. "බ්‍රාහ්මණය, සොරුවනාහි, ගැණීම බලාපොරොත්තු වන්නෝය, පැහැරගැන්ම විචාරන්නෝය. කෛරාටිකකම

අධිෂ්ඨානකොට ඇත්තෝය, අන්ධකාරයට ආලය කරන්නෝය නොදැක්ම (අසුනොවීම) කෙළවරකොට ඇත්තෝය.

12. "භවත් ගෞතමයන් වහන්ස, ශ්‍රමණයෝ (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

13. "බ්‍රාහ්මණය, ශ්‍රමණයෝ වනාහි ඉවසීම හා කීකරුකම බලාපොරොත්තු ඇත්තෝය. නුවණ විචාරන්නෝය, ශීලය අධිෂ්ඨානකොට ඇත්තෝය. කිසිවක ඇලීම නැත්තෝය නිර්වාණය කෙළවරකොට ඇත්තෝය.

14. "භවත් ගෞතමයන් වහන්ස, පුදුමයකි. භවත් ගෞතමයන් වහන්ස, පෙර නොවූ දෙයකි. ක්ෂත්‍රියයන්ගේ (ii) බලාපොරොත්තුවද, විචාරයද අධිෂ්ඨානයද, ආලයද, අවසානයද භවත් ගෞතමයන් වහන්සේ දනියි (iii) බ්‍රාහ්මණයන්ගේ (මෙහි 14 (ii) යෙදිය යුතුයි.) ගෘහපතියන්ගේ (මෙහි 14 (ii) යෙදිය යුතුයි.) ස්ත්‍රීයගේ (මෙහි 14 (ii) යෙදිය යුතුයි.) සොරුන්ගේ (මෙහි 14 (ii) යෙදිය යුතුයි.) ශ්‍රමණයන්ගේ (මෙහි 14 (ii) යෙදිය යුතුයි.) බලාපොරොත්තුද, විචාරයන්ද, අධිෂ්ඨානයන්ද, ආලයන්ද, අවසානයන්ද භවත් ගෞතමයන් වහන්සේ දනිති.

15. (මේ ඡෙදය 2 අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ 10 අසුර වර්ගයේ 51 සූත්‍රයේ 6 ඡෙදය මෙනි.)

53. **උභයත්ථසමධිගාහ සූත්‍රයː-** 1, ඉක්බිති එක්තරා බ්‍රාහ්මණයෙක් භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවිය, සතුටුවියයුතු සිහිකටයුතු කථාව නිමවා එකත්පසෙක හුන්නේය, එකත්පසෙක හුන්නාවූ ඒ බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළකළේය.

2. 'ස්වාමීනි, එකම ධර්මයක් වඩනලද්දේ බොහෝසේ පුරුදුකරණ ලද්දේ මෙලොව වැඩද පරලොව වැඩද යන දෙකම ලබාගන්නේ නම් එබඳු ධර්මයක් ඇත්තේද?

"බ්‍රාහ්මණය, එකම ධර්මයක් වඩනලද්දේ බොහෝසේ පුරුදුකරන ලද්දේ මෙලොව වැඩද, පරලොව වැඩද ලබා ගන්නේ නම් එබඳු ධර්මයක් ඇත්තේමය.

3. "ස්වාමීනි, ඒ ධර්මය කවරේද?

4. "බ්‍රාහ්මණය, අප්‍රමාදය යන එකම ධර්මය වඩනලද්දේ බොහෝ සේ පුරුදු කරණලද්දේ මෙලොව වැඩද පරලොව වැඩද යන දෙකම ලබාගනියි. (ii) යම් ඒ ඇවිදින සියලුම සතුන්ගේ පියවර ඇත් පියවරෙහි ඇතුල්වේද ඇත්පියවර ඒ සියල්ලන්ගෙන් ශ්‍රෙෂ්ඨවෙයි. එමෙන්ම බමුණ, මේ අප්‍රමාදය නම් එකම ධර්මය වඩනලද්දේ බොහෝසේ පුරුදුකරණ ලද්දේ මෙලොව වැඩද පරලොව වැඩද ලබාගනියි.

5. "බ්‍රාහ්මණය, යම්සේ උස්වූ ගෙයක වක්වූ යටලී ඇද්ද ඒ සියල්ලම ගෙය පිහිටකොට ඇත්තෝද ගෙය දෙසට නැමුනෝද ඒ සියල්ලට වඩා ඒ උස්ගෙයම ප්‍රධානවේද? එපරිද්දෙන්ම (මෙහි 4 (i) යෙදිය යුතුයි.) බ්‍රාහ්මණය, සැවැන්න (කොළ) කපන්නෙක් සැවැන්න කපා අගින් අල්වාගසාද, සොලවාද එමෙන්ම බ්‍රාහ්මණය, (මෙහි 4 (i) යෙදිය යුතුයි.) බ්‍රාහ්මණය යම්සේ අඹ පොකුරකින් නටුවෙන් ගිලිහී වැටුන යම් ඒ අඹත් අර පොකුරටම අයත්වේද එමෙන්ම (මෙහි 4 (i) යෙදිය යුතුයි.) බ්‍රාහ්මණය, යම්සේ සියලුම ප්‍රදෙශ රජවරු සක්විති රජුට යටත්වූවාහු වෙත්ද ඒ රජවරුන්ට වඩා චක්‍රවර්ති රජ ශ්‍රෙෂ්ඨ වේද එමෙන්ම (මෙහි 4 (i) යෙදිය යුතුයි.) බමුණ සියලුම තාරකාවන්ගේ ආලෝකය චන්ද්‍රයාගේ ආලෝකයෙන් දහසය වන කලාවටවත් නොඅගීද ඒවාට වඩා චන්ද්‍රයාගේ ආලෝකය ප්‍රධානවේද, එපරිද්දෙන්ම (මෙහි 4 (i) යෙදිය යුතුයි.) බ්‍රාහ්මණය, මේ එකම ධර්මය වඩනලද්දේ බොහෝ වශයෙන් පුරුදුකරණ ලද්දේ මෙලොවද පරලොවද වැඩ සිදුකරයි."

6. (මේ ඡෙදය 2 අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ 10 අසුර වර්ගයේ 51 සූත්‍රයේ 6 ඡෙදය මෙනි.)

**54. ජාති භූමිය ධම්මික සූත්‍රයඃ-** 1. "එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ගිජ්ජකූළු පව්වෙහි වාසය කරණසේක. එකල්හි ආයුෂ්මත් ධම්මික ස්ථවිරතෙමේ ආවාස සතක් ඇති මුළු ජාති භූමියෙහිම ආවාස භාරව සිටී.

2 "එකල්හි වනාහි ආයුෂ්මත් ධම්මිකතෙමේ ආගන්තුග භික්ෂූනට වෛර කරයි, බනියි, හිංසා කරයි, වචන වලින් විදියි,

කොප කරවයි. ආගන්තුග භික්ෂූහු ආයුෂ්මත් ධම්මික තෙරුන් විසින් වෛර කරණු ලබන්නාහු බනිනු ලබන්නාහු වෙහෙස කරණු ලබන්නාහු වචනයෙන් විදිනු ලබන්නාහු කොප කරවනු ලබන්නාහු පිටවී යත්. නො නවතිත්. ආවාසය හිස් වෙයි.

3. "ඉක්බිති ජාති භූමියෙහි වූ උපාසකයන්ට අපි වනාහි භික්ෂු සංඝයා සිවුරු පිඬු සෙනසුන් ගිලන්පස බෙහෙත් බඩුවලින් උපස්ථාන කළෝ වෙමු. නමුත් ආගන්තුග භික්ෂූහු පිටවී යත්. නොනවතිත්. ආවාසය හිස් වෙත්. යම් කරුණකින් ආගන්තුග භික්ෂූහු පිටවී යත්ද නොනවතිත්ද ආවාසය හිස්වෙත්ද ඊට හේතු කවරේද? ඊට ප්‍රත්‍යය කවරේද?

4. "ඉක්බිති ජාති භූමික උපාසකවරුන්ට මේ ආයුෂ්මත් ධම්මිකතෙමේ ආගන්තුග භික්ෂූන්ට වෛර කරයි. බනියි, වෙහෙස කරයි, වචනයෙන් විදියි, කොප කරවයි. ඒ ආගන්තුග භික්ෂූහු ආයුෂ්මත් ධම්මික තෙරුන් විසින් වෛර කරණු ලබන්නාහු බනිනු ලබන්නාහු වෙහෙස කරණු ලබන්නාහු වචනවලින් විදිනු ලබන්නාහු කොප කරවනු ලබන්නාහු පිටවී යත්, නොනවතිත්. ආවාසය හිස් වෙයි. අපි ආයුෂ්මත් ධම්මික නෙරපන්නෙම් නම් යෙහෙකැයි සිතූහ."

5. ඉක්බිති ජාති භූමියෙහි වූ උපාසකයෝ ආයුෂ්මත් ධම්මිකතෙමේ යම් තැනෙක්හිද එහි පැමිණියාහුය. පැමිණ ආයුෂ්මත් ධම්මිකට "ස්වාමීනි, ආයුෂ්මත් ධම්මිකතෙමේ මේ ආවාසයෙන් බැහැර යේවා ඔබගේ මෙහි විසීමෙන් පලක් නැතැයි" කීවාහුය.

6. ඉක්බිති ආයුෂ්මත් ධම්මිකතෙමේ ඒ ආවාසයෙන් අනික් ආවාසයකට ගියේය. එහිද ආයුෂ්මත් ධම්මිකතෙමේ ආගන්තුග භික්ෂූන්ට (මේ සූත්‍රයේම 2-3-4-5-6 ඡෙද යෙදිය යුතුයි.)

7. ඉක්බිති ආයුෂ්මත් ධම්මිකතෙමේ ඒ ආවාසයෙන්ද අනික් ආවාසයකට ගියේය. (මේ සූත්‍රයේම 2-3-4-5 ඡෙද යෙදිය යුතුයි.) ජාති භූමියෙහි ආවාස සතින්ම නෙරපන්නෙම් නම් යෙහෙකැයි සිතූහ.

8. ඉක්බිති ආයුෂ්මත් ධම්මිකට ජාති භූමියෙහිවූ උපාසකයන් විසින් ජාති භූමියෙහිවූ සම්පූර්ණ ආවාස සතින්ම මා නෙරපනු ලැබීමි. දැන් කොහි යන්නෙම්දැයි මේ සිත විය.

9. ඉක්බිති ආයුෂ්මත් ධම්මික මම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි යන්නෙම් නම් යෙහෙකැයි සිතුයේය. ඉක්බිති ආයුෂ්මත් ධම්මිකතෙමේ පාත්‍ර සිව්රු ගෙන රජගහ නුවර යම් තැනෙක්හිද එහි ගියේය. ක්‍රමක්‍රමයෙන් රජගහ නුවර ගිජුකුළු පව්ව යම් තැනෙක්හිද භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ආයුෂ්මත් ධම්මිකට භාග්‍යවතුන් වහන්සේ 'ධම්මිකය' දැන් කොහි සිට එන්නෙහිදැයි ඇසූසේක. ස්වාමීනි මම ජාති භූමික උපාසකවරුන් විසින් සියලුම ආවාස සතින්ම බැහැර කරණ ලද්දේ වෙයි. ධාර්මිකය කම් නැත. යම්බඳුවූ ඔබ ඒ ඒ තැනින් බැහැර කරත් නම් මින් තොපට කවර ප්‍රයෝජනයක්ද, ඒ ඒ තැනින් බැහැර කළ ඔබ මා සමීපයටම ආවෙහිය.

10 "ධම්මිකය පෙරවූ දෙයක් කියමි. මුහුදු යන වෙළෙන්දෝ පරතෙර දක්නා පක්ෂියෙකු රැගෙන නැවෙන් මුහුදට වදිත්. පරතෙර නොදක්නා නැවින් ඔව්හු පරතෙර දක්නා පක්ෂියා මුදවා හරිත්. හෙතෙම යන්නේම පෙරදිගට යයි. බටහිර දිගට යයි. උතුරු දිගට යයි. දකුණු දිගට යයි උඩට යයි. අනුදිගට යයි. ඉදින් හෙතෙම හාත්පස පරතෙර දකීද එසේ ගියේම විය හෙතෙම ඉදින් හාත්පස පරතෙර නොදකීද ඒ නැවටම ආපසු එයි.

11. "ධම්මිකය එසේම යම්බඳුවූ තෝ ඒ ඒ තැනින් බැහැර කෙරෙත්ද ඒ ඒ තැනින් බැහැර කරණ ලද ඒ නුඹ මා සමීපයටම එන්නෙහිය. ධම්මිකය පෙර සිදුවූවක් කියමි. කුරු රජහට සුප්‍රතිෂ්ඨ නම් අතු පසක් ඇති, සිහිල් සෙවන ඇති, යහපත්වූ නුග ගසක් විය ධම්මිකය, සුප්‍රතිෂ්ඨ නම් නුගයට දොළොස් යොදුනක් වැසුනේ වේ. යොදුන් පසක් මුල් වලට හා අරටු වලට යටවිය. ධම්මිකය සුප්‍රතිෂ්ඨ නම් නුග ගසට පිලවුන් නැති

මීවදයක් යම්සේද එපමණ මහත් ලාස් ප්‍රමාණ ගෙඩි වූහ. ධම්මිකය සුප්‍රතිෂ්ඨ නම් නුග රුකේ එක් කඳක් අන්තඃපුරය සහ රජු පරිභොග කරයි. එක් කඳක් භට සෙනාව පරිභොග කරයි. එක් කඳක් නියම්ගම් දනවු වැස්සෝ පරිභොග කරයි. එක් කඳක් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ පරිභොග කරත්. එක් කඳක් මෘග පක්ෂීහු පරිභොග කරත්. ධම්මික සුප්‍රතිෂ්ඨ නම් නුග රුකේ ගෙඩි කිසිවෙක් නොරකියි. ඔවුනොවුන්ගේ ගෙඩි නොපෙළත්.

12. "ධම්මිකය, එක්තරා පුරුෂයෙක් සුප්‍රතිෂ්ඨ නුගරුකේ ඵල ඇතිතාක් අනුභව කොට අතු කඩා ගියේය. ධම්මිකය ඉක්බිති සුප්‍රතිෂ්ඨ නම් නුග රුකෙහි අධිගෘහිත දෙවතාවාට ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයි. ඒකාන්තයෙන් පුදුමයි. යම් පවිකාර මනුෂ්‍යතෙම සුප්‍රතිෂ්ඨ නම් නුග ගසේ යම්තාක් ගෙඩි කා අතු කඩා යයි. සුප්‍රතිෂ්ඨ නුගරුක මත්තෙහි ගෙඩි නො උපදවන්නේ නම් යෙහෙකැයි මෙසේ සිතුයේය. ධම්මිකය, සුප්‍රතිෂ්ඨ නුගගස මත්තෙහි ගෙඩි නුදුන්නේය. ධම්මිකය, ඉක්බිති කුරුරජ ශක්‍ර දෙවේන්ද්‍රයා යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ සක්දෙව් රජහට 'නිදුකානෙනි, දැන් දන්නෙහිද? සුප්‍රතිෂ්ඨ නුග ගස ගෙඩි හටනොගනීයයි' කීයේය.

"ධම්මිකය ඉක්බිති සක්දෙව් රජතෙම යම්සේ වහා වැහි වලාවක් ඇවිත් සුප්‍රතිෂ්ඨ නුග ගස හෙළුවේද මුලින් උදුරා දැම්මේද එබඳු ඉර්ධියක් පෑවේය.

13. "ධම්මිකය, ඉක්බිති සුප්‍රතිෂ්ඨය නම් නුග ගසෙහි අධිගෘහිත දෙවතාවා දුක්වූයේ නොසතුටු සිත් ඇතිවූයේ කඳුළු පිරුණු ඇස් ඇත්තේ අඬමින් එකත්පසෙක සිටියේය. ධම්මිකය, ඉක්බිති සක්දෙව් රජතෙම සුප්‍රතිෂ්ඨ නම් නුග ගසෙහි අධිගෘහිත දෙවතාවා යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ, සුප්‍රතිෂ්ඨ නුග ගසෙහි අධිගෘහිත දෙවතාවාට 'දේවතාවා, නුඹ දුක්ව, නොසතුටුව, කඳුළු පිරුණ ඇසින් යුක්තව, අඬමින් එක් පැත්තකට වී සිටින්නෙහිදැයි' ඇසීය. 'නිදුකානෙනි, එසේමය. මහත් වැහිවලාවක් ඇවිත් විමන හෙලූයේය. මුලින් උදුරා දැම්මේයයි' කීයේය.

'දෙවතාව, කිමෙක්ද වෘක්ෂයන්ගේ ස්වභාවයෙහි සිටියාවූ (ගස) මහත් වැහිවලාවක් විත් විමන හෙළුවාහුද, මුලින් උදුරා දැම්මේදැයි' ඇසීය. 'නිදුකානන්වහන්ස, කෙසේ වෘක්ෂය වෘක්ෂ ධර්මයෙහි පිහිටියේවේදැයි' ඇසීය. 'දෙවතාවෙනි, මේ ලොකයෙහි ගසක මුල් මුලින් ප්‍රයොජන ඇත්තෝ ගෙනයත්. පොත්ත පොතුවලින් ප්‍රයෝජන ඇත්තෝ ගෙනයත්. කොළ කොළවලින් ප්‍රයෝජන ඇත්තෝ ගෙනයත්. මල මල්වලින් ප්‍රයෝජන ඇත්තෝ ගෙනයත්. ගෙඩි ගෙඩිවලින් ප්‍රයෝජන ඇත්තෝ ගෙනයත්. ඒ කරණකොටගෙන දෙවතාවා විසින් නොසතුටු බවක්වත් නොඉවසීමක්වත් නොකට යුතුය. දෙවතාවෙනි මෙසේ වනාහි වෘක්ෂය වෘක්ෂධර්මයෙහි සිටියේ වේයයි' කීයේය.

'මා විසින් වෘක්ෂ ධර්මයෙහි නො පිහිටි (වෘක්ෂය) මහත් වැහිවලාවක් පැමිණ විමන හෙළුයේ මුල් උදුරණලද්දක් කෙළෙමියි' කීයේය. 'දෙවතාව' ඉදින් තොප වෘක්ෂ ධර්මයෙහි පිහිටන්නේ නම් තොපගේ විමන වන්නේය පෙර වූ සේ වේ.'

14. "ධම්මිකය, ඉක්බිති සක්දෙව්රජතෙම යම්සේ මහත් වැහිවලාවක් විත් සුප්‍රතිෂ්ඨ නම් නුගගස එසවූයේද එවැනි ඍද්ධියක් පෑවේය. පොත්ත සහිත මුල් සහිත වූවාහුය. ධම්මිකය, එසේම ශ්‍රමණ ධර්මයෙහි සිටි නුඹව ජාතිභූමකවූ උපාසකයෝ සියළු ජාතිභූමියෙහි වූ ආවාස සතින්ම නුඹ බැහැරකළාහුද,"

15. "ස්වාමීනි, කෙසේ නම් ශ්‍රමණතෙමේ ශ්‍රමණ ධර්මයෙහි සිටියේවේද, ධම්මිකය, මේ ශාසනයෙහි ශ්‍රමණතෙම ආක්‍රොශ කරන්නාට ආපසු ආක්‍රොශ නොකෙරේද, වෛර කරන්නාට නැවත වෛර නොකෙරේද, කොලාහලකරන්නාට නැවත කෝලාහල නොකෙරේද, ධම්මිකය, මෙසේ වනාහි ශ්‍රමණතෙම ශ්‍රමණ ධර්මයෙහි පිහිටියේ වේ. ස්වාමීනි, ශ්‍රමණ ධර්මයෙහි නොපිහිටි මාව ජාතිභූමියෙහිවූ උපාසකයෝ ජාති භූමියෙහිවූ ආවාස සතින් නෙරපූයේයයි" කීයේය.

16. "ධම්මිකය, පෙර වූ දෙයක් කියමි. පව් සෝදන තොටුපොලක, කාම සම්පත් අනුභව නොකරණ සුනෙත්‍ර නම්

ශාස්තෘකෙනෙක් විය. (ii) ධම්මිකය, සුනෙත්‍ර ශාස්තෘවරයාගේ නොයෙක් ශ්‍රාවකයන් සිය ගණනක් වූහ. සුනෙත්‍ර ශාස්තෘ තෙමේ ශ්‍රාවකයන්ට බ්‍රහ්ම ලෝකයට යාමට ධර්ම දෙශනා කරයි. ධම්මිකය, බ්‍රහ්ම ලෝකයට යාමට ධර්මදෙශනා කරණ සුනෙත්‍ර ශාස්තෘවරයා කෙරෙහි යම් කෙනෙක් හිත නොපැහැද වූවාහුද ඔව්හු ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැප නැති නපුරු ගති ඇති වහා වැටෙන නරකයෙහි ඉපදුනාහුය.

යම් කෙනෙක් බ්‍රහ්මලෝකයට යාමට ධර්මදෙශනා කරණ සුනෙත්‍ර ශාස්තෘන්වහන්සේගේ දෙශනාවල සිත පැහැදෙව්වාහුද ඔව්හු ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලෝකයෙහි ඉපදුනාහුය.

17. "ධම්මිකය, පෙර 'මූගපක්ඛ' නම් ශාස්තෘවරයෙක් විය. (මෙහි 16 (ii) ඡේදය යෙදිය යුතුයි. 'සුනෙත්‍ර' වෙනුවට 'මූගපක්ඛ' යයි වෙනස් කළ යුතුයි.)

18. "ධම්මිකය, පෙර 'අරණෙමි' නම් ශාස්තෘවරයෙක් විය. (මෙහි 16 (ii) ඡේදය යෙදිය යුතුයි. 'සුනෙත්‍ර' වෙනුවට 'අරණෙමි'යයි වෙනස් කළ යුතුයි.)

19. "ධම්මිකය, පෙර 'කුද්දාලක' නම් ශාස්තෘවරයෙක් විය. (මෙහි 16 (ii) ඡේදය යෙදිය යුතුයි. 'සුනෙත්‍ර' වෙනුවට 'කුද්දාලක'යයි වෙනස් කළ යුතුයි.)

20 "ධම්මිකය, පෙර 'හත්ථිපාල, නම් ශාස්තෘවරයෙක් විය. (මෙහි 16 (ii) ඡේදය යෙදිය යුතුයි. 'සුනෙත්‍ර' වෙනුවට 'හත්ථිපාල'යයි වෙනස් කළ යුතුයි.)

21. "ධම්මිකය, පෙර 'ජොතිපාල' නම් ශාස්තෘවරයෙක් විය. (මෙහි 16 (ii) ඡේදය යෙදිය යුතුයි. 'සුනෙත්‍ර' වෙනුවට 'ජොතිපාල'යයි වෙනස් කළ යුතුයි.)

22. "ධම්මිකය, ඒ කුමකැයි හඟින්නේද, (ii) යමෙක් පවුසෝදන තොටුපලවල් සමාන කාමයන්හි පහවූ ආශා ඇති නොයෙක් සියගණන් පිරිවර ශ්‍රාවක පිරිස ඇති මේ ශාස්තෘවරයන් සයදෙනාට දූශ්‍යවූ සිත් ඇතිව ආක්‍රොශ

කරන්නේද පරිභව කරන්නේද, හෙතෙම බොහෝ අකුශල් රැස්කරන්නේද, (iii) "ස්වාමීනි, එසේය."

23. "ධම්මිකය, (මේ සූත්‍රයේ 22 (ii) ඡේදය යෙදිය යුතුයි.) රැස්කරන්නේය. ඊට හෙතු කවරේද? ධම්මිකය, මම සබ්‍රම්සරුන් කෙරෙහි මෙන් මේ ශාසනයෙන් පිට මෙබඳු ඉවසීමක් නොකියමි. ධම්මිකය, තොප විසින් සමාන බ්‍රහ්මචරියාව රකින්නන් අතරෙහි සිත් දූශ්‍ය කර නොගන්නෙමුයි හික්මිය යුතුයි. ධම්මික, තොප විසින් මෙසේ හික්මිය යුතුය.

(1) "සුනෙත්‍ර නම් ශාස්තෘද මූගපක්ඛ නම් ශාස්තෘද, බ්‍රාහ්මණ වංශ ඇති අරනෙමි නම් ශාස්තෘද යමෙක් කුද්දාල පණ්ඩිතවූයේද, ඒ ශාස්තෘද මානවකවූ හස්තිපාල නම් ශාස්තෘද රේණු ආදී සත්රජුන්ට පුරෝහිතවූ මහා ගොවින්දයයි කියන ලද යමෙක් වූයේද ඒ ජොතිපාල නම් ශාස්තෘද යන මහ පිරිවර ඇති මේ ශාස්තෘ සදෙන අතීත කාලයෙහි හිංසා නොකටයුතු වූහ.

(2) "ක්‍රොධයයි කියනලද දුගඳින් තොරවූ කරුණා ධ්‍යානයෙහි සිටියාවූ කාම සංයෝජනයන් ඉක්මෙව්වාවූ ඒ ශාස්තෘවරයෝ කාම රාගය දුරුකොට බ්‍රහ්මලෝකයට ගියාහුය.

(3) "ඒ ශාස්තෘවරයන්ගේ නොයෙක් සිය ගණන් ශ්‍රාවකයෝ වූහ. ක්‍රොධයයි කියන ලද දුගඳින් තොරවූ කරුණා ධ්‍යානයෙහි පිහිටියාවූ කාම සංයෝජනයන් ඉක්මෙව්වාවූ ඒ ශ්‍රාවකයෝද කාම රාගය දුරුකොට බ්‍රහ්මලොකයට ගියාහුය.

(4) "බාහිරවූ පහකරනලද රාගය ඇති එකඟ සිත් ඇති මේ ඍෂීන්ට යම් මිනිසෙක් කෝපවූ සිතින් පරිභව කෙරේද, ඒ තැනැත්තේ බොහෝ අකුශල් රැස් කෙරේ.

(5) "සර්වඥ ශ්‍රාවකවූ සෝවාන්වූ යම් එක් භික්ෂුවකට යම් මනුෂ්‍යයෙක්තෙම කෝපවූ සිතින් පරිභව කෙරේද මේ මනුෂ්‍යතෙම ඊට වඩා අතිශයින් අකුශල් රැස්කෙරේ

යහපත් ස්වභාව ඇති දෙසැට දෘෂ්ටි නැතිකරගැණීමටද නොලැබෙන්නේය.

(6) "යමෙකුගේ ශ්‍රද්ධාවද ස්මෘත්තියද වීයර්‍යයද සංසිඳීමද, ප්‍රඥාවද යන පඤ්චෙන්ද්‍රියයෝ මෘදුවෙත්ද කාමයන්හි අවීතරාගය ඇත්තේද මේ පුද්ගලතෙම ආයර්‍ය සංඝයා පිළිබඳව සත්වන පුද්ගල වේ. එබඳු භික්ෂුවකට කෝපව පීඩා කෙරේද, ඒ පුද්ගලතෙම පළමුව තමන්ට පීඩාකොට පසුව අන්‍යයාට පීඩා කෙරෙයි.

(7) "යමෙක් ආත්මය රකීද ඔහුගේ පිටත දේ ආරක්ෂාවේ. එහෙයින් නුවණැත්තේ සැමකල්හි ගුණ නැසීමෙන් නොනැසුනේ ආත්මය රකින්නේය"

---

## දෙවෙනි පණ්ණාසකය.

## 6. මහා වර්ගය.

1. **සොණකොළිවිස සූත්‍රයඃ-** 1. "මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර ගිජ්ඣකූට පර්වතයෙහි වසනසේක. එසමයෙහි වනාහි ආයුෂ්මත් සෝණ තෙමේ රජගහනුවර සීත වනයෙහි වෙසෙයි.

2. ඉක්බිති වනාහි රහසිගතවූ, විවේක සහිතවූ, ආයුෂ්මත් සොණ හට මෙබඳු සිතේ කල්පනාවක් පහළවිය.

3. "භගවත්හුගේ යම්කිසි ශ්‍රාවක කෙනෙක් පටන්ගත් වීර්යයෙන් වෙසෙත්ද, මම ඔවුන්ගෙන් කෙනෙක්මි. එසේද වුවත් වනාහි මගේ සිත අල්වා ගැනීමක් නැතිව කෙලසුන් ගෙන් නොමිදෙයි මගේ ගෙයි වනාහි භොගයෝ වෙත්. භොගයන් අනුභව කරමින් පින් කරන්ටද හැකිය. මම ශික්ෂාවන් හැරදමා ගිහිව භොගයන්ද අනුභව කරමින් පින්ද කරන්නෙම් නම් මැනවැයි' සිතුයේය.

4. ඉක්බිත්තෙන් වනාහි භාග්‍යවතුන් වහන්සේ සිතින් ආයුෂ්මත් සෝණගේ සිතෙහිවූ කල්පනාව දැන (ii) යම්සේ

බලවත් පුරුෂයෙක් හැකිලවූ අතක් දිග හරීද දිගුකළ අතක් හකුලාද, එසේම (iii) ගිජුකුළු පව්වෙන් අතුරුදහන්ව සීත වනයෙහි ඇවැත් සොණ ඉදිරියේ පහළවූ සේක.

**5.** භාග්‍යවතුන් වහන්සේ පනවන ලද අස්නේ වැඩහුන්සේක. ආයුෂ්මත් සෝණ තෙමේ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් සෝණහට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළෝය.

"සෝණය, රහසිගතව විවේකව සිටි තොපගේ සිතට මෙබඳු කල්පනාවක් වූයේ නොවේද? (මෙහි 3 ඡේදය යෙදිය යුතුයි.)- "ස්වාමීනි, එසේය."

**6** "සෝණය, ඒ කුමකැයි සිතන්නෙහිද? පෙර ඔබ ගිහිගෙයි සිටියදී වීණාවෙහි තත් වැයීමෙහි දක්ෂ නොවේද?"-"එසේය, ස්වාමීනි."

"සෝණය, ඒ කුමකැයි සිතහිද? යම්විටෙක ඔබගේ වීණාවෙහි තත් ඉතා දිග නම් එවිට ඔබේ වීණාව හොඳට නද දේද, වැඩට සුදුසු වේද?"-"ස්වාමීනි, නොවේමය."

"සෝණය, යම්විටෙක ඔබගේ වීණාවෙහි තත් ඉතා බුරුල්වූවා, කිම ඔබේ වීණාව එවිට හොඳට නදදේද, වැඩට සුදුසු වේද?"-"ස්වාමීනි, නොවේමය."

"සෝණය, යම්විටෙක වීණාවේ තත් ඉතා දිග නොවේද, ඉතා බුරුල් නොවේද, සම ගුණයෙහි සිටියේ වේද. ඔබේ වීණාව එවිට කිම හොඳට නදදේද, වැඩට සුදුසු වේද?"-"ස්වාමීනි, එසේය."

"එසේම සෝණය, වැඩියෙන් පටන්ගත් වීර්යය සිතේ නොසන්සුන්කම පිණිස පවතී. ඉතා හැකුලුන වීර්යය අලසකම පිණිස පවතී.

"සෝණය, එබැවින් ඔබ මෙහිදී වීර්යයේ සමවතෙහි පිහිටව. වීර්යාදී ඉඳුරන්ගේ සම බව තේරුම් ගනුව. එහිදු අරමුණ ගනුව."

"එසේය, ස්වාමීනියි" ආයුෂ්මත් සෝණතෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුනි.

7. ඉක්බිත්තෙන් වනාහි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් සෝණහට මේ අවවාදයෙන් අවවාද දී (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) සීත වනයෙන් අතුරුදන්ව ගිජුකුලු පව්වෙහි පහළ විය.

8. ඉක්බිත්තෙන් වනාහි ආයුෂ්මත් සෝණතෙමේ පසු කාලයේ වීර්ය සමභාවයෙහි පිහිටියේය. ඉඳුරන්ගේ සමභාවය තේරුම් ගත්තේය. එහිදු අරමුණ ගත්තේය.

ඉක්බිත්තෙන් ආයුෂ්මත් සෝණතෙමේ හුදකලා වූයේ තනිවූයේ නොපමාවූයේ, කෙලෙස් තැවීම කරන්නේ නිවන් වෙත යොමුකළ සිත් ඇතිව වසන්නේ නොබෝ කලකින්ම යමක් පිණිස කුලපුත්තු ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදි වෙත්ද, ඉතා උතුම්, බඹසර අවසන්කොට ඇති ඒ නිවන මේ ආත්මයේම තෙමේ මනාව දැන, අත්දැක, පැමිණ වාසය කෙළේය. උත්පත්තිය ගෙවුණේය. බඹසර වැස නිමවීය. කළයුත්ත කරන ලදී. මෙලොවෙහි කළයුතු අනිකක් නැතැයි පෙනුණේය. ආයුෂ්මත් සෝණතෙමේ රහතුන් අතර එක් තැනැත්තෙක් විය.

9. ඉක්බිති රහත්වූ සෝණහට මෙබඳු සිතෙක් විය. මම භාග්‍යවතුන්වහන්සේ වෙත ගොස් රහත් භාවය පවසන්නෙම් නම් මැනවැ'යි (කියාය.) ඉක්බිති සෝණ තෙමේ භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙකද එහි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන්වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ ආයුෂ්මත් මහණතෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය.

10. "ස්වාමීනි, රහත්වූ, පව් ගෙවූ, බඹසර වැස නිමවූ, කළයුත්ත කළ, බර බිම තැබූ, සිය වැඩ සම්පූර්ණවූ හොඳින් දැන මිදුණාවූ යම් මේ භික්ෂුවක් වේද, මේ කරුණු සයෙහි අධිකලෙස ඇළුනේ වේ.

11 "නෛෂ්ක්‍රම්‍යයෙහි, තද විවේකයෙහි, අහිංසා (අව්‍යාපාද) යෙහි, ඇල්ම (තණ්හා) නැති කිරීමෙහි, දැඩිසේ ගැනීම ක්ෂය කිරීමෙහි, මුළා නොවීමෙහි, අධික ලෙස ඇළුණේ වෙයි.

12. "ස්වාමීනි, මේ ලොව කිසි ආයුෂ්මත් කෙනකුට මෙබඳු සිතෙක් වෙයි. 'ඒකාන්තයෙන් මේ ආයුෂ්මත් තෙමේ හුදෙක් ශ්‍රද්ධාමාත්‍රයක් නිසා නෛෂ්ක්‍රම්‍යයෙහි යෙදුණේය' කියාය. ස්වාමීනි, මෙය මෙසේ නොදත යුතුය.

13. "ස්වාමීනි, වැස නිමවූ, කළයුත්ත කළ, ඉදිරියට තමා විසින් කළයුත්තක් නොදක්නා, කළදෙය නැවත රැස් කිරීමක් හෝ නැති, ආශ්‍රවයන් ක්ෂය කළ භික්ෂුව, රාගය ක්ෂය කිරීමෙන් රාගය දුරුකිරීම් හේතුවෙන් නෛෂ්ක්‍රම්‍යයෙහි යෙදුණේ වේ. ද්වෙෂය ක්ෂය කිරීමෙන් ද්වෙෂය ක්ෂය කිරීම් හේතුවෙන් නෛෂ්ක්‍රම්‍යයෙහි යෙදුණේ වේ. මොහය ක්ෂය කිරීමෙන් මෝහය ක්ෂය කිරීම් හේතුවෙන් නෛෂ්ක්‍රම්‍යයෙහි යෙදුණේ වේ.

14. (i) "ස්වාමීනි, මේ ලොව කිසි ආයුෂ්මත් කෙනෙකුට මෙබඳු සිතෙක් වෙයි. (ii) 'ඒකාන්තයෙන් මේ ආයුෂ්මත් තෙමේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා කැමැත්තෙන්ම තද විවේකයෙහි යෙදුණේ වේ' (කියා) ය. ස්වාමීනි, මෙය මෙසේ නොදත යුතුය. (මෙහි 13 ඡේදය නෛෂ්ක්‍රම්‍ය වෙනුවට තද විවේකය කියා වෙනස්කර යෙදිය යුතුයි.)

15. "ස්වාමීනි, (මෙහි 12 ඡේදය යෙදිය යුතුයි) 'ඒකාන්තයෙන් මේ ආයුෂ්මත් තෙමේ බුදුසස්නෙන් බැහැර සිල් හා පිළිවෙත් සාරකොට අනුව යන්නේ අහිංසාවෙහි යෙදුණේ වේ.' (කියාය). ස්වාමීනි, මෙය මෙසේ නොදත යුතුයි.

"ස්වාමීනි, (12 ඡේදයද, 15 ඡේදයේ අහිංසාවෙහි යන්න වෙනුවට තෘෂ්ණා ක්ෂයකිරීමෙහි කියා වෙනස් කර 13 වෙනි ඡේදයද යොදාගත යුතුයි.)

"ස්වාමීනි, (12 වෙනි ඡේදයද, 15 වෙනි ඡේදයේ අහිංසාවෙහි යන්න වෙනුවට දැඩිකොට සිතින් අල්වා ගැනීම ක්ෂයකිරීමෙහි කියා වෙනස්කර 13 වෙනි ඡේදයද යොදාගත යුතුයි.)

"ස්වාමීනි, (12 ඡේදයද, 15 ඡේදයේ අහිංසාවෙහි යන්න වෙනුවට මුළා නොවීමෙහි කියා වෙනස් කර 13 වෙනි ඡේදයද යොදාගත යුතුයි.)

16 "ස්වාමීනි, මෙසේ යහපත්ව කෙලෙසුන්ගෙන් මිදුණු සිත් ඇති භික්ෂුව අලංකාර රූපයෝ ඇස්හමුවට පැමිණෙත්ද ඒ රූප ඔහුගේ සිත මැඩ නොගනී. ඔහුගේ සිත (එයින්) අවුල් නුවූයේමය. ස්ථිරවූයේ, නොසැලෙන බවට ගියේ, ඒ රූපයන්ගේ විනාශය ද බලයි.

17. "ස්වාමීනි, මෙසේ (16 ඡේදය රූප වෙනුවට කනින් දතයුතු ශබ්ද කියා යොදාගත යුතුය)

18. "ස්වාමීනි, (16 ඡේදය රූප වෙනුවට ගන්ධ කියා යොදා ගත යුතුයි.)

19. "ස්වාමීනි, (16 වෙනි ඡේදය රූප වෙනුවට රස කියා යොදාගත යුතුයි)

20. "ස්වාමීනි, (16 වෙනි ඡේදය රූප වෙනුවට ස්පර්ශ කියා යොදාගත යුතුයි.)

21. "ස්වාමීනි, (16 වෙනි ඡේදය රූප වෙනුවට සිතින් දතයුතු කරුණු කියා වෙනස්කර යොදාගත යුතුයි.)

22. "ස්වාමීනි, සිදුරු නොවූ බෙන නැති, එකට ඝනවූ ගල් පර්වතයක් යම්සේද (i) නැවත පෙරදිගින්ද (ii) මහත් වාතයක් සහිත වැස්සක් එන්නේද, ඒ පර්වතය කම්පා නොකරන්නේය. නොවෙවුල වන්නේය. විශෙෂයෙන් නොවෙවුල වන්නේය. නැවත බටහිර දිශාවෙන්ද (22-(ii) ඡේදය යෙදිය යුතුයි.) නැවත උතුරු දිශාවෙන්ද (22-(ii) ඡේදය යෙදිය යුතුයි.) නැවත දකුණු දිශාවෙන්ද (22-(ii) ඡේදය යෙදිය යුතුයි.)

23. ස්වාමීනි, එසේම මෙසේ යහපත්සේ කෙලෙසුන් ගෙන් මිදුන සිත් ඇති මහණහට ඇසින් දැක්කයුතු ලක්ෂණ රූපයෝ ඇසට හමුවෙත්ද ඔහුගේ සිත මැඩ නොපවතිත්. ඔහුගේ සිත අවුල් නොවූයේ වේ. නොසැලෙන බවට පැමිණියේය. රූපයෝ විනාශය අනුව බලයි.

"ස්වාමීනි, එසේම මෙසේ යහපත්සේ කෙලෙසුන්ගෙන් මිදුන සිත් ඇති මහණහට කණින් ඇසියයුතු ශබ්දයෝ හමුවෙද්ද

ඔහුගේ සිත මැඩ නොපවතිත්. ඔහුගේ සිත අවුල් නොවූයේවේ. නොසැලෙන බවට පැමිණියේය. ශබ්දයේ විනාශය අනුව බලයි.

"ස්වාමීනි, එසේම මෙසේ යහපත්සේ කෙලෙසුන්ගෙන් මිදුන සිත් ඇති මහණහට නාසයෙන් ගඳ සුවඳ දැනීම කටයුතු ගඳසුවඳ හමුවෙත්ද, ඔහුගේ සිත මැඩ නොපවතිත්. ඔහුගේ සිත අවුල් නොවූයේවේ, නොසැලෙන බවට පැමිණියේය. ගඳ සුවඳේ විනාශය අනුව බලයි.

"ස්වාමීනි, එසේම මෙසේ යහපත්සේ කෙලෙසුන්ගෙන් මිදුන සිත් ඇති මහණහට දිවෙන් දතයුතු රසයෝ හමුවෙද්ද ඔහුගේ සිත මැඩනොපවතිත්. ඔහුගේ සිත අවුල්නොවූයේවේ. නොසැලෙන බවට පැමිණියේය. රසයන්ගේ විනාශය අනුව බලයි

"ස්වාමීනි, එසේම මෙසේ යහපත්සේ කෙලෙසුන්ගෙන් මිදුන සිත් ඇති මහණහට කයින් දැනගතයුතු ස්පර්ශයෝ හමුවෙත්ද, ඔහුගේ සිත මැඩනොපවතිත්. ඔහුගේ සිත අවුල් නොවූයේවේ. නොසැලෙන බවට පැමිණියේය. ස්පර්ශයන්ගේ විනාශය අනුව බලයි."

"ස්වාමීනි, එසේම මෙසේ යහපත්සේ කෙලෙසුන්ගෙන් මිදුන සිත් ඇති මහණහට සිතින් දැනගතයුතු ධර්මයෝ හමුවෙත්ද, ඔහුගේ සිත මැඩනොවතිත්. ඔහුගේ සිත අවුල් නොවූයේවේ. නොසැලෙන බවට පැමිණියේය. ධර්මයන්ගේ විනාශය අනුව බලයි."

**(1-2)** "රහත්බවයයි කියන නෛෂ්ක්‍රම්‍යයද, සිතේ එම කෙළෙසුන් කෙරෙන් වෙන්වීම ඇතිබවද අවබොධ කොට සිටියාවූද තෘෂ්ණාව නැතිකිරීමද, සිතේ මුලානොවීමද අවබොධකොට සිටියාවූ කෙළෙස් නැති උතුමෙකුගේ ආයතනයන්ගේ ඉපදීම හා විනාශය දැක සිත මනා කොට මිදේද'

**(3-4)** "මෙසේ මනාකොට මිදුනාවූ නිවුනාවූ සිත් ඇති ඒ භික්ෂුව විසින් කරණලද්ද නැවත නැවත වැඩීමක් නැත්තේය. කළයුතු දෙයක් නැත.

(5) "ඒක ඝනවූ පර්වතය වාතයෙන් කම්පා නොවේද මෙපරිද්දෙන් රූපාලම්බනයෙන්ද, (ඇලීමෙන්ද) ශබ්දාලම්බනයෙන්ද, ගන්ධාලම්බනයෙන්ද, ස්පර්ශාලම්බනයෙන්ද, ලාභාලාභයෙහි ගිජුනොවන රහතන්වහන්සේලා කම්පා නොවෙති. උන්වහන්සේගේ සිත විශෙෂයෙන් මිදුනේ වේ සිටියේවේ. ඒ සිතේ ඉපදීම හා නැසීමද රහතන් වහන්සේ නැවත නැවත දකියි."

2. **ආබාධික ඵග්ගුණ සූත්‍රයː-** 1. එසමයෙහි වනාහි ආයුෂ්මත් ඵග්ගුණ ස්ථවිරයන් වහන්සේ හටගත් ආබාධ ඇත්තේ දුක්වූයේ දැඩි ගිලන්වූයේ වෙයි. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැන්හි පැමිණියහ. පැමිණ, භාග්‍යවතුන්වහන්සේ වැඳ එකත්පස්ව හුන්නාහ. එකත්පසෙක හුන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන්වහන්සේට මෙය සැළකළහ.

2. "ස්වාමීනි, ආයුෂ්මත් ඵග්ගුණ ස්ථවිරයන් වහන්සේ හටගත් ආබාධ ඇත්තේ දුක්වූයේ දැඩි ගිලන්වූයේ වෙයි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා කොට ආයුෂ්මත් ඵග්ගුණ ස්ථවිරයන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණෙන සේක්වා!" භාග්‍යවතුන් වහන්සේ කිසිවක් නොවැදෑරීමෙන් එය ඉවසූසේක.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි විවේකයෙන් නැගිටිසේක් ආයුෂ්මත් ඵග්ගුණ ස්ථවිරයන් වහන්සේ යම් තැනකද එතැන්හි එළඹිසේක. භාග්‍යවතුන් වහන්සේ වඩින බව දුරදීම ආයුෂ්මත් ඵග්ගුණ ස්ථවිරයන් වහන්සේ දැක්කේමය. දැක ඇඳෙන් නැගිටින ආකාරයක් දැක්වූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ඵග්ගුණ ස්ථවිරයන් වහන්සේට මෙසේ වදාළහ.

4 "ඵග්ගුණය, ඔබ ඇඳෙන් නැගිටීම යුතු නැත. කලින් පැනවූ මේ ආසනයෝ ඇත්තාහ. මම එහි හිඳගන්නෙමි." පැනවූ අස්නෙහි භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටි සේක. වැඩහිඳ ආයුෂ්මත් ඵග්ගුණ ස්ථවිරයන් වහන්සේට මෙසේ වදාළහ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ඔබ රුචිකරණ දේ මොනවාද? යැපියයුතු දේ කිමෙක්ද? දුක් වේදනාවෝ අඩුවෙමින් පවතිත්ද? වැඩවෙමින් පවතිත්ද? අඩුවෙන බවක් පෙනේද? වැඩිවෙන බවක් පෙනේද?"

5. "ස්වාමීනි, කිසිවක් රුචි නොවේ. (ii) යැපිය යුතු කිසිවක් (වුවමනා) නොවේ. මාගේ දැඩිවූ දුක් වේදනාවෝ වැඩෙමින් පවතිත්. අඩුවෙමින් නොපවතිත්. වැඩිවන බව පෙනේ. අඩුවන බව නොපෙනේ. (iii) ස්වාමීනි, යම්සේ බලවත් පුරුෂයෙක් තියුණු උලකින් හිස කළඹාද එමෙන්ම ස්වාමීනි, බලවත් වාතයෝ මාගේ හිසට පීඩා කරත්.

6. "ස්වාමීනි, මට රුචි දෙයක් නැත. (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) ස්වාමීනි, යම්සේ බලවත් පුරුෂයෙක් දැඩිවූ වරපටකින් හිස වෙලන්නේද ස්වාමීනි, එමෙන්ම මාගේ හිසෙහි දැඩිවූ හිසරදය පවතියි.

7. "ස්වාමීනි, මට රුචි දෙයක් නැත. (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) ස්වාමීනි, යම්සේ දක්ෂවූ ගවයන් මරන්නෙක් හෝ ඔහුගේ අතවැස්සෙක් හෝ තියුණු පිහියකින් බඩ කපන්නේද, එපරිද්දෙන්ම ස්වාමීනි, බලවත් වාතයෝ මාගේ කුසට වේදනා දෙත්.

8. "ස්වාමීනි, මට රුචි දෙයක් නැත. (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) ස්වාමීනි, යම්සේ බලවත් පුරුෂයෝ ඉතා දුර්වල පුරුෂයකු අත්වලින් අල්ලා ගිනිඅඟුරු වලක රත්කරවත්ද එපරිද්දෙන්ම ස්වාමීනි, මාගේ ශරීරයෙහි බලවත් දැවිල්ලක් වෙයි. ස්වාමීනි, මට රුචි දෙයක් නැත.

9. ඉක්බිති ආයුෂ්මත් ඵග්ගුණ ස්ථවිරයන් වහන්සේට දැහැමි කථාවන් දක්වා සමාදන් කරවා තෙද ගන්වා සතුටු කරවා අස්නෙන් නැගිට වැඩිසේක. ඉක්බිති ආයුෂ්මත් ඵග්ගුණ ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ වැඩමවා ටික වේලාවකින් කාලක්‍රියා කළහ.

10. උන්වහන්සේගේ මරණාවස්ථාවෙහි ඉන්ද්‍රියයෝ මනාසේ දැකුම්කලුව තිබුනාහ. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද

ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැන්හි පැමිණියහ. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියහ. එකත්පසෙක සිටියාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ.

11. "ස්වාමීනි, ආයුෂ්මත් එග්ගුණ ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ වැඩමවා ටික වේලාවකින්ම කාලක්‍රියා කළහ. උන්වහන්සේගේ මරණාවස්ථාවෙහි ඉන්ද්‍රියයෝ දැකුම්කලුව තිබුනාහ."

"කිමෙක්ද? ආනන්දය, එග්ගුණ ස්ථවිරයන්ගේ ඉන්ද්‍රියයෝ පැහැදී නොතිබෙද්ද? ආනන්දය, එග්ගුණ භික්ෂුවගේ පස් වැදෑරුම් ඔරම්භාගිය සංයෝජනයන්ගෙන් සිත මිදුනේය. ඔහුට ඒ ධර්මදේශනාව අසා පස්වැදෑරුම් ඔරම්භාගිය සංයෝජනයන්ගෙන් සිත මිදුනේය.

12 "ආනන්දය, සුදුසු කාලයෙහි බණ ඇසීමෙහි සුදුසු කාලයෙහි අර්ථ පරීක්ෂාකිරීමෙහි මේ අනුසස් සයෙකි. ඒ කවරහුද? ආනන්දය, මේ ශාසනයෙහි භික්ෂුවට පස්වැදෑරුම් ඔරම්භාගිය සංයෝජනයන් ගෙන් සිත මිදෙයි. හෙතෙම මරණ කාලයේ තථාගතයන් වහන්සේගේ දර්ශනය ලබයි. ඔහුට තථාගතයන් වහන්සේ ධර්මදෙශනා කරයි. (ii) මුල යහපත් මැද යහපත් කෙළවර යහපත් අර්ථසහිතවූ ව්‍යඤ්ජන සහිතවූ සියල්ල සම්පූර්ණවූ පිරිසිදු බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශ කරයි. ඒ ධර්මදෙශනාව අසා පස්වැදෑරුම් ඔරම්භාගිය සංයෝජනයන්ගෙන් සිත මිදෙයි. (iii) ආනන්දය, සුදුසු කාලයෙහි ධර්ම ශ්‍රවණයේ මේ ප්‍රථම ආනිශංසයයි.

13 "ආනන්දය, නැවතද පස්වැදෑරුම් ඔරම්භාගිය සංයෝජනයන්ගෙන් භික්ෂුවගේ සිත මිදුනේ වේද ඔහු මැරෙණ කාලයෙහි තථාගතයන් වහන්සේගේ දර්ශනය නොලැබුවේද එසේ නමුදු තථාගත ශ්‍රාවකයකු දක්නට ලැබෙයි. ඔහුට තථාගත ශ්‍රාවක තෙම ධර්මදෙශනා කරයි. (මෙහි 12 (ii) යෙදිය යුතුයි.) ආනන්දය සුදුසු කාලයෙහි ධර්ම ශ්‍රවණයේ මේ දෙවන ආනිශංසයයි.

14 "ආනන්දය, පස්වැදෑරුම් ඔරම්භාගිය සංයෝජනයන්ගෙන් භික්ෂුවගේ සිත මිදුනේ වේද, (ii) ඔහු මැරෙණ කාලයෙහි තථාගත දර්ශනය නොලැබේද තථාගත ශ්‍රාවක දර්ශනය නොලබාද එසේ නමුදු ඇසූ පරිදි දැරූපරිදි ධර්මය සිතින් කල්පනා කරයි. විචාරයි. සිතින් ඒ අනුව බලයි. (iii) පස් වැදෑරුම් ඔරම්භාගිය සංයෝජනයන් ගෙන් සිත මිදෙයි. ආනන්දය මේ සුදුසු කාලයෙහි ධර්මශ්‍රවණය කිරීමේ අර්ථයන් සිහිකිරීමේ තුන්වන අනිශංසයයි.

15 "ආනන්දය, මේ ශාසනයෙහි පස්වැදෑරුම් ඔරම්භාගිය සංයෝජනයන්ගෙන් භික්ෂුවගේ සිත මිදුනේ වේද, නිරුත්තරවූ නැවත නැවත ඉපදීමේ සිත මිදුනේ වේ. හෙතෙම මැරෙණ කාලයෙහි තථාගත දර්ශනය ලැබේද ඔහුට තථාගතයන් වහන්සේ ධර්මදෙශනා කරයි. (මෙහි 12 (ii) යෙදිය යුතුයි.) ඔහුට ඒ ධර්මදෙශනාව අසා නිරුත්තරවූ නැවත නැවත ඉපදීමේ සිත මිදෙයි. ආනන්දය, සුදුසු කාලයෙහි බණ ඇසීමේ මේ සතරවන ආනිශංසයයි.

16 "ආනන්දය, නැවතද පස්වැදෑරුම් ඔරම්භාගිය සංයෝජනයන්ගෙන් භික්ෂුවගේ සිත මිදෙයි. නිරුත්තරවූ නැවත නැවත ඉපදීමේ සිත මිදුනාවූ හෙතෙම මැරෙණ කාලයෙහි තථාගත දර්ශනය නොලබයිද එසේ නමුදු තථාගත ශ්‍රාවකයකුගේ දර්ශනය ලැබෙයි. ඔහුට තථාගත ශ්‍රාවකතෙම ධර්මය දෙශනා කරයි. (මෙහි 12 (ii) යෙදිය යුතුයි.) ඒ ධර්මය අසා ඔහුගේ සිත නිරුත්තරවූ නැවත නැවත ඉපදීමෙන් මිදෙයි. ආනන්දය, මේ සුදුසු කාලයෙහි බණ ඇසීමේ පස්වන ආනිශංසයයි.

17 "නැවතද ආනන්දය, භික්ෂුවගේ සිත පස්වැදෑරුම් ඔරම්භාගිය සංයෝජනයන්ගෙන් සිත මිදෙයි. නිරුත්තරවූ නැවත නැවත ඉපදීමේ සිත මිදුනේ වෙයි. (මෙහි 14 (ii) යෙදිය යුතුයි.) ඔහු ඇසූ පරිදි දැරූ පරිදි ධර්මය සිතින් කල්පනා කරන්නේ විචාරන්නේ ඒ පිළිබඳව සිත යොදවන්නේ නිරුත්තරවූ නැවත නැවත ඉපදීමෙහි සිත මිදෙයි. ආනන්දය, සුදුසු කාලයෙහි බණ ඇසීමෙහි අර්ථ පරීක්ෂා කිරීමෙහි මේ ආනිශංසයෝ සදෙන වෙති."

3. **ජළාභිජාති සූත්‍රයː-** 1. "එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර ගිජ්ඣකූළ පව්වෙහි වෙසේ. ඉක්බිති වනාහි ආයුෂ්මත් ආනන්දතෙමේ භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ ආයුෂ්මත් ආනන්දතෙම භාග්‍යවතුන් වහන්සේහට මෙය කීය.

2. "ස්වාමීනි, පූරණ කාශ්‍යප විසින් ජාතීහු සයක් පනවන ලදහ. කළුවූ ජාතියක් පනවන ලදී. නිල්වූ ජාතියක් පනවන ලදී. ලේවන් ජාතියක් පනවන ලදී. කහවන් ජාතියක් පනවන ලදී. සුදුවූ ජාතියක් පනවන ලදී. ඉතාම සුදුවූ ජාතියක් පනවන ලදී.

3. "ස්වාමීනි, එහි වනාහි පූරණ කාශ්‍යප විසින් බැටළු වැද්දෝය, හූරු වැද්දෝය, කුරුලු වැද්දෝය, මුව වැද්දෝය මසුන් මරන්නෝය, සොරුය, සොරු මරන්නෝය, සිරකරුවෝය, අන් කිසි කෲර කර්ම කරන්නෝද යන මෙය කළු වූ ජාතියයයි පනවන ලදී. ස්වාමීනි, එහි වනාහි පූරණ කාශ්‍යප විසින් භික්ෂූන් අතර රළු පැවතුම් ඇත්තෝද, අන් කිසි කර්ම මත ඇති ක්‍රියාවාද ඇති අයද යන මෙය නිල්වූ ජාතියයයි පනවන ලදී. ස්වාමීනි, එහි වනාහි පූරණ කාශ්‍යප විසින් එක් සළුවක් හඳනා නිගණ්ඨයෝය යන මෙය ලේවන් ජාතියයයි පනවන ලදී. ස්වාමීනි, එහි වනාහි පූරණ කාශ්‍යප විසින් ගිහි වූත් සුදු වස්ත්‍ර හඳනා වූත් අචෙලක (-නිර්වස්ත්‍ර) තපසුන්ගේ ශ්‍රාවකයෝ යන මෙය කසාවන් ජාතියයයි පනවන ලදී. ස්වාමීනි, එහි වනාහි පූරණ කාශ්‍යප විසින් ආජීවක තාපසයෝද ආජීවක තවුසියෝද යන මෙය සුදුවූ ජාතියයයි පනවන ලදී. ස්වාමීනි, එහි වනාහි පූරණ කාශ්‍යප විසින් නන්ද නම් වූද වච්ඡා නම් වූද, කෘශ වූද සංකිච්ච නම් වූද මක්ඛලී ගොසාල තෙමේ යන මෙය ඉතා සුදු ජාතියයයි පනවන ලදී. ස්වාමීනි, පූරණ කාශ්‍යප විසින් මේ ජාතීහු සය පනවන ලදී."

4. "ආනන්දය, කිමෙක්ද වනාහි පූරණ කාශ්‍යප හට සියලු ලොව මේ ජාතීහු සය පැනවීමට මෙසේ අනුදනීද?" "ස්වාමීනි, මෙය නොවේමය."

"ආනන්දය, යම්සේ පුරුෂයෙක්තෙම දිළිඳු වූයේවේද, ස්වකීය දෙයක් නැත්තේද, නැළියක් (සහල්) නැත්තේද නො කැමැත්තහුට 'පින්වත් පුරුෂය, තා විසින් මේ මස කෑ යුතුය, මලද නොදිය යුතුයයි' සිතේ කිලුටකට (-බාධාවකට) අසු කරන්නේද, ආනන්දය, එසේම වනාහි මෝඩවූ ව්‍යක්ත නොවූ ස්ථාන නො දන්නාවූ, පාපවූ පූරණ කාශ්‍යප විසින් එය එසේ ප්‍රතිඥා නොකොට මේ මහණ බමුණන්ට මේ ජාති සය පනවන ලද්දේය. ආනන්දය, මම වනාහි ජාති සයක් පනවමි. එය අසව, හොඳට මෙනෙහි කරව, කියන්නෙමි."

"ස්වකීය, මැනවයි" ආයුෂ්මත් ආනන්ද තෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය.

**5.** "ආනන්දය, ජාති සය කෙසේද? ආනන්දය, මේ ලොව එකෙක් කළුවූ ජාති ඇත්තේ කළුවූ (පාප-) ධර්මයක් උපදවයි. ආනන්දය මේ ලොව එකෙක් කළුවූ ජාති ඇත්තේ සුදුවූ (පින්) දහම උපදවයි. ආනන්දය මේ ලොව එකෙක් කළුවූ ජාති ඇත්තේ කළු නොවූ, සුදු නොවූ නිවන උපදවයි. ආනන්දය, මේ ලොව එකෙක් සුදුවූ ජාති ඇත්තේ කළුවූ දහම උපදවයි. ආනන්දය මේ ලොව එකෙක් සුදුවූ ජාති ඇත්තේ සුදුවූ දහම උපදවයි. ආනන්දය, මේ ලොව එකෙක් සුදුවූ ජාති ඇත්තේ කළු නොවූ සුදු නොවූ නිවන උපදවයි.

**6.** "ආනන්දය, කෙසේ නම් කළු ජාති ඇත්තේ කළුවූ දහම උපදවාද? (ii) ආනන්ද, මෙලොව වනාහි එකෙක් නීච කුලයවූ සැඬොල් කුලයෙහි හෝ වැදි කුලයෙහි හෝ කුළු පොතු කුලයෙහි හෝ රියකරු කුලයෙහි හෝ පුප්සඬු කුලයෙහි හෝ ආහාර පාන භොජන නැති, දුෂ්කර ජීවිකා ඇති, යමක දුකින් කෑම ඇඳීම ලැබේද ඒ දිළිඳු කුලයක හෝ උපන්නේ වේද, හෙද වනාහි දුර්වර්ණද, නපුරු දැකීම්, ඇත්තේද, ඉතා කොන් වූයේද (iii) බොහෝ ලෙඩ ඇත්තේද, අත කොරවූ හෝ බකල හෝ පය කොර හෝ පැත්ත පණ නැතිසේ හෝ ආහාර පාන, වස්ත්‍ර, යාන, මාලා, සුවඳ විලවුන්, ඇඳන්, ගෙවල්, පහන් නොලබනුයේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

(iv) හෝ කයින් වැරදි කරයි, වචනයෙන් වැරදි කරයි, සිතින් වැරදි කරයි. හේ කයින් වැරදි කර, වචනයෙන් වැරදි කර, සිතින් වැරදි කර, කය බිඳී මරණින් මතු අපායවූ දුගතිවූ ඇදවැටීමවූ නිරයේ උපදී. ආනන්දය, එසේම වනාහි කළුවූ ජාති ඇත්තේ කළුවූ දහම උපදවයි.

7. "ආනන්දය, කෙසේ නම් කළුවූ ජාති ඇත්තේ සුදුවූ දහම උපදවාද? (මෙහි 6 ඡේදයේ (ii), (iii) යෙදිය යුතුයි.) හේ කයින් හොඳ කරයි. වචනයෙන් හොඳ කරයි. සිතින් හොඳ කරයි. එසේ කොට කය බිඳී මරණින් මතු සුගතිවූ දෙව් ලොව උපදී. ආනන්දය, එසේම කළුවූ ජාති ඇත්තේ සුදුවූ දහම උපදවයි.

8. "ආනන්දය, කෙසේ නම් කළුවූ ජාති ඇත්තේ කළු නොවූ, සුදු නොවූ දහම උපදවාද? (මෙහි 6 ඡේදයේ (ii) යෙදිය යුතුයි.) (ii) කෙස් රැවුල් කපවා, කසාවත් හැඳ, ගෙයින් නික්ම සස්නෙහි පැවිදි වේද, හේ මෙසේ පැවිදි වූයේ, නුවණ දුබල කරන සිත කිලිටිවූ, වැසී සිටින පස් අකුසල් හැර, සතර සිහි පිහිටුවීම්වල මනාව සිත පිහිටවූයේ බොධි අංග සත තත්වූ පරිද්දෙන් වඩා කලු නොවූ සුදු නොවූ නිවණ උපදවයි. (iii) ආනන්දය, මෙසේම වනාහි කළුවූ ජාති ඇත්තේ කළු නොවූ සුදු නොවූ නිවන උපදවයි.

9. "ආනන්දය, කෙසේ නම් සුදුවූ ජාති ඇත්තේ කළුවූ දහම උපදවාද? (ii) ආනන්දය, මේ ලොව එකෙක් උසස් කුලවූ රදළ මහසල් කුල හෝ බමුණු මහසල් කුල හෝ සිටු මහසල් කුල හෝ ආඪ්‍යව, මහ ධනව, මහා භොග සහිතව, බොහෝ රන් රිදී ඇතිව, බොහෝ ධනොපකරණ ඇතිව උපන්නේ වේද, සුරූප ඇත්තේ, දර්ශනීය වූයේ, පහදවන්නේ, උතුම් ශරීර වර්ණසෞන්දර්යයෙන් යුක්තවූයේ, ආහාර පාන, වස්ත්‍ර, යාන මාලා, ගඳ විලවුන්, ඇඳන්, ගෙවල්, පහන්, ලද්දේ වේද, (iii) හේ කයින් වැරදි කරයි, වචනයෙන් වැරදි කරයි. සිතින් වැරදි කරයි, එසේ කොට කය බිඳී මරණින් පසු දුර්ගතිවූ ඇද වැටීමවූ නිරයේ උපදී. ආනන්ද මෙසේම වනාහි සුදුවූ ජාති ඇත්තේ කලුවූ දහම උපදවයි.

10. "ආනන්දය, කෙසේ නම් සුදුවූ ජාති ඇත්තේ සුදුවූ දහම උපදවාද? (මෙහි 9 ඡේදයේ (ii) යෙදිය යුතුයි.) හේ කයින් කුසල් කරයි. වචනයෙන් කුසල් කරයි. සිතින් කුසල් කරයි. එසේකොට මරණින්මතු සුගතිවූ දෙව්ලොව උපදී. ආනන්දය, එසේම සුදුවූ ජාති ඇත්තේ සුදුවූ දහම උපදවයි.

11. "ආනන්දය, කෙසේ නම් සුදු ජාති ඇත්තේ කළු නොවූ සුදු නොවූ නිවන උපදවාද? ආනන්දය, මේ ලොව එකෙක් ආඪ්‍ය මහා ධනවත්, මහා භොගවත් බොහෝ රන් රිදී ඇති, බොහෝ ධනොපකරණ ඇති, රදළ මහසල් කුල හෝ බමුණු මහසල් කුල හෝ සිටු මහසල් කුල හෝ උපන්නේ වේද, හේ සුරූප ඇත්තේ දර්ශනීය වූයේ පහදවන්නේ උතුම් ශරීර වර්ණ සෞන්දර්යයෙන් යුක්තවූයේ, ආහාර පාන, වස්ත්‍ර, යාන, මාලා, සුවඳ විලවුන්, ඇදන්, ගෙවල්, පහන්, ලබනුයේ වේද, හේ (මෙහි 8 ඡේදයේ (ii) යෙදිය යුතුයි.) ආනන්දය, මෙසේම සුදුවූ ජාති ඇත්තේ කලු නොවූ සුදු නොවූ නිවණ උපදවයි. මේ වනාහි ජාතීහු සයයි."

4. **ආසවප්පහාණ සූත්‍රය**:- 1. "මහණෙනි, ධර්ම සයෙකින් යුත් භික්ෂුව (මෙහි 1 ආහුණෙය්‍ය වර්ගයේ 1 සූත්‍රයේ 2 (ii) ඡේදය යෙදිය යුතුයි.)

2. "කවර සයකින්ද?

"මහණෙනි, මෙහි භික්ෂුවගේ යම් පවක් (ඉඳුරන්) හික්මීමෙන් ගෙවිය යුතුවේද, ඒ පව් (ඉඳුරන්) හික්මවීමෙන් ගෙවේ. යම් පවක් ඇසුරු කිරීමෙන් ගෙවිය යුතුද, ඒ පව් ඇසුරු කිරීමෙන් ගෙවේ. යම් පවක් ඉවසීමෙන් ගෙවියයුතුද, ඒ පව් ඉවසීමෙන් ගෙවේ යම් පවක් දුරුකිරීමෙන් ගෙවිය යුතුද, ඒ පව් දුරුකිරීමෙන් ගෙවේ, යම් පවක් යටපත් කිරීමෙන් ගෙවිය යුතුද, ඒ පව් යටපත් කිරීමෙන් ගෙවේ. යම් පවක් සිත (භාවනා) වැඩීමෙන් ගෙවියයුතුද, ඒ පව් සිත වැඩීමෙන් ගෙවේ.

3 "මහණෙනි, යමක් (ඉඳුරන්) හික්මවීමෙන් ගෙවේ ද (ඉඳුරන්) හික්මවීමෙන් ගෙවියයුතු ඒ පව් කවරේද? මහණෙනි, මෙහි යම් භික්ෂුවක් නුවණින් සලකමින් වෙසෙයි. හික්මීමෙන්

හික්මුණේ වසයි. මහණෙනි, ඇස නොහික්මවා වසන අසංවර වූ ඔහුට යම් විනාශයෙන් කරන දැවිලි ඇති පවක් උපදීද, ඇස හික්මවීමෙහි සංවරව වසන ඔහුට මෙසේ විනාශයෙන් කරන දැවිලි ඇති ඒ පව් නොවේ.

"නුවණින් සලකමින් කන හික්මීමෙන් හික්මුනේ වසයි. මහණෙනි, කන නොහික්මවා වසන අසංවරවූ ඔහුට යම් විනාශයෙන් කරන දැවිලි ඇති පවක් උපදීද, කන හික්මවීමෙහි සංවරව වසන ඔහුට මෙසේ විනාශයෙන් කරන දැවිලි ඇති ඒ පව් නොවේ.

"නුවණින් සලකමින් නහයෙහි හික්මීමෙන් හික්මුණේ වසයි. මහණෙනි, නහය නොහික්මවා වසන අසංවර වූ ඔහුට යම් විනාශයෙන් කරන දැවිලිඇති පවක් උපදීද, නහය හික්ම වීමෙහි සංවරව වසන ඔහුට මෙසේ විනාශයෙන් කරන දැවිලි ඇති ඒ පව් නොවේ.

"නුවණින් සලකමින් දිවෙහි හික්මීමෙන් හික්මුණේ වසයි. මහණෙනි, දිව නොහික්මවා වසන අසංවරවූ ඔහුට යම් විනාශයෙන් කරන දැවිලි ඇති පවක් උපදීද, දිව හික්මවීමෙහි සංවරව වසන ඔහුට මෙසේ විනාශයෙන් කරන දැවිලි ඇති ඒ පව් නොවේ.

"නුවණින් සලකමින් කයෙහි හික්මීමෙන් හික්මුණේ වසයි, මහණෙනි, කය නොහික්මවා වසන අසංවරවූ ඔහුට යම් විනාශයෙන් කරන දැවිලි ඇති පවක් උපදීද, කය හික්මවීමෙහි සංවරව වසන ඔහුට මෙසේ විනාශයෙන් කරන දැවිලි ඇති ඒ පව් නොවේ.

"නුවණින් සලකමින් සිත හික්මීමෙහි හික්මුණේ වසයි. මහණෙනි, සිත නො හික්මවා වසන අසංවරවූ ඔහුට යම් විනාශයෙන් කරන දැවිලි ඇති පවක් උපදීද, සිත හික්මවීමෙහි සංවරව වසන ඔහුට මෙසේ විනාශයෙන් කරන දැවිලි ඇති ඒ පව් නොවේ.

4. "මහණෙනි, යම් නොහික්මවීමකින් අසංවරව වසන ඔහුට මෙසේ විනාශයෙන් කරන දැවිලි ඇති යම් පවක් උපදීද

හික්මවීමෙන් වසන ඔහුට මෙසේ විනාශයෙන් කරන දැවිලි ඇති ඒ පව් (ආශ්‍රව) නොවේ.

5. "මහණෙනි, යමක් ආශ්‍රයෙන් ගෙවේද ආශ්‍රයයෙන් ගෙවියයුතු ඒ පව් කවරේද?

"මහණෙනි, මෙහි (සස්නෙහි) යම් භික්ෂුවක් (ii) යම්තාක් ශීත නැසීමට, උෂ්ණය නැසීමට, ඇටමැසි, මදුරු, සුළං, අවු, විසකුරු සතුන් යන මොවුන් ස්පර්ශ නොවීමට (iii) යම්තාක් ලජ්ජා ස්ථාන වැසීමට නුවණින් සලකා සිවුර ඇසුරුකරයිද, ක්‍රීඩාවට නොව, මදයට නොව, සැරසුමට නොව, බැබලීමට නොව, යම්තාක් මේ කය සිටීමට, යැපීමට, පීඩා නැවැත්වීමට බඹසර පැවැත්වීමෙහි උපකාරයට 'මෙසේ පරණ වේදනාවද නසමි. අලුත් වේදනාවද නො උපදවන්නෙමි මගේ ජීවිතයාත්‍රාවද වන්නේය. නිවැරදි බවද පහසු විහරණයද වන්නේයයි' නුවණින් සලකා ලත් අහර ඇසුරු කෙරේද, (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

"යම්තාක් කාලයේ හිරිහැර නැසීමට, විවේකයෙහි ඇලීමට නුවණින් සලකා සෙනසුන ඇසුරු කෙරේද, යම්තාක් උපන් හිංසා උපදවන වේදනාවන් නැසීමට, කරුණා සහගත භාවයවූ නිවණ පිණිස නුවණින් සලකා ගිලන්පස බෙහෙත් පිරිකර ඇසුරුකෙරේද,

"මහණෙනි, යමක් වනාහි ඇසුරු නොකිරීමෙන් විනාශයෙන් කරන දැවිලි වන්නේද, මෙසේ ඇසුරුකරන්නාවූ ඔහුට ඒ විනාශයෙන් කරණ දැවිලි ඇති ඒ පව් නොවේ.

"මහණෙනි, ඇසුරුකිරීමෙන් යම් පවක් ගෙවේද, ඒ ඇසුරුකිරීමෙන් ගෙවියයුතු පව් මොහුය'යි කියනුලැබේ.

6. "මහණෙනි, යමක් ඉවසීමෙන් ගෙවේද, ඉවසීමෙන් ගෙවියයුතු ඒ පව් කවරේද?

"මහණෙනි, මෙහි භික්ෂුවක් ඉවසන්නේවේද සීතය, උෂ්ණය, සා ගින්න, පිපාසය, ඇටමැසි, මදුරු, සුළං, අවු, විසකුරු සතුන් යන මොවුන්ගේ ස්පර්ශයද දුක්වූ, දැඩිවූ, රළුවූ, කටුක වූ, නොමිහිරිවූ මනාප නොවූ, පණ පැහැරගන්නාවූ, වේදනාවන්

ඉවසන්නේවේද, මහණෙනි, නො ඉවසන ඔහුට විනාශයෙන් කරන දැවීම් ඇති, යම් පවක් උපදින්නේ නම්, මෙසේ ඉවසන්නාවූ ඔහුට විනාශයෙන් කරන දැවිලි ඇති, ඒ පව් නො උපදී. මහණෙනි, යමක් ඉවසීමෙන් ගෙවේද මේ පව් ඉවසීමෙන් ගෙවිය යුත්තෝය' යි කියනු ලැබෙත්.

7. "මහණෙනි, යමක් වනාහි දුරු කිරීමෙන් ගෙවේද, දුරු කිරීමෙන් ගෙවියයුතු පව් කවරේද?

"මහණෙනි, මෙහි භික්ෂුවක් නුවණින් සලකා චණ්ඩවූ ඇතකු දුරු කෙරේද, අසකු, ගොනකු, බල්ලකු, සර්පයකු දුරුකෙරේද, කණුවක්, කටු අත්තක්, දිය වළක්, බෑවුමක් කුණුගොඩක් කුණුවළක්, යම්බඳු වූ පාප මිත්‍රයන් ඇසුරු කරන්නකු, දන්නාවූ සමාන බඹසර ඇති භික්ෂුතෙම ලාමක කරුණු කෙරෙහි හෙළා දකීද, හෙතෙම එම නොසෙවිය යුත්ත එම නො තැන, එම ලාමක මිතුරන්ද නුවණින් සලකා දුරු කෙරේද, මහණෙනි, යමක් දුරු නොකරන්නාවූ ඔහුට විනාශයෙන් කරන දැවීම් ඇති පව් උපදින්නේ නම් මෙසේ දුර කරන්නාවූ ඔහුට මේ පව් නො උපදී.

8. "මහණෙනි, යමක් වනාහි යටපත් කිරීමෙන් ගෙවේද යටපත් කිරීමෙන් ගෙවියයුතු පව් කවරේද?

"මහණෙනි, මෙහි යම් භික්ෂුවක් නුවණින් සලකා උපන් කාම සිතුවිලි යටපත් කෙරේද, හැරලයිද, දුරු කෙරේද, නසයිද, නො පැවැත්මට පමුණුවාද,

"නුවණින් සලකා උපන් කෝප සිතුවිලි යටපත්කෙරේද, හැරලයිද, දුරුකෙරේද, නසයිද, නොපැවැත්වීමට පමුණුවාද,

"නුවණින් සලකා උපන් හිංසා සිතුවිලි යටපත්කෙරේද, හැරලයිද, දුරුකෙරේද, නසයිද, නොපැවැත්වීමට පමුණුවාද,

"නුවණින් සලකා උපන් පව්වූ ලාමකගති සිතුවිලි යටපත්කෙරේද, හැරලයිද, දුරුකෙරේද, නසයිද, නොපැවැත්වීමට පමුණුවාද,

"මහණෙනි, යමක් යටපත් නොකරන්නාවූ ඔහුට විනාශයෙන් කරන දැවිලි ඇති යම් පවක් උපදින්නේ නම් මෙසේ යටපත් කරන්නාවූ ඔහුට විනාශයෙන් වන දැවිලි ඇති මේ පව් නොවේ.

9. "මහණෙනි, යමක් යටපත් කිරීමෙන් ගෙවේද, මේ පව් යටපත් කිරීමෙන් ගෙවියයුත්තෝයයි කියනු ලැබෙත්.

"මහණෙනි, යමක් සිත වැඩීමෙන් ගෙවේද සිතවැඩීමෙන් ගෙවියයුතු පව් කවරේද?

"මහණෙනි, මෙහි භික්ෂුව නුවණින් සලකා විවේකය ඇසුරුකළ, නොඇල්ම ඇසුරුකළ, සිතනොපැවැත්ම ඇසුරු කළ, දුරුකිරීම වැඩෙන සිහිය නම් බොධි අංගය වඩාද, නුවණින් සලකා ධර්මය විමසීමේ බොධි අංගය, වීර්ය නම් බොධි අංගය, ප්‍රීතිය නම් බොධි අංගය, සන්සිඳීම නම් බොධි අංගය, සිත එකඟය නම් බොධි අංගය, මැදහත්කම නම් බොධි අංගය, යන මේ විවේකය ඇසුරුකළ, නොඇල්ම ඇසුරු කළ, සිත නොපැවැත්ම (නිරොධය) ඇසුරු කළ, (චිත්ත-සංඥා) දුරුකිරීම වැඩෙන බොධි අංග වඩාද, මහණෙනි, යමක් නොවඩන්නාවූ ඔහුට විනාශයෙන් කරන දැවිලි ඇති පව් උපදින්නේ නම්, මෙසේ වඩන ඔහුට විනාශයෙන් කරන දැවිලි ඇති ඒ පව් නොවේ. මහණෙනි, යමක් සිත වැඩීමෙන් ගෙවේද, මොහු සිත වැඩීමෙන් ගෙවියයුතුපව් යයි කියනු ලැබේ.

10. (මේ ඡෙදය 1 ආහුණෙය්‍ය වර්ගයේ 1 සූත්‍රයේ 2 (ii) ඡෙදය මෙනි.

**5. දාරුකම්මික සූත්‍රයː-** 1. "මා විසින් මේ සූත්‍රය මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ නාදික ගම්හි ගිඤ්ජකාවසථයෙහි වැඩවසන සේක. එකල්හි දැව කර්මාන්ත කරන්නාවූ එක්තරා ගෘහපතියෙක් භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන්වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේය. එසේ හුන්නාවූ ගෘහපතියාට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

2 "ගෘහපතිය, ඔබගේ කුලයෙහි දානය දෙනු ලැබේද?" "ස්වාමීනි, මාගේ කුලයෙහි දානය දෙනු ලැබේ. එයද යම් ඒ භික්ෂූහු ආරණ්‍යකවූවෝද, පිණ්ඩපාතිකවූවෝද, පාංශුකූලික වූවෝද, අර්හත් හෝ ඒ මගට පිළිපන්නාහු හෝ වෙත්ද, එබඳුවූ භික්ෂූන් කෙරෙහි දානය දෙනු ලැබේ." "ගෘහපතිය, ගිහිවූ කාම භොගීවූ පුත්‍රයන්ගෙන් ගැහැට ඇත්තාවූ කසී සඳුන් පරිහරණය කරන්නාවූ මල් ගඳ විලවුන් දරන්නාවූ මිළ මුදල් ඉවසන්නාවූ ඔබ විසින් මේ රහත්හුය, මේ රහත් මගට පිළිපන්නෝයයි දැනගැනීම අමාරුවෙන් කටයුතුය.

3. "ගෘහපතිය, ආරණ්‍යකවූද උඩගුවූ මාන්නය ඇති, චපලවූ මුඛරවූ විසුරුන වචන ඇති, මුළාවූ සිහි ඇති, කල්පනා නැති, එකඟවූ සිත් නැති, මුලාවූ සිත් ඇති, ප්‍රකෘති ඉන්ද්‍රිය ඇති භික්ෂුවක් වෙයි. මෙසේ හෙතෙම ඒ අංගයෙන් නින්දා ලබයි.

4 "ගෘහපතිය, ආරණ්‍යකවූද උඩගුනොවූ මාන්නය නැති, චපල නොවූ මුඛර නොවූ විසුරුන වචන නැති, එළඹ සිටි සිහි ඇති, කල්පනා ඇති, එකඟවූ සිත් ඇති, සංවරවූ ඉන්ද්‍රිය ඇති, භික්ෂුවක් වෙයි. මෙසේ හෙතෙම ඒ අංගයෙන් ප්‍රශංසා ලබයි.

5 "ගෘහපතිය, (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.) ගම්බද වෙහෙරෙහි වසන භික්ෂුවක් වෙයි. මෙසේ හෙතෙම ඒ අංගයෙන් නින්දා ලබයි.

"ගෘහපතිය, උඩගු නැති (මෙය මේ සූත්‍රයේ 4 ඡේදය මෙනි.) භික්ෂුවක් වෙයි. මෙසේ හෙතෙම ඒ අංගයෙන් ප්‍රශංසා ලබයි. ගෘහපතිය, පිණ්ඩපාතිකවූද උඩගුවූ (මෙය 3 ඡේදය මෙනි.) භික්ෂුවක් වෙයි මෙසේ හෙතෙම ඒ අංගයෙන් නින්දා ලබයි. ගෘහපතිය, පිණ්ඩපාතිකවූද උඩගු නැති (මෙය 4 ඡේදය මෙනි.) භික්ෂුවක් වෙයි. මෙසේ හෙතෙම ඒ අංගයෙන් ප්‍රශංසා ලබයි. ගෘහපතිය, ආරාධනා ලබන්නාවූද උඩගුවූ (මෙය 3 ඡේදය මෙනි.) භික්ෂුවක් වෙයි මෙසේ හෙතෙම ඒ අංගයෙන් නින්දා ලබයි. ගෘහපතිය, ආරාධනා ලබන්නාවූද උඩගු නැති (මෙය 4 ඡේදය මෙනි.) භික්ෂුවක් වෙයි. මෙසේ හෙතෙම ඒ අංගයෙන් ප්‍රශංසා ලබයි. ගෘහපතිය, පාංශුකූලිකවූද උඩගුවූ (මෙය 3 ඡේදය මෙනි.)

භික්ෂුවක් වෙයි. හෙතෙම ඒ අංගයෙන් නින්දා ලබයි. පාංශුකූලිකවූද උඩඟු නැති (මෙය මේ සූත්‍රයේ 4 ඡේදය මෙනි.) භික්ෂුවක් වෙයි. හෙතෙම ඒ අංගයෙන් ප්‍රශංසා ලබයි. ගෘහපතිය, සැදැහැ ඇතියන් දෙන සිවුරු දරන්නාවූද උඩඟුවූ (3 ඡේදය මෙනි.) භික්ෂුවක් වෙයි. හෙතෙම ඒ අංගයෙන් නින්දාලබයි. ගෘහපතිය, සැදැහැ ඇතියන් දෙනසිවුරු දරන්නාවූද උඩඟු නැති (මෙය මේ 4 ඡේදය මෙනි.) භික්ෂුවක් වෙයි. හෙතෙම ඒ අංගයෙන් ප්‍රශංසා ලබයි ගෘහපතිය, මෙසේ ඔබ සංඝයා කෙරෙහි දන්දෙව. ඔබ විසින් සංඝයා කෙරෙහි දන් දෙනු ලබන්නේ සිත පහදින්නේය. ඒ පැහැදුනාවූ සිත් ඇති ඔබ කායයාගේ බිඳීමෙන් මරණින් මතු සුගති නම්වූ ස්වර්ග ලොකයෙහි උපදින්නේය” “ස්වාමීනි, මම අද පටන් සංඝයා කෙරෙහි දන් දෙන්නෙමි.”

**6. චිත්තහත්ථි සාරිපුත්ත සූත්‍රයඃ-** 1. “මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයෙක්හි භාග්‍යවතුන්වහන්සේ බරණැස් නුවර මෘගයන්ට අභයදුන් ඉසිපතනාරාමයෙහි වාසයකරණ සේක. එකල්හි බොහෝ ස්ථවිර භික්ෂූහු සවස් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැලකුනාහු කවාකාර මලුවෙහි රැස්වූවාහු අභිධර්ම කථා කියමින් හුන්නාහුය. එකල්හි වනාහි හස්ති සාරියගේපුත්‍රවූ ආයුෂ්මත් චිත්‍රතෙමේ අභිධර්ම කථා කරණ ස්ථවිර භික්ෂූන් අතර අතුරු කථා පටන්ගනියි.

2. ඉක්බිති ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිර තෙමේ හස්තිසාරියගේ පුත්‍රවූ ආයුෂ්මත් චිත්‍රට “හස්තිසාරියගේ පුත්‍රවූ ආයුෂ්මත් චිත්‍රයෙනි, අභිධර්ම කථාකියන ස්ථවිර භික්ෂූන් අතර අතුරු කථා නොකරව. ආයුෂ්මත් චිත්‍රතෙමේ කථාව අවසානය දක්වා ප්‍රමාදවන සේක්වායි” කීයේය. මෙසේ කී කල්හි හස්තිසාරියගේ පුත්‍රවූ ආයුෂ්මත් චිත්‍රගේ යහළු භික්ෂූහු ආයුෂ්මත් මහාකොට්ඨිතට “ආයුෂ්මත් කොට්ඨිත ස්ථවිරයන් වහන්ස, හත්ථිසාරි පුත්‍රවූ ආයුෂ්මත් කොට්ඨිත තෙරුන් පිට නොකරව, හස්තිසාරියගේ පුත්‍රවූ ආයුෂ්මත් චිත්‍රතෙමේ පණ්ඩිතය. හස්තිසාරියගේ පුත්‍රවූ ආයුෂ්මත් චිත්‍රතෙමේ ස්ථවිර භික්ෂූන්ට අභිධර්ම කථා කීමට සමර්ථයයි” කීවාහුය.

3. "ඇවැත්නි, සිතේක්‍රමය නොදන්නවුන්ට අනුන්ගේ සිත දැනගැනීමට නොහැක. ඇවැත්නි, මේලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් යම්තාක් ශාස්තෲන් වහන්සේ හෝ අනික් ගරු කටයුතු ස්ථවිරකෙනෙක් ඇසුරුකොට වාසයකරයිද, ඒතාක් අතිශයින් කීකරුවේ. අතිශයින් උඩඟු නොවූයේ වේ, අතිශයින් ශාන්තවූයේ වේ, (ii) යම් අවස්ථාවක සිට ශාස්තෲන් වහන්සේගෙන් හෝ ගරුකටයුතු සමාන ශිල්රකින්නන්ගෙන් ඈත්වේද, හෙතෙම (iii) භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකාවන් රජුන් රජමහ ඇමතියන් තීර්ථකයන් තීර්ථක ශ්‍රාවකයන් සමග ඇලී වාසය කරයිද, ප්‍රකටව කථාවෙහි ඇලී වාසය කරන්නහුගේ සිත රාගය මැඩ පවත්වයි. හෙතෙම රාගයෙන් මැඩ පැවැත්වූ සිතින් ශික්ෂාව අත්හැර ගිහිවෙයි.

4. "ඇවැත්නි, යම්සේ ගොයම් කෑ ගොනෙක් යම්සේ දම්වැලකින් හෝ බඳනාලද්දේ ගාලෙහි හෝ සිර කරණු ලැබුවේද, ඇවැත්නි, යම්කෙනෙක් මේ ගවතෙම දැන් ගොයම් නොකන්නේය. නැවත ගොයමට නොබසින්නේයයි මෙසේ කියන්නේය, ඇවැත්නි, හෙතෙම මනාකොට කියන්නේද? ඇවැත්නි නැත, යම්හෙයකින් ඒ ගොයම් කන ගොනා දම්වැල හෝ කඩා ගාල නොබිඳ නැවත ගොයමට බසින්නේය, යන මේ කාරණය විද්‍යමාන වේ.

"ඇවැත්නි, එසේම මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් යම්තාක් ශාස්තෲන් වහන්සේ හෝ ගරුකටයුතු අන්කෙනෙක් ඇසුරුකොට වාසයකරයිද ඒතාක් අතිශයින් කීකරුවේ. අතිශයින් උඩඟු නොවූයේවේ. අතිශයින් ශාන්ත වූයේ වේ.

5. (මේ ඡේදය 3 (ii) හා 3 (iii) මෙන් වේ.)

6. "ඇවැත්නි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් කාමයන්ගෙන් වෙන්ව අකුශල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිත, විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරයි. හෙතෙම ප්‍රථම ධ්‍යානය ලැබුයේ වෙමියි. (මෙහි 3. (iii) යෙදිය යුතුයි.)

7. "ඇවැත්නි, යම්සේ සතරමං සන්ධියෙක්හි මහවැහි බින්දු ඇති වර්ෂාවක් වසින්නේ ධූලි නැතිකරන්නේද මඩ උපදවන්නේද, ඇවැත්නි, යමෙක් දැන් මේ සතරමං සන්ධියෙහි නැවත ධූලි ඇති නොවන්නේයයි මෙසේ කියන්නේය. ඇවැත්නි, හෙතෙම යහපත්කොට කියන්නෙක්වී කියන්නේද? ඇවැත්නි නැත. ඇවැත්නි, මේ සතරමං සන්ධියෙහි මනුෂ්‍යයන් හෝ යන්නාහුද ගවයන් හෝ සත්වයන් යන්නේ නම් අව්ව හා වාතය තෙතමන ගන්නේනම් නැවත ධූලි පහළවන්නේය යන මේ කාරණය විද්‍යමානවේ. ඇවැත්නි, (මෙහි 6 ඡේදය යෙදිය යුතුයි.)

8. "ඇවැත්නි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම් ඇති සිත හා එකට පහළවූ විතර්ක නැති විචාර නැති සමාධියෙන් උපන් ප්‍රීතිය හා සැප ඇති දෙවෙනි ධ්‍යානයට පැමිණ වාසය කරයිද, හෙතෙම දෙවෙනි ධ්‍යානය ලැබුයේ වෙමිය. (මෙහි 3 (iii) යෙදිය යුතුයි.)

9. "ඇවැත්නි, ගමට හෝ නියම්ගමට හෝ නුදුරෙහිවූ මහත් විලක් යම්සේද එහි වසන්නාවූ ලොකු දියබින්දු ඇති වර්ෂාව සිප්පිබෙල්ලන් හා සක් බෙල්ලන්ද කැට කැබිලිතිද අතුරුදහන් කරන්නේය. ඇවැත්නි, යම් කෙනෙක් 'දැන් මේ විලෙහි නැවත සිප්පිබෙල්ලන් හා සක් බෙල්ලන්ද, කැට කැබිලිතිද පහළ නොවන්නේයයි' මෙසේ කියන්නේය. ඇවැත්නි, හෙතෙම මනාකොට කියන්නේද? ඇවැත්නි නැත. මේ විලෙහි මිනිසුන් හෝ වතුර බොන්නාහුද ගවයන් හෝ තිරිසනුන් ජලය බොන්නාහු නම්, වාතය හා අව්ව තෙතමන ගන්නේද, නැවත ඊටපසු සිප්පිබෙල්ලන් හා සක් බෙල්ලන්ද කැට කැබිලිතිද පහළ වන්නේයයි යන මේ කරුණ විද්‍යමාන වේ.

10. "ඇවැත්නි, එසේම මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් (මෙහි 8 ඡේදය යෙදිය යුතුයි.)

11. "ඇවැත්නි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් (ii) ප්‍රීතිය පහවීමෙන් උපෙක්ෂා ඇතිව වාසය කරයි. සිහි ඇත්තේ සම්‍යක් ප්‍රඥාවෙන් යුක්ත වූයේ කයින් සැපක් විඳී. උපෙක්ෂා

ඇති සිහි ඇති සැප විහරණයකැයි ආර්‍ය්‍යයෝ කියත්ද ඒ (iii) තුන්වෙනි ධ්‍යානයට පැමිණ වාසය කරයිද, හෙතෙම මම තෘතිය ධ්‍යානයට පැමිණියෙමියි (මෙහි 3 (iii) යෙදිය යුතුයි.) ඇවැත්නි, යම්සේ ප්‍රණීත භොජනයක් වැළඳූ පුරුෂයෙක් 'ඊයේ සවස බොජුනට රුචි නොවන්නේද, ඇවැත්නි යමෙක් අසවල් පුරුසතෙමේ නැවත භොජනය කැමති නොවන්නේයයි' මෙසේ කියන්නේය. ඇවැත්නි, හෙතෙම යහපත් කොට කියන වදනක්ද? ඇවැත්නි නැත. ඇවැත්නි, මේ කරුණ විද්‍යමාන වේ. ප්‍රණීත බොජුන් වැළඳූ මේ පුරුෂයා යම්තාක් ඒ ඕජාව ශරීරයෙහි සිටීද ඒතාක් අන්බොජුනක් රුචි නොවන්නේය. යම්කලක පටන් ඔහුට ඒ ඕජාව අතුරුදහන් වේද, නැවත ඒ භොජනය රුචිවන්නේය. ඇවැත්නි, එසේම මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් ප්‍රීතිය පහවීමෙන් (මෙහි 11 ඡේදය යෙදිය යුතුයි) තුන්වෙනි ධ්‍යානයට පැමිණ වාසය කරයිද, හෙතෙම තෘතිය ධ්‍යානය ලැබුවෙමියි. (මෙහි 3 (iii) යෙදිය යුතුයි.)

12. "ඇවැත්නි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් (ii) සැපය දුරු කිරීමෙන්ද දුක දුරු කිරීමෙන්ද සොම්නස් දොම්නස් දෙක අස්තවීමට පෙරම දුක් නැති සැප නැති උපෙක්ෂා ස්මෘති දෙදෙනාගේ පිරිසිදුකම ඇති සතරවෙනි ධ්‍යානයට පැමිණ වාසය කරයි. (iii) හෙතෙම සතරවෙනි ධ්‍යානය ලැබුයේ වෙමියි, (මෙහි 3 (iii) යෙදිය යුතුයි.)

13. "ඇවැත්නි, පර්වත වංගුවෙක්හි වාතය නොහමන පහවූ රැල ඇති දිය විලක් වේද, ඇවැත්නි, යමෙක් මෙසේ කියන්නේය. දැන් මේ දියවිලෙහි නැවත රැල පහල නොවන්නේයයි, මෙසේ කියන්නේය. ඇවැත්නි, හෙතෙම යහපත්කොට කියන්නේද? ඇවැත්නි නැත. ඇවැත්නි, පෙරදිගින් මහත් වාතයක් සහිත වැස්සක් එන්නේය. ඕ ඒ දියවිලෙහි රැල ඇති කරන්නේය. බටහිර දිශාවෙන් මහත් වාතයක් සමග වැස්සක් එන්නේය. ඕතොමෝ ඒ දියවිලෙහි රැල ඇතිකරන්නේය. උතුරු දිගින් මහත් වාතයක් සහිත වැස්සක් එන්නේය. ඕතොමෝ ඒ දියවිලෙහි රැළ ඇතිකරන්නේය. දකුණු දිගින් මහත් වාතයක්

සහිත වැස්සක් එන්නේය. ඕතොමෝ ඒ දියවිලෙහි රැල ඇති කරන්නේය.

14. "ඇවැත්නි, එසේම මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් සැප ප්‍රහාන කිරීමෙන්ද, දුක් ප්‍රහාන කිරීමෙන්ද (මෙහි 12 (ii) ඡේදය යෙදිය යුතුයි.) සතරවෙනි ධ්‍යානයට පැමිණ වාසයකරයිද, හෙතෙම සතරවෙනි ධ්‍යානය ලැබුයේ වෙමියි. (මෙහි 3 (iii) යෙදිය යුතුයි.)

15. "ඇවැත්නි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් සියලු නිමිති මෙනෙහි නොකිරීමෙන් රාගාදී නිමිති රහිත චිත්තසමාධියට පැමිණ වාසය කරයි. හෙතෙම රාගාදී නිමිති රහිත චිත්ත සමාධිය ලදිමියි (මෙහි 3 (iii) යෙදිය යුතුයි.)

16. "ඇවැත්නි, යම්සේ රජෙක් හෝ රජමහ ඇමතියෙක් හෝ සිවුරඟ සෙනග සමග මහා මාර්ගයට පිළිපන්නේ එක්තරා වන ලැහැබෙක්හි එක් රැයක් විසීමට පැමිණෙන්නේය. එහි ඇතුන්ගේ ශබ්දයෙන් අසුන්ගේ ශබ්දයෙන් රථ ශබ්දයෙහි පාබල සෙනගේ ශබ්දයෙන් ගැටබෙර මිහිඟු බෙර සක්හඬින් රැහැයි හඬ යටපත්වේ. ඇවැත්නි, යමෙක් දැන් මේ වනලැහැබෙයි නැවත රැහැයි හඬ පහල නොවන්නේයයි' මෙසේ කියන්නේය. ඇවැත්නි, හෙතෙම මනාකොට කියන්නේද? ඇවැත්නි නැත ඇවැත්නි, ඒ රජතෙමේ හෝ රජමහ ඇමතියා හෝ ඒ වන ලැහැබෙන් යන්නේද නැවත ඒ රැහැයි හඬ පහළ වන්නේය යන මේ කරුණ විද්‍යමාන වේ.

17. "ඇවැත්නි, එසේම මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් සියලු නිමිති මෙනෙහි නොකිරීමෙන් රාගාදී නිමිති රහිත චිත්ත සමාධියට පැමිණ වාසය කරත්ද, හෙතෙම අනිමිත්ත චිත්ත සමාධිය ලැබුවෙමියි, (මෙහි 3 (iii) යෙදිය යුතුයි.)

18. ඉක්බිති හස්තිසාරියගේ පුත්‍රවූ ආයුෂ්මත් චිත්‍ර තෙමේ මෑත කාලයක ශික්ෂා අත්හැර ගිහිවූයේය. ඉක්බිති හස්තිසාරියගේ පුත්‍රවූ චිත්‍රගේ යහළු භික්ෂූහු ආයුෂ්මත් මහා කොට්ඨිත තෙරුන් යම් තැනෙක්හිද එහි පැමිණියාහුය. පැමිණ ආයුෂ්මත් මහා කොට්ඨිතට "කිමෙක්ද? ආයුෂ්මත් මහා කොට්ඨිත විසින්

හස්තිසාරියගේ පුත්‍රවූ චිත්‍රගේ සිත තම සිතින් දැනගන්නා ලද්දේද? හස්තිසාරියගේ පුත්‍ර චිත්‍ර තෙමේ මේ සමාපත්තිවලට පැමිණියේය. නැවත ශික්ෂා අත්හැර ගිහිවන්නේදැයි දන්නේද, නොහොත් හස්තිසාරියගේ පුත්‍රවූ චිත්‍රතෙමේ මේ මේ සමාපත්ති ලැබූවෙකි. නැවතද ශික්ෂා අත්හැර ගිහිවන්නේයයි දෙවතාවෙක් මේ කාරණය කීවාහුද, ඇවැත්නි, හස්තිසාරියගේපුත්‍රවූ චිත්‍රතෙමේ මේ මේ සමාපත්ති ලැබූවෙකි. නමුත් ශික්ෂා අත්හැර ගිහි වන්නේයයි මා විසින් මගේ සිතින් ඔහුගේ සිත දැනගත්තෙමි."

19. "ස්වාමීනි, හස්තිසාරියගේ පුත්‍රවූ චිත්‍රතෙමේ මේ මේ සමාපත්ති ලැබූවෙකි. නමුත් ශික්ෂා අත්හැර ගිහි වන්නේයයි මේ කාරණය මට දෙවතාවකු විසින්ද කියනලදී."

20. ඉක්බිති හස්තිසාරියගේ පුත්‍රවූ චිත්‍රගේ යහළු භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියාහුය. එකත්පසෙක සිටි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට "හස්තිසාරියගේ පුත්‍රවූ චිත්‍රතෙමේ මේ මේ සමාපත්ති ලැබූවෙකි. නමුත් ශික්ෂා අත්හැර ගිහිවූයේයයි" කීවාහුය.

21. "මහණෙනි, චිත්‍රතෙමේ නෛෂ්ක්‍රම්‍යය බොහෝ කල් සිහි නොකරන්නේය." නැවත හස්තිසාරියගේ පුත්‍ර චිත්‍රතෙමේ නොබෝ කලකින්ම හිසකෙස් රැවුල් බහා කහ වස්ත්‍ර හැඳ ගිහිගෙන් නික්ම අනගාරික ශාසනයෙහි පැවිදි විය.

22. "ඉක්බිති හස්තිශාරියගේ පුත්‍ර චිත්‍රතෙමේ හුදකලා වූයේ (මෙහි අංගුත්තර නිකායේ තිකනිපාතයේ 3 පණ්ණාසකයේ 28 සූත්‍රයේ 5 ඡේදයේ 'තනිව' යන වචනයේ සිටද 6 ඡේදයද යෙදිය යුතුයි.)

7. **මෙත්තෲය පඤ්හ සූත්‍රයː-** 1 "මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ බරණැස් නුවර සමීපයෙහි මිගදාය නම්වූ ඉසිපතනාරාමයෙහි වැඩ වසනසේක. එකල්හි වනාහි සවස් වරුවෙහි පිණ්ඩපාතයෙන් වැළකුණාවූ කවාකාර මලුවෙහි රැස්වූ බොහෝ ස්ථවිර භික්ෂූන් වහන්සේලා

අතර මේ අතුරු කථාවක් පහළවිය. "භාග්‍යවතුන් වහන්සේ විසින් පාරායන සූත්‍රයෙහි මෙත්තෙය්‍ය ප්‍රශ්නයෙහි (ii) යමෙක් තෙම ස්පර්ශය හා ස්පර්ශ නිරොධයද යන අන්තදෙක මනා නුවණින් දැන නිර්වාණයෙහි තෘෂ්ණා ඇලීමෙන් නොඇලේද, හෙතෙම මේ ශාසනයෙහි සිබ්බනි යම් තෘෂ්ණාව ඉක්මෙව්වේ වෙයි. ඔහු මහා පුරුෂයයි කියමි." (iii) යනුවෙන් මෙය වදාළ සේක.

2 "ඇවැත්නි, එක් අන්තයක් කවරේද? දෙවන අන්තය කවරේද? මධ්‍යය කුමක්ද "සිබ්බනි" නම් තෘෂ්ණාව කවරීද? මෙසේ කී කල්හි එක්තරා භික්ෂුනමක් ස්ථවිර භික්ෂූන්ට මේය කීවේය.

3 "ඇවැත්නි, ස්පර්ශය එක් අන්තයකි. ස්පර්ශය ඇතිවීමේ හේතුව අනික් අන්තයයි. ස්පර්ශ නිරොධය මධ්‍යයයි (ii) සිබ්බනී නම් තෘෂ්ණාව ඒ ඒ භවයේ ඉපදීම තෘෂ්ණාවෙන් ඔහු වසයි. ඇවැත්නි, මෙපමණකින් දැනගතයුත්ත දැන ගනියි. විශෙෂයෙන් දැනගතයුත්ත විශෙෂයෙන් දැනගනියි. දැනගතයුත්ත දැනගන්නේ විශෙෂයෙන් දැනගතයුත්ත විශෙෂයෙන් දැනගන්නේ මෙලෙව්හිම දුක් කෙළවර කරන්නේ වේ."

4 "මෙසේ කී කල එක්තරා භික්ෂුවක් ස්ථවිර භික්ෂූන්ට මෙසේ කීවේය. "ඇවැත්නි, අතීතය එක් අන්තයක අනාගතය දෙවෙනි අන්තයයි, පවත්නා කාලය මධ්‍යයයි, (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

5 "මෙසේ කීකල්හි එක්තරා භික්ෂුවක් ස්ථවිර භික්ෂූන්ට මෙසේ කීය. "ඇවැත්නි, සුඛ වේදනාව එක් අන්තයක දුක් වේදනාව දෙවෙනි අන්තයයි, අදුක්ඛවූද අසුඛවූද වේදනාව මධ්‍යයයි, (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

6 'මෙසේ කී කල්හි එක්තරා භික්ෂුවක් මෙසේ කීවේය. "ඇවැත්නි, නාමය එක් අන්තයක, රූපය දෙවෙනි අන්තයයි විඤ්ඤාණය මධ්‍යයයි. (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

7 "මෙසේ කී කල්හි එක්තරා භික්ෂුවක් ස්ථවරභික්ෂූන්ට මෙසේ කීය. "ඇවැත්නි, සවැදෑරුම් අධ්‍යාත්මික ආයතනයෝ

එක් අන්තයක, බාහිරවූ සවැදෑරුම් ආයතනයෝ අනික් අන්තයයි. විඤ්ඤාණය මධ්‍යයයි, (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

8 "මෙසේ කී කල්හි එක්තරා භික්ෂුවක් ස්ථවිරභික්ෂූන්ට මෙසේ කීය. "ඇවැත්නි, ආත්මදෘෂ්ටිය එක් අන්තයකි. ආත්ම දෘෂ්ටිය ඇතිවීමේ හේතුව දෙවෙනි අන්තයයි, ආත්ම දෘෂ්ටි නිරොධය මධ්‍යයයි. (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

9 "මෙසේ කී කල්හි එක්තරා භික්ෂූනමක් ස්ථවිර භික්ෂූන්ට මෙසේ කීය. "ඇවැත්නි, අප විසින් තම තමන්ගේ වැටහීම ප්‍රකාශ කරණ ලදී. එමු ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැන්හි පිවිසෙන්නෙමු. එසේ පිවිස භාග්‍යවතුන් වහන්සේට මෙය දන්වන්නෙමු. යම්සේ අපට භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කෙරේද, එසේ අපි දරන්නෙමු"--"එසේය ඇවැත්නියි" ස්ථවිර භික්ෂූහු ඒ භික්ෂුවට උත්තර දුන්හ.

10 ඉක්බිති ඒ ස්ථවිර භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැන්හි පැමිණියහ. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියාහ. එකත්පසෙක සිටියාවූ ස්ථවිර භික්ෂූහු යම්තාක් ඔවුනොවුන් සමගවූ කථා සල්ලාපයක් ඇද්ද ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේට දැන්වූහ. "ස්වාමීනි, කාගේ අදහස යහපත්ද?"

11 "මහණෙනි, යුෂ්මතුන් සියල්ලන්ගේම අදහස් යහපති එසේ නමුදු මා විසින් යමක් සඳහා (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) යනුවෙන් පාරායන සූත්‍රයේ මෙත්තෙය්‍ය ප්‍රශ්නයේ දේශනා කරණ ලද්දේද, එය අසව්. මනාකොට මෙනෙහි කරව්, ප්‍රකාශකරන්නෙමි."--"එසේය ස්වාමීනි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ.

12 "භාග්‍යවතුන් වහන්සේ මෙය ප්‍රකාශ කළසේක. ඇවැත්නි, ස්පර්ශය එක් අන්තයකි ස්පර්ශ සමුදය දෙවන අන්තයයි, ස්පර්ශ නිරොධය මධ්‍යයයි. (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

8 **දණ්ඩකප්ප සූත්‍රයː-** 1 "මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ මහත් භික්ෂූ සමූහයා හා

කොසල දනව්වෙහි සැරිසරනසේක් කොසල වැස්සන්ගේ දණ්ඩකප්ප නම් නියම් ගමෙහි විසූහ. ඉක්බිත්තෙන් වනාහි භාග්‍යවතුන් වහන්සේ මගින් පහව එක්තරා ගසක් මුල පැනවූ අස්නෙහි වැඩහුන්හ. ඒ භික්ෂූහුද සෙනසුන් සෙවීමට දණ්ඩකප්පයට ඇතුළුවූහ.

2 "ඉක්බිති වනාහි ආයුෂ්මත් ආනන්දතෙමේ බොහෝ භික්ෂූන් සමග ඇඟ සේදීමට අචිරවතී නදියට පැමිණියේය. අචිරවතියෙහි ඇඟ සෝදා ගොඩවී ඇඟ වියළන්නේ එක සිවුරින් සිටියේය.

"ඉක්බිති වනාහි එක්තරා භික්ෂුවක් ආයුෂ්මත් ආනන්දයන් කරා එළඹ ආයුෂ්මත් ආනන්ද හට මෙසේ කීය.

3 (i) "ඇවැත් ආනන්දය, භාග්‍යවතුන් වහන්සේ 'දෙවදත්ත අපායගතය. කල්පයක් පැසෙයි, පිළියම් නොකළ හැක්කේයයි' සියල්ල සිතින් තීරණයකොට ප්‍රකාශ කෙළේද? නැතහොත් කිසියම් ප්‍රකාරයෙකින්ද?' (ii) ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ වනාහි මේ කාරණය ප්‍රකාශ කරන ලද්දේය."

4 ඉක්බිති ආයුෂ්මත් ආනන්දතෙම භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් ආනන්ද තෙමේ භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැළකෙළේය.

"ස්වාමීනි, මම මෙහි අචිරවතී නදියට බොහෝ භික්ෂූන් සමග ඇඟ සේදීමට ගියෙමි. අචිරවතී නදියෙහි ඇඟ සෝදා ගොඩනැඟී ඇඟ වේළමින් එක සිවුරින් සිටියෙමි. ඉක්බිති වනාහි එක්තරා භික්ෂුවක් මා කරා අවුත් මට මෙය කීය. (මෙහි 3 (i) යෙදිය යුතුයි.) මෙසේ කී කල්හි ස්වාමීනි මම ඒ භික්ෂුහට මෙය කීමි. (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

5 "ආනන්දය, ඒ භික්ෂුතෙමේ අලුත පැවිදිවූ නවකයෙක් හෝ වේ. ස්ථවිරවූවෙක් නම් බාලවූ අදක්ෂයෙකි. මා ඒකාන්තයෙන් යමක් ප්‍රකාශ කරන ලද්දේද, කෙසේ නම් එහි දෙ ආකාරයකට පැමිණෙන්නේද, ආනන්දය, යමෙක් මෙසේ

මා විසින් සියල්ල සිතින්ම තීරණයකොට ප්‍රකාශ කෙළේද, එබඳු අන් එකම පුද්ගලයකු හෝ මම නොදනිමි. ඒ නම් මේ දෙවදත්තයි.

6 "ආනන්දය, මම යම්තාක් දෙවදත්තගේ ලොම තුඩක් පමණවූ හෝ කුශල ධර්මයක් දුටුයෙම්ද ඒතාක් මම දෙවදත්ත තෙමේ අපායගතය, කල්පයක් පැසෙන්නේය. පිළියම් නොකළහැක්කේයයි දෙවදත්ත ගැන ප්‍රකාශයක් නොකළෙමි. ආනන්ද, යම් තැනකින් මම දෙවදත්තගේ ලොම තුඩක් පමණවූ හෝ කුශල ධර්මයක් නොදුටුයෙම්ද, ඉක්බිති මම දෙවදත්ත තෙමේ අපායගතය, කල්පයක් පැසෙන්නේය, පිළියම් නොකළ හැක්කේයයි දෙවදත්ත ගැන ප්‍රකාශ කළෙමි.

7 "ආනන්දය, යම්සේ පුරුෂ ප්‍රමාණයට වැඩි, ගැට්ට තෙක්වූ අශුචියෙන් පිරුණු අශුචි වළක් වේද, එහි පුරුෂයෙක් තෙම හිස සහිතවම කිඳුනේවේද, කිසියම් පුරුෂයෙක් තෙම ඔහුට වැඩ කැමැත්තේ, හිත කැමැත්තේ බැඳුම්වලින් නිදහස්වීම කැමැත්තේ, ඒ අශුචි වළෙන් උඩ නගනු කැමැත්තේ ‍හෙතෙම ඒ ගූථ කූපය වටා කැරකෙන්නේ ඒ පුරුෂයාගේ ලොම්අගක් පමණකුදු අශුචි නොගෑවුණු තැනක් නොදකින්නේනම් කොතැනින් අල්ලාගෙන උඩනගන්නේද?

8 "ආනන්දය, එසේම මම වනාහි යම්තැනෙක පටන් දෙව්දත්හුගේ ලොම් අගක් පමණ හෝ කුශල ධර්මයක් නොදුටුවෙම්ද, එතැන්පටන් මම දෙවදත්තතෙමේ අපායගතය, කල්පයක් පැසෙන්නේය. පිළියම් නොකටහැක්කේ යයි දෙවදත්ත ගැන ප්‍රකාශ කෙළෙමි.

9 "ආනන්දය, ඉදින් තෙපි පුරුෂෙන්ද්‍රිය ඥානයන් බෙදා දක්වන්නාවූ තථාගතයන්හට ඇහුම්කන් දෙව්ද,

"භාග්‍යවතුන් වහන්සේ යම්හෙයකින් පුරුෂෙන්ද්‍රිය ඥානයන් බෙදා දක්වන්නේ නම් භික්ෂූහු යමක් අසා දරත්ද භාග්‍යවතුන් වහන්ස ඊට මේ කාලයයි. සුගතයන් වහන්ස ඊට මේ කාලයයි."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

"ආනන්දය, එසේ වීනම් අසව, මනාව මෙනෙහි කරව, කියන්නෙමි"-"එසේය, ස්වාමීනි" යි ආනන්ද තෙමේ භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්නේය.

10 "භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. ආනන්දය, මේ පුද්ගලයාට කුශල ධර්මයෝද අකුශල ධර්මයෝද පවතිත්යයි මෙසේ මම ඇතැම් පුද්ගලයෙකු සිතින් සිත පතුරුවා දනිමි. අනෙක්විටෙක මේ පුද්ගලයාට කුශල ධර්ම අතුරුදහන් විය අකුශල ධර්ම සම්මුඛවීයයිද ඔහුට කුසල් මුල් නොසිඳුණු ඇසක් ඇත. එබැවින් ඔහුට පින් පව් පහළවන්නේය, මෙසේ මේ පුද්ගලතෙමේ මත්තෙහි නොපිරිහෙන ධර්ම ඇත්තෙක් වන්නේයයි මෙසේ මම ඒ මේ තැනැත්තා සිතින් සිත පතුරුවා මනාව දනිමි.

11 "ආනන්දය, යම්සේ නොකැඩුණු, කුණුනොවූ, අව් සුළං නොවැදුණු, හරගෙන දෙන, හොඳ කුඹුරක හොඳට වැටුණු, හොඳට පිළියෙළවුණු බිම බහන ලද බීජයෝ වෙත්ද මේ බීජයෝ වැඩීමට පැළවීමට විශාල බවට පැමිණෙත්යයි දන්නෙහිය"-- "ස්වාමීනි, එසේය"

12 "ආනන්දය, එසේම වනාහි මෙහි මේ පුද්ගලයාට කුශල ධර්මයෝද අකුශල ධර්මයෝද පවතිත්යයි මෙසේ මම ඇතැම් පුද්ගලයකු සිතින් සිත පතුරුවා දනිම්ද, අනෙක් විටෙක මේ පුද්ගලයාව කුශල ධර්ම අතුරුදහන්විය. අකුශල ධර්ම සම්මුඛවීයයිද, ඔහුට කුසල් මුල් නොසිඳුණු ඇසක් ඇත. එබැවින් ඔහුට පින් පව් පහළ වන්නේය. මෙසේ මේ පුද්ගලතෙම මත්තෙහි නොපිරිහෙන ධර්ම ඇත්තේ වන්නේ යයි මෙසේ මම ඒ මේ තැනැත්තා සිතින් සිත වෙන්කොට දැන මනාව දත්තේ වෙමි.

13 (i) "ආනන්දය, මෙහි මේ පුද්ගලයාට කුශල ධර්මයෝද අකුශල ධර්මයෝද පවතිත්යයි සිතින් සිත වෙන්කොට ඇතැම් පුද්ගලයකු මම දැනගනිම්ද, අනික් කලෙක මේ පුද්ගලයාගේ අකුශල ධර්මයෝ අතුරුදහන්වූහ. කුශල ධර්මයෝ ඉදිරියටපැමිණියහ, ඔහුගේ මුලින් නොසිඳුන අකුශලමූලයෝ

ඇත්තාහ. (ii) ඔහුට ඒ අකුශල මූලයන්ගෙන් අකුශලය රැස්වන්නේය. මෙසේ මේ පුද්ගලතෙම නැවත පිරිහීම් ධර්මයා පැමිණෙන්නේයයි ඔහු සිතින් සිත වෙන්කොට දැනගනිමි.

14 "ආනන්දය, යම්සේ නොකැඩුනු, කුණුනොවූ, අව් සුළං වලින් වෙනසක් නොවූ හරදෙන, මනාව තබන ලද බීජයෝ ලොකු ගලක බහාලන ලද්දාහු වෙද්ද මේ බීජයෝ වැඩීමට මහත් බවට නොපැමිණෙන්නේ යයි ආනන්දය, ඔබ දන්නෙහිද?"--"එසේය, ස්වාමීනි"

15 (මෙහි 13 ඡෙදය යෙදිය යුතුයි) (ii) ආනන්දය, මෙසේද වනාහි තථාගතයන් වහන්සේ පුරුෂ පුද්ගලයා සිතින් සිත වෙන්කොට දැනගන්නේ වෙයි. ආනන්දය, මෙසේ වනාහි තථාගතයන් වහන්සේගේ පුරිෂෙන්ද්‍රිය ඥානය (iii) සිතින් සිත වෙන්කොට දැනගන්නා ලද්දේවෙයි. ආනන්දය, මෙසේද වනාහි තථාගතයන් වහන්සේ සිතින් සිත පිරිසිඳ නැවත ධර්මයන් ඇතිවීම දන්නා ලද්දේ වෙයි. (iv) ආනන්දය, මෙහි මේ පුද්ගලයාට කුශල ධර්මයෝද අකුශල ධර්මයෝද පවතිත්යයි ඇතැම් පුද්ගලයකු සිතින් සිත වෙන්කොට මම දැනගතිමි. (v) අනික් කාලයක මේ පුද්ගලයාට අස් ලොම් අගක් එබීමට හැකි තරම්වත් කුශල ධර්මයක් නැත. මේ පුද්ගලයා ඒකාන්තයෙන් කළුවූ අකුශල ධර්මයන්ගෙන් යුක්තවූවෙක, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැප නැති අයහපත් ගති ඇති නපුරුසේ වැටෙන නරකයෙහි උපදනේය.

16 "ආනන්දය, යම්සේ කැඩුනු, කුණුවූ, අව් සුළඟින් විනාශවූ හොඳට සමකරණ ලද යහපත් කෙත් බිමක බහාලන ලද බීජයෝ වැඩීමට මහත් බවට නොපැමිණෙන්නේ යයි දන්නෙහිද?"-"එසේය, ස්වාමීනි"

"එපරිද්දෙන්ම ආනන්දය, මෙහි ඇතැම් පුද්ගලයෙකුට කුශල ධර්මයෝද අකුශල ධර්මයෝද පවතිත්යයි ඇතැම් පුද්ගලයකු සිතින් සිත වෙන්කොට මම දැනගතිමි. (මෙහි 15 (iii) යෙදිය යුතුයි.)

පටුන



17 (මෙහි 15 (ii) යෙදිය යුතුයි.) ආනන්දය, මෙසේද වනාහි තථාගතයන් වහන්සේ පුරිෂෙන්ද්‍රිය ඥානය (මෙහි 15 (iii) යෙදිය යුතුයි.)

18 "මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේය. ස්වාමීනි, මේ පුද්ගලයන් තුන්දෙනාගෙන් අනික් සමානවූ පුද්ගලයන් තුන්දෙනෙක් පණවන්නට හැකිවෙත්ද?'

"ආනන්දය, හැකියයි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. (මෙහි 13 ඡේදය යෙදිය යුතුයි.)

ආනන්දය, යම්සේ මනාව ගිනිගත් දිලිසෙන ගිනිඅඟුරු ලොකු ගලක බහාලන ලද්දේ වේද ඒ අඟුරු වැඩිවීමට මහත් බවට නොපැමිණෙන්නේයයි ඔබ දන්නෙහිද?"-"එසේය, ස්වාමීනි."

19. "ආනන්දය, යම්සේ සවස් කාලයෙහි හිරු බසිනවිට ආලෝකය අතුරුදහන් වන්නේය. අන්ධකාරය පහළවන්නේ යයි ඔබ දන්නෙහිද?"-"එසේය ස්වාමීනි."

"ආනන්දය, යම්සේ මනාව ගිනිගත් දිලිසෙන ගිනිඅඟුරු ලොකු ගලක බහාලන ලද්දේ වේද ඒ අඟුරු වැඩිවීමට මහත් බවට නොපැමිණෙන්නේයයි ඔබ දන්නෙහිද?"-"එසේය, ස්වාමීනි."

19. "ආනන්දය, යම්සේ සවස් කාලයෙහි හිරු බසිනවිට ආලෝකය අතුරුදහන් වන්නේය. අන්ධකාරය පහළවන්නේ යයි ඔබ දන්නෙහිද?"-"එසේය ස්වාමීනි."

"ආනන්දය, රාත්‍රිය ලැබූතැන ආහාර වේලාවෙහි අර්ධ රාත්‍රියෙහි ආලෝකය අතුරුදහන්විය. අන්ධකාරය පහළවූයේයයි ඔබ දන්නෙහිද? ආනන්දය, එමෙන්ම මම මේ පුද්ගලයාට කුශල ධර්මයෝද, අකුශල ධර්මයෝද පවතිත්යයි සිතින් සිත වෙන්කොට දනිම්ද, අනික් කලෙක මේ පුද්ගලයාගේ කුශල ධර්මයෝ අතුරුදහන්වූහ. අකුශල ධර්මයෝ ඉදිරියටපැමිණියහ. ඔහුගේ මුලින් නො සිඳුන කුශල මූලයෝ ඇත්තාහ. එයද

සියල්ලෙන් සියල්ල විනාශවෙයි. මෙසේ මේ පුද්ගලතෙම පරිහානි ධර්මයට වැටෙන්නේයයි සිතින් සිත වෙන්කොට දැනගනිමි. ආනන්දය, මෙසේද තථාගතයන් වහන්සේ පුරිස පුද්ගලයා සිතින් සිත පිරිසිඳ දැනගන්නේවේ. ආනන්දය, මෙසේද තථාගතයන්වහන්සේ පුරුෂෙන්ද්‍රියඥානය සිතින් සිත වෙන්කොට දැනගන්නේ වෙයි. ආනන්දය, මෙසේද තථාගතයන් වහන්සේ නැවත ධර්මයන් ඉපදීම සිතින් සිත වෙන්කොට දැනගන්නා ලද්දේවෙයි. ආනන්දය, මෙහි වනාහි මම මෙහි මේ පුද්ගලයාට කුශල ධර්මයෝද අකුශල ධර්මයෝද පවතිත්යයි සිතින් සිත වෙන්කොට දනිම්ද, අනික් කලෙක මේ පුද්ගලයාගේ අකුශල ධර්මයෝ අතුරුදහන්වූහ. කුශල ධර්මයෝ ඉදිරිපත්වූහ. ඔහුගේ මුල් නොසිඳුන අකුශල මූලයෝ ඇත්තාහ. එයද සියල්ලෙන් සියල්ල විනාශවෙයි. මෙසේ මේ පුද්ගලතෙම නැවත පිරිහීමට නොයන්නේ වෙයි.

**20.** "ආනන්දය, යම්සේ ගිනිගත් මනාව දිලිසෙන ගිනි අඟුරු වියලුන තණකොළ ගොඩක හෝ දර ගොඩක හෝ බහාලනලද්දේ වැඩීමට මහත් බවට පැමිණෙන්නේයයි ඔබ දන්නෙහිද?"-"එසේය, ස්වාමීනි." "ආනන්දය, යම්සේ රාත්‍රි එළිවෙන යාමයෙහි හිරු නැගෙන කල්හි අන්ධකාරය අතුරුදහන් වන්නේය. ආලෝකය පහලවන්නේයයි ඔබ දන්නෙහිද?"- "එසේය, ස්වාමීනි"

"යම්සේ හෝ ආනන්දය, රැවුන තැනම මැද කොටසෙහි ආහාර වේලාවෙහි අන්ධකාරය දුරුවිය. ආලෝකය පහළ වූයේයයි ඔබ දන්නෙහිද?"-"එසේය, ස්වාමීනි." (මෙහි 13 (i) යෙදිය යුතුයි.)

**21.** "ආනන්දය, එපරිද්දෙන්ම මම මේ පුද්ගලයාට කුශල ධර්මයෝද අකුශල ධර්මයෝද ඇත්තාහ. පවතිත්යයි සිතින් සිත වෙන්කොට දැනගනිමි. දනිම්ද? අනික් කලෙක මේ පුද්ගලයාගේ අකුශල ධර්මයෝ අතුරුදහන්වූහ. එයද සියල්ලෙන් සියල්ල විනාශ වෙයි. මෙසේ මේ පුද්ගලතෙම නැවත පිරිහීමට නොයන්නේ වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ආනන්දය, මෙසේද තථාගතයන් වහන්සේ පුරුෂ පුද්ගලයා සිතින් සිත වෙන්කොට දැනගන්නේ වෙයි. ආනන්දය, මෙසේද තථාගතයන්වහන්සේ පුරුෂෙන්ද්‍රියඥානය සිතින් සිත වෙන්කොට දැනගන්නේවේ. ආනන්දය, මෙසේද තථාගතයන් වහන්සේ නැවත ධර්මයන් ඉපදීම සිතින් සිත වෙන්කොට දැනගන්නා ලද්දේ වෙයි. අනික් කාලයක මේ පුද්ගලයාට අස් ලොම් අගක් එබීමට හැකි තරම්වත් අකුශල ධර්මයක් නැත. මේ පුද්ගලතෙම ඒකාන්තයෙන් පිරිසිදු වූ වැරදි නැති ධර්මයන්ගෙන් මෙලොවම පිරිනිවෙන්නේයයි මෙසේ සිතින් සිත වෙන්කොට දැනගතිමි. ආනන්දය, යම්සේ සිහිල්වූ නිවුනාවූ අඟුරු වියලි තණකොළ ගොඩක හෝ දර ගොඩක හෝ බහාලන ලද්දේ මේ අඟුරු වැඩිවීමට මහත්බවට නොපැමිණෙන්නේයයි ඔබ දන්නෙහිද?"-"එසේය, ස්වාමීනි"

"ආනන්දය, එපරිද්දෙන්ම මෙහි ඇතැම් පුද්යලයෙකුට කුශල ධර්මයෝද අකුශල ධර්මයෝද පවතිත් යයි ඇතැම් පුද්ගලයකු සිතින් සිත වෙන්කොට මම දැනගතිමි. අනික් කාලයක මේ පුද්ගලයාට අස් ලොම් අගක් එබීමට හැකි තරම්වත් අකුශල ධර්මයක් නැත. මේ පුද්ගලතෙම ඒකාන්තයෙන් පිරිසිදුවූ වැරදි නැති ධර්මයන්ගෙන් මෙලොවම පිරිනිවෙන්නේ යයි මෙසේ සිතින් සිතවෙන්කොට දැනගතිමි. ආනන්දය, මෙසේද තථාගත පුරුෂෙන්ද්‍රිය ඥානය සිතින් සිත වෙන්කොට දැනගන්නේවේ. ආනන්දය, මෙසේද තථාගතයන් වහන්සේ නැවත ඉපදීම සිතින් සිත වෙන්කොට දැනගන්නාලද්දේ වෙයි. ආනන්දය, එහි පෙරකී පුද්ගලයෝ තුන්දෙන වෙද්ද ඒ තුන් පුද්ගලයන් ගෙන් එක් අයෙක් නො පිරිහෙන ධර්ම ඇත්තෙක. එක් අයෙක් පිරිහීම් ධර්ම ඇත්තෙක. එක් පුද්ගලයෙක් නිරය නම්වූ අපායට යන්නෙක.

**22.** "ආනන්දය, මෙහි යම් ඒ පසුව කී පුද්ගලයෝ තුන් දෙන වෙද්ද මේ තුන් පුද්ගලයන්ගෙන් එක් අයෙක් නො පිරිහෙන ධර්ම ඇත්තෙක, එක් අයෙක් පිරිහෙන ධර්ම ඇත්තෙක. එක් අයෙක් පරිනිර්වාණ ධර්ම ඇත්තෙකි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**9 නිබ්බෙධික පරියාය සූත්‍රයː- 1** "මහණෙනි, යුෂ්මතුන්ට තියුණු අවබොධයක් ඇතිකර ගැනීමට හේතුවන ධර්ම ක්‍රමය දෙශනා කරන්නෙමි. එය අසව්. මනාකොට සිහි කරව්. දෙශනාකරන්නෙමි" "එසේය, ස්වාමීනි"යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

**2.** "මහණෙනි, තියුණු අවබොධයක් ඇතිකර ගැනීමට හේතුවන ඒ ධර්ම ක්‍රමය කවරේද? (ii) මහණෙනි, කාමය දතයුතුය. කාමය ඇතිවීමේ හේතුව දතයුතුය. කාමයන්ගේ වෙනස දතයුතුයි. කාමයන්ගේ විපාකය දතයුතුය. කාමයන් නැතිවීම හෝ නැතිතැන දතයුතුය. කාමයන් නැතිකිරීමට ගමන්කරණ ප්‍රතිපදාව දත යුතුය.

**3.** "ආශ්‍රවයන් ඇතිවීමේ හේතුව දතයුතුය. ආශ්‍රවයන්ගේ වෙනස දතයුතුය. ආශ්‍රවයන්ගේ විපාකය දතයුතුය. ආශ්‍රවයන් නැතිවීම හෝ නැතිතැන දතයුතුය. ආශ්‍රවයන් නැතිකිරීමට ගමන්කරණ මාර්ගය දතයුතුය.

**4.** "මහණෙනි, කර්මය දතයුතුය. කර්මයන් ඇතිවීමේ හේතුව දතයුතුය. කර්මයන්ගේ වෙනස දතයුතුය. කර්මයන්ගේ විපාකය දතයුතුය. කර්මයන් නැතිවීම හෝ නැතිතැන දතයුතුය. කර්මයන් නැතිකිරීමට ගමන්කරණ මාර්ගය දතයුතුය.

**5.** "මහණෙනි, දුක දතයුතුය. දුක නැතිවීමේ හේතුව දතයුතුය. දුකෙහි වෙනස දතයුතුය. දුකෙහි විපාකය දතයුතුය. දුක නැතිවීම හෝ නැතිතැන දතයුතුය. දුකනැති කිරීමට ගමන්කරණ මාර්ගය දතයුතුය.

**6.** "මහණෙනි, කාමයෝ දතයුතුය. කාමයන් ඇතිවීමේ හේතුව දතයුතුය. කාමයන්ගේ වෙනස දතයුතුය. කාමයන් නැතිවීම හෝ නැති තැන දතයුතුය. කාමයන් නැතිකිරීමට ගමන්කරණ මාර්ගය දතයුතුයි" මෙසේ දෙශනාකරණලදී.

**7.** "මෙය කුමක් නිසා දෙශනාකරණ ලද්දේද? මහණෙනි, කාමගුණයෝ පසක් වෙති, යහපත්වූ, ප්‍රියවූ, සිත් අලවන්නාවූ,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

මනා දැකුම් ඇති, මනා රූ ඇති, කාමයන් ඇති කරවන්නාවූ ඇලීම් ඇතිකරවන්නාවූ ඇසින් හැඳිනගන්නා රූපයෝද, කණින් හැඳිනගන්නාවූ ශබ්දයෝද, නාසයෙන් හැඳිනගන්නාවූ සුවඳද, දිවෙන් හැඳිනගන්නාවූ රසයෝද, කයින් හැඳිනගන්නාවූ ස්පර්ශයෝද වෙති. එසේ නමුදු මේ කාමයෝ නොවෙති. මොවුහු කාමගුණයෝයයි ආයර්‍ය්‍යවිනයෙහි කියත්.

8. "පුරුෂයාගේ කල්පනා වශයෙන් උපන්නාවූ රාගයතෙම කාම නම් වේ. ලෝකයෙහි යම් විසිතුරු අරමුණු ඇද්ද මොවුහු කාමයෝ නොවෙත්. ලෝකයෙහි එසේම විසිතුරු අරමුණු ඇත්තාහ. එසේවුවත් මේ ලෝකයෙහි නුවණැත්තෝ කාමාශාව දුරුකරත් හික්මවත්."

9. "මහණෙනි, කාමයන්ගේ නිදාන (මුල් කාරණය) ඇතිවීම කෙසේද? ස්පර්ශය මහණෙනි, කාමයන්ගේ නිදාන ඇතිවීමයි.

"මහණෙනි, කාමයන්ගේ වෙනස කෙසේද? මහණෙනි, රූපයෙහි කාමය අන්‍යය, ශබ්දයෙහි කාමය අන්‍යය, ගඳ සුවඳෙහි කාමය අන්‍යය. රසයෙහි කාමය අන්‍යය. ස්පර්ශයෙහි කාමය අන්‍යය. මහණෙනි, මේ වනාහි කාමයන්ගේ වෙනස් බවයි.

10. "මහණෙනි, කාමයන්ගේ විපාකය කවරේද? මහණෙනි, යමක් කැමැතිවනු ලබන්නේ, පින් පක්ෂයෙහිවූ හෝ පව් පක්ෂයෙහිවූ හෝ එයින් උපදනා ආත්ම භාවය උපදවයි. මහණෙනි, කාමයන්ගේ විපාකය මේ යයි කියනු ලැබේ.

11. "මහණෙනි, කාමයන්ගේ නැති කිරීම කෙසේද? මහණෙනි, ස්පර්ශය නැතිකිරීම කාමය නැතිකිරීමවේ. මෙයම ආර්ය අෂ්ටාංගික මාර්ගයයි කාමය නැති කිරීමේ පිළිවෙතයි. ඒ කෙසේදයත්? (ii) නිවැරදි දැකීමයි නිවැරදි අදහසයි. නිවැරදි වචනයයි. නිවැරදි කර්මාන්තයයි. නිවැරදි ජීවිකාව නිවැරදි ව්‍යායාමයයි, නිවැරදි සිහියයි, නිවැරදි සිත එකඟකමයි.

12. "මහණෙනි, යම් විටක මෙයින් වනාහි ආර්යශ්‍රාවක තෙම මෙසේ කාමයන් මනාව දනීද. මෙසේ කාමයන්ගේ නිදාන ඇතිවීම දනීද, මෙසේ කාමයන්ගේ වෙනස් බව මනාව දනීද. මෙසේ කාමයන්ගේ විපාකය දනීද, මෙසේ කාමයන් නැතිකිරීම

දනීද, මෙසේ කාමයන්ගේ නැති කිරීමට යවන පිළිවෙත දනීද. හෙතෙම මේ කාමයන් නැති කිරීම වූ තියුණු අවබොධයවූ, බඹසර දනී.

13. (මෙහි 2 (ii) සිට 6 ඡේදය දක්වා යොදාගත යුතුයි.)

14. "මහණෙනි, වෙදනාව දතයුතුය, වෙදනාව ඇතිවීමේ හේතුව දතයුතුය. වේදනාවගේ විපාකය දතයුතුය. වේදනාවන් නැතිවීම හෝ නැති තැන දතයුතුය. වේදනා දතයුතුය. වේදනාව නැතිකරන පිළිවෙත දතයුතුයයි මේ කාරණය වනාහි කියනලදද, (ii) මෙය කුමක් සඳහා කියන ලදද?

15. "මහණෙනි, මේ වේදනාව තුන් වැදෑරුම්ය. සැප විඳීමය, දුක් විඳීමය, සැප නොවූ දුක් නොවූ විඳීමය (කියායි.)

16 'මහණෙනි, වේදනාවන්ගේ නිදාන ඇතිවීම කෙසේද? මහණෙනි, ස්පර්ශය වේදනාවන්ගේ නිදාන ඇතිවීමයි. මහණෙනි, වේදනාවන්ගේ වෙනස කෙසේද? මහණෙනි, ගොදුරු සහිතවූ සැපවූ විඳීමක් ඇත. ගොදුරු රහිතවූ සැපවූ විඳීමක් ඇත. ගොදුරු සහිතවූ දුක්වූ විඳීමක් ඇත. ගොදුරු රහිතවූ දුක්වූ විඳීමක් ඇත. ගොදුරු සහිතවූ, දුක් නොවූ, සැපනොවූ විඳීමක් ඇත. ගොදුරු රහිතවූ දුක් නොවූ සැප නොවූ විඳීමක් ඇත. මහණෙනි, මේ වනාහි වේදනාවන්ගේ වෙනස් බවයි.

17 "මහණෙනි, වේදනාවන්ගේ විපාකය කවරේද? මහණෙනි, යමක් විඳිනු ලබන්නේ පින් පක්ෂයෙහිවූ හෝ පව් පක්ෂයෙහිවූ හෝ එයින් (වේදනාවෙන්) උපදනා ආත්මභාවය උපදවයි. මහණෙනි, වේදනාවන්ගේ විපාකය මේ යයි කියනු ලැබේ.

18 "මහණෙනි, වේදනාවන්ගේ නැතිකිරීම කවරේද? මහණෙනි, ස්පර්ශයෝ නැතිකිරීම වේදනාවගේ නැතිකිරීමවේ. මෙයම ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයයි. වේදනාව නැතිකිරීමේ පිළිවෙතයි. ඒ කෙසේද යත්, මෙහි 11 (ii) ඡේදය යෙදිය යුතුයි.)

19 "මහණෙනි, යම් (බඳු) මෙයින් වනාහි ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ මෙසේ වේදනාව දනීද, මෙසේ වේදනාව ඇතිවීම දනීද,

මෙසේ වේදනාවන්ගේ වෙනස දනීද, මෙසේ වේදනාවන්ගේ විපාකය දනීද, මෙසේ වේදනාවන්ගේ නැතිකිරීම දනීද, මෙසේ වේදනාව නැති කිරීමට යවන පිළිවෙත දනීද හෙතෙම මේ වේදනාව නැතිකිරීමවූ තියුණු අවබොධයවූ බඹසර දනී. (මෙහි 14 (i) ඡෙදය යෙදිය යුතුයි.)

20 "මහණෙනි, සංඥාව (හැඟීම) දතයුතුය, සංඥාව ඇතිවීමේ හේතුව දතයුතුය. සංඥාවේ විපාකය දතයුතුය. සංඥාව නැතිවීම දතයුතුය. සංඥාව නැති කරන පිළිවෙත දතයුතුයයි යම් මේ කාරණයක් කියන ලදද (ii) මෙය කුමක් සඳහා කියන ලදද?

21 "මහණෙනි, මේ හැඟීම් පසෙකි. රූපයේ හැඟීමද, ශබ්දයේ හැඟීමද, ගඳ සුවඳෙහි හැඟීමද, රසයෙහි හැඟීමද, ස්පර්ශයෙහි හැඟීමද ධර්මයෙහි හැඟීමද (කියාය.)

22 "මහණෙනි, සංඥාවන්ගේ නිදාන ඇතිවීම කෙසේද? මහණෙනි, ස්පර්ශය හැඟීම්වල නිදාන ඇතිවීමයි. මහණෙනි, සංඥාවන්ගේ වෙනස කෙසේද? මහණෙනි, රූපයෙහි සංඥාව අන්‍යය, ශබ්දයෙහි සංඥාව අන්‍යය, ගඳ-සුවඳෙහි සංඥාව අන්‍යය, රසයෙහි සංඥාව අන්‍යය, ස්පර්ශයෙහි සංඥාව අන්‍යය ධර්මයෙහි සංඥාව අන්‍යය. මහණෙනි, මේ වනාහි සංඥාවන්ගේ වෙනසයි.

23 "මහණෙනි, සංඥාවන්ගේ විපාකය කෙසේද? මහණෙනි, යම් යම් පරිද්දකින් එය හඳුනාද, ඒ ඒ පරිද්දෙන් ව්‍යවහාර කෙරෙයි. මෙසේ සංඥා ඇත්තේ වීමියි ව්‍යවහාරයෙන් පැසුණු මම සංඥාව කියමි. මහණෙනි, මේ වනාහි සංඥාවන්ගේ විපාකයයි.

24 "මහණෙනි, සංඥාවන්ගේ නැතිකිරීම කෙසේද? මහණෙනි, ස්පර්ශය නැතිකිරීම සංඥාවන්ගේ නැතිකිරීමයි. මෙයම ආය්‍යී අෂ්ටාංගික මාර්ගයයි. සංඥාවන් නැතිකිරීමේ පිළිවෙතයි. එ කෙසේද යත්? (මෙහි 11 (ii) ඡෙදය යෙදිය යුතුයි.) මහණෙනි, යම් බඳු මෙයින් වනාහි ආය්‍යී ශ්‍රාවකතෙම මෙසේ සංඥාව දනීද, මෙසේ සංඥාවන්ගේ නිදාන ඇතිවීම දනීද,

මෙසේ සංඥාවන්ගේ වෙනස දනීද, මෙසේ වේදනාවන්ගේ විපාකය දනීද, මෙසේ වේදනාවන්ගේ නැති කිරීම දනීද, මෙසේ සංඥාව නැතිකරන පිළිවෙත දනීද, හෙතෙමේ මේ සංඥාවන් නැතිකිරීමවූ තියුණු අවබොධයවූ බඹසර දනී. (මෙහි 20 (i) ඡේදය යෙදිය යුතුයි.) මෙය එය සඳහාම කියන ලදී.

25 "මහණෙනි, ආශ්‍රවයෝ (කෙලෙස්) දතයුතුය. ආශ්‍රවයන් ඇතිවීමේ හේතුව දතයුතුය, ආශ්‍රවයන්ගේ විපාකය දතයුතුය, ආශ්‍රවයන් නැතිකිරීම දතයුතුය, ආශ්‍රවයන් නැති කරන පිළිවෙත දතයුතුයයි (ii) මෙය කියන ලදද, එය කුමක් සඳහා කියන ලදද?

26 "මහණෙනි, ආශ්‍රවයෝ තුනෙකි. කාමාශ්‍රවය, භවාශ්‍රවය, අවිජ්ජාශ්‍රවය (කියා) ය. මහණෙනි, ආශ්‍රවයන්ගේ නිදානය ඇතිවීම කෙසේද? මහණෙනි, අවිද්‍යාව (නොදැනීම) ආශ්‍රවයන්ගේ නිදානය ඇතිවීමයි. මහණෙනි, ආශ්‍රවයන්ගේ වෙනස කෙසේද? මහණෙනි, නිරයට යවන ආශ්‍රවයෝ ඇත. තිරිසන් ජාතියට යවන ආශ්‍රවයෝ ඇත. ප්‍රෙත ලොකයට යවන ආශ්‍රවයෝ ඇත. මිනිස් ලොවට යවන ආශ්‍රවයෝ ඇත. දෙව් ලොවට යවන ආශ්‍රවයෝ ඇත. මහණෙනි, මෙය වනාහි ආශ්‍රවයන්ගේ වෙනස යයි කියනු ලැබේ.

"මහණෙනි, ආශ්‍රවයන්ගේ විපාකය කවරේද? මහණෙනි යමක් නොදැනීමට පත්වූයේ පින් පක්ෂයෙහිවූ හෝ පව් පක්ෂයෙහිවූ හෝ ඉන් උපදනා ආත්මභාවය උපදවයි. මහණෙනි, ආශ්‍රවයන්ගේ විපාකය මේයයි කියනු ලැබේ.

27 "මහණෙනි, ආශ්‍රවයන් නැති කිරීම කවරේද? මහණෙනි, අවිද්‍යාව නැති කිරීම ආශ්‍රවයන් නැතිකිරීමයි. මෙයම ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. ආශ්‍රවයන් නැති කරන පිළිවෙතයි. ඒ කෙසේද යත්? (මෙහි 11 (ii) ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, යම් (බඳු) මෙයින් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙමේ මෙසේ ආශ්‍රවයන් දනී, මෙසේ ආශ්‍රවයන්ගේ නිදානය ඇතිවීම දනී, මෙසේ ආශ්‍රවයන්ගේ වෙනස දනී, මෙසේ ආශ්‍රවයන්ගේ විපාකය දනී, මෙසේ ආශ්‍රවයන්ගේ නැතිකිරීම දනී, මෙසේ ආශ්‍රවයන් නැති

කරන පිළිවෙත දනී, හෙතෙම මේ ආශ්‍රවයන්ගේ නැතිකිරීමවූ තියුණු අවබොධයවූ බඹසර දනී.

28 (මේ ඡෙදය 25 (i) මෙනි.)

29 "මහණෙනි, කර්මය දතයුතුය, කර්මය ඇතිවීමේ හේතුව දතයුතුය, කර්මයන්ගේ විපාකය දතයුතුය, කර්මයන් නැති කිරීම දතයුතුය, කර්මය නැති කරන පිළිවෙත දතයුතුයයි (ii) මෙය කියන ලදද, මෙය කුමක් සඳහා කියන ලදද?

30 "මහණෙනි, සිතීම කර්මය යයි මම කියමි. සිතා කයින් හෝ වචනයෙන් හෝ සිතින් හෝ කර්මය කරයි. මහණෙනි, කර්මයන්ගේ නිදානය ඇතිවීම කෙසේද? මහණෙනි, ස්පර්ශය කර්මයන්ගේ නිදානය ඇතිවීමයි, මහණෙනි, කර්මයන්ගේ වෙනස කෙසේද? මහණෙනි නිරයෙහි විඳියයුතු කර්මයක් ඇත, තිරිසන් ජාතියෙහි විඳියයුතු කර්මයක් ඇත, ප්‍රෙත ලෝකයේ විඳියයුතු කර්මයක් ඇත, මිනිස් ලොව විඳිය යුතු කර්මයක් ඇත. දෙව්ලොව විඳියයුතු කර්මයක් ඇත. මහණෙනි, මේ වනාහි කර්මයන්ගේ වෙනස යයි කියනු ලැබේ. මහණෙනි, කර්මයන්ගේ විපාකය කවරේද? මහණෙනි, කර්මයන්ගේ විපාකය ත්‍රිවිධයයි කියමි. මේ ලොකයෙහි හෝ ඊළඟ ආත්මයෙහි හෝ භවයෙන් භවයෙහි හෝ (කියා) ය. මහණෙනි, මේ වනාහි කර්මයන්ගේ විපාකයයි කියනු ලැබේ.

31 "මහණෙනි, කර්මයන් නැති කිරීම කෙසේද? මහණෙනි, ස්පර්ශයන්ගේ නැතිකිරීම කර්මයන්ගේ නැතිකිරීමයි, මෙයම ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයයි, කර්මය නැති කරන පිළිවෙතයි. ඒ කෙසේද යත්? (මෙහි 11 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, යම් (බඳු) මෙයින් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ මෙසේ කර්මය දනීද, මෙසේ කර්මයන්ගේ නිදානය ඇතිවීම දනීද, මෙසේ කර්මයන්ගේ වෙනස දනීද, කර්මයන්ගේ විපාකය, කර්මයන්ගේ නැතිකිරීම, කර්මයන් නැති කරන පිළිවෙත දනීද හෙතෙමේ කර්මයන් නැතිකිරීමවූ, තියුණු අවබොධ ඇති, මෙ බඹසර දනී.

32 (මෙහි 29 (i) යෙදිය යුතුයි.) එය මෙය සඳහා කියන ලදී.

33 (i) "මහණෙනි, දුක දත යුතුය, දුකෙහි නිදානය ඇතිවීම දත යුතුය. දුකෙහි වෙනස දත යුතුය, දුකෙහි විපාකය දත යුතුය, දුකෙහි නැති කිරීම දත යුතුය, දුක නැති කරන පිළිවෙත දතයුතුයයි, (ii) මෙය කියන ලදද, මෙය කුමක් සඳහා කියන ලදද?

34 "ඉපදීමද දුක්ය. දිරාපත්වීමද දුක්ය. ලෙඩද දුක්ය. මරණයද දුක්ය. ශොකය, වැලපීම්, දුක, දොම්නස, සිත් තැවුලද දුක්ය. කැමති යමක් නොලැබේද, එයද දුක්ය. කෙටි වශයෙන් දැඩිගැනීම් ඇති ශරීරයේ පස්කොටස දුක්ය. මහණෙනි, දුකෙහි නිදානය ඇතිවීම කෙසේද? මහණෙනි, තෘෂ්ණාව දුකෙහි නිදානය ඇතිවීමයි. මහණෙනි, දුකෙහි වෙනස කවරේද? මහණෙනි, ඉතා අධිකවූත් දුකක් ඇත, කුඩාවූත් දුකක් ඇත. සෙමෙන් විරාගයට පත්වන්නාවූ දුකක් ඇත, වහා විරාගයට පත්වන්නාවූ දුකක් ඇත. මහණෙනි, මෙය වනාහි දුකෙහි වෙනසයයි කියනු ලැබේ.

35 "මහණෙනි, දුකෙහි විපාකය කවරේද? මහණෙනි, මේ ලොකයෙහි වනාහි ඇතැමෙක් යම් දුකෙකින් මැඩුණේ බැසගත් සිත් ඇත්තේ දුක්වේ. ක්ලාන්තවේ, වැලපේ, ලෙහි අත් ගසා හඬයි, මූර්ඡාවට පත්වේ. යම් මේ දුකෙකින් මැඩුණේ, බැසගත් සිත් ඇත්තේ, පිටත සෝදිසියට පැමිණේ. කවරෙක් තෙම මේ දුකේ නැති කිරීමට එක විදියක් හෝ දෙවිදියක් දනීද (කියා) ය. මහණෙනි, මම මූර්ඡාවෙන්වූ විපාකය හෝ සෝදිසියටවූ විපාකය හෝ දුකයයි කියමි. මහණෙනි, දුකෙහි විපාකය මේයයි කියනු ලැබේ.

36 "මහණෙනි, දුක නැතිකිරීම කෙසේද? මහණෙනි තෘෂ්ණාව නැති කිරීම දුක නැති කිරීමයි. මෙයම ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයයි' දුක් නැති කිරීමේ පිළිවෙතයි. ඒ කෙසේද යත්? (මෙහි 11 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, යම් බඳු මෙයින් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙමේ මෙසේ දුක දනීද, මෙසේ දුකෙහි නිදාන ඇතිවීම, දුකෙහි වෙනස, දුකෙහි විපාකය, දුක නැතිකිරීම දුක නැති කරන පිළිවෙත දත යුතුයයි යම් මේ කාරණයක් කියන

ලදද මෙය සඳහා කියන ලදී. මහණෙනි, ඒ මේ වනාහි තියුණු අවබොධ ඇතිකර ගැනීමේ ධර්ම ක්‍රමයයි."

**10. ඡතථාගත බාල (සිහනාද) සූත්‍රයː-** 1. "මහණෙනි, යම් බලයකින් යුක්තවූ තථාගතතෙම උසස් ස්ථානය එසේ යයි පිළිගනීද, පිරිසෙහි ශ්‍රෙෂ්ඨ නාදය කෙරේද, බඹසර ප්‍රකාශ කෙරේද, එබඳුවූ තථාගත බලයෝ සයක් වෙති.

2. "ඒ සය කවරේද? මහණෙනි, මෙහි තථාගතතෙම හේතුව හේතුව වශයෙන්ද හේතු නොවන දෙය හේතු නොවන දෙය වශයෙන්ද තත්වූ පරිදි දනියි. මහණෙනි, යමක් තථාගතතෙම හේතුව හේතුව වශයෙන්ද හේතු නොවන දෙය හේතු නොවන දෙය වශයෙන්ද තත්වූ පරිදි දැනගනියි. (ii) යම් බලයකට පැමිණ තථාගතතෙම උසස් ස්ථානය එසේ යයි පිළිගනීද, පිරිසෙහි ශ්‍රෙෂ්ඨ නාදය කෙරේද බඹසර ප්‍රකාශ කෙරේද, මහණෙනි මෙයද තථාගතයන් වහන්සේගේ තථාගත බලයක් වෙයි.

3. "මහණෙනි, නැවතද තථාගතතෙම පසුවූ මත්තෙහි වූ පවත්නා කාලයෙහිවූ කර්මයන් රැස් කිරීම හේතු වශයෙන් විපාක වශයෙන් තත්වූ පරිදි දනියි. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

4. "මහණෙනි, නැවතද තථාගතතෙම ධ්‍යානය, කෙලෙසුන්ගෙන් සිත මිදීම සමාපත්ති, යන මොවුන්ගේ කිලුටු බව, පිරිසිදු බව, නැගිටීම, තත්වූ පරිදි දනීද, මහණෙනි, තථාගතතෙම ධ්‍යානය, කෙළෙසුන්ගෙන් සිත මිදීම, සමාපත්ති, යන මොවුන්ගේ යම් ඒ කිලුටු බව, පිරිසිදු බව, නැගිටීම තත්වූ පරිදි දනීද, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

5. "මහණෙනි, නැවතද තථාගතතෙම නොයෙක් ආකාර පෙර භවයන් සිහි කෙරේද, කෙසේද, (මෙහි සංයුත්ත නිකායේ මහා වර්ගයේ 7 සංයුත්තයේ 1 සූත්‍රයේ 10 ඡේදය 'ජාති එකක්ද' යන තැන සිට යෙදිය යුතුයි.) (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

6. "මහණෙනි, නැවතද තථාගතතෙම (ii) මිනිස් බව ඉක්මවූ පිරිසිදුවූ දිවැසින් චුතවන්නාවූද උපදින්නාවූද හීනවූද ප්‍රණීතවූද මනා පැහැ ඇත්තාවූද දුර්වර්ණවූද සැපයට පැමිණියා වූද දුකට

පැමිණියා වූද සත්වයන් දකියි. කර්මානුකූලව උපන්සත්වයන් දනියි. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

7. "මහණෙනි, නැවතද තථාගතතෙම (ii) ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත්ඵල සමාධියත් අර්හත් ඵල ප්‍රඥාවත් මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ (iii) වාසය කරයි. මහණෙනි, තථාගතතෙම (මෙහි 8 (ii) යෙදිය යුතුයි.) වාසය කෙරේද, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

8. "මහණෙනි, යම් බලවලින් යුක්තවූ තථාගතතෙම උසස් ස්ථානය එසේයයි පිළිගනීද, පිරිසෙහි ශ්‍රේෂ්ඨ නාදය කෙරේද බඹසක ප්‍රකාශ කෙරේද මේ සය තථාගතයන් වහන්සේගේ තථාගත බලයෝ වෙති.

9. "මහණෙනි, එයින් මත්තෙහි තථාතයන් වහන්සේ වෙත හේතුව හේතුව වශයෙන්ද හේතුව නොවන දෙය හේතු නොවන දෙය වශයෙන්ද තත්වූ පරිදි ඥානයෙන් එළඹ ප්‍රශ්න විචාරත්. මහණෙනි, යම් යම් පරිදි තථාගතයන් වහන්සේගේ හේතුව හේතුව වශයෙන්ද හේතුව නොවන දෙය හේතුව නොවන දෙය වශයෙන්ද තත්වූ පරිදි දැන ඥානය දන්නා ලදද ඒ පරිදි තථාගතතෙම හේතුව හේතුව වශයෙන්ද හේතු නොවන දෙය හේතු නොවන දෙය වශයෙන්ද දැන ප්‍රශ්න විචාරණ ලද්දේ ප්‍රකාශ කරයි.

10. "මහණෙනි, එයින් මත්තෙහි පසුගිය මත්තෙහිවූ පවත්නා කාලයෙහිවූ කර්මයන් රැස් කිරීම ස්ථාන වශයෙන් හේතු වශයෙන් විපාක වශයෙන් තත්වූ පරිදි ඥානයෙන් තථාගතයන් වහන්සේ වෙත එළඹ ප්‍රශ්න විචාරත්. මහණෙනි, යම් යම් පරිදි පසුගිය, මත්තෙහිවූ, පවත්නා කාලයෙහිවූ කර්මයන් රැස් කිරීම තථාගතයන් වහන්සේ විසින් ස්ථාන වශයෙන් හේතු වශයෙන් විපාක වශයෙන් තත්වූ පරිදි ඥානයෙන් දන්නා ලදද ඒ ඒ පරිදි ඔවුනට තථාගත තෙම පසුගිය මත්තෙහි පවත්නා කාලයෙහි කර්මයන් රැස් කිරීම ස්ථාන වශයෙන් හේතු වශයෙන් විපාක වශයෙන් තත්වූ පරිදි ප්‍රශ්න විචාරණ ලද්දේ ප්‍රකාශ කරයි.

11 "මහණෙනි, එයින් මත්තෙහි ධ්‍යාන, මිදීම, සමාධිය සමාපත්තීන් පිළිබඳ කිළුටු බව, පිරිසිදු බව, නැගිටීම, තත්වූ පරිදි නුවණින් තථාගතයන් වහන්සේ වෙත පැමිණ ප්‍රශ්න විචාරත් යම් යම් පරිදි තථාගතයන් වහන්සේ විසින් ධ්‍යාන මිදීම, සමාධි, සමාපත්තීන් පිළිබඳව දන්නා ලදද ඒ ඒ පරිදි ඔවුන්ට තථාගතතෙම ධ්‍යාන, මිදීම, සමාධි, සමාපත්තීන් පිළිබඳ කිළුටු බව, පිරිසිදු බව, නැගිටීම තත්වූ පරිදි ඥානයෙන් ප්‍රශ්න විචාරණ ලද්දේ ප්‍රකාශ කරයි.

12. "මහණෙනි, එයින් මත්තෙහි තථාගතයන් වහන්සේ වෙත පැමිණ පෙර විසූ භවයන් සිහිකිරීමේ තත්වූ පරිදි ඥානයෙන් ප්‍රශ්න විචාරත්. මහණෙනි, යම් යම් පරිදි තථාගතයන් වහන්සේ විසින් පෙර විසූ භවයන් පිළිබඳ තත්වූ පරිදි ඥානය දන්නා ලදද ඒ ඒ පරිද්දෙන් ඔවුන්ට තථාගත තෙම පෙර විසූ භවයන් සිහිකිරීමේ තත්වූ පරිදි ඥානයෙන් ප්‍රශ්න විචාරණ ලද්දේ ප්‍රකාශ කරයි.

13. "මහණෙනි, ඉන් මත්තෙහි තථාගතයන් වහන්සේ වෙත පැමිණ සත්වයන්ගේ චුතිය හා උත්පත්තිය පිළිබඳ ඥානයෙන් ප්‍රශ්න විචාරයි. මහණෙනි, යම් යම් පරිදි තථාගතයන් වහන්සේ විසින් සත්වයන්ගේ චුතිය හා උත්පත්තිය පිළිබඳ තත්වූ පරිදි ඥානයෙන් දන්නා ලදද ඒ ඒ පරිද්දෙන් ඔවුන්ට තථාගතතෙම සත්වයන්ගේ චුතිය හා උත්පත්තිය පිළිබඳ තත්වූ පරිදි ඥානයෙන් ප්‍රශ්න විචාරණ ලද්දේ ප්‍රකාශ කරයි.

14. "මහණෙනි, එයින් මත්තෙහි තථාගතයන් වහන්සේ වෙත පැමිණ ආශ්‍රවයන් ක්ෂය කිරීම පිළිබඳ තත්වූ පරිදි ඥානයෙන් ප්‍රශ්න විචාරත්. මහණෙනි, යම් යම් පරිදි තථාගතයන් වහන්සේ විසින් ආශ්‍රවයන් ක්ෂය කිරීම පිළිබඳ තත්වූපරිදි ඥානයෙන් දන්නාලදද ඒ ඒ පරිදි ඔවුන්ට තථාගත තෙම ආශ්‍රවයන් ක්ෂය කිරීමස පිළිබඳ තත්වූ පරිදි ඥානයෙන් ප්‍රශ්න විචාරණ ලද්දේ ප්‍රකාශ කරයි. "මහණෙනි, යම් ඒ හේතුව හේතුව වශයෙන්ද හේතු නොවන දෙය හේතු නොවන දෙය වශයෙන්ද තත්වූ පරිදි දැනීමේ යම් ඥානයක් ඇද්ද, එයද සන්සිඳුන සිතැත්තහුටම කියමි. නොසන්සිඳුන සිතැත්තහුට නොවේ.

15. "යම් ඒ පසුගිය, මත්තෙහිවූ, පවත්නා කල, කර්ම රැස් කිරීම ස්ථාන වශයෙන් හේතු වශයෙන් විපාක වශයෙන් තත්වූ පරිදි දන්නා ඥානයක් ඇද්ද එයද සන්සිඳුන සිතැත්තහුටම කියමි. නොසන්සිඳුන සිතැත්තහුට නොවේ. යම් ඒ ධ්‍යාන මිදීම, සමාධි, සමාපත්තීන්ගේ කිළුටුබව, පිරිසිදු බව, නැගිටීම, තත්වූ පරිදි දැනීමේ ඥානයක් ඇද්ද එයද සන්සිඳුන සිතැත්තහුටම කියමි. නොසන්සිඳුන සිතැත්තහුට නොවේ. යම් ඒ පෙර විසූ භවයන් පිළිබඳ තත්වූ පරිදි දැනීමේ ඥානයක් ඇද්ද එයද සන්සුන් සිතැත්තහුටම කියමි. නොසන්සිඳුන සිතැත්තහුට නොවේ. යම් ඒ සත්වයන්ගේ චුතවීම හා උත්පත්තිය පිළිබඳ ඥානයක් ඇද්ද, එයද සන්හුන් සිතැත්තහුටම කියමි. නොසන්සිඳුන සිතැත්තහුට නොවේ. යම් ඒ ආශ්‍රවයන් ක්ෂය කිරීම පිළිබඳ තත්වූ පරිදි ඥානයක් ඇද්ද එයද සන්හුන් සිතැත්තහුටම කියමි. නොසන්සිඳුන සිතැත්තහුට නොවේ. මහණෙනි, සමාධි මාර්ගය හා සමාධිය පිළිබඳ වැරදි මාර්ගයද මෙසේය."

---

## 7. දෙවතා වර්ගය

11. **අනාගාමිඵල සච්ඡිකිරියා සූත්‍රයඃ-** 1. "මහණෙනි, කරුණු සයක් දුරු නොකර අනාගාමි ඵලයට පැමිණීමට සුදුසු නොවේ. කිනම් සයක්ද යත්? අශ්‍රද්ධාව, පාපයෙහි ලජ්ජා නැති බව, පාපයෙහි බිය නැති බව, කුසීතකම, සිහිමුළාව, නුවණ නැතිබව, යන සයයි. මහණෙනි, මේ කරුණු සය දුරු නොකර අනාගාමී ඵලය ලබාගැනීමට නොහැකිය.

2. "මහණෙනි, කරුණු සයක් දුරුකර අනාගාමී ඵලයට පැමිණීමට සුදුසුවේ. (ii) කිනම් සයක්ද යත්? ශ්‍රද්ධාව, පාපයෙහි ලජ්ජා ඇතිබව, පාපයෙහි බිය ඇති බව, කුසීත නැතිබව, සිහිනුමුළාව, නුවණ ඇතිබව, යන සයයි. (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

12. **අරහත්ත සච්ඡිකිරියා සූත්‍රයඃ-** 1. "මහණෙනි, කරුණු සයක් දුරු නොකර රහත්වීමට නුසුදුසුය.

2. (i) කිනම් සයක්ද යත්? සිතේ අලසකම, කයේ අලසකම, සිතේ විසුරුණු බව, පසුතැවිල්ල, අශ්‍රද්ධාව, ප්‍රමාදය, යන සයයි. (ii) (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, කරුණු සයක් දුරුකොට රහත්වීමට සුදුසු වේ.

4. (මෙය මෙහි 2 (i) ද, 3 ඡේදයද යෙදිය යුතුයි.)

13. **භික්ඛුපාපමිත්ත සූත්‍රයඃ-** 1. "මහණෙනි, ඒකාන්තයෙන් පවිටුමිත්‍රයන් ඇති, පවිටන් සහායකොට ඇති, පවිටන්ට නැමෙන, පවිටු මිත්‍රයන් ආශ්‍රය කරන සේවනය කරණ ඒ මහණ තෙම ඔවුන්ගේ අදහස්වලට අනුව හැසිරෙන්නේ හැසිරීම පිළිබඳ සිරිත් විරිත් ආරක්ෂා කරයි යන, මෙය සිදු නොවේ. හැසිරීම පිණිසවූ සිරිත් විරිත් නොරැක (අටමාර්ග ඵල සතෙහි) ශෛක්ෂධර්ම පුරයි යන මෙය විද්‍යමාන නොවේ. ශෛක්ෂ ධර්ම නොපුරා සිල් පුරන්නේය යන මෙය විද්‍යමාන නොවේ. සිල් නොපුරා කාමාශාව හෝ රූපාශාව හෝ අරූප ආශාව හෝ දුරුකරන්නේය යනමේ කරුණු විද්‍යමාන නොවේ.

2. "මහණෙනි, ඒකාන්තයෙන් යහපත් මිත්‍රයන් ඇති, යහපත් මිත්‍රයන් සහායකොට ඇති, යහපත් මිත්‍රයන්ට නැමෙන, යහපත් අය හා ආශ්‍රයකරණ සේවනය කරණ ඒ මහණතෙම ඔවුන්ගේ අදහස්වලට අනුව හැසිරෙන්නේ හැසිරීම් පිළිබඳ සිරිත් විරිත් පුරවන්නේය යන මේ කාරණය විද්‍යමානවේ හැසිරීම් පිළිබඳ සිරිත් විරිත් පුරා ශෛක්ෂධර්ම පුරන්නේය යන මේ කාරණය විද්‍යමානවේ. ශෛක්ෂධර්ම පුරා සිල් පුරන්නේය යන මේ කාරණය විද්‍යමාන වේ. සිල් පුරා කාමාශාව, රූපාශාව, අරූපාශාව දුරු කරන්නේය යන මේ කාරණය විද්‍යමානවේ.

14. **සංසණිකාරාම සූත්‍රයඃ-** 1. "මහණෙනි, ඒකාන්තයෙන් ඒ මහණතෙම සමාගමෙහි ඇලුනේ, සමාගමෙහි නිරතවූයේ, සමාගමට එක්වීමෙහි යෙදුනේ, පිරිසෙහි ඇලුනේ, පිරිස සමග නිරතවූයේ, පිරිස සමග එක්වීමෙහි යෙදුනේ, තනිව විවේකයෙහි ඇලෙන්නේයයි, මේ කාරණය විද්‍යමානවේ තනිව විවේකයෙහි නොඇලෙන්නේ සිතට අරමුණ ගන්නේය යන මේ කාරණය

විද්‍යමාන නොවේ. සිතට අරමුණ නොගන්නේ සම්‍යක් දෘෂ්ටිය පුරන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ. සම්‍යක් දෘෂ්ටිය නොපුරා සම්‍යක් සමාධිය පුරන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ. සම්‍යක් සමාධිය නොපුරා සංයෝජන (බැමි) දුරුකරන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ. සංයෝජනයන් දුරු නොකොට නිර්වාණය ප්‍රත්‍යක්ෂ කරන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ.

2 "මහණෙනි, ඒකාන්තයෙන් ඒ මහණතෙම සමාගමෙහි නොඇලුනේ, සමාගමෙහි නිරත නොවූයේ, සමාගමට එක්වීමෙහි නොයෙදුනේ, පිරිසෙහි නොඇලුනේ, පිරිස සමග නිරත නොවූයේ, පිරිස සමග එක්වීමෙහි නොයෙදුනේ, තනිව විවේකයෙහි ඇලෙන්නේය යන මේ කරුණ විද්‍යමාන නොවේ. තනිව විවේකයෙහි ඇලෙන්නේ සිතට නිමිත්ත ගන්නේය යන මේ කරුණ විද්‍යමාන නොවේ. සිතට නිමිත්ත නොගන්නේ සම්‍යක් දෘෂ්ටිය පුරන්නේය යන මේ කරුණ විද්‍යමාන නොවේ. සම්‍යක් දෘෂ්ටිය නොපුරා සම්‍යක් සමාධිය පුරන්නේය යන මේ කරුණ විද්‍යමාන නොවේ. සම්‍යක් සමාධිය නොපුරා සංයෝජනයන් දුරු කරන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ. සංයෝජනයන් දුරු නොකර නිර්වාණය ප්‍රත්‍යක්ෂ කරන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ.

3 "මහණෙනි, ඒකාන්තයෙන් ඒ මහණතෙම (මෙහි 2 ඡේදය 'නොඇලුණු' 'නිරතනොවූ' 'නොයෙදුනු' වෙනුවට 'ඇලුනු' 'නිරතවූ' 'යෙදුනු' කියාද, 'විද්‍යමාන නොවේ' යන්නට 'විද්‍යමාන වේ' කියාද වෙනස්කර යොදාගත යුතුයි.)

**15. දෙවතා පරිහානිය සූත්‍රය:-** 1. ඉක්බිති එක්තරා දිව්‍යපුත්‍රයෙක් මධ්‍යම රාත්‍රිය ඉක්මවූ කල්හි යහපත් වර්ණයෙන් යුක්තව මුළු ජේතවනාරාමය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය.

2. එකත්පසෙක සිටි ඒ දෙවතාවා භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, කරුණු සයක් මහණහුගේ නොපිරිහීම පිණිස

පවතිත්යයි කීයේය. ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරවය, ධර්මයට ගෞරවය, සංඝයාට ගෞරවය, ශික්ෂාවට ගෞරවය, සුවච බව, යහපත් මිත්‍රයන් ඇතිබව යන සයයි. ස්වාමීනි, මේ කරුණු සය මහණහට නොපිරිහීම පිණිස පවතිත්.” ඒ දේවතාවා මෙසේ කීය. ශාස්තෲන් වහන්සේ පිළිගත් සේක. ඉක්බිති ඒ දේවතාවා ශාස්තෲන් වහන්සේ මාගේ වචන පිළිගත් සේකැයි ශාස්තෲන් වහන්සේ වැඳ පැදකුණු කොට එහිම අතුරුදහන් විය.

3 ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ ඒ රාත්‍රියගේ ඇවෑමෙන් භික්ෂූන්ට කථාකළ සේක. මහණෙනි, මේ රාත්‍රියෙහි එක්තරා දේවතාවෙක් මධ්‍යම රාත්‍රිය ඉක්මවූ කල්හි යහපත් වර්ණයෙන් යුක්තව මුළු ජේතවනාරාමය ආලෝක කොට මා යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ මා වැඳ එකත්පසෙක සිටියේය. (මෙහි 2 වෙනි ඡේදය ශාස්තෲන් වහන්සේ වෙනුවට මා කියා වෙනස්කර යොදාගත යුතුයි.)

4. මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් ලුහුඬින් වදාරණ ලද මෙහි මෙසේ විස්තර වශයෙන් අර්ථය දනිමි.

5. “ස්වාමීනි, මේ ශාසනයෙහි මහණතෙම තමන්ද ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගරුකරන්නේවේද, ශාස්තෲන් වහන්සේට ගරු කිරීමෙහි ගුණ කියන්නේ වේද යම් අන් භික්ෂු කෙනෙක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව නැත්තේ වේද, ඔවුන්ද ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගරු කිරීමට යොදවයිද, අන් යම්කිසි භික්ෂුවක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගරු කරන්නේද ඔවුන්ගේද ඇත්තාවූ, සත්‍යවූ ගුණය සුදුසු කාලයෙහි කියයිද

6. “ස්වාමීනි, මේ ශාසනයෙහි මහණ තෙම (මෙහි 5 වෙනි ඡේදය ‘ශාස්තෲන් වහන්සේ’ යන්නට ‘ධර්මය’ කියා වෙනස්කර යොදාගත යුතුයි)

7. "ස්වාමීනි, මේ ශාසනයෙහි මහණතෙම (මෙහි 5 වෙනි ඡේදය 'ශාස්තෘන් වහන්සේ' වෙනුවට 'සංඝයා' කියා වෙනස්කර යොදාගත යුතුයි)

8. "ස්වාමීනි, මේ ශාසනයෙහි මහණතෙම (මෙහි 5 වෙනි ඡේදය 'ශාස්තෘන්වහන්සේ' වෙනුවට 'ශික්ෂාවෙහි' කියා වෙනස්කර ගතයුතුයි.)

9. "ස්වාමීනි, මේ ශාසනයෙහි මහණ තෙම (මෙහි 5 වෙනි ඡේදය 'ශාස්තෘන් වහන්සේ' වෙනුවට 'කීකරු වේද' කියා යොදාගත යුතුයි.)

10. "ස්වාමීනි, මේ ශාසනයෙහි මහණතෙම (මෙහි 5 වෙනි ඡේදයේ 'ශාස්තෘන් වහන්සේ' වෙනුවට 'යහපත් මිත්‍රයන් ඇත්තේ වේද' කියා වෙනස් කර යොදාගත යුතුයි.)

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් ලුහුඬින් වදාරණ ලද මෙහි මෙසේ විස්තර වශයෙන් අර්ථය දනිමි."

11. "ශාරීපුත්‍රය, යහපත යහපත, ශාරීපුත්‍රය, ඔබ මා විසින් ලුහුඬින් වදාරණ ලද මෙය මෙසේ විස්තර වශයෙන් අර්ථය දන්නෙහිය.

"ශාරීපුත්‍රය, මේ ශාසනයෙහි මහණතෙම තමන්ද ශාස්තෘන් වහන්සේ විෂයෙහි ගරුකරන්නේ වේද, (මෙහි 5 වෙනි ඡේදය යෙදිය යුතුයි.)

12-16 (මෙහි 11 ඡේදය හා 5 වෙනි ඡේදය ශාස්තෘන් වහන්සේ වෙනුවට ධර්මය, සංඝයා, ශික්ෂාව, කීකරුවේද, යහපත් මිත්‍රයන් ඇත්තේවේද කියා යොදා ඡේද යොදාගත යුතුයි.)

16. **සන්තසමාධි සූත්‍රයː-** 1. "මහණෙනි, ඒකාන්තයෙන් ඒ භික්ෂුව ශාන්තවූ සමාධිය නැතිව, ප්‍රණීත සමාධිය නැතිව, සංසිඳීම නැතිව, සිතේ එකඟකම නැතිව, එකෙකු බොහෝ දෙනෙකු වන්නාහ. බොහෝ දෙනෙකු එකෙක් වන්නේය. (දීඝනිකායේ 3 සූත්‍රයේ 70 ඡේදයේ ඉදිරිපත් කොට යන වචනයේ සිට යොදාගත යුතුයි)

"බ්‍රහ්ම ලෝකයතෙක් වසඟකොට පවත්නේයයි යන කාරණය සිදුනොවේ.

2. "පිරිසිදුවූ මිනිස් ගතිය ඉක්මවූ දිව කණින් දුරද, ලඟද යන ශබ්ද දෙක අසන්නේය යන කාරණය සිදුනොවේ.

3. "රාග සහිත සිත රාග සහිත සිතයයි දන්නේය. (දීඝනිකායේ 2 සූත්‍රයේ 72 ඡේදයේ රාග සහිත සිතයයි දැන ගන්නෙමි යන්න දැනගන්නේයයි කියා වෙනස්කොට යොදා ගත යුතුයි)

"නොමිදුන සිත නොමිදුන සිතයයි දන්නේය යන අන්‍ය සත්වයන්ගේ අන්‍ය පුද්ගලයන්ගේ සිතින් සිත වෙන්කොට දැනගන්නේය යන කාරණය සිදු නොවේ.

4. "නොයෙක් පෙර විසූ භවයන් සිහිකරන්නේය. කෙසේද එක ජාතියක් ජාති දෙකක් (දීඝ නිකායේ 2 සූත්‍රයේ 74 ඡේදයේ එක් ජාතියක්ද යන තැන් සිට යොදාගත යුතුයි.)

"ආකාර සහිත පෙර වූ කිරීම් සහිත නොයෙක් පෙර විසූ භවයන් සිහිකරන්නේය. යන කාරණය සිදුනොවේ.

5 "මිනිස්ගතිය ඉක්මවූ දිවැසින් සත්වයන් බලත් (1 දීඝ නිකායේ 2 සූත්‍රයේ 75 ඡේදයේ 'හේ නොයෙක් පෙර විසීම් යන තැන් සිට යොදාගත යුතුයි) කර්මය පරිදි පැමිණෙන සත්වයන් දැනගන්නේය යන කාරණය සිදුනොවේ.)

6 "ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීමෙන් ආශ්‍රවයන් නැති (අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ 2 පණ්ණාසකයේ පඤ්චංගික සමාධි සූත්‍රයේ අගකොටස යෙදිය යුතුයි.) ප්‍රත්‍යක්ෂකොට එයට පැමිණ වාසය කරන්නේය යන කාරණය සිදුනොවේ.

7. 'මහණෙනි, ඒ භික්ෂුව ශාන්තවූ සමාධියෙන් ප්‍රණීත සමාධියෙන් සංසිඳීමෙන් සිතේ එකඟකමින්, නොයෙක් ඉර්ධි විධිය විඳියි. (මේ සූත්‍රයේ 1 ඡේදයේ 'බොහෝදෙනෙක්' යන තැන සිට 'පවත්නේ' යන තැන දක්වා යෙදිය යුතුයි)

බ්‍රහ්මලෝකයතෙක් කයින් වසඟකොට පවත්නේය යන කාරණය සිදුවෙයි.

8. "මිනිස් ගතිය ඉක්මෙව්වාවූ පිරිසිදුවූ දිව කණින් දිව්‍යවූද, මනුෂ්‍යවූද, දුරවූද, ලංවූද ශබ්දදෙක අසන්නේය යන කාරණය සිදුවෙයි.

9. "රාග සහිත සිත රාග සහිත සිතය (මෙහි 16 සූත්‍රයේ 3 ඡෙදය යෙදිය යුතුයි) නොමිදුන සිත නොමිදුන සිතයයි දන්නේය අන්‍ය සත්වයන්ගේ අන්‍ය පුද්ගලයන්ගේ සිතින් සිත වෙන්කොට දැනගන්නේය යන කාරණය විද්‍යමාන වෙයි. නොයෙක් පෙර විසූ භවයන් සිහිකරන්නේය. කෙසේද? එක ජාතියක් ජාති දෙකක් (මේ සූත්‍රයේ 4 ඡෙදය යෙදිය යුතුයි) ආකාර සහිත පෙරටුවූ නොයෙක් පෙර විසූ භවයන් සිහි කරන්නේය යන කාරණය සිදුවේ.

10. "මිනිස් ගතිය ඉක්මවූ පිරිසිදු දිවැසින් සත්වයන් දකින්නේය. චුතවෙන්නාවූද, උපදින්නාවූද, හීනවූද ප්‍රණීත වූද, සුවර්ණවූද, දුර්වර්ණවූද, යහපත් ගති ඇත්තාවූද, නපුරු ගති ඇත්තාවූද කර්මය පරිද්දෙන් පැමිණෙන්නාවූද සත්වයන් දන්නේය යන කාරණය සිදුවේ.

11. "ආශ්‍රවයන් ක්ෂයකිරීමෙන් ආශ්‍රව නැති සිතේ මිදීම (මේ සූත්‍රයේ 6 ඡෙදය යෙදිය යුතුයි.) ප්‍රත්‍යක්ෂකොට එයට පැමිණ වාසය කරන්නේය යන කාරණය සිදුවෙයි.

17. **භබ්බතාපත්ති සූත්‍රය**:- 1. "මහණෙනි, කරුණු සයකින් යුක්ත භික්ෂුව නුසුදුසුවූයේ ඒ ඒ තැන ඒ ඒ ආයතනයන්හි නුසුදුසු බවට පැමිණීමට හැකිය.

2. "කවර සයකින්ද යත්? මේ ශාසනයෙහි භික්ෂුව මේ පිරිහීම භජනය කරණ ධර්මයෝයයි තත්වූ පරිදි නොදනීද, මේ සම තත්වයක් ඇතිකරවන ධර්මයෝයයි තත්වූපරිදි නොදනීද, මේ දියුණුව ඇතිකරණ ධර්මයෝයයි තත්වූපරිදි නොදනීද, මේ උසස් අවබොධයක් ඇතිකරවන ධර්මයෝයයි තත්වූ පරිදි නොදනීද, සකස් නොවූ කටයුතු ඇත්තේවේද අහිතවත් දෙය කරන්නේවේද, (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, කරුණු සයකින් යුක්ත භික්ෂුව සුදුසු වූයේ ඒ ඒ තැන ඒ ඒ ආයතනයන්හි සුදුසු බවට පැමිණිය හැකිය.

4. "කවර සයකින්ද? මේ ශාසනයෙහි භික්ෂුව මේ පිරිහීම භජනය කරණ ධර්මයෝයයි තත්වූ පරිදි දනීද, මේ සමතත්වයක් ඇතිකරවන ධර්මයෝයයි තත්වූ පරිද්දෙන් දනීද, මේ උසස් තත්වයක් ඇතිකරවන ධර්මයෝයයි තත්වූ පරිදි දනීද, මේ උසස් අවබෝධයක් ඇතිකරවන ධර්මයෝ යයි තත්වූ පරිදි දනීද, සකස්ව කරණ කටයුතු ඇත්තේද හිතවත් දෙය කරන්නේ වේද, (මෙහි 3 ඡේදය යෙදියයුතුයි.)

18. **සමාධිබලතා සූත්‍රය**:- 1. "මහණෙනි, කරුණු සයකින් යුක්ත භික්ෂුව සමාධියෙහි බලවත් බවට පැමිණීමට නුසුදුසුය.

2. "කවර සයකින්ද, මේ ශාසනයෙහි භික්ෂුව සමාධියට සමවැදීමේ දක්ෂ නොවේද, සමාධිය සමතත්වයක තබාගැණීමේ දක්ෂ නොවේද, සමාධියෙන් නැගිටීමේ දක්ෂනොවේද, සකස්ව කටයුතු නොකරන්නේවේද, මිහිරිදෙය නොකරන්නේවේද, හිතවත් දෙය නොකරන්නේ වේද, (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි)

3. "මහණෙනි, මේ ධර්ම සයෙන් යුක්ත භික්ෂුව සමාධියෙහි බලයට පැමිණීමට සුදුසුය.

4. "කවර සයකින්ද? මේ ශාසනයෙහි භික්ෂුව සමාධියට සමවැදීමේ දක්ෂවේද, සමාධිය සමතත්වයක තබාගැණීමේ දක්ෂ වේද, සමාධියෙන් නැගිටීමේ දක්ෂවේද, සකස්ව කටයුතු කරන්නේවේද, මිහිරිදෙය කරන්නේ වේද, හිතවත් දෙය කරන්නේවේද, (මෙහි 3 ඡේදය යෙදිය යුතුයි.)

19. **ඣානාභබ්බ සූත්‍රය**:- 1. "මහණෙනි, කරුණු සයක් දුරුනොකොට පළමුවන ධ්‍යානයට සමවැද වාසය කරන්නට නුසුදුසුය.

2. "කවර සයක්ද? පංච කාමයන්ට ඇති ආශාව, නපුරු අදහසය. සිතේ හා කයේ මැලිගතිය, සිතේ නොසන්සුන්කම හා කළ නොකළ දේට පසුතැවීම. සැකය, කාමයන්හි ආදීනවයන් සුදුසු පරිදි මනා නුවණින් නොදැකීම (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, කරුණු සයක් දුරුකොට පළමුවන ධ්‍යානයට සමවැද වාසය කරන්නට සුදුසුවේ.

4. "කවර කරුණු සයකින්ද? කාමයන්ට ඇති ආශාව නපුරු අදහසය, සිතේ හා කයේ මැලිගතිය, සිතේ නොසන්සුන්කම හා කළ නොකළ දේට පසුතැවීම, කාමයන්හි ආදීනවයන් සුදුසු පරිදි මනා නුවණින් දැකීම, (මෙහි 3 ඡේදය යෙදිය යුතුයි.)

**20. කාමවිතක්කාදී සූත්‍රය:-** 1. "මහණෙනි, කරුණු සයක් දුරුනොකොට පළමුවන ධ්‍යානයට සමවැද වාසය කරන්නට නුසුදුසුය.

2. "කවර සයක්ද? කාමයන් ගැන කල්පනා කිරීම, නපුරු අදහස් කල්පනාකිරීම, හිංසා කිරීමේ අදහස් කල්පනා කිරීම, කාම සංඥාව, ව්‍යාපාද සංඥාව, විහිංසා සංඥාව යන සය වෙති.

3. "මහණෙනි, ධර්ම සයක් දුරුකොට පළමුවන ධ්‍යානයට සමවැද වාසය කරන්නට සුදුසුවේ.

4. "කවර සයක්ද? කාමයන් ගැන කල්පනා කිරීම, නපුරු අදහස් කල්පනා කිරීම, හිංසාකිරීමේ අදහස් කල්පනා කිරීම, කාම සංඥාව, ව්‍යාපාද සංඥාව, විහිංසා සංඥාව යන මේ සය වෙති. (මෙහි 3 ඡේදය යෙදිය යුතුයි.)

---

## 8 අරහන්ත වර්ගය.

**21. දිට්ඨධම්ම විහරණ සූත්‍රය:-** 1. "මහණෙනි, කරුණු සයෙකින් යුත් භික්ෂුතෙම මේ ආත්මයෙහි හිරිහැර සහිතව සිත් තැවුල් සහිතව, දැවිලි සහිතව දුකෙස් වසයි. කයබිඳීමෙන් මරණින් පසු දුගතිය බලාපොරොත්තු වියයුතු බවයි.

2. "කවර සයෙකින්ද යත්? කාම සිතුවිල්ලෙන් නපුරු සිතුවිල්ලෙන්, හිංසා සිතුවිල්ලෙන්, කාම වැටහීමෙන්, නපුරු වැටහීමෙන්, හිංසා වැටහීමෙන්ය. (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, මේ කරුණු සයෙකින් යුත් භික්ෂුතෙම මේ ආත්මයෙහි හිරිහැර රහිතව, සිත තැවුල් රහිතව, දැවිලි රහිතව

සැපසේ වෙසෙයි. කය බිඳීමෙන් මරණයෙන් පසුව සුගතිය (හොඳ ඉපදීමක්) බලාපොරොත්තු වියයුතු වෙයි.

4. "කවර සයෙකින්ද යත්? කාමයෙන් නික්මීමේ සිතුවිල්ල, නපුරු නැති සිතුවිල්ල, හිංසා නැති සිතුවිල්ල, කාමයෙන් නික්මීමේ වැටහීම, නපුරු නැති වැටහීම, හිංස නැති වැටහීම (මෙහි 3 ඡේදය යෙදිය යුතුයි.)

22. **අරහන්ත සච්ඡිකරණ සූත්‍රයඃ-** 1. "මහණෙනි, කරුණු සයක් හැර නොදමා, රහත්බව අත්කිරීමට නොහැකිය.

2. "කවර සයක්ද යත්? මානය, අවමානය, අතිමානය, අධිමානය, තදගතිය, තද නිවටකමයි. (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

23. **උත්තරිමනුස්සධම්ම සූත්‍රයඃ-** 1. "මහණෙනි, කරුණු සයක් හැරනොදමා, මිනිස් බව ඉක්මවූ, ආර්යභාවය ගෙන දීමට සමර්ථ නුවණ කොටස අත්කරන්නට නොහැකිය.

2 "කවර සයක්ද යත්? සිහිමුළාව, විමසීමේ නුවණනැති බව, ඉඳුරන්හි දොර නො වැසීම, කෑමෙහි පමණ නොදන්නා බව, වඤ්චාව, චාටු කළාවය (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, කරුණු සයක් හැරදමා මිනිස්බව ඉක්මවූ ආර්ය භාවය ගෙනදීමට සමර්ථ නුවණ කොටස අත්කරන්නට හැකි වෙයි.

4. "කවර සයක්දයත්? සිහිමුළාව, විමසීමේ නුවණ නැති බව, ඉඳුරන්හි දොර නොවැසීම, කෑමෙහි පමණ නොදන්නාබව, චාටු කථාවය. (මෙහි 3 ඡේදය යෙදිය යුතුයි.)

24. **සුඛසොමනස්සබහුල සූත්‍රයඃ-** 1. මහණෙනි, කරුණු සයකින් යුත් භික්ෂුව මේ ආත්මයෙහිම සොම්නස් බහුලව වසයි, ආශ්‍රවයන් ගෙවා දැමීම පිණිස නුවණද පටන්ගන්නා ලද්දේය.

2. "කවර සයෙකින්දයත්? මහණෙනි, මේ සස්නෙහි භික්ෂුතෙම ධර්මයෙහි ඇළුණේවේද භාවනාවෙහි ඇලුණේවේද, පව් ගෙවා දැමීමෙහි ඇලුණේවේද, තද විවේකයෙහි ඇලුණේ

වේද, කෝපනොකිරීමෙහි ඇලුණේවේද, නොපමාවේ ඇලුණේ වේද, කියා ය. (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

**25. අනධිගතාධිගමන සූත්‍රයඃ-** 1. "මහණෙනි, කරුණු සයෙකින් යුත් භික්ෂුව නොදත් කුශල ධර්මය දැනගැනීමට හෝ, දත් කුශල ධර්මය දියුණු කිරීමට හෝ අසමර්ථය.

2. "කවර සයකින්ද යත්? මහණෙනි, මෙහි භික්ෂුව අයෙහි දක්ෂයෙක් නොවේද, වැඩෙහි දක්ෂයෙක් නොවේද, උපායෙහි දක්ෂයෙක් නොවේද, නොපැමිණි කුශල ධර්මයනට පැමිණීමට කැමැත්ත නූපදවාද, පැමිණි කුශලධර්මයන් හොඳට නොරකීද, නිතර පැවැත්වීමට නොසලසාද (කියායි)

3 "මහණෙනි, කරුණු සයෙකින් යුත් භික්ෂුව නොපැමිණි කුශල ධර්මයන්ට පැමිණීමට පැමිණි කුශල ධර්මයන් දියුණු කිරීමට අසමර්ථය.

4. "කවර සයකින්දයත්? මහණෙනි, මෙහි භික්ෂුව අයෙහි දක්ෂයෙක් වේද, වැයෙහි දක්ෂයෙක්වේද, උපායෙහි දක්ෂයෙක්වේද? නොපැමිණි කුශල ධර්මයන්ට පැමිණීමට කැමැත්ත උපදවාද, පැමිණි කුශල ධර්මයන් හොඳට රකීද? නිතර පැවැත්වීමට සලසාද (යන මොහුයි.) (මෙහි 3 ඡේදය යෙදිය යුතුයි.)

**26. මහත්තපාපුණන සූත්‍රයඃ-** 1 "මහණෙනි, කරුණු සයකින් යුත් භික්ෂුතෙමේ නොබෝ කලෙකින්ම ධර්මයන්හි මහත් දියුණුවට පැමිණේ

2. "කවර සයකින්දයත්? මහණෙනි, මෙහි භික්ෂුතෙම ආලෝකය බහුලකොට ඇත්තේවේද, භාවනා යෙදීම බහුල කොට ඇත්තේවේද, නුවණ බහුලකොට ඇත්තේවේද, සන්තොෂය බහුලකොට ඇත්තේවේද, කුශල ධර්මයන්හි බහා නොතබනලද කටයුතු ඇත්තේවේද, මතු මත්තෙහිද ගමන් කෙරේද, (යන මොහුය.) (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

**27. පාණාතිපාතාදී ඡධම්ම සූත්‍රයඃ-** 1. "මහණෙනි කරුණු සයෙකින් යුත් තැනැත්තේ ගෙන එන ලද්දක් බහා තබන්නාසේ මෙසේ නික්මුණේ නිරයෙහි වේ.

2. "කවර සයෙකින්ද යත්? සතුන් නසන්නේ වේද නුදුන් දෙය ගන්නේ වේද කාමයන්හි වැරදි හැසිරීම් ඇත්තේවේද, බොරු කියන්නේ වේද, ලාමකවූ කැමැත්ත ඇත්තේද, වැරදි දැකීම ඇත්තේද, (යන මොහුයි) (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, කරුණු සයකින් යුත් තැනැත්තේ ගෙන එන ලද්දක් බහා තබන්නාසේ මෙසේ නික්මුණේ ස්වර්ගයෙහි වේ.

4. "කවර සයකින්ද යත්? සතුන් නැසීමෙන් වෙන් වූයේවේද, නුදුන් දෙය ගැන්මෙන් වෙන්වූයේ වේද, කාමයන්හි වැරදි හැසිරීමෙන් වෙන්වූයේ වේද, බොරු කීමෙන් වෙන්වූයේ වේද, වඩා කැමැත්ත නැත්තේ වේද, නිවැරදි දැකීම ඇත්තේවේද, (යන මොහුය.) (මෙහි 3 ඡෙදය යෙදිය යුතුයි.)

28. **මුසාවාදාදි ඡධම්ම සූත්‍රය**:- 1. "මහණෙනි, කරුණු සයෙකින් යුක්තවූයේ ගෙන එන ලද්ද බහා තබන්නා සේ මෙසේ නික්මුණේ නිරයෙහි වේ.

2. "කවර සයෙකින්ද යත්? බොරු කියන්නේ වේද, කේලාම් කියන්නේ වේද, ඵරුෂ වචන කියන්නේ වේද, හිස් වචන කියන්නේ වේද, ලොභී වේද, ආඩම්බර වූයේ වේද, (යනුය) (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, කරුණු සයෙකින් යුක්තවූයේ ගෙනඑන ලද්ද බහා තබන්නා සේ මෙසේ නික්මුණේ ස්වර්ගයෙහි වේ.

4. "කවර සයකින්ද යත්? බොරු කීමෙන් වැලකුණේ වේද, කේලාම් කීමෙන් වැලකුණේ වේද, ඵරුෂ වචන කීමෙන් වැලකුණේ වේද, හිස් වචන කීමෙන් වැලකුණේ වේද, ලොභ නැත්තේද, ආඩම්බර නැත්තේද, (යනුය.) (මෙහි 3 ඡෙදය යෙදිය යුතුයි.)

29. **අග්ගධම්ම සච්ඡිකරණ සූත්‍රය**:- 1. "මහණෙනි, කරුණු සයකින් යුත් භික්ෂුව අග්‍රවූ, ධාර්මිකවූ, රහත් බව අත් කරන්නට නුසුදුසුය.

2. "කවර සයකින්ද යත්? මහණෙනි, මෙහි භික්ෂු තෙම පැහැදුණේ නොවේද, පවට ලජ්ජා නැත්තේද, පවට බිය

නැත්තේද, කුසීතද, අනුවණද, කයෙහි ජීවිතයෙහිද බලාපොරොත්තු අධික වේද, (යනුය.) (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.

3. "මහණෙනි, කරුණු සයකින් යුත් භික්ෂුව අග්‍රවූ ධාර්මිකවූ, රහත් බව අත් කරන්නට සුදුසුය.

4. "කවර සයෙකින්ද යත්? මහණෙනි, මෙහි භික්ෂුව, සැදැහැවත් වේද, පවට ලජ්ජා ඇත්තේද, පවට භය ඇත්තේද, පටන්ගත් වීර්ය ඇත්තේද, නුවණැත්තේද, කයෙහිද ජීවිතයෙහි බලාපොරොත්තුවක් නැත්තේද, (යනුය.) (මෙහි 3 ඡේදය යෙදිය යුතුයි.)

**30. රත්තින්දිව හානි වුද්ධි සූත්‍රය:-** 1. "මහණෙනි, කරුණු සයකින් යුත් භික්ෂුහට යම් රැයක් හෝ දහවලක් පැමිණේද, කුශල ධර්මයන්හි හානිය පිණිසම බලාපොරොත්තු විය යුතුයි වැඩීම පිණිස නොවේ.

2. "කවර සයකින්ද යත්? මහණෙනි, මෙහි භික්ෂු තෙම වනාහි හිරිහැර ඇත්තේ නො සතුටු වූයේ අන්‍යවූත් අන්‍යවූත් සිවුරු-ආහාර-සෙනසුන්-ගිලන්පස-බෙහෙත් පිරිකරවලින් විෂම කැමැත්ත ඇත්තේවේද, සැදැහැ නැත්තේ වේද, දුශ්ශීල වූයේ වේද, කුශීතවූයේද, සිහි මුළා ඇත්තේද, අනුවණද (යනුය.) (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, කරුණු සයකින් යුත් භික්ෂුහට යම් රැයක් හෝ දවහලක් පැමිණේද, කුශල ධර්මයන්හි වැඩීම පිණිසම කැමැති විය යුතුය. හානිය පිණිසම නොවේ.

4. "කවර සයකින්ද යත්? මහණෙනි, මෙහි භික්ෂූ තෙම හිරිහැර නැත්තේ සතුටුවූයේ අන්‍යවූත් අන්‍යවූත් සිවුරු-ආහාර-සෙනසුන්-ගිලන්පස-බෙහෙත් පිරිකරවලින් විෂම කැමැත්ත ඇත්තේ නොවේද, සැදැහැවත් වේද සිල්වත්ද පටන්ගත් වීර්ය ඇත්තේද සිහිමත්ද නැණවත්ද (යනුය) (මෙහි 3 ඡේදය යුතුයි.)

---

# 9 සීති වර්ගය.

**31 අනුත්තර සීතිභාව සූත්‍රයඃ-** 1 "මහණෙනි, කරුණු සයකින් යුක්තවූ භික්ෂුව නිරුත්තරවූ (එයට වඩා උසස් යමක් නැති) සංසිඳීම ප්‍රත්‍යක්ෂ කරන්නට නුසුදුසුය.

2 "කවර සයකින්ද? මහණෙනි, මේ සස්නෙහි භික්ෂුව යම් කලෙක සිතට නිග්‍රහ කටයුතුනම් ඒ කාලයෙහි සිතට නිග්‍රහ නොකෙරේද, යම් කලෙක සිත උත්සාහවත් කටයුතු නම් ඒ කාලයෙහි සිත උත්සාහවත් නොකෙරේද, යම් කලෙක සිත උසස් කටයුතු නම් ඒ කාලයෙහි සිත උසස් නොකෙරේද, යම් කලෙක සිත මධ්‍යස්ථ කටයුතු නම් ඒ කාලයෙහි සිත මධ්‍යස්ථ නොකෙරේද, පහත් තත්වයෙහි ඇලීම වේද, ආත්ම දෘෂ්ටියෙහි ඇලුනේ වේද (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

3 "මහණෙනි, කරුණු සයකින් යුක්තවූ භික්ෂුව නිරුත්තරවූ සංසිඳීම ප්‍රත්‍යක්ෂ කරන්නට සුදුසුය.

4 "කවර සයකින්ද? මහණෙනි, මේ සස්නෙහි භික්ෂුව යම් කලෙක සිතට නිග්‍රහ කටයුතු නම් ඒ කාලයෙහි සිතට නිග්‍රහ කෙරේද, යම් කලෙක සිත උසස් කටයුතු නම් ඒ කාලයෙහි සිත උසස් කෙරේද, යම් කලෙක සිත මධ්‍යස්ථ කටයුතු නම් ඒ කාලයෙහි සිත මධ්‍යස්ථ කෙරේද, ප්‍රණීත දෙයෙහි ඇළුනේවේද, නිර්වාණයෙහි ඇළුනේද (මෙහි 3 ඡේදය යෙදිය යුතුයි.)

**32 නියාමොක්කමන සූත්‍රයඃ-** 1 "මහණෙනි, කරුණු සයකින් යුක්තවූ තැනැත්තේ බණ අසන්නේද කුශල ධර්මයන්හි තැන්පත්වූ නියම කළ දෙයට බැසගන්නට නොහැක්කේ වෙයි.

2 "කවර සයකින්ද? කර්මාවරණ බැවින් යුක්තවූයේ වේද ක්ලෙශාවරණ බැවින් යුක්තවූයේ වේද, අකුශල විපාකයකින් වැසුනේ වේද, බලවත් කැමැත්ත නැත්තේ වේද, ප්‍රඥාවත් නොවේද, (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

3 "මහණෙනි, කරුණු සයකින් යුක්තවූ තැනැත්තේ බණ අසන්නේ කුශල ධර්මයන්හි තැන්පත්වූ නියම කළ දෙයට බැස ගන්නට හැක්කේ වෙයි.

4 "කවර සයකින්ද? කර්මාවරණ බැවින් යුක්තනොවූයේ වේද, ක්ලෙශාවරණ බැවින් යුක්තනොවූයේ වේද, අකුශල විපාකයකින් නොවැසුනේ වේද, බලවත් කැමැත්ත ඇත්තේ වේද, ප්‍රඥාවත් වේද, (මෙහි 3 ඡෙදය යෙදිය යුතුයි.)

33 **සම්මත්ත සූත්‍රය**:- 1 "මහණෙනි, කරුණු සයකින් යුක්තවූ තැනැත්තේ බණ අසන්නේ නමුදු කුශල ධර්මයන්හි තැන්පත්වූ නියම කළ දෙයට බැස ගන්නට නොහැක්කේ වෙයි.

2 "කවර සයකින්ද? මව මරණ ලද්දේ වේද, පියා මරණ ලද්දේ වේද, රහතුන් වහන්සේ මරණ ලද්දේ වේද, දුෂ්ටවූ සිතින් තථාගතයන් වහන්සේගේ ශරීරයෙන් ලේ සොල්වන ලද්දේ වේද, සංඝ භෙදය කරණ ලද්දේ වේද, ප්‍රඥා නැත්තේ වේද මෝඩවූ කෙළතොලු කෙනෙක් වේද යන මේ කරුණු සයින් යුක්තවූ තැනැත්තේ (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි.)

3 "මහණෙනි, කරුණු සයකින් යුක්තවූ තැනැත්තේ බණ අසන්නේ කුශල ධර්මයන්හි තැන්පත්වූ නියම කළ දෙයට බැසගන්නට හැක්කේ වෙයි.

4 "කවර සයකින්ද? මව නොමරණ ලද්දේ වේද, පියා නොමරණ ලද්දේ වේද, රහතන් වහන්සේ නොමරණ ලද්දේ වේද, දුෂ්ටවූ සිතින් තථාගතයන් වහන්සේගේ ශරීරයෙන් ලේ නොසොල්වන ලද්දේ වේද, සංඝ භෙදය නොකරන ලද්දේ වේද, ප්‍රඥා ඇත්තේ වේද, මෝඩවූ කෙළතොලු කෙනෙක් නොවූයේද (මෙහි 3 ඡෙදය යෙදිය යුතුයි.)

34 **සුස්සූසන සූත්‍රය**:- 1 "මහණෙනි, ධර්ම සයකින් යුක්තවූ තැනැත්තේ බණ අසන්නේ නමුදු කුශල ධර්මයන්හි තැන්පත්වූ නියම කළ දෙයට බැසගන්නට නොහැක්කේ වෙයි.

2 "කවර සයකින්ද? තථාගතයන් වහන්සේ විසින් දන්නා ලද ධර්ම විනය දෙශනා කරණ කල්හි නොඅසාද කණ නොනමාද, වෙන කරුණක් සිතට නගා ගනීද, අනර්ථයක්ම ගනීද, අර්ථය නොසලකා හරීද, පිළිවෙලින් තොරවූ ඉවසීමෙන් යුක්තවූයේ වේද (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි.)

3 "මහණෙනි, ධර්ම සයකින් යුක්තවූ තැනැත්තේ බණ අසන්නේ කුශල ධර්මයන්හි තැන්පත්වූ නියම කළ දෙයට බැසගන්නට හැක්කේ වෙයි.

4 "කවර සයකින්ද? තථාගතයන් වහන්සේ විසින් දන්නා ලද ධර්ම විනය දෙශනා කරණ කල්හි අසාද, කන් නමාද, වෙන කරුණක් සිතට නගා නොගනීද, අර්ථයක්ම ගනීද, අර්ථය සලකාද, පිළිවෙලින් යුක්තවූ ඉවසීමෙන් යුක්ත වේද (මෙහි 3 ඡෙදය යෙදිය යුතුයි.)

**35 දිඨිසම්පදා සච්ඡිකරණ සූත්‍රය:-** 1 "මහණෙනි, කරුණු සයක් දුරුනොකොට සෝවාන්බව ලැබීමට නුසුදුසුය.

2 "කවර සයක්ද? ආත්ම දෘෂ්ටිය, සැකය, අන්‍ය ශීල ව්‍රතයන් යහපත්යයි ගැනීම, අපායට යාමට හේතුවන රාගය අපායට යාමට හේතුවන ද්වෙෂය, අපායට යාමට හේතුවන මොහය (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි.)

3 "මහණෙනි, කරුණු සයක් දුරුකොට සෝවාන් බව ලැබීමට සුදුසුය.

4 "කවර සයක්ද? ආත්ම දෘෂ්ටිය, සැකය, අන්‍ය ශීල ව්‍රතයන් යහපත්යයි ගැනීම, අපායට යාමට හේතුවන රාගය අපායට යාමට හේතුවන ද්වෙෂය, අපායට යාමට හේතුවන මොහය (මෙහි 3 ඡෙදය යෙදිය යුතුයි.)

**36 පහීන ධම්මඡක්ක සූත්‍රය:-** 1 "මහණෙනි, කරුණු සයක් සෝවාන් පුද්ගලයාට ප්‍රහීණ වූවාහු වෙති.

2 "කවර සයක්ද? ආත්මදෘෂ්ටිය, සැකය, අන්‍ය ශීලව්‍රතයන් යහපත්යයි ගැනීම, අපායට යාමට හේතුවන රාගය, අපායට යාමට හේතුවන ද්වෙෂය, අපායට යාමට හේතුවන මෝහය (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි.)

**37 උප්පාදනායාභබ්බධම්ම සූත්‍රය:-** 1 "මහණෙනි, සෝවාන් පුද්ගලයා කරුණු සයක් උපදවන්නට නුසුදුසු වෙයි.

2 "කවර සයක්ද? ආත්ම දෘෂ්ටිය, සැකය, අන්‍ය ශීල ව්‍රතයන් යහපත්යයි ගැනීම, අපායට යාමට හේතුවන රාගය, අපායට

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

යාමට හේතුවන ද්වේෂය, අපායට යාමට හේතුවන මොහය යන මේ සයවෙති. (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

38 **ඡඅභබ්බට්ඨානසූත්‍රයඃ-** 1 "මහණෙනි, මේ නුසුදුසු කරුණු සයක් වෙති.

2 "කවර සයක්ද? සෝවාන් පුද්ගලයා ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරව නැතිව නොකීකරුව වාසය කරන්නට නුසුදුසුය. සෝවාන් පුද්ගලයා ධර්මය කෙරෙහි ගෞරව නැතිව නොකීකරුව වාසය කරන්නට නුසුදුසුය. සෝවාන් පුද්ගලයා සංඝයා කෙරෙහි ගෞරව නැතිව නොකීකරුව වාසය කරන්නට නුසුදුසුය. සෝවාන් පුද්ගලයා ශික්ෂාව කෙරෙහි ගෞරව නැතිව නොකීකරුව වාසය කරන්නට නුසුදුසුය. සෝවාන් පුද්ගලයා සංඝයා කෙරෙහි ගෞරව නැතිව වාසය කරන්ට නුසුදුසුය. සෝවාන් පුද්ගලයා ශික්ෂාව කෙරෙහි ගෞරව නැතිව නොකීකරුව වාසය කරන්ට නුසුදුසුය. සෝවාන් පුද්ගලයා නොපැමිණෙන ස්ථානයට හැරී ඒමට නුසුදුසුය. සෝවාන් පුද්ගලයා අටවෙනි භවයක් උපදවන්නට නුසුදුසුය. (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

39 **කිඤ්චිසංඛාරූප ගමන සූත්‍රයඃ-** 1 "මහණෙනි, මේ නුසුදුසු කරුණු සයක් වෙති.

2 "කවර සයක්ද? සෝවාන් පුද්ගලයා කිසි සංස්කාරයක් නිත්‍ය වශයෙන් ගන්නට නුසුදුසු වෙයි. සෝවාන් පුද්ගලයා කිසි සංස්කාරයක් සැප වශයෙන් ගන්නට නුසුදුසුය. සෝවාන් පුද්ගලයා කිසි ධර්මයක් ආත්ම වශයෙන් ගන්නට නුසුදුසුය. සෝවාන් පුද්ගලයා ඇසූ දුටු දේ මගුල් වශයෙන් පිරිසිදුයයි ගෙන හැරියාමට නුසුදුසුය. සෝවාන් පුද්ගලයා මේ ශාසනයෙන් පිටත දන්දීමට සුදුස්සන් සෙවීමට නුසුදුසුය. (මෙහි 3 ඡේදය යෙදිය යුතුයි.)

40 **ආනන්තරිය සූත්‍රයඃ-** 1 "මහණෙනි, මේ නුසුදුසු කරුණු සයක් වෙති.

2 "කවර සයක්ද? සෝවාන් පුද්ගලයා මව මැරීමට නුසුදුසුය. පියා මැරීමට නුසුදුසුය රහතන් වහන්සේ මැරීමට නුසුදුසුය,

දුෂ්ටවූ සිතින් තථාගතයන් වහන්සේගේ ශරීරයෙන් ලේ සෙලවීමට නුසුදුසුය. සංඝභෙදය කරන්නට නුසුදුසුය. සෝවාන් පුද්ගලයා අන්‍ය ශාස්තෘවරයකු ඇතැයි පෙන්වීමට නුසුදුසුය."

41 **සයංකත සුඛදුක්ඛ සූත්‍රයː-** 1 "මහණෙනි, නුසුදුසු කරුණු සයක් වෙති. කවර සයක්ද?

2 "මහණෙනි, සෝවාන් පුද්ගලයා තමා විසින් කරණ ලද සුවදුක් වලට ආපසු හැරී ඒමට නුසුදුසුය. අනුන් විසින් කරණ ලද සැපදුක් වලට ආපසු හැරී ඒමට නුසුදුසුය. තමා විසින්ද අනුන් විසින්ද කළ සැප දුක්වලට ආපසු හැරී ඒමට නුසුදුසුය. තමා විසින් නොකරණ ලද හේතුවක් නැතිව හටගත් සැප දුක් වලට හැරීඒමට නුසුදුසුය.

3 "සෝවාන් පුද්ගලයා තමා විසින්ද අනුන් විසින්ද නොකරණ ලද හේතුවක් නැතිව හටගත් සුවදුක් වලට ආපසු හැරී ඒමට නුසුදුසුය.

4 "එයට හේතුකවරේද? මහණෙනි, එසේමය. සෝවාන් පුද්ගලයා විසින් හේතුව දක්නා ලදී. හේතුවෙන් යුක්ත ධර්මයෝද දක්නා ලදී. (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

---

## 10. ආනිසංස වර්ගය.

42. **දුල්ලභපාතුභාව සූත්‍රයː-** 1. "මහණෙනි, සයක පහළවීම ලොව දුර්ලභය.

2 "කවර සයෙක්ද යත්? තථාගතවූ අර්හත්වූ සම්මා සම්බුදුන්ගේ පහළවීම ලොව දුර්ලභය, තථාගතයන් අවබෝධ කළ ධර්ම විනයය දෙසන්නාවූ තැනැත්තේ ලොව දුර්ලභය, ආර්ය භූමියෙහි නැවත ඉපදීම ලොව දුර්ලභය, ඉන්ද්‍රියයන්ගේ විකලභාවය ලොව දුර්ලභය, ජඩ නොවීමද කෙළතොලු හා ගොළු නොවීමද ලොව දුර්ලභය, පින් දහමට කැමැත්ත ලොව දුර්ලභය, (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

**43. සොතාපත්තානිසංස සූත්‍රය:-** 1. "මහණෙනි, සෝවාන් ඵලය අත්කිරීමට මේ අනුසස් සයෙකි.

2. "කවර සයෙක්ද යත්? සද්ධර්මයට ඒකාන්ත වූයේ වේද, නොපිරිහෙන ධර්ම ඇත්තේවේද, සම්පූර්ණයෙන් අවසන් කළහුට දුකක් නොවේද, අසමාන නුවණින් යුතුද, ඔහුට හේතුව පෙනුණේවේද, හේතුවෙන් හටගත් (ඵල) ධර්මයෝද පෙනුණාහු වේද, (යනුය) (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

**44. නිච්චතො සමනුපස්සන සූත්‍රය:-** 1. "මහණෙනි, ඒ භික්ෂුතෙම ඒකාන්තයෙන් කිසියම් සංස්කාරයක් නිත්‍ය වශයෙන් බලන්නේ (ii) අනුලොම්වූ කැමැත්තෙන් යුක්ත වන්නේය යන මේ කාරණය නොපවතියි. අනුලොම්වූ කැමැත්තෙන් යුක්ත නොවූයේ, නිවැරැදි ස්වභාවයට බැසගනීය යන මේ කාරණය නොපවතියි. නිවැරදි ස්වභාවයට බැස නොගන්නේ සෝවාන් ඵලය හෝ, සකෘදාගාමි ඵලය හෝ අනාගාමි ඵලය හෝ අර්හත්වය හෝ අත්කෙරේය යන මේ කාරණය නොපවතියි.

2. "මහණෙනි, ඒ භික්ෂුතෙම වනාහි ඒකාන්තයෙන් සියලු සංස්කාරය අනිත්‍යවශයෙන් බලන්නේ, (ii) අනුලොම් කැමැත්තෙන් යුක්තවන්නේ යන මේ කාරණය පවතී. අනුලොම් කැමැත්තෙන් යුක්තවූයේ, නිවැරැදි ස්වභාවයට බැස ගනීය යන මේ කාරණය පවතී. නිවැරැදි ස්වභාවයට බැසගන්නේ සෝවාන්ඵලය හෝ සකෘදාගාමිඵලය හෝ අනාගාමි ඵලය හෝ අර්හත්වය හෝ අත්කරන්නේය යන මේ කාරණය පවතී

**45. සුඛතො සමනුපස්සන සූත්‍රය:-** 1. "මහණෙනි, ඒ භික්ෂුතෙම ඒකාන්තයෙන් කිසියම් සංස්කාරයක් සැප වශයෙන් බලන්නේ (මෙහි 1 ii) යෙදිය යුතුයි.) සියලු සංස්කාරය දුක් වශයෙන් බලන්නේ (මෙහි 2 (ii) ඡේදය යෙදිය යුතුයි.) කිසියම් ධර්මයක් ආත්ම වශයෙන් බලන්නේ (මෙහි 1 (ii) යෙදිය යුතුයි.)

**46. අත්තතොසමනුපස්සන සූත්‍රය:-** "මහණෙනි, ඒ භික්ෂුතෙම ඒකාන්තයෙන් කිසියම් සංස්කාරයක් ආත්ම වශයෙන් බලන්නේ (මෙහි 1 (ii) සියලු සංස්කාරය සුඛවශයෙන් බලන්නේ

මෙහි 2 (ii) යෙදිය යුතුයි. කිසියම් ධර්මයක් ආත්ම වශයෙන් බලන්නේ මෙහි 1 (ii) යෙදිය යුතුයි.)

47. **නිබ්බාණසමනුපස්සන සූත්‍රය**:- 1 "මහණෙනි, ඒ භික්ෂුතෙම ඒකාන්තයෙන් නිවණ දුක් වශයෙන් බලන්නේ අනුලොම්වූ කැමැත්තෙන් යුක්ත වන්නේයයි මේ කාරණය නොපවතී. අනුලොම් කැමැත්තෙන් යුක්ත නොවූයේ නිවැරදි ස්වභාවයට බැස ගනීය යන මේ කාරණය නොපවතී. නිවැරදි ස්වභාවයට බැස නොගන්නේ සෝවාන්ඵලය හෝ සකෘදාගාමීඵලය හෝ අනාගාමීඵලය හෝ අර්හත්වය හෝ අත් කරන්නේය යන මේ කාරණය නොපවතී.

2 "මහණෙනි ඒ භික්ෂූතෙම ඒකාන්තයෙන් නිවන සැප වශයෙන් බලන්නේ අනුලොම් කැමැත්තෙන් යුක්ත වූයේ වන්නේයයි යන මේ කාරණය පවතී. අනුලොම් කැමැත්තෙන් යුක්තවූයේ නිවැරදි ස්වභාවයට බැසගන්නේ යයි යන මේ කාරණය පවතී. නිවැරදි ස්වභාවයට බැසගන්නේ සෝවාන්ඵලය හෝ සකෘදාගාමිඵලය හෝ අනාගාමීඵලය හෝ අර්හත්වය හෝ අත්කරන්නේය යන මේ කාරණ පවතී."

48. **අනිච්චසඤ්ඤාපට්ඨාපන සූත්‍රය**:- 1. "මහණෙනි, අනුසස් සයක් බලන්නාවූ භික්ෂුව විසින් සියලු සංස්කාරයන්හිද සීමා රහිතව 'අනිත්‍යයි' යන හැඟීම වැඩීමට සෑහේමය.

2. "කවර සයක්දයත්? මගේ සියලු සංස්කාරයෝ අස්ථිර බැවින් ගෙවීයන්නේය. මගේ සිත මුළුලොවෙහි නොඇලෙන්නේය. මගේ සිත සියලු ලෝකයෙන් නැගීසිටින්නේය. මගේ සිත නිවණට නැමුණේ වන්නේය. මගේ (කාමඡන්දාදී) බැඳුම්ද ගෙවීමටයයි. උතුම්වූ මහණකමින් යුක්තවූයේ වන්නේය. (යනුය) (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

49. **දුක්ඛතො සමනුපස්සන සූත්‍රය**:- 1. "මහණෙනි, අනුසස් සයක් බලන්නාවූ භික්ෂුව විසින් සියලු සංස්කාරයන්හිද සීමා රහිත කොට දුක්ය යන හැඟීම නැගිටුවන්නට සෑහේමය.

2. "කවර සයක්ද යත්? ඔසවන ලද කඩු ඇති වධකයා කෙරෙහි මෙන් සියලු සංස්කාරයන්හිද මට නිර්වාණයයි යන

හැඟීම එළඹුණේ වන්නේය. මුළු ලොකයෙන් මගේ සිත නැගිටින්නේය, නිවන්හිද ශාන්ත භාවය දක්නා සුලු වෙමි. මගේ ක්ලෙශද නැසීමට යයි කටයුත්ත කරන්නේද වෙමි. මෛත්‍රී ව්‍රතය පිණිස ශාස්තෘතෙමේද මා ඇසුරු කෙළේ වන්නේය. (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි.)

**50. අනත්තසඤ්ඤුපට්ඨාපන සූත්‍රය:-** 1. "මහණෙනි, අනුසස් සයක් බලන භික්ෂුව විසින් සියලු සංස්කාරයන්හි සීමා රහිත කොට අනාත්ම සංඥාව එළවන්නට සෑහේමය.

2. "කවර සයක්ද යත්? සියලු ලොකයෙහිද එයින් නොවූවෙක් වන්නෙමි. මම යන හැඟීමද මට ගෙවේ. මගේය යන හැඟීමද මට ගෙවේ. අසමානවූ නුවණින් යුක්තවූයේ වන්නෙමි. මා හෙතුව මනාව දක්නා ලද්දේ වන්නේය. හෙතුවෙන් උපන් මේ ධර්මයෝද මනාව දක්නා ලද්දෝය. (යනුය) (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි.)

**51. පහාතබ්බභව සූත්‍රය:-** 1. "මහණෙනි, දුරුකළ යුතු භවයෝ තුනෙකි. තුන් හික්මීමෙහි හික්මිය යුතුය. දුරුකළ යුතු භවත්‍රය කවරේද? කාම භවය, රූපභවය අරූප භවය (යනුය.) මේ භවත්‍රය දුරුකළ යුතුය.

2. "කවර තුනෙක හික්මිය යුතුද? අධිශීල ශික්ෂාවය, අධි චිත්ත ශික්ෂාවය, අධි ප්‍රඥා ශික්ෂාවය (යනු) යි. මේ හික්මීම් තුනෙහි හික්මිය යුතුය. මහණෙනි, යම් හෙයකින් භික්ෂුහට මේ තුන් භවය ගෙවුනේ වෙයි. මේ තුන් හික්මීමෙහි හික්මුණේ විය යුතුය.

3. "මහණෙනි, මේ භික්ෂුතෙම වනාහි තෘෂ්ණාව සින්දේය. බැඳුම් පෙරළීය. මැනවින් සම්‍යක් මානය අවබොධ කිරීමෙන් දුක කෙළවර කෙළේ යයි කියනු ලැබේ

**52. පහාතබ්බතණ්හා සූත්‍රය:-** 1. "මහණෙනි, දුරු කටයුතු මේ තෘෂ්ණාවෝ තිදෙනෙකි. මාන තුනෙකි.

2. "කවර තෘෂ්ණා තුනක් දුරුකටයුතුද? කාමතෘෂ්ණාව භව තෘෂ්ණාව, විභවතෘෂ්ණාව (යනු) ය. මේ තුන් තෘෂ්ණාව දුරුකට යුතුය.

3. "දුරුකටයුතු මාන තුන කවරේද? මානය, අවමානය අතිමානයයි. මේ තුන් මානයෝ දුරු කටයුතුය.

4. "මහණෙනි, යම් තැනක පටන් මේ තුන් තෘෂ්ණාව දුරුවුණේද, මේ තුන් මානයෝ දුරුකළෝද.

5. "මහණෙනි, මේ මහණතෙම තෘෂ්ණාව සින්දේය. බැඳුම් පෙරළිය, සම්‍යක් මානය අවබොධ කිරීමෙන් දුක කෙළවර කෙළේයයි කියනු ලැබේ.

---

## 11 තික වර්ගය

**53. අකුසල මූලපහාන සූත්‍රය:-** 1 "මහණෙනි, මේ ධර්ම තුනකි. කිනම් තුනක්ද යත්? රාගය, ද්වෙෂය, මොහය යන තුනයි. මහණෙනි, මේ ධර්ම තුනය.

2 "මහණෙනි, මේ ධර්ම තුන ප්‍රහාණ කිරීම පිණිස ධර්ම තුනක් වැඩිය යුතුය. කිනම් තුනක්ද යත්. රාගය ප්‍රහීණ කිරීම පිණිස අශුභ වැඩිය යුතුය. ද්වෙෂය ප්‍රහීණ කිරීම පිණිස මෛත්‍රිය වැඩිය යුතුය. මෝහය ප්‍රහීණ කිරීම පිණිස ප්‍රඥාව වැඩිය යුතුය. මහණෙනි, මේ ධර්ම තුන ප්‍රහීණ කිරීම පිණිස මේ ධර්ම තුන වැඩිය යුත්තාහයි" වදාළසේක.

**54 දුච්චරිත පහාණ සූත්‍රය:-** 1 මහණෙනි, මේ ධර්ම තුනකි. කිනම් තුනක්ද යත්, කාය දුශ්චරිතය, වචී දුශ්චරිතය, මනො දුශ්චරිතය යන තුනයි. මහණෙනි, මේ ධර්ම තුනය.

2 "මහණෙනි, ධර්ම තුන ප්‍රහීණ කිරීම පිණිස ධර්ම තුනක් වැඩිය යුතුයි.

3 කිනම් තුනක්ද යත්. කාය දුශ්චරිතය ප්‍රහිණ කිරීම පිණිස කාය සුචරිතය වැඩිය යුතුය. වාක් දුශ්චරිතය ප්‍රහීණ කිරීම පිණිස වාක් සුචරිතය වැඩිය යුතුය. මනො දුශ්චරිතය ප්‍රහීණ කිරීම පිණිස මනො සුචරිතය වැඩිය යුතුය. (මෙහි 2 ඡෙදය යෙදිය යුතුයි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**55 විතක්ක පහාණ සූත්‍රයඃ-** 1 "මහණෙනි, මේ ධර්ම තුනකි. කිනම් තුනක්ද යත්. කාම සිතිවිල්ල, කොප සිතිවිල්ල, හිංසා සිතිවිල්ල, යනුය. මහණෙනි මේ ධර්ම තුනයි.

2 "මහණෙනි, මේ ධර්ම තුන ප්‍රහාණය කිරීම පිණිස ධර්ම තුනක් වැඩිය යුතුය.

3 "කිනම් තුනක්ද යත්? කාමයන් ගැන සිතීම ප්‍රහීණ කිරීම පිණිස නෛෂ්කාම්‍ය කල්පනාව වැඩිය යුතුයි. කොප සිතිවිල්ල ප්‍රහිණ කිරීම පිණිස මෛත්‍රී සිතිවිල්ල වැඩිය යුතුය. හිංසා සිතිවිල්ල ප්‍රහීණ කිරීම පිණිස අවිහිංසා සිතිවිල්ල වැඩිය යුතුය. (මෙහි 2 ඡෙදය යෙදිය යුතුයි.)

**56 සඤ්ඤා පහාණ සූත්‍රයඃ-** 1 "මහණෙනි, මේ ධර්ම තුනකි. කිනම් තුනක්දයත්. කාම හැඟීම, කෝප හැඟීම, හිංසා හැඟීම යන තුනයි. මහණෙනි, මේ හැඟීම් තුනය.

2 "මහණෙනි, මේ හැඟීම් තුන ප්‍රහාණය කිරීම පිණිස ධර්ම තුනක් වැඩිය යුත්තාහ.

3 "කිනම් තුනක්ද යත්? කාම හැඟීම ප්‍රහාණය කිරීම පිණිස නෛෂ්කාම්‍ය හැඟීම වැඩිය යුත්තාහ. කොප හැඟීම ප්‍රහාණය කිරීම පිණිස මෛත්‍රී හැඟීම වැඩිය යුත්තාහ. හිංසා හැඟීම ප්‍රහාණය කිරීම පිණිස අහිංසා සංඥාව වැඩිය යුත්තාහ (මෙහි 2 ඡෙදය යෙදිය යුතුයි.)

**57 ධාතුත්තය පහාණ සූත්‍රයඃ-** 1 "මහණෙනි, මේ ධර්ම තුනකි. කිනම් තුනක්ද යත්? කාම ධාතුවය, ව්‍යාපාද ධාතුවය විහිංසා ධාතුවය යන තුනයි. මහණෙනි මේ ධර්ම තුනය

2 "මහණෙනි, මේ ධර්ම තුන ප්‍රහීණකිරීම පිණිස ධර්ම තුනක් වැඩිය යුත්තාහ.

3 "කිනම් තුනක්ද යත්? කාම ධාතුව ප්‍රහීණ කිරීම පිණිස නෛෂ්කාම්‍ය ධාතුව වැඩිය යුතුයි. ව්‍යාපාද ධාතුව ප්‍රහීණ කිරීම පිණිස මෛත්‍රී ධාතුව වැඩිය යුතුයි. හිංසාධාතුව ප්‍රහීණ කිරීම පිණිස අවිහිංසා ධාතුව වැඩිය යුතුයි. (මෙහි 2 ඡෙදය යෙදිය යුතුයි.)

**58 අස්සාදදිට්ඨි සූත්‍රය**:- 1 'මහණෙනි, මේ ධර්ම තුනකි. කිනම් තුනක්ද යත්? සැප වශයෙන් දැකීම, ආත්මය වශයෙන් දැකීම, වැරදි දැකීම යන තුනයි මහණෙනි, මේ ධර්ම තුනය.

2 "මහණෙනි, මේ ධර්ම තුනම ප්‍රහීණ කිරීම පිණිස ධර්ම තුනක් වැඩිය යුතුය.

3 "කිනම් තුනක්ද යත්? සැප වශයෙන් දැකීම ප්‍රහාණය කිරීම පිණිස අනිත්‍යය යන හැඟීම වැඩිය යුතුයි ආත්මය යන හැඟීම ප්‍රහීණ කිරීම පිණිස අනාත්ම යන හැඟීම වැඩිය යුතුය. වැරදි දැකීම ප්‍රහීණ කිරීම පිණිස හරි දැකීම වැඩිය යුතුයි. (මෙහි 2 ඡේදය යෙදිය යුතුයි.)

**59 අරතිපහාණ සූත්‍රය**:- 1 "මහණෙනි, මේ ධර්ම තුනකි. කිනම් තුනක්ද යත්? නොඇලීම, හිංසාව, අධර්මයෙහි හැසිරීම යන තුනයි. මහණෙනි මේ ධර්ම තුනය.

2 "මහණෙනි, මේ ධර්ම තුන ප්‍රහීණ කිරීම පිණිස ධර්ම තුනක් වැඩිය යුත්තාහ.

3 "කිනම් තුනක්ද යත්? නොඇලීම ප්‍රහීණකිරීම පිණිස මෘදු බව වැඩිය යුතුයි. හිංසාව ප්‍රහීණ කිරීම පිණිස අවිහිංසාව වැඩිය යුතුයි. අධර්මයෙහි හැසිරීම ප්‍රහීණකිරීම පිණිස ධර්මයෙහි හැසිරීම වැඩිය යුත්තාහ. (මෙහි 2 ඡේදය යෙදිය යුතුයි.)

**60 අසන්තුට්ඨතා පහාණ සූත්‍රය**:- 1 "මහණෙනි, මේ ධර්ම තුනකි. කිනම් තුනක්ද යත්. නොසතුටු බව, යහපත් නුවණ නැති බව, බොහෝ කැමති බව, යන තුනයි. මහණෙනි, මේ ධර්ම තුනය.

2 "මහණෙනි, මේ ධර්ම තුන ප්‍රහීණ කිරීම පිණිස ධර්ම තුනක් වැඩිය යුත්තාහ.

3 "කිනම් තුනක්ද යත්? නොසතුටු බව ප්‍රහීණ කිරීම පිණිස සතුටුවීම වැඩිය යුතුයි. යහපත් නුවණ නැති බව ප්‍රහීණ කිරීම පිණිස යහපත් ප්‍රඥාව වැඩිය යුතුය. බොහෝ කැමති බව ප්‍රහීණ කිරීම පිණිස බොහෝ කැමති නැති බව වැඩිය යුතුයි. (මෙහි 2 ඡේදය යෙදිය යුතුයි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**61 දොවචස්සතා පහාණ සූත්‍රය**:- 1 "මහණෙනි, මේ ධර්ම තුනකි කවර තුනක්ද යත්? නපුරු වචන ඇති බව, පවිටු මිතුරන් ඇති බව, සිතේ විපිළිසර බව යන තුනයි. මහණෙනි මේ ධර්ම තුනය.

2 "මහණෙනි, මේ ධර්ම තුන ප්‍රහීණ කිරීම පිණිස ධර්ම තුනක් වැඩිය යුත්තාහ.

3 "කිනම් තුනක්ද යත්? නපුරු වචන ඇති බව ප්‍රහීණ කිරීම පිණිස කීකරු බව වැඩිය යුතුය. පවිටු මිත්‍රයන් ඇති බව ප්‍රහීණ කිරීම පිණිස යහපත් මිත්‍රයන් ඇති බව වැඩිය යුතුය. සිතේ අවුල් ප්‍රහීණ කිරීම පිණිස ආශ්වාස ප්‍රශ්වාස සිහිය වැඩිය යුතුය. (මෙහි 2 ඡෙදය යෙදිය යුතුයි.)

**62 උද්ධච්ච පහාණ සූත්‍රය**:- 1 "මහණෙනි, මේ ධර්ම තුනකි. කිනම් තුනක්ද යත්? සිතේ නොසන්සුන් කම, සංවර නොවීම, ප්‍රමාදය යන තුනයි. මහණෙනි, මේ ධර්ම තුනය.

2 "මහණෙනි, මේ ධර්ම තුන ප්‍රහාණය කිරීම පිණිස ධර්ම තුනක් වැඩිය යුත්තාහ.

3 "කිනම් තුනක්ද යත්? සිතේ නොසන්සුන් කම ප්‍රහීණ කිරීම පිණිස කෙලෙස් ඔබා තැබීම වැඩිය යුතුය. අසංවරය ප්‍රහීණ කිරීම පිණිස සංවරය වැඩිය යුතුය. ප්‍රමාදය ප්‍රහීණ කිරීම සඳහා අප්‍රමාදය වැඩිය යුතුයි. (මෙහි 2 ඡෙදය යෙදිය යුතුයි.)

---

## 12. සාමඤ්ඤ වර්ගය.

**1. කායානුපස්සී විහරණ සූත්‍රය**:- 1. "මහණෙනි, ධර්ම සයක් දුරුනොකර ශරීරයෙහි, ශරීරය අනුව බලන්නට නුසුදුසුය.

2. "කිනම් සයක්ද යත්? කර්මාන්තයෙහි ඇලුන බව, කථාවෙහි ඇලුනබව, නිදීමෙහි ඇලුනබව, පිරිසෙහි ඇලුන බව, ඉන්ද්‍රියයන්හි නොවසනලද දොරටු ඇතිබව, බොජුනෙහි ප්‍රමාණ නොදන්නා බව යන සයයි. මහණෙනි, මේ ධර්ම සය

අත්නොහැර ශරීරයේ ශරීරය අනුව බැලීම බලමින් වසන්නට නුසුදුසුය.

**2. අජ්ඣත්තං කායානුපස්සී සූත්‍රයඃ-** 1. "මහණෙනි, ධර්ම සයක් අත්හැර ශරීරයෙහි ශරීරය අනුව බලන්නට සුදුසුය. (මෙහි 2 යෙදිය යුතුයි. 'හැරයන්නට' 'අත්හැර' කියා වෙනස්කර යොදාගත යුතුයි.)

**3. බහිද්ධා කායානුපස්සී සූත්‍රයඃ-** 1. "මහණෙනි, ධර්ම සයක් අත්නොහැර ස්වකීය ශරීරයෙහි ශරීරය අනුව බලන්නට නුසුදුසුය. (මෙහි මේ වර්ගයේ 1 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

**4 අජ්ඣත්ත බහිද්ධා කායානුපස්සී සූත්‍රයඃ-** (මෙහි මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයෙහි 'ශරීරයෙහි' යන්නට පිටත්හිවූ, තමාතුළ හා පිටත්හිවූ, වේදනාවන්හි වේදනාව, තමාතුළ ඇති වේදනාවන්හි, පිටත්හිවූ වේදනාවන්හි, ඇතුළත පිටත වේදනාවන්හි, සිතෙහි සිත, තම සිතෙහි, පිටත්හිවූ සිතෙහි, ඇතුළත පිටත සිතෙහි, ධර්මයන්හි ධර්මය, තමා තුළ ඇති ධර්මයන්හි, පිටත්හිවූ ධර්මයන්හි, ඇතුළත පිටත ධර්මයන්හි කියා වෙනස්කරද, 1 සූත්‍රයේ 'දුරු නොකර' යන්නට 'දුරු කර' කියා යොදාද සූත්‍ර 30 ක් යොදාගත යුතුයි.)

**5. අජ්ඣත්තවෙදනානුපස්සී සූත්‍රයඃ-** 1. "මහණෙනි, ධර්ම සයකින් යුක්තවූ තපස්සුනම් ගෘහපතිතෙමේ තථාගතයන් වහන්සේ කෙරෙහි පැහැදීමට ගියේ අමෘතය දක්නේ අමෘතය ප්‍රත්‍යක්ෂකොට ජීවත්වෙයි.

2. "කිනම් සයකින්දයත්? බුදුන් කෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්තවූයේවේද, ධර්මයෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්තවූයේ වේද, සංඝයා කෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්තවූයේ වේද, ආර්‍ය්‍ය ශීලයෙන් යුක්තවූයේ වේද, ආර්‍ය්‍ය ඥාණයෙන් යුක්තවූයේ වේද, ආර්‍ය්‍යවූ කෙලෙසුන්ගෙන් මිදීමෙන් යුක්තවූයේ වේද, (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

**6. බහිද්ධාවෙදනානුපස්සී සූත්‍රයඃ-** 1. (මේ වර්ගයේ 5 වෙනි සූත්‍රයේ 'තපස්සු' වෙනුවට, 'භල්ලුක' 'සුදත්ත නම් අනේපිඬු'

'මච්ඡිකා සණ්ඩිකචිත්ත' 'හත්ථක ආලවක' 'මහානාම සක්ක' විසාලානුවර උග්ග' 'උග්ගත' සුරම්බට්ඨ' 'ජීවක කොමාරභච්ච' 'නකුලපිතා' 'තවකණ්ණික' 'පූරණ' 'ඉසිදත්ත' 'සන්ධාන' 'විජය' 'වජ්ජිය මහිත' 'මෙණ්ඩක' 'වාසෙට්ඨ උපාසක' 'අරිට්ඨ' සාරග්ග' යන වචන යොදා සූත්‍ර 20 ක් යොදාගත යුතුයි)

7. **රාගාභිඤ්ඤානුත්තරිය සූත්‍රය**:- 1. "මහණෙනි, රාගය විශිෂ්ට ඥානයෙන් අවබෝධ කිරීම පිණිස ධර්ම සයක් වැඩියයුතුය.

2. "කිනම් සයක්ද යත්? ශ්‍රෙෂ්ඨ දැකීම, ශ්‍රෙෂ්ඨ ඇසීම, ශ්‍රෙෂ්ඨ ලාභය, ශ්‍රෙෂ්ඨ හික්මීම, ශ්‍රෙෂ්ඨ උපස්ථානය, ශ්‍රෙෂ්ඨ සිහිකිරීම යන සයයි. (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි.)

8. **රාගාභිඤ්ඤානුස්සති සූත්‍රය**:- 1. 'මහණෙනි, රාගය විශිෂ්ට ඥානයෙන් අවබෝධ කිරීම පිණිස ධර්ම සයක් වැඩිය යුත්තාහ.

2. "කිනම් සයක්ද යත්? බුදුන් අරමුණු කොට ඇති සිහිය, ධර්මය අරමුණුකොට ඇති සිහිය, සංඝයා අරමුණු කොට ඇති සිහිය, ශීලය අරමුණුකොට ඇති සිහිය, ත්‍යාගය අරමුණුකොට ඇති සිහිය, දේවතාවන් අරමුණුකොට ඇති සිහිය, යන සයයි. (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි.)

9. **රාගාපරිඤ්ඤනුත්තරිය සූත්‍රය**:- 1. "මහණෙනි, රාගය විශිෂ්ට ඥානයෙන් අවබෝධ කිරීම පිණිස ධර්ම සයක් වැඩිය යුත්තාහ.

2 "කිනම් සයක්ද යත්? අනිත්‍යය යන හැඟීම, අනිත්‍යයෙහි දුක්ය යන හැඟීම, දුකෙහි අනාත්මය යන හැඟීම, දුරුකරණ හැඟීම නොඇලෙන හැඟීම, නිවණ යන හැඟීම, යන සයයි. (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි.)

10 (මේ වර්ගයේ 9 වෙනි සූත්‍රයේ විශිෂ්ට ඥානයෙන් අවබෝධ කිරීම පිණිස යන්නට, විශෙෂයෙන් දැනගැනීම, ක්ෂය කිරීම, ප්‍රහීන කිරීම, ක්ෂයවීම, විනාශවීම, නොඇලීම, නිරුද්ධිය, අත්හැරීම, දුරුකිරීම, යන පද යොදා සූත්‍ර 9 ක් සාදාගත යුතුයි.)

11. මේ වර්ගයේ 9 වෙනි සූත්‍රයේ රාගය වෙනුවට දෝෂ, මොහ, ක්‍රොධ, උපනාහ (බද්ධවෛර) ගුණමකු ගතිය, යුගග්‍රාහය,

(තරග කිරීම) ඊෂ්‍යාව, මසුරුකම, මායාව, කෛරාටිකකම, තදගතිය, එකට එක කිරීම, මාන්නය, අතිමාන්නය, මත්වීම, ප්‍රමාදය, කියා වෙනස්කර 10 වෙනි ඡේදයේ පදයක් පාසා යොදා සූත්‍ර 144 ක් සාදාගත යුතුයි) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. පැහැදුනු සිතැති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දේශනාවට සතුටුවූහ.

**සයවන නිපාතය නිමි.**

---

# 7 සත්තක නිපාතය.

## 1. ධන වර්ගය.

**1. අප්පිය භික්ඛු සූත්‍රයඃ-** 1. "එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඩුසිටුහුගේ ආරාමයෙහි වැඩවසනසේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට 'මහණෙනි'යි ඇමතූ සේක. 'ස්වාමීනි'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

2 "මහණෙනි, කරුණු සතකින් යුක්තවූ භික්ෂුව බ්‍රහ්මචාරීන්ට අප්‍රියවූයේද, අමනාපවූයේද අගරු වූයේද, අසම්භාවනීයද වෙයි.

3. "කවර සතකින්දයත්? මහණෙනි, මෙ ශාසනයෙහි භික්ෂුව ලාභය කැමැත්තේවේද, සත්කාරය කැමැත්තේවේද, පව්ටු අදහස් ඇත්තේවේද, පවට ලජ්ජා නැත්තේ වේද, වැරදි ඇදහීම් ඇත්තේද, (මෙහි 2 ඡේදය යෙදිය යුතුයි.)

4. "මහණෙනි, කරුණු සතකින් යුක්තවූ භික්ෂුව බ්‍රහ්මචාරීන්ට ප්‍රියවූයේද, මනාපවූයේද, ගරුවූයේද, සම්භාවනීයද වෙයි.

5. "කවර සතකින්දයත්, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව ලාභය කැමති නොවේද, සත්කාරය කැමති නොවේද, පාපයට

බිය ඇත්තේද පාපයට ලජ්ජා ඇත්තේද පවිටු අදහස් නැත්තේද සම්‍යක්දෘෂ්ටි ඇත්තේද, (මෙහි 4 ඡේදය යෙදිය යුතුයි.)

**2. අමනාප භික්ඛු සූත්‍රය:-** 1. "කරුණු සතකින් යුක්ත භික්ෂුව බ්‍රහ්මචාරීන්ට අප්‍රියවූයේද අමනාපවූයේද ගරු නොවූයේද අසම්භාවනීයද වෙයි.

2. "කවර සතකින්දයත්, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව ලාභය කැමැත්තේවේද, සත්කාරය කැමැත්තේ වේද පවිටු අදහස් ඇත්තේවේද, පාපයට ලජ්ජා නැත්තේවේද, පාපයට භය නැත්තේවේද ඊර්ෂ්‍යාව ඇත්තේද, මසුරුද (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

3. "කරුණු සතකින් යුක්තවූ භික්ෂුව බ්‍රහ්මචාරීන්ට ප්‍රියවූයේද, මනාපවූයේද ගරුවූයේද සම්භාවනීයද වෙයි.

4. "කවර කරුණු සතකින්දයත්? මහණෙනි, මේශාසනයෙහි භික්ෂුව ලාභය නොකැමැත්තේද සත්කාරය නොකැමැත්තේද පවිටු අදහස් නැත්තේද, පවට ලජ්ජා ඇත්තේද, පවට බිය ඇත්තේද, ඊර්ෂ්‍යාව නැත්තේද, මසුරුකම නැත්තේද (මෙහි 3 ඡේදය යෙදිය යුතුයි.)

**3. සංඛිත්ත සත්තබල සූත්‍රය:-** 1. "මහණෙනි, මේ බලයෝ සතක් වෙත්.

2. "කවර සතක්දයත්? ශ්‍රද්ධාබලය, වීර්‍ය්‍යබලය, හිරිබලය ඔත්තප්පබලය, ස්මෘතිබලය, සමාධිබලය, ප්‍රඥාබලය, මහණෙනි, මේ සප්තබලයෝ වෙති.

> 3. "ශ්‍රද්ධාබලයද, වීර්‍ය්‍යබලයද, හිරිබලය හා ඔත්තප්පබලයද, ස්මෘතිබලයද, සමාධිබලයද, ඒකාන්තයෙන් ප්‍රඥාබලය සත්වන බලයවේ. මේ සප්තබලයෙන් බලවත්වූ පණ්ඩිත භික්ෂුතෙම සැපසේ ජීවත්වේ. උපායෙන් ධර්මය සොයාද ප්‍රඥාවෙන් චතුරාර්‍ය්‍යසත්‍යය විශෙෂයෙන් දකීද (එබඳු භික්ෂුවගේ) පහනේ නිවීමමෙන් චිත්තයාගේ විමොක්ෂය (වස්තු අරමුණින් මිදීම) වේ."

**4. විත්ථත සත්තබල සූත්‍රය:-** 1. 2. (මේ ඡේද මේ වර්ගයේ 3 සූත්‍රයේ 1, 2 ඡේද මෙන් වෙත්)

3. "මහණෙනි, ශ්‍රද්ධාබලය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍යශ්‍රාවකතෙම තථාගතයන් වහන්සේගේ බොධිඥානය (මෙහි ඡක්ක නිපාතයේ 1. ආහුනෙය්‍ය වර්ගයේ 10 සූත්‍රයේ 2 (ii) ඡෙදය යෙදිය යුතුයි) ශ්‍රද්ධාව ඇත්තේද අදහාද මෙය ශ්‍රද්ධාබලයයි කියනු ලැබේ.

4 "මහණෙනි වීර්‍ය්‍යබලය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍යශ්‍රාවකතෙම අකුශල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිසද, කුසල ධර්මයන්ගේ වැඩීම පිණිසද, උත්සාහ ඇත්තේ දැඩි පරාක්‍රම ඇත්තේ කුශල ධර්මයන්හි අත්නොහල උත්සාහ ඇත්තේද, මහණෙනි, මේ විරිය බලයයි කියනුලැබේ.

5. "මහණෙනි, හිරිබලය කවරේද? (ii) මහණෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍යශ්‍රාවකතෙම ලාමකවූ අකුශල ධර්මයන්ගේ සංසිඳවීම පිණිස ලජ්ජාවේද කායදුශ්චරිතයෙන්ද, වචීදුශ්චරිතයෙන්ද, මනොදුශ්චරිතයෙන්ද, ලජ්ජා ඇත්තේ ලජ්ජාවේද, (iii) මහණෙනි, මේ හිරිබලයයි කියනු ලැබේ.

6. "මහණෙනි, ඔත්තප්පබලය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍යශ්‍රාවකතෙම ලාමකවූ අකුශල ධර්මයන්ගේ සංසිඳවීම පිණිස ඔත්තප්පය (බිය) ඇත්තේද, කාය දුශ්චරිතයෙන්ද, වචීදුශ්චරිතයෙන්ද, මනොදුශ්චරිතයෙන්ද, බිය ඇත්තේ බියවේද, මහණෙනි, මේ ඔත්තප්පබලයයයි කියනු ලැබේ.

7. "මහණෙනි, ස්මෘති බලය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍යශ්‍රාවකතෙම උතුම්වූ ස්මෘති ප්‍රඥාවෙන් යුක්තවූයේ කොට බොහෝ කල්වූ දෙයද කියා බොහෝ කල්ගතවූ දෙයද සිහිකරන්නේ මනාකොට සිහිකරන්නේ ස්මෘතිමත්වේද මෙය ස්මෘති බලයයි කියනුලැබේ.

8. "මහණෙනි, සමාධි බලය කවරේද මහණෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍යශ්‍රාවකතෙම කාමයන්ගෙන් වෙන්ව අකුසල ධර්මයන්ගෙන් වෙන්ව (මෙහි 1 අංගුත්තර නිකායේ දුතිය පණ්ණාසකයේ බ්‍රාහ්මණ වර්ගයේ 8 සූත්‍රයේ 3 (iii) ඡෙදයේ අග කොටස යෙදිය යුතුයි 302 පිට.)

9. "මහණෙනි, ප්‍රඥාබලය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ආයර්‍ය්‍යශ්‍රාවකතෙම උදයත්ථගාමිනී (දියුණුව ඇති කරවන) ප්‍රඥාවෙන් යුක්තවූයේ මනාකොට දුක් කෙළවර කරන්නාවූ ආයර්‍ය්‍යවූ උසස් ප්‍රඥාවෙන් යුක්ත වූයේ ප්‍රඥාවත් වේද, මහණෙනි, මෙය ප්‍රඥාබලයයි කියනු ලැබේ."

10. (මෙහි මේ වර්ගයේ 3 සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

**5. සංඛිත්ත සත්තධන සූත්‍රයː-** 1. "මහණෙනි, මේ ධනයෝ සත්දෙනෙක් වෙත්. 2. කවර සත්දෙනෙක්ද යත්? ශ්‍රද්ධා ධනය, ශීල ධනය, හිරි ධනය, ඔත්තප්ප ධනය, ශ්‍රැත ධනය, ත්‍යාග ධනය, ප්‍රඥාධනය යනුයි' මහණෙනි, මේ සප්ත ධනයෝ වෙත්.

3. "ශ්‍රද්ධා ධනයද, ශීල ධනයද, හිරි ධනයද, ඔත්තප්ප ධනයද, ශ්‍රැත ධනයද, ත්‍යාග ධනයද, ප්‍රඥා ධනයද ඒකාන්තයෙන් සත්වන ධනය වේ. යම්බඳුවූ ස්ත්‍රියකට හෝ පුරුෂයෙකුට හෝ මේ සප්තායර්‍ය්‍යධනයෝ ඇත්තාහුද ඔහු දිළිඳු නොවේයයි කියත්. ඔහුගේ ජීවිත වෘත්තිය සිස්නොවේ. එහෙයින් පණ්ඩිතතෙම බුදුන්ගේ අනුශාසනය සිහිකරන්නේ ශ්‍රද්ධාවද, ශීලයද, පැහැදීමද ධර්මය දැකීමද යොදන්නේය."

**6. විත්ථත සත්තධන සූත්‍රයː-** 1. 2. (මෙහි මේ වර්ගයේ 5 සූත්‍රයේ 1. 2 ඡේද යෙදිය යුතුයි 'බලය' වෙනුවට 'ධනය' යෙදිය යුතුයි.)

3. (මේ ඡේදය මේ වර්ගයේ 4 සූත්‍රයේ 3 ඡේදය මෙනි 'බලය' වෙනුවට 'ධනය' යෙදිය යුතුයි.)

4. "මහණෙනි, ශීලධනය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ආයර්‍ය්‍යශ්‍රාවකතෙම ප්‍රාණඝාතයෙන් වෙන්වූයේ වේද, අන්සතු දෙය ගැන්මෙන් වෙන්වූයේ වේද, කාමයෙහි වරදවා හැසිරීමෙන් වෙන්වූයේද, බොරුකීමෙන් වෙන්වූයේද, ප්‍රමාදයට හේතුවූ රහමෙර පානයෙන් වෙන්වූයේ වේද, මහණෙනි, මේ ශීල ධනයයි කියනු ලැබේ.

5. (මෙය මේ වර්ගයේ 4 සූත්‍රයේ 5 ඡේදය මෙනි 'බලය' වෙනුවට 'ධනය' යෙදිය යුතුයි.)

**6.** (මෙහි මේ වර්ගයේ 4 සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි. බලය' වෙනුවට 'ධනය' යෙදිය යුතුයි.)

7 "මහණෙනි, ශ්‍රැත ධනය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තේ වේද, ශ්‍රැතධරවූයේ ශ්‍රැතසන්නිචය (බොහෝ පළපුරුදු) වූයේ යම් ඒ ධර්මයෝ මුල පිරිසිදුවූ මැද පිරිසිදුවූ අග පිරිසිදුවූ අර්ථ සහිතවූ ව්‍යඤ්ජන සහිතවූ සියල්ලෙන් පරිපූර්ණවූ පිරිසිදු බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශ කෙරෙද්ද එබඳුවූ ධර්මයෝ ධරණ ලද්දේ වචනයෙන් පුරුදු කරණ ලද්දේ සිතින් මෙනෙහි කරණ ලද්දේ සම්‍යක් දෘෂ්ටියෙන් මනාකොට යෙදුනේ බහුශ්‍රැත වෙත්ද, මහණෙනි, මෙය ශ්‍රැත ධනයයි කියනු ලැබේ.

8 'මහණෙනි, ත්‍යාග ධනය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍යශ්‍රාවක තෙම පහවූ මසුරුමල ඇති සිතින් ගිහිගෙයි වෙසේද, පරිත්‍යාගය ඇත්තේ, දීමට සෝදන ලද අත් ඇත්තේ දීමට ඉල්ලීමෙහි යෙදුනේ, දීමට සුදුස්සන් තෝරා දීමෙහි යෙදුනේ වේද, මහණෙනි, මෙය ත්‍යාග ධනයයි කියනු ලැබේ.

9 (මෙය මේ වර්ගයේ 4 සූත්‍රයේ 9 ඡේදය මෙනි-'බලය' වෙනුවට 'ධනය' යෙදිය යුතුයි.) මහණෙනි, මේ සප්ත ධනයෝ වෙත්.

10 (මෙහි මේ වර්ගයේ 3 සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි. 'බලය' වෙනුවට 'ධනය' යෙදිය යුතුයි.)

7 **උග්ගමහාමත්ත සූත්‍රය**:- 1 "ඉක්බිත්තෙන් උග්ග නම් රාජ මහාමාත්‍යතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණිසේක. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටියාවූ උග්ග රාජ මහාමාත්‍ය තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළකළේය.

2 "ස්වාමීනි, ආශ්චර්‍ය්‍යයකි. ස්වාමීනි, පුදුමයකි. රොහනෙය්‍ය නම් මිගාර තෙම යම්තාක් ආඪ්‍යද යම්තාක් මහත් ධන ඇත්තේද, යම්තාක් මහාභොග ඇත්තේ වෙයිද ස්වාමීනි රොහනෙය්‍ය නම් මිගාර තෙම කොපමණ ආඪ්‍යවූයේද කොපමණ මහත් ධන

ඇත්තේද කොපමණ මහා භොග ඇත්තේද, අමුරන්ම ලක්ෂයකි රිදී ගැන කියනුම කවරේද?

3 "උග්ගය, ඇත්තාවූ ඒ ධනය ඕහට නැත්තේ යයි කියමි. උග්ගය, එසේ නමුදු ඒ ධනය ජලයෙන්ද ගින්නෙන්ද රජුන්ගෙන්ද සොරුන්ගෙන්ද අප්‍රිය දායාදයන්ගෙන්ද සාධාරණ වන්නේය.

4 "උග්ගය, මේ ධනයෝ සත්දෙන ජලයෙන්ද ගින්නෙන්ද රජුන්ගෙන්ද සොරුන්ගෙන්ද අප්‍රිය දායාදයන්ගෙන්ද අසාධාරණ වෙති.

5 "ඒ සත කවරහුද? ශ්‍රද්ධා ධනය, ශීල ධනය, හිරිධනය ඔත්තප්ප ධනය, ශ්‍රැත ධනය, ත්‍යාග ධනය, ප්‍රඥා ධනය යනුයි. උග්ගය (මෙහි 4 ඡෙදය යෙදිය යුතුයි)

6 (මෙය මේ වර්ගයේ 3 සූත්‍රයේ 3 ඡෙදය මෙනි. 'බලය' වෙනුවට 'ධනය' යෙදිය යුතුයි.)

8 **සත්ත සංයෝජන සූත්‍රයː-** 1 "මහණෙනි, මේ සංයෝජනයෝ සතක් වෙති.

2 "කවර සතක්ද? අනුසය සංයෝජනය, පටිඝ සංයෝජනය, දිට්ඨි සංයෝජනය, විචිකිච්ඡා සංයෝජනය, මාන සංයෝජනය, භවරාග සංයෝජනය, අවිජ්ජා සංයෝජනය මහණෙනි, මේ සංයෝජනයෝ සතක් වෙති."

9 **සංයොජන සමුච්ඡෙද සූත්‍රයː-** 1 "මහණෙනි, සප්ත සංයෝජනයන්ගේ ප්‍රහාණය පිණිස සිඳීම පිණිස බඹසර හැසිරෙයි.

2 "කවර සතකගේද? (ii) අනුසය සංයෝජනයාගේ (iii) ප්‍රහාණය පිණිස බඹසර හැසිරෙයි. පටිඝ සංයෝජනයාගේ (මෙහි 2 (iii) යෙදිය යුතුයි.) දිට්ඨි සංයෝජනයාගේ (මෙහි 2 (iii) යෙදිය යුතුයි.) විචිකිච්ඡා සංයෝජනයාගේ (මෙහි 2 (iii) යෙදිය යුතුයි.) මානසංයෝජනයාගේ (මෙහි 2 (iii) යෙදිය යුතුයි.) භවරාග සංයෝජනයාගේ (මෙහි 2 (iii) යෙදිය යුතුයි.) අවිජ්ජා සංයෝජනයාගේ (මෙහි 2 (iii) යෙදිය යුතුයි.)

3 (මේ ඡෙදය මේ සූත්‍රයේ 1 ඡෙදය මෙනි.)

4 "මහණෙනි, යම් හෙයකින් භික්ෂුවගේ අනුසය සංයෝජනය (ii) නැවත නූපදිනසේ මුලින් කපන ලද තල් ගසක් සේ කරණ ලදද, අභාවයට පමුණුවන ලද්දේද-(iii) පටිඝ සංයෝජනයද, (4 (ii) යෙදිය යුතුයි.) දිට්ඨි සංයෝජනයද (4 (ii) යෙදිය යුතුයි.) විචිකිච්ඡා සංයෝජනයද (4 (ii) යෙදිය යුතුයි.) මාන සංයෝජනයද (4 (ii) යෙදිය යුතුයි.) භවරාග සංයෝජනයද (4 (ii) යෙදිය යුතුයි.) අවිජ්ජා සංයෝජනයද (4 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, මෙයින් භික්ෂුව තෘෂ්ණාව සින්දේය, සංයෝජනයන් දුරුකොට දුක් කෙළවර කළේය.

10 **මච්ඡරිය සංයොජන සූත්‍රයඃ-** 1 "මහණෙනි, මේ සංයෝජනයෝ සතක් වෙති.

2 "කවර සතක්ද යත්? අනුනය සංයෝජනය, පටිඝ සංයෝජනය, දිට්ඨි සංයෝජනය, විචිකිච්ඡා සංයෝජනය මාන සංයෝජනය, ඉස්සා සංයෝජනය, මච්ඡරිය සංයෝජනය යන මේ සත සංයෝජනයෝ වෙති."

---

## 2. අනුසය වර්ගය.

11. **සත්තානුසය සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ අනුසය සතක් වෙති.

2. "කවර සතක්ද යත්? කාමරාගානුසය, පටිඝානුසය, දිට්ඨානුසය, විචිකිච්ඡානුසය, මානානුසය, භවරාගානුසය, අවිජ්ජානුසය යන මේ සත අනුසය නම් වෙති.

12. **අනුසයප්පහාණ සූත්‍රයඃ-** 1. "මහණෙනි, සප්ත අනුසයන්ගේ ප්‍රහාණය පිණිස සිඳීම පිණිස බඹසර හැසිරෙයි.

2. 4 (මේ ඡෙද 1 වර්ගයේ 9 සූත්‍රයේ 2-4 ඡෙද මෙනි. 'සංයෝජන' වෙනුවට 'අනුසය' යෙදිය යුතුයි.)

13. **කුලුපගමනංග සූත්‍රයඃ-** 1. "මහණෙනි, කරුණු සතකින් යුත් ගෙදරකට පෙර නොගියේ නම් යන්නට නුසුදුසුය ගියේද හිඳගැණීමට නුසුදුසුය.

2. "කවර සතකින්ද? ප්‍රිය මනාපයෙන් හුනස්නෙන් නොනැගිටීද, ප්‍රිය මනාපයෙන් වැඳීම නොකෙරේද, ප්‍රිය මනාපයෙන් ආසනය නොදේද, ඕහට ඇතිදෙය සඟවාද, බොහෝ ඇතත් ටිකක් දේද, ප්‍රණීත දේ ඇතත් රූක්ෂ දෙයක් දේද, සකස්කොට නොව නොසකස් කොට දේද (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, කරුණු සතකින් යුක්තවූ ගෙදරකට නොගියේ නම් යන්නට සුදුසුය. ගියේ නම් හිඳගන්නටද සුදුසුය.

4. "කවර කරුණු සතකින්ද? ප්‍රිය මනාපයෙන් හුනස්නෙන් නැගිටීද, ප්‍රිය මනාපයන් අභිවාදනය කෙරේද, ප්‍රිය මනාපයෙන් අසුන්දේද, ඕහට ඇති දේ නොසඟවාද, බොහෝ ඇතිකල්හි බොහෝ දේද; ප්‍රණීත දෙය ඇති කල්හි ප්‍රණීත දෙය දේද, සකස්කොට දේද, නොසකස් කොට නොදේද, (මෙහි 3 ඡේදය යෙදිය යුතුයි.)

14. **සත්තාහුණෙය්‍ය සූත්‍රය**:- 1. "මහණෙනි, මේ පුද්ගලයෝ සත්දෙන (ii) ආහුණෙය්‍ය දුරසිට ගෙනවුත් පිදීමට යොග්‍යයෝය. පාහුනෙය්‍යා (දුර ගෙනයන දේ ගෙනවුත් පිදීමට යොග්‍යයෝය. දක්ඛිනෙය්‍ය (දක්ෂිණාවට සුදුස්සෝය) ලෝකයාගේ නිරුත්තරවූ පින්කෙතය.

2. "කවර සත් දෙනෙක්ද යත්? උභතො භාගයෙන් මිදුන තැනැත්තේය, ප්‍රඥාවෙන් මිදුන තැනැත්තේ හෙවත් ශුෂ්ක විදර්ශක රහතුන් වහන්සේය, නාම කායයෙන් ධ්‍යාන ස්පර්ශයකොට පසුව නිවන් පසක්කොට සිටි තැනැත්තේය. ශ්‍රද්ධාවෙන් මිදුන තැනැත්තේය. ප්‍රථම මාර්ග ප්‍රඥාවයයි කියන ලද ධර්මය සිහිකරණ තැනැත්තේය. ප්‍රථම මාර්ග සංඛ්‍යාත ශ්‍රද්ධාව සිහිකරණ තැනැත්තේය යන (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

15. **උදකූපම පුග්ගල සූත්‍රය**:- 1. "මහණෙනි, ජලයට බඳු උපමා ඇති පුද්ගලයෝ සත්දෙනෙක් ලෝකයෙහි විද්‍යමානවෙති.

2. "ඒ සත්දෙන කවරහුද? මහණෙනි, ඇතැම් පුද්ගලයෙක් එක්වරක් (ජලයෙහි) ගිලුනේ ගිලුනේමය. මහණෙනි, ඇතැම්

පුද්ගලයෙක් ගිලී මතුවෙයි. මහණෙනි, මෙහි වනාහි ඇතැම් පුද්ගලයෙක් ගිලී සිටියේ වෙයි. මහණෙනි, මෙහි වනාහි ඇතැම් පුද්ගලයෙක් මතුවී විශෙෂයෙන් බලයි. අවලෝකනය කෙරෙයි. මහණෙනි, මෙහි වනාහි ඇතැම් පුද්ගලයෙක් මතුවී පිහිනයි. මහණෙනි, මෙහි වනාහි ඇතැම් පුද්ගලයෙක් මතුවී ගැඹුරට පිවිසියේ වෙයි. මහණෙනි, මෙහි වනාහි ඇතැම් පුද්ගලයෙක් මතුවී එතරවූයේ පරතීරගතවූ ඒ බ්‍රාහ්මණ තෙම ගොඩ සිටියේ වෙයි.

3. "මහණෙනි, කෙසේනම් පුද්ගලතෙම වරක් ගිලුනේ ගිලුනේම වේද? මහණෙනි, මෙහි වනාහි ඇතැම් පුද්ගලයෙක් ඒකාන්ත කාලක (කලු) වූ අකුසල ධර්මයන්ගෙන් යුක්තවේද, මහණෙනි, මෙසේ වනාහි පුද්ගල තෙම වරක් ගිලුනේ ගිලුනේම වෙයි.

4. "මහණෙනි, කෙසේනම් පුද්ගලතෙම ගිලී මතුවේද? (ii) මහණෙනි, මෙහි ඇතැම් පුද්ගලයෙක් කුශල ධර්මයන්හි මතුවීමෙන් යුතු ශ්‍රද්ධාව යහපත්වේද පාපයට ලජ්ජාව යහ පත්වේද පාපයට බිය යහපත් වේද වීර්‍ය්‍යය යහපත් වේද කුසල ධර්මයන්හි ප්‍රඥාව යහපත්වේද ඔහුගේ ඒ ශ්‍රද්ධාව නොසිටියි. නොවැඩෙයි. පිරිහේමය ඔහුගේ ඒ හිරිය, ඔත්තප්පය, වීර්‍ය්‍යය, ප්‍රඥාව (යන මේ ධර්මයෝ) නොසිටිත්. නොවැඩෙත්. පිරිහෙත්මය. (iii) මහණෙනි, මෙසේ පුද්ගල තෙම ගිලී මතුවෙයි.

5. "මහණෙනි, කෙසේ නම් පුද්ගලතෙම ගිලී සිටියේ වේද? (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

6. "මහණෙනි, කෙසේ නම් පුද්ගලතෙම මතුවී විශෙෂයෙන් බලාද අවලෝකනය කෙරේද? (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) හෙතෙම සංයෝජන තුනකගේ ක්ෂය කිරීමෙන් නිරයගාමිනී නොවූ සම්බෝධිපරායනවූ සෝවාන්වූයේ වෙයි. මෙසේ පුද්ගල තෙම මතුවී විශෙෂයෙන් බලයි.

7. "මහණෙනි, කෙසේනම් පුද්ගලතෙම මතුවී පිහිනයිද? (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) හෙතෙම සංයෝජන තුනකගේ ක්ෂයවීමෙන් රාග ද්වෙෂ මොහයන්ගේ තුනීවීමෙන් සකෘදාගාමී

වේද, වරක් මේ ලෝකයට අවුත් දුක් කෙළවර කෙරේද මහණෙනි, එසේ වනාහි පුද්ගල තෙම මතුවී පිහිනයි.

8 "මහණෙනි, කෙසේනම් පුද්ගලතෙම මතුවී ඈත දියඹට ගියේවේද, (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) හෙතෙම පංචඔරම්භාගිය සංයෝජනයන්ගේ ක්ෂය වීමෙන් ඖපපාතික වේද ඒ ලෝකයෙන් වෙනස් නොවන්නේ පිරිනිවණට යේද, මහණෙනි, එසේ වනාහි පුද්ගලතෙම මතුවී ඈත දියඹට යෙයි

9. "මහණෙනි, කෙසේනම් පුද්ගලතෙම මතුවී පරතෙරට ගියේවේද? පරතෙරටගිය බ්‍රාහ්මණතෙම ගොඩ සිටියේ වේද, (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) (ii) හෙතෙම ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීමෙන් අනාශ්‍රවවූයේ චිත්ත විමුක්තියද ප්‍රඥා විමුක්තියද මෙලෙව්හිදීම තෙමේ උසස් ඥානයෙන් ප්‍රත්‍යක්ෂකොට එයට පැමිණ වාසය කරයි. (iii) මහණෙනි, මෙසේ පුද්ගල තෙම මතුවී එතර වූයේ වෙයි පරතෙරට ගිය බ්‍රාහ්මණ තෙම ගොඩසිටියේ වෙයි. (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

**16. අනිච්චානුපස්සි සූත්‍රයː-** 1. (මේ ඡේදය මේ වර්ගයේ 14 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. "කවර සත්දෙනෙක්ද යත්? මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් නිරන්තරයෙන් සිතින් ගැවසී ගත් ප්‍රඥාවෙන් අවබෝධ කරගත් සියලු සංස්කාරයන්හි අනිත්‍යය දකිමින් වාසය කරයි. (මේ වර්ගයේ 15 සූත්‍රයේ 9 (ii) ඡේදය යෙදිය යුතුයි.) (මෙහි මේ වර්ගයේ 14 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, නැවතද ඇතැම් පුද්ගලයෙක් නිරන්තරයෙන් සිතින් ගැවසීගත් ප්‍රඥාවෙන් අවබෝධ කරගත් සියලු සංස්කාරයන්හි අනිත්‍ය සංඥා ඇත්තේ අනිත්‍යය විඳින්නේ අනිත්‍යය දකිමින් වාසය කරයි. ඔහුට පෙරපසු නොව එකවිටම ආශ්‍රවයන්ගේ නැතිවීමද ජීවිතය නැතිවීමද (සිදුවෙයි) (මෙහි මේ වර්ගයේ 14 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

4. '(i) නැවතද මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් සියලු සංස්කාරයන්හි අනිත්‍යය දක්නේ අනිත්‍ය සංඥාව ඇත්තේ අනිත්‍යය සම්බන්ධ විශෙෂයෙන් දැනීම ඇති

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වූයේ නිරන්තරයෙන් සිතින් ගැවසීගත් ප්‍රඥාවෙන් අවබෝධ කරගත් හෙතෙම පස්වැදෑරුම් ඕරම්භාගිය සංයෝජනයන්ගේ ක්ෂයවීමෙන් (ii) අන්තරා පරිනිබ්බායීවේද, (මෙහි මේ වර්ගයේ 4 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

5. "(මෙහි 4 (i) යෙදිය යුතුයි) උපහච්ච පරිනිබ්බායි වේද, (මෙහි මේ 4 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

6. "(මෙහි 4 (i) යෙදිය යුතුයි.) අසංඛාර පරිනිබ්බායි වේද, (මෙහි මේ 4 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

7. "(මෙහි 4 (i) යෙදිය යුතුයි) සසංඛාර පරිනිබ්බායි වේද, (මෙහි මේ 4 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

8. අකනිට්ඨගාමී උද්ධංසොත නම් වූයේද, (මෙහි මේ 4 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.) (මෙහි 4 (i) යෙදිය යුතුයි.)

17. **දුක්ඛානුපස්සි සූත්‍රය**:- 1. (මේ සූත්‍රය මේ වර්ගයේ 16 සූත්‍රය මෙනි.) 'අනිත්‍ය' වෙනුවට 'දුක්' යෙදිය යුතුයි.)

18. අනත්තානුපස්සී සූත්‍රයː- (මේ සූත්‍රය මේ වර්ගයේ 16 සූත්‍රය මෙනි.) 'අනිත්‍ය' වෙනුවට 'අනාත්ම' යෙදිය යුතුයි.)

19. **නිබ්බාණ සුඛානුපස්සි සූත්‍රය**:- (මේ සූත්‍රය මේ වර්ගයේ 16 සූත්‍රය මෙනි.) 'අනිත්‍ය' වෙනුවට 'නිවන් සැප' යෙදිය යුතුයි.)

20. **නිද්දසවත්ථු සූත්‍රය**:- 1. "මහණෙනි, මේ නිර්දෝෂ වස්තූහු සතක් වෙති.

2. "කවර සතක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව ශික්ෂා සමාදානයෙහි දැඩි ආශාව ඇත්තේ වේද, මත්තෙහිද ශික්ෂාසමාදානයෙහි නොහළ පෙම් ඇත්තේ ධර්මය පිළිබඳ ඇල්මෙහි දැඩි ආශාව ඇත්තේ වේද, මත්තෙහිද ධර්මය පිළිබඳ ඇල්මෙහි නොහළ පෙම් ඇත්තේ ආශාව හික්මවීමෙහි දැඩි ආශාව ඇත්තේ වේද, මත්තෙහිද ආශාව හික්මවීමෙහි නොහළ පෙම් ඇත්තේ විවේකයෙහි දැඩි ආශාව ඇත්තේවේද, මත්තෙහිද විවේකයෙහි නොහළ පෙම් ඇත්තේ වීර්‍ය්‍යාරම්භයෙහි දැඩි ආශාව ඇත්තේ වේද, මත්තෙහිද වීර්‍ය්‍යාරම්භයෙහි නොහළ පෙම් ඇත්තේ ප්‍රඥා ස්මෘතියෙහි (සිහිනුවණෙහි) දැඩි ආශාව

ඇත්තේවේද, මත්තෙහිද ප්‍රඥා ස්මෘතියෙහි නොහළ පෙම් ඇත්තේ සම්‍යක් දෘෂ්ටිය ප්‍රතිවේධ කිරීමෙහි දැඩි ආශාව ඇත්තේ වේද, මහණෙනි, මේ සප්ත නිර්දෝෂ වස්තූහු වෙත්.”

---

## 3. වජ්ජිසත්තක වර්ගය.

**21. සාරන්දද අපරිහානිය සූත්‍රයඃ-** 1. “මා විසින් මෙසේ අසනලදී. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විශාලානුවර සමීපයෙහි වූ සාරන්දද නම් චෛත්‍යස්ථානයෙහි වැඩවාසය කරණසේක. එකල්හි වනාහි බොහෝ ලිච්ඡවීවරු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණුනාහ. එසේ පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක සිටියහ. එසේ සිටියාවූ ඒ ලිච්ඡවිවරුන්ට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

2. “ලිච්ඡවීනි, තොපට සප්ත අපරිහානිය ධර්මයන් දෙශනා කරන්නෙමි. එය අසව්, මනාකොට සිහිකරව්. දෙශනා කරන්නෙමි”යි (වදාළසේක.) ‘එසේය ස්වාමීනියි’ ඒ ලිච්ඡවීවරු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ.

3. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. “ලිච්ඡවීනි සප්ත අපරිහානිය ධර්මයෝ කවරහුද? ලිච්ඡවීනි යම්තාක් වජ්ජීහු නිතර නිතර රැස්වෙත්ද, රැස්වීම් බහුලකොට ඇත්තෝද, (ii) ලිච්ඡවීනි, වජ්ජීන්ගේ අභිවෘද්ධියම බලාපොරොත්තුවිය යුතුයි. පිරිහීමක් නොවේ.

4. “ලිච්ඡවීනි, යම්තාක් වජ්ජීහු සමගිව රැස්වෙත්ද, සමගිව නැගිටිත්ද, සමගිව වජ්ජීන් විසින් කටයුතුදේ කෙරෙද්ද (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

5. “ලිච්ඡවීනි, වජ්ජීහු යම්තාක් නොපැනවූවක් නොපණවද්ද, පැනවූදේ නොසිඳිද්ද, යම්සේ පණවනලද පුරාණ වජ්ජි ධර්මයන් සමාදන්ව වෙසෙද්ද, (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

6. “ලිච්ඡවීනි, වජ්ජීහු යම්තාක් ලිච්ඡවීන්ගේ යම් ඒ මහල්ලෝ ඇද්ද, ඔවුන්ට සත්කාර කෙරෙද්ද, ගරුකාර කෙරෙද්ද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

බහුමාන කෙරෙද්ද, පුදද්ද ඔවුන්ගේද ඇසිය යුත්තක් ඇතැයි සිතද්ද (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

7. "ලිච්ඡවීනි, වජ්ජීහු යම්තාක් යම් ඒ කුලස්ත්‍රීහු කුල කුමාරිහු ඇද්ද ඔවුන් හිංසාකොට බලහත්කාරයෙන් ගෙන වාසය නොකරවද්ද (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

8. "යම්තාක් ලිච්ඡවීනි, වජ්ජීහු ඔවුන්ගේ යම් ඒ අභ්‍යන්තරවූද, බාහිරවූද වජ්ජිචෛත්‍යයෝ ඇද්ද ඒවාට සත්කාර කෙරෙද්ද ගරුකාර කෙරෙද්ද, බහුමාන කෙරෙද්ද, පුදද්ද ඒවාට පෙර දුන්, පෙරකළ පුද නොපිරිහෙළද්ද (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

9 "යම්තාක් ලිච්ඡවීනි, වජ්ජීන්ගේ, රහතුන් වහන්සේලා කෙරෙහි කවරහෙයකින් නොපැමිණි රහත්හු විජිතයට පැමිණියාහුද පැමිණි රහත්හු විජිතයෙහි පහසුවෙන් වාසය කරන්නාහුදැයි ධාර්මික ආරක්ෂාව මනාකොට පිහිටුවනලද්දේ වේද, (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

10. "යම් හෙයකින් ලිච්ඡවීනි මේ සප්ත අපරිහානීය ධර්මයෝ වජ්ජීන් කෙරෙහි සිටිත්ද මේ සප්ත අපරිහානිය ධර්මයන්හි වජ්ජීන් යෙදෙනු පෙණෙද්ද ලිච්ඡවීනි, වජ්ජීන්ගේ අභිවෘද්ධියම බලාපොරොත්තු විය යුතුයි. පිරිහීමක් නොවේ."

**22. වජ්ජිඅපරිහානිය සූත්‍රයඃ-** 1. මා විසින් මෙසේ අසනලදී. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර ආසන්නයෙහිවූ ගිජ්ඣකූළ පව්වෙහි වැඩ වාසය කරණසේක. එකල්හි වනාහි විදෙහරට දේවියගේ පුත්‍රවූ අජාසත් නම් මගධ රජතෙම වජ්ජීන්ට විරුද්ධව යුද්ධයට යන්නට කැමති වූයේ වෙයි. හෙතෙම මෙසේ පැවසීය.

2. "මෙසේ මහර්ධිය ඇති මහානුභාව ඇති වජ්ජීන් මම විනාශ කරන්නෙමි. සිඳ දමන්නෙමි මුලිනුපුටන්නෙමි. වජ්ජීන්ට ව්‍යසන විපත්ති පමුණුවන්නෙමි' යනුයි.

3. ඉක්බිති අජාසත් මගධ රජතෙම මගධ මහාමාත්‍යවූ වස්සකාර බ්‍රාහ්මණයා ඇමතුවේය. 'බ්‍රාහ්මණය, තෝ මෙසේ

එව, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණෙව, එසේ පැමිණ මාගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් හිසින් වඳුව නිරෝගීබව, ආබාධ නැති බව අඩුපාඩු සැප විහරණ විචාරව, 'ස්වාමීනි, විදෙහ රටවැසි දේවියගේ පුත් අජාසත් නම් මගධ රජතෙම භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් හිසින් වඳියි. නිරෝගීබව, ආබාධ නැති බව අඩුපාඩු සැප විහරණයන් විචාරන්නේය යනුයි' මෙසේද කියව. 'ස්වාමීනි, අජාසත් රජතෙම වජ්ජීන්ට විරුද්ධව යුද්ධයට යනු කැමැත්තේ හෙතෙම මෙසේ කීය. (මෙහි 2 ඡේදය යෙදිය යුතුයි.)

'යම්සේ භාග්‍යවතුන් වහන්සේ දෙශනා කරත්ද එය මනාව ඉගෙණ (අවුත්) මට දන්වව. තථාගතයන් වහන්සේ සිදුනොවන්නක් දෙශනා නොකරයි' යනුයි.

4. "එසේය ස්වාමීනියි' මගධ මහාමාත්‍යවූ වස්සකාර බ්‍රාහ්මණයා අජාසත් රජුට පිළිවදන්දී අස්නෙන් නැගිට භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවිය. සතුටු වියයුතු සිහිකටයුතු පිළිසඳර කථාවකොට නිමවා එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටියාවූ මගධ මහාමාත්‍යවූ වස්සකාර බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළකෙළේය.

5. "භවත් ගෞතමයන් වහන්ස, විදේහ රටවැසි දේවියගේ පුත් අජාසත් නම් මගධ රජතෙම භවත් ගෞතමයන් වහන්සේගේ පාදයන් හිසින් වඳියි. 'සුළු ආබාධ සුළු අසනීප අඩුපාඩු සැපවිහරණ විචාරයි' මෙසේද කියයි." භවත් ගෞතමයන් වහන්ස, වජ්ජීන්ට විරුද්ධව යුද්ධයට යනු කැමැත්තේ හෙතෙම මෙසේ කීයේය. (මෙහි 2 ඡේදය යෙදිය යුතුයි.)

6. එකල්හි වනාහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ පිටුපසින් භාග්‍යවතුන් වහන්සේට පවන් සලමින් සිටියේවෙයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ඇමතූසේක.

7. "කිමෙක්ද? ආනන්දය, වජ්ජීහු නිතර එක්රැස්වූවාහු එක්රැස්වීම බහුලකොට ඇත්තාහුදැයි අසනලද්දේද?" යනුයි.

"ස්වාමීනි, වජ්ජීහු නිතර එක්රැස්වූවාහු එක්රැස්වීම බහුලකොට ඇත්තාහු යයි අසනලදී" "ආනන්දය, වජ්ජීහු රැස්වීම බහුලකොට ඇත්තාහු නිතර රැස්වූවෝ වන්නාහුද, වජ්ජීන්ගේ අභිවෘද්ධිය කැමතිවිය යුතුය.

8. "කිමෙක්ද? ආනන්දය, වජ්ජීහු සමගිව රැස්වෙද්ද, සමගිව නැගිටිත්ද, සමගිව කටයුතුදේ කෙරේදැයි අසන ලද්දේද?" යනුයි. "ස්වාමීනි, වජ්ජීහු සමගිව රැස්වෙත්ද, සමගිව නැගිටිත්ද, සමගිව කටයුතු කෙරෙත්දැයි අසනලදී." "ආනන්දය, වජ්ජීහු සමගිව රැස්වෙත්ද, සමගිව නැගිටිත්ද, සමගිව කටයුතු කෙරෙත්ද වජ්ජීන්ගේ අභිවෘද්ධිය කැමැති විය යුතුය.

9. "කිමෙක්ද? ආනන්දය, වජ්ජීහු නොපැනවූවක් නොපණවද්ද, පැනවූදේ නොසිඳිද්ද, යම්සේ පණවන ලද පුරාණ වජ්ජි ධර්මයන් සමාදන්ව වෙසෙදැයි අසන ලද්දේද? යනුයි" "ස්වාමීනි, වජ්ජීහු නොපැනවූවක් නොපණවත්, පැණවූදේ නොසිඳිත්, යම්සේ පණවනලද පුරාණ වජ්ජි ධර්මයන් සමාදන්ව වෙසෙත්යයි අසනලදී." "ආනන්දය, වජ්ජීහු නොපැණවූවක් නොපණවද්ද, පැනවූදේ නොසිඳිද්ද යම්සේ පණවනලද පුරාණ වජ්ජි ධර්මයන් සමාදන්ව වෙසෙද්ද, වජ්ජීන්ගේ අභිවෘද්ධිය කැමතිවිය යුතුයි.

10. "කිමෙක්ද? ආනන්දය, වජ්ජීහු වජ්ජීන්ගේ යම් ඒ මහල්ලෝ ඇද්ද, ඔවුන්ට සත්කාර කෙරෙත්ද, ගරුකාර කෙරෙත්ද බහුමාන කෙරෙත්ද, පුදත්ද ඔවුන්ගේද ඇසිය යුත්තක් ඇතැයි සිතත් දැයි අසනලද්දේද?" යනුයි. "ස්වාමීනි, වජ්ජීහු වජ්ජීන්ගේ යම් ඒ මහල්ලෝ ඇද්ද, ඔවුන්ට සත්කාර කෙරෙත්, ගරුකාර කෙරෙත්, බහුමාන කෙරෙත්, පුදත් ඔවුන්ගේද ඇසිය යුත්තක් ඇතැයි සිතත්යයි අසනලදී.' "ආනන්දය, වජ්ජීහු වජ්ජීන්ගේ යම් ඒ මහල්ලෝ ඇද්ද, ඔවුන්ට සත්කාර කෙරෙද්ද, ගරුකාර කෙරෙද්ද, බහුමාන කෙරෙද්ද, පුදද්ද ඔවුන්ගේද ඇසිය යුත්තක් ඇතැයි සිතද්ද, වජ්ජීන්ගේ අභිවෘද්ධිය කැමතිවිය යුතුයි.

11. "කිමෙක්ද? ආනන්දය, වජ්ජීහු යම් ඒ කුලස්ත්‍රීහු, කුලකුමාරිහු ඇද්ද, ඔවුන් හිංසාකොට, බලහත්කාරයෙන් ගෙන

වාසය නොකරවද්දැයි අසනලද්දේද?” යනුයි. “ස්වාමීනි, වජ්ජීහු යම් ඒ කුලස්ත්‍රීහු කුලකුමාරීහු ඇද්ද, ඔවුන් හිංසා කොට, බලහත්කාරයෙන් ගෙන වාසය නොකරවතියි අසන ලදී.” “ආනන්දය, වජ්ජීහු යම් ඒ කුලස්ත්‍රීහු කුලකුමාරීහු ඇද්ද, ඔවුන්ට හිංසාකොට බලහත්කාරයෙන් ගෙන වාසය නොකරවත්ද, වජ්ජීන්ගේ අභිවෘද්ධිය කැමති විය යුතුයි.

12. “කිමෙක්ද? ආනන්දය, වජ්ජීහු ඔවුන්ගේ යම් ඒ අභ්‍යන්තරවූද බාහිරවූද, වජ්ජිචෛත්‍යයෝ ඇද්ද ඒවාට සත්කාර කෙරෙද්ද, ගරුකාර කෙරෙද්ද, බහුමාන කෙරෙද්ද, පුදද්ද, ඒවාට පෙර දුන් පෙර කළ පුද නොපිරිහෙලද්දැයි අසන ලද්දේද” යනුයි. “ස්වාමීනි, වජ්ජීහු ඔවුන්ගේ යම් ඒ අභ්‍යන්තරවූද, බාහිරවූද, වජ්ජිචෛත්‍යයෝ ඇද්ද, ඒවාට සත්කාර කෙරෙත්, ගරුකාර කෙරෙත්, බහුමාන කෙරෙත්, පුදත්, ඒවාට පෙර දුන් පෙර කළ පුද නොපිරිහෙලත්යයි අසනලදී.” “ආනන්දය, වජ්ජීහු ඔවුන්ගේ යම් ඒ අභ්‍යන්තර වූද, බාහිරවූද, වජ්ජිචෛත්‍යයෝ ඇද්ද ඒවාට සත්කාර කෙරෙද්ද, ගරුකාර කෙරෙද්ද, බහුමාන කෙරෙද්ද, පුදද්ද, ඒවාට පෙර දුන් පෙර කළ පුද නොපිරිහෙලද්ද, වජ්ජීන්ගේ අභිවෘද්ධිය කැමැතිවිය යුතුය.

13. “කිමෙක්ද? ආනන්දය, වජ්ජීහු වජ්ජීන්ගේ රහතුන් වහන්සේලා කෙරෙහි කවර හෙයකින් නොපැමිණි රහත්හු විජිතයට පැමිණියාහුද පැමිණිරහත්හු විජිතයෙහි පහසුවෙන් වාසයකරන්නාහුදැයි ධාර්මික ආරක්ෂාව මනාකොට පිහිටුවන ලද්දේදැයි අසනලද්දේද?” යනුයි “ස්වාමීනි, වජ්ජීහු වජ්ජීන්ගේ රහතුන් වහන්සේලා කෙරෙහි කවර හෙයකින් නොපැමිණි රහත්හු විජිතයට පැමිණියාහුද පැමිණිරහත්හු විජිතයෙහි පහසුවෙන් වාසය කරන්නාහුය. ධාර්මික ආරක්ෂාව මනාකොට පිහිටුවන ලද්දේයයි අසනලදී.” “ආනන්දය, වජ්ජීහු වජ්ජීන්ගේ රහතුන් වහන්සේලා කෙරෙහි කවර හෙයකින් නො පැමිණි රහතුන් විජිතයට පැමිණියාහුද පැමිණි රහත්හු විජිතයෙහි පහසුවෙන් වාසය කරන්නාහුදැයි ධාර්මික ආරක්ෂාව මනාකොට පිහිටුවන ලද්දේවේද, වජ්ජීන්ගේ අභිවෘද්ධිය කැමතිවිය යුතුයි. පිරිහීමක් නොවේ”

14. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මගධ මහාමාත්‍යවූ වස්සකාර බ්‍රාහ්මණයා ඇමතූසේක. "බ්‍රාහ්මණය, මම එක්තරා කාලයක විශාලා නුවර ආසන්නයෙහිවූ සාරන්දද නම් චෛත්‍ය ස්ථානයෙහි විසීමි. එහිදී මම වජ්ජීන්ට මේ අපරිහානිය ධර්මයන් දේශනා කළෙමි. බ්‍රාහ්මණය, යම්තාක් මේ සප්ත අපරිහානිය ධර්මයෝ වජ්ජීන් කෙරෙහි පිහිටත්ද, මේ අපරිහානිය ධර්මයන් කෙරෙහි වජ්ජීහු ගරුකොට සලකද්ද, බ්‍රාහ්මණය, වජ්ජීන්ගේ අභිවෘද්ධිය කැමති විය යුතුය. පිරිහීමක් නොවේ."

15. "මෙසේ දේශනාකළ කල්හි මගධ මහාමාත්‍යවූ වස්සකාර බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළකළේය. "භවත් ගෞතමයන් වහන්ස, එකක් නමුදු මේ අපරිහානිය ධර්මයකින් යුක්තවූ වජ්ජීන්ගේ අභිවෘද්ධියම බලාපොරොත්තු විය යුතුය. පිරිහීමක් නොවේ. අපරිහානිය ධර්ම සතින්ම යුක්තනම් කියනුම කවරේද? භවත් ගෞතමයන් වහන්ස, විදෙහ දේවියගේ පුත්‍රවූ අජාසත් නම් මගධ රජු විසින් චාටු බස් කියා පෙළඹවීමෙන් හෝ ඔවුනොවුන් බිඳවීමකින් හෝ මිස වජ්ජීන් සමග යුද නොකටයුතුය. භවත් ගෞතමයන් වහන්ස, දැන් අපි යන්නෙමු බොහෝ වැඩ බොහෝ කටයුතු දේ ඇත."

"බ්‍රාහ්මණය, ඔබ දැන් කාලය දැනගත්තෙහිය." ඉක්බිති මගධ මහාමාත්‍යවූ වස්සකාර බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටුව අනුමෝදන්ව හුනස්නෙන් නැගිට ගියේය."

23. **පඨම භික්ඛු අපරිහානිය සූත්‍රය**:- 1 මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ආසන්නයෙහිවූ ගිජ්ඣකූළ පව්වෙහි වැඩවසන සේක එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූසේක. "මහණෙනි, තොපට සප්ත අපරිහානිය ධර්මයන් දේශනා කරන්නෙමි. එය මනාකොට අසව් සිහිකරව් දේශනා කරන්නෙමි."--"එසේය ස්වාමීනි'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළ සේක.

2. "මහණෙනි, සප්ත අපරිහානිය ධර්මයෝ කවරහුද? මහණෙනි, යම්තාක් භික්ෂූහු රැස්වීම බහුලකොට ඇත්තාහු

රැස්වෙද්ද (ii) මහණෙනි, භික්ෂූන්ගේ අභිවෘද්ධිය බලාපොරොත්තු විය යුතුයි. පිරිහීමක් නොවේ.

3. "මහණෙනි, යම්තාක් වනාහි භික්ෂූහු සමගිව රැස් වෙද්ද සමගිව නැගිසිටිද්ද, සමගිව සංඝයා පිළිබඳ කටයුතු කෙරෙද්ද (මෙහි 2 (ii) යෙදිය යුතුයි)

4. "මහණෙනි, යම්තාක් වනාහි භික්ෂූහු නොපැණවූවක් නොපණවද්ද, පැණවූදේ නොබිඳිද්ද යම්සේ පණවන ලද ශික්ෂා පදයන් සමාදන්ව සිටිද්ද, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

5. "මහණෙනි, යම්තාක් වනාහි භික්ෂූහු යම් ඒ පැවිදිව බොහෝ කල්වූ බොහෝ රාත්‍රීන් දන්නාවූ සංඝ පිතෘවරු සංඝ නායකවරු වෙද්ද, උන්වහන්සේලාට සත්කාර කෙරෙද්ද, ගරුකාර කෙරෙද්ද බහුමාන කෙරෙද්ද, පුදද්ද? උන්වහන්සේලාගේද ඇසිය යුත්තක් ඇතැයි සිතත්ද, (මෙහි 2 (ii) යෙදිය යුතුයි)

6. "මහණෙනි, යම්තාක් වනාහි භික්ෂූහු උපන්නාවූ නැවත භවයක් ඇතිකරන්නාවූ තෘෂ්ණාවගේ වසඟයට නොයද්ද, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.

7. "මහණෙනි, යම්තාක් වනාහි භික්ෂූහු අරණ්‍ය සෙනාසනයන්හි බලාපොරොත්තුව ඇතිකරගනිද්ද, මහණෙනි, යම් හෙයකින් වනාහි භික්ෂූහු වෙන්වෙන්ව කිමෙක්ද නො පැමිණියාවූ ප්‍රියශීලී සබ්‍රම්සරුන් පැමිණෙන්නාහුද පැමිණියාවූ ප්‍රියශීලී සබ්‍රම්සරුන් සැපසේ වෙසෙන්නාහුදැයි සිහිය පිහිටුවද්ද (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

8. "මහණෙනි, යම්තාක් මේ සප්ත අපරිහානිය ධර්මයෝ භික්ෂූන් කෙරෙහි පිහිටා තිබෙද්ද, භික්ෂූහු මේ සප්ත අපරිහානිය ධර්මයන් භික්ෂූන් කෙරෙහි තිබෙනු පෙණෙද්ද, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

(24-27 සූත්‍රවල 1 ඡේදය 23 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

**24 දුතිය භික්ඛු අපරිහානිය සූත්‍රයඃ-** 2 "ඒ අපරිහානිය ධර්ම සත කවරේද? මහණෙනි, යම්තාක් භික්ෂූහු කර්මාරාම

කටයුතු පතන්නෝ වෙද්ද, කර්මාරාම අනුයුක්ත කටයුතුවලම ඇලීගැලී සිටියෝ නොවෙද්ද, භස්සාරාම (නිතර දෙඩීමෙහි ඇළුනෝ) නොවෙද්ද, නිද්‍රාවෙහි ඇළුනෝ නොවෙද්ද, සමූහයෙහි ඇළුනෝ නොවෙද්ද, පවිටු අදහස් ඇත්තෝ නොවෙත්ද, පවිටු අදහස්වල වසඟයට නොගියාහු නොවෙද්ද, (පවිටු වූවෝ) නොවෙද්ද පාපමිත්‍රයන් ඇත්තේ, පාපසහායකයන් ඇත්තේ, පාපවංකවූවෝ ස්වල්ප මාත්‍ර විශෙෂාධිගමයකින් අඩාලකිරීමට නොපැමිණෙද්ද, මහණෙනි, භික්ෂූන්ගේ අභිවෘද්ධියම බලාපොරොත්තු වියයුතුයි. පිරිහීමක් නොවේ.

3 (මෙය මේ වර්ගයේ 23 සූත්‍රයේ 8 ඡෙදය මෙනි.)

**25 තතිය භික්ඛු අපරිහානිය සූත්‍රයː-** 2 "මහණෙනි, ඒ ධර්ම සත කවරේද? මහණෙනි, යම්හෙයකින් භික්ෂූහු ශ්‍රද්ධා ඇත්තෝ වෙද්ද, පවට ලජ්ජා ඇත්තෝ වෙද්ද, පවට බිය ඇත්තෝ වෙද්ද, (බහුශ්‍රැත) බොහෝ ඇසූ විරූ තැන් ඇත්තෝ වෙද්ද, පටන් ගත් වීයර්‍ය ඇත්තෝ වෙද්ද, සිහි ඇත්තෝ වෙද්ද, නුවණැත්තෝ වෙද්ද,

3 "මහණෙනි, භික්ෂූන්ගේ අභිවෘද්ධියම කැමතිවිය යුතුය පිරිහීම නොවේ. මහණෙනි මේ සප්ත අපරිහානිය ධර්මයෝ භික්ෂූන් කෙරෙහි පිහිටා ඇද්ද, මේ සප්ත අපරිහානිය ධර්මයන් කෙරෙහි භික්ෂූන් පිහිටා ඇතැයි පෙණෙද්ද භික්ෂූන්ගේ අභිවෘද්ධිය කැමතිවිය යුතුය. පිරිහීමක් නොවේ."

**26 චතුත්ථ භික්ඛු අපරිහානිය සූත්‍රයː-** 2 "ඒ සත කවරේද? ස්මෘති (සිහිය) සම්බොධ්‍යංගය වඩද්ද, ධර්මවිචය (ධර්මය විමසීම) සම්බොධ්‍යංගය වඩද්ද, වීර්ය සම්බොධ්‍යංගය වඩත්ද, ප්‍රීති සම්බොධ්‍යංගය වඩද්ද, ප්‍රශ්‍රබ්ධි (සන්සිඳීම) සම්බොධ්‍යංගය වඩද්ද, සමාධි (එකඟකම) සම්බොධ්‍යංගය වඩද්ද, උපෙක්ෂා (මැදහත්කම) සම්බොධ්‍යංගය වඩද්ද,

3 (මේ ඡෙදය මේ වර්ගයේ 25 සූත්‍රයේ 3 ඡෙදය මෙනි)

**27 පඤ්චම භික්ඛු අපරිහානිය සූත්‍රයː-** 2 "ඒ සත කවරේද? අනිත්‍ය සංඥාව වඩද්ද, අනන්ත සංඥාව වඩද්ද, අශුභ (පිළිකුල්)

සංඥාව වඩද්ද, ආදීනව (දොස්) සංඥාව වඩද්ද ප්‍රහාණ (ගෙවීම) සංඥාව වඩද්ද, විරාග (නොඇලීම) සංඥාව වඩද්ද, නිරොධ (නිවීමේ) සංඥාව වඩද්ද,

3 (මේ ඡෙදය මේ වර්ගයේ 25 සූත්‍රයේ 3 ඡෙදය මෙනි.)

28 **සෙඛපරිහානිය ධම්ම සූත්‍රයː-** 1 "මහණෙනි, මේ ධර්මයෝ සත්දෙන ශෛක්ෂ (රහත් ඵලය සඳහා පිළිපදින) භික්ෂුවගේ පිරිහීම පිණිස වෙති.

2 "ඒ කවර සතක්ද යත්? වැඩවලම යෙදී සිටීම, නිතර දෙඩීමෙහි ඇලීම, සමූහයෙහි ඇලීම, ඇස් ආදී ඉන්ද්‍රියයන්හි නොවසන ලද දොරවල් ඇති බව, භෝජනයෙහි පමණ නොදැනීම, සංඝයා කෙරෙහි සංඝ කටයුතු ඇද්ද, එහිදී ශෛක්ෂ භික්ෂුවයයි සිතා බලද්ද, සංඝයා කෙරෙහි ස්ථවිර (වැඩි මහළු) වූද චිරරාත්‍රඥ (බොහෝකල් දන්නා) වූද පැවිදිව බොහෝකල්වූද (ශාසනික) බර උසුලන්නාවූද ඔවුහු එයින් ප්‍රකට වෙත්යයි තමා වෙනස් ආකාරයකට පැමිණේද,

3 මේ සප්ත ධර්මයෝ ශෛක්ෂ භික්ෂුවගේ පිරිහීම පිණිස පවතිත්.

4 "මහණෙනි, මේ ධර්මයෝ සත්දෙන ශෛක්ෂ භික්ෂුවගේ නොපිරිහීම පිණිස වෙති.

5 "ඒ කවර සතක්ද යත්? වැඩවලම යෙදී නොසිටීම. නිතර දෙඩීමෙහි නොඇලීම, සමූහයෙහි නොඇලීම, ඇස් ආදී ඉන්ද්‍රියයන්හි වසන ලද දොරවල් ඇති බව, භෝජනයෙහි පමණ දැනීම, සංඝයා කෙරෙහි සංඝ කටයුතු ඇද්ද එහිදී ශෛක්ෂ භික්ෂුවයයි සිතා නොබලද්ද, සංඝයා කෙරෙහි ස්ථවිර (වැඩිමහළු) වූද චිරරාත්‍රඥ (බොහොකල් දන්නා) වූද පැවිදිව බොහෝකල්වූද (ශාසනික) බර උසුලන්නාවූද ඔව්හු එයින් ප්‍රකට වෙත්යයි තමා වෙනස් ආකාරයකට නොපැමිණේද, (මෙහි 4 ඡෙදය යෙදිය යුතුයි.)

29 **උපාසක පරිහානිය ධම්ම සූත්‍රයː-** 1 "මහණෙනි, මේ ධර්මයෝ සත්දෙනෙක් උපාසකයාගේ පිරිහීම පිණිස පවතිත්.

2 "කවර සතක්ද යත්? භික්ෂූන්ගේ දර්ශනය අඩු කෙරේද, බණ ඇසීමට පමාවේද, අධිශීලයෙන් (ඉහළ සිල්වලින්) නොහික්මේද, අප්‍රසාද බහුලවූයේවේද, ස්ථවිරවූද මධ්‍යමවූද නවකවූද භික්ෂූන් වහන්සේලා කෙරෙහි සිදුරු සොයමින් දොස්කීමේ අදහසින් බණ අසාද, මේ ශාසනයෙන් පිටත දන්දීමට සුදුස්සන් සොයාද, ඒ බාහිරකයන්ට මුලින්දී පසුව භික්ෂූන්ට දේද, (මෙහි 4 ඡේදය යෙදිය යුතුයි.)

3 "මහණෙනි, මේ ධර්මයෝ සත්දෙනෙක් උපාසකයාගේ නොපිරිහීම පිණිස පවතිත්.

4 "කවර සතක්ද යත්? භික්ෂූන්ගේ දර්ශනය අඩු නොකෙරේද? (මෙහි 3 ඡේදය යෙදිය යුතුයි.)

**30 උපාසක පරාභව ධම්ම සූත්‍රයː-** 1 "යම් උපාසකයෙක් භික්ෂූන් දැකීමට යාමද, බණ අසන්නට යාමද අඩු කෙරේද, පන්සිල් දසසිල් ආදී උත්තම ශීලයන්හි නොහික්මේද, භික්ෂූන් කෙරෙහි නොපැහැදීමද වඩාද, ගර්හා කරණ සිත් ඇත්තේ සිදුරු සොයන්නේ බණ අසන්ට කැමතිවේද යම් උපාසකයෙක් මේ ශාසනයෙන් පිටත දක්ෂිණාර්හයක්හු සොයාද, ඒ බාහිරකයන්ටදී පසුව භික්ෂූන්ට දේද, මනාකොට දෙශනාකරණ ලද මේ සප්ත ධර්මයන් සේවනය කරන්නාවූ උපාසකතෙම සද්ධර්මයෙන් පිරිහෙයි.

2 "යම් උපාසකයෙක් භික්ෂූන් දැකීමට යාමද බණ අසන්නට යාමද නොවළක්වාද උත්තම ශීලයෙහි හික්මේද භික්ෂූන් කෙරෙහි පැහැදීම වැඩේද දෝෂාරොපනය නොකරණ සිත් ඇත්තේ බණ අසන්ට කැමතිවේද, යම් උපාසකයෙක් මේ ශාසනයෙන් පිට දක්ෂිණාර්හයක්හු නොසොයාද මේ ශාසනයෙහි පූර්වසත්කාරය කෙරේද, මනාකොට දේශනා කරණලද සප්ත අපරිහානිය ධර්මයන් සේවනයකරන්නාවූ ඒ උපාසකතෙම සද්ධර්මයෙන් නොපිරිහෙයි"

**31 උපාසක විපත්ති ධම්ම සූත්‍රයː-** 1 "මහණෙනි, උපාසකයාට විපත්ති කරුණු සතක් වෙති. මහණෙනි, උපාසකයාට සම්පත්ති

කරුණු සතක් වෙති මහණෙනි, උපාසකයාට පිරිහීම් සතක් වෙති. මහණෙනි, උපාසකයාට වැඩීම් සතක් වෙති.

2 "කවර සතක්ද යත්? භික්ෂූන්ගේ දර්ශනය අඩු නොකරයි. බණ ඇසීමට ප්‍රමාද නොවෙයි. අධිශීලයෙහි හික්මෙයි. පැහැදීම බහුලකොට ඇත්තේ වෙයි. ස්ථවිරවූද මධ්‍යමවූද නවකවූද භික්ෂූන් කෙරෙහි දොස් නොසොයන අදහසින් සිදුරු නොසොයන අදහසින් බණ අසයි. මේ ශාසනයෙන් පිටත දන්දීමට සුදුස්සන් නොසොයයි. මේ ශාසනයෙහි භික්ෂූන්ට පූර්ව සත්කාරය කෙරෙයි. මහණෙනි, මේ උපාසකයාට අභිවෘද්ධි කරුණු වෙත්.

3 ("මෙහි 30 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.")

---

## 4. දෙවතා වර්ගය.

**32. පටිසන්ථාරගාරවතා සූත්‍රය:-** 1 "ඉක්බිත්තෙන් එක්තරා දෙවතාවෙක් රාත්‍රී මධ්‍යම යාමයෙහි (ii) දිළිසෙන පැහැයෙන් මුළු ජේතවනය ආලෝකකොට භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. එසේ පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එසේ සිටි දේවතාවා භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැළකෙළේය.

2. "ස්වාමීනි, කරුණු සතක් භික්ෂුවගේ නොපිරිහීම පිණිස පවතිත්.

3. "හේ කවර සතක්ද? ශාස්තෘන් වහන්සේ පිළිබඳ ගෞරවය, ධර්මය පිළිබඳ ගෞරවය, සංඝයා පිළිබඳ ගෞරවය ශික්ෂාව පිළිබඳ ගෞරවය, සමාධියපිළිබඳ ගෞරවය, අප්‍රමාදය පිළිබඳ ගෞරවය, පිළිසඳර කථාකිරීම පිළිබඳ ගෞරවයදැයි යන මේ ධර්මයෝ සත්දෙන ස්වාමීනි, භික්ෂුවගේ නොපිරිහීම පිණිස පවතියි.

4. ඒ දේවතාවා මෙසේ කීය. ශාස්තෘන් වහන්සේ එය අනුදත්සේක. ඉක්බිති ඒ දේවතාවා ශාස්තෘන් වහන්සේ මට

අනුදත්සේකැයි භාග්‍යවතුන් වහන්සේ ප්‍රදක්ෂිණාකොට වැඳ එතැන්හිම අතුරුදහන්වීය.

5. "ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ ඒ රාත්‍රිය ඇවෑමෙන් භික්ෂූන් අමතා මෙසේ දෙශනාකළසේක. 'මහණෙනි, මේ රාත්‍රියෙහි එක්තරා දෙවතාවෙක් රාත්‍රිය ආලොකකොට පැහැපත් වර්ණයෙන් සියලු ජේතවනය බබළවමින් මා යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. එසේ පැමිණ මා වැඳ එකත්පසෙක සිටියේය. එසේ සිටියාවූ ඒ දෙවතාවා මට මෙසේ සැළකෙළේය. (මෙහි 2, 3 ඡෙද යෙදිය යුතුයි.)

6. "මහණෙනි, ඒ දෙවතාවා මෙය සැළකොට ප්‍රදක්ෂිණා කිරීමෙන් මට වැඳ එතැන්හි අතුරුදහන් විය.

> 7. "කෙළෙස් තවනසුළුවූ භික්ෂුතෙම ශාස්තෲන් වහන්සේ ගරුකොට ඇත්තේද, ධර්මය ගරුකොට ඇත්තේද, සංඝයා කෙරෙහිද තියුණුවූ ගෞරවය ඇත්තේද, ශික්ෂාවෙහි තියුණුවූ ගෞරවය ඇත්තේද අප්‍රමාදය ගරුකොට ඇත්තේද, පිළිසඳරෙහි ගෞරවය ඇත්තේද එබඳු භික්ෂුතෙම පිරිහීමට අයොග්‍යවේ. නිර්වාණයාගේ සමීපයෙහි වේ."

33. **ඔත්තප්පගාරවතා සූත්‍රයː-** 1. "මහණෙනි, මේ රාත්‍රියෙහිම, එක්තරා දේවතාවෙක් ප්‍රථමයාමය ඉක්මවූ ඒ මනහර රාත්‍රියෙහි (මෙහි මේ වර්ගයේ 32 සූත්‍රයේ 1 (ii) සහ 2 ඡෙද යෙදිය යුතුයි.)

3."හේ කවරේද ශාස්තෲන්වහන්සේ පිළිබඳ ගෞරවය, ධර්මය පිළිබඳ ගෞරවය, සංඝයා පිළිබඳ ගෞරවය, ශික්ෂාව පිළිබඳ ගෞරවය, සමාධිය පිළිබඳ ගෞරවය, හිරිය හෙවත් පාපයට ලජ්ජාවීම පිළිබඳ ගෞරවය, ඔත්තප්පය හෙවත් පාපයට භයවීම පිළිබඳ ගෞරවය යන මේ ධර්මයෝ, ස්වාමීනි, භික්ෂුවගේ අපරිහානිය පිණිස පවතිත්ය යනුයි.

4. (මේ ඡෙදය මේ වර්ගයේ 32 සූත්‍රයේ 6 ඡෙදය මෙනි.)

> 5. "කෙළෙස් තවනසුළු භික්ෂුතෙම ශාස්තෲන් වහන්සේ ගරුකොට ඇත්තේද, ධර්මය ගරුකොට

ඇත්තේද, සංඝයා ගරුකොට ඇත්තේද, සමාධිය ගරුකොට ඇත්තේද, ශික්ෂාවෙහි තියුණුවූ ගෞරවය ඇත්තේද, පාපයෙහි ලජ්ජා භය දෙකින් යුක්තවූ ගුරු ආශ්‍රය ඇති ගෞරව සහිතවූ භික්ෂුතෙම පිරිහීමට අයොග්‍යවේ. නිර්වාණයාගේ සමීපයෙහි වේ.”

34. **කල්‍යාණමිත්තතා සූත්‍රය**:- 1 “මේ රාත්‍රියෙහි එක්තරා දෙවතාවෙක් ප්‍රථම යාමය ඉක්මවූ ඒ මනහර රාත්‍රියෙහි (මෙහි මේ වර්ගයේ 32 සූත්‍රයේ 1 (ii) සහ 2 ඡේදය යෙදිය යුතුයි.)

3. “හේ කවර සතක්ද, ශාස්තෘන් වහන්සේ පිළිබඳ ගෞරවය, ධර්මය පිළිබඳ ගෞරවය, සංඝයා පිළිබඳ ගෞරවය, ශික්ෂාව පිළිබඳ ගෞරවය, සමාධිය පිළිබඳ ගෞරවය, සුවච (කීකරු) භාවය, කල්‍යාණ මිත්‍රයන් ඇතිබවය, යන මේ ධර්මයෝ සත්දෙන, ස්වාමීනි, භික්ෂුවගේ නොපිරිහීම පිණිස පවතීය යනුයි.

4. (මේ ඡේදය මේ වර්ගයේ 32 සූත්‍රයේ 6 ඡේදය මෙනි.)

5. “කෙලෙස් තවනසුළු භික්ෂුතෙම ශාස්තෘන් වහන්සේ පිළිබඳ ගෞරවය ඇත්තේද, ධර්මය පිළිබඳව ගෞරවය ඇත්තේද, සංඝයා ගැන දැඩි ගෞරවය ඇත්තේද සමාධිය ගැන ගෞරවය ඇත්තේද, ශික්ෂාව උසස් ගෞරවය ඇත්තේද, කල්‍යාණ මිත්‍රයන් ඇත්තාවූ සුවචවූ ගුරු ආශ්‍රය ඇති ගෞරවය සහිතවූ (භික්ෂුතෙම) පිරිහීමට අයෝග්‍යවේ. නිර්වාණයාගේම සමීපයෙහිවේ.”

35. **සාරිපුත්ත කල්‍යාණමිත්ත සූත්‍රය**:- 1 මේ රාත්‍රියෙහිම එක්තරා දෙවතාවෙක් ප්‍රථමයාමය ඉක්මවූ ඒ මනහර රාත්‍රියෙහි. (මෙහි මේ වර්ගයේ 34 සූත්‍රයේ 1 (ii), 2 සහ 3 ඡේදය යෙදිය යුතුයි.)

4. “මහණෙනි, ඒ දෙවතාවා මෙය සැළකොට එතැන්හි අතුරුදහන් විය.

5. මෙසේ දෙශනාකළ කල්හි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන්වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළකළ සේක. “ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේ විසින් සංක්ෂෙපයෙන්

දෙශනා කරණලද මෙහි වනාහි විස්තර වශයෙන් අර්ථය මම දනිමි.

6. "ස්වාමීනි, මේ ශාසනයෙහි භික්ෂුව තමන් ශාස්තෘ ගෞරවයෙන් යුක්තවේද, ශාස්තෘ ගෞරවයේ ගුණ වණන්නේ ශාස්තෘ ගෞරවයෙන් තොර යම් ඒ භික්ෂූහු වෙද්ද ඔවුන්ද ශාස්තෘ ගෞරවය පිණිස යොදවාද, ශාස්තෘ ගෞරවයෙන් යුක්ත යම් භික්ෂූහු වෙද්ද, ඔවුන්ගේ ගුණය සුදුසු කාලයෙහි නොසඟවා ඇතිසේ කියයිද,

7. (මෙය 6 ඡෙදය මෙනි 'ශාස්තෘ' වෙනුවට 'ධම්ම' යෙදිය යුතුයි)

8. (මෙය 6 ඡෙදය මෙනි. 'ශාස්තෘ' වෙනුවට 'සංඝ' යෙදිය යුතුයි.

9. (මෙය 6 ඡෙදය මෙනි. 'ශාස්තෘ' වෙනුවට 'ශික්ෂා' යෙදිය යුතුයි)

10. (මෙය 6 ඡෙදය මෙනි. 'ශාස්තෘ' වෙනුවට 'සමාධි' යෙදිය යුතුයි)

11. (මෙය 6 ඡෙදය මෙනි. 'ශාස්තෘ' වෙනුවට 'සුවච' යෙදිය යුතුයි)

12. "ස්වාමීනි මේ ශාසනයෙහි භික්ෂුව තමන් කළ්‍යාණ මිත්‍රත්ව යන මෙයින් යුක්තවේද, කළ්‍යාණ මිත්‍රත්වය පිළිබඳ ගුණ කියන්නේ එයින් යුක්ත නොවූවන්ද එහි යොදවාද කළ්‍යාණ මිත්‍රත්වයෙන් යුක්ත යම් ඒ භික්ෂූහු වෙත්ද ඔවුන්ගේ ගුණය සුදුසු කල්හි නොසඟවා ඇතිසේ කියයිද, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂෙපයෙන් දෙශනා කරණ ලද මෙහි අර්ථය විස්තර වශයෙන් දනිමි යනුයි.

**36. සෙවිතබ්බ මිත්ත සූත්‍රය**:- 1. "කරුණු සතකින් යුක්තවූ මිත්‍රතෙම සේවනය කටයුතුයි.

2. "කවර සතකින්ද යත්? දෙන්නට දුෂ්කර දෙයක් දේද, කරන්නට දුෂ්කර දෙයක් කෙරේද, දුෂ්කර ඉවසීමක් ඉවසාද, ඔහුගේ රහස් මිත්‍රයාට ප්‍රකට කෙරේද, ඔහුගේ රහස් ආරක්ෂා

කෙරේද, විපතෙහිදී අත්නොහරීද, දුප්පත් මිත්‍රයා පහත්කොට නොසිතාද, මහණෙනි, මේ කරුණු සතින් යුක්තවූ මිත්‍රයා සේවනය කටයුතුය.

3. "දීමට දුෂ්කරවූ වස්තුවක් දේද, අමාරුවෙන් කටයුතු දෙයක් හෝ කෙරේද, යලිදු ඒ මිත්‍රයාගේ නපුරු වචන ඉවසාද, ඕහට තමාගේ රහස් කියාද, ඔහුගේ රහස් සඟවාද විපතෙහිදී අත්නොහරීද, මිත්‍රයා පහත්කොට නොසිතාද යන මේ කරුණු යම්පුද්ගලයකු කෙරෙහි විද්‍යමානවේද එබඳුවූ ඒ මිත්‍රතෙම මිත්‍රයන් කැමැත්තකු විසින් සේවනය කටයුතුය."

37. **අපිපනුජ්ජමාන සූත්‍රය**:- 1. "මහණෙනි, කරුණු සතකින් යුක්ත පැවිදි මිත්‍රයා ලිංගනාසනයෙන් නසනු ලැබීමෙනුදු (-එළවත්දීද) සේවනය කටයුතුය, භජනය කටයුතුය, පයුරුපාසනය (ආශ්‍රය) කටයුතුය.

2. "කවර සතකින්දයත්? ප්‍රියවූද, මන වඩන්නාවූද ගෞරවයෙන් සැලකියයුතුවූද, යහපත් වචන කථාකරන්නාවූද, අර්ථයෙන් ගැඹුරු කථාකරන්නාවූද, අසමානයෙහි නොයෙදෙන්නාවූද යන කරුණු සතින්යුක්ත (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

3. "ස්වකීය ශීලයෙන් ප්‍රිය ඇත්තේද, ගරුවූයේද සම්භාවනා කටයුතුද, කීමෙහි දක්ෂවේද, පිළිවිසි තෙපුල් ඉවසන්නේද, ගැඹුරු කථාව කරන්නේද අස්ථානයෙහි නොයොදන්නේද යන කරුණු සත මේ ලෝකයෙහි යම් පුද්ගලයක්හු කෙරෙහි විද්‍යමාන වෙත්ද, ස්වකීය හා අනුන්ගේ දියුණුව කැමති අනුකම්පා කරන්නාවූ එබඳුවූ ඒ (පැවිදි) මිතුරුතෙම ලිංගනාසනයෙන් නසනු ලබන්නහු විසින් (එලවත්ද) ද භජනය කටයුතුවේ."

38. **පටිසම්භිදා සච්ජිකරණ සූත්‍රය**:- 1 "කරුණු සතකින් යුක්ත භික්ෂුතෙම කල් නොයවාම සිවුපිළිසිඹියා, තෙමේ මනා කොට දැන ප්‍රත්‍යක්ෂකොට එයට පැමිණ වාසය කරන්නේය.

2. 'කවර සතකින්ද යත්? මෙය මාගේ සිතෙහි මැලි බවයයි තත්වූ පරිදි දනියි. ආධ්‍යාත්මිකවූද සංක්ෂිප්ත (හැකුළුණු) සිත

ආධ්‍යාත්මික සංක්ෂිප්ත සිතයයි තත්වූ පරිදි දනියි. බාහ්‍යවූ වික්ෂිප්ත (විසිරුන) සිත බාහ්‍යවූ වික්ෂිප්ත සිතයයි තත්වූ පරිදි දනියි. ඕහට සප්පාය අසප්පායයෙහි දන්නේම වේදනාවෝ උපදිත්. දන්නේම වැටහෙත්. දන්නේම නැතිවෙත්. දන්නේම සංඥාවෝ උපදිත්. දන්නේම වැටහෙත්. දන්නේම නැතිවෙත්. දන්නේම විතර්කයෝ උපදිත්. දන්නේම වැටහෙත්. දන්නේම නැතිවෙත් හෙතෙම ඔහුගේ ප්‍රඥාවෙන් හීන ප්‍රණීත ධර්මයන්ද කළු සුදු සප්‍රතිභාගයන්හි (සමානව පෙනෙන දෙයෙහි) නිමිත්ත මනාකොට සිහි කරණ ලද්දේ උපධාරණය කරණ ලද්දේ (සලසන ලද්දේ) ප්‍රතිවෙධකරණ ලද්දේ (තේරුණු) යහපත්සේ ගන්නා ලද්දේ වෙයි. (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

3. "කරුණු සතකින් යුක්තවූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සිවුපිළිසිඹියා තෙමේ මනාකොට දැන ප්‍රත්‍යක්ෂකොට එයට පැමිණ වාසය කරයි.

4. "කවර සතකින්දයත්? මහණෙනි, මේ ශාසනයෙහි ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙය මාගේ සිතේ මැලිබවයයි තත්වූ පරිදි දනියි. ආධ්‍යාත්මිකවූ සංක්ෂිප්ත (හැකුළුන) සිත මාගේ සංක්ෂිප්ත (හැකුළුන) සිතයයි මනාකොට දනියි. බාහ්‍යවූ වික්ෂිප්ත (විසිරුණු) සිත බාහ්‍යවූ මාගේ වික්ෂිප්ත (විසිරුණු) සිතයයි තත්වූ පිරිද දනියි. සප්පාය අසප්පායයෙහි ඕහට (ඒ ශාරීපුත්‍ර ස්ථවිරයන්ට) දන්නේම වේදනාවෝ උපදිත්. දන්නේම වැටහෙත්. දන්නේම නැතිවෙත්. දන්නේම විතර්කයෝ උපදිත්. දන්නේම වැටහෙත්. දන්නේම නැතිවෙත්. ප්‍රඥාවෙන් හීන ප්‍රණීත ධර්මයන්හිද, කෘෂ්ණ ශුක්ල සප්‍රතිභාගයන්හි නිමිත්ත මනාකොට සිහිකරණලද්දේ උපධාරණය කරණලද්දේ ප්‍රතිවෙධ කරණලද්දේ යහපත්සේ ගන්නාලද්දේ වෙයි (මෙහි 3 ඡේදය යෙදිය යුතුයි.)

**39. මිත්තවසවත්තන සූත්‍රය**:- 1. "මහණෙනි, කරුණු සතකින් යුක්තවූ භික්ෂුව සිත වසඟකොට වෙසෙයි. නොඑසේවූ භික්ෂුව සිත වසඟකොට නොවෙසෙයි.

2. "කවර සතකින්ද යත්? මහණෙනි, මේ සස්නෙහි භික්ෂුව සමාධියට දක්ෂවේද, සමාධියට සමවැදීමේ දක්ෂවේද සමාධියට

සමවැද සිටීමේ දක්ෂවේද සමාධියෙන් නැගිටීමේ දක්ෂවේද සමාධියට සුදුසු දක්ෂකමින් යුක්තවේද සමාධියට සුදුසු භූමිය සෙවීමේ දක්ෂවේද සමාධි අභිනීහාරයට (ප්‍රාර්ථනාවට) දක්ෂවේද, මහණෙනි, (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, කරුණු සතකින් යුක්තවූ ශාරීපුත්‍ර ස්ථවිරතෙම සිත වසඟකොට වෙසෙයි. නොඑසේවූ ශාරීපුත්‍ර ස්ථවිරතෙම සිත වසඟකොට නොවෙසෙයි.

4. "කවර කරුණු සතකින්ද යත්? මහණෙනි, මේ සස්නෙහි ශාරීපුත්‍ර ස්ථවිරතෙම සමාධියට දක්ෂවේද, සමාධියට සම වැදීමේ දක්ෂවේද, සමාධියට සමවැද සිටීමේ දක්ෂවේද, සමාධියෙන් නැගිටීමේ දක්ෂවේද, සමාධියට සුදුසු දක්ෂකමින් යුක්තවේද, සමාධියට සුදුසු භූමිය සෙවීමේ දක්ෂවේද, සමාධි අභිනීහාරයට දක්ෂවේද, යන මේ ධර්ම සතින් යුක්තවූ ශාරීපුත්‍ර ස්ථවිරතෙම සිත වසඟ කොට වෙසෙයි. නො එසේවූ ශාරීපුත්‍ර ස්ථවිරතෙම සිත වසඟ කොට නො වෙසෙයි.

**40. ශාරිපුත්තනිදස්ස භික්ඛු සූත්‍රයඃ-** 1. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩ වසනසේක. එකල්හි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ හැඳ පොරවා පා සිවුරු රැගෙන සැවැත් නුවර පිඬු පිණිස පිවිසිසේක. ඉක්බිත්තෙන් උන්වහන්සේට මේ අදහස ඇති විය. එනම් (ii) 'සැවැත් නුවර පිඬු පිණිස හැසිරෙන්නට තවම කල් නොපැමිණියේය. එබැවින් මම අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන්ගේ ආරාමයක් යම් තැනෙකද එතැන්හි එළඹෙන්නෙම් නම් ඉතා යෙහෙක' යනුයි.

2. ඉක්බිත්තෙන් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන්ගේ ආරාමයක් යම්තැනෙකද එතැන්හි පැමිණිසේක. එසේ පැමිණ ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන් සමග සතුටුවූහ. සතුටු විය යුතු සිහිකටයුතු තොරතුරු කථාව නිමවා එකත්පසෙක වැඩහුන්හ. (ii) එකල්හි වනාහි එක්ව රැස්වූ ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන් අතර මේ අතුරු කථාවක් පහළ

විය. 'ඇවැත්නි, යමෙක් වනාහි දොළොස් වසක් පරිපූර්ණවූ පරිශුද්ධවූ බ්‍රහ්මචරියාවෙහි හැසිරේද, කල් පිරුණු භික්ෂුව යයි ඔහට කියන්ට සුදුසුය' කියායි.

3. "එකල්හි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන්ගේ කථාවට සතුටු නොවූහ. පිළිතුරු නොදුන්හ. සතුටු නොව පිළිතුරු නොදී භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහිදී මේ කථාව පිළිබඳ අර්ථය දැනගන්නෙමියි හුනස්නෙන් නැගිට වැඩිසේක.

4. 'ඉක්බිත්තෙන් ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සැවැත් නුවර පිඬු පිණිස හැසිර සවස් වේලෙහි ආපසු පැමිණෙන්නේ, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැන්හි පැමිණියහ. එසේ පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක වැඩහුන්හ. එකත්පසෙක වැඩ සිටි ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළසේක.

5 "ස්වාමීනි, මම පෙරවරු කාලයෙහි හැඳ පොරවා සැවැත් නුවර පිඬු පිණිස හැසුරුනෙමි. ස්වාමීනි, ඒ මට මේ අදහස විය. (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) (ii) ස්වාමීනි, එකල්හි මම අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන්ගේ ආරාමය යම් තැනෙකද එතැන්හි පැමිණියෙමි. එසේ පැමිණ ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන් සමග සතුටුවීමි. සතුටු වියයුතු සිහිකටයුතු කථාව නිමවා එකත්පසෙක හුන්නෙමි. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

6. "ස්වාමීනි, එකල්හි මම ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන්ගේ වචනයට සතුටු නොවීමි. පිළිතුරු නොදුනෙමි. එසේ සතුටු නොවී පිළිතුරු නොදී භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහිදී මේ කථාවේ අර්ථය දැනගන්නෙමියි හුනස්නෙන් නැගිට බැහැර ගියෙමි යනුයි.

7. "ස්වාමීනි, මේ ධර්ම විනය නම් ශාසනයෙහි හුදෙක් වර්ෂ ගණන මාත්‍රයෙන් කල් පිරුණු භික්ෂුව යයි කියන්නට හැක්කේද?"

8. "ශාරීපුත්‍රය, මේ ධර්ම විනය නම් ශාසනයෙහි හුදෙක් වර්ෂ ගණන මාත්‍රයෙන් කල් පිරුණු භික්ෂුවයයි කියන්ට

නොහැක්කේය. ශාරිපුත්‍රය, මේ කල් පිරීමේ වස්තු සතක්, මා විසින් ස්වයංභූඥානයෙන් (මා ම) ප්‍රත්‍යක්ෂ කොට දැන ගන්නා ලදී.

9. "ඒ කවර සතක්ද? ශාරීපුත්‍රය, මේ ශාසනයෙහි මහණතෙම ශික්ෂා සමාදානයෙහි දැඩිවූ ආශා ඇත්තේවේද, නැවතද ශික්ෂා සමාදානයෙහි නොහළ පෙම් ඇත්තේ ධර්ම නිකාන්තියෙහි දැඩිවූ ආශාව ඇත්තේද, මත්තෙහිද ධර්ම නිකාන්තියෙහි නොහළ පෙම් ඇත්තේවේද, ආශාව තුනී කිරීමෙහි දැඩිවූ කැමැත්ත ඇත්තේද, මත්තෙහිද ආශාව තුනී කිරීමෙහි නොහළ පෙම් ඇත්තේ විවේකයෙහි දැඩි ආශාව ඇත්තේද, මත්තෙහිද විවේකයෙහි නොහළ පෙම් ඇත්තේ වීර්‍ය්‍යාරම්භයෙහි දැඩි ආශාව ඇත්තේවේද, මත්තෙහිද, වීර්‍ය්‍යාරම්භයෙහි නොහළ පෙම් ඇත්තේ ස්මෘති ප්‍රඥාවෙහි (සිහි නුවණෙහි) දැඩි ආශාව ඇත්තේවේද, මත්තෙහිද ස්මෘති ප්‍රඥාවෙහි නොහළ පෙම් ඇත්තේ සම්‍යක් දෘෂ්ටිය (නිවැරැදි දැකීම) ප්‍රතිවෙධ කිරීමෙහි දැඩි ආශාව ඇත්තේවේද, මත්තෙහිද සම්‍යක් දෘෂ්ටිය ප්‍රතිවෙධ කිරීමෙහි නොහළ පෙම් ඇත්තේ වේද, ශාරීපුත්‍රය, මේ කල් පිරීමේ කරුණු සත මවිසින් ස්වයම්භූඥානයෙන් (මා ම) දැන ප්‍රකට කරණ ලදී.

10. "ශාරීපුත්‍රය, මේ කල් පිරීමේ කරුණු සතින් යුක්ත වූ භික්ෂුව දොළොස් වසක් නමුදු පරිපූර්ණවූ පරිශුද්ධවූ බ්‍රහ්මචර්‍ය්‍යාව හැසිරේද කල් පිරුණු භික්ෂුව යයි කියන්ට සුදුසුය. සතිස් වසක් නමුදු පරිපූර්ණවූ පරිශුද්ධවූ බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරේද කල් පිරුණු භික්ෂුව යයි කියන්ට සුදුසුය. අට සතලිස් වසක් හෝ පරිපූර්ණවූ පරිශුද්ධවූ බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරේද කල් පිරුණු භික්ෂුවයයි කියන්ට සුදුසුයි."

**41. ආනන්ද නිදස්ස භික්ඛු සූත්‍රයː-** 1. "මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසඹෑ නුවර සමීපයෙහිවූ ඝොසිතාරාමයෙහි වැඩ වසන සේක. එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු රැගෙන කොසඹෑ නුවර පිඬු පිණිස

පිවිසියහ. ඉක්බිත්තෙන් ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේට මේ අදහස විය. 'කොසඹෑ නුවර පිඬු පිණිස හැසිරෙන්නට තව කල් ඇත්තේය. මම අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන්ගේ ආරාමය යම් තැනෙකද එතැන්හි එළඹෙන්නෙම් නම් ඉතා යෙහෙක යනුයි.

**2.** "ඉක්බිත්තෙන් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන්ගේ ආරාමය යම් තැනෙකද එතැන්හි පැමිණියහ. පැමිණ ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන් සමග සතුටු වූහ. සතුටු වියයුතු සිහිකටයුතු කථාව කොට නිමවා එකත්පසෙක වැඩහුන්හ. (ii) (මෙහි මේ වර්ගයේ 40 සූත්‍රයේ 4 (ii) යෙදිය යුතුයි.)

**3.** "ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන්ගේ කථාවට සතුටු නොවූහ. පිළිතුරු නොදුන්හ. සතුටු නොව පිළිතුරු නොදී භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහිදී මෙහි අර්ථය දැනගන්නෙමියි හුනස්නෙන් නැගිට වැඩියහ

**4.** "ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ කොසඹෑ නුවර පිඬු පිණිස හැසිර සවස් වේලෙහි පිණ්ඩපාතයෙන් වැළකුනේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැන්හි පැමිණියහ. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක සිටියාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළ කළහ.

**6.** "ස්වාමීනි, මම පෙරවරුයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙන කොසඹෑ නුවර පිඬු පිණිස හැසුරුනෙමි. ඒ මට මේ අදහස විය. (මෙහි 1 (ii) ද 4 (ii) ද 2 (ii) යෙදිය යුතුයි.) එකල්හි පිරිසිදු බඹසර හැසිරේද,

**6. 7.** (මෙහි මේ වර්ගයේ 40 සූත්‍රයේ 6, 7 ඡේද යෙදිය යුතුයි.)

**8.** "ආනන්දය, මේ ධර්ම විනය නම් ශාසනයෙහි හුදෙක් වස් ගණනින් පමණක් කල් පිරුණු භික්ෂුවයයි කියන්ට

නොහැක්කේය ආනන්දය, මේ කල් පිරීමේ කරුණු සතකි. මා විසින් ස්වයංභූඥායෙන් (මා ම) ප්‍රත්‍යක්ෂ කොට දැනගන්නා ලදී. ඒ සත කවරේද? ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම ශ්‍රද්ධාව ඇත්තේද, පාපයට ලජ්ජාව ඇත්තේද, පාපයට භය ඇත්තේද, බහුශ්‍රැත වේද, පටන් ගන්නා ලද වීර්‍ය්‍ය ඇත්තේ වේද, සිහි ඇත්තේ වේද, ප්‍රඥාවෙන් යුක්ත වේද, ආනන්දය, මේ කල් පිරීමේ කරුණු හත මා විසින් ස්වයම්භූඥානයෙන් (මා ම) ප්‍රත්‍යක්ෂකොට දැනගන්නා ලදී. ආනන්දය, මේ කල් පිරීමේ කරුණු සතින් යුක්ත භික්ෂුව දොළොස් වසක් නමුදු පරිපූර්ණවූ පිරිසිදු බඹසර හැසිරේද, නිර්දෝෂී භික්ෂුව යයි කියන්ට සුදුසුය. සිවු විසි වසක්-අට සතලිස් වසක් නමුදු පරිපූර්ණවූ පිරිසිදු බඹසර හැසිරේද කල්පත් භික්ෂුවයයි කියන්ට සුදුසුය" යනුයි.

---

## 5. මහායඤ්ඤ වර්ගය

42. විඤ්ඤාණට්ඨිති සූත්‍රයː- 1. "මහණෙනි, මේ විඥාන ස්ථිති (සිත පැවතීම්) සතක් වෙති.

2. "කවර සතක්ද යත්? මහණෙනි, නානත්තකාය නානත්ත සංඥීවූ සත්වයෝ ඇත්තාහ. සමහර මනුෂ්‍යයෝද ඇතැම් දෙවියෝද ඇතැම් විනිපාතිකයෝ (අපායගතහු) ද වෙති මේ ප්‍රථම (පළමු) විඥානස්ථිතියයි. මහණෙනි, නානත්තකායවූද ඒකත්ත සංඥීවූද සත්වයෝ ඇත්තාහ. සමහර දෙවියෝද ප්‍රථමයෙන් පහළවූ ඇතැම් බ්‍රහ්මකායිකයෝද වෙති. මේ දෙවෙනි විඥානස්ථිතියයි. මහණෙනි, ඒකත්තකායවූද නානත්ත සංඥීවූද සමහර සත්වයෝ ඇත්තාහ. ඇතම් ආභස්සර දෙවියෝ වෙති. මේ තුන්වෙනි විඥානස්ථිතියයි. මහණෙනි, ඒකත්ත කායනම්වූද ඒකත්ත සංඥීවූද ඇතැම් සත්වයෝ ඇත්තාහ. ඇතැම් සුභකිණ්හ දෙවියෝ වෙති. මේ සතරවෙනි විඥානස්ථිතියයි. මහණෙනි, සර්ව ප්‍රකාරයෙන් රූප සංඥාව දුරුකොට පටිඝසංඥාව අස්තංගම කොට (නොපෙනෙනු කොට) නානත්ත සංඥාවන් සිහි නොකිරීමෙන් අනන්ත ආකාශයයි. ආකාශානඤ්චායතනයට

පැමිණියාවූ සත්වයෝ ඇත්තාහ. මේ පස්වැනි විඥානස්ථිතියයි මහණෙනි, සර්වප්‍රකාරයෙන් ආකාශානඤ්චායතනය දුරුකොට අනන්ත විඤ්ඤාණයයි විඤ්ඤානඤ්චායතනයට පැමිණියාවූ ඇතැම් සත්වකෙනෙක් ඇත්තාහ මේ සයවන විඤ්ඤානස්ථිති යයි. මහණෙනි, සර්වප්‍රකාරයෙන් විඤ්ඤානඤ්චායතනය දුරු කොට කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණියාවූ ඇතැම් සත්වකෙනෙක් ඇත්තාහ මේ සත්වන විඤ්ඤානස්ථිති යයි. මහණෙනි, මේ විඤ්ඤානස්ථිති සතවෙති.

43. **සමාධි පරික්ඛාර සූත්‍රය**:- 1. "මහණෙනි, මේ සමාධි පරිෂ්කාරයෝ (උවමනා දේ) සතක්වෙති.

2. "කවර සතක්ද යත්? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතියද වෙති මහණෙනි යමක් මේ සප්තාංගයන්ගෙන් චිත්තයාගේ එකාග්‍රතාවන් (සිත එකඟකමින්) වටකරණ ලද්දේද මහණෙනි, මේ ආර්‍ය්‍ය සම්‍යක් සමාධියයි කියනු ලැබේ."

44. **සත්තග්ගි සූත්‍රය**:- 1 "මහණෙනි, මේ ගිනි සතක් වෙති. කවර සතක්ද යත්? රාගය නමැති ගින්න, ද්වේෂය නමැති ගින්න, මෝහය නමැති ගින්න, ආහුණෙය්‍ය නමැති ගින්න, ගෘහපති නමැති ගින්න, දක්ෂිණෙය්‍ය නමැති ගින්න, දරවලින් ඇතිවන ගින්න යනුයි. මහණෙනි, මේ සප්ත අග්නීහු වෙති."

45. **මහායඤ්ඤ (උග්ගත ශරීර) සූත්‍රය**:- 1 එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු මහසිටුහු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි උග්ගත ශරීර නම් බ්‍රාහ්මණයාගේ මහා යාගයක් එළඹියේ වෙයි. පන්සියයක් ගවයෝ යාගය පිණිස යාග කණුවෙහි යොදන ලද්දේවිය. පන්සියයක් ලොකු වස්සෝ යාගය පිණිස යාග කණුවෙහි යොදන ලද්දේ විය. පන්සියයක් ලොකු වැස්සියෝ යාගය පිණිස යාග කණුවෙහි යොදන ලද්දේ විය. පන්සියයක් එළුවෝ යාගය පිණිස යාග කණුවෙහි යොදන

ලද්දේ විය. පන්සියයක් බැටළුවෝ යාගය පිණිස යාග කණුවෙහි යොදන ලද්දේ විය.

2. එකල්හි උග්ගත ශරීරනම් බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවිය. සතුටුවිය යුතු සිහි කටයුතු කථාවකොට නිමවා එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටියාවූ උග්ගත ශරීර නම් බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළේය.

3. "භවත් ගෞතමයන්වහන්ස, ගිනිපිදීම යාගකණුව එසවීම මහත්ඵල මහානිශංසය ඇතැයි මා විසින් අසනලදී."

'බ්‍රාහ්මණය, ගිනි පිදීම, යාග කණුව එසවීම මහත් ඵල මහානිශංසය ඇතැයි මා විසින්ද අසනලදී." උග්ගත ශරීර නම් බ්‍රාහ්මණ තෙම දෙවෙනි වරටද තුන්වන වරටද 'භවත් ගෞතමයන් වහන්ස, ගිනිපිදීම, යාගකණුව එසවීම මහත් ඵල මහානිශංසය ඇතැයි මා විසින් අසනලදී." යන මෙය භාග්‍යවතුන් වහන්සේට සැළකළේය.

"බ්‍රාහ්මණය, ගිනිපිදීම, යාගකණුව එසවීම මහත් ඵල මහානිශංසය ඇතැයි මා විසින්ද අසනලදී.

4. "භවත් ගෞතමයන් වහන්ස, භවත් ගෞතමයන් වහන්සේගේ හා අපගේ මේ කාරණයෙන් සර්වප්‍රකාරයෙන් සමත්වයක් ඇතිවූයේ වෙයි." මෙසේ ප්‍රකාශ කළ කල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ උග්ගත ශරීර නම් බ්‍රාහ්මණයාට මෙසේ කීහ.

5. "භවත් ගෞතමයන් වහන්ස, ගිනිපිදීම, යාගකණුව එසවීම මහත්ඵල මහානිශංසයයි මා විසින් අසන ලදී." යනුවෙන් බ්‍රාහ්මණය, තථාගතයන් වහන්සේගෙන් මෙසේ ප්‍රශ්න නොකටයුතුය. බ්‍රාහ්මණය, මෙසේ වනාහි ප්‍රශ්න කටයුතුය. (ii) 'ස්වාමීනි, මම ගිනිපුදනු කැමැත්තේ වෙමි. යාගකණුව ඔසවනු කැමැත්තේ වෙමි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, යමක් මට බොහෝ කල් හිත සුව පිණිස පවත්නේනම් ස්වාමීනි,

භාග්‍යවතුන් වහන්ස, මට අවවාද කරණ සේක්වා. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මට අනුශාසනය කරණ සේක්වා.

**6.** ඉක්බිති උග්ගත ශරීරනම් බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළකළේය. "භවත් ගෞතමයන් වහන්ස; (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

7 'බ්‍රාහ්මණය, ගිනි පුදන තැනැත්තේ යාග කණුව ඔසවන තැනැත්තේ යාගයට මුලින්ම අකුශලවූ දුක් දෙන්නාවූ දුක්ඛ විපාකවූ ආයුධ තුනක් ඔසවයි. කවර තුනක්ද යත්. කාය ශස්ත්‍රය (කය නමැති ආයුධය) වචී ශස්ත්‍රය (වචනය නමැති ආයුධය) මනඃ ශස්ත්‍රය (සිත නමැති ආයුධය) යන මේ තුනයි. බ්‍රාහ්මණය, ගිනි පුදන්නේ, යාග කණුව ඔසවන්නේ යාගයෙහි පෙරටුව මෙසේ සිතක් උපදවයි. කෙසේද? (ii) යාගය පිණිස මෙපමණ ගවයෝ මරත්වා! යාගය පිණිස මෙපමණ ලොකු වස්සෝ මරත්වා! යාගය පිණිස මෙපමණ ලොකු වැස්සියෝ මරත්වා! යාගය පිණිස මෙපමණ එළුවෝ මරත්වා! යාගය පිණිස මෙපමණ බැටළුවෝ මරත්වා! යනුවෙනි. හෙතෙම පිනක් කරන්නෙමි'යි පවක් කරයි. කුශලයක් කරන්නෙමියි අකුශලයක් කරයි. සුගති මාර්ගයක් සොයන්නෙමි'යි දුර්ගති මාර්ගයක් සොයයි. (ii) බ්‍රාහ්මණය, ගිනි පුදන තැනැත්තේ යාගකණුව ඔසවන තැනැත්තේ යාගයෙන් පෙරටුව අකුශලවූ දුක් ගෙනදෙන්නාවූ දුක්ඛ විපාකවූ මේ පළමුවන සිත නමැති ආවුධය ඔසවයි.

8 "බ්‍රාහ්මණය, නැවතද ගිනි පුදන්නේ යාග කණුව ඔසවන්නේ යාගයෙන් පෙරටුව මෙබඳු වචනයක් කියයි. (මෙහි 7 (ii) යෙදිය යුතුයි.)

9 "බ්‍රාහ්මණය, නැවතද ගිනි පුදන්නේ යාග කණුව ඔසවන්නේ යාගයෙන් පෙරටුව මෙපමණ ගවයෝ මරත්වා'යි තෙමේ පළමුකොට මරයි. යාගය පිණිස ලොකු වස්සෝ මරත්වායි තෙමේ පළමුකොට මරයි. යාගය පිණිස එළුවෝ මරත්වායි තෙමේ පළමුකොට මරයි. යාගය පිණිස බැටළුවෝ මරත්වායි තෙමේ පළමුකොට මරයි. හෙතෙම පිණක් කරන්නෙමියි පවක් කරයි. කුශලයන් කරන්නෙමි'යි අකුශලයන්

කරයි. සුගති මාර්ගයක් සොයන්නෙමි’යි දුර්ගති මාර්ගයක් සොයයි.

10 “බ්‍රාහ්මණය, ගිනි පුදන්නේ යාගකණුව ඔසවන්නේ යාගයෙන් පෙරටුව මේ තුන්වන කාය ශස්ත්‍රය (කය නමැති ආයුධය ඔසවයි. බ්‍රාහ්මණය, ගිනි පුදන තැනැත්තේ යාග කණුව ඔසවන තැනැත්තේ යාගයෙන් පෙරටුව අකුසල්වූ දුක් ගෙනදෙන්නාවූ දුක්ඛ විපාකවූ මේ ආයුධ තුන ඔසවයි.

11 “බ්‍රාහ්මණය, මේ ගිනි තුන දුරුකටයුතුය. වර්ජනය කටයුතුය නොසෙවිය යුතුය. කවර තුනක්ද යත්? රාග නමැති ගින්න, ද්වෙෂය නමැති ගින්න, මොහය නමැති ගින්න යන තුනයි.

12 “බ්‍රාහ්මණය, කුමක් හෙයින් රාග නමැති ගින්න දුරුකටයුතුද වර්ජනය කටයුතුද නොසෙවිය යුතුද? බ්‍රාහ්මණය, රාගයෙන් රත්වූයේ මඩනා ලද්දේ හාත්පසින් ගන්නා ලද්දේ කයින් දුසිරිතෙහි හැසිරෙයි. (ii) වචනයෙන් දුසිරිතෙහි හැසිරෙයි. සිතින් දුසිරිතෙහි හැසිරෙයි. හෙතෙම කයින් දුසිරිතෙහි හැසිර වචනයෙන් දුසිරිතෙහි හැසිර මනසින් දුසිරිතෙහි හැසිර ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇත්තාවූ නපුරුසේ පතිත වන්නාවූ නරකයෙහි උපදියි. (iii) එහෙයින් මේ රාග නමැති ගින්න දුරුකටයුතුය. වර්ජනය කටයුතුය. සේවනය නොකටයුතුය.

13 “බ්‍රාහ්මණය, කුමක් හෙයින් ද්වෙෂ නමැති ගින්න දුරුකටයුතුද, වර්ජනය කටයුතුද, නොසෙවිය යුතුද? බ්‍රාහ්මණය, ද්වෙෂයෙන් රත්වූයේ මඩනා ලද්දේ හාත්පසින් ගන්නා ලද්දේ කයින් දුසිරිතෙහි හැසිරෙයි. (මෙහි 12 (ii) යෙදිය යුතුයි.) (iii) එහෙයින් මේ ද්වෙෂ නමැති ගින්න දුරු කටයුතුය. වර්ජනය කටයුතුය. සේවනය නොකටයුතුය.

14 “බ්‍රාහ්මණය, මෝහයෙන් මඩනාලද්දේ, හාත්පසින් ගන්නා ලද්දේ කයින් දුසිරිත් කරයි. (මෙහි 12 (ii) යෙදිය යුතුයි.) එහෙයින් මේ මොහය නමැති ගින්න දුරුකට යුතුය. වර්ජනය කටයුතුය. නොසෙවිය යුතුය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

15. "බ්‍රාහ්මණය, මේ ගිනි තුනක් සත්කාරකොට බහුමානකොට පූජාකොට ගරුකාරකොට සැපසේ පරිහරණය කටයුතුයි. කවර තුනක්දයත්, ආහුණෙය්‍ය (පිදිය යුතු) ගින්න, ගෘහපති ගින්න, දක්ඛිණෙය්‍ය (දක්ෂිණාව දියයුතු) ගින්න, යන මේ තුනයි.

16. "බ්‍රාහ්මණය, පිදියයුතු ගින්න කවරේද? බ්‍රාහ්මණය යමෙකුට ඒ මව හෝ පියා හෝ වෙද්ද බ්‍රාහ්මණය, මෙය පිදිය යුතු ගින්නයයි කියනුලැබේ. එයට හේතුකවරේද? බ්‍රාහ්මණය හටගත් දෙය පුදනලද්දේවේද එහෙයින් මේ පිදියයුතු ගින්න (ii) සත්කරකොට ගරුකාරකොට, බහුමානකොට පුදා මනාසේ පරිහරණය කටයුතුය.

17. "බ්‍රාහ්මණය, ගෘහපති ගින්න කවරේද? බ්‍රාහ්මණය මෙ ලෝකයෙහි යමෙකුට පුත්‍රයෝ හෝ අඹුවෝ හෝ දාසයෝ හෝ පණිවුඩකරුවෝ හෝ කම්කරුවෝ හෝ වෙත්ද, බ්‍රාහ්මණය, මේ ගෘහපති ගින්නයයි කියනු ලැබේ. එහෙයින් මේ ගෘහපති ගින්න (මෙහි 16 (ii) යෙදිය යුතුයි.)

18. 'බ්‍රාහ්මණය, දක්ෂිණාව දියයුතු ගින්න කවරේද? බ්‍රාහ්මණය, මේ ලෝකයෙහි මද ප්‍රමාදයෝ දුරුකළාවූ ක්ෂාන්ති සුරත භාවයෙහි නිවියාවූ එක් පසෙක දැමුණාහු වෙද්ද? එක් පසෙක නිවුනාහු වෙද්ද, එක් පසෙක පිරිනිවියාහු වෙද්ද බ්‍රාහ්මණය, මේ දක්ෂිණාව දියයුතු ගින්නයයි කියනු ලැබේ. බ්‍රාහ්මණය, මේ දක්ෂිණාව දියයුතු ගින්න (මෙහි 16 (ii) යෙදිය යුතුයි.)

19 "බ්‍රාහ්මණය, මේ ගිනි තුන සත්කාරකොට ගරුකාරකොට බහුමානකොට පුදා මනාසේ පරිහරණය කටයුතුය. බ්‍රාහ්මණය, මේ දරවලින් හටගන්නා ගින්න වනාහි කලින් කල දැල්විය යුතුය. කලින්කල බහාතැබිය යුතුය. කලින්කල නිවියයුතුය. කලින්කල සම කළ යුතුය.

20 "මෙසේ වදාළකල්හි උග්ගත ශරීර නම් බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකෙළේය. භාග්‍යවතුන් වහන්ස, ඉතා යහපති භාග්‍යවතුන් වහන්ස ඉතා යහපති. භවත්

ගෞතමයන් වහන්සේ මා අද පටන් දිවිහිම් කොට ඔබවහන්සේගේ සරණ ගියාවූ උපාසකයකුකොට සලකනසේක්වා. භවත් ගෞතමයන් වහන්ස, ඒ මම පන්සියයක් ගවයින් මුදන්නෙමි. ජීවිතය දෙමි. පන්සීයක් ලොකු වස්සන් මුදන්නෙමි. ජීවිතයදෙමි. පන්සීයක් ලොකු වැස්සියන් මුදන්නෙමි ජීවිතය දෙමි. පන්සියයක් එළුවන් මුදන්නෙමි. ජීවිතයදෙමි. පන්සියයක් බැටළුවන් මුදන්නෙමි. ජීවිතය දෙමි (ඔවුහු) තිල්තණ කත්වා, සිහිල් දිය බොත්වා ඔවුන්ට ශීත සුළඟ හැමේවායි."

**46. සංඛිත්ත සත්ත සඤ්ඤා සූත්‍රය:-** 1. "මහණෙනි, මේ (සඤ්ඤා) හැඳිනීම් සතක් භාවිතාකරණ ලද්දේ වැඩි වැඩියෙන් පුරුදු කරණ ලද්දේ මහත්ඵල ඇත්තාහු මහානිශංස, ඇත්තාහු නිවණට බැසගත්තාහු නිවණ අවසන් කොට ඇත්තාහු වෙති

2 "ඒ සත කවරේද? අශුභ සංඥාව, මරණ සංඥාව ආහාරයෙහි පිළිකුල් සංඥාව, සියලු ලොකයෙහි නොඇළුන සංඥාව, අනිත්‍ය සංඥාව, අනිත්‍යයෙහි දුක් සංඥාව, දුකෙහි අනාත්ම සංඥාව. (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

**47. විත්ථත සත්ත සඤ්ඤා සූත්‍රය:-** (1, 2 මෙහි මේ වර්ගයේ 46 සූත්‍රයේ 1, 2 ඡේද යෙදිය යුතුයි.) මෙසේ යමක් වදාරණ ලද්දේද, එය කුමක් සඳහා වදාරණ ලද්දේද යත්?

3 'මහණෙනි, අශුභ සංඥාව පුරුදුකිරීමෙන් එය බහුල කොට සිතින් ගෙන වාසය කරන්නේ භික්ෂුවගේ මෛථුන ධර්මයට එක්වීම කෙරෙන් සිත සැගවෙයි. (ii) හැකිලෙයි. එය අනුව හැඬගැසෙයි. එය සිහි නොකරයි. උපෙක්ෂාව හෝ පිළිකුල් බව පිහිටයි.

4. "මහණෙනි, යම්සේ කුකුල් පිහාටුවක් හෝ නහර ඇති කොළයක් හෝ ගින්නෙහි බහාලන ලද්දේ වකුටුවේද හැකිලේද කැරකී සිටීද දිග නොහැරේද එමෙන්ම (ii) මහණෙනි, ඉදින් භික්ෂුවට අශුභ සංඥාව පුරුදු කිරීමෙන් සිතින් බහුලකොට වාසය කිරීමෙන් මෛථුන ධර්මයට එක්වීම කෙරෙහි සිත අනුව සිටීද පිළිකුල් බවක් හෝ නොදැනේද මහණෙනි, භික්ෂුව විසින් මෙය දැනගත යුතුයි. 'මවිසින් අශුභ සංඥාව පුරුදු

නොකරණලදී. (iii) මාගේ පෙරට වඩා විශෙෂයක් නැත. මවිසින් භාවනා ඵලයට නොපැමිණෙන ලදී' යනුයි. මෙසේ එහි මනා සිහි ඇත්තේ වෙයි.

**5.** "මහණෙනි, ඉදින් වනාහි භික්ෂුව විසින් අසුභ සංඥාව පුරුදුකිරීමෙන් (ii) බහුලකොට සිතින්ගෙන වාසයකරන්නේ මෛථුන ධර්ම සමාපත්තියෙහි සිත සැඟවෙයි. හැකිලෙයි. පෙරලෙයි. දිග නොහැරෙයි. (iii) උපෙක්ෂාව හෝ පිළිකුල් බව හෝ සිටියි. මහණෙනි, මේ කාරණයෙහිලා භික්ෂුව විසින් මෙසේ දතයුතුයි. 'මවිසින් අශුභ සංඥාව පුරුදුකරණ ලදී. (iv) මාගේ පෙරට වඩා විශෙෂයක් ඇත. මවිසින් භාවනා ඵලයට පැමිණෙනලදී' යනුයි. මෙසේ එහි මනා සිහි ඇත්තේ වෙයි. (v) මහණෙනි, අශුභ සංඥාව පුරුදුකරණ ලද්දේ (vi) බහුල වශයෙන් වඩනලද්දේ මහත්ඵලවූයේ මහානිශංස වූයේ නිවණට බැසගන්නා ලද්දේ නිවණ කෙළවරකොට ඇත්තේද වෙයි. මෙසේ යමක් වදාරණලදද එය මේ සඳහා වදාරණලදී.

**6.** (මෙහි 3-4-5 ඡෙද යෙදීමේදී 'අසුභ සංඥාව වෙනුවට 'මරණ සංඥාව' ද--'මෛථුන ධර්මයට එක්වීම කෙරෙන් සිත සැඟවෙයි' වෙනුවට 'ජීවිතය පිළිබඳ බලවත් ආශාවෙන් සිත සැඟවෙයි' කියාද යෙදිය යුතුයි.)

**7.** (මෙහි 3-4-5 ඡෙදය යෙදීමේදී 'අසුභ සංඥාව වෙනුවට 'ආහාරයෙහි පිළිකුල් සංඥාව' ද, මෛථුන ධර්මයට එක්වීම කෙරෙන් සිත හඟවයි' වෙනුවට 'රස තෘෂ්ණාවෙහි සිත හඟවයි' කියාද යෙදිය යුතුයි.)

**8.** (මෙහි 3-4-5 ඡෙද යෙදීමේදී 'අසුභ සංඥාව' වෙනුවට 'සියලු ලෝකයෙහි නොඇලීමේ සංඥාව' ද, මෛථුන ධර්මයට එක්වීම කෙරෙන් සිත හඟවයි' වෙනුවට 'ලෝකය පිළිබඳ සිත්හි සිත සැඟවෙයි' කියාද යෙදිය යුතුයි.)

**9.** (මෙහි 3-4-5 ඡෙද යෙදීමේදී 'අසුභ සංඥාව, වෙනුවට 'අනිත්‍ය සංඥාව'ද මෛථුන ධර්මයට එක්වීම කෙරෙන් හිත හඟවයි' වෙනුවට 'ලාභ සතකාර කීර්ති ආදියෙහි සිත නොඇලෙයි' යෙදිය යුතුයි.)

10. "මහණෙනි, අනිත්‍යයෙහි දුක්ඛ සංඥාව පුරුදුකරණ ලද්දේ බහුල වශයෙන් වඩන ලද්දේ මහත් ඵල ඇත්තේ, මහානිශංස ඇත්තේ නිවණට බැසගත්තේ නිවණ අවසන් කොට ඇත්තේ වෙයි. මෙසේ යමක් වදාරණ ලද්දේද මෙය කුමක් සඳහා වදාරණ ලද්දේද යත්? (iii) මහණෙනි, අනිත්‍යයෙහි දුක්ඛ සංඥාව පුරුදුකරණ ලද්දාවූ බහුල වශයෙන් වඩන ලද්දාවූ භික්ෂුවගේ අලසකමෙහි, කුසීතබවෙහි, නිර්වාණ ධර්මයන් ඈත් කිරීමෙහි, ප්‍රමාදයෙහි කුශල ධර්මයන්ගේ නොයෙදීමෙහි, ප්‍රත්‍යවෙක්ෂා නොකිරීමෙහි, දැඩිවූ භය සංඥාව එළඹ සිටියේ වෙයි. ඔසවනලද කඩුව ඇති වධකයකු කෙරෙහි යම්සේද එමෙනි. (iv) මහණෙනි, ඉදින් අනිත්‍යයෙහි දුක්ඛ සංඥාව (v) පුරුදු කරමින් සිතින් බහුලකොට පුරුදු කරන්නහුගේ අලසකමෙහි, කුසීත බවෙහි, නිර්වාණ ධර්මයන් ඈත් කිරීමෙහි, ප්‍රමාදයෙහි කුශල ධර්මයන්ගේ නොයෙදීමෙහි ප්‍රත්‍යවෙක්ෂා නොකිරීමෙහි, දැඩි භය සංඥාවෙහි එළඹ නොසිටියේ වෙයි. ඔසවනලද කඩුවක් ඇති වධකයකු කෙරෙහි යම්සේද එමෙනි. (vi) මහණෙනි, භික්ෂුව විසින් මෙය දැනගත යුතුයි. 'මා විසින් අනිත්‍යයෙහි දුක්ඛ සංඥාව පුරුදු නොකරණ ලදී. මාගේ පෙරට වඩා වෙනසක් නැත. මාගේ භාවනා ඵලය නොපැමිණෙනලදී.' මෙසේ එහි මනා සිත් ඇත්තේ වෙයි.

11 (මෙහි 10 (iii) යෙදිය යුතුයි) දැඩිවූ බිය සංඥාව එළඹ සිටියේ වෙයි. ඔසවනලද කඩුවක් ඇති වධකයකු කෙරෙහි යම්සේද එමෙනි. මහණෙනි, භික්ෂුව විසින් මෙය දැනගත යුතුයි. මා විසින් අනිත්‍යයෙහි දුක්ඛ සංඥාව පුරුදු කරණ ලදී. පෙරට වඩා අනිකුදු විශෙෂයක් මාගේ ඇත. මා විසින් භාවනා ඵලයට පැමිණෙන ලදී' යනුයි. මෙසේ එහි මනා සිහි ඇත්තේ වෙයි. (මෙහි 10 (i) යෙදිය යුතුයි.)

12 "මහණෙනි, අනිත්‍යයෙහි දුක්ඛ සංඥාව වඩන ලද්දේ බහුල වශයෙන් වඩනලද්දේ මහත්ඵලවූයේ මහානිශංසවූයේ නිර්වාණයට බැසගත්තේ, නිර්වාණය කෙළවරකොට ඇත්තේ වෙයි. මෙසේ යමක් කියන ලද්දේද එය මේ සඳහා කියනලදී.

13. "(i) මහණෙනි, දුක්ඛයෙහි අනත්ත සංඥාව භාවිතා කරණලද්දේ බහුලවශයෙන් පුරුදු කරණලද්දේ මහත්ඵල ඇත්තේ මහානිශංස ඇත්තේ නිවණට බැසගත්තේ නිවණ අවසන්කොට ඇත්තේ වෙයි. (ii) මෙසේ යමක් වදාරණ ලද්දේද කුමක් සඳහා එය වදාරණ ලද්දේද යත්? දුක්ඛයෙහි අනත්ත සංඥාව පුරුදු කරණ ලද සිතින් බහුලකොට ගෙන වසන්නාවූ භික්ෂුවට මේ විඤ්ඤාණය (-සිත) සහිත කයෙහිද පිටත සියලු නිමිතිවලද මානය ඉක්මවූ ශාන්තවූ මනාකොට මුදනලද අහංකාරය මමය යන මාන්නය යන මෙයින් වෙන්වූ සිත ඇත්තේවෙයි. ඉදින් මහණෙනි, දුකෙහි අනත්ත සංඥාව පුරුදුකරණලද්දාවූ සිතින් බහුල වශයෙන් ගෙන වසන්නාවූ භික්ෂුවට මේ සවිඤ්ඤානක ශරීරයෙහිද පිටත සියලු නිමිතිවලද මානය ඉක්මවූ ශාන්තවූ මනාකොට ක්ලෙශයන්ගෙන් මුදනලද අහංකාරය මමය යන මාන්නය යන මෙයින් වෙන්වූ සිත ඇත්තේ නොවෙයි.

14 "මහණෙනි, භික්ෂුව විසින් මේ කාරණය දැනගත යුතුයි. 'මා විසින් දුක්ඛයෙහි අනත්ත සංඥාව පුරුදු නො කරනලදී. මාගේ පෙරට වඩා විශෙෂයක්ද නැත. මා විසින් භාවනා ඵලයට නොපැමිණෙන ලදී. මෙසේ එහි මනා සිහි ඇත්තේ වෙයි' ඉදින් වනාහි මහණෙනි, දුකෙහි අනත්ත සංඥාව-(මෙහි 10 (iv) (v) යෙදිය යුතුයි.) මහණෙනි, භික්ෂුව විසින් මෙය දැනගත යුතුයි. 'මා විසින් දුක්ඛයෙහි අනත්ත සංඥාව පුරුදු කරණ ලදී. මාගේ පෙරට වඩා විශෙෂයක්ද ඇත. මා විසින් භාවනා ඵලයට පැමිණෙන ලදී' යනුවෙනි. මෙසේ එහි මනා සිහි ඇත්තේ වෙයි. (මෙහි 13 (i) යෙදිය යුතුයි.) මෙසේ යමක් වදාරණ ලද්දේද එය මේ සඳහා වදාරණලදී.

15. "මහණෙනි, මේ සප්ත සංඥාවෝ වඩනලද්දේ බහුල වශයෙන් පුරුදුකරණ ලද්දේ මහත්ඵල ඇත්තේ මහානිශංස ඇත්තේ නිර්වාණයට බැසගත්තේ නිවණ කෙළවර කොට ඇත්තේද වෙයි"

48 **සත්ත මෛථුන සූත්‍රය**:- 1 'ඉක්බිති ජානුස්සෝනී බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි

පැමිණියේය. පැමිණ භාග්‍යවතුන්වහන්සේ සමග සතුටුවිය. සතුටු වියයුතු සිහිකටයුතු කථාව නිමවා උන්වහන්සේට මෙසේ සැළ කළේය.

2 "පින්වත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ බඹසර හැසිරෙන්නා මනාව දන්නේද?" කියාය.

"බ්‍රාහ්මණය, යමෙකුට වනාහි නොකැඩුනාවූ සිදුරුනොවූ සබල (කබර) නොවූ අකම්මාසවූ (මිශ්‍රවර්ණනොවූ) පරිපූර්ණවූ පිරිසිදුවූ ඒ බ්‍රහ්මචර්‍ය්‍යාව හැසිරේයයි මනාකොට කියන්නේද, මෙය මටම මනාකොට කියන්නේය. බ්‍රාහ්මණය, මම අඛණ්ඩවූ, සිදුරුනොවූ, පුල්ලිනොවැටුන, කිළුටුනොවූ, පරිපූර්ණවූ පිරිසිදුවූ බ්‍රහ්මචර්‍ය්‍යාව හැසිරෙන්නෙමි."

3 "භවත් ගෞතමයන් වහන්ස, බඹසර කැඩීමය, සිදුරුවීමය, පුල්ලිවැටීමය, කිළුටුවීමය, කිමෙක්ද?"

4 "බ්‍රාහ්මණය, මේ ලොකයෙහි ඇතැම් පැවිද්දෙක් හෝ (ii) බ්‍රාහ්මණයෙක් හෝ මනාසේ බඹසර හැසිරෙන්නේ යයි පිළිගනු ලබන්නේ ස්ත්‍රියක් සමග එක්ව එක යහනක නොසිටීද, එසේනමුදු ස්ත්‍රියගේ ඇඟ ඉලීම්, පිරිමැදීම්, නැවීම් අත් පා මැඩීම්, (iii) ඉවසයිද, එය බලාපොරොත්තුවේද එයින් සතුටට පත්වේද, බ්‍රාහ්මණය, මෙයද වනාහි බඹසරට කැඩුන, සිදුරුවූ, කබර සහිත කිලිටි වූවයයි කියනු ලැබේ. (iv) බ්‍රාහ්මණය මෙය අපිරිසිදු බඹසර හැසිරීමයයි කියයි. මෛථුන සංයොගයෙන් යුක්තවූයේ ජාති (ඉපදීමෙන්) නොමිදේ. ජරා මරණ ශොක පරිදෙව දුක්ඛ දොමනස්ස, උපායාස දුකින්ද නොමිදේයයි කියමි.

5 "බ්‍රාහ්මණය, නැවතද මේ ලොකයෙහි පැවිද්දෙක් හෝ (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) ඉවසයිද එසේනමුදු ස්ත්‍රිය සමග ගැටේද, ක්‍රීඩා කෙරේද, කෙළිකවටකම් කෙරේද, සිහි කෙරේද (මෙහි 4 (iv) යෙදිය යුතුයි.) ස්ත්‍රිය සමග නොගැටේද ක්‍රීඩා නොකෙරේද, කෙළිකවට කම් නොකෙරේද එසේ නමුදු ස්ත්‍රියගේ ඇසින් ඇස බලාද දකීද, ස්ත්‍රියගේ ඇසින් ඇස නොබලාද නොදකීද, එසේ නමුදු (ii) බිත්තියෙන් පිටත සිට හෝ ප්‍රකාරයෙන් පිටත සිට හෝ සිනහ වෙන්නාවූ හෝ

කථාකරන්නාවූ හෝ ගායනා කරන්නාවූ හෝ හඬන්නාවූ හෝ ස්ත්‍රියගේ ශබ්දය අසාද (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) ස්ත්‍රියගේ ශබ්දය නොඅසාද (iv) එසේනමුදු ඔහු පෙර ස්ත්‍රිය සමග සිනහවුන, ක්‍රීඩාකළ කෙළිකවටකම් කළ දේ සිහිකෙරේ ද, ඔහු පෙර (මෙහි 4 (iv) යෙදිය යුතුයි.) කෙළිකවටකම් කළ දේ සිහි නොකෙරේද එසේනමුදු පස්කම් සැප අනුභව කරන්නාවූ එයින් පිරිවැරූ ගෘහපතියකු හෝ ගෘහපති පුත්‍රයකු හෝ බලාද,

**6** "ගෘහපති පුත්‍රයකු නොබලාද, එසේනමුදු එක්තරා දේව නිකායක් ප්‍රාර්ථනාකොට බඹසර හැසිරේද මම මේ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපස් චරණයෙන් හෝ බඹසරින් හෝ දෙවියෙක් හෝ වන්නෙමි දෙවියන්ගෙන් එක්තරා කෙනෙක් වන්නෙමියි කියාය. හෙතෙම එය ආශ්වාදය කරයි. එය ආශා කරයි. එයින් ප්‍රීතිවෙයි. බ්‍රාහ්මණය මෙයද බඹසර කැඩීමය, සිදුරුවීමය, පුල්ලිවැටීමය, කිළුටු වීමයයි කියනු ලැබේ.

**7** "බ්‍රාහ්මණය, මෙය මෛථුන සංයෝගයෙන් සංයුක්තවූ අපිරිසිදු බඹසර යයි කියයි. ඉපදීමෙන් නොමිදේ. ජරා මරණ, ශොක, පරිදෙව, දුක්ඛ, දොමනස්ස, උපායාස දුක්ඛයන්ගෙන් නොමිදේයයි කියමි.

**8** "බ්‍රාහ්මණය, යම්තාක් වනාහි මේ සප්ත මෛථුනයන් ගෙන් එක්තරා මෛථුන සංයෝගයක් තමා කෙරෙහි දුරු නොකෙළේයයි මනාකොට දැක්කෙම්ද, බ්‍රාහ්මණය ඒතාක් මම දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත මේ ලොකයෙහි ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත දෙව් මිනිසුන් සහිත ප්‍රජාවෙහි නිරුත්තරවූ සම්‍යක් සම්බොධිය අවබොධ කළේයයි නොම ප්‍රතිඥා කළෙමි.

**9** "බ්‍රාහ්මණය, යම්හෙයකින් වනාහි මම මේ සප්ත මෛථුන සංයෝගයන් ගෙන් එක්තරා මෛථුන සංයෝගයක් තමා කෙරෙහි දුරු නොකෙළේයයි නොදැක්කෙම්ද බ්‍රාහ්මණය එහෙයින් මම දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොකයෙහි ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත දෙව් මිනිසුන් සහිත ප්‍රජාවෙහි නිරුත්තරවූ සම්‍යක් සම්බොධිය අවබොධ කළේයයි

මනාකොට ප්‍රතිඥා කළෙමි. මා තුළ දර්ශන ඥානය පහළවිය. මාගේ චිත්ත විමුක්තිය නොවෙනස්ය. මේ කෙළවර ආත්මභාවයයි. දැන් මතු භවයක් නැත."

10. "මෙසේ දෙශනා කළ කල්හි ජානුස්සොනී බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළකළේය. (අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ 10 අසුර වර්ගයේ 51 සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි)

**49. සංයොග වියොග සූත්‍රයඃ-** 1. "මහණෙනි, තොපට සංයොග වියොග (එක්වීම හා වෙන්වීම) දහම් කොටස දෙශනා කරන්නෙමි, එය අසව්, මනාකොට මෙනෙහි කරව් කියන්නෙමියි" වදාළසේක. 'එසේය, ස්වාමීනියි' ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ.

2. "ඒ සංයොග වියොග දහම් කොටස කවරේද? මහණෙනි, ස්ත්‍රිය, ස්ත්‍රී ලීලාව, ස්ත්‍රී පැවැත්ම ස්ත්‍රි ආකාරය, ස්ත්‍රි කැමැත්ත, ස්ත්‍රී ස්වරය (හඬ) ස්ත්‍රී අලංකාරය (යන මෙයින් යුක්තවූ) අධ්‍යාත්මික ස්ත්‍රීන්ද්‍රිය සිහි කරයි. ඇස එහි ඇලෙයි. එහි රමණය කරයි. ඇස එහි ඇළුන එහි රමණය කරන්නී බාහ්‍යවූ (පිටත) පුරුෂෙන්ද්‍රිය සිහි කරයි. කෙසේද පුරුෂ ලීලාව, පුරුෂ පැවැත්ම, පුරුෂාකාරය පුරුෂ කැමැත්ත, පුරුෂ හඬ, පුරුෂාලංකාරය යන මෙහි ඇ ඇලෙයි. එහි රමණය කරයි. ඇ එහි ඇළුනී එහි අභිරමණය කරන්නී පිටත එක්වීම බලාපොරොත්තු වෙයි. ඇයට සංයෝග හේතුවෙන් යම් සුවයක් සොම්නසක් උපදීද එයද බලාපොරොත්තු වෙයි. මහණෙනි, ස්ත්‍රී භාවයෙහි ඇළුනාවූ සත්වයෝ පුරුෂයන් කෙරෙහි සංයෝගයට ගියාහු වෙති. මහණෙනි, මෙසේ ස්ත්‍රිය ස්ත්‍රී භාවය නො ඉක්මවයි.

3 "මහණෙනි, පුරුෂතෙම අධ්‍යාත්මික පුරුෂෙන්ද්‍රිය සිහි කරයි පුරුෂ ලීලාව, පුරුෂ පැවැත්ම, පුරුෂාකාරය, පුරුෂ කැමැත්ත, පුරුෂ හඬ, පුරුෂාලංකාරය යන මෙහි හෙතෙම ඇලෙයි. රමණය කරයි. හෙතෙම එහි ඇළුනේ එහි රමණය කරන්නේ පිටත ස්ත්‍රීන්ද්‍රිය සිහි කරයි. ස්ත්‍රී ලීලාව' ස්ත්‍රී පැවැත්ම ස්ත්‍රී ආකාරය ස්ත්‍රී කැමැත්ත, ස්ත්‍රී හඬ, ස්ත්‍රී අලංකාරය එහි

ඇලෙයි. එහි රමණය කරයි. හෙතෙම එහි ඇළුනේ රමණය කරන්නේ පිටත සංයොගය (එක්වීම) බලාපොරොත්තු වෙයි. ඔහුට සංයෝග හේතුවෙන් යම් සුවයක් සොම්නසක් උපදීද එයද බලාපොරොත්තු වෙයි, මහණෙනි, පුරුෂ භාවයෙහි ඇළුනාවූ සත්වයෝ ස්ත්‍රීන් කෙරෙහි සංයොගයට (එක්වීමට) ගියේ වෙති. මහණෙනි, මෙසේ වනාහි පුරුෂතෙම පුරුෂ භාවය නොඉක්මවයි. මහණෙනි, මෙසේ සංයෝගය වෙයි.

4 "මහණෙනි, කෙසේ විසංයොගය (වෙන්වීම) වේද? මහණෙනි, ස්ත්‍රිය ස්ත්‍රිලීලාව ස්ත්‍රීපැවැත්ම, ස්ත්‍රී ආකාරය, ස්ත්‍රී කැමැත්ත, ස්ත්‍රි ස්වරය, ස්ත්‍රි අලංකාරය යන මෙසේ වූ අධ්‍යාත්මික ස්ත්‍රීන්ද්‍රිය සිහි කෙරේද ඇය එහි නොඇලෙයි. එහි රමණය නොකරයි. ඇය එහි නො ඇළුන එහි රමණය නොකරන්නී බාහ්‍යවූ පුරුෂෙන්ද්‍රිය සිහි නොකරයි. කෙසේද පුරුෂ ලීලාව, පුරුෂ පැවැත්ම, පුරුෂාකාරය, පුරුෂ කැමැත්ත, පුරුෂ ස්වරය, පුරුෂාලංකාරය යන මෙහි ඇය නොඇලෙයි. එහි රමණය නොකරයි. ඇය එහි නොඇළුනී එහි රමණය නො කරන්නී පිටත සංයොගය බලාපොරොත්තු නොවෙයි. ඇයට සංයොග හේතුවෙන් යම් සුවයක් සොම්නසක් උපදීද, එයද බලා පොරොත්තු නොවෙයි. මහණෙනි, ස්ත්‍රි භාවයෙහි ආශානොවූ නො ඇළුනාවූ ස්ත්‍රිය පුරුෂයන් කෙරෙහි වෙන්වූයේවෙයි. මහණෙනි, ස්ත්‍රිය එසේම ස්ත්‍රිභාවය ඉක්මවයි.

5. "මහණෙනි, පුරුෂයා අධ්‍යාත්මිකවූ පුරුෂලීලාව, පුරුෂ පැවැත්ම, පුරුෂාකාරය, පුරුෂ කැමැත්ත, පුරුෂ ස්වරය, පුරුෂාලංකාරය යන මේ පුරුෂෙන්ද්‍රිය සිහිනොකරයි. හෙතෙම එහි නොඇළුනේ එහි අභිරමණය නොකළේ ස්ත්‍රී ලීලාව, ස්ත්‍රීපැවැත්ම, ස්ත්‍රීආකාරය, ස්ත්‍රීකැමැත්ත, ස්ත්‍රීස්වරය, ස්ත්‍රීඅලංකාරය යන මේ පිටත ස්ත්‍රීන්ද්‍රිය සිහි නොකරයි. හෙතෙම එහි නොඇලෙයි. එහි අභිරමණය නොකරයි. හෙතෙම එහි නො ඇළුනේ අභිරමණය නොකළේ පිටත සංයොගය බලාපොරොත්තු නොවෙයි. සංයොග හේතුවෙන් ඔහට සැපතක් සොම්නසක් උපදීද එයද බලාපොරොත්තු නොවෙයි.

"පුරුෂභාවයෙහි නොඇළුනාවූ සත්වයෝ ස්ත්‍රීන් කෙරෙහි වෙන්වූවෝ වෙති. මහණෙනි, මෙසේ වනාහි පුරුෂයා පුරුෂ භාවය ඉක්මවයි. මහණෙනි, මෙසේ වනාහි විසංයෝගය වෙයි, මහණෙනි, මෙය සංයෝගය වියොග දහම් කොටස වෙයි.

**50. චම්පෙය්‍යක දානානිසංස සූත්‍රයː-** 1. "එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ චම්පා නගරය සමීපයෙහිවූ ගර්ගරා පොකුණු තෙර වැඩවසනසේක. එකල්හි බොහෝ චම්පා නගර වැසි උපාසකවරු ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියහ. පැමිණ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියහ. එකත්පසෙක සිටියාවූ චම්පා නගරවැසි උපාසකවරු ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මෙය සැළ කළහ.

2. "ස්වාමීනි, ශාරිපුත්‍රයන් වහන්ස, අපි භාග්‍යවතුන් වහන්සේ හමුවෙන් දැහැමි කථාවක් අසා බොහෝ කල්වෙමු. ස්වාමීනි, අපි භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි දැහැමි කථාවක් අසමු නම් ඉතා යහපති.'

"එසේ නම් ඇවැත්නි, පැමිණ සිටි උපොසථ දිනයෙහි පැමිණෙනු මැනවි, භාග්‍යවතුන් වහන්සේ සමීපයෙන් දැහැමි කථාවක් ඇසීම ඉතා යහපති."

'එසේය, ස්වාමීනි" ඒ චම්පා නගරවැසි උපාසකවරු ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට පිළිතුරුදී අසුන් වලින් නැගිට උන්වහන්සේට වැඳ පැදකුණුකොට ගියහ.

3. "ඉක්බිති ඒ චම්පා නගරවැසි උපාසකවරු පැමිණිසිටි උපොසථ දිනයෙහි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියහ. පැමිණ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියාහ. ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ඒ චම්පා නගරවැසි උපාසකවරුන් සමග භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැන්හි පැමිණියහ. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත් පසෙක සිටියාවූ ශාරිපුත්‍ර ස්ථවිරයන්වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ.

4. "ස්වාමීනි, මේ ලොකයෙහි ඇතැමකුට එබඳුවූ දානයක් දෙන ලද්දේ මහත් ඵල නොවූයේ වන්නේද, මහානිශංස නොවූයේ වන්නේද, ස්වාමීනි, මේ ලොකයෙහි ඇතමකුට එබඳුවූ දානයක් දෙන ලද්දේ මහත් ඵල වූයේ වන්නේද මහානිශංසවූයේ වන්නේද?"

"ශාරීපුත්‍රය, මේ ලොකයෙහි ඇතමකුට එබඳුවූ දානයක් දෙන ලද්දේ මහත් ඵල නොවූයේ මහානිශංස නොවූයේ වන්නේය. ශාරීපුත්‍රය, මේ ලොකයෙහි ඇතැමකුට එබඳුවූ දානයක් දෙන ලද්දේ මහත් ඵලවූයේ මහානිශංසවූයේ වන්නේය." "ස්වාමීනි, මේ ලොකයෙහි ඇතැමකුට එබඳුවූ දානයක් දෙන ලද්දේ මහත් ඵල නොවූයේ මහානිශංස නොවූයේ, ස්වාමීනි, එයට හේතු කවරේද? එයට ප්‍රත්‍යය කවරේද? ස්වාමීනි, මේ ලොකයෙහි ඇතැමකුට එබඳුවූ දානයක් දෙන ලද්දේ මහත් ඵල වූයේ මහානිශංස වූයේ ස්වාමීනි, එයට හේතු කවරේද? එයට ප්‍රත්‍යය කවරේද?"

5. "ශාරීපුත්‍රය, මේ ලොකයෙහි ඇතැමෙක් බලාපොරොත්තු සහිතව දන් දෙයි. ඇලුනු සිතැතිව දන් දෙයි. රැස් කිරීම් සිතැතිව දන් දෙයි. මෙය පරලොවදී අනුභව කරන්නෙමියි දන් දෙයි. හෙතෙම ආහාර පාන වස්ත්‍ර යාන මල්-සුවඳ-විලවුන් නිදන දේ ගෘහ පහන් යන මෙයින් ඒ දානය දෙයි. ශාරීපුත්‍රය, මේ ලොකයෙහි ඇතැමෙක් මෙබඳුවූ දන් දෙන්නේය. එය කුමකැයි සිතන්නෙහිද?" "එසේය ස්වාමීනි."

6. "ශාරීපුත්‍රය, එහි යමෙක් බලාපොරොත්තු ඇතිව දන් දෙයි. ඇළුනු සිතැතිව දන් දෙයි. රැස් කිරීම් සිතැතිව දන් දෙයි. මෙය පරලොවදී අනුභව කරන්නෙමියි දන් දෙයි. හෙතෙම ඒ දානය දී ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු චාතුර්මහාරාජික දෙවියන් අතර උපදියි. හෙතෙම ඒ කර්මය ඒ ඍද්ධිය ඒ යශස ඒ අධිපති භාවය ගෙවා මෙලොවට එන සුළුවූයේ වෙයි.

7. "ශාරීපුත්‍රය, මේ ලොකයෙහි ඇතැමෙක් බලාපොරොත්තු සහිතව දන් නොම දෙයි. ඇළුනු සිතැතිව දන් නොම දෙයි. රැස් කිරීම සිතැතිව දන් නොම දෙයි. මෙය පරලොවදී අනුභව

කරන්නෙමියි දන් නොම දෙයි. එසේ නමුදු දානය යහපත් යයි දන් දෙයි. නැවතද වනාහි පිය මුතු, මී මුතුන් විසින් පෙර දෙන ලද්දේය. පෙර කරණ ලද්දේය. කුල වංශය පුරාණ දේ අත් හරින්ට නුසුදුසුවෙමියි දන් දෙයි. පිය පුතු මී මුතුන් විසින් පෙර දෙන ලද්දේ නොවේ. කරණ ලද්දේ නොවේ. කුල වංශය අත් හරින්ට නුසුදුස්සෙමියි දන් දෙයි.

8. "නැවතද වනාහි 'මම පිසමි. මොවුහු නොපිසිත්. පිසන්නා නොපිසන්නට නොදීම නුසුදුසුය'යි (සිතා) දන්දෙයි 'මමද නොපිසමි. මොවුහුද නොපිසිත්. පිසන්නා නොපිසන්නන්ට නොදීම නුසුදුසුයයි' දන් දෙයි. (ii) නැවතද වනාහි යම්සේ ඔවුන්ගේ පෙර ඍෂීන්ගේ මහා යාගයෝ වූහ. ඒ කෙසේද? අට්ටක, වාමක, වාමදෙව, වෙස්සාමිත්ත, යමතග්ගී, අංගීරස, භාරද්වාජ, වාසෙට්ඨ, කස්සප යන මොවුන්ගේය. (iii) මෙසේ මාගේ මේ දාන සංවිභාගය වන්නේයයි දන් දෙයි. යම්සේ ඔවුන්ගේ පෙර ඍෂීන්ගේ මහා යෝගයෝ නොවූහ. ඒ කෙසේද? (මෙහි 8 (ii) ඡේදය යෙදිය යුතුයි.) නැවතද වනාහි මාගේ මේ දානය දෙනුයේ සිත පහදියි සතුටුවීමෙන් සොම්නස උපදීයයි දන් දෙයි. මේ දානය දීමෙන් සිත නොපහදියි. නොසතුටු වීමෙන් සොම්නස උපදීයයි දන්දෙයි.

9. "නැවතද චිත්තාලංකාරය පිණිස සිතට වුවමනා දේ පිණිස යයි දන් දෙයි. හෙතෙම පැවිද්දෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ ආහාර පාන, වස්ත්‍ර, යාන, මල් සුවඳ විලවුන් නිදන දේ, ගෘහ, පහන් යන මෙයින් ඒ දානය දෙයි. ශාරීපුත්‍රය, මේ ලොකයෙහි ඇතැමෙක් මෙබඳුවූ දන් දෙන්නේය. එය කුමකැයි සිතන්නෙහිද?"

10. "එසේය ස්වාමීනි, යම් ඒ කෙනෙක් බලාපොරොත්තු නැතිව දන් දෙයි. ඇළුන සිත් නැතිව දන් දෙයි. රැස්කිරීම් සිත් නැතිව දන් දෙයි. මෙය පරලොවදී අනුභව නොකරන්නෙමියි දන් දෙයි. දානය යහපත් නොවෙතැයි දන් දෙයි. පිය මුතු මී මුතුන් විසින් නොම දෙන ලද්දේය. නොම කරණ ලද්දේය. පුරාණ කුල වංශය අත් හරින්ට නොහැක්කෙමියි දන් දෙයි.

මම නොපිසමි. මොවුහු නොපිසත්. පිසන්නා නොපිසන්නන්ට නොදෙන්ට නුසුදුසුයයි' දන් දෙයි. යම්සේ ඔවුන්ගේ පූර්ව ඍෂීන්ගේ මහා යාගයෝ නොවූහ. ඒ කෙසේද අට්ටක, වාමක, වාමදෙව, වෙස්සාමිත්ත, යමතග්ගි, අංගීරස, භාරද්වාජ, වාසෙට්ඨ, කස්සප, භගු යන මොවුන්ගේයි. මෙසේ මාගේ දානය මේ දාන සංවිභාගය වන්නේයයි දන් දෙයි. 'මාගේ මේ දානය දෙන්නේ සිත නොපහදයි. සිත සතුටු නොවූයේ සොම්නස නොඋපදීයයි' දන් දෙයි. එසේ නමුදු සිතේ අලංකාරය පිණිස සිතට වුවමනා දේ පිණිස දන් දෙයි. හෙතෙම ඒ දානය දී ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු බ්‍රහ්ම කායික දෙවියන් සමග උපදියි. හෙතෙම ඒ කර්මය ගෙවා ඒ ඍද්ධිය ඒ යසස, ඒ ආධිපත්‍යය ගෙවා මෙලොවට නොඑන සුළු වූයේ අනාගාමී වෙයි.

11. "ශාරීපුත්‍රය, මේ ලොකයෙහි ඇතැම් කෙනෙකුට එබඳු දෙන ලද දන් මහත් ඵල නොවූයේ වේද, මහානිශංස නොවූයේ වේද, මේ එයට හේතුවයි මේ එයට ප්‍රත්‍යයයයි. ශාරීපුත්‍රය, මේ ලොකයෙහි ඇතැම් කෙනෙකුට එබඳු දෙන ලද දන් මහත් ඵල වූයේද මහානිශංස වූයේද මේ එයට හේතුවයි මේ එයට ප්‍රත්‍යයයි.

**51. (වෙළුකණ්ටකී) නන්දමාතු සූත්‍රයː-** 1. "මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේද ආයුෂ්මත් මහා මොග්ගල්ලායන ස්ථවිරයන් වහන්සේද මහත් වූ භික්ෂු සංඝයා සමග දක්ෂිණ ගිරියෙහි චාරිකාවෙහි හැසිරෙත්. එකල්හි වනාහි වෙළුකණ්ඨකී නම් නන්ද මාතා උපාසිකාව රෑ අළුයම් කාලයෙහි නැගිට පාරායන සූත්‍රය හඬනගා කියයි.

2. එකල්හි වනාහි වෛශ්‍රවණ මහරජතෙම යම්කිසිවක් සඳහා උතුරු දිශාවෙන් දකුණු දිසාවට යයි. නන්ද මාතා උපාසිකාවගේ පාරායන සූත්‍රය ශබ්දනගා කීම වෛශ්‍රවණ මහරජ තෙම ඇසුවේය. අසා කථාවේ කෙළවර බලාපොරොත්තුවෙන් සිටියේය. ඉක්බිති නන්ද මාතා උපාසිකාව පාරායන සූත්‍රය ශබ්දනගා කියා නිශ්ශබ්දවිය. ඉක්බිති වෛශ්‍රවණ මහරජ තෙම

නන්දමාතා උපාසිකාවගේ කථාවේ කෙළවර දැන "සාධු! සොහොයුරිය, සාධු! සොහොයුරිය" යි අනුමෝදන්විය.

(ii) "හොඳ වචන ඇත්ත, මේ (ඔබ) කවරෙක්ද?"

"සොහොයුරිය, මම ඔබේ සහෝදර වෛශ්‍රවණ මහ රජය."

"හොඳ වචන ඇත්ත, හොඳයි. එසේවීනම් මා විසින් යම් මේ ධර්ම කොට්ඨාසයක් කියන ලද්දේද, ඔබට මෙය ආගන්තුක සත්කාරය වේවා!"

"සොහොයුරිය, හොඳයි. මෙයමත් මට වේවා, හෙට සැරියුත් මුගලන් ප්‍රමුඛ භික්ෂු සමූහය උදය නොවළඳා වෙළුකණ්ඨකයට වඩිත්.

"ඒ භික්ෂු සංඝයා වළඳවා, මට දානය අනුමෝදන් කරන්නෙහිය, මෙසේත් මට ආගන්තුක සත්කාරය වේයයි" (කියායි)

3. ඉක්බිත්තෙන් වනාහි නන්ද මව් වූ උපාසිකාව රැය එළිවූවිට, තමාගේ ගෙහි රසවත් කෑම පීම් පිළියෙළ කරවීය. ඉක්බිත්තෙන් වනාහි සැරියුත් මුගලන් ප්‍රමුඛ භික්ෂු සංඝයා උදය නො වළඳා වෙළුකණ්ඨකයට පැමිණියහ.

"පින්වත් පුරුෂය එව, ඔබ පන්සලට ගොස් 'ස්වාමීනි, ආර්යයන්ට මේ කාලයවේ. නන්දමාතා ආයඨාවගේ ගෘහයෙහි දානය පිළියෙළ වීයයි' ආරාමයට ගොස් භික්ෂු සංඝයාට කාලය දනවව"

"එසේය, ආයඨාවෙනියි" ඒ පුරුෂතෙම නන්ද මාතා උපාසිකාවට පිළිතුරුදී, ආරාමයට ගොස් ස්වාමීනි, මේ කාලයවේ. නන්ද මාතා ආයඨාවගේ ගෘහයෙහි දානය පිළියෙළ වීයයි භික්ෂු සංඝයාට කාලය දැන්වීය.

4. ඉක්බිති සැරියුත් මුගලන් දෙනම ප්‍රමුඛ භික්ෂු සංඝ තෙම පෙරවරු කාලයෙහි හැඳ පොරවා පා සිවුරු ගෙන නන්ද මාතෘ උපාසිකාවගේ ගෘහය යම්තැනකද එතැන්හි වැඩියේය. එසේ වැඩ පැනවූ අස්නෙහි හිඳගත්තේය. ඉක්බිති නන්දමාතා

උපාසිකාව සැරියුත් මුගලන් දෙනම ප්‍රමුඛ භික්ෂුසංඝයා ප්‍රණීතවූ කෑම් පීම්වලින් සියතින් මනාකොට පැවරුයේය. ඉක්බිති නන්දමාතා උපාසිකාව වළඳන ලද පාත්‍රයෙහි අත බහා තබනලද සැරියුත් මහතෙරුන් වහන්සේ එකත්පසෙක හුන් නන්ද මව් වූ උපාසිකාවට මේ කාරණය කීය

**5** "නන්ද මාතාව, කවරෙක් නම් භික්ෂු සංඝයාගේ පැමිණීම ඔබට කීවේද?"

"ස්වාමීනි, මම මෙහි රෑ අළුයම් වේලෙහි නින්දෙන් නැගිට පාරායණ සූත්‍රය හඬනගා කියා නිශ්ශබ්ද වූයෙමි. ස්වාමීනි, ඉක්බිත්තෙන් වනාහි වෛශ්‍රවණ මහා රජතෙම මා කීම අවසන් කළා දැන 'සොහොයුරිය, යහපති, යහපතියි' එයට සතුටුවිය. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

"ස්වාමීනි, යම් මේ දානයක් වේද ඒ පින වෛශ්‍රවණ මහ රජහට යහපත පිණිස වේවා" යි කීය.

**6** "යමෙකදී වෛශ්‍රවණ මහරජු වැනි මෙබඳු බොහෝ ඍද්ධි ඇති, මෙබඳු මහෙශාඛ්‍යවූ, දෙව් පුතුන් හා සම්මුඛව සමගි කථාවන් කරන්නේද, නන්ද මාතාවෙනි මේ කාරණය පුදුමයි. නන්ද මාතාවෙනි, මේ කාරණය ආශ්චර්යයි."

**7.** "ස්වාමීනි, මට මේ පුදුම ආශ්චර්ය කාරණය මේ ම නොවේ. ස්වාමීනි, මට අනෙකුත් පුදුම, ආශ්චර්ය කාරණයක් ඇත.

"ස්වාමීනි, මෙහි මාගේ ප්‍රියවූ මනාපවූ නන්දක නම්වූ එක් පුත්‍රයෙක් විය. ඔහු රජවරු කිසියම් කරුණක් නිසා හිංසා කොට බලහත් කාරයෙන් දිවිතොර කළහ. ස්වාමීනි, ඒ අවස්ථාවෙහි දරුවා ගන්නාලද කල්හි හෝ ගණු ලබන කල්හි හෝ බැඳිකල්හි හෝ වද දෙන කල්හි හෝ නැසූකල්හි හෝ නසනු ලබන කල්හි හෝ සිත වෙනස්වූ බවක් මම නොදනිමි"

"ආශ්චයර්යයකි. නන්ද මාතාවෙනි. පුදුමයකි. නන්ද මාතාවෙනි යම් තැනෙක සිත ඉපදවීම් මාත්‍රයම පිරිසිදු කරන්නෙහිය"

8 "ස්වාමීනි, මාගේ මෙයම ආශ්චර්‍ය්‍යවූ පුදුමවූ ධර්මය නොවේ. අනිකුදු ආශ්චර්‍ය්‍ය පුදුම ධර්මයක් ඇත. ස්වාමීනි, මෙහි මාගේ ස්වාමියා කළුරිය කළේ එක්තරා යක්ෂ යොනියක උපන්නේය. හෙතෙම මට පෙර ආත්මභාවයෙන් පෙණෙයි. ස්වාමීනි, ඒ හේතුකොට ගෙන සිතෙහි වෙනස් වීමක් මම නොදනිමි" "ආශ්චර්‍ය්‍යයකි, නන්ද මාතාවනි, පුදුමයකි නන්ද මාතාවනි, යම් තැනෙක සිත ඉපදීම් මාත්‍රයම පිරිසිදු කෙළෙහිය"

9. "ස්වාමීනි, මෙයම මාගේ ආශ්චර්‍ය්‍යවූ පුදුමවූ ධර්මය නොවේ. අනිකුදු ආශ්චර්‍ය්‍ය පුදුම ධර්මයක් ඇත. ස්වාමීනි, තරුණවූ ස්වාමියාට මා තරුණ කල්හිම ගෙන එනලදී. යම් හෙයකින් මම සිතින්වත් ස්වාමියා හැර වෙන කෙනෙකු නොපැතීමි. කයින් කියනුම කිම"

"ආශ්චර්‍ය්‍යයකි, නන්දමාතාවනි, පුදුමයකි නන්ද මාතාවනි යම් තැනක සිත ඉපදවීම මාත්‍රයම පිරිසිදු කෙළෙහිය."

10. "ස්වාමීනි, මෙයම මාගේ ආශ්චර්‍ය්‍ය පුදුම ධර්මය නොවේ. අනිකුදු ආශ්චර්‍ය්‍යවූ පුදුම ධර්මයක් ඇත ස්වාමීනි, යම් දිනක උපාසිකාවයයි මා ප්‍රසිද්ධවීද, එදා පටන් දැන දැන කිසියම් ශික්ෂා පදයක් ඉක්මවූ බව මම නොදනිමි"-"ආශ්චර්‍ය්‍යයකි නන්ද මාතාවනි, පුදුමයකි නන්දමාතාවනි"

11. "ස්වාමීනි, තවත් ආශ්චර්‍ය්‍යවූ පුදුමවූ ධර්මයක් ඇත. ස්වාමීනි, යම්තාක් මම කාමයන් ගෙන් වෙන්ව අකුශලයන් ගෙන් වෙන්ව විතර්ක සහිත විචාරසහිත විවේකයෙන් හටගත් ප්‍රීති සුවයෙන් යුත් ප්‍රථමධ්‍යානයට සමවදිමියි විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම ඇති සිතේ එකඟත්වයක් ඇති විතර්ක රහිත විචාර රහිත සමාධියෙන් හටගත් ප්‍රීති සැපය ඇති ද්විතීයධ්‍යානයට සමවැද වාසය කරමියි ප්‍රීතියගේ වෙන්වීමෙන් සිහි ඇත්තේ මනා දැනීම් ඇත්තේ උපෙක්ෂා සහිතව වාසය කරමි. කයින්ද සැපය විඳිමි. යම් ධ්‍යානයකට උපෙක්ෂා ඇත්තේ සිහි ඇත්තේ සුඛ විහාරීයයි ආර්‍ය්‍යයන් වහන්සේලා කියද්ද ඒ තෘතීය ධ්‍යානයට සමවැද වාසය කරමියි, සැපයෙන් වෙන්වූද, දුකින් වෙන්වූද දුක් නොවූ,

සුව නොවූ උපේක්ෂා ස්මෘති පාරිශුද්ධියෙන් යුත් චතුර්ථධ්‍යානයට සමවැද වාසය කරමියි බලාපොරොත්තුවෙමි.

12. "මාගේ අනිකුදු ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයක් ඇත. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරණලද පඤ්ච ඔරම්භාගිය සංයෝජනයෝ (මුල් බැඳුම් පසක්) වෙද්ද ඔවුන්ගෙන් කිසිවක් අප්‍රහීනවූ බවක් නොදකිමි" "ආශ්චර්‍ය්‍යයකි. නන්ද මාතාවනි, පුදුමයි නන්දමාතාවනි"

13 ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිරයන්වහන්සේ නන්ද මාතා උපාසිකාව දැහැමි කථාවෙන් විස්තරකොට සමාදන්කොට උත්සාහවත්කොට සතුටුකොට අස්නෙන් නැගිට වැඩියහ.

**මහායඤ්ඤ වර්ගය නිමි.**

---

## දෙවෙනි පණ්ණාසකය.

# 6 අව්‍යාකත වර්ගය

**1 අව්‍යාකත වත්ථු සූත්‍රයඃ-** 1 "ඉක්බිති එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටියාවූ ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළේය.

2 "ස්වාමීනි, ශ්‍රැතවත්වූ (ඇසූ පිරූ තැන් ඇති) ආර්‍ය්‍ය ශ්‍රාවකයාට අව්‍යකෘත වස්තූන්හි (ප්‍රකාශ නොකළ) යම් හෙයකින් විචිකිච්ඡාව (සැකය) නූපදීද, එයට හේතු කවරේද, එයට ප්‍රත්‍යය කවරේද?

3 "මහණෙනි, ශ්‍රැතවත්වූ ආර්‍ය්‍ය ශ්‍රාවකයාට දෘෂ්ටි නිරොධයෙන් අව්‍යාකෘත (ප්‍රකාශ නොකළ) වස්තූන්හි විචිකිච්ඡාව නූපදියි.

4 "සත්වයා මරණින් මතු වේයයි මහණතෙම මෙය දෘෂ්ටි ගත්තේය. (ii) සත්වයා මරණින් මතු නොවේයයි මහණ තෙම මෙය දෘෂ්ටි ගත්තේය. සත්වයා මරණින් මතු වේද නොවේදැයි

මහණතෙම මෙය දෘෂ්ටි ගත්තේය. සත්වයා මරණින් මතු නොමවෙයි. නොම නොවේයයි මහණතෙම මෙය දෘෂ්ටි ගත්තේය.

**5** "ඇසූ පිරූ තැන් නැති පෘථග්ජන භික්ෂුතෙම දෘෂ්ටිය නොමදනියි. දෘෂ්ටිය ඇතිවීමේ හේතුව නොමදනියි. දෘෂ්ටි නිරොධය (නැතිකිරීම) නොම දනියි. දෘෂ්ටි නිරොධ ගාමිනී ප්‍රතිපදාව නොම දනියි. ඔහුගේ ඒ දෘෂ්ටිය වැඩෙයි. හෙතෙම ඉපදීමෙන් නොමිදෙයි. ජරාව මරණය ශොකය වැළපීම දුක් දොම්නස් සිත්තැවුල් වලින් නොමිදෙයි.

**6** "ඇසූ පිරූ තැන් ඇති ආර්‍ය්‍ය ශ්‍රාවකවූ භික්ෂුතෙම දෘෂ්ටිය දනියි. දෘෂ්ටිය ඇතිවීමේ හේතුව දනියි. දෘෂ්ටි නිරොධය දනියි. දෘෂ්ටි නිරොධගාමිනී ප්‍රතිපදාව දනියි ඒ භික්ෂුවට ඒ දෘෂ්ටිය නිරුද්ධ වෙයි. හෙතෙම ඉපදීමෙන් මිදෙයි. ජරාව මරණය ශොකය වැළපීම් දුක දොම්නස හා සිත් තැවුල්වලින් මිදෙයි.

**7** "මෙසේ දත් මෙසේ දන්නා ඇසූ පිරූ තැන් ඇති ආර්‍ය්‍ය ශ්‍රාවක භික්ෂුතෙම මෙසේ බලයි. සත්වයා මරණින් මතු වේයයි නොපවසයි. සත්වයා මරණින් මතු නොවේයයි නොපවසයි. සත්වයා මරණින් මතු වේද නොවේදැයි නොපවසයි. සත්වයා මරණින් මතු නොමවෙයි නොම නොවේයයි නොපවසයි. මෙසේ මෙය දන්නා ඇසූ පිරූ තැන් ඇති ආර්‍ය්‍ය ශ්‍රාවක භික්ෂුතෙම ප්‍රකාශ නොකළ කරුණුවල ප්‍රකාශ නොකරණ ස්වභාව ඇත්තේ වෙයි.

**8** "මෙසේ දන්නා ශ්‍රැතවත්වූ ආර්‍ය්‍ය ශ්‍රාවක භික්ෂුතෙම ප්‍රකාශ නොකළ කරුණු වල තැතිනොගනියි. කම්පානොවෙයි නොසෙල් වෙයි. බියට නොපැමිණෙයි. සත්වයා මරණින් මතු වේ යන මෙය තෘෂ්ණාව අනුවගිය අදහසකි. වැටහීම අනුව ගිය අදහසකි. මෙය වැටහීම ඇත්තකුගේ අදහසෙකි. මෙය ප්‍රමාදයට හේතුය. මෙය ප්‍රමාදය අනුව ගිය අදහසකි. මෙය විපිළිසර (පසුතැවිල්ලකි.) මෙහි 4 (ii) යෙදිය යුතුයි)

**9** "අශ්‍රැතවත් පෘථග්ජන භික්ෂුව විපිළිසර නොදනියි. විපිළිසර ඇතිවීමේ හේතුව නොදනියි. විපිළිසර නිරොධය

(නැතිකිරීම) නොදනියි. විපිළිසරය නිරුද්ධ කිරීමේ (නැති කිරීමේ) ප්‍රතිපදාව නොදනියි. ඔහුගේ ඒ විපිළිසරය (පසුතැවිල්ල) වැඩෙයි. හෙතෙම ඉපදීමෙන් නොමිදෙයි. ජරාව ව්‍යාධිය මරණය ශෝකය වැළපීම හා දුක් දොම්නස්, සිත් තැවුල්වලින් නොමිදෙයි.

10 "ශ්‍රැතවත්වූ ආර්‍ය්‍ය ශ්‍රාවක භික්ෂුතෙම වනාහි විපිළිසරය දනියි. විපිළිසර ඇතිවීමේ හේතුව දනියි. විපිළිසර නිරොධය දනියි. විපිළිසර නිරුද්ධකිරීමේ ප්‍රතිපදාව දනියි. හෙතෙම ඉපදීමෙන් මිදෙයි ජරා මරණ, ශොක, පරිදෙව දුක්ඛ, දොමනස්ස, උපායාස දුක්වලින් මිදෙයි.

11 'මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවක භික්ෂුතෙම සත්වයා මරණින් මතු වේයයි ප්‍රකාශ නොකරයි. සත්වයා මරණින් මතු නොවේයයි ප්‍රකාශනොකරයි සත්වයා මරණින් මතු වේය නොවේයයි ප්‍රකාශ නොකරයි. සත්වයා මරණින් මතු නොමවේ. නොම නොවේයයි ප්‍රකාශ නොකරයි. මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම ප්‍රකාශ නොකළ වස්තූන්හි ප්‍රකාශ නොකළ ධර්ම ඇත්තේ වෙයි. මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම මෙසේ බලන්නේ ප්‍රකාශනොකළ වස්තූන්හි තැති නොගනියි. කම්පා නොවෙයි. හදිසි බියට නොපැමිණෙයි. මහණෙනි, යම්හෙයකින් ශ්‍රැතවත්වූ ආර්‍ය්‍ය ශ්‍රාවකයාට ප්‍රකාශ නොකළ වස්තූන්හි විචිකිච්ඡාව නූපදීද මේ එයට හේතුවයි."

**2 පුරිසගති සූත්‍රය:-** 1 "මහණෙනි, සප්ත පුරිස ගතිද අනුපාද පරිනිර්වාණයද දෙශනා කරන්නෙමි. එය අසව්. මනාකොට සිහි කරව්, දෙශනා කරන්නෙමි"-"එසේය ස්වාමීනියි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

2 "මහණෙනි, සප්ත පුරිසගති (පුද්ගලයන් ස්වභාව හත) කවරහුද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම මෙසේ පිළිපන්නේ වෙයි. මෙසේ නොවූයේය. මට මෙසේ නොවන්නේය. මට ඇති නොවන්නේය. යම් යම් වූවක් ඇද්ද එය දුරු කරන්නෙමි'යි උපෙක්ෂාව ලබයි. හෙතෙම භවයෙහි

නොඇලෙයි. ඇතිවීමෙහි නොඇලෙයි. මත්තෙහි ශාන්ත නිර්වාණ පදයක් ඇද්ද, සම්‍යක් ප්‍රඥාවෙන් දකියි. හෙදවනාහි ඔහුට ඒ නිර්වාණ පදය සියල්ලෙන් සියල්ල ප්‍රත්‍යක්ෂ වූයේ නොවෙයි. ඔහුට සර්වප්‍රකාරයෙන් මානය නම් සිතිවිල්ල ප්‍රහීණ නොවූයේ වෙයි. ඔහුට සර්වප්‍රකාරයෙන් භවරාගය නම් සිතිවිල්ල ප්‍රහීණ නොවූයේ වෙයි. ඔහුට සර්වප්‍රකාරයෙන් අවිද්‍යාව නම් සිතිවිල්ල ප්‍රහීණ නොවූයේ වෙයි. හෙතෙම ඔරම්භාගිය සංයෝජන (මෑත බැඳුම්) පස ක්ෂය කිරීමෙන් අන්තරා පරිනිබ්බායී නම් අවිහාදියෙහි ඉපිද එහි ආයුෂයෙන් භාගයක් නොඉක්මවා රහත්ව පිරිනිවෙන අනාගාමී පුද්ගලයා වෙයි.

3 "මහණෙනි යම්සේ දවල් කාලයෙහි ඉතා රත්වූ යකඩ කබල නැසෙන කල්හි එහි පතුරු ඇතිවී විහිසිවී කලෙහි හැපී නිවෙන්නේද මහණෙනි, එපරිද්දෙන්ම භික්ෂුව මෙසේම පිළිපන්නේ වෙයි. 'නොවූයේය. මට නොවන්නේය. ඇති නොවන්නේය. මට ඇති නොවන්නේය. යම් යම් භූතයක් (වූවක්) ඇද්ද එය දුරු කරමි'යි උපෙක්ෂාව ලබයි. හෙතෙම භවයෙහි නොඇලෙයි. ඇතිවීමෙහි නොඇලෙයි. ශාන්තවූ මත්තෙහි නිර්වාණ පදයක් ඇද්ද එය සම්‍යක් ප්‍රඥාවෙන් දකියි. ඒ පදයද වනාහි සර්වප්‍රකාරයෙන් ප්‍රත්‍යක්ෂ කරණ ලද්දේ නොවෙයි. ඔහුට සර්වප්‍රකාරයෙන් මානය නම් සිතිවිල්ල ප්‍රහීණ වූයේ නොවෙයි. ඔහුට සර්වප්‍රකාරයෙන් භව රාගය නම් සිතිවිල්ල ප්‍රහීණ නොවූයේ වෙයි. ඔහුට සර්වප්‍රකාරයෙන් අවිද්‍යානුසය ප්‍රහීණ නොවූයේ වෙයි හෙතෙම පඤ්ච ඔරම්භාගිය සංයෝජනයන් ක්ෂය කිරීමෙන් අන්තරා පරිනිබ්බායී වේ.

4 (i) "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම මෙසේ පිළිපන්නේ වෙයි. 'නොවූයේය. මට නොවන්නේය. ඇති නොවන්නේය. මට ඇතිනොවන්නේය. යම් යම් භූතයක් ඇද්ද එය දුරු කරමියි' උපෙක්ෂාව ලබයි. හෙතෙම භවයෙහි නොඇලෙයි. ඇතිවීමෙහි නොඇලෙයි. මතු ශාන්තවූ නිර්වාණ පදයක් ඇද්ද එය සම්‍යක් ප්‍රඥාවෙන් දකියි. ඔහුගේ නිර්වාණ පදයද සර්වප්‍රකාරයෙන් ප්‍රත්‍යක්ෂ කරණ ලද්දේ නොවෙයි. ඔහුගේ මානය නම් සිතිවිල්ල සර්වප්‍රකාරයෙන් ප්‍රහීණ

නොවූයේවේ. ඔහුගේ භව රාගය නම් සිතිවිල්ල ප්‍රහීණ නොවූයේවේ. සර්වප්‍රකාරයෙන් අවිද්‍යානුසය ප්‍රහීණ නොවූයේවේ (ii) හෙතෙම පඤ්ච ඔරම්භාගිය සංයෝජනයන් ක්ෂය කිරීමෙන් අන්තරා පරිනිබ්බායී වේ.

5. "(i) මහණෙනි, යම්සේ දවසක් ගිනියම්වූ යකඩ කබලක් තලනා කල්හි එහි පතුරු ඇතිවී උඩපැන තලෙහි හැපී නිවෙන්නේද (ii) මහණෙනි, එපරිද්දෙන්ම මහණ තෙම මෙසේ පිළිපන්නේ වෙයි (මෙහි 4 (i) ඡේදය යෙදිය යුතුයි.)

6. (මෙහි 5 (i) යෙදිය යුතුයි.) මහණෙනි, එපරිද්දෙන්ම මහණතෙම මෙසේ පිළිපන්නේ වෙයි. (මෙහි 4 (i) ඡේදය යෙදිය යුතුයි.) හෙතෙම පඤ්චඔරම්භාගිය සංයෝජනයන්ගේ ක්ෂය වීමෙන් උපහච්ච පරිනිබ්බායි (අවිහාදියෙහි ඉපිද ආයුෂ භාගයක් නොඉක්මවා රහත්ව පිරිනිවෙන) අනාගාමී පුද්ගලයා වෙයි

7. "මහණෙනි, දවසේ ගිනියම්වූ යකඩ කබලක් තළන කල්හි එහි පතුරු නැග උඩට නැගී තලෙහි හැපී නිවෙන්නේය. මහණෙනි, එපරිද්දෙන්ම මහණ තෙම මෙසේ පිළිපන්නේ වෙයි. (මෙහි 4 (i) ඡේදය යෙදිය යුතුයි.) හෙතෙම පඤ්ච ඔරම්භාගිය සංයෝජනයන් ක්ෂය කිරීමෙන් අසංඛාර පරිනිබ්බායි (උත්සාහයක් නැතිව රහත් බවට පැමිණෙන) අනාගාමී පුද්ගලයා වෙයි.

8 "මහණෙනි, යම්සේ දවසක් ගිනියම්වූ යකඩ කබල සොළවන කල්හි පතුරු නැග උඩට පැන කුඩා තණරොදක හෝ කුඩා දර ගොඩක හෝ වැටෙන්නේය. ඒ ගිනියම්වූ පතුර එහි ගිනිද උපදවන්නේය. දුම්ද උපදවන්නේය. ගිනිද උපදවා දුම්ද උපදවා එම කුඩා තණරොද හෝ ලී ගොඩ හෝ විටින් ගෙන, අහර නැත්තේ නිවෙන්නේය. මහණෙනි, එපරිද්දෙන් මහණතෙම මෙසේ පිළිපන්නේ වෙයි. (මෙහි 4 (i) යෙදිය යුතුයි.) හෙතෙම පඤ්ච ඔරම්භාගිය සංයෝජනයන් ක්ෂය කිරීමෙන් අසංඛාර පරිනිබ්බායි අනාගාමි පුද්ගලයා වෙයි. මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව මෙසේ පිළිපන්නේ වෙයි. (මෙහි 4 (i) යෙදිය යුතුයි.) හෙතෙම පඤ්ච ඔරම්භාගිය සංයෝජනයන්ගේ

ක්ෂය වීමෙන් සසංඛාර පරිනිබ්බායි (උත්සාහයෙන් රහත්බවට පැමිණෙන) අනාගාමී පුද්ගලයා වෙයි.

9. "මහණෙනි, යම්සේ දවසක් ගිනියම්වූ යකඩ කබල තළන කල්හි පතුරු නැග උඩට පැන ලොකු තණ රොදක හෝ ලොකු දරගොඩක හෝ වැටෙන්නේද ඒ පතුර එහි ගිනිද ඇති කරවන්නේය. දුමද ඇති කරවන්නේය. ගිනිද ඇති කොට දුමද ඇතිකොට ඒ ලොකු තණරොද හෝ දර ගොඩ හෝ වටින් ගෙන අහර නැත්තේ නිවෙන්නේය. මහණෙනි, එපරිද්දෙන්ම මහණතෙම මෙසේ පිළිපන්නේ වෙයි. (මෙහි 4 (i) යෙදිය යුතුයි.) හෙතෙම පඤ්ච ඕරම්භාගිය සංයෝජනයන්ගේ ක්ෂය වීමෙන් සසංඛාර පරිනිබ්බායී අනාගාමී පුද්ගලයා වෙයි. මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම මෙසේ පිළිපන්නේ වෙයි. (මෙහි 4 (i) යෙදිය යුතුයි.) මත්තෙහි ශාන්තවූ නිර්වාණ පදයක් ඇද්ද මනා ප්‍රඥාවෙන් දකියි. ඒ පදයද වනාහි සර්වප්‍රකාරයෙන් ප්‍රත්‍යක්ෂකරණ ලද්දේ වෙයි. ඔහුගේ සර්වප්‍රකාරයෙන් මානය නම් සිතිවිල්ල ප්‍රහීන නුවූයේ වෙයි. සර්වප්‍රකාරයෙන් භවරාගය නම් සිතිවිල්ල ප්‍රහීණ නුවූයේ වෙයි. අවිද්‍යාව නම් සිතිවිල්ල ප්‍රහීන නුවූයේ වෙයි. හෙතෙම පඤ්ච ඕරම්භාගිය සංයෝජනයන් ක්ෂය කිරීමෙන් උද්ධංසොත අකනිට්ඨගාමී (ශුද්ධ වාස භූමියෙහි ඉපද පිළිවෙළින් අකනිටා බඹලොව දක්වා ගොස් අකනිටා බඹලොවදී පිරිනිවෙන) අනාගාමී පුද්ගලයා වෙයි.

10. "මහණෙනි, දවසක් ගිනියම්වූ ගිනිකබලක් තළන කල්හි පතුරු නැග උඩපැන ලොකු තණ රොදක හෝ දර ගොඩක හෝ වැටෙන්නේය. ඒ පතුර එහි ගිනිද උපදවන්නේය. දුම්ද උපදවන්නේය. ගිනිද ඇතිකොට දුම්ද ඇති කොට ඒ මහත්වූ තණරොද හෝ මහත්වූ දරගොඩ හෝ වට කොට පඳුරුද දවන්නේය. වනයද දවන්නේය. පඳුරුද දවා වනයද දවා අමුපැලැටි ආදියෙහි අන්තය හෝ කොළවල අන්තය හෝ ගල්වල අන්තය හෝ ජලය කෙළවරකොට ඇති හෝ රම්‍යවූ බිම් පෙදෙසකට පැමිණ එය ගිනි නොගෙන නිවෙන්නේය මහණෙනි, එපරිද්දෙන්ම මහණතෙම මෙසේ පිළිපන්නේවෙයි (මෙහි 4 (i) යෙදිය යුතුයි.) හෙතෙම පඤ්ච ඕරම්භාගිය

සංයෝජනයන් ක්ෂය කිරීමෙන් උද්ධංසොත අකනිට්ඨගාමී අනාගාමී පුද්ගලයා වෙයි. මහණෙනි, මේ සප්ත පුරුෂ ගතීහු වෙති.

11. "මහණෙනි, අනුපාදා පරිනිර්වානය කවරේද?

12. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම මෙසේ පිළිපන්නේ වෙයි. 'නොවූයේය මට නොවන්නේය ඇති නොවන්නේය, මට ඇතිවන්නේය. යම් භූතයක් ඇද්ද එය දුරු කරමියි' උපෙක්ෂාව ලබයි. හෙතෙම භවයෙහි නොඇලෙයි. ඇතිවී මෙහි නොඇලෙයි ශාන්තවූ මත්තෙහි ඇති නිර්වාණ පදයක් ඇද්ද සම්‍යක් ප්‍රඥාවෙන් බලයි. ඒ නිර්වාණ පදයද සර්වප්‍රකාරයෙන් ප්‍රත්‍යක්ෂ කරණ ලද්දේ වෙයි. ඔහුට සර්වප්‍රකාරයෙන් මානය නම් සිතිවිල්ල ප්‍රහීණ වූයේ වෙයි. සර්වප්‍රකාරයෙන් භව රාගය නම් සිතිවිල්ල ප්‍රහීන වූයේ වෙයි. සර්වප්‍රකාරයෙන් අවිද්‍යාව නම් සිතිවිල්ල ප්‍රහීන වූයේ වෙයි. හෙතෙම ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත් ඵල සමාධියත් අර්හත් ඵල ප්‍රඥාවත් (රහත් නුවණ) මේ ආත්මයෙහි තමාම විශෙෂ ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරයි. මහණෙනි, මෙය අනුපාදා පරිනිර්වාණය නම් වේ.

13. "මහණෙනි, මේ සප්තගතීහු වෙති. මහණෙනි, මේ අනුපාදා පරිනිර්වාණය වේ.

3 **තිස්ස බ්‍රහ්ම සූත්‍රය**:- 1 "මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහිවූ ගිජුකුළු පව්වෙහි වැඩ වසනසේක. ඉක්බිත්තෙන් වනාහි දේවතාවෝ දෙදෙනෙක් රාත්‍රිය ඉක්ම ගිය කල්හි දැකුම් කලු පැහැයෙන් මුළු ගිජුකුළු පෙදෙස බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමුණුනාහ. පැමිණ එකත්පසෙක සිටියාවූ එක් දේවතාවෙක් භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළ කළේය

2 "ස්වාමීනි මේ භික්ෂුණීහු මිදුණාහු වෙති." (යනුවෙනි) අනික් දෙවතාවා, "ස්වාමීනි, මේ භික්ෂුණීහු අනුපාදිශෙෂ වූවාහු

මනාකොට මිදුණාහු වෙතියි” මෙසේ සැළ කළහ. ශාස්තෲන් වහන්සේ දෙවතාවන්ගේ වචනයට එකඟවූ සේක. ඉක්බිති ඒ දේවතාවෝ ශාස්තෲන් වහන්සේ එකඟ වූසේකැයි භාග්‍යවතුන් වහන්සේ වැඳ ප්‍රදක්ෂිණාකොට එහිම අතුරුදහන් වූහ.

3 “ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ රාත්‍රියගේ ඇවෑමෙන් භික්ෂූන් ඇමතූ සේක. “මහණෙනි, මේ රාත්‍රියෙහි දෙවතාවෝ දෙදෙනෙක් මනහර රාත්‍රියෙහි පැහැපත් වර්ණයෙන් මුළු ගිජුකුළු පෙදෙස ආලොක කොට මා යම් තැනෙකද එතැන්හි පැමිණියහ. පැමිණ මා වැඳ එකත්පසෙක සිටියහ. මහණෙනි එකත්පසෙක සිටියාවූ එක් දේවතාවෙක් මට මෙසේ සැළ කළේය “ස්වාමීනි, මේ භික්ෂුණීහු මිදුනාහුය” අනික් දේවතාවා මට මෙසේ සැළ කළේය. “ස්වාමීනි, මේ භික්ෂුණීහු අනුපාදිශෙෂයහ. මනාකොට මිදුණාහ.”

4. ‘මහණෙනි ඒ දේවතාවෝ මෙය මට සැළ කළහ. මෙය සැළකොට මට වැඳ ප්‍රදක්ෂිණා කොට එතැන්හි අතුරුදහන් වූහ. එකල්හි වනාහි ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි වැඩ සිටියේ වෙයි. ඉක්බිති ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේට මේ අදහස විය. ‘සවුපාදිශෙෂයෙහි සවුපාදිශෙෂයයිද, අනුපාදිශෙෂයෙහි අනුපාදිශෙෂයයිද, කවර නම් දෙවියන්ට මෙබඳු ඥානයක් වේද? එකල්හි වනාහි තිස්ස නම් භික්ෂුව ලඟදී කළුරිය කළේ එක්තරා බ්‍රහ්ම ලෝකයක උපන්නේ වෙයි. එහිද තිස්ස බ්‍රහ්මතෙමේ මහර්ධි ඇත්තෙක, මහානුභාව ඇත්තෙකැයි ඔහු ගැන දනිත්.”

5. ඉක්බිති ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම යම්සේ වනාහි බලවත් පුරුෂයෙක් හකුළුවන ලද අතක් දිගු කෙරේද, දිගු කරණ ලද අතක් හකුළුවාද, එපරිද්දෙන් ගිජුකුළු පව්වෙහි අතුරුදහන් වූයේ ඒ බ්‍රහ්ම ලොකයෙහි පහළ විය. තිස්ස බ්‍රහ්මතෙම, එන්නාවූ ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ දුරින්ම දැක්කේමය. දැක ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේට මෙසේ කීයේය. “නිදුක්වූ මොග්ගල්ලානයෙනි, එනු මැනවි. නිදුක්වූ මොග්ගල්ලානයෙනි

යහපත් ගමනක් වේවා! මෙහි ඒම පිණිස බොහෝ කලකින් මේ පැමිණීම කෙළේය. මේ ආසනය පණවන ලදී. වැඩ හිඳිනු මැනවි, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයනි"යි (කීයේය). ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ පැනවූ අස්නෙහි වැඩ සිටියේමය. තිස්ස බ්‍රහ්මතෙමේද ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටියාවූ තිස්ස බ්‍රහ්මයාට ආයුෂ්මත් මහා මොග්ගල්ලාන තෙම මෙසේ කීයේය.

6 "තිස්සය, සවුපාදිශෙෂයෙහි සවුපාදි ශෙෂයයිද, අනුපාදිශෙෂයෙහි අනුපාදි ශෙෂයයිද, තිස්සය, කවර දෙවියන්ට මෙසේ ඥානයක් වේද?"

"නිදුක්වූ මොග්ගල්ලානයෙනි, සවුපාදිශෙෂයෙහි සවුපාදිශෙෂයයිද, අනුපාදිශෙෂයෙහි අනුපාදි ශෙෂයයිද බ්‍රහ්ම කායික දෙවියන්ට මේ ඥානය වෙයි."-"සවුපාදි ශෙෂයෙහි සවුපාදි ශෙෂයයිද, අනුපාදි ශෙෂයෙහි අනුපාදි ශෙෂයයිද, තිස්සය, සියලුම බ්‍රහ්ම කායික දෙවියන්ට මේ ඥානය වේද?" "නිදුක්වූ මොග්ගල්ලානයෙනි, සවුපාදිශෙෂයෙහි සවුපාදි ශෙෂයයිද අනුපාදිශෙෂයෙහි අනුපාදිශෙෂයයිද සියලුම බ්‍රහ්ම කායික දෙවියන්ට මේ ඥානය නොවෙයි. නිදුක්වූ මොග්ගල්ලානයෙනි, බ්‍රහ්මවූ ආයුෂයෙන් සතුටුවූ බ්‍රහ්මවූ වර්ණයෙන් බ්‍රහ්මවූ සැපයෙන් බ්‍රහ්මවූ කීර්තියෙන් ආධිපත්‍යයෙන් සතුටුවූ යම් බ්‍රහ්ම කායිකයෝ වෙද්ද ඒ මත්තෙහි මිදීම තතුසේ නොදනීද, ඔවුන්ට මේ ඥානය නොවෙයි. නිදුක්වූ මොග්ගල්ලානයෙනි, බ්‍රහ්මවූ ආයුෂයෙන් අසතුටුවූ වර්ණයෙන්, සැපයෙන්, කීර්තියෙන් බ්‍රහ්මවූ ආධිපත්‍යයෙන් අසතුටු වූවාහු ඒ මතු මිදීමද තතුසේ දනිද්ද ඔවුන්ට සවුපාදිශෙෂයෙහි සවුපාදි ශෙෂයයිද අනුපාදි ශෙෂයෙහි අනුපාදි ශෙෂයයිද මේ ඥානය වෙයි.

7. "නිදුක්වූ මොග්ගල්ලානයෙනි, මෙහි මහණතෙම උභතොභාග විමුත්තවූයේ (අර්හත්ඵලයෙහි අරූපධ්‍යාන පාදකොට විමුක්තවූයේ වෙයි. ඒ කාරණය දෙවියෝ මෙසේ

දනිත්. උභතොභාගවිමුක්තවූ ආයුෂ්මත්තෙම ඔහුගේ කය යම්තාක්ද ඒතාක් මෙහි පෙණෙත්. ශරීරයාගේ බිඳීමෙන් මනුෂ්‍යයෝ ඔහු නොදකිත්. නිදුක්වූ මොග්ගල්ලානයෙනි, අනුපාදිශෙෂයෙහි අනුපාදිශෙෂයයි ඒ දෙවියන්ට මේ ඥානය වෙයි. ආයුෂ්මත් මොග්ගල්ලානයෙනි, මෙහි මහණ පඤ්ඤා විමුත්ත (එකෙනෙහි අර්හත්ඵලය ලත්) වේද ඒ දෙවියෝ ඒ කරුණ මෙසේ දනිත්, මේ ආයුෂ්මත්වූ පඤ්ඤා විමුක්තතෙම යම්තාක් ඔහුගේ කය තිබේද ඒතාක් ඔහු දෙව් මිනිස්සු දකිත්. කායයාගේ බිඳීමෙන් දෙව් මිනිස්සු ඔහු නොදකිත්.

8. "නිදුක්වූ මොග්ගල්ලානයෙනි, මෙසේද ඒ දෙවියන්ගේ අනුපාදිශෙෂයෙහි හෝ අනුපාදිශෙෂයයි ඥානයක් වෙයි. මහණෙනි, මෙහි වනාහි භික්ෂුව 'කායසක්ඛි' වූයේද අප්පණිහිත විමොක්ෂයෙන් විමුක්තවූ) වෙයි. මේ කරුණ දෙවියෝ මෙසේ දනිත්. (ii) 'මේ ආයුෂ්මත් 'කායසක්ඛි' තෙම අනුලොම්වූ සේනාසනයන්, සේවනය කරන්නේ, කළ්‍යාණ මිත්‍රයන් භජනය කරන්නේ හාත්පසින් ඉන්ද්‍රියයන් හික්මවනු ලබන්නේ, යමක් පිණිස කුලපුත්‍රයෝ මනාකොට ගිහිගෙයින් නික්ම අනගාරිය නම් ශාසනයෙහි පැවිදි වෙද්ද, බඹසර කෙළවරකොට ඇති ඒ නිරුත්තර රහත්බව මෙලොවම තෙමේ විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂකොට එයට පැමිණ වාසය කරන්නේ නම් ඉතා යෙහෙක.

9 "නිදුක්වූ මොග්ගල්ලානය, සවුපාදිශෙෂයෙහි සවුපාදිශෙෂයයි, මෙසේද ඒ දෙවියන්ට ඥානයක් වෙයි. නිදුක්වූ මොග්ගල්ලානය, මෙහි වනාහි භික්ෂුතෙම "දිට්ඨිප්පත්ත" වූයේ (සුඤ්ඤත විමොක්ෂයෙන් විමුක්තවූ ආර්‍ය්‍යශ්‍රාවකයා සොතාපත්තිඵල සකෘදාගාමීමාර්ගඵල අනාගාමී මාර්ගඵල අර්හත් මාර්ග යන මේ මධ්‍යමාර්ගඵල සයෙහි දිට්ඨිප්පත්ත නම්.

(මේ සූත්‍රයේ 8 (ii) ඡෙදය 'කායසක්ඛී' වෙනුවට 'දිට්ඨිප්පත්ත' කියා වෙනස්කර යොදාගත යුතුයි (සද්ධාවිමුත්ත) වූයේ වෙයි. අනිමිත්ත විමොක්ෂයෙන් විමුක්තවූ ආර්‍ය්‍යශ්‍රාවක තෙම මතු සත් තැන්හිම සද්ධාවිමුත්ත නම්. ධම්මානුසාරී වූයේ

වෙයි. (සුඤ්ඤත විමොක්ෂයෙන් විමුක්තවූ ආර්‍යයශ්‍රාවක ශ්‍රොතාපත්ති මාර්ග ක්‍ෂණයෙහි ධම්මානුසාරී නමී.) ඒ කරුණ ඒ දෙවියෝ මෙසේ දනිත්. මේ ආයුෂ්මත් ධම්මානුසාරීතෙම (මේ සූත්‍රයේ 8 (ii) ඡේදය 'කායසක්ඛි' වෙනුවට 'සද්ධාවිමුත්ත' කියා වෙනස්කර යොදාගත යුතුයි)"

10. ඉක්බිති ආයුෂ්මත් මහාමොග්ගල්ලානතෙම තිස්ස බ්‍රහ්මයාගේ වචනයට සතුටුවී අනුමෝදන්ව, යම්සේ වනාහි බලවත් පුරුෂයෙක් හකුළුවනලද අතක් දිගුකරන්නේද, දිගු කරණලද අතක් හකුළුවන්නේද, එපරිද්දෙන්ම බ්‍රහ්ම ලෝකයෙහි අතුරුදහන් වූයේ ගිජ්ඣකූළපව්වෙහි පහළවිය. ඉක්බිති ආයුෂ්මත් මහා මොග්ගල්ලානතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ ආයුෂ්මත් මහා මොග්ගල්ලානතෙම තිස්ස බ්‍රහ්මයා සමග කථා සල්ලාපය යම් පමණද ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේට දැන්විය.

11. "මොග්ගල්ලානය, තිස්ස බ්‍රහ්මයා විසින් තොපට සත්වැනි වූ අනිමිත්ත විහාරී පුද්ගලයා ප්‍රකාශ නොකළේය."

"භාග්‍යවතුන් වහන්සේ යම් ඒ සත්වැනි අනිමිත්ත විහාරී පුද්ගලයා දෙශනා කරන්නේ නම් භාග්‍යවතුන් වහන්ස, එයට මේ කාලයයි සුගතයන් වහන්ස, එයට මේ කාලයයි. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගෙන් අසා දරා ගන්නාහුය.

12. "එසේ නම් මොග්ගල්ලානය, අසව. මනාකොට සිහි කරව දෙශනා කරන්නෙමි" "එසේය ස්වාමීනියි"-ආයුෂ්මත් මහා මොග්ගල්ලානතෙම භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ දෙශනා කළසේක.

"මොග්ගල්ලානය, මේ ශාසනයෙහි භික්ෂුතෙම සියලු නිමිති මෙනෙහි නොකිරීමෙන් අනිමිත්තවූ චිත්ත සමාධියක් වේද එයට සමවැද වාසය කරයි. ඔහු ගැන දෙවියෝ මෙසේ දනිත්. මේ ආයුෂ්මත්තෙම සියලු නිමිති සිහි නොකිරීමෙන් නිමිති ඇල්ලීම් නැති සිතේ එකඟකමට පත්වී සිටියි. මේ ආයුෂ්මත්තෙම යොග්‍යවූ සේනාසනයන් සේවනය කරන්නේ කළ්‍යාණ මිත්‍රයන්

භජනය කරන්නේ ඉන්ද්‍රිය සමථයට පමුණුවන්නේ යමක් පිණිස කුලපුත්‍රයෝ මනාකොට ගිහිගෙයින් නික්ම අනගාරීය නම්වූ ශාසනයෙහි පැවිදි වෙද්ද බඹසර අවසන්කොට ඇති නිරුත්තර රහත්බව මෙලෙව්හිදීම තෙමේ යහපත් ඥානයෙන් ප්‍රත්‍යක්ෂකොට එයට පැමිණ වාසය කරන්නේ නම් ඉතා යෙහෙක යනුයි.

13. "මොග්ගල්ලානය, එපරිද්දෙන්ම සවුපාදිශෙෂයෙහි සවුපාදිශෙෂයයි මෙසේ ඥානය ඇතිවෙයි."

4 **සීහ-දානඵල සූත්‍රයː-** 1 "එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විශාලා නගරය සමීපයෙහිවූ මහාවනයෙහි කූටාගාර ශාලාවෙහි වැඩවසන සේක. එකල්හි වනාහි සීහනම් සේනාපති තෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ සීහ සේනාපති තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළ කළේය.

2 "ස්වාමීනි, සාන්දෘෂ්ටික (මෙලොවදී පෙනෙන) දාන ඵලය ප්‍රකාශ කරන්නට හැකිසේක්ද?"

"එසේ නම් සීහය, එයම මෙහිදී විචාරන්නෙමි. යම්සේ ඔබට රුචිවන්නේනම් ප්‍රකාශ කරව. සීහය, මේ ලොකයෙහි පුරුෂයෝ දෙදෙනෙකි.

3 "එක් පුරුෂයෙක් අශ්‍රද්ධාවත්ය, මසුරුය, තද මසුරුය, අපහාස කරන්නේය. එක් පුරුෂයෙක් සැදැහැවත්ය දානපතිය, දීමෙහි ඇළුණේය. සීහය, කුමක් සිතන්නෙහිද? (ii) රහතුන් වහන්සේලා යම් ඒ පුරුෂයෙක් අශ්‍රද්ධාවත්ද, මසුරුද, තද මසුරුද, අපහාස කරන්නේද, (iii) යම් ඒ පුරුෂයෙක් ශ්‍රද්ධාවත්ද, දානපතීද දීමෙහි ඇළුනේද, (ii) මින් කවර නම් පුරුෂයකුට අනුකම්පා කරන්නාහු අනුකම්පා කෙරෙත්ද?"

4 (i) "ස්වාමීනි, යම් ඒ පුරුෂයෙක් අශ්‍රද්ධාවත්ද, මසුරුද, තද මසුරු අපහාස කරන්නේද (ii) කිමෙක්ද ස්වාමීන් වහන්සේලා ඔහුට අනුකම්පා කරන්නාහු අනුකම්පා කෙරෙද්ද, (iii) ස්වාමීනි, යම් ඒ පුරුෂයෙක් ශ්‍රද්ධාවත්ද, දානපතිද, දීමෙහි

ඇළුනේද (iv) ඔහුටම රහතුන් වහන්සේලා පළමුව අනුකම්පා කරන්නාහු අනුකම්පා කරන්නහුය.

5 (i) "සීහය, කුමකැයි සිතන්නෙහිද? යම් ඒ පුරුෂයෙක් අශ්‍රද්ධාවත්ද මසුරුද තද මසුරුද අපහාස කරන්නේද යම් ඒ පුරුෂයෙක් ශ්‍රද්ධාවත්ද, දානපතිද, දීමෙහි ඇළුනේද, (ii) කවරකු වෙත රහතුන් වහන්සේලා පැමිණෙන්නාහු පැමිණෙද්ද?"

6 (මෙහි 4 (i) යෙදිය යුතුයි) (ii) කිමෙක්ද රහතුන් වහන්සේලා ඔහු වෙත පළමුව පැමිණෙන්නාහු පැමිණෙද්ද? (මෙහි 4 (iii) යෙදිය යුතුයි) ඔහු වෙනම රහතුන් වහන්සේලා පළමුව පැමිණෙන්නාහු පැමිණෙත්.

7 (මෙහි 5 (i) යෙදිය යුතුයි.) සීහය, රහතුන් වහන්සේලා පළමුව කාගේ (දානය) පිළිගන්නාහු පිළිගනිද්ද?

8 'ස්වාමීනි, (මෙහි 4 (i) යෙදිය යුතුයි.) කිමෙක්ද? ඔහුගේ (දානය) රහතුන් වහන්සේලා පළමු පිළිගන්නාහු පිළිගනිද්ද? (මෙහි 4 (iii) යෙදිය යුතුයි.) ඔහුගේම (දානය) රහතුන් වහන්සේලා පළමුව පිළිගන්නාහු පිළිගණිත්."

9 (මෙහි 5 (i) යෙදිය යුතුයි.) සීහය, රහතුන් වහන්සේලා කවරෙකුට පළමුව ධර්මය දෙශනා කරන්නාහු දෙශනා කරද්ද,

10 (මෙහි 4 (i) යෙදිය යුතුයි.) කිමෙක්ද ඔහුට රහතුන් වහන්සේලා පළමුව ධර්මය දෙශනා කරන්නාහු දෙශනාකරද්ද (මෙහි 4 (iii) යෙදිය යුතුයි.) ඔහුටම රහතුන් වහන්සේලා පළමුව ධර්මය දෙශනා කරන්නාහු දෙශනා කරත්.

11 (මෙහි 5 (i) යෙදිය යුතුයි) කවරෙකුගේ යහපත් කීර්ති ශබ්දය නැගීයේද?"

12. (මෙහි 4 (i) යෙදිය යුතුයි.) ස්වාමිනී, ඔහුගේ යහපත් කීර්ති ශබ්දය නැගී යන්නේද? (මෙහි 4 (iii) යෙදිය යුතුයි) ඔහුගේම යහපත් කීර්ති ශබ්දය නැගී යන්නේය."

13 (මෙහි 5 (i) යෙදිය යුතුයි) කවරෙක් වනාහි ඉදින් ක්ෂත්‍රිය පිරිසකටද ඉදින් බ්‍රාහ්මණ පිරිසකටද ඉදින් ගෘහපති පිරිසකටද

යන යම් යම්ම පිරිසක් වෙත පැමිණෙන්නේ නම් නොහැකිලී නිර්භයව පැමිණෙන්නේද?"

14 "කිමෙක්ද? ස්වාමීනි, (මෙහි 4 (i) යෙදිය යුතුයි) ඔහු වනාහි ඉදින් ක්ෂත්‍රිය පිරිසකටද ඉදින් බ්‍රාහ්මණ පිරිසකටද, ඉදින් ගෘහපති පිරිසකටද යන යම් යම්ම පිරිසක් වෙත පැමිණෙන්නේ නම් නොහැකිලී නිර්භයව පිරිස් වෙත පැමිණේද? (මෙහි 4 (iii) යෙදිය යුතුයි) නොහැකිලී නිර්භයව පිරිස් වෙත පැමිණෙන්නේ වේ"

15 (මෙහි 5 (i) යෙදිය යුතුයි.) සීහය, කුමකැයි සිතන්නෙහිද? කවරෙක් කායයාගේ බිඳීමෙන් මරණින් මතු ස්වර්ග ලෝකයෙහි උපදින්නේද?"

16 (මෙහි 4 (i) යෙදිය යුතුයි.) කිමෙක්ද ස්වාමීනි, හෙතෙම කායයාගේ බිඳීමෙන් මරණින් මතු සුගති නම්වූ ස්වර්ග ලෝකයෙහි උපදින්නේද? (මෙහි 4 (iii) යෙදිය යුතුයි) හෙතෙම කායයාගේ බිඳීමෙන් මරණින් මතු සුගති නම්වූ ස්වර්ග ලෝකයෙහි උපදින්නේය.'

17 "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් ඒ සයවැදෑරුම් සාන්දෘෂ්ටික දානඵලයෝ දෙශනා කරණ ලදද මම මෙහිලා භාග්‍යවතුන් වහන්සේට ඇදහීමෙන් නොයමි මමද මෙය දනිමි ස්වාමීනි, මම දායකවූයෙම් දානපතිවූ මා වෙත රහතුන් වහන්සේලා පළමුව අනුකම්පා කරන්නාහු අනුකම්පා කරත්. ස්වාමීනි, මම දායක වූයෙම්. දානපතිවූ මා වෙත රහතුන්වහන්සේලා පළමුව පැමිණෙන්නාහු පැමිණෙත්. ස්වාමීනි, මම දායකවූයෙම්, දානපතිවූයෙම් (මාගේ දානය රහතුන් වහන්සේලා පළමුව පිළිගන්නාහු පිළිගනිත් ස්වාමීනි, මම දායකවූයෙම්, දානපතිවූයෙම් රහතුන් වහන්සේලා ධර්මය දේශනා කරන්නාහු මට පළමුව දෙශනා කරත්. ස්වාමීනි, මම දායකවූයෙම් දානපති වූයෙම් 'සීහ සෙනාපති දායකය, කාරකය, සංඝයාට උපස්ථාන කරන්නෙකැයි' මාගේ යහපත් කීර්ති ඝොෂාව නැඟී ගියේ වෙයි. ස්වාමීනි, මම දායක වූයෙම් දානපති වූයෙම් මම ක්ෂත්‍රිය බ්‍රාහ්මණ ගෘහපති ශ්‍රමණ යන යම් යම් ඒ

පිරිසක් වෙත එළඹෙම්ද නිර්භයව නොහැකිළී එළඹෙමි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ සාන්දෘෂ්ටික දානඵල සයක් දෙශනා කරණ ලද්දේද ඒවා පිළිබඳව මෙහිලා මම භාග්‍යවතුන් වහන්සේට ශ්‍රද්ධාවෙන් යමි. මමද එය දනිමි" "සීහය, දායකවූ දානපතිවූ තැනැත්තේ කායයාගේ බිඳීමෙන් මරණින් මතු සුගති නම්වූ ස්වර්ග ලොකයෙහි උපදනේයයි ස්වාමීනි, යමක් මට භාග්‍යවතුන් වහන්සේ දෙශනා කළේද, මම එය නොදනිමි. මෙහි වනාහි ඇදහීමෙන් යමි."

18 "සීහය, දායකවූ දානපති තෙමේ කායයාගේ බිඳීමෙන් මරණින් මතු සුගති නම්වූ ස්වර්ග ලොකයෙහි උපදනේය, එය එසේමය."

**5. අරක්ඛෙය්‍ය ධම්ම සූත්‍රය:-** 1. "මහණෙනි, තථාගතයන් වහන්සේ නොරැකිය යුතු කරුණු සතරක් වෙති. කරුණු තුනකින් දොස් නොකිය හැකිවේ.

2. "තථාගතයන්ගේ ඒ නොරැකිය යුතු කරුණු සතර කවරේද? මහණෙනි, තථාගතතෙම පිරිසිදුව කයේ පැවතුම් ඇත්තෙකි. මගේ මෙය අනෙකෙක් දැන නොගනීවායි යමක් තථාගතයන් වහන්සේ රකින්නේ නම් එබඳු කාය දුශ්චරිතයක් තථාගතයන්ට නැත. මහණෙනි තථාගතතෙම පිරිසිදු වචනයේ පැවතුම් ඇත්තේය. මගේ මෙය අනෙකෙක් දැන නොගනීවායි යමක් තථාගතතෙමේ ආරක්ෂා කරන්නේ නම් එබඳු වචනයේ වරදක් තථාගතයන්ට නැත මහණෙනි, තථාගතතෙම පිරිසිදු හිතේ පැවතුම් ඇත්තේය. මගේ මෙය අනෙකෙක් දැන නොගනීවායි යමක් තථාගතතෙමේ ආරක්ෂා කරන්නේ නම් එබඳු වචනයේ වරදක් තථාගතයන් වහන්සේට නැත. මහණෙනි, තථාගතතෙම පිරිසිදු ආජීවය (දිවි පැවැත්ම) ඇත්තෙක මගේ මෙය අනෙකෙක් නොදනීවායි යමක් රකින්නේ නම් එබඳු වැරදි දිවි පැවැත්මක් තථාගතයන්ට නැත. මේ සතර තථාගතයන් වහන්සේගේ නොරැකිය යුතු කරුණු සතර වෙති.

3. "කවර තුනෙකින් දොස් නොකිය යුතුද? තථාගතයන් වහන්සේ මනාව දෙසූ ධර්ම ඇත්තේය. මහණෙනි, මෙහිලා ඒ

මට (ii) ඒකාන්තයෙන් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ ලොකයෙහි අන්කිසිවෙක් හෝ කරුණු සහිතව මෙසේද ඔබ මනාව ධර්මය නොදෙසූවෙකැයි චෝදනා කරන්නේද, මහණෙනි, මෙබඳු කාරණයක් නොදක්නෙමි. මහණෙනි, මම මේ කාරණයද නොදක්නේ ක්ෂෙම ප්‍රාප්ත වූයේ අභය ප්‍රාප්ත වූයේ, විශාරදත්වයට පැමිණියේ වාසය කරමි.”

4. “මහණෙනි, මා විසින් ශ්‍රාවකයින්ට නිර්වාණ ගාමිනී ප්‍රතිපදාව මනාකොට පණවන ලදී. එසේ පිළිපන්, මාගේ ශ්‍රාවකයෝ ආශ්‍රවයන්ගේ ක්ෂය වීමෙන් අනාශ්‍රවවූ චිත්ත විමුක්තියද (සිතේ නිදහස) ප්‍රඥා විමුක්තියද මෙලෙව්හිම තුමූ ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාසය කෙරෙත්. (මෙහි 3 (ii) යෙදිය යුතුයි) (කෙසේද) යම්සේ පිළිපන් තථාගතශ්‍රාවකයෝ ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන් පව් නැති චිත්ත විමුක්තියද ප්‍රඥා විමුක්තියද මෙලෙව්හිම තුමූ උසස් නුවණින් දැන එයට පැමිණ වාසය කරන්නෝද මෙබඳු ප්‍රතිපදාවෝ නොපනවන ලද්දෝ යයි චෝදනා කරන්නාහුද, මහණෙනි, මෙබඳු කාරණයක් නොදක්නෙමි. මෙබඳු කාරණයක් නොදක්නාවූ මම ක්ෂෙම ප්‍රාප්ත වූයේ අභය ප්‍රාප්ත වූයේ විශාදරත්වයට පැමිණියේ වාසය කරමි.

5 “මහණෙනි, නොයෙක් සිය ගණන් මාගේ ශ්‍රාවකයෝ ආශ්‍රවයන්ගේ ක්ෂය වීමෙන් අනාශ්‍රවවූ චිත්ත විමුක්තියද ප්‍රඥා විමුක්තියද මෙලෙව්හිම තෙමේ මනාකොට දැන එයට පැමිණ වාසය කෙරෙත්ද, එහි වනාහි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ ලොකයෙහි අන් කිසිවෙක් හෝ ඒ නොයෙක් සිය ගණන් ශ්‍රාවක පිරිස ආශ්‍රවයන්ගේ ක්ෂය වීමෙන් අනාශ්‍රවවූ චිත්ත විමුක්තියද ප්‍රඥා විමුක්තියද නොලැබුයේ යයි කරුණු සහිතව කියාද මහණෙනි, මෙබඳු කාරණයක් නොදක්නෙමි. මහණෙනි, මේ කාරණයෙහිද, මම කරුණක් නොදක්නේ ක්ෂෙම ප්‍රාප්ත වූයේ අභය ප්‍රාප්ත වූයේ විශාරදයට පැමිණියේ වාසය කරමි.

"මේ කරුණු තුනෙන් දොස් නොකිය හැකිය. මහණෙනි, තථාගතයන් වහන්සේ පිළිබඳ නොරැකිය හැකි මේ සතර කාරණයෝය. මේ කරුණු තුනින් දොස් නොකිය හැකිය."

**6. කිම්බිල චිරට්ඨිතික සූත්‍රයඃ-** 1 "මේ සූත්‍රය මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කිම්බිලා නගරය සමීපයෙහිවූ වෙළුවනාරාමයෙහි වැඩ වසනසේක. ඉක්බිති ආයුෂ්මත් කිම්බිල ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ ආයුෂ්මත් කිම්බිල ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළේය.

2. "ස්වාමීනි, තථාගතයන් වහන්සේ පිරිනිවි කල්හි සද්ධර්මය චිරස්ථායී නොවේද? හේතු කවරේද?"

"කිම්බිලය, තථාගතයන් වහන්සේ පිරිනිවි කල්හි භික්ෂූහුද, භික්ෂුණීහුද, උපාසකවරුද, උපාසිකාවරුද ශාස්තෘන් වහන්සේ කෙරෙහි අකීකරුවූවෝ අගෞරව වූවෝ වාසයකරත්ද ධර්මයෙහි අකීකරුවූවෝ අගෞරව වූවෝ වාසයකරත්ද, සංඝයා කෙරෙහි අකීකරුවූවෝ අගෞරව වූවෝ වාසයකරත්ද ශික්ෂාවෙහි අකීකරුවූවෝ අගෞරව වූවෝ වාසය කරත්ද, සමාධියෙහි අකීකරුවූවෝ අගෞරව වූවෝ වාසය කරත්ද, අප්‍රමාදයෙහි අකීකරුවූවෝ අගෞරව වූවෝ වාසය කරත්ද, පිළිසඳරෙහි අකීකරුවූවෝ අගෞරව වූවෝ වාසය කරත්ද, කිම්බිලය, තථාගතයන් වහන්සේ පිරිනිවි කල්හි යම් හෙයකින් සද්ධර්මය චිරස්ථායි නොවේද මේ එයට හේතුවයි මේ එයට ප්‍රත්‍යයයි"

3 "ස්වාමීනි, තථාගතයන් වහන්සේ පිරිනිවි කල්හි යම් හෙයකින් සද්ධර්මය චිරස්ථායීවේද එයට හේතු කවරේද? එයට ප්‍රත්‍යය කවරේද?

"කිම්බිලය, තථාගතයන් වහන්සේ පිරිනිවි කල්හි මේ ශාසනයෙහි භික්ෂූහුද භික්ෂූණීහුද උපාසකවරුද උපාසිකාවරුද ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරව සහිතව කීකරුව වෙසෙද්ද, ධර්මයෙහි ගෞරව සහිතව කීකරුව වෙසෙද්ද,

සංඝයා කෙරෙහි ගෞරව සහිතව කීකරුව වෙසෙද්ද, ශික්ෂාව කෙරෙහි ගෞරව සහිතව කීකරුව වෙසෙද්ද, සමාධිය කෙරෙහි ගෞරව සහිතව කීකරුව වෙසෙද්ද, අප්‍රමාදයෙහි ගෞරව සහිතව කීකරුව වෙසෙද්ද, පිළිසඳරෙහි ගෞරව සහිතව කීකරුව වෙසෙද්ද, කිම්බිලය, තථාගතයන් වහන්සේ පිරිනිවීමෙන් පසු යම් හෙයකින් සද්ධර්මය චිරස්ථායීවේද, මේ එයට හේතුවයි, මේ එයට ප්‍රත්‍යයයි."

7. **පටිසල්ලීන භික්ඛු සූත්‍රය:-** 1. "මහණෙනි, කරුණු සතකින් යුක්තවූ භික්ෂුව කල්නොයවාම ආශ්‍රවයන් ක්ෂයවූයේ අනාශ්‍රවවූ චිත්ත විමුක්තියද ප්‍රඥා විමුක්තියද මෙලෙව්හිම තෙමේ යහපත් ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට වාසය කරන්නේය.

2. "කවර කරුණු සතකින්දයත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව ශ්‍රද්ධාවත්වේද, සිල්වත්වේද, බහුශ්‍රැතවේද, විවේකයෙන් යුක්තවූයේවේද, පටන්ගන්නාලද වීර්‍ය්‍ය ඇත්තේවේද, සිහි ඇත්තේවේද ප්‍රඥා ඇත්තේවේද, (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි.)

8. **පචලායන සූත්‍රය:-** 1. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ භගුරට සුංසුමාර නම් පර්වතය අසල මිගදාය නම්වූ භෙසකලා වනයෙහි වැඩ වාසයකරණ සේක. එකල්හි වනාහි ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ මගධරට කල්ලාවාලමුත්ත ග්‍රාමයෙහි නිදිබරව වැඩසිටියේ වෙයි.

2. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මනුෂ්‍යත්වය ඉක්මවූ පිරිසිදුවූ දිව ඇසින් ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ මගධරට කල්ලවාලමුත්ත ග්‍රාමයෙහි නිදිබරව සිටිනු දැක බලවත් පුරුෂයෙක් හකුළුවන ලද අතක් දිග හරින්නේ යම්සේද, දිගහරිනලද අතක් හකුළුවන්නේ යම් සේද, එපරිද්දෙන්ම භගුරට සුංසුමාර පර්වතය ආසන්නයෙහි මිගදාය නම්වූ භෙසකලා වනයෙහි අන්තර්ධානවූයේ මගධ රට කල්ලවාලමුත්ත ග්‍රාමයෙහි ආයුෂ්මත්වූ මොග්ගල්ලාන ස්ථවිරයන් ඉදිරියෙහි පහළවිය. භාග්‍යවතුන් වහන්සේ පැනවූ අස්නෙහි වැඩසිටිසේක. වැඩසිට වනාහි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේට මෙසේ වදාළහ.

"එසේනම් මොග්ගල්ලානය, යම් සංඥාවක් ඇතිව වාසය කරන්නාවූ ඔබ මැලිගතියට බැස ගන්නෙහිද, ඒ සංඥාව මෙනෙහි නොකරව. ඒ සංඥාව බහුල වශයෙන් මෙනෙහි නොකරව. යම්සේ මෙසේ වාසය කරණ ඔබට මැලිගතිය පහවන්නේය යන මේ කරුණු පවතී. මෙසේ වාසය කරණ කල්හි ඔබට ඉදින් ඒ මැලිගතිය පහනොවන්නේ නම්, එබැවින් අසනලද දරනලද ධර්මයක් සිතින් නැවත කල්පනා කරව, නැවත සිහිකරව. සිතින් නැවත විමසව. සිත මෙහෙයවා බලව. යම් හෙයකින් මෙසේ වාසය කරන ඔබට ඒ මැලිගතිය පහව යන්නේය යන මේ කරුණ පවතී.

4. "මෙසේ වාසයකරණ ඔබට ඒ මැලිගතිය පහ නොවන්නේද මොග්ගල්ලානය, එබැවින් ඔබ දෙකන් සිදුරු සාරන්නෙහිය. අතින් ශරීරය පිරිමදින්නෙහිය (ii) යම් හෙයකින් මෙසේ වාසයකරන ඔබට ඒ මැලිගතිය පහවන්නේය යන මේ කරුණ පවතී.

5 "මෙසේ වාසයකරණ ඔබට ඒ මැලිගතිය පහ නොවන්නේද, එබැවින් ඔබ අස්නෙන් නැගිට ජලයෙන් ඇස් තෙමා දිශාවන් බලව, නැකැත් තරු හා තරු රූප බලව. (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

6. "මෙසේ වාසයකරණ ඔබට ඒ මැලිගතිය පහ නොවන්නේද එබැවින් ඔබ ආලෝක සංඥාව සිහිකරව, දහවලය යන සංඥාව සිතින් ගනුව 'දවාල යම්සේද රාත්‍රියත් එසේය. රාත්‍රිය යම්සේද දවාලත් එසේයයි' මෙසේ විවෘතවූ වට නොකළ සිතින් ප්‍රභාසහිත සිත වඩය. (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

7. "මෙසේ වාසයකරණ ඔබට ඒ මැලිගතිය පහ නොවන්නේ නම් එතැන්පටන් ඔබ ඉදිරිය, පසුව යන හැඟීම ඇත්තේ අභ්‍යන්තර ගත ඉන්ද්‍රියයන්ගෙන් විවේකවූ සිතින් ඒ සක්මනට බසුව. (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

8. "මෙසේ වාසයකරණ ඔබට ඒ නිදි මැලිගතිය ඉදින් දුරු නොවේද, ඉක්බිති මොග්ගල්ලානය, ඔබ පයින් පය එකට තබා සීහසෙය්‍යාව කරව. සිහි ඇත්තේ මනා දැනීම් ඇත්තේ උත්ථාන

(නැගිටීමේ) සංඥාව මෙනෙහි කොට මොග්ගල්ලානය, පිබිදියාවූ ඔබ නිද්‍රා සුඛය, ස්පර්ශසුඛය, මැලිබවෙහි සුඛය යන මෙහි නොයෙදුණේ වාසය කරන්නෙමියි වහාම නැගිටිය යුතුය.

9. "මෙසේ වනාහි ඔබ හික්මිය යුතුය. එහෙයින් මොග්ගල්ලානය, මෙහිලා බලවත් ගිජුකම දැඩිකොට ගෙන කුලයන් වෙත නොඑළඹෙන්නෙමියි මෙසේ හික්මිය යුතුය. මොග්ගල්ලානය, ඔබ මෙසේද හික්මියයුතුයි. මොග්ගල්ලානය ඉදින් මහණතෙම බලවත් ගිජුකම දැඩිකොටගෙන කුලයන් වෙත පැමිණේද මොග්ගල්ලානය, කුලයන්හි කළයුතු වැඩ ඇත. යම්හෙයකින් මිනිස්සු පැමිණියාවූ භික්ෂුව සිහි නොකෙරෙති. එකල්හි භික්ෂුවට 'දැන් මා කෙරෙහි මේ මිනිස්සු වෙනස්වූවාසේය. දැන් මේ මේ මිනිස්සු මා කෙරෙහි කලකිරුණාහු වැනියයි' මෙබඳු සිතක් වෙයි. මෙසේ ඒ භික්ෂුවට අලාභයෙන් මකුබවද, මකුගතිය ඇත්තහුට උද්ධච්චය (සිතේ නොසන්සුන්කම) ද උද්ධච්චවූවහුට අසංවරයද අසංවරවූවහුට සමාධියෙන් සිත දුර බවද වේ.

10. "මොග්ගල්ලානය, එහෙයින් මෙහිලා මෙසේ හික්මිය යුතුය. කලහයට හේතුවන කථාව නොකරන්නෙමි'යි කියායි මොග්ගල්ලානය, ඔබ මෙසේද හික්මිය යුතුය. මොග්ගල්ලානය, කලහයට හේතුවූ කථාව ඇති කල්හි බහුලව කථාකිරීම බලාපොරොත්තු නොවිය යුතුය. බහුල කථාව ඇතිකල්හි නොසන්සුන්කමද නොසන්සුන්කම ඇත්තහුට අසංවරයද, අසංවරය ඇත්තහුට සමාධියෙන් සිත දුරු වීමද වේ.

11. "මොග්ගල්ලානය, මම සියල්ලන් සමගම එක්වීම හොඳයයි නොකියමි. මොග්ගල්ලානය, මම සියල්ලන් සමගම එක්වීම නරකයයිද නොකියමි. මොග්ගල්ලානය, මම ගිහියන් හා පැවිද්දන් සමග එක්වීම වර්ණනා නොකරමි. යම් ඒ ස්වල්පවූ ශබ්දයන් ඇති ස්වල්පවූ ඝොෂාවන් ඇති මිනිසුන්ගේ ශබ්ද නැති මිනිසුන්ගේ රහස්බවට සුදුසු විවේක වාසයට සුදුසු යම් ඒ සේනාසනයෝ වෙද්ද, ඒ සේනාසනයන් සමග එක්වීම වර්ණනා කරමි.

12. "මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් මහා මොග්ගල්ලායන තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළකළේය. "ස්වාමීනි, කොපමණකින් භික්ෂුතෙම කොටින් (අතිශයින්) නිවුනේ වෙයිද. කාමාදී බැම්වලින් අතිශයින් නිදහස ලැබුයේ වෙයිද. අතිශයින් බ්‍රහ්මචාරී වූයේ වෙයිද. අතිශයින් සිවුමගින් කටයුතු අවසාන වූයේ වෙයිද. දෙවිමිනිසුන්ට උතුම් වූයේ වෙයිද.

13. "මොග්ගල්ලානය, මේ ශාසනයෙහි භික්ෂුවට සියලු ධර්මයෝ අභිනිවෙසයට (-ඇලීමට) නුසුදුසුයයි ශ්‍රැතයක් (-අසනලද්දක්) වෙයි. මොග්ගල්ලානය, මෙහි භික්ෂුවට සියලු ධර්මයෝ අභිනිවෙසයට නුසුදුසුය කියා මේ ශ්‍රැතයක් වෙයිද හෙතෙම සියලු ධර්මයන් දැනගනියි. සියලු ධර්මයන් දැනගෙන සියලු ධර්මයන් පිරිසිඳ දනියි. සියලු ධර්මයන් පිරිසිඳ දැන සැපවූ හෝ දුක්වූ හෝ සැපදුක් දෙකින් තොරවූ හෝ යම්කිසි වේදනාවක් විඳියි. හෙතෙම ඒ වේදනාවන්හි අනිත්‍යය දකිමින් වාසය කරයි. නොඇලීම් වශයෙන් බලමින් වාසය කරයි නිරෝධය (වේදනා සිත් නැතිකිරීම) අනුව බලමින් වාසය කරයි. දුරුකිරීම අනුව බලමින් වාසය කරයි.

14. "එසේ අනිත්‍යය, විරාගය, නිරෝධය, පටිනිස්සග්ගය අනුව බලමින් වසන්නේ මේ ලෝකයෙහි කිසිවක් (දැඩිව අල්ලා ගැනීම් වශයෙන්) නොගනියි. එසේ නොගන්නේ ත්‍රස්ත නොවෙයි. ත්‍රස්ත නොවන්නේ තමා තුළම පිරිනිවේ.

15. "ඉපදීම අවසන්ය. බඹසර වැස නිමවනලදී. සිවුමගින් කටයුතු දේ කරනලදී. මේ ආත්මභාවයෙන් පසු අනිකක් නැතැයි දැනගනියි. මොග්ගල්ලානය, මෙපමණකින් භික්ෂුව කොටින් තෘෂ්ණාව රැස්කිරීමෙන් මිදුනේ වෙයි. අතිශයින් තැන්පත්වූයේ කාමාදී බැඳුම්වලින් නිදහස ලැබූයේ අතිශයින් බ්‍රහ්මචාරීවූයේ අතිශයින් (සිවුමගින් කටයුතු දේ) අවසන්වූයේ දෙවි මිනිසුන්ට ශ්‍රෙෂ්ඨ වූයේ වෙයි."

**9 මා පුඤ්ඤභායී සූත්‍රය:-** 1 "මහණෙනි, පින්වලට භය නොවව්. යම් ඒ පිනක් වේනම් එය සැපතට එක්තරා නමකි. මහණෙනි, බොහෝකල් කරණ ලද පින්වල හේතුවෙන් බොහෝ කල් කැමති වියයුතු සිත් අදනාවූ, මනවඩන්නාවූ විපාකය

වින්දෙමි. සත් වසක් මෛත්‍රී සිත වැඩුවෙමි, සත් වසක් මෛත්‍රී සිත වඩා සංවර්ත (නැසෙන) විවර්ත (වැඩෙන) කල්ප සතක් මේ ලොකයට නැවත නොආයෙමි. මහණෙනි, මම කල්පය විනාශවන කල්හි ආභස්සර බඹලොවට පැමිණෙමි. කල්පය හටගැණෙන කල්හි හිස්වූ බඹ විමනක උපදිමි. මහණෙනි, එහි වනාහි මඩින්නාවූ, නොමැඩවියහැකි සියල්ල දක්නාවූ, යටතෙහි පවත්වන්නාවූ මහාබ්‍රහ්මයෙක් වීමි. මහණෙනි, සතිස්වාරයක් දෙවියන්ට අධිපතිවූ ශක්‍රයාවීමි, සත් රුවනින් යුත් ජනපදයන්ගේ අර්ථාවරණයට පත් සිවු මහා දිවයින් දිනන ලද ධාර්මිකවූ ධර්මයට රජවූ චක්‍රවර්ති රජවීමි. මහණෙනි, ඒ මට මේ සප්ත රත්නයෝ වූහ.

2 "ඒ කවරහුද? චක්‍ර රත්නය, හස්ති රත්නය, අශ්ව රත්නය, මණි රත්නය, ස්ත්‍රී රත්නය, ගෘහපති (සිටු) රත්නය, පරිනායක (පුත්‍ර) රත්නයම සත්වෙනි වේ.

3 "මහණෙනි, මට සූරවූ වීරවූ අඟපසඟ ඇති අන්‍ය සේනා මැඩියහැකි පුත්‍රයෝ දහසකට වඩා වූහ. ඒ සක්විති රජතෙම සාගරය කෙළවරකොට ඇති මේ පෘථිවිය දණ්ඩනයක් නොකොට ආයුධ ආදියක් නොගෙන ධර්මයෙන් දිනා වාසය කරයි.

4 1 "සැප සොයන්නවුනි, කුශලයන්ගේ, පුණ්‍යයන්ගේ විපාකය බලව්, මහණෙනි, සත් අවුරුද්දක් මුළුල්ලෙහි මෛත්‍රී සිත වඩා මහා කල්ප සතක් මුළුල්ලෙහි මේ ලොකයට නැවත නොආයෙමි. ලොකය විනාශ වන කල්හි ආභස්සර බ්‍රහ්මලොකයට ගියෙමි"

2 "ඒ මම ලොකය වැඩෙන කල්හි හිස්වූ බ්‍රහ්ම ලොකයට ගියේ වෙමි. එකල්හි සත් වාරයක අනුන් වසඟයෙහි පවත්වන්නාවූ මහා බ්‍රහ්ම වූයෙමි. සතිස් වාරයක් දෙවියන්ට අධිපතිවූයේ දිව්‍ය රාජ්‍යය කරවූයෙමි. (නොයෙක් සියගණන් වාරයෙහි) දඹදිවට නායකවූ සක්විති රජවීමි."

3 "ඔටුණු පලන් ක්ෂත්‍රියවූ මිනිසුන්ට අධිපතියෙක් වීම්ද ඒ මම මේ පොළොව දඬුවමක් නැතිව ආයුධ ආදියක් නැතිව ජයගෙන සාහසික නොව දැහැමින් සෙමෙන්

අනුශාසනා කළෙමි. මේ පෘථිවි මණ්ඩලයෙහි දැහැමින් රාජ්‍යය කරවා මහත් ධන ඇති මහත් සම්පත් ඇති ධනයෙන් ආඪ්‍යවූ සියලු කාමයන්ගෙන් හා සත් රුවනින්ද යුක්තවූ පූජ්‍ය කුලයෙහි උපන්නෙමි.”

4 “ලොකයෙහි බුදුවරයෝ සංග්‍රහ කරන්නාහු වෙත්ද, ඒ බුදුවරයන් විසින් මනාකොට මේ කරුණ දෙශනා කරණ ලද්දේය. යම් හෙයකින් පොළොවට අධිපතියයි කියනු ලැබේද මෙය උසස් බවට හේතුවකි.

5 “බොහෝ වස්තු උපකරණ ඇති තේජසින් යුත් රජ වෙමි. දඹදිවට අධිපතිවූයේ මහත් ඍද්ධි ඇති යශස් ඇති වෙමි. එහෙයින් හීනජාති ඇත්තේ නමුදු කවරෙක් මේ කරුණ අසා නොපහදින්නේද පහදින්නේමය.

6 “එහෙයින් ගුණයෙන් මහත් බව කැමති වන්නාවූ තමන්ගේ දියුණුව අනුන්ගේ දියුණුව කැමැත්තහු විසින් බුදුවරයන්ගේ අනුශාසනාව සිහිකරමින් සද්ධර්මය ගරු කට යුත්තේය.”

**10 සුජාතාසර සුණ්හා සූත්‍රය:-** 1 “එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනේපිඬු මහසිටානන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු රැගෙන අනේපිඬු මහ සිටුහුගේ නිවේශනය යම්තැනෙකද එතැන්හි වැඩිසේක. වැඩ පැනවූ අස්නෙහි හිඳගත් සේක. එකල්හි වනාහි අනේපිඬු මහ සිටුහුගේ ගෘහයෙහි මහා හඬින් මහා ශබ්දයෙන් කථා කරන්නාහු වෙති. ඉක්බිති අනාථපිණ්ඩික ගෘහපති තෙමේ භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙකද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස්ව සිටියේය. එකත්පසෙක සිටියාවූ අනාථපිණ්ඩික ගෘහපතිහුහට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය.

2 “ගෘහපතිය, කවර හෙයින් ඔබගේ නිවාසයෙහි මිනිස්සු මහ හඬ නගන්නෝද මහා ශබ්ද පවත්වන්නෝද? මසුන් අල්ලන කෙවුලන්යයි සිතමි.”

"ස්වාමීනි, මේ සුජාතා නම් ලේලිය ධනයෙහි උසස් උසස්වූ කුලයකින් ගෙන එන ලදී. ඈය නැන්දා හෝ මාමා ගණන් නොගනියි, හිමියා ගණන් නොගනියි, භාග්‍යවතුන් වහන්සේටද සත්කාර නොකරයි. ගරුකාර නොකරයි, බුහුමන් නොකරයි, පූජා නොකරයි."

3 "ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ සුජාතා (ලේලිය) ට "සුජාතාවනි මෙහි එවයි" ආමන්ත්‍රණය කළ සේක. "එසේය ස්වාමීනියි" සුජාතා භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචනදී භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැන්හි පැමිණියාය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක හුන්නීය. එකත්පසෙක හුන්නාවූ සුජාතාවට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

4 "සුජාතාවෙනි, පුරුෂයාට භාර්‍ය්‍යාවෝ සත්දෙනෙකි. ඒ සත්දෙන කවරහුද? වධකයකු සමානවූවා සෙරියක සමාන වූවා, ස්වාමියකු සමානවූවා, මව සමානවූවා. සොහොයුරියක සමානවූවා, යෙහෙළියක සමානවූවා, දාසියක සමානවූවා යනුය. මේ සත්දෙන සුජාතාවෙනි, පුරුෂයාට භාර්‍ය්‍යාවෝ වෙති. ඒ භාර්‍ය්‍යාවන්ගෙන් තී කවර තැනැත්තියක්ද?"

5 "ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ විසින් කෙටි වශයෙන් දෙශනා කරණ ලද්දෙහි විස්තර වශයෙන් අර්ථය නොදනිමි. ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ විසින් කෙටි වශයෙන් දෙශනා කරණ ලද්දෙහි අර්ථය යම්සේ විස්තර වශයෙන් දැනගන්නෙම් නම් එසේ භාග්‍යවතුන් වහන්සේ මට ධර්මයදෙශනා කරණු මැනවි.

"එසේ නම් සුජාතාවනි, අසව. මනාකොට මෙනෙහි කරව දෙශනා කරන්නෙමි"--"එසේය, ස්වාමීනියි" සුජාතා (ලේලි) භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්නීය. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

(1) "පුරුෂයාගේ යම් භාර්‍ය්‍යාවක් තොමෝ දූෂිත සිත් ඇත්තීද, හිතානුකම්පා නැත්තීද, පරපුරුෂයන් (කෙරෙහි) ඇලුනීද, ස්වාමියා ඉක්මවා අතිකක්හු සිතන්නීද, ධනයෙන්

මිළයට ගන්නා ලද්දියක් වන්නීද, ස්වාමියාහට වධ පිණිස උත්සාහ කරන්නීද, මෙබඳුවූ ඒ භායර්‍යා තොමෝ වධක භායර්‍යාවයයි කියනු ලැබේ. ඕ තොමෝ වධකරන්නීද, භායර්‍යාද වේයයි කියනු ලැබේ.

(2) "ස්ත්‍රියගේ ස්වාමිපුරුෂතෙම ශිල්පයද වෙළඳාමද සීසෑමද කරන්නේ නම් ධනයක් ලබාද ඒ ධනයෙන් ස්වල්පයකුදු වෙන් කරගන්ට පුරුෂයාගේ යම් භායර්‍යාවක් තොමෝ කැමති වන්නීද මෙබඳුවූ ඒ භායර්‍යාව (සොර) චොර භායර්‍යාවයයි කියනු ලැබේ.

(3) "පුරුෂයාගේ යම් භායර්‍යාවක් තොමෝ කටයුතු කර්මාන්ත නොකරණු කැමැත්තී මැලි සිත් ඇත්තීද, බොහෝකොට අනුභව කරන්නීද ක්‍රෑරද, කෝපගති ඇත්තීද, නපුරු වචන කියන්නීද, උත්සාහවත් ස්වාමියාගේ ඒ උත්සාහය යටපත් කොට පවතීද, මෙබඳුවූ ඒ භායර්‍යාව ස්වාමි භායර්‍යාවයයි කියනු ලැබේ.

(4) "යම් ස්ත්‍රියක් තොමෝ සෑම කල්හි ස්වාමියාට හිතානුකම්පා ඇත්තීද, පුත්‍රයා රක්නා මවමෙන් ස්වාමියා රකීද, යලිදු මෙබඳුවූ යම් භායර්‍යාවක් වන්නීද, ඕතොමෝ මාතෘ භායර්‍යායයි කියනු ලැබේ

(5) 'බාල සොහොයුරී යම්සේ වැඩිමහලු සහෝදරයා කෙරෙහි ගෞරව සහිත වන්නීද, එමෙන් ස්වකීය ස්වාමියා කෙරෙහි ලජ්ජා සිත් ඇත්තී ස්වාමියාගේ වසඟයෙහි පවත්නීද, ඕතොමෝ භගිනිභායර්‍යායයි කියනුලැබේ"

(6) "මේ ලොකයෙහි යම් ස්ත්‍රියක් තොමෝ ස්වාමියා දැක බොහෝ කලකින් ආ යහලුවකුට යහළු තැනැත්තියක් සේ සතුටු වන්නීද, කුලසම්පන්නවූ ශීලයෙන් යුක්තවූ ස්වාමිහු දෙවිකොට පැවතුම් ඇත්තීද, පුරුෂයාගේ මෙබඳු භායර්‍යාවක් වන්නීද, ඕතොමෝ මිත්‍රභායර්‍යා යයි කියනු ලැබේ."

(7) 'කොප නැත්තී හිමියා විසින් (දණ්ඩක් ගෙන තී නසන්නෙමියි) දණ්ඩ වධයෙන් තර්ජනය කරණ ලද්දී

නොකිපුනාවූම ද්වේෂ නොවූ සිත් ඇත්තී හිමියාගේ වරද ඉවසාද පුරුෂයාගේ මෙබඳුවූ යම් භාර්‍ය්‍යාවක් තොමෝ ස්වාමිහුගේ වසඟයෙහි පවත්නීද, ඒ භාර්‍ය්‍යා තොමෝ දාසී භාර්‍ය්‍යායයි කියනු ලැබේ.

(8) "මේ කාලයෙහි යම් භාර්‍ය්‍යාවක් තොමෝ වධක භාර්‍ය්‍යාවයයි කියනු ලබන්නීද, චෞරී භාර්‍ය්‍යාවයයි කියනු ලබන්නීද, යම් භාර්‍ය්‍යාවක් ස්වාමි භාර්‍ය්‍යාවයයි කියනු ලබන්නීද, දුස්සීල ස්වභාව ඇති කෲරවූ ආදර නැත්තාවූ ඒ භාර්‍ය්‍යාවෝ තිදෙන කය බිඳීමෙන් මරණින් මතු නරකයට යෙත්.

(9) "මේ ලොකයෙහි යම් මාතෘභාර්‍ය්‍යාවක් වන්නීද, යම් භගිනි භාර්‍ය්‍යාවක් වන්නීද, යම් මිත්‍ර භාර්‍ය්‍යාවක් වන්නීද, යම් ස්ත්‍රියක් තොමෝ දාසී භාර්‍ය්‍යාවයයි කියනු ලබන්නීද ශීලයෙහි පිහිටි බැවින් බොහෝ කල් හික්මුණු ඒ භාර්‍ය්‍යාවෝ සතරදෙන කය බිඳීමෙන් මරණින් මතු සුගතියට යෙති.

5. "සුජාතාවෙනි, පුරුෂයාට මේ සප්ත භාර්‍ය්‍යාවෝ වෙති ඒ සත්දෙනාගෙන් තී කවර තැනැත්තියද?"

"ස්වාමීනි, අද පටන් මම ස්වාමියාට දාසී සමාන භාර්‍ය්‍යාව යයි දරණු ලැබේවා."

11. **සපත්තකන්ත සූත්‍රයඃ-** 1. "මහණෙනි, සතුරන් ප්‍රිය කරන්නාවූ සතුරන් ඇතිකරන්නාවූ මේ ධර්ම සතක් ක්‍රොධ කරනසුළු ස්ත්‍රියකට හෝ පුරුෂයෙකුට හෝ වෙත්.

2. "ඒ සත කවරේද? මහණෙනි, සතුරා සතුරාට මෙසේ කැමතිවෙයි. ඒකාන්තයෙන් මේතෙම දුර්වර්ණ වන්නේ නම් යෙහෙක කියායි එයට හේතු කවරේද? මහණෙනි, සතුරා සතුරාගේ ශරීරයේ පැහැපත් බවට සතුටු නොමවෙයි. මහණෙනි මේ පුරුෂතෙම ක්‍රොධකරන සුල්ලෙක්වූයේ ක්‍රොධයෙන් මැඩුණ කෙනෙක්වූයේ ක්‍රොධයෙන් යුක්ත කෙනෙක්වූයේ මනාකොට නැවේ වේද, සුවඳ විලවුන් ගැල්වූයේවේද, කපනලද දැලි රැවුල් ඇත්තේවේද, සුදු (පිරිසිදු) වස්ත්‍ර ඇන්දේවේද, ඉක්බිති හෙතෙම ක්‍රොධයෙන් දුර්වර්ණවූයේම වෙයි.

"මහණෙනි, සතුරන් ප්‍රිය කරන්නාවූ සතුරන් ඇති කරන්නාවූ මේපළමුවන ධර්මය මෙයින් ක්‍රොධකරන ස්ත්‍රියකට හෝ පුරුෂයෙකුට හෝ ඇතිවෙයි. මහණෙනි, නැවතද සතුරා සතුරාට මෙසේ කැමතිවෙයි. මේතෙම දුක්සේ සයනය කරන්නේ නම් ඉතා යෙහෙක කියායි. එයට හේතු කවරේද? මහණෙනි, සතුරා සතුරාගේ සුඛශෙයයාවම කැමති නොවෙයි. මහණෙනි, මේ පුරුෂයා ක්‍රොධඇත්තේ ක්‍රොධයෙන් මැඩුණේ ක්‍රොධයෙන් යුක්තවූයේ හුදෙක් හෙතෙම දික් ලොම් ඇති ඇතිරිලි වලින් හෝ ගෙතූ මල් ඇති ඇතිරිලි වලින් යුත් දෙපස රතුවන් කොට්ටා ඇති ඇතිරිලිවලින් හෝ රැලි එල්ලී ඇති ඇතිරිලි වලින් හෝ මුවාදී සතුන්ගේ රූප ගෙතූ ඇතිරිලිවලින් හෝ වසනලද කවිච්චියක සයනය කෙරේද, ඉක්බිති හෙතෙම ක්‍රොධයෙන් මඩනාලද්දේ දුකසේ සයනය කරයි.

"මහණෙනි, මේ සතුරන් ප්‍රිය කරන්නාවූ සතුරන් ඇති කරන්නාවූ දෙවන ධර්මය ක්‍රොධ කරනසුලු ස්ත්‍රියකට හෝ පුරුෂයකුට ඇතිවෙයි.

4. "නැවතද මහණෙනි, සතුරා සතුරාට මෙසේ කැමති වෙයි. මේ තෙමේ බොහෝ අභිවෘද්ධියට නොපැමිණෙන්නේ නම් යෙහෙක කියායි, එයට හේතු කවරේද? මහණෙනි, සතුරා සතුරාගේ බොහෝ අභිවෘද්ධියට සතුටු නොවෙයි. මහණෙනි, මේ පුද්ගලතෙම ක්‍රොධ ඇත්තේ ක්‍රොධයෙන් මඩනාලද්දේ අයහපත් දෙයක් ගෙන මා විසින් ගන්නාලද්දේ යහපත් දෙයක් යයි සිතයි. අයහපත් දෙයක් ගෙන මා විසින් ගන්නා ලද්දේ යහපත් දෙයකැයි සිතයි ක්‍රොධයෙන් මඩනා ලද්දාවූ මේ ධර්මයෝ අන්‍යොන්‍ය ප්‍රතිවිරුද්ධව ගන්නාලද්දේ දිගුකලක් අහිත පිණිස දුක් පිණිස පවතිත්. මහණෙනි, මේ සතුරන් ඇතිකරන්නාවූ සතුරන් ප්‍රිය කරන්නාවූ තුන්වන ධර්මය ක්‍රොධකරනසුලු ස්ත්‍රියකට හෝ පුරුෂයෙකුට හෝ ඇතිවෙයි.

5. "මහණෙනි, නැවතද සතුරා සතුරාට මෙසේ කැමති වෙයි මේ තෙමේ භොග සම්පත් ඇති නොවන්නේ වේ නම් ඉතා යෙහෙක. යනුවෙනි, එයට හේතු කවරේද? මහණෙනි,

සතුරා සතුරාට භොග ඇති කල්හි සතුටු නොවෙයි. මහණෙනි, ක්‍රොධ කරන සුලු, ක්‍රොධයෙන් මැඩුණාවූ, මේ පුද්ගලයාට උත්ථාන වීය්‍ය්‍යීයෙන් ලබන ලද බාහු බලයෙන් පුරුදු කරණ ලද, ඩහදිය වගුරුවන ලද ධාර්මිකවූ දැහැමින් ලද්දාවූ ඒ භොගයෝ වෙද්ද ක්‍රොධයෙන් මැඩුණාහුගේ ඒ ධනයන්ද රජවරු තුමූ රාජ කොෂ්ඨාගාරයට (-භාණ්ඩාගාරයට) යවත්, මහණෙනි, මේ සතුරන් ඇති කරන්නාවූ සතුරන් ප්‍රිය කරන්නාවූ මේ සතරවන ධර්මය ක්‍රොධ කරන සුලු ස්ත්‍රියකට හෝ පුරුෂයෙකුට හෝ ඇති වෙයි.

**6.** "මහණෙනි, නැවතද වනාහි සතුරා සතුරාට මෙසේ සිතයි. මේ තෙමේ, කීර්ති ඇත්තෙක් නොවන්නේ නම් ඉතා යෙහෙක කියයි. එයට හේතු කවරේද? මහණෙනි, සතුරා සතුරාගේ කීර්තියට සතුටු නොවේ. මහණෙනි, මේ පුද්ගලතෙම ක්‍රොධ ඇත්තේ ක්‍රොධයෙන් මඩනා ලද්දේ ක්‍රොධයෙන් මඩනා ලද්දේ ක්‍රොධයෙන් යුක්තවූයේ වේද එබඳුවූ ඔහුගේ අප්‍රමාදයෙන් ලබන ලද යම් ඒ කීර්තියක් වේද ක්‍රොධයෙන් මඩනාලද්දේ එයිනුදු නැසෙයි. මහණෙනි, මේ සතුරන් ප්‍රිය කරන්නාවූ සතුරන් ඇති කරන්නාවූ මේ පස්වන ධර්මය ක්‍රොධය කරන සුලු ස්ත්‍රියකට හෝ පුරුෂයෙකුට හෝ පැමිණෙයි.

**7.** "මහණෙනි, නැවතද වනාහි සතුරාට මෙසේ කැමති වෙයි. මේ තෙමේ මිත්‍රයන් නැත්තෙක් වන්නේ නම් ඉතා යෙහෙක කියාය. එයට හේතු කවරේද? සතුරා සතුරාට මිත්‍රයන් ඇතිවීම ගැන සතුටු නොවෙයි. මහණෙනි, මේ පුද්ගලතෙම ක්‍රොධඇත්තේ ක්‍රොධයෙන් මඩනා ලද්දේ ක්‍රොධයෙන් යුක්ත වූයේ වේද, එබඳුවූ ඔහුගේ යම් මිත්‍රාමාත්‍යයෝ වෙද්ද නෑ සහලේ නෑයෝ වෙද්ද ඔවුහුද ක්‍රොධයෙන් මඩනා ලද ඔහු දුරින් දුරු කෙරෙත්. මහණෙනි, සතුරන් ප්‍රිය කරන්නාවූ සතුරන් ඇති කරන්නාවූ මේ සයවන ධර්මය ක්‍රොධ කරන සුලු ස්ත්‍රියකට හෝ පුරුෂයෙකුට හෝ ඇතිවෙයි.

**8.** "මහණෙනි, නැවතද වනාහි සතුරා සතුරාට මෙසේ සිතයි. මේ තෙමේ ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පහවූ අයහපත් ගති ඇති නපුරු සේ පතිතවන්නාවූ නරකයෙහි උපදින්නේ නම්, ඉතා යෙහෙක කියායි. එයට හේතු කවරේද? සතුරා සතුරාගේ සුගති ගමනින් නොසතුටු වෙයි. මහණෙනි, මේ පුද්ගලතෙම ක්‍රොධ කරන සුලු වූයේ ක්‍රොධයෙන් මඩනා ලද්දේ වේද, හෙතෙම කයින් දුසිරිතෙහි හැසිරෙයි. වචනයෙන් දුසිරිතෙහි හැසිරෙයි. සිතින් දුසිරිතෙහි හැසිරෙයි. හෙතෙම කයින් දුසිරිතෙහි හැසිර වචනයෙන් දුසිරිතෙහි හැසිර, සිතින් දුසිරිතෙහි හැසිර, ක්‍රොධයෙන් මඩනා ලද හෙතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ අයහපත් ගති ඇති නපුරු සේ පතිත වන්නාවූ නරකයෙහි උපදියි. මහණෙනි, මේ සතුරන් ප්‍රිය කරන්නාවූ සතුරන් ඇති කරන්නාවූ සත්වන ධර්මය ක්‍රොධ කරනසුලු ස්ත්‍රියකට හෝ පුරුෂයෙකුට හෝ ඇති වෙයි.

9. (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි.)

1. "ක්‍රොධ ඇති පුද්ගලතෙම දුර්වර්ණ ඇත්තේවේ යලිදු හෙතෙම දුකසේ සයනය කරයි. නැවත අර්ථය (වැඩීම) ගෙන අනර්ථය මා විසින් ගන්නා ලද්දේ යයි සිතයි.

2. "ක්‍රොධයෙන් මැඩුනාවූ පුරුෂතෙම කයින්ද වචනයෙන්ද ප්‍රාණඝාත කර්ම කොට නැවත ක්‍රොධ ඇත්තේ ධන හානියට පැමිණෙයි.

3. "ක්‍රොධ මදයෙන් මත්වූයේ අයසට පැමිණෙයි. ක්‍රොධය ඇත්තාවූ ඔහු ඥාති මිත්‍රයන් හා මනා සිත් ඇති යහළුවන් දුරු කරත්.

4 "ක්‍රොධයතෙම අනර්ථය උපදවන්නේය. ක්‍රොධය සිත කෝප කරවන්නේය, ඇතුළ (තමා සිත්හි) හටගත් ඒ ක්‍රොධය භයට හේතුවන බැව් ජනතෙම (නුවණැස් නැති හෙයින්) නොදන්නේය.

5 "කිපුනු පුද්ගලතෙම යහපත නොදනියි. කිපුනු පුද්ගලතෙම ධර්මය නොදක්නේය, ක්‍රොධය යම් කාලයෙක්හි මිනිසා මඩීද එකල්හි (ඔහට) ගන අඳුරවේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

6. "කිපුනු පුද්ගලතෙම අපහසුවූ දෙය පහසුවක් මෙන් සම්පාදනය කෙරේද හෙතෙම ක්‍රොධය පහවූ කල්හි ගින්නෙන් දන ලද්දක්හු මෙන් තැවේ.

7-8. "ක්‍රොධය යම් කලෙක උපදීද, එකල්හි දුම් නගින හෙයින් ධූමාග්නියයි කියනලද ගින්න මෙන් දුර්වර්ණ මුහුණ ඇතිබව ආකාරයෙන් දක්වන්නේය. යම් පරිද්දෙකින් මනුෂ්‍යයෝ කිපෙද්ද, ඔවුන්ට පාපයෙහි ලජ්ජාවක් නොවන්නේය. පාපයෙහි බියක් නොවන්නේය. වචනයෙන්ද ගරුත්වයක් නොවන්නේය. ක්‍රොධයෙන් වැඩුණ පුද්ගලයාට කිසි පිහිටක් නොවේ.

9. "සමථවිදර්ශනා මාර්ගයන්ගෙන් වෙන්වූ තැවෙන්නාවූ කටයුතුවෙද්ද ඒ කර්මයන් කියන්නෙමි එය තත්වූ පරිද්දෙන් අසව්"

10. "කිපුනු තැනැත්තේ පියා නසයි කිපුනු තැනැත්තේ සිය මව නසයි. කිපුනු තැනැත්තේ රහතන් වහන්සේ නසයි. කිපුනු තැනැත්තේ පෘථග්ජනයා නසයි."

11. "යම් මවක් විසින් පෝෂ්‍යය කරණ ලද්දාවූ පුරුෂතෙම මේ ලෝකය දකීද, ජීවිතය දුන්නාවූම ඒ මවද නසයි.

12. "කිපුනු පුදගලතෙම බොහෝ ජනයන් නසන්නේද නසනු ලබන්නාවූ ඒ සත්වයෝ වනාහි තමාට බඳු උපමා ඇත්තාහ. ආත්මය වනාහි අතිශයින් ප්‍රියවේ. කිපුනු පුද්ගල තෙම නොයෙක් අරමුනුවල මුළාවූයේ බොහෝ කාරණයන් හේතුකොට ගෙන ආත්මය නසයි.

13. "කිපුනු පුද්ගල තෙම කඩුවෙන් ආත්මය නසයි. මුලාවූවාහු විෂ අනුභව කෙරෙති. ගෙල වැළලා මැරෙත් පර්වතයෙන් හා කඳුරැලියෙහිද (පැන මැරෙත්."

14. "නැසුනාවූ වැඩීම් ඇති තමන් මරණයට පමුණුවන්නාවූද කර්මයන් කරන්නාහු හටගත් ක්‍රොධ ඇත්තේ පිරිහෙන්නේයයි නොදනිත්."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

15. "මෙසේ මෙය ක්‍රොධ ස්වරූපයෙන් මරුහුගේ පාශය වූයේ සිත් නමැති ගුහාවෙහි හෘදය රූපය නිසා පවත්නේය. ඒ ක්‍රොධය විදර්ශනා ප්‍රඥාවෙන්ද වීය්‍ර්යයෙන්ද (මාර්ග සම්‍යක්-) දෘෂ්ටියෙන්ද (යන මේ) දමනයෙන් මනාකොට සිඳින්නේය."

16. "පණ්ඩිතතෙම එකම අකුශලයවූ මේ ක්‍රොධය සිඳින්නේය. එපරිද්දෙන්ම අපට නොසතුටු මුහුණ ඇති බව නොවේවායි (සමථ විදර්ශනා) ධර්මයෙහි හික්මෙන්නේය."

17. "පහකරණ ලද ක්‍රොධය ඇති ආයාශ රහිතවූ (දැඩි ලොභය නැත්තාවූ) පහකරණ ලද මෝහය ඇති. දැමනාහු ක්‍රොධය නසා ආශ්‍රව රහිතවූවාහු පිරිනිවන් පාත්."

---

## 7. මහාවර්ගය

12. **හිරොත්තප්පවිපන්න සූත්‍රයː-** 1. මහණෙනි, පාපයට ලජ්ජාව හා භය නැති කල්හි පිරිහීගිය හිරිඔතප් ඇත්තහුට ඉන්ද්‍රිය සංවරයට කරුණු නැත්තේවේ. ඉන්ද්‍රිය සංවරය නැති කල්හි පිරිහීගිය ඉන්ද්‍රිය සංවරය ඇත්තහුට ශීලයට කරුණු නැත්තේවේ. ශීලය නැති කල්හි විපතටපත් ශීලය ඇත්තහුට සම්‍යක්සමාධියට කරුණු නැත්තේ වේ. සම්‍යක් සමාධිය නැති කල්හි පිරිහීගිය සම්‍යක් සමාධි ඇත්තහුට තත්වූ පරිදි ඥාන දර්ශනය නැත්තේවේ. තත්වූ පරිදි ඥාන දර්ශනය නැතිකල්හි විපතට පත් යථාභූත ඥාන දර්ශනය (ඒ වූපරිදි දැකීමේ නුවණ) ඇත්තහුට සංස්කාරයන්ගේ කළකිරීමෙන් ඇතිවන ක්ලේශයන් ගෙන් වෙන්වීම නැත්තේවේ. සංස්කාරයන්ගේ කලකිරීමෙන් ඇතිවන ක්ලේශයන්ගෙන් වෙන්වීම නැතිකල්හි පිරිහී ගිය සංස්කාරයන්ගේ කලකිරීමෙන් ඇතිවන ක්ලේශයන්ගෙන් වෙන්වීම ඇත්තහුට විමුක්ති ඥාන දර්ශනයට (මිදීම නුවණින් දැකීමට) කරුණු නැත්තේවේ.

2. "මහණෙනි, පිරිහීගිය අතුපතර ඇති ගසක්වේද, එහි පතුරුද සම්පූර්ණබවට නොපැමිණේ, පොත්තද එළයද අරටුවද

සම්පූර්ණබවට නොපැමිණේ. මහණෙනි, එපරිද්දෙන්ම පාපයට ලජ්ජාව හා බිය නැතිකල්හි පිරිහීගිය පාපයට ලජ්ජාව හා බිය ඇත්තහුට විමුක්ති ඥාන දර්ශනයට කරුණු නැත්තේවේ.

3. "මහණෙනි, පාපයට ලජ්ජාව හා බිය ඇති කල්හි පාපයට ලජ්ජාව හා බිය ඇත්තහුට ඉන්ද්‍රිය සංවරයට කරුණු ඇත්තේවේ.

(ii) "ඉන්ද්‍රිය සංවරය ඇති කල්හි ඉන්ද්‍රිය සංවරය ඇත්තහුට ශීලයට කරුණු ඇත්තේවේ. ශීලය ඇති කල්හි ශීලය ඇත්තහුට සම්‍යක් සමාධියට (නිවරද සිත එකඟයට) කරුණු ඇත්තේවේ. සම්‍යක් සමාධිය ඇතිකල්හි සම්‍යක් සමාධිය ඇත්තහුට තත්වූ පරිදි ඥාන දර්ශනයට කරුණු ඇත්තේවේ. තත්වූපරිදි ඥාන දර්ශනය ඇතිකල්හි තත්වූපරිදි ඥානදර්ශනය ඇත්තහුට සංස්කාරයන්ගේ කලකිරීමෙන් ඇතිවන ක්ලේශයන්ගෙන් වෙන්වීම ඇත්තේවේ. සංස්කාරයන්ගේ කලකිරීමෙන් ඇතිවන ක්ලේශයන්ගේ වෙන්වීම ඇතිකල්හි සංස්කාරයන්ගේ කළකිරීමෙන් ඇතිවන ක්ලේශයන්ගේ වෙන්වීම ඇත්තහුට විමුක්ති ඥාන දර්ශනයට කරුණු ඇත්තේවේ.

4. "මහණෙනි, සම්පූර්ණවූ අතුපතර ඇති ගසක් වේද එහි පතුරුද සම්පූර්ණබවට පැමිණේ. පොත්තද, එළයද අරටුවද සම්පූර්ණ බවට පැමිණේ. මහණෙනි, පවට ලජ්ජා හා බිය ඇතිකල්හි පවට ලජ්ජාව හා බිය ඇත්තහුට ඉන්ද්‍රිය සංවරයට කරුණු ඇත්තේවේ. (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

13. **සත්තසුරියුග්ගමන සූත්‍රයඃ-** 1. "එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විශාලා නගරය සමීපයෙහිවූ අම්බපාලි වනයෙහි වැඩවසනසේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ "මහණෙනියි" භික්ෂූන් ඇමතූසේක. "ස්වාමීනියි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. (i) "මහණෙනි, සංස්කාරයෝ අනිත්‍යයහ. මහණෙනි, සංස්කාරයෝ අස්ථිරයහ. මහණෙනි, සංස්කාරයෝ සැනසීම් රහිතයහ. මහණෙනි, යම්බඳුවූ මේ සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුය. නොඇලීමට සුදුසුය. විශෙෂයෙන් මිදීමට

සුදුසුය. (ii) මහණෙනි, මේරු පර්වත රාජයා දිගින් යොදුන් අසූසාරදහසෙකි. පළලින් යොදුන් සාරදහසෙකි. යොදුන් අසූසාර දහසක් මුහුදෙහි ගිලී සිටියේය. යොදුන් අසූසාර දහසක් මුහුදින් උඩට නැගී සිටියේය.

3. "මහණෙනි, මෙබඳු කාලයක්වන්නේමය (කෙබඳුද?) බොහෝ අවුරුදු ගණනකින් බොහෝ අවුරුදු සිය ගණනකින් බොහෝ අවුරුදු දහස් ගණනකින් බොහෝ අවුරුදු ලක්ෂ ගණනකින් වර්ෂාව නොවසියි. මහණෙනි, වර්ෂාව නොවස්නා කල්හි යම් ඒ ඇටවර්ග ගස්වැල් ඖෂධජාති හා වනප්‍රදේශයෝ ඇද්ද ඒ සියල්ල වියලී යත්. නොපැළවෙත්. එසේම (මෙහි 2 (i) යෙදිය යුතුයි.)

4. "මහණෙනි, කවර කලෙක හෝ දීර්ඝ කාලයක් ඇවෑමෙන් දෙවෙනි සූර්‍ය්‍යයා පහළවේද, එබඳු කාලයක් වේමය, මහණෙනි, දෙවෙනි සූර්‍ය්‍යයා පහළවීමෙන් යම් ඒ කුඩා ඇල, දොළ, වළවල් ඇද්ද ඒවා සිඳෙත්, වියලීයත්, නොවෙත් මහණෙනි, එසේම (මෙහි 2 (i) යෙදිය යුතුයි.)

5. "මහණෙනි, කවර කාලයෙක හෝ දීර්ඝ කාලයක් ඇවෑමෙන් තුන්වෙනි සූර්‍ය්‍යයා පහළවේද, එබඳු කාලයක් වේමය. මහණෙනි, තුන්වෙනි සූර්‍ය්‍යයා පහළවීමෙන් යම්කිසි ඒ මහා ගංගා වේද්ද, ඒ කවරහුද ගංගා, යමුනා, අචිරවති, සරභූ, මහී (යන මේ ගංගාවෝ) වියලී යත්. සිඳෙත්, නොවෙත්. මහණෙනි, එමෙන්ම (මෙහි 2 (i) යෙදිය යුතුයි.)

6. "මහණෙනි, කවර කාලයෙක හෝ දීර්ඝ කාලයක් ඇවෑමෙන් සතරවෙනි සූර්‍ය්‍යයා පහළවේද, එබඳු කාලයක් වේමය, මහණෙනි, සතරවෙනි සූර්‍ය්‍යයාගේ පහළවීමෙන් යම් තැන්වලින් මේ මහා ගංගා ඇතිවන්නාහු නම් යම් මහවිල් වේද්ද එනම්, අනවතප්ත සිංහප්‍රපාත, රථකාර, කර්ණමුණ්ඩ, ඡද්දන්ත, මන්දාකිනී යන විල්හු වියලෙත්, සිඳෙත්, නොවෙත් මහණෙනි, එසේම (මෙහි 2 (i) යෙදිය යුතුයි.)

7. "මහණෙනි, කවර කාලයෙක දීර්ඝ කාලයක් ඇවෑමෙන් පස්වෙනි සූර්‍ය්‍යයා පහළවේද, එබඳු කාලයක් වේමය. මහණෙනි,

පස්වෙනි සූර්‍ය්‍යයාගේ පහළවීමෙන් යොදුන් සියයකින් මහා සමුද්‍රයෙහි ජලය පහළට බසිත්. යොදුන් දෙසියයකින් හෝ මහාසමුද්‍රයෙහි ජලය පහළටබසිත්. යොදුන් තුන්සියයකින් හෝ සාරසියයකින් හෝ පන්සියයකින් හෝ හයසියයකින් හෝ සත්සියයකින් හෝ මහා සමුද්‍රයෙහි ජලය පහළට බසිත්, සත්තලක් හෝ මහා සමුද්‍රයෙහි ජලය ඉතිරිවෙයි සය තලක් හෝ පස් තලක් හෝ සිවු තලක් හෝ තුන්තලක් හෝ දෙතලක් හෝ එක තලක් පමණ හෝ මහා සමුද්‍රයෙහි ජලය ඉතිරිවෙයි. මහා සමුද්‍රයෙහි සප්ත පුරුෂ ප්‍රමාණ ජලය ඉතිරිවෙයි. පුරුෂ ප්‍රමාණ සයක් පමණ, පසක් පමණ, සතරක් පමණ, තුනක් පමණ, දෙකක් පමණ, එකක් පමණ අර්ධ පුරුෂ ප්‍රමාණයක් හෝ කටිය පමණ දණ පමණ ගොප් ඇටය පමණ ජල යටට බැසගනියි. මහණෙනි, සරත් කාලයෙහි යම්සේ ලොකු වැහි බින්දු ඇති වර්ෂාව වසින කල්හි ඒ ඒ තැන්වල ගොකුරයන්හි ජලය සිටියේවේද, මහණෙනි, පස්වෙනි සූර්‍ය්‍යයාගේ පහළවීමෙන් ඇඟිලි පුරුකක් තෙමෙන පමණකුදු සමුද්‍රයෙහි ජලය නොවෙයි. මහණෙනි, මෙසේම (මෙහි 2 (i) යෙදිය යුතුයි.)

8. "යම් ඒ දීර්ඝ කාලයක ඇවෑමෙන් සවෙනි සූර්‍ය්‍යයා පහළවේද, මහණෙනි, එබඳු කාලයක් වේමය. මහණෙනි, සවෙනි සූර්‍ය්‍යයාගේ පහළවීමෙන් මේ මහා පෘථුවියද මේරු පර්වතරාජයාද දුම් නගත්. විශේෂයෙන් දුම්නගත්. මනාකොට දුම්නගත්. මහණෙනි, යම්සේ කුඹල්කරුවාගේ (වලංඇසුරූ පෝරණුව) මැටි ආලේපකළේ පළමු පළමුව දුම් කවාද විශෙෂයෙන් දුම් කවාද, මහණෙනි, එමෙන්ම සවෙනි සූර්‍ය්‍යයාගේ පහළවීමෙන් මේ මහාපෘථිවියද මේරු පර්වතරාජයාද දුම්නගත්. විශෙෂයෙන් දුම් නගත්. මහණෙනි, එමෙන්ම (මෙහි 2 (i) යෙදිය යුතුයි.)

**9.** "මහණෙනි, කිසියම් දීර්ඝකාලයක ඇවෑමෙන් සත්වෙනි සූර්‍ය්‍යයා පහළවේද, මහණෙනි, එබඳු දීර්ඝ කාලයක් වේමය. සත්වෙනි සූර්‍ය්‍යයා පහළවීමෙන් මේ මහා පෘථිවියද මේරු පර්වතයද ඇවිලෙයි, දැල්වෙයි. එකම ගිනිජාලාවක් වෙයි. මේ මහා පෘථුවියේද මේරු පර්වත රාජයාගේද දැල්වෙන්නාවූ,

ගිනිගන්නාවූ ඒ ගින්න වාතයෙන් විසුරුවන ලද්දේ බ්‍රහ්මලෝකය දක්වාද යයි. මහණෙනි, මේරුපර්වතයේද මේ මහා පෘථුවියේද දනුලබන ඩැහැගෙන තිබෙන්නාවූ විනාශවන්නාවූ මහත්වූ ගිනිකඳින් මඩනාලද යොදුන් සියයක් පමණවූ ගල්කුළු බිඳී විනාශවෙත්. දෙසියයක් යොදුන් පමණ ගල්කුළු බිඳී විනාශවෙත්. සාරසියයක් යොදුන් පමණ පන්සියයක් යොදුන් පමණ ගල්කුළු බිඳී විනාශ වෙත්. දනුලබන ගින්නෙන් ඩැහැගෙන තිබෙන මේරු පර්වතයෙහිද මේ මහා පෘථිවියෙහිද අළු නොපෙණෙයි. දැලි නොපෙණෙයි. මහණෙනි, ගිතෙල් හෝ තලතෙල් හෝ දනකල්හි ගින්නෙන් ඩැහැගත් කල්හි යම්සේ අළු නොපෙනේද දැලි නොපෙනේද මහණෙනි, දනුලබන ගින්නෙන් ඩැහැගෙන තිබෙන මේ මහා පෘථිවියේද මේරු පර්වතයේද අළු නොපෙණෙයි, දැලි නොපෙණෙයි. මහණෙනි, මෙසේම (මෙහි 2 (i) යෙදිය යුතුයි.) මහණෙනි, මේ මහා පෘථිවියද මේරු පර්වතයද ගින්නෙන් ඩැහැ නොගන්නේයයි විනාශ නොවන්නේයයි දැක්කවුන් හැර කවරෙක් සිතාද, කවරෙක් අදහාද.

10 "මහණෙනි, පෙර වනාහි කාමයන්හි දුරුකළ ආශා ඇති තීර්ථක නායකවූ සුනෙත්‍ර නම් ශාස්තෘවරයෙක් වීය. මහණෙනි, සුනෙත්‍ර නම් ශාස්තෘවරයාට වනාහි නොයෙක් සියගණන් ශ්‍රාවකයෝ වූහ. සුනෙත්‍ර ශාස්තෘවරයා බඹලොව ගමන පිණිස සිය ශ්‍රාවකයන්ට ධර්මය දේශනාකරයි. මහණෙනි, බඹලොව ගමන පිණිස ධර්මය දෙශනා කරන්නාවූ සුනෙත්‍ර ශාස්තෘවරයාගේ සියලු ශාසනය (ඔවුහු) සර්වප්‍රකාරයෙන් දත්හ. ඔවුහු කායයාගේ බිඳීමෙන් මරණින් මතු සුගති නම්වූ බඹලොව උපන්හ.

11 "යම් කෙනෙක් සර්ව ප්‍රකාරයෙන් ශාසනය නොදත්තෝද, ඔවුහු කායයාගේ බිඳීමෙන් මරණින් මතු ඇතැම් කෙනෙක් පරනිර්මිත වසවර්ති දෙවියන් සමග උපන්හ. ඇතැම් කෙනෙක් නිර්මානරතී දෙවියන් සමග උපන්හ. තවත් කෙනෙක් තුසිත දෙවියන් සමග උපන්හ. ඇතැම්හු යාම දෙවියන් සමග උපන්හ. ඇතැම් කෙනෙක් තව්තිසා දෙවියන් සමග උපන්හ. තවත් කෙනෙක් චාතුර් මහාරාජික දෙවියන් සමග උපන්හ.

ඇතැම්හු ක්ෂත්‍රිය මහාසාර කුලයන් හා එක්ව උපන්හ. තවත් අයෙක් බ්‍රාහ්මණ මහාසාර කුලයන් හා එක්ව උපන්හ. ඇතැම් කෙනෙක් ගෘහපති මහාසාර කුලයන් හා එක්ව උපන්හ.

12. "මහණෙනි, ඉක්බිති සුනෙත්‍ර ශාස්තෘවරයාට මේ අදහසවිය. 'ශ්‍රාවකයන් හා පරලොව සමසම ගතිහු වන්නාහුද මෙය වනාහි නුසුදුසුය. ඒ මම මත්තෙහි මෛත්‍රිය වඩන්නේනම් ඉතා යෙහෙක' කියායි. මහණෙනි ඉක්බිති සුනෙත්‍ර ශාස්තෘතෙම සත්වසක් මෛත්‍රී සිත වැඩුවේය. සත් වසක් මෙත් සිත වඩා ලෝකය නැති වෙමින් හා ඇති වෙමින් පවත්නා කල්ප සතක් මේ ලෝකයට නැවත නොආයේය. මහණෙනි, ලෝකය විනාශවන කල්හි ආභස්සර බඹලොවට පිවිසියේය. ලෝකය ඇතිවන කල්හි සූන්‍යවූ බඹවිමනක උපදියි. මහණෙනි, එහි බ්‍රහ්මයාවෙයි. මඩින්නන් විසින් නොමැඩිය හැකි ඒකාන්තයෙන් යටතට ගත් අධිපතිවූ මහා බ්‍රහ්මයාවෙයි. මහණෙනි, සතිස්වාරයක් වනාහි දෙවියන්ට අධිපතිවූ ශක්‍රයා විය.

13 "නොයෙක් සියගණන් වාරවල සත්රුවනින් යුතු ජනපදයන්ගෙන් සැදුනු සිවු දිවයිනක් දිනනසුළු ධාර්මිකවූ දැහැමි රජවූ සක්විති රජවිය. ඔහුට සූරවූ වීරවූ අන්‍යසේනා පරදවන මනා අඟපසඟ ඇති පුත්‍රයෝ දහසකට වඩා වූහ. ඒ චක්‍රවර්ති රජතෙම සාගරය කෙළවර කොට ඇති මේ පෘථිවිය, දඬුවමින් තොරව ආයුධ ආදියෙන් (කරණ යුදවලින්) තොරව ධර්මයෙන් දිනා වාසය කළේය. මහණෙනි, ඒ සුනෙත්‍ර ශාස්තෘතෙම වනාහි මෙසේ දීර්ඝායුෂ්කවූයේ චිරස්ථායීවූයේ නොමිදුනේ විය. (එහෙත්) ඉපදීමෙන්ද ජරා, මරණ, ශොක, පරිදෙව (වැළැපීම්) දුඃඛ, දොමනස්ස, උපායාස (-සිත් තැවුල්) දුක්වලින් නොමිදුනේ දුකින් යුක්තවූයේයයි කියමි.

14. "මහණෙනි, එයට හේතු කවරේද? සතර ධර්මයන්ගේ අවබෝධ නොකිරීමෙනි, ප්‍රතිවෙධ නොකිරීමෙනි. කවර සතර ධර්මයන්ගේද යත්? ආර්‍ය්‍ය ශීලය අවබෝධ නොකිරීමෙන් ප්‍රතිවෙධ නොකිරීමෙන් ආර්‍ය්‍ය සමාධිය අවබෝධ නො කිරීමෙන් ප්‍රතිවෙධ නොකිරීමෙන් ආර්‍ය්‍ය ප්‍රඥාව අවබෝධ නොකිරීමෙන්

ප්‍රතිවෙධ නොකිරීමෙන් ආර්‍ය්‍යවිමුක්තිය අවබෝධ නොකිරීමෙන් ප්‍රතිවේධ නොකිරීමෙන්ද යනුයි.

15. "මහණෙනි, යුෂ්මතුන් විසින් ආර්‍ය්‍යශීලය අවබෝධ කරණලදී. ප්‍රතිවෙධ කරණලදී. ආර්‍ය්‍ය සමාධිය අවබෝධ කරණලදී. ප්‍රතිවේධ කරණලදී. ආර්‍ය්‍ය ප්‍රඥාව අවබෝධ කරණලදී. ප්‍රතිවෙධ කරණලදී. ආර්‍ය්‍යවූ විමුක්තිය අවබෝධ කරණලදී. භවතෘෂ්ණාව උපුටාදමන ලදී. භවයෙන් භවයට ගෙනයන තෘෂ්ණාව ක්ෂයවිය. දැන් නැවත ඉපදීමක් නැත" භාග්‍යවතුන් වහන්සේ මෙය දෙශනා කළසේක. දෙශනාකොට සුගතවූ ශාස්තෘන් වහන්සේ ඉන්පසු මෙය දේශනා කළ සේක.

16 (i) "ශීලයද සමාධියද ප්‍රඥාවද ලෝකොත්තර මිදීමයයි කියනලද අර්හත් ඵලයද යන මේ ධර්මයෝ යශස් ඇත්තාවූ ගෞතමයන් විසින් අවබෝධ කරණ ලද්දාහුය.

2. "මෙසේ බුද්ධතෙම විශිෂ්ට ඥානයෙන් මනාකොට දැන භික්ෂූන්ට ධර්මය දෙශනාකළ සේක. සසර දුක් කෙළවර කළාවූ පසැස් ඇත්තාවූ ශාස්තෘතෙම ක්ලෙශ පරිනිර්වාණයෙන් නිවුනසේක."

14 **පච්චන්ත නගරොපම සූත්‍රය**:- 1 "මහණෙනි, යම් හෙයකින් වනාහි රජහුගේ පිටිසර බද නගරය සප්ත නගර ආරක්ෂා වලින් මනාකොට පිළියෙල කරණ ලද්දේවේද, චතුර්විධ ආහාරයන්ගේ පහසුවෙන් ලැබීමද මද උත්සාහයෙන් ලැබීමද නිදුකින් ලැබීමද සිදුවේද, මහණෙනි, රජහුගේ ප්‍රත්‍යන්ත නගරයට බාහිරවූ පස මිතුරුවූ සතුරන් විසින් කිසිවක් නොකට හැකියයි මෙය කියනු ලැබේ.

2 "කවර සතකින්ද යත්, මහණෙනි මෙහි රජහුගේ පිටිසර බද නගරයෙහි මනාකොට සිටුවන ලද ස්ථිරවූ නොසෙල්වෙන ඉන්ද්‍ර කීලයක් (නුවර ඉම සවි වෙන කනුවක්) ඇත්තේ වෙයි. මේ පළමුවන නගරාරක්ෂාවෙන් (ii) රජහුගේ පිටිසර බද නගරය අන්‍යයන්ගේ වැළක්වීමෙන්ද අභ්‍යන්තර ආරක්ෂාවෙන්ද මනාකොට ආරක්ෂාව කරණ ලද්දේ වෙයි.

3. "මහණෙනි, නැවතද රජුගේ පිටිසර බද නගරයෙහි ගැඹුරුවූද පළල්වූද දිය අගල් කරන ලද්දේ වෙයි. මේ දෙවන නගරාරක්ෂාවෙන් (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

4. "නැවතද මහණෙනි, රජුගේ පිටිසර බද නගරයෙහි උස්වූද පළල් වූද වටේ යෑමට පාරවල් වෙයි. මේ තුන්වන නගරාරක්ෂාවෙන් (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

5. "නැවතද මහණෙනි, රජුගේ පිටිසර බද නගරයෙහි ලහපත්ද, ජෙවනිකද බොහෝ ආවුධද රැස් කරණ ලද්දේ වෙයි මේ සතරවන නගර ආරක්ෂාවෙන් (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

6. "නැවතද මහණෙනි, රජුගේ පිටිසර බද නගරයෙහි බොහෝ බල පිරිස වාසය කරයි. එනම්, ඇතුන් නැගි පිරිස, අසුන් නැගි පිරිස, රිය නැගි, දුනුගත්, වස්ත්‍ර සොළවන, ආහාර දෙන පිරිසද උසස්වූ රාජ පුත්‍රයෝද පණින්නාවූ මහා ඇත්තුද ශූරවූ පැලුම්කරුවෝද චර්ම යොධිහුද දාසක පුත්‍රයෝද යන මේ පස්වැනිවූ නගරාරක්ෂාවෙන් (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

7. "නැවතද මහණෙනි, රජුගේ පිටිසර බද නගරයෙහි පණ්ඩිතවූ ව්‍යක්තවූ නුවණැති නොහඳුනන්නවුන් වළක්වන හඳුනන්නවුන් ඇතුල් කරණ දොරටු පාලයෙක් වෙයි. මේ සවන නගරා රක්ෂාවෙන් (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

8. "නැවතද මහණෙනි, රජුගේ පිටිසර බද නගරයෙහි උස්වූද පළල්වූද සුවඳකැවූ පිරියම් කරණ ලද්දාවූද ප්‍රාකාරයක් වෙයි. මේ සත්වන නගරාරක්ෂාවෙන් (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) මේ සප්ත නගරාරක්ෂාවලින් මනාකොට ආරක්ෂා කරණ ලද්දේවේ.

9. "කවර සතර ආහාරයකගේ පහසුවෙන් ලැබීම, මද උත්සාහයෙන් ලැබීම නිදුකින් ලැබීම වේද, මහණෙනි, මෙහි රජුගේ පිටිසර බද නගරයෙහි අභ්‍යන්තරිකයන්ගේ ඇල්ම පිණිස, පීඩා නොවීම පිණිස, පාසුවිහරණය පිණිස පිටතින් පැමිණෙන්නන් දුරු කිරීම පිණිස බොහෝ තෘණ දර ජලය රැස් කරණ ලද්දේ වෙයි.

10. (i) "මහණෙනි, නැවතද රජුගේ පිටිසර බද නගරයෙහි ආභ්‍යන්තරිකයන්ගේ ඇල්ම පිණිස පීඩා නොවීම පිණිස පිටතින් පැමිණෙන්නන් දුරු කිරීම පිණිස (ii) ඇල් වී, යව රැස් කරණ ලද්දේවේ.

11. (මෙහි 10 (i) යෙදිය යුතුයි.) තල මෑ මුං හා පස්වරුවේ ආහාර රැස්කරණ ලද්දේවේ (මෙහි 10 (i) යෙදිය යුතුයි.) බොහෝ බෙහෙත් රැස් කරණ ලද්දේ වෙයි. එනම්, ගිතෙල් වෙඬරු තෙල් මීපැනි ලුණු යනාදියයි. මේ සතර ආහාරයන්ගේ පහසුවෙන් ලැබීමද මද උත්සාහයෙන් ලැබීමද නිදුකින් ලැබීමද වෙයි. මහණෙනි, යම් හෙයකින් වනාහි රජුගේ පිටිසර බද නගරය මේ සප්ත නගරාරක්ෂාවලින් මනාකොට ආරක්ෂා කරණ ලද්දේ වෙයිද, මේ සතර ආහාරයන්ගේ පහසුවෙන් ලැබීම, මද උත්සාහයෙන් ලැබීම නිදුකින් ලැබීම සිදුවෙයි. මහණෙනි, රජුගේ පිටිසර බද නගරයට බාහිරවූ සතුරන් විසින් පස මිතුරන් විසින් කළ යුත්තක් නැතැයි මෙය කියයි.

12. "මහණෙනි, එපරිද්දෙන්ම යම් හෙයකින් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම සප්ත ධර්මයකින් යුක්තවූයේ වේද (හෙතෙම) උසස් චෛතසිකවූ මේ ආත්ම භාවයෙහිම සුඛ විහරණ ඇති සතර ධ්‍යානයන් පහසුවෙන් ලබන්නේ වෙයි. මද උත්සාහයෙන් ලබන්නේ වෙයි. නිදුකින් ලබන්නේ වෙයි. මහණෙනි, මේ තෙම ආර්‍ය්‍ය ශ්‍රාවකයයි කියනු ලැබේ පාපීවූ මාරයා විසින් කළ යුත්තක් නැත. කවර ධර්ම සතකින් යුක්තවූයේද යත්?

13 "මහණෙනි, යම්සේ රජුගේ පිටිසර බද නගරයෙහි අභ්‍යන්තර ආරක්ෂාව පිණිසද පිටතින් පැමිණෙන අයගේ වැලැක්වීම පිණිසද ගැඹුරුකොට යට කරණ ලද ස්ථිරවූ නොසෙල්වෙන ඉන්ද්‍රඛීලයක් වේද, මහණෙනි, එපරිද්දෙන්ම ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම තථාගතයන් වහන්සේගේ සර්වඥතාඥානය ගැන (ii) ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත්‍ය, සම්‍යක් සම්බුද්ධය, අෂ්ටවිද්‍යා පසළොස්චරණ ධර්මයන්ගෙන් යුක්තය, සුගතය ලොකවිදූය, පුරුෂයන් හික්මවන උතුම්වූ රියැදුරෙක, දෙව්මිනිසුන්ගේ ශාස්තෘය, චතුරාර්‍ය්‍ය සත්‍යය අවබොධ කළ

සේකැයි (iii) ශ්‍රද්ධාව ඇත්තේ වේද අදහාද එබඳු ශ්‍රද්ධාව ඇති ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම අකුශලය දුරුකරයි. කුශලය වඩයි. වැරදි දේ දුරුකරයි. නිවැරදිදේ වඩයි. පිරිසිදුවූ ආත්මභාවයක් පරිහරණයකරයි මේ පළමුවන සද්ධර්මයෙන් යුක්තවූයේ වෙයි.

14 "මහණෙනි, යම්සේ රජුගේ පිටිසර බද නගරයෙහි ඇතුළත ආරක්ෂාව පිණිසද පිටතින් පැමිණෙන අයගේ වැළැක්වීම පිණිසද ගැඹුරුවූද පළල්වූද දිය අගල් වේද මහණෙනි, එපරිද්දෙන්ම ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම කාය දුශ්චරිතයෙන් ලජ්ජා ඇත්තේ ලජ්ජා වේද වාග් දුශ්චරිතයෙන් මනො දුශ්චරිතයෙන් ලජ්ජාවේද ලාමකවූද අකුශල ධර්මයන්ගේ සංසිඳවීමෙන් ලජ්ජාවෙන් ආරක්ෂාකරන්නාවූ ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම අකුශලය දුරුකරයි. කුශලය වඩයි. වැරදි දේ දුරුකරයි නිවැරදිදේ වඩයි පිරිසිදු ආත්මභාවයක් වඩයි, මේ දෙවෙනි සද්ධර්මයෙන් යුක්තවූයේ වෙයි.

15 "මහණෙනි, යම්සේ රජුගේ පිටිසර බද නගරයෙහි ඇතුළත වාසීන්ගේ ආරක්ෂාව පිණිසද පිටතින් පැමිණෙන්නන්ගේ වැළැක්වීම පිණිසද උස්වූද පළල්වූද වටේයාමට පාරවල් වේද, මහණෙනි, එපරිද්දෙන්ම ආර්‍ය්‍යශ්‍රාවක තෙම බිය ඇත්තේ බිය වේද, කාය දුශ්චරිතයෙන් බිය ඇත්තේ බියවේද, වාග් දුශ්චරිතයෙන් බිය ඇත්තේ බිය වේද, මනො දුශ්චරිතයෙන් ලාමකවූ අකුශල ධර්මයන්ගේ සංසිඳවීමෙන් පවට බිය නමැති මාර්ගය ඇති ආර්‍ය්‍යශ්‍රාවක තෙම අකුශලය දුරුකරයි. කුශලය වඩයි. වැරදිදේ දුරුකරයි. නිවැරදිදේ වඩයි. පිරිසිදු ආත්මභාවයක් පරිහරණය කරයි. මේ තුන්වෙනි සද්ධර්මයෙන් යුක්තවූයේ වෙයි.

16 "මහණෙනි, යම්සේ රජුගේ පිටිසර බද නගරයෙහි (මෙහි 'ආරක්ෂා' වෙනුවට 'ආයුධ රැස්' කියා වෙනස් කොට (මෙහි 2 (ii) ඡෙදය යෙදිය යුතුයි.) මහණෙනි, එපරිද්දෙන්ම ආර්‍ය්‍යශ්‍රාවක තෙම බහුශ්‍රැතවූයේ වේද ශ්‍රැතධරවූයේ රැස්කළ බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තේ යම් ඒ ධර්මයෝ මුල යහපත්වූ මැද යහපත්වූ අග යහපත්වූ අර්ථසහිතවූ ව්‍යඤ්ජන සහිතවූ සියල්ල පරිපූර්ණවූ

පරිශුද්ධවූ බ්‍රහ්මචය්‍ය්‍ර්‍යාව මනාකොට ප්‍රකාශ කරත්ද එබඳුවූ ධර්මයෝ බොහෝකොට අසන ලද්දාහු වෙත්. දරණ ලද්දේ වචනයෙන් පුරුදු කරණ ලද්දේ සිතින් පරීක්ෂාකරණ ලද්දේ සම්‍යක් දෘෂ්ටියෙන් ප්‍රතිවෙධ කරණ ලද්දේ වේද, මහණෙනි, ශ්‍රැතායුධවූ ආය්‍ය්‍ර්‍ය ශ්‍රාවකතෙම අකුශලය දුරුකරයි, කුශලය වඩයි වැරදිදේ දුරුකරයි නිවැරදිදේ වඩයි, පිරිසිදු ආත්මභාවයක් පරිහරණය කරයි මේ සතරවැනි සද්ධර්මයෙන් යුක්තවූයේ වෙයි.

17 "මහණෙනි, යම්සේ රජුගේ පිටිසර බද නගරයෙහි (මෙහි 2 (ii) සහ 6 ඡෙද යෙදිය යුතුයි.) මහණෙනි, එපරිද්දෙන්ම ආය්‍ය්‍ර්‍යශ්‍රාවක තෙම පටන් ගන්නා ලද වීය්‍ය්‍ර්‍ය ඇත්තේ අකුශල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කුශල ධර්මයන්ගේ වැඩීම පිණිස උත්සාහ ඇත්තේ දැඩි වීය්‍ය්‍ර්‍ය ඇත්තේ කුශල ධර්මයන්හි බහා නොතබන ලද බර ඇත්තේ වාසය කරයි. මහණෙනි, වීය්‍ය්‍ර්‍ය බල කාය ඇති ආය්‍ය්‍ර්‍යශ්‍රාවක තෙම අකුශලය දුරුකරයි, කුශලය වඩයි. වැරදිදේ දුරුකරයි. නිවැරදිදේ වඩයි. පිරිසිදු ආත්මභාවය පරිහරණය කරයි. මේ පස්වැනි සද්ධර්මයෙන් යුක්තවූයේ වෙයි.

18 "මහණෙනි, යම්සේ වනාහි රජුගේ පිටිසරබද නගරයෙහි (මෙහි 2 (ii) සහ 7 ඡෙද යෙදිය යුතුයි) මහණෙනි, එමෙන්ම ආය්‍ය්‍ර්‍ය ශ්‍රාවකතෙම උතුම්වූ නුවණින් යුත් ස්මෘතියෙන් යුක්තවූයේ කලකට පෙර කරණ ලද දේද කලකට පෙර කියන ලද දේද සිහි කරන්නේ අනුස්මරණය කරන්නේ සිහි ඇත්තේ වේද,

"මහණෙනි, සිහිය නමැති දොරටුපාලයා ඇති ආය්‍ය්‍ර්‍ය ශ්‍රාවකතෙම අකුශලය දුරුකරයි. කුශලය වඩයි. වැරදි දේ දුරුකරයි. නිවැරදිදේ වඩයි. පිරිසිදුවූ ආත්මභාවයක් වඩයි. මේ සවැනි සද්ධර්මයෙන් යුක්තවූයේ වෙයි.

19 "මහණෙනි, යම්සේ වනාහි රජුගේ පිටිසර බද නගරයෙහි (මෙහි 8 ඡෙදය යෙදිය යුතුයි.) මහණෙනි, එපරිද්දෙන්ම ආය්‍ය්‍ර්‍යශ්‍රාවක තෙම උදයත්ථගාමිනි ප්‍රඥාවෙන් යුක්තවූයේ මනාකොට දුක් කෙළවර කරන්නාවූ ආය්‍ය්‍ර්‍යවූ තියුණු ප්‍රඥාවෙන් යුක්තවූයේ ප්‍රඥාවත්වේද, මහණෙනි, නුවණ නමැති වර්ණාලේප පිරියම් ඇති ආය්‍ය්‍ර්‍ය ශ්‍රාවකතෙම අකුශලය දුරුකරයි, කුශලය

වඩයි, වැරදිදේ දුරු කරයි, නිවැරදිදේ වඩයි, පිරිසිදුවූ ආත්මභාවයක් පරිහරණය කරයි, මේ සත්වැනිවූ සද්ධර්මයෙන් යුක්තවූයේ වෙයි.

20 "මේ ධර්ම සතින් යුක්තවූයේ වෙයි. මෙලොවම සැප විහරණ ඇති උසස් චෛතසිකයන්ගෙන් යුත් ධ්‍යාන සතර පහසුවෙන් ලබයි. මද උත්සාහයෙන් ලබයි. නිදුකින් ලබයි. මහණෙනි, රජුගේ පිටිසර බද නගරයෙහි ඇතුළත අයගේ ඇල්ම පිණිසද පීඩා නොවීම පිණිසද පිටතින් පැමිණෙන අයගේ වැළැක්වීම පිණිසද බොහෝ තෘණ දර දිය රැස්කරණ ලද්දේද, මහණෙනි, එමෙන්ම ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම තමන්ගේ ඇල්ම පිණිසද පීඩා නොවීම පිණිසද, එාසු විහරණය පිණිසද, නිර්වාණයට බැසගැන්ම පිණිසද කාමයන්ගෙන් වෙන්ව අකුශල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් උපන් ප්‍රීති සැපය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරයි.

21 "මහණෙනි, මෙසේ රජුගේ පිටිසර බද නගරයෙහි ඇතුළත වාසීන්ගේ ඇල්ම පිණිසද පීඩා නොවීම පිණිසද එාසු විහරණය පිණිසද, පිටතින් පැමිණෙන්නන්ගේ වැළැක්වීම පිණිසද, (ii) බොහෝ ඇල් හා යව රැස් කරණ ලද්දේ වෙයි. එමෙන්ම ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම තමන්ගේ ඇල්ම පිණිසද පීඩා නොවීම පිණිසද එාසු විහරණය පිණිසද නිවණට බැස ගැන්ම පිණිසද විතර්ක විචාරන්ගේ සංසිඳීමෙන් ආධ්‍යාත්මයෙහි පැහැදීම ඇති චිත්තයාගේ එකඟත්වය ඇති විතර්ක රහිතවූ විචාර රහිතවූ ප්‍රීතිය හා සැපය ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි.

22 (මෙහි 21 (i) යෙදිය යුතුයි.) තල මෑ මුං හා වෙනත් ආහාර රැස් කරණ ලද්දේවේ. මහණෙනි, එමෙන්ම ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම තමන්ගේ ඇල්ම පිණිසද පීඩා නොවීම පිණිසද එාසු විහරණය පිණිසද නිර්වාණයට බැසගැන්ම පිණිසද ප්‍රීතියගේ වෙන්වීමෙන් උපෙක්ෂා ඇත්තේ වාසය කරයි. සිහි ඇත්තේ මනාදැනීම ඇත්තේ කයින් සැපතද විඳියි. යමකට

ආයර්‍ෂයන් වහන්සේලා උපෙක්ෂා ඇත්තේ සිහි ඇත්තේ සැප විහාරීයයි ආයර්‍ෂයන් වහන්සේලා කියද්ද, ඒ තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි.

23 (මෙහි 21 (i) යෙදිය යුතුයි.) බොහෝ බෙහෙත් රැස් කරණ ලද්දේ වෙයි. එනම්, ගිතෙල් වෙඬරු තෙල් මී පැණි ලුණු (යනාදියයි) මහණෙනි, එමෙන්ම ආයර්‍ෂ ශ්‍රාවකතෙම පීඩා නොවීම පිණිසද ඵාසුවිහරණය පිණිසද නිර්වාණයට බැසගැන්ම පිණිසද සුඛයාගේ ප්‍රහාණයෙන්ද දුක්ඛයාගේ ප්‍රහාණයෙන්ද සොමනස්ස දොමනස්සයන්ගේ ප්‍රහාණයෙන් පෙරම අදුක්ඛවූ අසුඛවූ උපෙක්ෂා ස්මෘති යන මෙයින් පිරිසිදුවූ චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කරයි. මේ චෛතසිකයන්ගේ උසස් බව ඇති මෙලොව සැප විහරණ ඇති මේ සතර ධ්‍යානයන්ගේ පහසුවෙන් ලැබීම වෙයි. මද උත්සාහයෙන් ලැබීම වෙයි. නිදුකින් ලැබීම වෙයි. මහණෙනි, මේ ආයර්‍ෂ ශ්‍රාවක තෙම මහණෙනි, මේ තෙම ආයර්‍ෂ ශ්‍රාවකයයි කියයි. පාපීවූ මාරයා විසින් කිසිවක් නොකට හැකිය."

15. **ආහුණෙය්‍යසත්තංග සූත්‍රයः-** 1. "මහණෙනි, ධර්ම සතකින් යුක්තවූ භික්ෂුව පූජාවට යොග්‍යවේ. (මෙහි ඡක්ක නිපාතයේ 1 ආහුණෙය්‍ය වර්ගයේ 10 සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි)

2. "කවර සතකින්දයත්? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ධර්මය දන්නේවේද, අර්ථය දන්නේවේද, තමා දන්නේද, ප්‍රමාණය දන්නේද, කාලය දන්නේද, පිරිස දන්නේද, උතුම් පුද්ගලයන් දන්නේද (යන කරුණු සතයි.)

3. "මහණෙනි, කෙසේ නම් භික්ෂුව ධර්මය දන්නේවේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ධර්මය දන්නේ සූත්‍රය ගෙය්‍යය, වෙය්‍යාකරණය, ගාථාය, උදානය, ඉතිවුත්තකය, අද්භූත ධර්මය, වෙදල්ලය (ii) දනීද හෙතෙම ධර්මය දන්නේවේ. (මෙහි 3 (i) යෙදිය යුතුයි.) නොදන්නේ නම් මේ ශාසනයෙහි ධර්මය නොදන්නේවේ. (මෙහි 3 (i) යෙදිය යුතුයි.) දන්නේද, එහෙයින් මේ ශාසනයෙහි භික්ෂුව ධර්මය දන්නේවේ. (ධර්මය දන්නා තැනැත්තා මෙසේය.)

4. "අර්ථය දන්නාතැනැත්තේද කෙසේවේද? මහණෙනි, මේ ශාසනයෙහි (ii) භික්ෂුව ඒ ඒ භාෂිතයාගේ අර්ථය, මේ භාෂිතයාගේ අර්ථය මේ වෙයි. මේ භාෂිතයාගේ අර්ථය මේ වේයයි දනී.

"මහණෙනි, ඉදින් මේ නොදන්නේද අර්ථය දන්නේයයි නොකියන්නේය මහණෙනි, යම් හෙයකින් වනාහි භික්ෂුව මේ භාෂිතයාගේ අර්ථය මේය, මේ භාෂිතයාගේ අර්ථය මේයයි ඒ ඒ භාෂිතයාගේ අර්ථය දනීද එහෙයින් අර්ථය දන්නේයයි කියයි. (ධර්මය දන්නා තැනැත්තේද අර්ථය දන්නා තැනැත්තේද මෙසේය.)

5. "තමා දන්නේ කෙසේවේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව (ii) ශ්‍රද්ධාවෙන්ද, ශීලයෙන්ද, ශ්‍රැතයෙන්ද, ත්‍යාගයෙන්ද, ප්‍රඥාවෙන්ද, ප්‍රතිභානයෙන්ද, මෙපමණකින් යුක්ත වීමියි, (iii) තමා දනීද, එහෙයින් තමා දන්නේයයි කියනුලැබේ. මහණෙනි, (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) නො දන්නේද තමා දන්නේයයි නොකියන්නේය. (ධර්මය දන්නා තැනැත්තේද අර්ථය දන්නා තැනැත්තේද තමා දන්නා තැනැත්තේද මෙසේය.)

6. "ප්‍රමාණය දන්නා තැනැත්තේ කෙසේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව (ii) සිවුරු පිණ්ඩාහාර සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර පිළිගැනීමේ ප්‍රමාණය (iii) දනීද, මහණෙනි, ඉදින් භික්ෂුව (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) නොදන්නේද මේ ශාසනයෙහි ප්‍රමාණය දන්නායයි නොකියන්නේය. මහණෙනි, යම් හෙයකින් වනාහි භික්ෂුව (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) දන්නේද එහෙයින් ප්‍රමාණය දන්නායයි කියනු ලැබේ. (ධර්මය දන්නා, අර්ථය දන්නා, තමා දන්නා ප්‍රමාණය දන්නාද මෙසේය.

7. "කාලය දන්නා කෙසේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව, (ii) උදෙසීමට (ඉගෙණීමට) මේ කාලයවේ. ප්‍රශ්න කිරීමට මේ කාලයවේ. භාවනාවට මේ කාලයවේ. විවේක වාසයට මේ කාලය වේයයි (iii) කාලය දනීද, ඉදින් භික්ෂුව (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) නොදන්නේද, මේ ශාසනයෙහි

කාලය දන්නායයි නොකියන්නේය. මහණෙනි, යම් හෙයකින් වනාහි භික්ෂුව (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) දනීද එහෙයින් කාලය දන්නායයි කියනු ලැබේ. ධර්මය දන්නා, අර්ථය දන්නා තමා දන්නා, ප්‍රමාණය දන්නා, කාලය දන්නාද මෙසේවේ.

8. "පිරිස ගැන දන්නා කෙසේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව (ii) මේ ක්ෂත්‍රිය පිරිසය මේ බ්‍රාහ්මණ පිරිසය මේ ගෘහපති පිරිසය, මේ ශ්‍රමණ පිරිසය එහි මෙසේ එළඹිය යුතුයි. මෙසේ සිටිය යුතුයි. මෙසේ (කටයුතු) කළ යුතුය. මෙසේ හිඳගත යුතුය මෙසේ කථා කළ යුතුය මෙසේ කථා නොකළ යුතුයයි (ii) පිරිස ගැන දන්නේද, මහණෙනි, භික්ෂුව (මෙහි 8 (ii) යෙදිය යුතුයි.) පිරිස ගැන නොදන්නේ නම් මේ ශාසනයෙහි පිරිස ගැන දන්නායයි නොකියනුලැබේ. මහණෙනි, යම් හෙයකින් වනාහි භික්ෂුව (මෙහි 8 (ii) යෙදිය යුතුයි.) එහෙයින් වනාහි පිරිස දන්නායයි කියනුලැබේ. (ධර්මය දන්නා, අර්ථය දන්නා, තමා දන්නා, ප්‍රමාණය දන්නා, කාලය දන්නා, පිරිස දන්නාද මෙසේය.)

9. "උතුම් පුද්ගලයන් දන්නා කවරෙක් වේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව විසින් කරුණු දෙකකින් පුද්ගලයෝ දැනගන්නා ලද්දාහුවෙත්. එක් පුද්ගලයෙක් ආයුෂ්‍යන් වහන්සේලා දකිනු කැමතිවේද එක් පුද්ගලයෙක් ආයුෂ්‍යන් වහන්සේලා නොදකිනු කැමැතිවේද, මේ පුද්ගලයෝ දෙදෙනෙකි. යම් ඒ පුද්ගලයෙක් ආයුෂ්‍යන් වහන්සේලා නොදකිනු කැමතිවේද මෙසේ හෙතෙම ඒ ඒ කාරණයෙන් නින්දා කටයුතුය. යම් ඒ පුද්ගලයෙක් ආයුෂ්‍යන් වහන්සේලා දකිනු කැමතිවේද මෙසේ හෙතෙම ඒ ඒ කාරණයෙන් ප්‍රශංසා කටයුතුය.

10. "ආයුෂ්‍යන් වහන්සේලා දකිනු කැමති පුද්ගලයෝ දෙදෙනෙකි. එක් පුද්ගලයෙක් සද්ධර්ම ශ්‍රවණයට කැමතිවෙයි. එක් පුද්ගලයෙක් සද්ධර්මශ්‍රවණයට අකමැති වෙයි. යම් ඒ පුද්ගලයෙක් සද්ධර්මශ්‍රවණයට අකමැතිවේද මෙසේ හෙතෙම ඒ ඒ කාරණයෙන් නින්දා කටයුතුය. යම් ඒ පුද්ගලයෙක් බණ අසනු කැමතිවේද හෙතෙම ඒ ඒ කාරණයෙන් ප්‍රශංසා කටයුතුයි.

11. "බණ අසන පුද්ගලයෝ දෙදෙනෙක් වෙති. එක් පුද්ගලයෙක් කන් නමා බණ අසයි. එක් පුද්ගලයෙක් කන් නොනමා බණ අසයි. යම් ඒ පුද්ගලයෙක් කන් නොනමා බණ අසාද හෙතෙම ඒ ඒ කාරණයෙන් නින්දා කටයුතුය. යම් ඒ පුද්ගලයෙක් කන් නමා බණඅසාද, හෙතෙම ඒ ඒ කාරණයෙන් ප්‍රශංසා කටයුතුය.

12. "පුද්ගලයෝ දෙදෙනෙක් කන් නමා බණ අසති. එක් පුද්ගලයෙක් අසා (සිතේ) දරාගනියි. එක් පුද්ගලයෙක් අසා (සිතේ) දරා නොගනියි. යම් ඒ පුද්ගලයෙක් බණ අසා සිතේ දරා නොගනීද, මෙසේ හෙතෙම ඒ ඒ කාරණයෙන් නින්දා කටයුතුය. යම් ඒ පුද්ගලයෙක් බණ අසා සිතේ දරා ගනීද හෙතෙම ඒ ඒ කාරණයෙන් ප්‍රශංසා කටයුතුය.

13. "පුද්ගලයෝ දෙදෙනෙක් බණ අසා සිතේ දරා ගනිත් එක් පුද්ගලයෙක් දරණලද ධර්මයන්ගේ අර්ථය පරීක්ෂා කර බලයි. එක් පුද්ගලයෙක් දරණලද ධර්මයන්ගේ අර්ථය පරීක්ෂාකර නොබලයි. යම් ඒ පුද්ගලයෙක් දරණලද ධර්මයන්ගේ අර්ථය පරීක්ෂාකරනොබලයිද, මෙසේ හෙතෙම ඒ ඒ කාරණයෙන් නින්දා කටයුතුය. යම් ඒ පුද්ගලයෙක් දරනලද ධර්මයන්ගේ අර්ථය පරීක්ෂාකර බලයිද, හෙතෙම ඒ ඒ කාරණයෙන් ප්‍රශංසා කටයුතුය.

14. "පුද්ගලයෝ දෙදෙනෙක් දරණලද ධර්මයන්ගේ අර්ථ පරීක්ෂාකර බලත්. එක් පුද්ගලයෙක් අර්ථය දැන, ධර්මය දැන ධර්මානුධර්ම ප්‍රතිපන්නවූයේ වෙයි. එක් පුද්ගලයෙක් අර්ථය නොම දැන ධර්මය නොමදැන ධර්මානුධර්ම ප්‍රතිපන්නවූයේ වෙයි. එක් පුද්ගලයෙක් අර්ථය නොම දැන ධර්මය නොමදැන ධර්මානුධර්ම ප්‍රතිපන්න වූයේද හෙතෙම ඒ ඒ කාරණයෙන් නින්දා කටයුතුය. යම් ඒ පුද්ගලයෙක් අර්ථය දැන ධර්මය දැන ධර්මානුධර්ම ප්‍රතිපන්න වූයේද හෙතෙම ඒ ඒ කාරණයෙන් ප්‍රශංසා කටයුතුය.

15. "පුද්ගලයෝ දෙදෙනෙක් අර්ථය දැන, ධර්මය දැන ධර්මානුධර්ම ප්‍රතිපන්න වෙති එක් පුද්ගලයෙක් තමාගේ හිත පිණිස පිළිපන්නේ අනුන්ගේ හිත පිණිස පිළිපන්නේ නොවේ.

එක් පුද්ගලයෙක් තමාගේ හිත පිණිසද අනුන්ගේ හිත පිණිසද පිළිපන්නේ වේ යම් ඒ පුද්ගලයෙක් තමාගේ හිත පිණිස පිළිපන්නේ අනුන්ගේ හිත පිණිස පිළිනොපන්නේ වේද, මෙසේ හෙතෙම ඒ කාරණයෙන් නින්දා කටයුතුය. යම් ඒ පුද්ගලයෙක් තමාගේ හිත පිණිසද අනුන්ගේ හිත පිණිසද පිළිපන්නේවේද, හෙතෙම ඒ කාරණයෙන් ප්‍රශංසා කටයුතුය.

16. "මහණෙනි, මෙසේ වනාහි භික්ෂුව විසින් කරුණු දෙකකින් පුද්ගලයෝ හැඳිනගන්නා ලද්දාහුවෙති. මහණෙනි, මෙසේ වනාහි භික්ෂුව යහපත් පුද්ගලයන් ඇඳින ගන්නේ වෙයි

17. (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි)

16. **පාරිච්ඡත්තකොපම සූත්‍රය**:- 1. "මහණෙනි, යම් කිසිකලෙක තවුතිසා දෙවියන්ගේ කොවිලාර නම් වූ පරසතු රුක කොළ පඬුවන් පැහැ වෙයි. ඒ කාලයෙහි තවුතිසා දෙවියෝ කොවිලාර නම් වූ පරසතු රුක කොළ පඬුවන් පැහැවූයේය. කල් නොයවාම වැටුන කොළ ඇත්තේ වේයයි දෙවියෝ සතුටු වෙත්.

2 "මහණෙනි, යම් කිසි කලෙක තව්තිසා දෙවියන්ගේ කොවිලාර නම් වූ පරසතු රුක වැටුණ කොළ ඇත්තේ වෙයිද ඒ කාලයෙහි තවුතිසා දෙවියෝ කොවිලාර නම් වූ පරසතු රුක වැටුණ කොළ ඇත්තේය. කල් නොයවාම දළුලන්නේ යයි සතුටු වෙත්.

3. "මහණෙනි, යම් කිසි කලෙක තවුතිසා දෙවියන්ගේ කොවිලාර නම් වූ පරසතු රුක දළුලෑවේද, කල් නොයවාම මැලැසි (කුඩා මල් මොට්ටු) ඇතිවේයයි සතුටු වෙති. මහණෙනි යම්කිසි කලෙක තවුතිසා දෙවියන්ගේ කොවිලාර නම් වූ පරසතු රුක මැලැසි (කුඩා මල් මොට්ටු) ඇතිවෙයි. ඒ කාලයෙහි තවුතිසා දෙවියෝ කොවිලාර නම් වූ පරසතු රුක මැලැසි (කුඩා මල් මොට්ටු) ඇතිවිය. කල් නොයවාම මේරූ මල් මොට්ටු ඇතිවන්නේයයි සතුටු වෙති.

4. "මහණෙනි, යම් කිසිකලෙක තවුතිසා දෙවියන්ගේ කොවිලාර නම් වූ පරසතු රුක මේරූ මල් මොට්ටු ඇතිවෙයි.

ඒ කාලයෙහි තවුතිසා දෙවියෝ කොවිලාර නම් වූ පරසතු රුක මේරූ මල් මොට්ටු ඇතිවිය. කල් නොයවාම තැනින් තැන පිපුණු මල් ඇතිවේයයි සතුටු වෙයි.

**5** "මහණෙනි, යම්කිසි කලෙක තවුතිසා දෙවියන්ගේ කොවිලාර නම් වූ පරසතු රුක තැනින් තැන පිපුණු මල් ඇතිවෙයි. ඒ කාලයෙහි තවුතිසා දෙවියෝ කොවිලාර නම් වූ පරසතු රුක තැනින්තැන පිපුණු මල් ඇතිවිය. කල්නොයවාම ගස මුළුල්ලම මල් පිපෙන්නේයයි සතුටුවෙයි.

**6.** "මහණෙනි, යම්කිසි කලෙක තවුතිසා දෙවියන්ගේ කොවිලාර නම් වූ පරසතු රුක ගස මුළුල්ලම මල් පිපෙයි. සතුටුවූ තවුතිසා දෙවියෝ කොවිලාර නම් වූ පරසතු රුක්මුල දිව්‍යවූ සාර මාසයක් දිව්‍ය වූ පඤ්චකාම ගුණයන්ගෙන් යෙදුනාහු යුක්තවූවාහු සැප විඳිත්. මහණෙනි, සියල්ල පිපුනාවූ කොවිලාර නම් වූ පරසතු රුක හාත්පස පණස් යොදුනක් ප්‍රභාවෙන් ස්පර්ශ කරණ ලද්දේ වෙයි. වාතය අනුව යොදුන් සියයක් සුවඳ හමයි. කොවිලාර නම් වූ පරසතු රුක්හි මේ ආනුභාවයයි.

**7.** "මහණෙනි, එමෙන්ම යම් කලෙක ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම ගෘහවාසයෙන් අනගාරිය නම්වූ පැවිද්දට සිත යොදයිද මහණෙනි, එපරිද්දෙන්ම ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම ඒ කාලයෙහි දෙවියන්ගේ කොවිලාර නම් වූ පරසතු රුක කොළ පඬුවන් වූවාසේ වෙයි.

**8.** "මහණෙනි, යම් කලෙක ආර්‍ය්‍යශ්‍රාවකතෙම දැලි රැවුල් අස්කොට සිවුරු පොරවා ගිහිගෙන් නික්ම අනගාරිය නම් වූ ශාසනයෙහි පැවිදිවූයේ වේද ඒ කාලයෙහි දෙවියන් ගේ පරසතු රුක පහවූ කොළ ඇතිවූවාසේ වෙයි.

**9.** "මහණෙනි, යම් කලෙක ආර්‍ය්‍යශ්‍රාවකතෙම කාමයන්ගෙන් වෙන්ව (මෙහි දුතිය පණ්ණාසකයේ 6 මහාවර්ගයේ 6 සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.) ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කෙරේද, ඒ කාලයෙහි දෙවියන්ගේ පරසතු රුක දළු ලෑවාසේ වෙයි.

10 "මහණෙනි, යම් කලෙක ආය්‍ය්‍යශ්‍රාවකතෙම විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් (මෙහි ද්‍රුතිය පණ්ණාසකයේ 6 මහා වර්ගයේ 6 සූත්‍රයේ 8 ඡේදය යෙදිය යුතුයි) ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කෙරේද, ඒ කාලයෙහි දෙවියන්ගේ පරසතු රුක මැලැසි (කුඩා මොට්ටු) ඇතිවූවාසේ වෙයි

11. "මහණෙනි, යම් කලෙක ආය්‍ය්‍යශ්‍රාවකතෙම ප්‍රීතියගේ විරාගයෙන් (මෙහි ද්‍රුතිය පණ්ණාසකයේ 6 මහා වර්ගයේ 6 සූත්‍රයේ 11 (ii) ඡේදය යෙදිය යුතුයි.) තෘතීය ධ්‍යානයට පැමිණ වෙසේද ඒ කාලයෙහි දෙවියන්ගේ පරසතු රුක මේරූ මොට්ටු ඇතිවූවාසේ වෙයි.

12. "මහණෙනි, යම්කිසි කලෙක ආය්‍ය්‍යශ්‍රාවකතෙම සැපය දුරුකිරීමෙන් (මෙහි ද්‍රුතිය පණ්ණාසකයේ 6 මහා වර්ගයේ 6 සූත්‍රයේ 12 (ii) ඡේදය යෙදිය යුතුයි.) චතුර්ථ ධ්‍යානයට පැමිණ වාසය කෙරේද, ඒ කාලයෙහි දෙවියන්ගේ පරසතු රුක තැනින් තැන මල් පිපුණාසේ වෙයි

13. "මහණෙනි, යම්කලෙක ආය්‍ය්‍යශ්‍රාවකතෙම ආශ්‍රවයන්ගේ දුරුකිරීමෙන් අනාශ්‍රවවූ චිත්ත විමුක්තියද ප්‍රඥා විමුක්තියද මෙලොවම තෙමේ මනාකොට දැන ප්‍රත්‍යක්ෂකොට එයට පැමිණ වාසය කරයි. ඒ කාලයෙහි දෙවියන්ගේ පරසතු රුක ගස මුළුල්ල පිපුණාසේ වෙයි.

14. "මහණෙනි, ඒ කාලයෙහි භූමාටු දෙවියෝ (ii) මේ තෙම මෙනම් ඇති ආයුෂ්මතුන් වහන්සේ, මෙනම් ඇති ආයුෂ්මතුන් වහන්සේගේ ලඟ හැසිරෙන භික්ෂූන් වහන්සේ අසවල් ගමින් හෝ නියම්ගමින් ගිහිගෙයින් නික්ම ශාසනයෙහි පැවිදිවූයේ ආශ්‍රවයන්ගේ නැතිකිරීමෙන් ආශ්‍රව (කෙළෙස්) නැති චිත්ත විමුක්තියද ප්‍රඥා විමුක්තියද තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන මේ ආත්මභාවයෙහිම තෙමේ මනා කොට දැන එයට පැමිණ වාසය කරන්නේයයි' මහත්සේ හඬනගත්.

15. "භූමාටු දෙවියන්ගේ ශබ්දය අසා චාතුර්මහාරාජික දෙවියෝ (මෙහි 14 (ii) යෙදිය යුතුයි.) චාතුර්මහාරාජික දෙවියන්ගේ ශබ්දය අසා තවුතිසා දෙවියෝ (මෙහි 4 (ii) යෙදිය

යුතුයි.) තවුතිසා දෙවියන්ගේ හඬ අසා යාම දෙවියෝ (මෙහි 14 (ii) යෙදිය යුතුයි.) යාම දෙවියන්ගේ හඬ අසා තුසිත දෙවියෝ (මෙහි 14 (ii) යෙදිය යුතුයි.) තුසිත දෙවියන්ගේ හඬ අසා නිර්මාන රතී දෙවියෝ (මෙහි 14 (ii) යෙදිය යුතුයි.) නිර්මානරතී දෙවියන්ගේ හඬ අසා පරනිර්මිත වසවර්ති දෙවියෝ (මෙහි 14 (ii) යෙදිය යුතුයි.) පරනිර්මිත වසවර්ති දෙවියන්ගේ හඬ අසා බ්‍රහ්මකායික දෙවියෝ (මෙහි 14 (ii) යෙදිය යුතුයි.) මෙසේ ඒක්ෂණයෙන් ඒ මොහොතින් බ්‍රහ්ම ලෝකය දක්වා ශබ්දය නැඟීයයි. මේ ක්ෂීණාශ්‍රව භික්ෂූන් වහන්සේගේ ආනුභාවයයි.”

17. **සක්කාර ගරුකාර සූත්‍රයඃ-** 1. “ඉක්බිති රහසිගතව විවේකයෙහි ඇළුනාවූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මෙසේ සිතුවිල්ලක් පහළ විය. ‘භික්ෂුව කවරෙකුට වනාහි සත්කාර කොට ගරුකාර කොට ඇසුරු කොට වාසය කරන්නේ අකුසල් දුරු කරන්නේද, කුසල් වඩන්නේද? යනුවෙනි.

2 “ඉක්බිති ආයුෂ්මත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මේ අදහස විය. ‘භික්ෂුව ශාස්තෲන් වහන්සේට වනාහි (ii) සත්කාර කොට ගරුකාර කොට ආශ්‍රය කොට වාසය කරන්නේ අකුසල් දුරු කරන්නේය. කුසල් වඩන්නේය ධර්මයට වනාහි (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) සංඝයාට වනාහි (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) ශික්ෂාවට වනාහි (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) සමාධියට වනාහි (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) අප්‍රමාදයට වනාහි (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) පිළිසඳරට වනාහි භික්ෂුව සත්කාර කොට ගරුකාර කොට ආශ්‍රය කොට වාසය කරන්නේ අකුසල් දුරු කරන්නේය. කුසල් වඩන්නේය, යනුවෙනි.

3 “ඉක්බිති ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මේ අදහස විය. (ii) ‘මේ ධර්මයෝ පිරිසිදුය, බබලන සුලුය. මම භාග්‍යවතුන් වහන්සේ ළඟට ගොස් මේ ධර්මයන් කියන්නෙම් නම් ඉතා යෙහෙක යනුවෙනි. මෙසේ මේ ධර්මයෝ පිරිසිදුවූවෝ ඉතාම පිරිසිදුවූවෝ වන්නාහ. යම්සේ පුරුෂයෙක් පිරිසිදුවූ බබලන්නාවූ රන් කාසියක් ලබන්නේ නම් ඔහුට මේ අදහස වන්නේය. ‘මේ මාගේ රන් කාසිය පිරිසිදුය බබලන සුලුය, මේ

රන් කාසිය රන් කරුවකු වෙතට ගෙන ගියේ නම් පිරිසිදු වන්නේය ඉතාම පිරිසිදු වන්නේය යනුවෙනි. එපරිද්දෙන්ම මේ ධර්මයෝ පිරිසිදුය බබලන සුලුය, භාග්‍යවතුන් වහන්සේ ළඟට ගොස් මේ ධර්මයන් ප්‍රකාශ කරන්නෙම් නම් ඉතා යෙහෙක යනුවෙනි. එසේ කල්හි මේ ධර්මයෝ පිරිසිදු වූවෝ වන්නාහ. ඉතාම පිරිසිදු වූවෝ වන්නාහ.'

4. "ඉක්බිති ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සවස් වේලෙහි විවේකයෙන් නැගිටියේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියහ. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියහ. එකත්පසෙක සිටියාවූ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළහ.

"ස්වාමීනි, රහසිගතව විවේකයෙහි ඇළුනාවූ මට මෙසේ සිතිවිල්ලක් පහළවීය. 'භික්ෂුව කවරකුට වනාහි සත්කාරකොට ගරුකාර කොට ආශ්‍රය කොට වාසය කරන්නේ අකුශල් දුරු කරන්නේද කුසල් වඩන්නේද?' යනුවෙනි. ඒ මට මේ අදහස විය. භික්ෂුව ශාස්තෲන් වහන්සේට වනාහි (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) ඒ මට මේ අදහස විය. (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

5 "යහපති, ශාරීපුත්‍රය, ශාස්තෲන් වහන්සේටම වනාහි භික්ෂුව සත්කාර කොට ගරුකාර කොට ආශ්‍රය කොට වාසය කරන්නේ, අකුශල් දුරු කරන්නේය කුසල් වඩන්නේය. ශාරීපුත්‍රය, ධර්මයට වනාහි (ii) භික්ෂුව සත්කාර කරන්නේ ගරුකාර කරන්නේ ආශ්‍රය කොට වාසය කරන්නේ, අකුශල් දුරු කරන්නේය. කුසල් වඩන්නේය. (iii) ශාරීපුත්‍රය, සංඝයාට (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) ශාරීපුත්‍රය, භික්ෂුව ශික්ෂාවට (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) ශාරීපුත්‍රය, භික්ෂුව සමාධියට (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) ශාරීපුත්‍රය, භික්ෂුව අප්‍රමාදයට (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) ශාරීපුත්‍රය, භික්ෂුව පිළිසඳරට සත්කාර කරන්නේ ගරුකාර කරන්නේ අකුශල් දුරු කරන්නේය කුශල් වඩන්නේය, යනුවෙනි."

6. "මෙසේ දෙශනා කළ කල්හි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළ කළහ

"ස්වාමීනි, මම මේ කාරණයෙහි ලා භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂේපයෙන් දෙශනා කරණ ලද්දහුගේ අර්ථය මෙසේ විස්තර වශයෙන් දනිමි. ස්වාමීනි, ශාස්තෲන් වහන්සේ කෙරෙහි අගෞරව ඇති ඒ භික්ෂුතෙම ධර්මයෙහි ගෞරව ඇත්තේ යයි මේ කාරණය විද්‍යමාන නොවේ.

7. "ස්වාමීනි, යම් ඒ භික්ෂුවක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි අගෞරව ඇත්තේද, ධර්මයෙහිද අගෞරව ඇත්තේ වේ ස්වාමීනි, ශාස්තෲන් වහන්සේ කෙරෙහි අගෞරව ඇති භික්ෂුතෙම ධර්මයෙහිද සංඝයා කෙරෙහිද අගෞරව ඇත්තේවේ. (ii) ස්වාමීනි, ඒ භික්ෂුතෙම ශාස්තෲන් වහන්සේ කෙරෙහි අගෞරව ඇත්තේවේද, ධර්මය කෙරෙහි, අගෞරව ඇත්තේවේද සංඝයා කෙරෙහි අගෞරව ඇත්තේ වේද, (iii) ශික්ෂාවෙහි ගෞරව ඇත්තේයයි යන කාරණය විද්‍යමාන නොවේ. (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) ශික්ෂාවෙහිද හෙතෙමේ අගෞරව ඇත්තේවෙයි. ස්වාමීනි, (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) ශික්ෂාවෙහි අගෞරව ඇත්තේද සමාධියෙහි ගෞරව ඇත්තේයයි යන කාරණය විද්‍යමාන නොවේ.

8 "මහණෙනි, යම් ඒ භික්ෂුවක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි අගෞරව ඇත්තේද, ධර්මය කෙරෙහි අගෞරව ඇත්තේද, සංඝයා කෙරෙහි අගෞරව ඇත්තේද, ශික්ෂාවෙහි අගෞරව ඇත්තේද, (ii) සමාධියෙහිද හෙතෙම ගෞරව නැත්තේ වේ. (මෙහි 8 (i) යෙදිය යුතුයි.) හෙතෙම අප්‍රමාදයෙහි ගෞරව ඇත්තේය යන කාරණය විද්‍යමාන නොවේ. (මෙහි 8 (i) යෙදිය යුතුයි.) අප්‍රමාදයෙහිද හෙතෙම අගෞරව ඇත්තේවේ.

9 (මෙහි 8 (i) යෙදිය යුතුයි.) අප්‍රමාදයෙහි අගෞරව ඇත්තේ වේ. පිළිසඳරෙහි ගෞරව සහිත වන්නේය යන කාරණය විද්‍යමාන නොවේ. (මෙහි 8 (i) යෙදිය යුතුයි.)

10. "ස්වාමීනි, ඒ මහණතෙම, ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව ඇත්තේ වේද, හෙතෙම ධර්මය කෙරෙහි අගෞරව නැත්තේ යයි යන කාරණය විද්‍යමාන නොවේ. මහණෙනි, (ii) යම් ඒ මහණතෙම ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව ඇත්තේ වේද, (iii) හෙතෙම ධර්මයෙහිද ගෞරව ඇත්තේවේ.

(මෙහි 10 (ii) යෙදිය යුතුයි.) ධර්මය කෙරෙහි ගෞරව ඇත්තේද හෙතෙම සංඝයා කෙරෙහි ගෞරව නැත්තේය යන කාරණය විද්‍යමාන නොවේ.

11 (i) "ස්වාමීනි, යම් ඒ මහණතෙම ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරව ඇත්තේද, ධර්මය කෙරෙහි ගෞරව ඇත්තේද, (ii) සංඝයා කෙරෙහිද ගෞරව ඇත්තේවේ. (මෙහි 11 (ii) යෙදිය යුතුයි.) සංඝයා කෙරෙහිද ගෞරව ඇත්තේද, ශික්ෂාව කෙරෙහි ගෞරව නැත්තේය යන කාරණය විද්‍යමාන නොවේ.

12. (i) "ස්වාමීනි, යම් ඒ මහණතෙම ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරව ඇත්තේවේද ධර්මය කෙරෙහිද ගෞරව ඇත්තේවේද සංඝයා කෙරෙහිද ගෞරව ඇත්තේ වේද (ii) ශික්ෂාව කෙරෙහිද ගෞරව ඇත්තේවේ. (මෙහි 12 (i) යෙදිය යුතුයි. ශික්ෂාව කෙරෙහිද ගෞරව ඇත්තේ සමාධිය කෙරෙහි ගෞරවය නැත්තේය යන කාරණය විද්‍යමානනොවේ.

13. (i) (මෙහි 10 (i) යෙදිය යුතුයි.) ශික්ෂාව කෙරෙහි ගෞරව ඇත්තේ සමාධියෙහිද ගෞරව ඇත්තේවේ. (ii) (මෙහි 13 (i) යෙදිය යුතුයි.) සමාධියෙහිද ගෞරව ඇත්තේ වේ. අප්‍රමාදයෙහි ගෞරව නැත්තේය යන කාරණය විද්‍යමාන නොවේ.

14. (මෙහි 13 (i) යෙදිය යුතුයි.) හෙතෙම අප්‍රමාදයෙහිද ගෞරව ඇත්තේ වේ. (මෙහි 13 (i) යෙදිය යුතුයි.) අප්‍රමාදයෙහිද ගෞරව ඇත්තේවේ පිළිසඳරෙහි ගෞරව නැත්තේය යන කාරණය විද්‍යමාන නොවේ.

15 "(මෙහි 13 (i) යෙදිය යුතුයි.) සමාධියෙහි ගෞරව ඇත්තේවේද, පිළිසඳරෙහි ගෞරව ඇත්තේවේ.

16 'ස්වාමීනි, මේ කාරණයෙහිලා භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂේපයෙන් දෙශනා කරණ ලද්දහුගේ මෙසේ විස්තර වශයෙන් අර්ථය දනිමියි" (ප්‍රකාශ කළහ)

17. "යහපති, යහපති, ශාරීපුත්‍රය, ඔබ මේ කාරණයෙහිලා මවිසින් සංක්ෂේපයෙන් දෙශනා කරණ ලද්දහුගේ අර්ථය විස්තර වශයෙන් දැනගත්තෙහිය, එය ඉතා යහපත් වේ.

18 "ශාරීපුත්‍රය, ඒ භික්ෂු තෙම ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව නැත්තේ ද, ධර්මයෙහි ගෞරව ඇත්තේය යන කාරණය විද්‍යමාන නොවේ.

ශාරීපුත්‍රය, යම් ඒ මහණ තෙම ශාස්තෲන් වහන්සේ කෙරෙහි අගෞරව ඇත්තේ ද, හෙතෙම ධර්මයෙහි ද අගෞරව ඇත්තේය. ශාරීපුත්‍රය යම් ඒ මහණතෙම ශාස්තෲන් වහන්සේ කෙරෙහි අගෞරව ඇත්තේ ද, ධර්මය කෙරෙහි අගෞරව ඇත්තේ ද හෙතෙම සංඝයා කෙරෙහි අගෞරව ඇත්තේ ය. ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව නැත්තේ ද, ධර්මයෙහි ගෞරව නැත්තේ ද සංඝයා කෙරෙහි ගෞරව නැත්තේ ද ශික්ෂාව කෙරෙහි ගෞරව නැත්තේ ද, ශික්ෂාවෙහි ගෞරව නැත්තේ ද, සමාධිය කෙරෙහි ගෞරවය නැත්තේ ද, අප්‍රමාදයෙහි ගෞරව නැත්තේ ද, පිළිසඳරෙහි ගෞරව ඇත්තේය යන කාරණය විද්‍යමාන නොවේ

19. "මහණෙනි, යම් ඒ භික්ෂුතෙම ශාස්තෲන්වහන්සේ කෙරෙහි ගෞරව නැත්තේ ද, ධර්මය කෙරෙහි ගෞරව නැත්තේ ද, සංඝයා කෙරෙහි ගෞරව නැත්තේ ද ශික්ෂාව කෙරෙහි ගෞරව නැත්තේ ද, සමාධියෙහි ගෞරව නැත්තේ ද, අප්‍රමාදයෙහි ගෞරව නැත්තේ ද පිළිසඳරෙහිද ගෞරව නැත්තේ වේ."

20. "මහණෙනි, යම් ඒ මහණතෙම ශාස්තෲන්වහන්සේ කෙරෙහි ගෞරව ඇත්තේ ද ධර්මයකෙරෙහි, ගෞරව නැත්තේය යන කාරණය විද්‍යමාන නොවේ. ශාරීපුත්‍රය, යම් ඒ මහණතෙම ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව ඇත්තේද හෙතෙම ධර්මයෙහිද ගෞරව ඇත්තේ වේ. සංඝයා කෙරෙහි ගෞරව නැත්තේය යන කාරණය විද්‍යමාන නොවේ.

21. "ශාරීපුත්‍රය, යම් ඒ මහණතෙම ශාස්තෲන්වහන්සේ කෙරෙහි ගෞරව ඇත්තේය ධර්මය කෙරෙහි ගෞරව ඇත්තේ ය. සංඝයා කෙරෙහි ගෞරව ඇත්තේ ය. (ii) ශික්ෂාව කෙරෙහි ගෞරව ඇත්තේය යන කාරණය විද්‍යමාන නොවේ (මෙහි 21 (i) යෙදිය යුතුයි.) සංඝයා කෙරෙහිද, ශික්ෂාව කෙරෙහි ගෞරව

ඇත්තේ සමාධිය කෙරෙහි ගෞරව නැත්තේය යන කාරණය විද්‍යමාන නොවේ.

22. (මෙහි 21 (i) යෙදිය යුතුයි.) ශික්ෂාව කෙරෙහි ගෞරව ඇත්තේ සමාධිය කෙරෙහි ගෞරව ඇත්තේ, අප්‍රමාදය කෙරෙහි ගෞරවනැත්තේය යන කාරණය විද්‍යමාන නොවේ.

23. (මෙහි 21 (i) යෙදිය යුතුයි.) සමාධිය කෙරෙහි ගෞරව ඇත්තේ ශික්ෂාව කෙරෙහි ගෞරව ඇත්තේ අප්‍රමාදය කෙරෙහි ගෞරව ඇත්තේ (ii හෙතෙම පිළිසඳරෙහි ගෞරව නැත්තේය යන කාරණය විද්‍යමාන නොවේ.

24. (මෙහි 23 (i) යෙදිය යුතුයි.) "පිළිසඳරෙහිද හෙතෙම ගෞරව ඇත්තේ වේ. ශාරිපුත්‍රය, මා විසින් මේ කාරණයෙහි ලා දෙශනා කරණ ලද්දහුගේ මෙසේ විස්තර වශයෙන් අර්ථය දත යුතුය."

18. **භාවනානුයුත්ත සූත්‍රයඃ-** 1. "මහණෙනි, භාවනාවෙහි නොයෙදී වාසය කරන්නාවූ භික්ෂුවට මෙසේ කිසියම් අදහසක් උපදනේය, (එනම්) 'ආශ්‍රවයන්ගෙන් දැඩිව නොගෙන මාගේ සිත මිදෙන්නේ නම් යෙහෙක (යනුවෙනි) ඉක්බිති ඔහුගේ ආශ්‍රවයන්ගෙන් දැඩිව නොගෙන සිත නොමිදේමය. එයට හේතු කවරේද? නොවඩන ලද බැවිනැයි කියයුතු වන්නේය. කවරකගේ නොවැඩීමෙන්ද?

2 "සතර සතිපට්ඨානයෙන්ද, සතර සම්‍යක් ප්‍රධානයන්ගේද, සතර ඍද්ධිපාදයන්ගේද, පඤ්චෙන්ද්‍රියයන්ගේද, පංචබලයන්ගේද, සප්තබොධ්‍යංගයන්ගේද, ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයාගේද (නොවැඩීමෙනි.)

3 "මහණෙනි (i) අටක් හෝ දශයක් හෝ දොළසක් හෝ බිජුවට වෙද්ද ඒවා කිකිළිය මනා කොට එහි සයනය කොට නොරකින ලද්දේද, මනාකොට උණුසුම් කරණ ලද්දේ නොවේද, මනාකොට පරිහරණය කරන ලද්දේ නොවේද, මෙසේ ඒ කිකිළියට යම්කිසි අදහසක් වන්නේය. (ii) (එනම්) මාගේ කුකුළු පැටව් පා නිය අගින් හෝ හොට තුඩින් හෝ බිජුවටය පලාගෙන

සුවසේ උපදනේ නම් යෙහෙක' (යනුවෙනි.) එසේ නමුදු ඒ කුකුළු පැටව් පා නිය අගින් හෝ හොට තුඩින් හෝ බිජුවටය පලාගෙන සුවසේ උපදින්ට නුසුදුසුමය, එයට හේතු කවරේද? (iii) මහණෙනි, ඒ එසේමය, ඒ කිකිළියගේ බිජුවට මනාකොට එය මත ලැග නොරක්කාහු වෙති. මනාකොට උණුසුම් නොකරණ ලද්දාහු වෙති, මනාකොට පරිහරණය නොකරණ ලද්දාහු වෙති.

4 "මහණෙනි, එපරිද්දෙන් ම භාවනාවෙහි නොයෙදෙමින් වාසය කරන්නාවූ භික්ෂුවට මෙසේ කිසියම් අදහසක් උපදනේය. (එනම්) 'ආශ්‍රවයන්ගෙන් දැඩිව නොගෙන මාගේ සිත මිදෙන්නේ නම් අනේ යෙහෙක' (යනුවෙනි) එසේ නමුත් ඔහුගේ සිත ආශ්‍රවයන්ගෙන් දැඩිව නොගෙන නොමිදෙන්නේය, එයට හේතු කවරේද? ඔහු විසින් නොවඩනලද බැවිනැයි කියයුතුය, කවරක් නොවඩන බැවින්ද (මෙහි 2 ඡේදය යෙදිය යුතුයි.)

5 "මහණෙනි, භාවනාවෙහි යෙදෙමින් වාසය කරන්නාවූ භික්ෂුවට මෙසේ කිසියම් අදහසක් නූපදනේද, 'මාගේ සිත දැඩිව නොගෙන ආශ්‍රවයන්ගෙන් මිදෙන්නේ නම් යෙහෙක' (යනුවෙනි) ඉක්බිති ඔහුගේ සිත ආශ්‍රවයන් දැඩිව නොගෙන මිදෙන්නේය. ඊට හේතු කවරේද? (ii) වඩන ලද බැවිනැයි කියයුතුය. කුමක් වඩන ලද බැවින්ද (මෙහි 2 ඡේදය යෙදිය යුතුයි.)

6 "මහණෙනි, යම්සේ කිකිළියගේ බිජුවට අටක් හෝ දශයක් හෝ දොළසක් හෝ වෙද්ද ඒවා කිකිළිය විසින් එහි මත ලැග රක්කාහු මනාකොට උණුසුම් කරණ ලද්දාහු මනාකොට පරිහරණය කරණ ලද්දාහු වෙති. ඒ කිකිළියට කිසියම් මෙබඳු අදහසක් නූපදනේය (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, කිකිළියගේ බිජුවට එහි මත ලැග රකින ලද්දාහු උණුසුම් කරණ ලද්දාහු මනාකොට පරිහරණය කරණ ලද්දාහු වෙති.

7 (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) එසේ නමුත් ඔහුගේ සිත වඩන ලද බැවිනැයි කිය යුතුයි කුමක් වඩන ලද බැවින්ද (මෙහි 2 ඡේදය යෙදිය යුතුයි)

8 "මහණෙනි, යම්සේ ලී අසින්නාට හෝ ඔහුගේ අත වැස්සාට හෝ වෑමිට පෙනේමය ඇඟිලි ලකුණු පෙනේමය ඔහුට මෙබඳු ඥානයක් නොවෙයි (එනම්) අද මෙපමණ වෑමිට ගෙවුණේ විය. ඊයේ මෙපමණය පෙරේදා මෙපමණය. ඉක්බිති ඔහුට ගෙවුණෙහි ගෙවුණේයයි ඥානය ඇතිවෙයි.

9 "මහණෙනි, එපරිද්දෙන්ම භාවනාවෙහි යෙදෙමින් වෙසෙන්නාවූ භික්ෂුවට කිසියම් මෙබඳු ඥානයක් නොවෙයි අද මෙපමණ මාගේ ආශ්‍රවයෝ ක්ෂයවූහ. ඊයේ මෙපමණකින්ය. පෙරේදා මෙපමණකින්ය. ඉක්බිති ඔහුට ක්ෂයවූවෙහි ක්ෂයවූයේය යන ඥානය වෙයි. මහණෙනි යම්සේ සමසක් ජලයෙන් වටව තිබුණ හෙමන්ත කාලයෙහි ගොඩතබන ලද වේවැල් වලින් බඳින ලද මුහුදු නැව අවු සුළං වැදුණේ මනා කොට වැසිකාලයෙහි මහා මෙඝයෙන් තෙමුණේ පහසුවෙන්ම ඒ බැඳුම් නැතිවී යත්, කුණු වෙත්. මහණෙනි, එපරිද්දෙන්ම භාවනාවෙහි යෙදුන භික්ෂුවට පහසුවෙන්ම සංයෝජනයන් නැතිවෙත්. කුණුවී යත්."

**19. අග්ගික්ඛන්ධොපම සූත්‍රයː-** 1. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මහත්වූ භික්ෂු සංඝයා සමග කොසොල් රට සැරිසරණසේක. දුර මගට පිළිපන් භාග්‍යවතුන් වහන්සේ එක්තරා පෙදෙසක දැල්වුණ මනාව ගිනිගත් ගින්නෙන් බබලන මහත්වූ ගිනි කඳක් දැක මගින් ඉවත්ව එක්තරා ගසක් මුල පැනවූ අස්නෙහි වැඩසිටිසේක. වැඩහිඳ වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක.

2. "මහණෙනි, දැල්වුණ මනාව ගිනිගත් දැල්ලෙන් බබලන අර මහා ගිනිකඳ දැක්කහුද?" "එසේය, ස්වාමීනි"

"මහණෙනි, කුමක් සිතන්නහුද? අර දැල්වුන මනාව ගිනිගත් දැල්ලෙන් බබලන මහත්වූ ගිනිකඳ වැළඳගෙන හිඳගන්නේ නම් හෝ නිදන්නේ නම් හෝ යම් ඒ මෘදුවූ තරුණවූ අත් පා ඇති ක්ෂත්‍රිය කන්‍යාවක් හෝ බ්‍රාහ්මණ කන්‍යාවක් හෝ ගෘහපති කන්‍යාවක් හෝ වැළඳගෙන හිඳ ගන්නේ නම් හෝ නිදන්නේ නම් හෝ මේ දෙකින් කුමක් උතුම්වේද?"

3 "ස්වාමීනි, මෘදුවූ තරුණ වූ අත් පා ඇති ක්ෂත්‍රිය කන්‍යාවක් හෝ බ්‍රාහ්මණ කන්‍යාවක් හෝ ගෘහපති කන්‍යාවක් හෝ වැළඳගෙන හිඳගන්නේ නම් හෝ නිදන්නේ නම් හෝ එයම උතුම්. ස්වාමීනි, අර මනාව ගිනිගත් ගින්නෙන් බබලන මහත්වූ ගිනි කඳක් වැළඳගෙන හිඳින්නේ නම් හෝ නිදන්නේ නම් හෝ ස්වාමීනි, එය දුකක් වේමය.

4 "මහණෙනි, යුෂ්මතුන්ට දන්වමි ප්‍රකාශ කරමි (ii) දුශ්ශීලවූ පාප ධර්ම ඇති කැතකුණුවලින් පිරි කසල ගොඩක් සමානවූ සැඟවී වැරදි වැඩ කරණ ශ්‍රමණයයි අඟවන අශ්‍රමණවූ බ්‍රහ්මචාරී යයි අඟවන බ්‍රහ්මචාරී නොවූ ඇතුළත කුණුවූ, වැගිරෙන, කසල හටගත් ඒ දුසිල් මහණහුට (iii) ඒ ගිනිකඳ වැළඳගැනීම මැනවි. එයට හේතු කවරේද? (iv) ඒ හේතුකොට ගෙන ඔහුට මරණය හෝ ඒ සමාන දුකක් හෝ වන්නේය. ඒහේතුවෙන් කායයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් තොරවූ අයහපත් ගති ඇති නරකයෙහි නූපදනේය.

5 (i) "මහණෙනි, යම් හෙයකින් දුශ්ශීලවූ පාපධර්ම ඇති කැතකුණු පිරි කසලගොඩක් සමානවූ සැඟවී කරණ වැරදි වැඩ ඇති ශ්‍රමණ යයි අඟවන අශ්‍රමණවූ බ්‍රහ්මචාරීයයි අඟවන බ්‍රහ්මචාරී නොවූ ඇතුළත කුණුවූ වැගිරෙන කසල හටගත් ඒ දුසිල් මහණතෙම (ii) මෘදුවූ තරුණවූ අත් පා ඇති ක්ෂත්‍රිය කන්‍යාවක් හෝ බ්‍රාහ්මණ කන්‍යාවක් හෝ ගෘහපති කන්‍යාවක් හෝ වැළඳගෙන හිඳගන්නේ නම් හෝ නිදන්නේ නම් හෝ මහණෙනි, (iii) ඒ හේතුවෙන් ඔහුට දිගු කලක් අහිත පිණිස දුක් පිණිස වන්නේය. කායයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ අයහපත් ගති ඇති නපුරු සේ පතිතවන නරකයෙහි උපදනේය.

6 "මහණෙනි, කුමකැයි සිතන්නෙහිද? (i) ශක්තිමත් පුරුෂයෙක් දැඩිවූ කෙඳි කඹයකින් කෙණ්ඩා දෙක වෙලා එකට ගටන්නේද, එයින් සිවිය සිඳෙන්නේය. සිවිය සිඳී සම සිඳෙන්නේය. සම සිඳී මස් සිඳෙන්නේය. මස් සිඳී නහර සිඳෙන්නේය නහර සිඳී ඇට සිඳෙන්නේය. ඇටමිදුළු පැතිර

සිටිනේය. (ii) මහණෙනි, (iii) යම් ඒ ක්ෂත්‍රිය මහා සාරයන්ගේ හෝ බ්‍රාහ්මණ මහා සාරයන්ගේ හෝ ගෘහපති මහා සාරයන්ගේ හෝ වැඳීම ඉවසන්නේද (iv) මේ දෙකින් කුමක් උතුම්ද? "ස්වාමීනි, (මෙහි 6 (iii) යෙදිය යුතුයි.) එය උතුම්. ස්වාමීනි, (මෙහි 6 (i) යෙදිය යුතුයි.) එය දුක්වන්නේය.

7. "මහණෙනි, යුෂ්මතුන්ට දන්වන්නෙමි. ප්‍රකාශ කරන්නෙමි (මෙහි 4 (ii) සහ 6 (i) යෙදිය යුතුයි.) මහණෙනි, එයට හේතු කවරේද (මෙහි 4 (iv) යෙදිය යුතුයි.)

8 (මෙහි 5 (i) යෙදිය යුතුයි.) (ii) මහණහුට භික්ෂු තෙමේ ක්ෂත්‍රිය මහා ස්ථවිරයන්ගේ හෝ බ්‍රාහ්මණ මහා සාරයන්ගේ හෝ ගෘහපති මහා සාරයන්ගේ හෝ වැඳීම ඉවසාද (මෙහි 5 (iii) ඡේදය යෙදිය යුතුයි.)

9 "මහණෙනි, කුමක් සිතන්නෙහිද යම් (ii) ඒ බලවත් පුරුෂයෙක් තෙලින් සෝධන ලද මුවහත් ආයුධයකින් පපුවෙහි පෙදෙසට පහර දෙන්නේ නම් (iii) (එය හෝ) (මෙහි 8 (ii) යෙදිය යුතුයි.) මේ දෙකින් කුමක් උතුම්ද?" "ස්වාමීනි, (මෙහි 8 (ii) යෙදිය යුතුයි.) එය උතුම්.

10 (i) "මහණෙනි, යුෂ්මතුන්ට දන්වන්නෙමි, යුෂ්මතුන්ට ප්‍රකාශ කරන්නෙමි. (ii) මෙහි 4 (ii) සහ 9 (ii) යෙදිය යුතුයි.) එය ඉවසීම උතුම්වේ. එයට හේතු කවරේද? (මෙහි 4 (iv) සහ 5 (i) ද, 6 (iii) ද, 8 (iii) ද යෙදිය යුතුයි.)

11. "මහණෙනි, (i) යම් ඒ ශක්තිමත් පුරුෂයෙක් රත්වූ ගිනිගත් දැල්වෙන්නාවූ ගින්නෙන් බබලන්නාවූ යකඩ පට්ටයකින් ශරීරය වෙළන්නේද (එය හෝ) (ii) ක්ෂත්‍රිය මහා සාරයන්ගේ හෝ බ්‍රාහ්මණ මහා සාරයන්ගේ හෝ ගෘහපති මහාසාරයන්ගේ හෝ ශ්‍රද්ධාවෙන් දුන් සිවුරු පරිභොග කරන්නේ නම් (iii) මේ දෙකින් කුමක් උතුම් වන්නේද?" "ස්වාමීනි, (මෙහි 10 (ii) යෙදිය යුතුයි.) එයම උතුම් වන්නේය (මෙහි 10 (i) යෙදිය යුතුයි වෙළන්නේ නම් එය දුක්වන්නේය.

12. "මහණෙනි, යුෂ්මතුන්ට දන්වන්නෙමි. යුෂ්මතුන්ට ප්‍රකාශ කරන්නෙමි. (මෙහි 4 (iv) සහ 10 (i) යෙදිය යුතුයි.)

එයම උතුම්වේ. එයට හේතු කවරේද? මහණෙනි, (මෙහි 4 (iv) සහ 5 (i) ද, 10 (ii) ද, 8 (iii) ද යෙදිය යුතුයි.)

12. "මහණෙනි, කුමකැයි සිතන්නෙහිද? (ii) යම් ඒ ශක්තිමත් පුරුෂයෙක් රත්වූ ගිනිගත් මනාව ගිනි ඇවුළුනාවූ ගින්නෙන් බබලන්නාවූ යකඩ හුලකින් කට අරවා රත්වූ ගිනි ගත් මනාව ගිනි ඇවුළුණාවූ ඒ ලෝහෝ ගුලිය මුඛයෙහි බහන්නේද එය ඔහුගේ තොල්ද දවන්නේය. මුඛයද දවන්නේය. දිවද දවන්නේය. කණද දවන්නේය, පපුවද දවන්නේය. අතුනුද අතුනු බහන්ද රැගෙන අධොභාගයෙන් නික්මෙන්නේය. (එය හෝ) (iii) යම් ඒ ක්ෂත්‍රිය මහාසාරයන්ගේ හෝ බ්‍රාහ්මණ මහාසාරයන්ගේ හෝ ශ්‍රද්ධාවෙන් දුන් පිණ්ඩපාතය පරිභොග කරන්නේද, (iv) මේ දෙකින් කුමක් උතුම්ද?" "ස්වාමීනි, (මෙහි 12 (iii) යෙදිය යුතුයි.) එය උතුම් වේ. (මෙහි 12 (ii) යෙදිය යුතුයි.) ස්වාමීනි, එය දුකට හේතුවේ.

13. "මහණෙනි, යුෂ්මතුන්ට දන්වන්නෙමි. යුෂ්මතුන්ට ප්‍රකාශකරන්නෙමි. (මෙහි 4 (ii) සහ 12 (ii) යෙදිය යුතුයි.) උතුම් වන්නේය. එයට හේතු කවරේද? (මෙහි 4 (iv) ද, 5 (i) ද, 12 (ii) ද, 12 (iii) ද, 8 (iii) ද, යෙදිය යුතුයි.)

14. "මහණෙනි, (ii) යම් බලවත් පුරුෂයෙක් හිසින් හෝ අල්ලා කඳින් හෝ අල්ලා රත්වූ ගිනිගත් මනාකොට ගිනිදැල්වුණු යකඩ ඇඳක හෝ යකඩ පුටුවක හෝ වාඩිකර වන්නේද, නිදිකරවන්නේද (එය හෝ) (iii) ක්ෂත්‍රිය මහා සාරයන් හෝ බ්‍රාහ්මණ මහාසාරයන් හෝ ගෘහපති මහාසාරයන් හෝ විසින් හෝ ශ්‍රද්ධාවෙන් දෙනලද ඇඳපුටු පරිභොග කෙරේ නම් හෝ (iv) මේ දෙකින් කුමක් උතුම්වේද?" "ස්වාමීනි, (මෙහි 14 (ii) සහ 14 (iii) යෙදිය යුතුයි. එය උතුම් වේ. (මෙහි 14 (ii) යෙදිය යුතුයි.) එය දුක් වන්නේය.

15. "මහණෙනි, යුෂ්මතුන්ට දන්වන්නෙමි. යුෂ්මතුන්ට ප්‍රකාශ කරන්නෙමි. (මෙහි 14 (ii) යෙදිය යුතුයි.) උතුම් වේ. මහණෙනි, එයට හේතු කවරේද? (මෙහි 4 (iv) යෙදිය යුතුයි.)

(මෙහි 5 (i) සහ 14 (iii) ද, 8 (iii) ද, 4 (ii) ද, 4 (iii) ද, 5 (iii) ද යෙදිය යුතුයි.)

16. "මහණෙනි, කුමකැයි සිතන්නෙහිද (ii) යම් බලවත් පුරුෂයෙක් පා උඩුකුරුකොට හිස යටිකුරුකොට අල්වා ගිනිගත් මනාකොට ගිනි ඇවුළුණ ගින්නෙන් දිලිසෙන ලොහෝ සැළියක බහාලන්නේද, හෙතෙම එහි පෙණ දමමින් පැසෙන්නේ වරක් මතුවන්නේය. වරක් යටයන්නේය. වරක් සරසට යන්නේය. එය හෝ (iii) යම් ක්ෂත්‍රිය මහාසාරයන් හෝ බ්‍රාහ්මණ මහාසාරයන් හෝ ගෘහපති මහාසාරයන් හෝ ශ්‍රද්ධාවෙන් දුන් විහාරය පරිභොග කෙරේද, (iii) මේ දෙකින් කුමක් උතුම් වන්නේද?" "ස්වාමීනි (මෙහි 16 (iii) යෙදිය යුතුයි.) එය උතුම් වේ. (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) එය දුක් වේ

17. "මහණෙනි, යුෂ්මතුන්ට දන්වන්නෙමි. ප්‍රකාශ කරන්නෙමි (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) භික්ෂුවට එය උතුම් වේ. එයට හේතු කවරේද? මහණෙනි, ඒ හේතුවෙන් ඔහුට මරණය වන්නේය මරණය සමාන දුකක් හෝ වන්නේය. ඒ හේතුවෙන් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ අයහපත් ගති ඇති නපුරුසේ පතිතවන නරකයෙහි නූපදින්නේය. (මෙහි 4 (ii) ජේදය යෙදිය යුතුයි.) භික්ෂුතෙම ක්ෂත්‍රිය මහාසාරයන්ගේ හෝ ශ්‍රද්ධාවෙන් දෙන විහාරය පරිභොග කෙරේද? මහණෙනි, එය ඔහුට දිගු කලක් අහිත පිණිස දුක් පිණිස වන්නේය. කය බිඳී මරණින් පසු සැප නැත්තාවූ නරක ගතිය නම්වූ විශෙෂයෙන් ඇදවැටෙන්නාවූ නරකයෙහි උපදනේය.

18. "මහණෙනි, එහෙයින් මෙහිලා මෙසේ හික්මිය යුතුයි අපි යම් කෙනෙකුන්ගේ සිවුරු පිණ්ඩාහාර සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර පරිභොග කෙරේනම්, ඔවුන්ගේ ඒ දීම මහත්ඵල වන්නේය. මහානිශංස වන්නේය. අපගේද පැවිද්ද ඵල රහිත නොවන්නේය. සම්පූර්ණ වන්නේය. මහණෙනි, යුෂ්මතුන් විසින් මෙසේ හික්මිය යුතුයි.

19 "තමා දෙස බැලීමෙන් අප්‍රමාදව සම්පාදනය කරන්නට සුදුසුය. අනුන්ගේ අර්ථය හෝ බැලීමෙන් අප්‍රමාදව සම්පාදනය කරන්නට සුදුසුය. මහණෙනි, උභයාර්ථයම හෝ බලමින් අප්‍රමාදව සම්පාදනය කරන්නට සුදුසුය.'

20 "භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය දෙශනා කළ සේක. මේ ධර්මය දෙශනා කරණ කල්හි සැටක් පමණ භික්ෂූන්ගේ මුඛ වලින් උණුලේ වමනය විය. "ස්වාමීනි, දුෂ්කරය, බොහෝ දුෂ්කරයයි" සැටක් පමණ භික්ෂූහු ගිහිවූහ. සැටක් පමණ භික්ෂූන්ගේ දැඩිව නොගෙන ආශ්‍රවයන්ගෙන් සිත මිදුණාහ (රහත්වූහ.)"

**20 සුනෙත්ත සූත්‍රයඃ-** 1 "මහණෙනි, පෙර වනාහි කාමයන්හි වීතරාග ඇති තීර්ථක නායකවූ සුනෙත්ත නම් ශාස්තෘවරයෙක් විය. මහණෙනි, සුනෙත්ත ශාස්තෘවරයාට බොහෝ සිය ගණන් ශ්‍රාවකයෝ වූහ. සුනෙත්ත ශාස්තෘ තෙමේ බ්‍රහ්ම ලොක ගමන පිණිස ශ්‍රාවකයන්ට ධර්මය දෙශනා කළේය. සුනෙත්ත ශාස්තෘවරයා එසේ ධර්මය දෙශනා කරද්දී යම් කෙනෙකුගේ සිත් නොපැහැදුණේද, ඔවුහු කායයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ අයහපත් ගති ඇති නපුරුසේ පතිතවන නරකයෙහි උපන්හ. මහණෙනි සුනෙත්ත ශාස්තෘවරයා ධර්මය දෙශනා කරද්දී යමෙකුගේ සිත් පැහැදුනේද ඔවුහු කායයාගේ බිඳීමෙන් මරණින් මතු සුගති නම්වූ ස්වර්ග ලොකයෙහි උපන්හ."

2 "මහණෙනි, පෙර මූගපක්ඛ නම් ශාස්තෘවරයෙක් වීය. (මෙහි මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි. සුනෙත්ත' වෙනුවට මූගපක්ඛ' යෙදිය යුතුයි)

3 (මෙහි 1 ඡේදයේ 'සුනෙත්ත' වෙනුවට 'අරණෙමි' යෙදිය යුතුයි.)

4 (මෙහි 1 ඡේදයේ 'සුනෙත්ත' වෙනුවට 'කුද්දාල' යෙදිය යුතුයි.)

5 (මෙහි 1 ඡේදයේ සුනෙත්ත වෙනුවට 'හත්ථිපාල' යෙදිය යුතුයි.)

**21. අරක සූත්‍රයඃ-** 1 "කාමයන්හි වීතරාග ඇති තීර්ථක නායකවූ අරක නම් ශාස්තෘවරයෙක් විය. (මෙහි මේ වර්ගයේ 20 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි. 'සුනෙත්ත' වෙනුවට 'අරක' යෙදිය යුතුයි.)

2 "මහණෙනි, කුමකැයි සිතන්නහුද? කාමයන්හි වීතරාග ඇති නොයෙක් සිය ගණන් ශ්‍රාවකයන් සහිත සමූහයා පිරිවැරූ තීර්ථක නායකවූ මේ සප්ත ශස්තෘවරයන් කෙරෙහි යමෙක් දුෂ්ටවූ සිතින් ආක්‍රොශ කරන්නේ නම්, බණින්නේ නම් හෙතෙම බොහෝ පව් රැස් කරන්නේද?'-'එසේය, ස්වාමීනි"

3 "මහණෙනි, යමෙක් වනාහි කාමයන්හි වීතරාගීවූ නොයෙක් සිය ගණන් ශ්‍රාවකයන් සහිත සමූහයා පිරිවැරූ තීර්ථක නායකවූ මේ සප්ත ශාස්තෘවරන්යන් කෙරෙහි දුෂ්ටවූ සිතින් ආක්‍රොශ කරන්නේ නම් බණින්නේ නම් හෙතෙම බොහෝ පව් රැස් කරන්නේය.

4 "යමෙක් එක්තරා සම්‍යක් දෘෂ්ටියෙන් යුත් පුද්ගලයෙකුට ආක්‍රොශ කරන්නේ නම් බණින්නේ නම් මේ තෙමේ එයට වඩා බොහෝ පව් රැස් කරන්නේය. එයට හේතු කවරේද? යම්සේ මාගේ සබ්‍රහ්මචාරීන් කෙරෙහි මෙන් මේ ශාසනයෙන් අන්‍යවූවන් කෙරෙහි මෙබඳුවූ ඉවසීමක් මම නොකියමි. මහණෙනි, එහෙයින් මෙහිලා හික්මිය යුතුය. මාගේ සබ්‍රහ්මචාරීන් කෙරෙහි සිත් ප්‍රදූෂ්‍ය වන්නේද කියායි. මහණෙනි, යුෂ්මතුන් විසින් මෙසේ හික්මිය යුතුය.

5 "මහණෙනි, පෙර වනාහි කාමයන්හි වීතරාග ඇති තීර්ථක නායකවූ අරක නම් ශාස්තෘවරයෙක් විය මහණෙනි, අරක ශාස්තෘවරයාට නොයෙක් සිය ගණන් ශ්‍රාවකයෝ වූහ. අරක ශාස්තෘතෙම ශ්‍රාවකයන්ට මෙසේ ධර්මය දෙශනාකළේය බ්‍රාහ්මණයෙනි, මිනිසුන්ගේ ජීවිතය (ii) ස්වල්පය, ස්වල්ප කලක් පවත්නේය. බොහෝ දුක් ඇත්තේය. බොහෝ සිත් තැවුල් වලින් යුක්තයයි දැන අවබොධ කටයුතුයි. කුශල් කටයුතුය. බඹසර හැසිරිය යුතුය. උපන්නහුට නොමැරීමක් නැත.

6 "බ්‍රාහ්මණයෙනි, යම්සේ තණ අග පිනිබිඳ හිරු නැගෙන කල්හි වියලීයේද, ස්ථිරව නොපිහිටියේ වේද, එපරිද්දෙන්ම බ්‍රාහ්මණයෙනි, මිනිසුන්ගේ ජීවිතය තණ අග පිනිබිඳ සමානය. (ii) (මෙහි 5 (ii) යෙදිය යුතුයි.

7 "බ්‍රාහ්මණයෙනි, යම්සේ ලොකු පොද ඇති වැස්ස වසින කල්හි ඇතිවන දිය බුබුල වහා නැති වේද, බොහෝ වේලා නොපවත්නේද, බ්‍රාහ්මණයෙනි, එපරිද්දෙන්ම මිනිසුන්ගේ මේ ජීවිතය දියබුබුලට සමානය, (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

8 "බ්‍රාහ්මණයෙනි, යම්සේ දියෙහි ඇඳි (රේඛාව) ඉර වහාම මැකීයේද, බොහෝ කල් නොපවත්නේද එපරිද්දෙන්ම බ්‍රාහ්මණයෙනි, මිනිසුන්ගේ ජීවිතය දියෙහි ඇඳි ඉරට උපමා කටයුතුය. (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

9 "බ්‍රාහ්මණයෙනි, යම්සේ පර්වතයෙන් පටන්ගත් ගඟ දුර ගමන් ඇත්තේ වහා ගමන් කරන්නේ සීඝ්‍ර සැඩපහර ඇත්තේ ක්ෂණයක් හෝ ක්ෂණ දශයක් හෝ මොහොතක් හෝ ගලා බසී නම් එය ගමන් කෙරේමය. වැහේමය, පවතීමය. බ්‍රාහ්මණයෙනි, එමෙන්ම මිනිසුන්ගේ ජීවිතය පර්වතයකින් පටන්ගන්නා ගඟකට සමානය. (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

10 "බ්‍රාහ්මණයෙනි, ශක්තිමත් පුරුෂයෙක් දිව අග කෙළපිඩක් එකතුකොට වහාම කෙළගසන්නේද, බ්‍රාහ්මණයෙනි, එමෙන්ම බ්‍රාහ්මණයෙනි, මිනිසුන්ගේ ජීවිතය කෙළපිඩක් සමානය. (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

11 "බ්‍රාහ්මණයෙනි, දවසක් ගිනියම්වූ යකඩ කබලෙහි මස් කැටියක් තබන ලද්දේ වහාම විනාශවීයේද බොහෝකල් නොපවතීද බ්‍රාහ්මණයෙනි, එපරිද්දෙන්ම මිනිසුන්ගේ ජීවිතය මස් පිඩකට උපමා ඇත්තේය. (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

12 "බ්‍රාහ්මණයෙනි, යම්සේ මරණයට නියමවූ ගවදෙන මරණ ස්ථානයට ගෙන යන කල්හි යම් යම් ඒ පාදයක් ඔසවාද මරණ ස්ථානයට ළංවේ, එහෙයින්ම මරණයටද ළංවේ. බ්‍රාහ්මණයෙනි, එපරිද්දෙන්ම මිනිසුන්ගේ ජීවිතය මරණයට ගෙන යන දෙනකට සමානය. (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

13. "එකල්හි වනාහි මිනිසුන්ට සැට දහසක් අවුරුදු ආයු ප්‍රමාණය විය. අවුරුදු පන්සියයක්වූ කුමාරිකාවෝ පුරුෂයකුට පාවාදීමට යොග්‍ය වූහ. මහණෙනි, එසමයෙහි මිනිසුන්ට ආබාධ

සයක් (පමණක්) විය. එනම්, ශීතල, උෂ්ණය, බඩගින්න, පිපාසය, මල මූ කිරීම් යනුයි. මහණෙනි, මෙසේ දීර්ඝායුෂ්කවූ මෙසේ චිරස්ථායීවූ මෙසේ අල්පාබාධවූ මිනිසුන් ඇති කල්හි ඒ අරක ශාස්තෲතෙම ශ්‍රාවකයන්ට මෙසේ ධර්මය දෙශනා කරන්නේය.

14. "බ්‍රාහ්මණයෙනි, මිනිසුන්ගේ ජීවිතය (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

15. "මහණෙනි, මේ කාලයෙහි වනාහි මිනිසුන්ගේ ජීවිතය ස්වල්පය, ස්වල්ප කාලයක් පවත්නේය. බොහෝ දුක් ඇත්තේය. බොහෝ සිත් තැවුල් ඇත්තේය. කුසල් කළ යුතුය. බඹසර හැසිරිය යුතුය. උපන්නහුට නොමැරීමක් නැත, යනු සත්‍ය ලෙසම කියන්නේය.

16. "මහණෙනි, මේ කාලයෙහි වනාහි යමෙක් බොහෝ ජීවත් වන්නේද අවුරුදු සියයක් හෝ එයට ස්වල්පයක් අඩුව හෝ වැඩිව වෙයි. මහණෙනි, අවුරුදු සියයක් ජීවත් වන්නෙක් ඍතු තුන් සියයක්ම ජීවත් වෙයි. හේමන්ත ඍතු සියයක්ද ගිම්හාන ඍතු සියයක්ද වස්සාන ඍතු සියයක්ද යන ආකාරයෙනි. මහණෙනි, ඍතු තුන් සියයක් ජීවත් වන්නෙක් මාස එක්දහස් දෙසියයක් ජීවත් වෙයි. හේමන්ත ඍතුවෙහි සාර සියයක්ද ගිම්හාන ඍතුවෙහි සාර සියයක්ද වස්සාන ඍතුවෙහි සාර සියයක්ද යන ආකාරයෙනි. මහණෙනි, මාස එක්දහස් දෙසියයක් ජීවත් වන්නෙක් අර්ධ මාස දෙදහස් සාර සියයක් ජීවත් වෙයි. හේමන්තයේ අර්ධ මාස අට සියයකි. ගිම්හානයේ අර්ධමාස අටසියයකි. වස්සානයේ අර්ධමාස අටසියයකි. වර්ෂයකට අර්ධමාස එක් දහස් දෙසියයක් ජීවත්වන්නෙක් රාත්‍රි තිස් හය දහසක් ජීවත් වෙයි. හේමන්තයේ රාත්‍රි දොළොස් දහසකි. ගිම්හානයේ රාත්‍රි දොළොස් දහසකි. වස්සානයේ රාත්‍රි දොළොස් දහසකි. මහණෙනි, රාත්‍රි තිස් හය දහසක් ජීවත් වන්නෙක් දෙසැත්තෑ දහසක් බත් (වේල්) අනුභව කරයි. හේමන්තයේ බත් වේල් විසිහතර දහසකි. ගිම්හානයේ බත් වේල් විසිහතර දහසකි. වස්සානයේ බත් වේල් විසිහතර දහසකි. මේ මවගෙන් කිරි බීමද බත් නොලැබීමද සමගමය.

එහි මේ භත්තන්තරායෝ නම් කිපියේද බත් අනුභව නොකරයි. දුක් වූයේද බත් අනුභව නොකරයි. ලෙඩවූයේද බත් අනුභව නොකරයි. උපොසථික වූයේද බත් අනුභව නොකරයි. නොලැබුනේද බත් අනුභව නොකරයි.

17. "මහණෙනි, මවිසින් මෙසේ අවුරුදු සියයක් ආයු ඇති මිනිසකුගේ ආයුෂද දක්වන ලදී. ආයු ප්‍රමාණයද දක්වන ලදී. ඍතුහුද දක්වන ලදී. සංවත්සරද දක්වන ලදී. මාසයෝද දක්වන ලදී. අර්ධ මාසයෝද දක්වන ලදී. රාත්‍රීහුද දක්වන ලදී. බත් (වේල්) ද දක්වන ලදී. භත්තන්තරායෝද (-ආහාර වැරදීම්) දක්වන ලදී. මහණෙනි, ශාස්තෲන් වහන්සේ විසින් යමක් කළයුතු නම් ශ්‍රාවකයන්ට හිත ඇතිව අනුකම්පාව උපදවා එය යුෂ්මතුනට සිදු කරණ ලදී. මහණෙනි, මේ රුක් මුල්ය, මේ ශූන්‍යාගාරයෝය, ධ්‍යාන කරව්, ප්‍රමාද නොවව්, පසුව විපිළිසර නොවව්, මෙය තොපට අපගේ අනුශාසනාවයි."

---

## 8. විනය වර්ගය.

22. **සීලවන්ත විනයධර සූත්‍රය**:- 1 මහණෙනි, ධර්ම සතකින් යුක්තවූ භික්ෂුතෙම විනයධර වෙයි. 2 "කවර සතකින්ද යත්, ඇවත දනීද, ඇවැත් නොවන දේ දනීද, ස්වල්පවූ ඇවැත් දනීද, මහා ඇවැත් දනීද, ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සංවරවූයේ සිල් ඇත්තේවේද, ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තවූයේ ස්වල්ප වරදෙහි බිය දක්නා සුළුවූයේ ශික්ෂාපදයන් සමාදන්ව හික්මෙයි. චෛතසිකයන්ගේ උසස් හික්මීමට අයත් මෙලොව සැප විහරණය ඇති සතර ධ්‍යානයන්ගේ පහසුවෙන් ලැබීම වෙයි. නිදුකින් ලැබීම වෙයි. පහසුවෙන් ලැබීම වෙයි. ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන් ආනාශ්‍රවවූ චිත්ත විමුක්තියද ප්‍රඥා විමුක්තියද මෙලොවම තෙමේ මනාකොට දැන ප්‍රත්‍යක්ෂකොට එයට පැමිණ වාසය කරයි.

3. (මෙය 1 ඡේදය මෙනි)

**23. ස්වාගත විනයධර සූත්‍රය**:- 1 (මේ ඡේදය මේ වර්ගයේ 22 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2 "කවර සතකින්දයත් (ii) ඇවත දනීද, ඇවැත් නොවන දේ දනීද, (iii) ස්වල්පවූ ඇවැත් දනීද, මහා ඇවැත් දනීද, උභය (භික්ෂු භික්ෂුණී) ප්‍රාතිමොක්ෂයන් සූත්‍ර වශයෙන් අනුව්‍යඤ්ජන වශයෙන් මනාකොට නිශ්චයවූයේ ප්‍රගුණවූයේ වේ ද චෛතසිකයන්ගේ උසස් හික්මීම ඇති, මෙලොව සුව විහරණය ඇති සතර ධ්‍යානයන් පහසුවෙන් ලබන්නේ නිදුකින් ලබන්නේ මද උත්සාහයෙන් ලබන්නේ ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන් අනාශ්‍රවවූ චිත්ත විමුක්තියද ප්‍රඥා විමුක්තියද මෙලොවම තෙමේ මනාකොට දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාසය කරයි, (v) (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

**24 අසංහීර සූත්‍රය**:- 1. (මේ ඡේදය මේ වර්ගයේ 22 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. "කවර සතකින් ද යත්? (ii) ඇවැත දනියි, ඇවැත් නොවන දේ දනියි, ස්වල්ප ඇවැත් දනියි, මහා ඇවැත් දනියි, විනයෙහි ස්ථිරව පිහිටියේ වෙයි, (iii) චෛතසිකයන්ගේ මනා හික්මීම ඇති මෙලොවම සුව විහරණ ඇති සතර ධ්‍යානයන් මද උත්සාහයෙන්, නිදුකින් පහසුවෙන් ලබන්නේ වෙයි, ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන් අනාශ්‍රව වූ චිත්ත විමුක්තිය ද ප්‍රඥා විමුක්තිය ද, මෙලොවම තෙමේ මනාකොට දැන ප්‍රත්‍යක්ෂකොට එයට පැමිණ වාසය කරයි, (මෙහි මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

3. "කවර සතක් ද යත්, ඇවත දනියි. ඇවැත් නොවන දේ දනියි. ස්වල්ප ඇවැත් දනියි, මහා ඇවැත් දනියි, නන්වැදෑරුම් පූර්වෙනිවාසය සිහිකරයි, කෙසේද? පිරිසිදුවූ මනුෂ්‍යත්වය ඉක්මවූ දිව ඇසින් චුතවන්නාවූද, උපදින්නාවූද, හීනවූද, ප්‍රණීතවූද, මනාපැහැ ඇත්තාවූද, දුර්වර්ණවූද, සැපයට පැමිණියාවූද, දුකට පැමිණියාවූද, සත්වයන් දකියි. කර්මය ලෙස එළඹෙන්නාවූ සත්වයන් දකියි. ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන් අනාශ්‍රවවූ චිත්ත විමුක්තියද ප්‍රඥා විමුක්තියද මෙලොවම තෙමේ මනාකොට දැන ප්‍රත්‍යක්ෂකොට එයට පැමිණ වාසය කරයි, (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**25. පුබ්බෙනිවාසලාභී විනයධර සූත්‍රය:-** 1 "මහණෙනි, ධර්ම සතකින් යුක්තවූ භික්ෂුතෙම විනයධර වූයේ බබළයි.

2 (1) "කවර ධර්ම සතකින්දයත් ඇවත දනියි. ඇවැත් නොවන දේ දනියි, ස්වල්ප ඇවැත් දනියි, මහා ඇවැත් දනියි, ශික්ෂාපදයන් සමාදන්ව සතර ධ්‍යානයන් කැමැති පරිදි ලබන්නේ පහසුවෙන් ලබන්නේ බහුලව ලබන්නේ ප්‍රත්‍යක්ෂකොට එයට පැමිණ වාසය කරයි, (ii) මහණෙනි, (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි)

**26. සීලවන්ත සොභන සූත්‍රය:-** 1. "මහණෙනි, ධර්ම සතකින් යුක්තවූ භික්ෂු තෙමේ විනයධරවූයේ බබළයි.

2 "කවර සතකින්ද යත්? ඇවැත (මෙහි 25 සූත්‍රයේ 2 (i) ඡේදය යෙදිය යුතුයි.) එයට පැමිණ වාසය කරයි (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

27. ස්වාගතසොභන සූත්‍රය:- 1 මහණෙනි, ධර්ම සතකින් යුක්ත වූ භික්ෂු තෙම විනයධරවූයේ බබළයි.

2. "කවර සතකින්ද යත්. ඇවැත දනියි. ඇවැත් නොවන දේ දනියි, ස්වල්ප ඇවැත් (මෙහි 23 සූත්‍රයේ (iii) ඡේදය යෙදිය යුතුයි.) උභය ප්‍රාති මොක්ෂයන් (මෙහි 23 සූත්‍රයේ 2 (iv) සහ 1 ඡේදය යෙදිය යුතුයි.)

**28. අසංහීරසොභන සූත්‍රය:-** (මෙය මේ වර්ගයේ 27 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. "කවර සතකින්ද යත්, ඇවත දනී. (මෙහි 24 සූත්‍රයේ 2 (ii) ඡේදය යෙදිය යුතුයි.) විනයෙහි ස්ථිරව පිහිටියේ වෙයි. (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

**29. පුබ්බෙ නිවාසසොභන සූත්‍රය:-** (මේ ඡේදය මේ වර්ගයේ 27 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

ඇවත (මෙහි 24 සූත්‍රයේ 2 (ii) ඡේදය යෙදිය යුතුයි.) නන්වැදෑරුම් පූර්වනිවාසය (මේ 1 ඡේදය යෙදිය යුතුයි.)

**30. උපාලි ආයාචන සූත්‍රය:-** ඉක්බිත්තෙන් ආයුෂ්මත් උපාලි ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැන්හි

පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූම ආයුෂ්මත් උපාලි ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකෙළේය.

2. "මම භාග්‍යවතුන් වහන්සේගේ යම් ධර්මයක් අසා හුදකලාවූයේ, වෙන්වූයේ, අප්‍රමාදවූයේ, කෙළෙස් තවන වීර්‍ය්‍යී ඇත්තේ, ආත්මභාවයෙහි දුරු කළ ආශා ඇත්තේ. වාසය කරන්නෙම් නම් ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට එබඳු ධර්මයක් මනාකොට දෙශනා කරන සේක්වා!"

3. "උපාලීනි, ඔබ යම් ධර්මයක් දන්නෙහි නම් මේ ධර්මයෝ ඒකාන්තයෙන් කළකිරීම පිණිස, රාග විරාගය ඇල්ම නැති කිරීම පිණිස, නිරොධය (සිත නොසිටීම) පිණිස, සංසිඳීම පිණිස, දැනීම පිණිස, අවබොධය පිණිස, නොපවතියි. උපාලීනි මේ ධර්මය නොවේය මේ විනය නොවේය මේ ශාස්තෘ ශාසනය නොවේයයි යන කරුණු ඒකාන්තයෙන් දැන ගනුව උපාලීනි, ඔබ යම් ධර්මයක් දන්නෙහි නම් මේ ධර්මයෝ ඒකාන්තයෙන් කළකිරීම පිණිස, රාග විරාගය පිණිස, නිරෝධය පිණිස, සංසිඳීම පිණිස, දැනීම පිණිස, අවබොධය පිණිස පවතියි. උපාලීනි මේ ධර්මය වෙයි. මේ විනය වෙයි, මේ ශාස්තෘ ශාසනය වෙයි, යන කරුණු ඒකාන්තයෙන් දරව."

**31. අධිකරණ සමථ සූත්‍රයː-** 1 "මහණෙනි, උපනුපන් අධිකරණයන්ගේ සමථය පිණිස, සංසිඳීම පිණිස, මේ අධිකරණ සමථ ධර්මයෝ සතක් වෙති, (ඉදිරියෙහි හික්මීම නම්) සම්මුඛො විනය දිය යුතුය, ස්මෘති විනය දිය යුතුය, නොමුලා විනය දිය යුතුය, පටිඤ්ඤාතකරණ නම් පොරොන්දු කිරීම දිය යුතුය, යෙභුය්‍යසිකා නම් නිතර ස්ථිරත්වය දිය යුතුය, තස්සපාපිය්‍යසිකා නම් ඔහුට පොරොන්දු දිය යුතුය, තිණවත්ථාරකය (කරුණ වසාදැමීම) දිය යුතුය. මහණෙනි, මේ සප්ත අධිකරණ සමථ ධර්මයෝ උපනුපන් අධිකරණ ධර්මයන්ගේ සංසිඳීම පිණිස වෙත්."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# 9 සමණ වර්ගය.

**32. භික්ඛුකරණ ධම්ම සූත්‍රයː**- 1 'මහණෙනි, ධර්ම සතක් බිඳුන බැවින් භික්ෂුව වෙයි.

2. "කවර සතක්ද යත්, සක්කාය දෘෂ්ටිය බිඳුණේ වෙයි, විචිකිච්ඡාව බිඳුණේ වෙයි, සීලබ්බත පරාමාසය බිඳුණේ වෙයි, රාගය බිඳුණේ වෙයි, දොසය බිඳුණේ වෙයි, මොහය බිඳුණේ වෙයි, මානය බිඳුණේ වෙයි. මහණෙනි, මේ ධර්ම සත බිඳුණ බැවින් භික්ෂුව වෙයි.

**33-39. සමණ කරණ ධම්ම සූත්‍රය, බ්‍රාහ්මණ ධම්ම සූත්‍රය, සොත්ථිය ධම්ම සූත්‍රය, නහාතක ධම්ම සූත්‍රය, වෙදගූ ධම්ම සූත්‍රය, අරිය ධම්ම සූත්‍රය, අරහන්ත ධම්ම සූත්‍රය**

33. 1. "මහණෙනි, ධර්ම සතක් සංසිඳුණ බැවින් ශ්‍රමණ වෙයි.

2. කවර සතක්ද යත්? ආත්ම දෘෂ්ටිය දුරුවූයේ වෙයි. බුද්ධාදී අටතැන සැකය දුරුවූයේ වෙයි. බාහිර ශීලයන් ව්‍රතයන් දුරුවූයේ වෙයි. රාගය දුරුවූයේ වෙයි. ද්වෙෂය දුරුවූයේ වෙයි. මොහය දුරුවූයේ වෙයි. මානය දුරුවූයේ වෙයි.

3. (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි.)

34-39. දක්වා මේ සූත්‍රවල 2 ඡෙදය 33 සූත්‍රයේ 2 ඡෙදය මෙනි ඒ ඒ සූත්‍රවල 3 ඡෙදය 1 ඡෙදය මෙනි)

34. 1 "ධර්ම සතක් යටකළ බැවින් බ්‍රාහ්මණ වෙයි.

35. 1 "ධර්ම සතක් ඉවත් කළ බැවින් යහපත් වූයේ වෙයි.

36. 1 "නෑ බැවින් (පිරිසිදු කළ බැවින්) නහාතක" නම්වේ.

37. 1 "දන්නා ලද බැවින් වෙදගූ නම්වේ.

38, 1. සුදුසු බැවින් ආයඎ නම් වෙයි.

39. 1 "දුරු කළ බැවින් අර්හත් නම් වෙයි.

3. "මහණෙනි, මේ ධර්ම සතකගේ දුරුවීමෙන් රහත් නම් වෙයි.

**40 සත්ත අසද්ධම්ම සූත්‍රය**:- 1 "මහණෙනි, මේ අසද් ධර්මයෝ සතෙකි. ඒ සත කවරේද? ශ්‍රද්ධාව නැත්තේ වේද, පාපයට ලජ්ජාව නැත්තේ වේද, පාපයට බිය නැත්තේ වේද, බොහෝ ඇසූ පිරූ තැන් නැත්තේ වේද, කම්මැලි වේද, මුළාවූ සිහි ඇත්තේ වේද, ප්‍රඥා නැත්තේ වේද, මහණෙනි, මේ සත අසද්ධර්මයෝ වෙති."

**41 සත්ත සද්ධම්ම සූත්‍රය**:- 1 "මහණෙනි මේ සද්ධර්මයෝ සතෙකි ඒ සත කවරේද? ශ්‍රද්ධාව ඇත්තේ වේද, පාපයට ලජ්ජාව ඇත්තේ වේද, පාපයට බිය ඇත්තේ වේද, බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තේ වේද, පටන් ගන්නා ලද වීර්‍ය්‍ය ඇත්තේ වේද, සිහි ඇත්තේ වේද, නුවණැත්තේ වේද, මේ සත සද්ධර්මයෝ වෙති."

---

## 10 ආහුණෙය්‍ය වර්ගය.

**42. චක්ඛු අනිච්චානුපස්සී සූත්‍රය**:- 1 (i) "මහණෙනි, පූජාවට යොග්‍යවූ දුර සිට ගෙනවුත් පිදීමට යොග්‍යවූ දන් දීමට සුදුසුවූ දෙඅත් හිස මත තබා වැඳීමට යොග්‍යවූ ලොකයාගේ නිරුත්තර පින් කෙතවූ මේ පුද්ගලයෝ සත්දෙනෙක් වෙති.

2. "ඒ සත්දෙන කවරහුද? (ii) මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් ඇසෙහි අනිත්‍යය අනුව බලන්නේ අනිත්‍ය සංඥා ඇත්තේ අනිත්‍යය විඳින්නේ නිරන්තරයෙන් ක්ලෙශයන් ගැවසී නොගත් සිත් ඇත්තේ සිතින් ඇලෙන්නේ ප්‍රඥාවෙන් වටකළේ (iii) හෙතෙම ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන් අනාශ්‍රවවූ චිත්ත විමුක්තියද ප්‍රඥා විමුක්තියද මෙලොවම තෙමේ මනාකොට දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාසය කරයි. (මෙහි 1 (i) යෙදිය යුතුයි) ප්‍රථම පුද්ගලයා වෙයි.

3. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) ඔහුට පෙර පසු නොව එකවිටම ඒ ක්ලෙශයන් නැතිවීමද ජීවිතය නැතිවීමද සිදු වෙයි. මහණෙනි, මේ (මෙහි 1 (i) යෙදිය යුතුයි.) දෙවන පුද්ගලයා වෙයි.

4. "මහණෙනි, නැවතද (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) හෙතෙම පස්වැදෑරුම් ඔරම්භාගිය සංයෝජනයන් (මෑත බැඳුම් පහ) ගේ දුරු කිරීමෙන් "අන්තරා පරිනිබ්බායී" වෙයි. "උපහච්ච" පරිනිබ්බායි වෙයි, අසංඛාර පරිනිබ්බායි වෙයි, සසංඛාර පරිනිබ්බායී වෙයි. ඉහළ ඉපදීමට යන අකනිට්ඨගාමී පුද්ගයා වෙයි. මහණෙනි, මේ (මෙහි 1 (i) (ii) යෙදිය යුතුයි.)

43. **චක්ඛු දුක්ඛානු පස්සි සූත්‍රයː-** 1 (මේ ඡේදය 42 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2 "ඒ සත්දෙන කවරහුද? මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් ඇසෙහි දුක අනුව බලන්නේ වාසය කරයි. ඇසෙහි අනාත්මය අනුව බලන්නේ වාසය කරයි. ක්ෂයවීම අනුව බලන්නේ වාසය කරයි. ව්‍යයවීම අනුව බලන්නේ වාසය කරයි. ඇසෙහි විරාගය අනුව බලන්නේ ඇසෙහි දුරුකිරීම අනුව බලන්නේ වාසය කරයි. කණෙහි-නාසයෙහි-දිවෙහි-ශරීරයෙහි-සිතෙහි-රූපයෙහි-ශබ්දයෙහි-ගන්ධයෙහි-රශයෙහි-ස්පර්ශයෙහි-ධර්මයෙහි-චක්ෂූර් විඥානයෙහි-ශ්‍රොත විඥානයෙහි-ඝාණ විඥානයෙහි-ජිව්හා විඥානයෙහි-මනස් විඥානයෙහි-චක්ෂු ස්පර්ශයෙහි-ශ්‍රොත ස්පර්ශයෙහි- ඝාණ ස්පර්ශයෙහි-ජිව්හා ස්පර්ශයෙහි-මනස් ස්පර්ශයෙහි-ඇස හා ස්පර්ශයෙන් හටගත් වේදනාවෙහි-කණ හා ස්පර්ශයෙන් හටගත් වේදනාවෙහි-දිව හා ස්පර්ශයෙන් හටගත් වේදනාවෙහි-කය හා ස්පර්ශයෙන් හටගත් වේදනාවෙහි-සිත හා ස්පර්ශයෙන් හටගත් වේදනාවෙහි-රූප සංඥාවෙහි-ශබ්ද සංඥාවෙහි-ගන්ධ සංඥාවෙහි-රස සංඥාවෙහි-ස්පර්ශ සංඥාවෙහි-ධර්ම සංඥාවෙහි-රූපය ගැන සිතීමෙහි-ශබ්දය ගැන සිතීමෙහි-ගන්ධය ගැන සිතීමෙහි-රසය ගැන සිතීමෙහි ස්පර්ශය ගැන සිතීමෙහි-ධර්මය ගැන සිතීමෙහි-රූප තෘෂ්ණාවෙහි-ශබ්ද තෘෂ්ණාවෙහි-ගන්ධ තෘෂ්ණාවෙහි-රස තෘෂ්ණාවෙහි-ස්පර්ශ තෘෂ්ණාවෙහි-ධර්ම තෘෂ්ණාවෙහි-රූප විතර්කයෙහි-ශබ්ද විතර්කයෙහි-ගන්ධ විතර්කයෙහි-රස විතර්කයෙහි-ස්පර්ශ විතර්කයෙහි-ධර්ම විතර්කයෙහි-රූප විචාරයෙහි (සෙවීමෙහි) ශබ්ද විචාරයෙහි-ගන්ධ විචාරයෙහි-

රස විචාරයෙහි-ස්පර්ශ විචාරයෙහි-ධර්ම විචාරයෙහි-රූපස්කන්ධයෙහි-වේදනාස්කන්ධයෙහි-සංඥා ස්කන්ධයෙහි-සංස්කාර ස්කන්ධයෙහි-විඥාන ස්කන්ධයෙහි-අනිත්‍යය අනුව බලන්නේ, දුක අනුව බලන්නේ, අනාත්මය අනුව බලන්නේ, ක්ෂය අනුව බලන්නේ, ව්‍යය අනුව බලන්නේ, විරාගය අනුව බලන්නේ, නිරොධය අනුව බලන්නේ, දුරු කිරීම අනුව බලන්නේ, වාසය කරයි. මහණෙනි, රාගයාගේ දැනීම පිණිස සප්ත ධර්ම කෙනෙක් වැඩිය යුත්තාහ.

3 "කවර ධර්මසතක්ද යත්, සතිසම්බොධ්‍යංගය (මෙහි 7 සත්තක නිපාතයේ 2 වර්ගයේ 26 සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි.) උපෙක්ෂා සම්බොධ්‍යංගය, යන මේ ධර්මයෝ වෙති

4. "මහණෙනි, රාගයාගේ මනා දැනීම පිණිස මේ ධර්ම සත වැඩිය යුතුයි මහණෙනි, රාගයාගේ මනා දැනීම පිණිස ධර්ම සතක් වැඩිය යුතුයි.

5 "කවර සතක්දයත්. අනිත්‍ය සංඥාව, අනාත්ම සංඥාව, අශුභ සංඥාව, ආදිනව සංඥාව, ප්‍රහාණ සංඥාව, විරාග සංඥාව නිරොධ සංඥාව යනුයි.

6 "මහණෙනි, රාගයාගේ මනා දැනීම පිණිස මේ සප්ත ධර්මයෝ වැඩිය යුතුය.

7. (i) "කවර සතක්දයත්? (ii) අශුභ සංඥාවය මරණ සංඥාවය, ආහාරයෙහි පිළිකුල් සංඥාවය, සියලු ලොකයෙහි නොඇලීම් සංඥාවය, අනිත්‍ය සංඥාවය, අනිත්‍යයෙහි දුක් සංඥාවය, දුකෙහි අනාත්ම සංඥාවය, (iii) මහණෙනි, රාගයාගේ මනා දැනීම පිණිස යම් මේ ධර්ම සත වැඩිය යුතුය. (iv) මහණෙනි, රාගයාගේ විශිෂ්ටඥානය පිණිස, හීනකිරීම පිණිස, දුරුකිරීම පිණිස, ක්ෂය පිණිස, ව්‍යය පිණිස, විරාගය පිණිස, නිරොධය පිණිස, අත්හැරීම පිණිස, දුරුකිරීම පිණිස, මේ සප්ත ධර්මයෝ වැඩිය යුතුය. ද්වෙෂයාගේ-මොහයාගේ-ක්‍රොධයේ-බද්ධවෛරයේ-ගුණමකුකමේ-අනුන්ට දොස් කීමේ-ඊර්ෂ්‍යාවේ-මසුරුකමේ-රැවටිල්ලේ-කපටිකමේ-තද ගතියේ-එකටඑක

කිරීමේ-මානයේ-අතිමානයේ-මදයේ-ප්‍රමාදයේ-මනාදැනීම පිණිස, (මෙහි 7 (iv) ඡේදය යෙදිය යුතුයි.)"

8. "භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතයට විශෙෂයෙන් සතුටු වූහ.

**(සත්තක නිපාතය නිමි.)**

---

# 8. අට්ඨක නිපාතය

## පළමුවෙනි පණ්ණාසකය

## 1. මෙත්තා වර්ගය

1. **අට්ඨ මෙත්තානිසංස සූත්‍රයː-** 1. "මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනේපිඬු මහා සිටාණන් විසින් කරවන ලද ජේතවන මහා විහාරයෙහි වැඩවසනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ " මහණෙනි" කියා භික්ෂූන්ට ආමන්ත්‍රණය කළ සේක. ඒ භික්ෂූහු 'භාග්‍යවතුන් වහන්සැ'යි කියා ප්‍රතිවචන දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

2. "මහණෙනි, මෛත්‍රී චෙතෝ විමුක්තිය ආදරයෙන් සේවනය කිරීමෙන්, නැවත නැවත කිරීමෙන් භාවනා කිරීමෙන් හෙවත් වැඩීමෙන් නැවත නැවත කිරීමෙන් යෙදූ වාහනයක් මෙන් කිරීමෙන් පදිඃචි වත්තක් හෝ ස්ථානයක් මෙන් කිරීමෙන් ඉදිරියෙහි පිහිටි දෙයක් මෙන් කිරීමෙන් හාත්පසින් මනාකොට රැස් කළ (ගොඩගැසූ) දෙයක් මෙන් කිරීමෙන් යහපත්ව ආරම්භ කොට කිරීමෙන් ආනිසංශ අටක් බලාපොරොත්තු විය යුතුයි.

3 "ඒ කිනම් ආනිශංස අටක්ද? සැපසේ නිදයි, සැපසේ අවදි වෙයි, නපුරු සීන නො දකියි. මිනිසුන්ට ප්‍රිය වෙයි. අමනුෂ්‍යයින්ට ප්‍රිය වෙයි, දෙවියෝ රකිත්, ඔහුට ගින්නක් හෝ විසක් හෝ ආයුධයක් හෝ නොවදී. මෛත්‍රී භාවනාවෙන් රහත්බව ලබන්නට නොහැකිවී නම් (මරණින් මතු) බඹ ලොව උපදී. (මෙහි 2 ඡේදය යෙදිය යුතුයි.)

4 (1) "යමෙක් අප්‍රමාණ සතුන් වෙත මෛත්‍රිය සිහියෙන් යුක්තව වඩාද විදර්ශනාවෙන් කෙලෙස් නැති කිරීමයයි කියන ලද රහත් බවට පැමිණියාහුගේ දශ සංයෝජනයෝ තුනී වෙත්."

(2) "ඉදින් එකද සත්වයෙකුට දූෂ්‍ය නුවූ සිත් ඇත්තේ මෛත්‍රී කෙරේද, ඒ කරණකොට ගෙන කුසල් ඇත්තේ වෙයි. සියලු ප්‍රාණීන් කෙරෙහිම සිතින් අනුකම්පා කරන්නාවූ ආයර්‍ය්‍යතෙම බොහෝ පින් කරයි."

(3) "යම් කෙනෙක් සත්වයන්ගෙන් පිරුණාවූ පොළොව ජයගෙන තාපසයන් මෙන් දැහැමි රජවරු වූවාහු දන් දෙමින් හැසුරුණාහුද අශ්ව මෙධය, පුරුෂ මෙධය, සම්මාපාසය, වාචපෙයය්‍යය, නිරග්ගලයයි යම් යාග පසක් වෙද්ද ඒ මහා යාගයෝද මනාකොට වඩන ලද මෛත්‍රීසිතෙහි දහසයවන කලාවටද නොපැමිණෙත්. චන්ද්‍රයාගේ රශ්මිය මෙන් තාරකාවන්ගේ රශ්මිය නැත්තාක් මෙනි."

(4) "යමෙක් තෙම සතුන් නොමරාද අනුන් ලවාත් නොමරවාද, අනුන් නොපරදවාද, වෙන කෙනෙකු ලවාත් අනුන් නොපරදවාද, හෙතෙම සියලු සත්වයන් කෙරෙහි මෛත්‍රී පිණ්ඩයක් වේ. ඔහු කෙරෙහි කිසිවෙකුගේ වෛරයක් නැත්තේය."

2. **ආදිබ්‍රහ්මචරිය පඤ්ඤා සූත්‍රය**:- 1. "මහණෙනි, මාර්ග බ්‍රහ්මචයර්‍ය්‍යාවට මුල්වූ විදර්ශනා ප්‍රඥාව නොලැබූ කල්හි ලැබීමටද ලැබූකල්හි බොහෝ වීමටද, මහත්වීමටද භාවනාව සම්පූර්ණවීම පිණිසද, මේ කරුණු අට හේතු වෙත්.

2. "ඒ අට කෙසේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම ශාස්තෘන් වහන්සේ හෝ ගරු කටයුතු අන්‍ය භික්ෂුවක් හෝ ආශ්‍රයකොට වෙසේද, යමෙක්හු කෙරෙහි ඔහුගේ තියුණු වූ ලජ්ජා භය එළඹ සිටියේවේද, ප්‍රේමයත් ගෞරවයත් එළඹ සිටියේ වේද, (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි.)

3. "ඒ මහණතෙම ඒ ශාස්තෘන්වහන්සේ හෝ ගරුකටයුතු එක්තරා භික්ෂුවක් හෝ ආශ්‍රයකොට වෙසේද, යමෙක්හු කෙරෙහි ඔහුගේ තියුණුවූ ලජ්ජා භය එළඹ සිටියේවේද, ප්‍රෙමයත් ගෞරවයත් එළඹසිටියේවේද, හෙතෙම කලින්කල (උන්වහන්සේ වෙත) එළඹ. 'ස්වාමීන් වහන්ස! මෙය කෙසේද, මෙහි අර්ථය කෙසේදැයි' පූර්වාපර සන්ධි විචාරයි. සැක තැන් විචාරයි. (එකල්හි) ඔහුට ඒ පින්වතුන් වහන්සේලා අප්‍රකට අර්ථය ප්‍රකාශ කෙරෙත්, ප්‍රකාශ නො කළ අර්ථය ප්‍රකාශ කෙරෙත්. අනේකප්‍රකාරවූ සැක කටයුතුවූ ධර්මයන්හි සැක දුරු කෙරෙත්. (ii) මහණෙනි, මේ මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාවට මුල්වූ විදර්ශනා ප්‍රඥාව නොලැබූ කල්හි ලැබීමටද, ලැබූකල්හි බොහෝ වීමටද, මහත්වීමටද, භාවනාව සම්පූර්ණවීමටද (iii) (ඇතිවිය යුතුවූ) දෙවෙනි හේතුවයි.

4. (i) මහණතෙම ඒ ධර්මය අසා කාය ප්‍රකාශයෙන්ද, චිත්තප්‍රකාශයෙන්ද යන දෙයාකාරවූ ප්‍රකාශයෙන් (විදර්ශනාවට හේතු) සපයයි (ii) (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

(ඇතිවිය යුතුවූ) තුන්වෙනි හේතුවයි.

5. (i) "සිල්වතෙක් වේද, ප්‍රාතිමොක්ෂ සංවර සීලයෙන් හික්මී වෙසේද භික්ෂූන් අතර හැසිරිය යුතු ආකාරයත් ගොදුරුගම්හි හැසිරියයුතු ආකාරයත් දැන ඉගෙන පිළිපදිමින් ස්වල්පමාත්‍රවූ වරදෙහි පවා භය දකින ස්වභාවය ඇතිව ශික්ෂා පද සමාදන්ව එහි පිළිපදිමින් වෙසේද, (ii) (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

(ඇතිවිය යුතුවූ) හතරවෙනි හේතුවයි.

6. (i) ධර්මවිනය උගතෙක්වේද, උගත් දෙය මතකතබා ගත්තෙහි වේද, උගත් දෙය සිතෙහි තැන්පත් කරගත්තෙක් වේද, යම්කිසි ධර්මයක් මුල, මැද, අග යන තුන් තන්හි නිවැරදිව යහපත්ව දෙශනාකරණ ලදද, අර්ථ සහිතව-භාෂාව නොවරදවා සම්පූර්ණකොට දෙශනා කරණ ලදද, (ඒ දෙශනාවෙන්) පිරිසිදු බ්‍රහ්මචරියාව ප්‍රකාශකෙරෙත්ද, එබඳුවූ ධර්මයෝ මොහු විසින් ඉගෙන ගන්නා ලද්දේවේද, ඉගෙනගත් ධර්මය සිත

තථාගතත්තේවේද, වචනයෙන් පුරුදුකරණ ලද්දේවේද, පිළිවෙළ නොවරදවා සිතින් පරීක්ෂාකරණ ලද්දේවේද, විදර්ශනා ප්‍රඥාවෙන් යහපත්ව අවබොධ කරණ ලද්දේවේද, (ii) (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

(ඇතිවිය යුතුවූ) පස්වැනි හේතුවයි.

7. (i) "අකුශල ධර්මයන් දුරුකිරීම පිණිසද, කුශල ධර්මයන් රැස් කිරීම පිණිසද පටන්ගන්නාලද වීර්‍ය්‍ය ඇතිව වාසය කෙරේද වීර්‍ය්‍යවන්තවූයේ දැඩිවූ පරාක්‍රමයෙන් යුක්තවූයේ, නොපසුබස්නා වීර්‍ය්‍යයෙන් යුක්ත වූයේ වේද, (ii) (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

(ඇතිවිය යුතුවූ) සවැනි හේතුවයි.

8. (i) "සංසයා වෙතින් අණ නොලැබූ කථිකයෙක් වේද, දෙතිස් කථාවෙන් තොරවූ කථිකයෙක් වේද, ධර්මය සිය කැමැත්තෙන්ම දෙසන්නෙක්වේද, ධර්මය දෙසීම පිණිස අන්‍යයන්ට හෝ ආරාධනා කරන්නෙක් වේද, ආර්‍ය්‍ය තූෂ්ණිම්භාවයයි කියනලද සිවුවැනි ධ්‍යානයට සමවැදීම හෝ සෙසු කමටහනක් (භාවනාවක්) මෙනෙහි කිරීම හෝ කෙරේද, (ii) මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

(ඇතිවිය යුතුවූ) සත්වැනි හේතුවයි.

9. (i) "රූපය මෙසේය. රූපය ඇතිවන්නේ මෙසේය. රූපය නිරුද්ධ වන්නේ (නැති වන්නේ) මෙසේය. වේදනාව මෙසේය. වේදනාව ඇතිවන්නේ මෙසේය. වේදනාව නිරුද්ධ වන්නේ මෙසේය. සංඥාව මෙසේය. සංඥාව ඇතිවන්නේ මෙසේය. සංඥාව නිරුද්ධ වන්නේ මෙසේය. සංස්කාරය මෙසේය. සංස්කාරය ඇති වන්නේ මෙසේය. සංස්කාරය නිරුද්ධ වන්නේ මෙසේය. විඤ්ඤාණය මෙසේය. විඤ්ඤාණය ඇතිවන්නේ මෙසේය. විඤ්ඤාණය නිරුද්ධ වන්නේ මෙසේ යයි පඤ්චුපාදානස්කන්ධය කෙරෙහි උදයව්‍යය (ඇතිව නැති වීම) අනුව සිහි කරමින් වසන්නේ වේද? (ii) (මෙහි 3 (ii) යෙදිය යුතුයි) (ඇතිවිය යුතුවූ) අට වැනි හේතුවයි.

10. (i) "එකී භික්ෂුවට මේ මතු දක්වන පරිදි සමාන බඹසර ඇති භික්ෂූහු ගෞරවය දක්වත්. මේ ආයුෂ්මතුන් වහන්සේ

වනාහි ශාස්තෲන් වහන්සේ ඇසුරු කොට වාසය කරයි. ගරු කටයුතු එක්තරා භික්ෂූන් වහන්සේ නමක් හෝ ඇසුරු කොට වාසය කරයි. යමෙක්හු කෙරෙහි ඔහුගේ තියුණුවූ ලජ්ජා භය එළඹ සිටියේ වේද, ප්‍රේමයත් ගෞරවයත් එළඹ සිටියේ වේද, (එබඳු උතුමෙක් ඇසුරු කොට වාසය කරයි)

(ii) "තවද ඒ ආයුෂ්මතුන් වහන්සේ දතයුතු දේ දනී. දැක්ක යුතු දේ දකී, යන මේ ස්වභාවය ප්‍රිය භාවය පිණිසද, ගරු භාවය පිණිසද, භාවනාව පිණිසද ශ්‍රමණ භාවය පිණිසද, හුදකලා භාවය (විවේකය) පිණිසද පවතී.

11. 'ඒ මේ ආයුෂ්මතුන් වහන්සේ වනාහි ශාස්තෲන් වහන්සේ ඇසුරු කොට වසමින් එක්තරා ගරු කටයුතු සමාන බඹසර ඇති භික්ෂුවක් හෝ ඇසුරු කොට වසමින් යමෙකු කෙරෙහි තියුණුවූ ලජ්ජා භය එළඹ සිටියේ වේද, ප්‍රේමයත් ගෞරවයත් එළඹ සිටියේ වේද, එබඳුවූ උතුමන් වෙත කලින් කල පැමිණ, 'ස්වාමීන් වහන්ස, මෙය කෙසේද, මෙහි අර්ථය කුමක්දැයි' පූර්වාපර සන්ධි විචාරයි. සැක තැන් විචාරයි. (එකල්හි) ඔහුට ඒ පින්වතුන් වහන්සේලා අප්‍රකට අර්ථය ප්‍රකාශ කෙරෙත්. ප්‍රකාශ නොකළ අර්ථය ප්‍රකාශ කෙරෙත්. අනෙක ප්‍රකාරවූ සැක කටයුතුවූ ධර්මයන්හි සැක දුරු කෙරෙත්. ඒකාන්තයෙන් මේ (මෙහි 10 (ii) යෙදිය යුතුයි.)

12. (මෙහි 4 (i) සහ 10 (ii) යෙදිය යුතුයි.)

13. (මෙහි 5 (i) යෙදිය යුතුයි.)

14. (මෙහි 6 (i) යෙදිය යුතුයි.) (මෙහි 10 (ii) යෙදිය යුතුයි.)

15. (මෙහි 7 (i) යෙදිය යුතුයි.) ඒකාන්තයෙන් මේ (මෙහි 10 (ii) යෙදිය යුතුයි.)

16. (මෙහි 8 (i) යෙදිය යුතුයි.) ඒකාන්තයෙන් මේ (මෙහි 10 (ii) යෙදිය යුතුයි.)

17. (මෙහි 9 (i) යෙදිය යුතුයි.) ඒකාන්තයෙන් මේ (මෙහි 10 (ii) යෙදිය යුතුයි.)

18. "මහණෙනි, මාර්ග බ්‍රහ්ම චරියාවට මුල්වූ විදර්ශනා ප්‍රඥාව නොලැබූ කල්හි ලැබීමටද, ලැබූ කල්හි බොහෝ වීමටද මහත් වීමටද භාවනාව සම්පූර්ණ වීමටද මේ කරුණු අට හේතුවෙත්."

3. **අප්පිය පසංසී සූත්‍රයඃ-** 1. "මහණෙනි, කරුණු අටකින් යුක්තවූ භික්ෂුතෙම, සබ්‍රම්සරුන්ට, (භික්ෂූන්ට) අප්‍රිය වෙයි, අමනාපද වෙයි, අගෞරවද වෙයි, සැලකිල්ලට භාජනද නොවෙයි.

2. "කිනම් කරුණු අටකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම අප්‍රියවූ දුසිල් මහණුන්ට ප්‍රශංසා කරන්නේ වේද, ප්‍රියවූ සිල්වත් භික්ෂූන්ට ගර්හා කරන්නේ වේද, සිවුපස ලාභයෙහි ගිජුවූයේ වේද, සත්කාරයෙහි ගිජු වූයේවේද, පාපයෙහි ලජ්ජා නැතිවූයේ වේද, පාපයෙහි භය නැතිවූයේද, පවිටු අදහස් ඇත්තේද, මිසදිටු වූයේද, (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, කරුණු අටකින් යුක්තවූ මහණතෙම සබ්‍රම්සරුන්ට ප්‍රියද වෙයි, මනාපද වෙයි, ගෞරවයද වෙයි, සැලකිල්ලට භාජනද වෙයි.

4. "කිනම් කරුණු අටකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම අප්‍රියවූ දුසිල් මහණුන්ට ප්‍රශංසා නොකරන්නේ වේද, ප්‍රියවූ සිල්වත් භික්ෂූන්ට ගර්හා නොකරන්නේ වේද, සිවුපස ලාභයෙහි ගිජු නුවූයේ වේද, සත්කාර ලාභයෙහි ගිජු නුවූයේ වේද, පාපයෙහි ලජ්ජා ඇත්තේ වේද, පාපයෙහි භය ඇත්තේ වේද, අල්පේච්ඡ වූයේවේද, සම්‍යක් දෘෂ්ටික වූයේද, (මෙහි 3 ඡේදය යෙදිය යුතුයි.)

4. **ලාභකාම සූත්‍රයඃ-** 1. "මහණෙනි, කරුණු අටකින් යුක්තවූ මහණතෙම සබ්‍රම්සරුන්ට අප්‍රියද වෙයි, අමනාපද වෙයි, අගෞරවද වෙයි, නොසැලකිය යුතුද වෙයි.

2. "කිනම් කරුණු අටකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම සිවුපස ලාභයෙහි ගිජුවූයේ වේද, සත්කාර ලාභයෙහි ගිජුවූයේ වේද, (ගර්හා ලැබීමට සුදුසුව සිටියේ

නමුදු) අනුන් විසින් ගර්හා කරණු නොලැබේවායි වේද, කථා කළයුතු කාලය නොදන්නේ වේද, (සිවු පසය පිළිගත යුතු) පමණ නොදන්නේ වේද, අපිරිසිදුවූ කාය කර්මාදිය ඇත්තේ වේද, බොහෝකොට කථා කරන්නේ වේද, සබ්‍රම්සරුන්ට ආක්‍රොෂ පරිභව බණන්නේ වේද, (මෙහි 1 ඡේදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, කරුණු අටකින් යුක්තවූ මහණතෙම සබ්‍රම්සරුන්ට ප්‍රියද වෙයි, මනාපද වෙයි, ගෞරවද වෙයි, සැලකිය යුතුද වෙයි.

4. "කිනම් කරුණු අටකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම සිවුපස ලාභයෙහි ගිජු නොවේද, සත්කාර ලාභයෙහි ගිජු නොවේද, ස්වකීය දොස් ඇසීමෙහි සතුටුවේද, කථා කිරීම් ආදියෙහි සුදුසු කාලය දනීද, සිවුපසයෙහි පමණ දන්නේ වේද, පිරිසිදුවූ කාය කර්මාදිය ඇත්තේ වේද, දොඩමලු නොවේද, (වාචාල නොවේද) සබ්‍රම්සරුන්ට ආක්‍රොෂ පරිභව නොවන්නේ වේද, (මෙහි 3 ඡේදය යෙදිය යුතුයි.)

5. **සංඛිත්තලොක ධම්ම සූත්‍රය**:- 1. "මහණෙනි, මේ අෂ්ට ලොක ධර්මය තෙම ලෝකය ලුහුබඳියි. (ලොකය අනුව පෙරළෙයි) ලොකයද අෂ්ට ලොක ධර්මය ලුහුබඳියි. (අෂ්ට ලොක ධර්මය අනුව පෙරලෙයි.)

2. "ඒ ලොක ධර්ම අට කෙසේද? ලාභයද, අලාභයද, අයසද, (පරිවාර සම්පත්තියෙන් තොර වීමද) යසසද, (පරිවාර සම්පත් ලැබීමද) නින්දා ලැබීමද, ප්‍රශංසා ලැබීමද, සැප ලැබීමද, දුක් ලැබීමද, යන අටය.

3 1. "ලාභයද, අලාභයද, අයසද, යසසද, නින්දාද, ප්‍රශංසාද සැපද, දුකද යන මේ සත්වයන් කෙරෙහි පවත්නාවූ ලෝක ධර්ම අට අනිත්‍යයහ. සදාකාලික නොවෙත්. විනාශ වන ස්වභාවයෝ වෙත්.

2 "යහපත් සිහියෙන් යුක්තවූ ප්‍රඥාවන්ත පුද්ගල තෙම මේ අෂ්ට ලොක ධර්ම ස්වභාවයද දැන අනිත්‍ය ස්වභාව ධර්මය දකීද, ඔහුගේ සිත ඉෂ්ටාරමුණු වලින් නොකැළඹෙයි. අනිටු අරමුණු වලින් නො ගැටෙයි. (ක්‍රෝධ නූපදී) ඒ

ඉෂ්ටාරම්මණය අනුගමනය කිරීමෙන් (රැකගැනීමෙන්) හෝ එයට විරුද්ධ වීමෙන් හෝ විනාශ වනු ලබන ආත්මය සහගතවූවක් නැතැයි දැන කෙලෙස් රජසින් තොරවූ නිස්සොකීවූ (සෝක නැත්තාවූ) ඒ ආයර්‍ය පුද්ගල තෙම නිර්වාණ පදය යහපත් ප්‍රඥාවෙන් අවබෝධ කොට භවයාගේ කෙළවරට පැමිණෙන්නේයි.”

**6 විත්ථත ලොක ධම්ම සූත්‍රය:-** 1 “මහණෙනි, මේ අෂ්ට ලොක ධර්මය තෙම ලොකය ලුහුබඳී. (ලොකය අනුව පෙරලෙයි) ලොකයද අෂ්ට ලොක ධර්මය ලුහුබඳියි. (අෂ්ට ලොක ධර්මය අනුව පෙරලෙයි.

2 “ඒ ලොකධර්ම අට කෙසේද යත්? (ii) ලාභයද, අලාභයද, අයසද, යසසද, නින්දාද, ප්‍රශංසාද, සැපද, දුකද යන අටය.

3 “මහණෙනි, ධර්ම විනය නූගත් පෘථග්ජනයාට ලාභයද, අලාභයද, අයසද, යසසද, නින්දාද, ප්‍රශංසාද, සැපද දුකද උපදී. මහණෙනි, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

4 “මහණෙනි, ඒ කරුණ පිළිබඳව ධර්ම විනය නූගත් පෘථග්ජනයාට වඩා ධර්ම විනය උගත් ආයර්‍ය ශ්‍රාවකයාගේ වෙනස කුමක්ද? අධිකවූයේ කුමක්ද? විශෙෂ කරුණ කුමක්ද?”

5 “ස්වාමීන් වහන්ස! අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ නායක කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණ කොට ඇත්තාහ. ස්වාමීන් වහන්ස, ඒකාන්තයෙන් ඒ වදාරණ ලද ධර්මයාගේ අර්ථය භාග්‍යවතුන් වහන්සේම වදාරණසේක් නම් යහපති, භාග්‍යවතුන් වහන්සේගෙන්ම (ඒ ධර්මය) අසා භික්ෂූහු ඉගෙන ගනිත්.”

6 “මහණෙනි, එසේවීනම් අසව්, යහපත්ව මෙනෙහි කරවු, දෙශනා කරන්නෙමි”-“ස්වාමීන් වහන්ස, එසේය”යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

7 (i) “මහණෙනි, ධර්ම විනය නූගත් පෘථග්ජනයාට ලාභය උපදී, හෙතෙම මෙසේ කල්පනා නොකරයි. (කෙසේද?) ‘මට

මේ ලාභය උපන්නේ නමුදු (ii) එය අනිත්‍යයි, දුකයි වෙනස්වන (නැතිවන) ස්වභාවයි' කියා (එහි) නියම තත්වය නොදනී.

8 "අලාභය ඇතිවේද, අයස ඇතිවේද, යසස ඇතිවේද නින්දා ඇතිවේද, ප්‍රශංසා ඇති වේද, සැප ඇතිවේද, දුක ඇති වේද, (මෙහි 7 (ii) යෙදිය යුතුයි.)

9 "ලාභයද ඔහුගේ සිත හාත්පසින් මැඩගෙන සිටී. අලාභයද, අයසද, යසසද, නින්දාද, ප්‍රශංසාද, සැපද, දුකද ඔහුගේ සිත හාත්පසින් මැඩගෙන සිටී. හෙතෙම උපන් ලාභය රැක ගනී. උපන් අලාභයෙහි විරුද්ධවෙයි. උපන් අයසෙහි විරුද්ධවෙයි. උපන් යසස රැකගනී. උපන් නින්දාවෙහි විරුද්ධවෙයි. උපන් ප්‍රශංසාව රැකගනී. උපන් සැප රැක ගනී. උපන් දුකෙහි විරුද්ධවෙයි. මෙසේ හෙතෙම ඉෂ්ටවූ ලොක ධර්මය රැක ගැනීමෙහිත් අනිෂ්ටවූ ලොක ධර්මය කෙරෙහි විරුද්ධත්ත්වය පහළ කිරීමෙහිත් යෙදුනේ, ජාති දුකින්ද, ජරා දුකින්ද, මරණ දුකින්ද, සොක දුකින්ද පරිදෙව දුකින්ද, කායික දුකින්ද, මානසික දුකින්ද, උපායාස දුකින්ද නොමිදේ. (එහෙයින්) දුකින් නොමිදේයයි කියමි.

10 "මහණෙනි, ධර්ම විනය උගත් ආර්‍ය්‍ය ශ්‍රාවකයාට ලාභය උපදී. හෙතෙම මෙසේ කල්පනා කරයි. (කෙසේද?) මේ ලාභය වනාහි මට උපන්නේය, (එසේද වුවත්) (ii) එය අනිත්‍යය දුකය වෙනස්වන (නැතිවන) ස්වභාවයයී (එහි) නියම තත්ත්වය දනී. (iii) අලාභය උපදීද, යසස උපදීද, අයස උපදීද, ප්‍රශංසා උපදීද, නින්දා උපදීද, සැප උපදීද, දුක උපදීද හෙතෙම මෙසේ කල්පනා කරයි. (කෙසේද?) මේ දුක වනාහි මට උපන්නේය. (එසේද වුවත්) (මෙහි 10 (ii) යෙදිය යුතුයි.) ලාභයද ඔහුගේ සිත හාත්පසින් මැඩගෙන නොසිටී. අයසද ඔහුගේ සිත හාත්පසින් මැඩගෙන නොසිටී. යසසද ඔහුගේ සිත හාත්පසින් මැඩගෙන නොසිටී. නින්දාද ඔහුගේ සිත හාත්පසින් මැඩගෙන නොසිටී. ප්‍රශංසාද ඔහුගේ සිත හාත්පසින් මැඩගෙන නොසිටී. සැපද ඔහුගේ සිත හාත්පසින් මැඩගෙන නොසිටී. දුකද ඔහුගේ සිත හාත්පසින් මැඩගෙන නොසිටී.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

11 "හෙතෙම උපන් ලාභය නොරකී. අලාභයෙන් විරුද්ධ නොවෙයි. උපන් යසස නොරකී. අයසෙහි විරුද්ධ නොවෙයි. උපන් ප්‍රශංසාව නොරකී. නින්දාවෙහි විරුද්ධ නොවෙයි. උපන් සැපත නොරකී. දුකෙහි විරුද්ධ නොවෙයි.

"හෙතෙම මෙසේ රැකීම් විරුද්ධවීම් දෙක හෙවත් ඇලීම් ගැටීම් දෙක ප්‍රහීණ කෙළේ ජාති ජරා මරණ සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාස යන මෙයින් මිදෙයි. (එහෙයින්) දුකින් මිදේයයි කියමි.

"මහණෙනි, මේ වනාහි ධර්ම විනය නූගත් පෘථග්ජනයාට වඩා ධර්ම විනය උගත් ආර්‍ය්‍ය ශ්‍රාවකයාගේ වෙනසයි. අධිකවූ කරුණුයි. විශෙෂවූ කරුණුයි.

12 "ලාභයද, අලාභයද, අයසද, යසසද, නින්දාද, ප්‍රශංසාද, සැපද, දුකද යනමේ සත්වයන් කෙරෙහි පවත්නාවූ ලොක ධර්ම අට අනිත්‍යයහ. සදාකාලික නොවෙත්. විනාශවන ස්වභාවයෝ වෙත්. යහපත් සිහියෙන් යුක්තවූ ප්‍රඥාවන්ත පුද්ගලතෙම මේ අෂ්ට ලොක ධර්ම ස්වභාවයද දැන අනිත්‍ය ස්වභාව ධර්මය දකීද, ඔහුගේ සිත ඉෂ්ටාරමුණු වලින් නොකැළඹෙයි. අනිටු අරමුණු වලින් නොගැටෙයි. (ක්‍රොධ නූපදී) ඒ ඉෂ්ටාරම්මණය අනුගමනය කිරීමෙන් හෝ (රැක ගැනීමෙන්) එයට විරුද්ධ වීමෙන් හෝ විනාශවනු ලබන ආත්ම සහගතවූවක් නැතැයි දැන කෙලෙස් රජසින් තොරවූ නිස්සොකී වූ (සොක නැත්තාවූ) ඒ ආර්‍ය්‍ය පුද්ගලතෙම නිර්වාණපදය යහපත් ප්‍රඥාවෙන් අවබෝධකොට භවයාගේ කෙළවරට පැමිණෙන්නේයි"

7 **පරියාදින්න දේවදත්ත සූත්‍රය**:- 1 "එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ගිජ්ඣකූට පර්වතයෙහි වැඩ වාසය කරණසේක. එසමයෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ දෙව්දත් තෙරුන් සංඝභෙද කොට එතැනින් පහවගිය නොබෝ වේලාවකින් ඒ දෙව්දත් තෙරුන් අරභයා භික්ෂූන්ට ආමන්ත්‍රණය කොට වදාළසේක.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2 "මහණෙනි, පැවිදිතෙම කලින් කල තමාගේ විපත්තිය ගැන ප්‍රත්‍යවේක්ෂා කරන්නේ නම් යහපති, අනුන්ගේ විපත්තිය ගැනද කලින් කල ප්‍රත්‍යවෙක්ෂා කරන්නේනම් යහපති, තමාගේ සම්පත්තිය ගැන කලින් කල ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ නම් යහපති, අනුන්ගේ සම්පත්තිය ගැනද කලින් කල ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ නම් යහපති.

3 "මහණෙනි, අසද්ධර්ම අටකින් මඩනා ලද්දාවූ හාත්පසින් යටකොට ගන්නා ලද්දාවූ සිත් ඇති දේවදත්තයා අපායට හිමිවූවෙකි. නරකයට හිමිවූවෙකි. කල්පයක් නරකයෙහි පැසිය යුත්තෙකි. පිළියම් රහිත වූවෙකි.

4 "කවර අටකින්ද යත්? මහණෙනි, ලාභයෙන් (ii) මඩනා ලද්දාවූ හාත්පසින් යටකොට ගන්නා ලද්දාවූ සිත් ඇති දෙවදත්තයා අපායට හිමිවූවෙකි. නරකයට හිමිවූවෙකි. කල්පයක් නරකයෙහි පැසිය යුත්තෙකි. පිළියම් රහිත වූවෙකි. (iii) අලාභයෙන් (මෙහි 4 (ii) යෙදිය යුතුයි) අයසින් (මෙහි 4 (ii) යෙදිය යුතුයි) යසසින් (මෙහි 4 (ii) යෙදිය යුතුයි) සත්කාරයෙන් (මෙහි 4 (ii) යෙදිය යුතුයි) අසත්කාරයෙන් (මෙහි 4 (ii) යෙදිය යුතුයි) පවිටු අදහසින් (මෙහි 4 (ii) යෙදිය යුතුයි) පාපමිත්‍ර සේවනයෙන් (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

5 (මේ ඡෙදය මේ වර්ගයේ 7 සූත්‍රයේ 3 ඡෙදය මෙනි.)

6 (i) මහණෙනි, පැවිදිතෙම උපන් ලාභය (ii) මැඩපවත්වා, මැඩපවත්වා වාසය කරන්නේ නම් මැනවි. (iii) උපන් අලාභය (මෙහි 6 (ii) යෙදිය යුතුයි) උපන් යසස (මෙහි 6 (ii) යෙදිය යුතුයි) උපන් අයස (මෙහි 6 (ii) යෙදිය යුතුයි) උපන් සත්කාරය (මෙහි 6 (ii) යෙදිය යුතුයි) උපන් අසත්කාරය (මෙහි 6 (ii) යෙදිය යුතුයි) උපන් පවිටු අදහස (මෙහි 6 (ii) යෙදිය යුතුයි) උපන් පාපමිත්‍ර සේවනය (මෙහි 6 (ii) යෙදිය යුතුයි)

7 "මහණෙනි, පැවිදිතෙම කිනම් ප්‍රයෝජනයක් උදෙසා උපන් ලාභය මැඩ පවත්වා මැඩ පවත්වා වාසය කරන්නේද, උපන් අලාභය මැඩ පවත්වා මැඩ පවත්වා වාසය කරන්නේද යසස මැඩ පවත්වා මැඩ පවත්වා වාසය කරන්නේද, අයස

මැඩ පවත්වා මැඩ පවත්වා වාසය කරන්නේද, සත්කාරය මැඩ පවත්වා මැඩ පවත්වා වාසය කරන්නේද, අසත්කාරය මැඩ පවත්වා මැඩ පවත්වා වාසය කරන්නේද, පවිටු අදහස මැඩ පවත්වා මැඩ පවත්වා වාසය කරන්නේද, පාපමිත්‍ර සේවනය මැඩ පවත්වා මැඩ පවත්වා වාසය කරන්නේද,

8 "මහණෙනි, යම්හෙයකින් උපන් ලාභය (ii) මැඩ නොපවත්වා වාසය කරන්නාවූ ඒ භික්ෂුවට කාමාදී ආශ්‍රවයෝ උපදින්නාහු විනාශ දැවිලි වෙත්ද, (iii) උපන් ලාභය (iv) මැඩ පවත්වා වාසය කරන්නාවූ ඒ භික්ෂුවට එපරිද්දෙන් විනාශ දැවිලි නොවෙත්.

9 "මහණෙනි, යම්හෙයකින් උපන් අලාභය (මෙහි 8 (ii) යෙදිය යුතුයි.) උපන් අලාභය (මෙහි 8 (iv) යෙදිය යුතුයි) උපන් අයස (මෙහි 8 (ii) යෙදිය යුතුයි) උපන් අයස (මෙහි 8 (iv) යෙදිය යුතුයි) උපන් සත්කාරය (මෙහි 8 (ii) යෙදිය යුතුයි.) උපන් සත්කාරය (මෙහි 8 (iv) යෙදිය යුතුයි) උපන් අසත්කාරය (මෙහි 8 (ii) යෙදිය යුතුයි) උපන් අසත්කාරය (මෙහි 8 (iv) යෙදිය යුතුයි) උපන් පවිටු අදහස (මෙහි 8 (ii) යෙදිය යුතුයි) උපන් පවිටු අදහස (මෙහි 8 (iv) යෙදිය යුතුයි) උපන් පාපමිත්‍ර සේවනය (මෙහි 8 (ii) යෙදිය යුතුයි) උපන් පාපමිත්‍ර සේවනය (මෙහි 8 (iv) යෙදිය යුතුයි.)

10 (i) "මහණෙනි, පැවිදිතෙම මේ ප්‍රයෝජනය නිසා උපන් ලාභය (ii) මැඩ පවත්වා මැඩ පවත්වා වාසය කරන්නේය (iii) උපන් අලාභය (මෙහි 10 (ii) යෙදිය යුතුයි) උපන් යසස (මෙහි 10 (ii) යෙදිය යුතුයි) උපන් අයස (මෙහි 10 (ii) යෙදිය යුතුයි) උපන් සත්කාරය (මෙහි 10 (ii) යෙදිය යුතුයි) උපන් අසත්කාරය (මෙහි 10 (ii) යෙදිය යුතුයි) උපන් පවිටු අදහස (මෙහි 10 (ii) යෙදිය යුතුයි) උපන් පාපමිත්‍ර සේවනය මැඩ පවත්වා මැඩ පවත්වා වාසය කරන්නේය.

11 "මහණෙනි, එහෙයින් මේ ශාසනයෙහි (පැවිදිතෙම) මෙසේ හික්මිය යුතුය. (කෙසේද?) උපන් ලාභය (ii) මැඩ පවත්වා මැඩ පවත්වා වාසය කරන්නෙමු (iii) උපන් අලාභය (මෙහි 11

(ii) යෙදිය යුතුයි) උපන් යසස (මෙහි 11 (ii) යෙදිය යුතුයි) උපන් අයස (මෙහි 11 (ii) යෙදිය යුතුයි) උපන් සත්කාරය (මෙහි 11 (ii) යෙදිය යුතුයි) උපන් අසත්කාරය (මෙහි 11 (ii) යෙදිය යුතුයි) උපන් පවිටු අදහස (මෙහි 11 (ii) යෙදිය යුතුයි) උපන් පාපමිත්‍ර සේවනය මැඩ පවත්වා මැඩ පවත්වා වාසය කරන්නෙමුයි කියායි. මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතුය"

8. **මහිසවත්ථු (උත්තර) සූත්‍රයඃ-** 1. එක් සමයෙක්හි ආයුෂ්මත්වූ උත්තර තෙරණුවෝ මහිස වස්තුවෙහි සංඛෙය්‍යක නම් වූ පර්වතයෙහි පිහිටි ධවජාලිකා විහාරයෙහි වැඩ වාසය කරණසේක. එහිදී ආයුෂ්මත් උත්තර තෙරණුවෝ "ඇවැත්නි, මහණෙනි," කියා භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක

2 "ඇවැත්නි, මහණෙනි! භික්ෂූහු කලින් කල තමන්ගේ වරද කල්පනා කරන්නාහු නම් මැනවි. ඇවැත්නි, භික්ෂූහු කලින් කල අනුන්ගේ වරද කල්පනා කරන්නාහු නම් මැනවි. ඇවැත්නි, භික්ෂූහු කලින් කල තමන්ගේ සීලාදී ගුණ සම්පත්තිය කල්පනාකරන්නාහු නම් මැනවි. ඇවැත්නි භික්ෂූහු අනුන්ගේ සීලාදී ගුණ සම්පත්තිය කල්පනා, කරන්නාහු නම් මැනවි."

3. එසමයෙහි වනාහි වෙසමුනි මහරජ්ජුරුවෝ කිසියම් කටයුත්තක් සඳහා උතුරු දිශාවේ සිට දකුණු දෙසට යයි. වෙසමුනි මහ රජතුමා (එසේ යන අතර) ආයුෂ්මත් උත්තර තෙරණුවෝ මහිසවස්තුවෙහි සංඛෙය්‍යක පර්වතයෙහි පිහිටි ධවජාලිකා විහාරයෙහි භික්ෂූන්ට (මෙහි 2 ඡෙදය යෙදිය යුතුයි) යයි මෙසේ දෙශනා කරන්නාවූ ධර්ම ඇසුවේය.

4. ඉන්පසු වෙසමුනි මහ රජතුමා, යම්සේ වනාහි කාය බල ඇති පුද්ගලයෙක් වක් කළ අතක් දිගු කරන්නේ යම්සේද දික් කළ අතක් හකුලන්නේ (නමන්නේ) යම්සේද එසේ හෙවත් එපමණ ඉක්මනින් මහිස වස්තුවෙහි සංඛෙය්‍යක නම් පර්වතයෙහි පිහිටි ධවජාලිකා විහාරයෙන් අතුරුදන්ව තවුතිසා දෙව්ලොව දෙවියන් අතර පහළ වූයේය. ඉන්පසු වෙසමුනි මහ රජතුමා සක්දෙව් මහ රජතුමා යම් තැනකද එතැනට පැමිණියේය, පැමිණ සක්දෙව් මහ රජ හට මෙසේ ප්‍රකාශ කෙළේ ය.

**5.** "නිදුකාණෙනි, මේ බව දන්නෙහිද? උත්තර තෙරණුවෝ මහිසවස්තුවෙහි සංඛෙය්‍යක නම් පර්වතයෙහි පිහිටි ධවජාලිකා විහාරයෙහි භික්ෂූන්ට මෙබඳු ධර්මයක් දෙශනා කරයි (කෙබඳු ධර්මයක්ද යත්,) (මෙහි 2 ඡෙදය යෙදිය යුතුයි.)

**6** ඉක්බිති සක්දෙව් මහ රජතුමා යම්සේ වනාහි කාය බල ඇති පුරුෂයෙක් වක් කළ අතක් දිගු කරන්නේ යම් සේද, දික් කළ අතක් හකුලන්නේ යම් සේද, එසේ හෙවත් එපමණ ඉක්මනින් තව්තිසා දෙව්ලොව දෙවියන් අතරින් අතුරුදන්ව මහිස වස්තුවෙහි සංඛෙය්‍යක නම් පර්වතයෙහි පිහිටි ධවජාලිකා විහාරයෙහි ආයුෂ්මත් උත්තර තෙරණුවන්ගේ ඉදිරියෙහි පහළ වූයේය.

**7** ඉක්බිති සක්දෙව් මහ රජතුමා ආයුෂ්මත්වූ උත්තර තෙරණුවෝ යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත්වූ උත්තර තෙරණුවන්ට මනාකොට වැඳ එකත් පසෙක සිටියේය. එකත්පසෙක්හි සිටියාවූ සක්දෙව් රජතුමා ආයුෂ්මත් උත්තර තෙරණුවන්ට මෙසේ ප්‍රකාශ කෙළේය.

**8.** "ස්වාමීනි, ආයුෂ්මත් උත්තර තෙරණුවෝ භික්ෂූන්ට (මෙහි 2 ඡෙදය යෙදිය යුතුයි.) මෙ බඳුවූ ධර්මයක් දෙශනා කෙළේය යනු සැබෑද?"

**9.** "එසේය, දේවේන්ද්‍රය,"-"කිමෙක්ද ස්වාමීනි, මේ ධර්මය ආයුෂ්මත් උත්තර තෙරණුවන්ටම අවබොධවූ ධර්මයක්ද? නැතහොත් ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේගේ දෙශනාවක්ද?"

"එසේ වී නම් දෙවෙන්ද්‍රය, මම ඔබට උපමාවක් කරන්නෙමි. උදාහරණයෙනුදු මෙලොව ඇතැම් නැණවත් පුරුෂයෝ වචනයෙහි අර්ථය දැන ගනිත්.

"දෙවේන්ද්‍රය යම්සේ වනාහි ගමකට හෝ නියම් ගමකට නුදුරු තන්හි මහත්වූ ධාන්‍ය රාශියක් වූයේද, ඒ ධාන්‍ය රාශියෙන් මහජනයා කයිනුදු, පෙට්ටිවලිනුදු, ඔඩොක්කුවෙනුදු ඇඟිලි වලිනුදු ධාන්‍ය ගෙන යන්නේය. දෙවේන්ද්‍රය, යම්කිසිවෙක් වනාහි ඒ මහජනයා වෙත පැමිණ මේ ධාන්‍ය කොතැනින්

ගෙන එන්නේ දැයි මෙසේ විචාරන්නේ නම් දෙවේන්ද්‍රය එයට උත්තර දෙන්නාවූ ඒ මහජනයා හරි උත්තරයක් දෙන්නේ නම් ඒ උත්තරය කෙසේ විය යුතුද?"

10 "ස්වාමීන් වහන්ස, ඒ මහාජනයා මනාකොට උත්තර දෙන්නේ නම්, (අපි) අතර මහා ධාන්‍ය රාශියෙන් ගෙන එමුයයි ප්‍රකාශ කරන්නේය."

"දෙවේන්ද්‍රය, එපරිද්දෙන්ම වනාහි යම්කිසි සුභාෂිතයක් වේ නම් ඒ සියල්ල ඒ භාග්‍යවත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ අයත්ය. ඒ ධර්මයෙන් රැගෙන රැගෙන අන්‍යයෝද අපිද කියමු."

11. "ස්වාමීනි, ආශ්චර්‍ය්‍යයයි. ස්වාමීනි-අද්භූතයි. ස්වාමීනි ආයුෂ්මත් උත්තර තෙරණුවන් විසින් යම්කිසි සුභාෂිතයක් වේනම් ඒ සියල්ල ඒ භාග්‍යවත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ අයත්ය. ඒ ධර්මයෙන් රැගෙන රැගෙන අන්‍යයෝද අපිද කියමු යන යම් මේ වචනයක් ප්‍රකාශ කරණ ලදද, එයද සුභාෂිතයකි. උත්තර ස්වාමීනි, එය එසේමය,-ස්වාමීනි, උත්තර තෙරණුවෙනි, මෙපමණකින් මනුෂ්‍යයන් අතරෙහිවූ භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිවු පිරිස මේ ධර්ම ක්‍රමය කුමක්දැයි නොපිහිටියාහුය. (නොදත්තාහුය) ස්වාමීනි, ආයුෂ්මත් උත්තර තෙරණුවෝ මේ ධර්ම ක්‍රමය-උගනීවා.

ස්වාමීනි, ආයුෂ්මත් උත්තර තෙරණුවෝ මේ ධර්ම ක්‍රමය පාඩම් කියාවා. ස්වාමීනි, උත්තර තෙරණුවෝ, මේ ධර්ම ක්‍රමය ධාරණය කෙරේවා. ස්වාමීනි, මේ ධර්ම ක්‍රමය අර්ථයෙන් යුක්තය, ශාසන බ්‍රහ්මචාරියාවට මුල් වූයේයි."

**9. නන්ද බ්‍රහ්ම චරිය සූත්‍රයඃ-** 1. "මහණෙනි, නන්දයා පිළිබඳව යහපත්ව ප්‍රකාශ කරන්නෙක් (ඔහු) ජාතිකුල පුත්‍රයෙක් යයි ප්‍රකාශ කරන්නේය. නන්දයා පිළිබඳව යහපත්ව ප්‍රකාශ කරන්නෙක් (ඔහු) කාය බලය ඇත්තෙක් යයි ප්‍රකාශ කරන්නේය. යහපත්ව ප්‍රකාශ කරන්නෙක් රූප සම්පත්තියෙන් ප්‍රසාද උපදවන්නෙක්යයි ප්‍රකාශ කරන්නේය, යහපත්ව ප්‍රකාශ කරන්නෙක් බලවත් රාග ඇත්තේයයි ප්‍රකාශ කරන්නේය,

2. "මහණෙනි, ඒ කුමකැයි හඟිවූ ද? නන්දයා චක්ෂුරාදී ඉන්ද්‍රියයන් පිළිබඳව වසන ලද දොර ඇත්තේ වෙයි. හෙවත් ඉන්ද්‍රිය සංවරශීලයෙන් යුක්ත වෙයි. භොජනයෙහි පමණ දන්නේය. නිදි වර්ජනය කිරීමෙහි යෙදුනේය, සියලු ඉරියව්වෙහි සිහියෙන් යුක්තව ක්‍රියා කරන්නේය, යම්බඳු මේ ගුණ දහම් කරණකොටගෙන. සම්පූර්ණවූ පිරිසිදුවූ ශාසන බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන්නට නන්දයා සමර්ථවෙයි.

3. "මහණෙනි, ඒ කියන ලද ගුණදහම් අතුරෙන් මෙය නන්දයාගේ ඉන්ද්‍රිය සංවරය වෙයි. මහණෙනි, ඉදින් නන්දයාට පූර්වදිශාව බැලියයුතු වීනම් සියල්ල සිතට යහපත්ව ගෙන නන්දයා පූර්වදිශාව බලයි-(කෙසේද?) 'පූර්වදිශාව බලන්නාවූ මට මෙපරිද්දෙන් (බැලූකල්හි) (ii) දැඩි ලෝභ දොම්නස් ආදී පාප ධර්මයෝ සිතට වැද නොගන්නාහුයයි ඒ පිළිබඳව සම්පත් ප්‍රඥාවෙන් යුක්ත වූයේ වෙයි'

4 "මහණෙනි, ඉදින් නන්දයාට බටහිරදිග බැලිය යුතු වී නම් සියල්ල සිතට යහපත්ව ගෙන නන්දයා බටහිරදිග බලයි. 'බටහිරදිග දිසාව බලන්නාවූ මට මේ පරිද්දෙන් (බැලූ කල්හි) (මෙහි 11 (ii) යෙදිය යුතුයි) උතුරුදිග බැලිය යුතු වීනම් සියල්ල සිතට යහපත්ව ගෙන නන්දයා උතුරු දිග බලයි. උතුරු දිසාව බලන්නාවූ මට මේ පරිද්දෙන් (බැලූ කල්හි) (මෙහි 11 (ii) යෙදිය යුතුයි.)

5. "දකුණු දිග බැලිය යුතුවී නම්, සියල්ල සිතට යහපත්ව ගෙන නන්දයා දකුණු දිග බලයි. 'දකුණු දිග බලන්නාවූ මටමේ පරිද්දෙන් (බැලූ කල්හි) (මෙහි 11 (ii) යෙදිය යුතුයි.) උඩ දිශාව බැලිය යුතුවීනම්, සියල්ල සිතට යහපත්ව ගෙන නන්දයා උඩ දිසාව බලයි. උඩ දිසාව බලන්නාවූ මට මෙපරිද්දෙන් (බැලූ කල්හි) (මෙහි 11 (ii) යෙදිය යුතුයි.) යට දිසාව බැලිය යුතුවීනම්, සියල්ල සිතට යහපත්ව ගෙන නන්දයා යට දිසාව බලයි. යට දිසාව බලන්නාවූ මට මේ පරිද්දෙන් (බැලූ කල්හි) (මෙහි 11 (ii) යෙදිය යුතුයි.)

6. "අනුදිග බැලිය යුතු වීනම් සියල්ල සිතට යහපත්ව ගෙන නන්දයා අනුදිග බලයි, මෙසේ අනුදිග බලන්නාවූ මට

විෂමලෝභ දොම්නස් ආදී පාප ධර්මයෝ සිතට වැද නොගන්නාහුයයි බලයි, මෙපරිද්දෙන් එහි සම්‍යක් ප්‍රඥාවෙන් යෙදුනේ වෙයි. "මහණෙනි, මෙය නන්දයාගේ ඉන්ද්‍රිය සංවරය පිණිස වෙයි.

7. "මහණෙනි, ඒ කියන ලද ගුණධර්මයන් අතුරෙන් මෙය නන්දයාගේ භොජනයෙහි පමණ දැනීම පිණිස වෙයි. මහණෙනි, මේ ශාසනයෙහි නන්දයා නුවණින් සලකා ආහාරය වළඳයි. (කෙසේද?) 'මම මේ ආහාරය ක්‍රීඩා පිණිස නොවළඳමි. මද වැඩීම පිණිස නොවළඳමි, අලංකාරය පිණිස නොවළඳමි, සැරසීම පිණිස නොවළඳමි, යම්තාක් මේ ශරීරයාගේ චිරස්ථිතිය වේද ඒ පිණිස වළඳමි, අවිහිංසාවෙහි ඇලීම සඳහා වළඳමි. ශාසන බ්‍රහ්මචරියාවට අනුග්‍රහ පිණිස වළඳමි' මෙසේ මේ වැළඳීමෙන් පුරාණ බඩගිනි වේදනාව නසන්නෙමි. (පමණට වඩා වැළඳීමෙන්) අමුතු වේදනාවක්ද නූපදවන්නෙමි. මේ වැළඳීම මාගේ ජීවිතය ගෙන යාම සඳහා යාත්‍රාවක්ද වන්නේය. නිවැරදිද වන්නේය. පාසු විහරණය පිණිසද වන්නේය, යනුය. මහණෙනි, මෙය නන්දයාගේ භොජනයෙහි පමණ දැනීම පිණිස වෙයි.

8. "මහණෙනි, ඒ කියන ලද ගුණධර්මයන් අතුරෙන් මෙය නන්දයාගේ නිදිවර්ජිත කිරීම පිළිබඳ වෙයි. මහණෙනි, මේ ශාසනයෙහි නන්දයා දහවල් කාලය සක්මනින්ද, හිඳීමෙන්ද නීවරණ ධර්මයන්ගෙන් සිත පිරිසිදු කරයි. රාත්‍රියෙහි ප්‍රථම යාමය සක්මනින්ද, හිඳීමෙන්ද, නීවරණ ධර්මයන්ගෙන් සිත පිරිසිදු කරයි. රාත්‍රියෙහි මැදුම්යම (ශරීරයෙහි) දකුණු පාර්ශවය යටකොට ඍජුවූ දකුණු පාදය මතුයෙහි වම් පාදය ස්වල්පයක් උඩට ඇද තබා සිහියෙන් යුක්තව සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තව අළුයම නැගීසිටිමි යන අධිෂ්ඨානය සහිතවූ සංඥාවෙන් සිංහ ශය්‍යාවෙන් සයනය කෙරෙයි. රාත්‍රියෙහි පැසුළුයම-(අළුයම) නැගිට සක්මනින්ද හිඳීමෙන්ද නීවරණ ධර්මයන්ගෙන් සිත පිරිසිදු කරයි. මහණෙනි මෙය නන්දයාගේ නිදිවර්ජජිත කිරීම පිළිබඳ වෙයි.

9. "මහණෙනි, ඒ කියනලද ගුණ ධර්මයන් අතුරෙන් මෙය නන්දයාගේ සම්‍යක් සිහිය පිළිබඳ වෙයි. මහණෙනි, මේ ශාසනයෙහි නන්දයාට තත්ත්වය අවබොධවන ලද්දාවූම වේදනාවෝ උපදිත්. අවබෝධවන ලද්දාවූම වේදනාවෝ එළඹ සිටිත්. අවබොධවන ලද්දාවූම වේදනාවෝ නිරුද්ධ වෙත්. මහණෙනි මෙය නන්දයාගේ සම්‍යක් සිහිය පිළිබඳ වෙයි.

10. "මහණෙනි, නන්දයා ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තය භොජනයෙහි පමණ දන්නේය, නිදි දුරුකිරීමෙහි යෙදුනේය, සම්‍යක් සිහියෙන් යුක්තයයි. මෙයට වඩා කුමක්ද? යම්හෙයකින් නන්දයා සම්පූර්ණවූ පිරිසිදුවූ ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙන්නට (සිතන්නේද?) එය හැකිවෙයි."

10. **කාරණ්ඩවනිධමන සූත්‍රය:-** 1. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ චම්පා නුවර ගර්ගරා නම් පොකුණු තෙර වැඩ වාසය කරණසේක. එසමයෙහි වනාහි භික්ෂූහු භික්ෂුවට ඇවතින් චෝදනා කරත්, ඒ භික්ෂුව භික්ෂූන් විසින් චෝදනා කරණු ලබන්නේ වෙන වෙන කරුණු වලින් වරද වසා කථාකරත්. බාහිර කථා ගෙනහැර දක්වත්. කෝපයද, ද්වෙෂයද විරුද්ධ කරුණුද පහළ කරත්.

2. එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක. "මහණෙනි, ඒ පුද්ගලයා පහකරවු, මහණෙනි, ඒ පුද්ගලයා පහකරවු, මහණෙනි, ඒ පුද්ගලයා පහකළ යුතුය. කිමෙක්ද? තොප විසින් අන්‍යවූ (බුද්ධපුත්‍ර නුවූ) පුද්ගලයෙකු වෙහෙස කරණු ලබන්නේද? මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙකුගේ ඉදිරියට සක්මන් කිරීමද, ආපසු සක්මන් කිරීමද, ඉදිරි බැල්මද, වටපිටබැල්මද අතපය දික්කිරීමද, අතපය වක්කිරීමද, සඟල සිවුරු පාසිවුරු දැරීමද, අන්‍යවූ යහපත් භික්ෂූන්ගේ (ඉරියව් වැනි) වෙයි. යම්තාක් අන්‍ය භික්ෂූහු ඔහුගේ ඇවැත නොදකිත්ද (ඒතාක් ඔහු භික්ෂුවක් මෙන් පෙනී සිටියි.)

3. "යම් දිනක පටන් භික්ෂූහු ඔහුගේ ඇවැත දකිත්ද, (එකල්හි) ඔහු මෙසේ (හඳුනා) දැනගනිත් 'මේ පුද්ගලයා භික්ෂූන්

කෙලසන්නෙකි. හිස් (බොල්) ශ්‍රමණයෙකි, ශ්‍රමණ කසලයෙකි, යි’ මෙසේ (හඳුනා) දැනගනිත්. ඔහු (ගැන) මෙසේ දැන ගෙන (සංඝයා කෙරෙන්) බැහැර කෙරෙත්, එයට හේතු කවරේද? අන්‍යවූ යහපත් භික්ෂූන් දූෂ්‍ය නොකෙරේවා කියායි.

4. “මහණෙනි, යම්සේ වනාහි සමෘද්ධවූ යව කෙතෙක් හි (හටගත්) යව බොල් කරන්නාවූ, කුණු කරන්නාවූ යවදූෂී නම් රෝගය උපන්නේ නමුදු (ඒ රෝගයට භාජනවූ) යව පැලයේ මුලද නාලය හෙවත් කඳ ද, පත්‍රයද (ඒ යව පැලය) පුදිනතුරු අන්‍යවූ යහපත් යව පැල මෙන් දෘෂ්‍යමාන වන්නාහුද, ඒ යව පැලය පීදුනු තැන් පටන් එය යව බොල් කරන්නාවූ යව කුණුකරන්නාවූ යව දූෂී රෝගයට භාජනවූවකැයි දැනගනිත්. ඒ (ගැන) එසේ දැන එය සහමුලින් උගුල්ලා යව කෙතින් පිටත දමත්. එයට හේතු කවරේද? අන්‍යවූ යහපත් යව දූෂ්‍ය නොවේවා කියායි.

5. “මහණෙනි, එපරිද්දෙන්ම වනාහි මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙකුගේ ඉදිරියට සක්මන් කිරීමද, ආපසු සක්මන් කිරීමද, ඉදිරි බැල්මද, වට පිට බැල්මද, අතපය දික් කිරීමද, අතපය වක්කිරීමද, සඟල සිවුරු පා සිවුරු දැරීමද, අන්‍යවූ යහපත් භික්ෂූන්ගේ ඉරියව් වැනිවෙයි, යම්තාක් අන්‍ය භික්ෂූහු ඔහුගේ ඇවැත නොදකිත්ද, (ඒතාක් ඔහු භික්ෂුවක් මෙන් පෙනී සිටියි) යම් දිනක පටන් භික්ෂූහු ඔහුගේ ඇවැත දකිත්ද, එකල්හි ඔහු මෙසේ (හඳුනා) දැන ගනිත්. ‘මේ පුද්ගලයා භික්ෂූන් කෙලසන්නෙකි. හිස් (බොල් ශ්‍රමණයෙකි.) ශ්‍රමණ කසලයෙකියි මෙසේ (හඳුනා) දැනගනිත්. ඔහු (ගැන) මෙසේ දැනගෙන (සංඝයා කෙරෙන්) බැහැර කෙරෙත්, එයට හේතු කවරේද? අන්‍යවූ යහපත් භික්ෂූන් දූෂ්‍ය නොකෙරේවා, කියායි.

6. “මහණෙනි, යම්සේ වනාහි මහත්වූ ධාන්‍ය රාශියක් පොළන කල්හි (හුලං ගස්වන කල්හි) එහි යම්කිසි දැඩිවූ සාරවත්වූ (ධාන්‍යයෝ වෙත් නම්) ඒ ධාන්‍යයෝ එක් පසෙක රැස්වෙත්, යම්කිසි දුර්වලවූ බොල්වූ (ධාන්‍යයෝ වෙත් නම්) ඒ ධාන්‍යයෙන් සුළඟින් එක් පසෙක විසුරුවෙත්, ධාන්‍ය හිමියෝ

මුස්න (ඉදල) ගෙන ඒ බොල් වඩා ඈතට හැමද (අතුගා) දමත්, එයට හේතු කවරේද? අන්‍යවූ යහපත ධාන්‍ය (ඒ බොල්වලින්) දූෂ්‍ය නොවේවා කියායි.

7. (මේ ඡේදය 5 ඡේදය මෙනි.)

8. "මහණෙනි, යම්සේ වනාහි දිය පීල්ලක් උවමනා කරන්නාවූ පුරුෂයෙක් තෙම තියුණු කෙටේරියක් (පොරොවක්) ගෙන වනයට ප්‍රවිෂ්ට වන්නේ නම් හෙතෙම ඒ ඒ වෘක්ෂයට පොරෝවලින් තට්ටුකරයි. එහි ඒ පොරෝවලින් තට්ටුකරණ ලද යම් (කිසි) වෘක්ෂයෝ දැඩිද, සාරවත්ද, (අරටු සහිතද) ඒ වෘක්ෂයෝ කර්කශ (දැඩි) නාදය පිටකරත්. යම්කිසි වෘක්ෂයෝ ඇතුළත කුණුවූවාහුද, ඕජාව වැගිරෙන්නාහුද දිරුම් සහිත වූවාහුද, ඒ වෘක්ෂයෝ පොරෝවලින් තට්ටුකරණ ලද්දාහු දෙදරුම් නාදය පිටකරත්. (ඔහු) ඒ දෙදරුම් නාදය පිටකළ වෘක්ෂය මුලින් සිඳියි. (කපයි) මුල සිඳ අග සිඳියි. අග සිඳ ඇතුළත යහපත්ව ශුද්ධකොට දිය පීල්ලට යොදයි.

9. (මේ ඡේදය 5 ඡේදය මෙනි.)

1. "සමග විසීමෙන් (මොහු) පවිටු අදහස් ඇත්තේ යයිද, ක්‍රොධ කරණ ස්වභාව ඇත්තේයයිද, ගුණමකු යයි ද, අවවාදයට නොනැමෙනසුලු යයි ද, යුග ග්‍රාහ ලක්ෂණ වූ එකට එක කරන්නෙක් යයි ද, ඊර්ෂ්‍යා කරන්නෙක්යයිද, මසුරෙක්යයිද, හොරෙක්යයිද, දැනගනිව්.

2. "මහජනයා මධ්‍යයෙහි සාන්ත වචන පවසමින් ශ්‍රමණයෙක් මෙන් කථාකරයි. රහසිගතව පාපකර්ම කරයි. ලාමකවූ දෘෂ්ටි ඇත්තේ වෙයි. (ශික්ෂාරක්ෂණය පිළිබඳව) ආදර රහිත වෙයි. (ආකුල වචන සහිතව) වෙවුලමින් බොරු පවසයි.

3. "මෙබඳුවූ පුද්ගලයා තත්වාකාරයෙන් දැන සියලු සිල්වත් භික්ෂූහු සමගිව ඔහු (ගැන) කලකිරෙව්, ඒ ශ්‍රමණ කසලයා පහකරවු, ඒ ශ්‍රමණ කුණ දුරුකරව්. අශ්‍රමණ වූ ශ්‍රමණ මානීවූ බොල් මහණුන් පාකර හරිවු. පවිටුවූ ආචාර ගොචරයෙන් යුක්තවූ ලාමක අදහස් ඇත්තාවූ භික්ෂූන්) පහකොට ශුද්ධ වූවාහු

ශුද්ධ වූ භික්ෂූන් සමග සමගි සම්පන්නව වාසය කරවු. ඉක්බිති සමගිවූ ප්‍රඥාවන්තවූ (තෙපි) දුක් කෙළවර කරවු.”

(මෙත්තා වර්ගය නිමි.)

---

## 2. මහාවර්ගය.

11. වෙරඤ්ජ සූත්‍රයඃ- 1. “මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ වෙරඤ්ජා නුවර නලෙරු නම් යක්ෂයා විසින් අධිගෘහිතවූ කොසඹ රුක් මුල වැඩ වාසය කරණසේක.

2. “එකල්හි වනාහි වේරඤ්ජ නම් බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවූයේය. සතුටු විය යුතුවූ සිහිකටයුතුවූ කථාව අවසන්කොට එකත් පසෙක හුන්නේය. එකත් පසෙක හුන්නාවූ වෙරඤ්ජ බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවේය.

3 “භවත් ගෞතමයාණනි, (ii) ශ්‍රමණ භවත් ගෞතමයෝ වයසින් ජීර්ණවූ, වෘද්ධවූ, මහලුවූ, දීර්ඝකාලයක් ගතකලාවූ වයසට පැමිණියාවූ බමුණන්ට නොවඳින්නේයයිද, (දුටුකළ) අසුනෙන් නො නැගිටින්නේ යයි ද, අසුනක හිඳිනසේ ආරාධනා නොකරන්නේයයි ද (iii) යන මේ පුවත මා විසින් අසනලදී. භවත් ගෞතමයාණනි, ඒ මේ පුවත එසේමය. (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) භවත් ගෞතමයාණනි, ඒ මේ කරුණ නොහොබනේමය.

4. “බ්‍රාහ්මණය, දෙවියන් සහිතවූ, මරුන් සහිතවූ, බ්‍රහ්මයන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ, දෙව් මිනිසුන් සහිතවූ සත්ත්වලොකයෙහි යම්කිසිවෙකුට මම වඳින්නෙම්, දැක හුනස්නෙන් නැගීසිටින්නෙම්, අසුනක හිඳිනසේ ආරාධනා කරන්නෙම්, යන මේ කරුණ මම නොදක්නෙම්.

“බ්‍රාහ්මණය, යමෙකුට වනාහි තථාගතමෙ වඳින්නේ හෝ වේද, දැක හුනස්නෙන් නැගීසිටින්නේ හෝ වේද, අසුනක

හිඳනාසේ ආරාධනා කරන්නේ හෝ වේද, ඔහුගේ හිස් මුදුන හෝ පැලෙන්නේය.

**5.** "භවත් ගෞතමතෙම අරස රූපියෙකි. (සමගි රසයෙන් තොරවූවෙකි.)

"බ්‍රාහ්මණය, යම්කිසි කරුණකින් යහපත්ව කථා කරන්නාවූ යම්කිසිවෙක් ශ්‍රමණ භවත් ගෞතමයා අරසරූප යයි මට කියන්නේ නම් එයට හේතු ඇත්තේමය.

"බ්‍රාහ්මණය, යම් ඒ රූප රසය, ශබ්ද රසය, ගන්ධරසය, රස රසය, ස්පර්ශරසය යන (රසයෝ වෙත් නම්) තථාගතයන්ගේ ඒ රසයෝ ප්‍රහීන වූවාහු වෙත්. ආර්‍ය්‍යමාර්ග ශාස්ත්‍රයෙන් මූලෝච්ඡින්නවූවාහු වෙත්. කරටිය කැපූ තල් ගසක් මෙන් කරණලද්දාහු වෙත්. අභාවප්‍රාප්ත කරණලද්දාහු වෙත්. නැවත හටනොගන්නා බවට පමුණුවන ලද්දාහුවෙත්.

**6.** "බ්‍රාහ්මණය, යම්කිසි කරුණකින් යහපත්ව කථා කරන්නාවූ, යම්කිසිවෙක් ශ්‍රමණ භවත් ගෞතමය, (ii) අරස රූපයයි මට කියයුතු වන්නේ මේ හේතුවෙනි, යුෂ්මතා යමක් සඳහා කීයෙහි නම් ඒ සඳහා නොවෙයි."

**7.** "භවත් ගෞතමතෙම නිබ්භොගියෙක් (සමගි පරිභොගයෙන් තොරවූවෙකි) (මෙහි 6 (i) යෙදිය යුතුයි.) "නිබ්භොගියෙකැයි මට කියන්නේනම් එයට හේතු ඇත්තේමය. බ්‍රාහ්මණය, යම් ඒ රූප (පරි භොගය, ශබ්ද පරිභොගය, ගන්ධ පරිභොගය, රසපරිභොගය, ස්පර්ශ පරිභොගය යන (පරිභොගයෝ වෙත් නම්) තථාගතයන්ගේ ඒ පරිභොගයෝ ප්‍රහීන වූවාහු වෙත්. ආර්‍ය්‍ය මාර්ග ශස්ත්‍රයෙන් මූලෝච්ඡින්න වූවාහු වෙත්. කරටිය කැපූ තල් ගසක් මෙන් කරණ ලද්දාහු වෙත්. අභාවප්‍රාප්ත කරණ ලද්දාහුවෙත්. නැවත හටනොගන්නා බවට පමුණුවන ලද්දාහු වෙත්. (මෙහි 6 (i) යෙදිය යුතුයි.) නිබ්භෝගියෙකැයි මට කියයුතුවන්නේ නම්, මේ හේතුවෙනි. යුෂ්මතා යමක් සඳහා කීයෙහිනම් ඒ සඳහා නොවෙයි."

**8.** "භවත් ගෞතමතෙම අකිරිය වාදියෙකි." (මෙහි 6 (i) යෙදිය යුතුයි.) අකිරියවාදියයි මට කියන්නේ නම් එයට හේතු ඇත්තේමය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

"බ්‍රාහ්මණය, මම වනාහි කාය දුශ්චරිතයද, වචීදුශ්චරිතයද, මනො දුශ්චරිතයද, නොකටයුතු යයි කියමි. අනේකප්‍රකාරවූ පවිටුවූ අකුශල ධර්මයන් නොකටයුතු යයි කියමි. (මෙහි 6 (i) යෙදිය යුතුයි.) අකිරියවාදියෙක් යයි මට කියයුතු වන්නේ නම් මේ හේතුවෙනි. යුෂ්මතා යමක් සඳහා කීයෙහි නම් ඒ සඳහා නොවෙයි."

9. "භවත් ගෞතමතෙම උච්ඡේද වාදියෙකි," (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) උච්ඡේද වාදියෙක් යයි මට කියන්නේ නම් එයට හේතු ඇත්තේමය. බ්‍රාහ්මණය, මම වනාහි රාගයද, ද්වෙෂයද, මෝහයද, සම්පූර්ණයෙන් සිඳ දැමිය යුතුයයි කියමි. අනේකප්‍රකාරවූ පවිටුවූ අකුශල ධර්මයන් සම්පූර්ණයෙන් සිඳ දැමිය යුතුයයි කියමි. (මෙහි 6 (i) යෙදිය යුතුයි.) උච්ඡේද වාදියෙක්යයි මට කිය යුතු වන්නේ නම් මේ හේතුවෙනි. යුෂ්මතා යමක් සඳහා කීයෙහි නම් ඒ සඳහා නොවෙයි.

10. "භවත් ගෞතමතෙම පිළිකුල් කරන්නෙකි. (මෙහි 6 (i) යෙදිය යුතුයි.) පිළිකුල් කරන්නෙකැයි මට කියන්නේ නම් එයට හේතු ඇත්තේමය. බ්‍රාහ්මණය, මම වනාහි කාය දුශ්චරිතයද, වචී දුශ්චරිතයද, මනො දුශ්චරිතයද, පිළිකුල් කරමි. අනේකප්‍රකාරවූ පවිටුවූ අකුශල ධර්මයන්ට පැමිණීම පිළිකුල් කරමි (මෙහි 6 (i) යෙදිය යුතුයි.) පිළිකුල් කරන්නෙකැයි මට කියයුතු වන්නේ නම් මේ හේතුවෙනි. යුෂ්මතා යමක් සඳහා කීයෙහි නම් ඒ සඳහා නොවෙයි

11. "භවත් ගෞතමතෙම වේනයිකයෙකි, (හික්මී විය යුත්තෙකි.) (මෙහි 6 (i) යෙදිය යුතුයි.) වේනයිකයෙක් යයි මට කියන්නේ නම් එයට හේතු ඇත්තේමය බ්‍රාහ්මණය, මම වනාහි රාගයද, ද්වෙෂයද, මෝහයද, විනාශය පිණිස සන්සිඳවීම පිණිස දහම් දෙසමි. අනේකප්‍රකාරවූ පවිටුවූ අකුශල ධර්මයන් විනාශය පිණිස දුරුකිරීම පිණිස දහම් දෙසමි. (මෙහි 6 (i) යෙදිය යුතුයි.) වේනයිකයෙක්යයි මට කිය යුතු වන්නේ නම් මේ හේතුවෙනි. යුෂ්මතා යමක් සඳහා කීයෙහි නම් ඒ සඳහා නොවෙයි.

12. "භවත් ගෞතමතෙම තපස්සියෙකි.' (මෙහි 6 (i) යෙදිය යුතුයි.) තපස්සියෙක්යයි මට කියන්නේ නම් එයට හේතු

ඇත්තේමය. බ්‍රාහ්මණය, මම වනාහි කාය දුශ්චරිතයද, වචී දුශ්චරිතයද, මනො දුශ්චරිතයද යන පවිටුවූ අකුශල ධර්මයන් නැවිය යුතුයයි විනාශ කළ යුතුයයි කියමි. බ්‍රාහ්මණය, යමෙකුගේ වනාහි නැවිය යුතු විනාශ කළයුතු පවිටුවූ අකුශල ධර්මයෝ ප්‍රහීණ වූවාහු වෙත්ද, මුලොච්ඡින්න කරණ ලද්දාහු වෙත්ද, කරටිය කැපූ තල් ගසක් මෙන් කරණ ලද්දාහු වෙත්ද, අභාවප්‍රාප්ත කරණ ලද්දාහු වෙත්ද, නැවත හටනොගන්නා බවට පමුණුවන ලද්දාහු වෙත්ද, මම ඔහු තපස්සියෙක්යයි කියමි. බ්‍රාහ්මණය, තථාගතයන්ගේ වනාහි නැවිය යුතුවූ විනාශ කළ යුතුවූ පවිටුවූ අකුශල ධර්මයෝ ප්‍රහීණ වූවාහු වෙත්. මුලොච්ඡින්න කරණ ලද්දාහු වෙත්, කරටිය කැපූ තල් ගසක් මෙන් කරණ ලද්දාහු වෙත්. අභාවප්‍රාප්ත කරණ ලද්දාහු වෙත්. පසුව හට නොගන්නා බවට පමුණුවන ලද්දාහු වෙත්. (මෙහි 6 (i) යෙදිය යුතුයි.) තපස්සියෙක් යයි මට කිය යුතු වන්නේ නම් මේ හේතුවෙනි. යුෂ්මතා යමක් සඳහා කීයෙහි නම් ඒ සඳහා නොවෙයි.

13 "භවත් ගෞතමතෙම අපගර්භයෙකි' (මෙහි 6 (i) යෙදිය යුතුයි.) අපගර්භයෙක්යයි මට කියන්නේ නම් එයට හේතු ඇත්තේමය. බ්‍රාහ්මණය, යමෙකුගේ වනාහි මතු ආත්මභවයෙහි මවු කුස පිළිසිඳ ගැනීමේ ශක්තියද, නැවත නැවත භවයන්හි ඉපදීමේ ශක්තියද, ප්‍රහීණ වූයේ වේද, මුලොච්ඡින්න වූයේ වේද, කරටිය කැපූ තල් ගසක් මෙන් කරණ ලද්දේ වේද, අභාවප්‍රාප්ත කරණ ලද්දේ වේද, නැවත හට නොගන්නා බවට පමුණුවන ලද්දේ වේද, මම ඔහු අප ගර්භයෙක් යයි කියමි.

"බ්‍රාහ්මණය, තථාගතයන්ගේ වනාහි මතු ආත්මභවයෙහි මවු කුස පිළිසිඳ ගැනීමේ ශක්තියද, නැවත නැවත භවයන්හි ඉපදීමේ ශක්තියද, ප්‍රහීණ වූයේ වෙයි. මුලොච්ඡින්න වූයේ වෙයි. කරටිය කැපූ තල් ගසක් මෙන් කරණ ලද්දේ වෙයි. අභාවප්‍රාප්ත කරණ ලද්දේ වෙයි. නැවත හට නොගන්නා බවට පමුණුවන ලද්දේ වෙයි. (මෙහි 6 (i) යෙදිය යුතුයි.) අප ගර්භයෙකැයි මට කියයුතු වන්නේ නම් මේ හේතුවෙනි. යුෂ්මතා යමක් සඳහා කීයෙහි නම් ඒ සඳහා නොවෙයි."

14. "බ්‍රාහ්මණය, යම්සේ වනාහි කිකිළියකගේ බිත්තර අටක් හෝ දහයක් හෝ දොළසක් වෙත්ද, ඒ බිත්තර ඒ කිකිළිය විසින් මනාකොට රකින ලද්දාහු වෙත්ද, එයින් යම්කිසි කුකුළු පැටියෙක් (තමාගේ) පාදයෙහි නියපොතු වලින් හෝ හොටෙන් හෝ බිත්තර කටුව පලා සැපසේ පළමුකොට පිටතට නික්මුනේ වේද, කිමෙක්ද? ඔහුට වැඩි මහල්ලාය කිය යුතුද? බාලයාය කිය යුතුද?" -"භවත් ගෞතමයාණනි, ඔහුට වැඩි මහල්ලාය කිය යුතුය. හෙතෙම වනාහි ඔවුන්ගේ වැඩිමහල්ලා වෙයි."

15 'බ්‍රාහ්මණය, එපරිද්දෙන්ම වනාහි අවිද්‍යා නැමැති බිත්තර කොපුවෙන් වැළඳ ගත්තාවූ (වටකොට ගත්තාවූ) සත්ත්වයන් අතුරෙන් මම අවිද්‍යා නමැති බීජ කොෂය පලා ලෝකයෙහි අසහාය (එකම) පුද්ගලයෙක් වූයේ අනුත්තරවූ සම්‍යක් සම්බොධිය මනාකොට අවබෝධ කෙළෙමි. බ්‍රාහ්මණය, මම වනාහි ලෝකයාගේ වැඩිමහල්ලා වෙමි. ශ්‍රෙෂ්ඨයා වෙමි.

16. "බ්‍රාහ්මණය, මා විසින් නොපසුබස්නා වීර්‍ය්‍යය පටන් ගන්නා ලද්දේය. නුමුළාවූ සිහිය එළඹ සිටියේ වෙයි. කාය දරථයෙන් තොරවූ සැහැල්ලු කය ඇත්තේ වෙමි. සිත එකඟ වූයේ සමාධියට පැමිණියේ වෙයි.

17. "බ්‍රාහ්මණය, ඒ මම වනාහි කාමයන්ගෙන් වෙන්ව අකුශල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිතවූ විචාර සහිත වූ විවේකයෙන් හටගත් ප්‍රීති සැප ඇත්තාවූ ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරමි. විතර්ක විචාරයන් සන්සිඳවා සිතේ පැහැදීම් ඇතිවූයේ විතර්ක විචාරයන්ගෙන් තොරවූ චිත්තයාගේ එකඟ භාව යයි කියන ලද සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් යුක්තවූ දෙවන ධ්‍යානයට පැමිණ වාසය කරමි.

18. "(ද්විතීයධ්‍යානයෙහි ඇත්තාවූ) ප්‍රීතියෙහිද නොඇලී උපෙක්ෂා සහගතව (දුක් සැප දෙක්හි මද්ධ්‍යස්ථව) වාසය කරයි. සිහි ඇතිව යහපත් ප්‍රඥාවෙන් යුක්තව සැපයද කයින් විඳිමි. ආර්‍ය්‍ය පුද්ගලයෝ උපෙක්ෂා ස්මෘතියෙන් හා සැප විහරණයෙන් යුක්තවූ යම්කිසි ධ්‍යානයක් ගැන කියත්ද, ඒ තෘතීයධ්‍යානයට පැමිණ වාසය කරමි.

19. 'සැප දුක් දෙක පිළිබඳ අදහස දුරුකොට පෙර මෙන් සොම්නස් දොම්නස් දෙක දුරු කිරීමෙන් ලැබිය යුතුවූ දුක් සැප දෙකින් තොර උපෙක්ෂා සහගත සිහියෙන් පිරිසිදුවූ සිවු වැනි ධ්‍යානයට (සම වැද) පැමිණ වාසය කරමි.

20. "ඒ මම මෙසේ සිත එකඟවූ කල්හි පිරිසිදුවූ කල්හි හාත්පසින් සුද්ධවූ කල්හි කෙලෙස් රහිතවූ කල්හි උපක්ලේශ ධර්මයන් පහව ගිය කල්හි මෘදුවූ කල්හි (විදර්ශනාවට) යොග්‍යවූ කල්හි ස්ථිරවූ කල්හි නොසෙල්වී සිටිනා බවට පැමිණි කල්හි පූර්වෙනිවාස ස්මෘති ඥානය (පෙර විසූ ආත්ම ගැන දැන ගැනීම) පිණිස ඒ සිත යොමු කෙළෙමි.

21. "ඒ මම අනේකප්‍රකාරවූ පෙර විසූ ආත්ම සිහි කරමි. ඒ කෙසේද? (උපන්නාවූ) එක ජාතියක්ද ජාති දෙකක්ද (1 අංගුත්තර නිකායේ දුතිය පණ්ණාසකයේ 1. බ්‍රාහ්මණ වර්ගයේ 8 සූත්‍රයේ 4, 5, 6, ඡේද මෙහි යෙදිය යුතුයි.)

22. "බ්‍රාහ්මණය, ඒ රාත්‍රියෙහි ප්‍රථම යාමයෙන් මට මේ ප්‍රථම විද්‍යාව ලැබුනේය. (මම එයට පැමිණියෙමි.) මෝහය පහව ගියේය. විද්‍යාව උපන්නේය. අන්ධකාරය පහව ගියේය. අලෝකය උපන්නේය. යම්සේ වනාහි අප්‍රමාදව කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව ආත්ම පරිත්‍යාගයෙන් වාසය කරන්නෙකුට (ක්‍රියා කරන්නෙකුට) අවබොධ වන්නේද එසේ අවබොධ කෙළෙමි.

23. "බ්‍රාහ්මණය, කුකුළු පැටියා බීජ කෝෂය පලා නික්මුනාක් මෙන් මේ මාගේ පළමුවන නික්මීමයි. (අවබොධයයි.) (මෙහි 20 ඡේදය යෙදිය යුතුයි.)

24. (අංගුත්තර නිකායේ දුතිය පණ්ණාසකයේ 1. බ්‍රාහ්මණ වර්ගයේ 8 සූත්‍රයේ 8 ඡේදයේ "හෙතෙම" වෙනුවට "මම" යයි වෙනස්කර යොදාගත යුතුයි.)

25. "බ්‍රාහ්මණය, ඒ රාත්‍රියෙහි මද්ධ්‍යම යාමයෙහි මට මේ දෙවෙනි විද්‍යාව ලැබුනේය. (එයට පැමිණියෙමි) මෝහය පහව ගියේය. විද්‍යාව උපන්නේය. අන්ධකාරය පහව ගියේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ආලෝකය උපන්නේය. යම්සේ වනාහි අප්‍රමාදව කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව ආත්ම පරිත්‍යාගයෙන් වාසය කරන්නෙකුට (අවබෝධ වන්නේද එසේ අවබෝධ කෙළෙමි)

**26.** "බ්‍රාහ්මණය, කුකුළු පැටියා බීජ කොෂය පලා නික්මුනාක් මෙන් මේ මාගේ දෙවැනි නික්මීමයි. (අවබෝධයයි.) ඒ මම මෙසේ සිත එකඟවූ කල්හි පිරිසිදුවූ කල්හි භාත්පසින් සුද්ධවූ කල්හි කෙලෙස් රහිතවූ කල්හි උපක්ලේශ ධර්මයන් පහව ගිය කල්හි මෘදුවූ කල්හි (විදර්ශනාවට) යොග්‍යවූ කල්හි ස්ථිරවූ කල්හි නොසෙල්වී සිටින බවට පැමිණි කල්හි (කාමාදී) ආශ්‍රවයන් ක්ෂය කිරීම පිණිස ඒ සිත යොමු කෙළෙමි. (යෙදවූයෙමි.)

**27.** "ඒ මම (මේ ලෝකය) දුක යයි තත්ත්වාකාරයෙන් (ඇති සැටියටම) යහපත්ව අවබෝධ කෙළෙමි. මේ (තෘෂ්ණාව) දුක් ඉපදීමේ හේතුවයයි තත්ත්වාකාරයෙන් අවබෝධ කෙළෙමි. මේ දුක් නැති කිරීමෙන් (ලබන) නිර්වාණයයයි තත්ත්වාකාරයෙන් අවබෝධ කෙළෙමි, මේ දුක් නැති කිරීමේ මාර්ගයයයි තත්ත්වාකාරයෙන් අවබෝධ කෙළෙමි.

**28** "මේ ආශ්‍රවයෝයයි තත්වාකාරයෙන් අවබොධ කෙළෙමි. මේ ආශ්‍රවයන් ඉපදීමට හේතුවවූ තෘෂ්ණාව යයි තත්වාකාරයෙන් අවබොධ කෙළෙමි. මේ ආශ්‍රවයන්ගේ නිරුද්ධවීමෙන් ලබන නිර්වාණයයි තත්වාකාරයෙන් අවබොධ කෙළෙමි. මේ ආශ්‍රවයන් නිරුද්ධ කිරීමේ මාර්ගයයි තත්වාකාරයෙන් අවබෝධ කෙළෙමි.

**29.** "එසේ දැනගත්තාවූ එසේ දැක්කාවූ මාගේ සිත කාමාශ්‍රවයන්ගෙනුදු මිදුනේය. භාවාශ්‍රවයන්ගෙනුදු මිදුනේය. දෘෂ්ටි ආශ්‍රවයන්ගෙනුදු මිදුනේය. අවිජ්ජා ආශ්‍රවයන්ගෙනුදු මිදුනේය. මිදුනුකල්හි මිදුනේයයි දැන ගතිමි.

**30.** "නැවත ඉපදීමේ ශක්තිය ක්ෂයවූයේය. (අවසාන වූයේය.) ශාසන බ්‍රහ්මචරියාවෙහි වැස නිමකෙළෙමි. (නිර්වාණය විමුක්තිය පිණිස) කළයුතු දේ කොට නිමකෙළෙමි. මේ ආත්මයෙන් කළයුතුවූ අනිකක් නැතැයි සම්පූර්ණයෙන් දැනගතිමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

31. "බ්‍රාහ්මණය, ඒ රාත්‍රියෙහි අවසාන යාමයෙහි මට මේ තුන්වැනි විද්‍යාව ලැබුනේය. (එයට පැමිණියෙමි.) මෝහය පහව ගියේය. විද්‍යාව උපන්නේය. අන්ධකාරය පහව ගියේය. ආලෝකය උපන්නේය. යම් සේ වනාහි අප්‍රමාදව කෙළෙස් තවන වීයර්‍යයෙන් යුක්තව ආත්ම පරිත්‍යාගයෙන් වාසය කරන්නෙකුට (අවබොධ වන්නේද එසේ අවබොධ කෙළෙමි)

32. "බ්‍රාහ්මණය, කුකුළු පැටියා බීජකෝෂය පලා නික්මුණාක් මෙන් මේ මාගේ තුන් වැනි නික්මීමයි (අවබොධයයි.)

33. "මෙසේ වදාළකල්හි වේරඤ්ජා බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළකෙළේය. "පින්වත් ගෞතමයන් වහන්ස, (ඔබවහන්සේ) වැඩිමහල්ලාය. පින්වත් ගෞතමයාණන් වහන්සේ ශ්‍රෙෂ්ඨයායි (අංගුත්තර නිකායේ 7 මහාවර්ගයේ 13 සූත්‍රයේ 27 ඡේදයේ අන්තිම කොටස යෙදිය යුතුයි. 330 පිට)

2 **සීහසේනාපති සූත්‍රයඃ-** 1. 'එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විශාලාමහනුවර මහවනයෙහි වූ කූටාගාර ශාලාවෙහි වැඩවාසය කරණසේක. එසමයෙහි වනාහි (ii) ප්‍රසිද්ධවූ කීර්තිමත්වූ බොහෝ ලිච්ඡවී (රජදරුවෝ) රැස්වීම් ශාලාවෙහි රැස්ව හුන්නාහු අනේකප්‍රකාරයෙන් බුදුන්ගේ ගුණ කියත්. ධර්මයේ ගුණ කියත්. සංඝයාගේ ගුණ කියත්.

2. "එසමයෙහි වනාහි නිඝණ්ඨ ශ්‍රාවකවූ සීහ සේනාධිපතියා ඒ පිරිසෙහි හුන්නේවෙයි. එකල්හි සීහ සේනාධිපතියාට මෙබඳු වූ සිතක් ඇතිවූයේය. නිසැකවම ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත් සම්‍යක් සම්බුද්ධ වන සේක. (මෙහි 1 (i) යෙදිය යුතුයි.)

"මම ඒ භාග්‍යවත්වූ අර්හත් සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ දැකීම පිණිස පැමිණෙන්නෙම් නම් ඉතා යෙහෙකැ,යි"

3. "ඉක්බිති සීහ සෙනාධිපතියා නිගණ්ඨනාත පුත්‍රයා යම්තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ නිගණ්ඨනාත පුත්‍රයාට මෙසේ සැළකෙළේය.

"ස්වාමීන් වහන්ස, මම ශ්‍රමණභවත් ගෞතමයාණන් වහන්සේ දැකීම සඳහා පැමිණෙන්නට කැමැත්තෙමි"යි

"සීහය, කිමෙක්ද? ඔබ ක්‍රියාවාදී වූයේ අක්‍රියවාදීවූ ශ්‍රමණ භවත් ගෞතමයා දැකීම පිණිස එළඹෙන්නේද, සීහය, ශ්‍රමණ භවත් ගෞතමයා අක්‍රියාවාදියෙකි. අක්‍රිය පිණිස දහම් දෙසයි. ඒ ධර්මයෙහි ශ්‍රාවකයන් හික්මවයි."

4. "එකල්හි භාග්‍යවතුන් වහන්සේ දැකීම පිණිස සීහ සේනාධිපතියාගේ ගමනෙහි කටයුතු සම්පාදනය සන්සිඳුනේය. දෙවනුවද (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) දෙවනුවද සීහ සේනාධිපතියාට මේ සිත වූයේය. 'නිසැකවම ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත් සම්‍යක් සම්බුද්ධ වනසේක. මේ (මෙහි 1 (ii) යෙදිය යුතුයි.)

"මම ඒ භාග්‍යවත්වූ අර්හත් සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ දැකීම පිණිස පැමිණෙන්නෙම් නම් ඉතා යෙහෙකැ'යි.

5. (මේ ඡේදය 3 ඡේදය මෙනි.)

6. "දෙවනුවද භාග්‍යවතුන් වහන්සේ දැකීම පිණිස සීහ සේනාධිපතියාගේ ගමනෙහි කටයුතු සම්පාදනය සන්සිඳුනේය. වැළකුනේය. තුන්වෙනුවද (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) තුන්වෙනුවද සීහ සෙනාධිපතියාට මේ සිත ඇතිවූයේය.

"නිසැකවම ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත් සම්‍යක් සම්බුද්ධ වනසේක. (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) ඒනිසාමය. මම ඒ භාග්‍යවත්වූ අර්හත් සම්‍යක් සම්බුදු රජාණන්වහන්සේ දැකීම පිණිස එළඹෙන්නෙම් නම් ඉතා යෙහෙක (නිගණ්ඨයින්ගෙන්) විචාළා හෝ නොවිචාළා හෝ නිගණ්ඨයෝ මට කුමක් කෙරෙත්ද? මම ඒ නිගණ්ඨයින්ගෙන් නො විචාරාම ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ දැකීම පිණිස පැමිණෙත් නම් ඉතා යෙහෙකැ' යි

7. "ඉක්බිති සීහ සේනාධිපතියා මද්ධ්‍යාහ්ණ කාලය ඉක්මවූ පමණින් පන්සියයක් පමණ රථ සේනාව සමග භාග්‍යවතුන්වහන්සේ දැකීම පිණිස විශාලාමහනුවරට පිටත් වූයේය. රථයෙන් යායුතු භූමිප්‍රදෙශය යම්තාක්ද ඒතාක් රථයෙන් ගොස් රථයෙන් බැස පයින්ම ආරාමයට ඇතුල්වූයේය. ඉක්බිති සීහ සේනාධිපතියා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද

එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ සීහ සේනාධිපතියා භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළකෙළේය.

8. "ස්වාමීන් වහන්ස, (ii) ශ්‍රමණ භවත් ගෞතමයාණන් වහන්සේ අකිරිය වාදියෙකි, අකිරිය පිණිස ධර්මය දෙශනා කරයි, ඒ ධර්මයෙන් ශ්‍රාවකයන් හික්මවයි. (iii) කියා මා විසින් අසනලදී. ස්වාමීන් වහන්ස, යම්කිසිවෙක් (මෙහි 8 (ii) යෙදිය යුතුයි.) "යන්න කියත් නම් කිමෙක්ද ස්වාමීන්වහන්ස, ඔවුහු භාග්‍යවතුන් වහන්සේ දෙශනාකළ දෙශනාවක් කියන්නාහුද? භාග්‍යවතුන් වහන්සේට බොරුවෙන් චෝදනා නොකරන්නාහු ද? (දෙශනාකළ) ධර්මයට අනුකූලවූ ධර්මයක් ප්‍රකාශ කරන්නාහුද? ධර්මය අනුව වාදයට බැසගැනීමක් නොවන්නේද, ගර්හා කටයුතු තැනකට නොපැමිණේද? ස්වාමීන් වහන්ස, අපි වනාහි භාග්‍යවතුන් වහන්සේට බොරු චෝදනා නොකරණු කැමැත්තෝ වෙමු.

9. "සීහය, යම්කිසි හේතුවකින් යහපත්ව (යුක්ති සහගතව) කථාකරන්නාවූ යම් කිසිවෙක් (මෙහි 8 (ii) යෙදිය යුතුයි.) කියා මට කියන්නේ නම් එයට හේතු ඇත්තේමය.

10. (i) "සීහය, යම්කිසි හේතුවකින් යහපත්ව (යුක්ති සහගතව) කථාකරන්නාවූ යම්කිසිවෙක් ශ්‍රමණ භවත් ගෞතමතෙම කිරියවාදියෙක්ය. ක්‍රියා පිණිස ධර්මය දෙශනා කරයි. ඒ ධර්මයෙන් ශ්‍රාවකයින් හික්මවයි. (ii) කියා මට කියන්නේ නම් එයටද හේතු ඇත්තේමය.

11. (i) "සීහය, යම්කිසි හේතුවකින් යහපත්ව (යුක්ති සහගතව) කථාකරන්නාවූ යම්කිසිවෙක් ශ්‍රමණභවත් ගෞතම තෙම උච්ඡේද වාදියෙක්ය, උච්ඡේදය පිණිස ධර්මය දෙශනා කරයි. ඒ ධර්මයෙන් ශ්‍රාවකයින් හික්මවයි." (ii) කියා මට කියන්නේ නම් එයටද හේතු ඇත්තේමය.

12. (i) "සීහය, යම්කිසි හේතුවකින් යහපත්ව (යුක්ති සහගතව) කථාකරන්නාවූ යම්කිසිවෙක් ශ්‍රමණභවත් ගෞතම

තෙම ජේගුච්ඡියෙකි (පිළිකුල් කරන්නෙකි.) පිළිකුල් කිරීම පිණිස ධර්මය දෙශනා කරයි. ඒ ධර්මයෙන් ශ්‍රාවකයන් හික්මවයි. (ii) කියා මට කියන්නේනම් එයටද හේතු ඇත්තේමය.

13. (i) "සීහය, යම්කිසි හේතුවකින් යහපත්ව (යුක්ති සහගතව) කථාකරන්නාවූ යම් කිසිවෙක් ශ්‍රමණ භවත් ගෞතමතෙම වේනයිකයෙකි (හික්මිය යුත්තෙකි.) හික්මීම පිණිස ධර්මය දෙශනා කරයි, ඒ ධර්මයෙන් ශ්‍රාවකයින් හික්මවයි, (ii) කියා මට කියන්නේ නම් එයටද හේතු ඇත්තේමය.

14. (i) "සීහය, යම්කිසි හේතුවකින් යහපත්ව (යුක්ති සහගතව) කථාකරන්නාවූ යම්කිසිවෙක් ශ්‍රමණ භවත් ගෞතම තෙම තපස්සියෙක්ය. තපස්බව පිණිස ධර්මය දෙශනාකරයි. ඒ ධර්මයෙන් ශ්‍රාවකයන් හික්මවයි (ii) කියා මට කියන්නේ නම් එයටද හේතු ඇත්තේමය.

15. (i) "සීහය, යම්කිසි හේතුවකින් යහපත්ව (යුක්ති සහගතව) කථාකරන්නාවූ යම්කිසිවෙක් ශ්‍රමණ භවත්ගෞතම තෙම අපගර්භයෙක්ය. අපගර්භභාවය පිණිස ධර්මය දෙශනාකරයි. ඒ ධර්මයෙන් ශ්‍රාවකයන් හික්මවයි (ii) කියා, මට කියන්නේ නම් එයටද හේතු ඇත්තේමය.

16. (i) "සීහය, යම්කිසි හේතුවකින් යහපත්ව (යුක්ති සහගතව) කථාකරන්නාවූ යම්කිසිවෙක් ශ්‍රමණභවත්ගෞතම තෙම අස්සාසයෙක්ය. අස්වැසීම කිරීම පිණිස ධර්මය දෙශනා කරයි. ඒ ධර්මයෙන් ශ්‍රාවකයන් හික්මවයි. (ii) කියා මට කියන්නේනම් එයටද හේතු ඇත්තේමය.

17. (i) "සීහය, යහපත්ව (යුක්ති සහගතව) කථාකරන්නාවූ යම්කිසිවෙක් ශ්‍රමණ භවත් ගෞතමතෙම අකිරියවාදියෙකි අකිරියපිණිස ධර්මය දෙශනාකරයි. ඒ ධර්මයෙන් ශ්‍රාවකයන් හික්මවයි (ii) කිරීමට (ඇති) හේතු කවරේද? සීහය, මම වනාහි කාය දුශ්චරිතයද, වචී දුශ්චරිතයද මනො දුශ්චරිතයද නොකළයුතුයයි කියමි. අනෙකප්‍රකාරවූ පවිටුවූ අකුශල ධර්මයන් නොකළයුතුයයි කියමි (මෙහි 17 (i) යෙදිය යුතුයි.)

18 (මෙහි 10 (i) යෙදිය යුතුයි. කීමට (ඇති) හේතු කවරේද? සීහය, මම වනාහි කාය සුචරිතයද, වචීසුචරිතයද, මනො සුචරිතයද කට යුතුයයි කියමි, අනේක ප්‍රකාරවූ කුශල ධර්මයන් කළ යුතුයයි කියමි, (මෙහි 10 (i) යෙදිය යුතුයි.) කියා මට කියන්නේ නම් එයට හේතුව මෙයයි.

19. (මෙහි 11 (i) යෙදිය යුතුයි.) කීමට හේතු කවරේද? සීහය, මම වනාහි රාගයද ද්වෙෂයද මෝහයද සහමුලින් සිඳිය යුතුයයි කියමි. අනේකප්‍රකාරවූ පවිටුවූ අකුශල ධර්මයන් සහමුලින් සිඳිය යුතුයයි කියමි.

20. (මෙහි 12 (i) යෙදිය යුතුයි.) කියා මට කියන්නේ නම් එයට හේතුව මෙයයි. (මෙහි 12 (i) යෙදිය යුතුයි.) කීමට හේතු කවරේද? සීහය මම වනාහි කායදුශ්චරිතයද, වචීදුශ්චරිතයද, මනොදුශ්චරිතයද, පිළිකුල් කරමි. අනේක ප්‍රකාරවූ පවිටුවූ අකුශල ධර්මයන්ට පැමිණීම පිළිකුල් කරමි. (මෙහි 12 (i) යෙදිය යුතුයි.) මට කියන්නේ නම් එයට හේතුව මෙයයි.

21. (මෙහි 13 (i) යෙදිය යුතුයි.) කීමට හේතු කවරේද? සීහය මම වනාහි රාගයද ද්වෙෂයද මෝහයද විනය (හික්මීම) පිණිස ධර්මය දෙශනා කරමි. අනේක ප්‍රකාරවූ පවිටුවූ අකුශල ධර්මයන් විනය (දුරුකිරීම) පිණිස ධර්මය දෙශනා කරමි. (මෙහි 13 (i) යෙදිය යුතුයි.) කියා මට කියන්නේ නම් එයට හේතුව මෙයයි.

22. (මෙහි 14 (i) යෙදිය යුතුයි.) කීමට හේතු කවරේද? සීහය, මම වනාහි පවිටුවූ අකුශල ධර්මයන් තැවිය යුතුයයි කියමි. කායදුශ්චරිතයද වචීදුශ්චරිතයද මනොදුශ්චරිතයද තැවිය යුතුයයි කියමි. සීහය, යමෙකුගේ වනාහි තැවිය යුතුවූ ලාමකවූ අකුශල ධර්මයෝ ප්‍රහීන වූවාහු වෙත්ද, මුල්සිඳිනා ලද්දාහු වෙත්ද, කරටිය සිඳිනලද තල් ගසක් මෙන් කරන ලද්දාහු වෙත්ද, අභාවප්‍රාප්ත කරණ ලද්දාහු වෙත්ද, නැවත නූපදනා බවට පමුණුවන ලද්දාහු වෙත්ද, මම ඔහු තපස්සියෙක්යයි කියමි සීහය, තථාගතයන් වහන්සේගේ වනාහි තැවිය යුතුවූ ලාමකවූ අකුශල ධර්මයෝ ප්‍රහීන වූවාහු වෙත්, මුල් සිඳිනා ලද්දාහු වෙත්, කරටිය

සිඳිනා ලද තල් ගසක් මෙන් කරණ ලද්දාහු වෙත්, අභාවප්‍රාප්ත කරණ ලද්දාහු වෙත්, නැවත නූපදනා බවට පමුණුවන ලද්දාහු වෙත්, (මෙහි 14 (i) යෙදිය යුතුයි.) කියා මට කියන්නේ නම් එයට හේතුව මෙයයි.

23 (මෙහි 15 (i) යෙදිය යුතුයි.) කීමට හේතුව කවරේද? සීහය, යමෙකුගේ වනාහි නැවත (උත්පත්ති වශයෙන්) මවු ගැබක සයනය කිරීම, නැවත භවයක ඉපදීම ප්‍රහීන වූයේ වේද, මුල් සිඳිනා ලද්දේවේද, කරටිය සිඳින ලද තල් ගසක් මෙන් කරණ ලද්දේවේද, අභාවප්‍රාප්ත කරණ ලද්දේවේද, නැවත නූපදනා බවට පමුණුවන ලද්දේ වේද, මම ඔහුට නැවත නූපදින්නෙක්යයි කියමි. සීහය, තථාගතයන් වහන්සේගේ වනාහි නැවත මවු ගැබක සයනය කිරීම නැවත භවයක ඉපදීම ප්‍රහීන වූයේ වෙයි. මුල් සිඳිනා ලද්දේ වෙයි, කරටිය සිඳිනා ලද තල් ගසක් මෙන් කරණ ලද්දේ වෙයි, අභාවප්‍රාප්ත කරණ ලද්දේ වෙයි, නැවත නූපදනා බවට පමුණුවන ලද්දේ වෙයි, (මෙහි 15 (i) යෙදිය යුතුයි.) කියා මට කියන්නේ නම් එයට හේතුව මෙයයි.

24. (මෙහි 16 (i) යෙදිය යුතුයි.) කීමට හේතු කවරේද? සීහය, මම වනාහි සතර මාර්ග ඵල සංඛ්‍යාතවූ උතුම්වූ අස්වැසීමෙන් සනසමින් සැනසීම පිණිස ධර්මය දෙශනා කරමි. ඒ ධර්මයෙන් ශ්‍රාවකයන් හික්මවමි. (මෙහි 16 (i) යෙදිය යුතුයි.) කියා මට කියන්නේ නම් එයට හේතුව මෙයයි.

25. "මෙසේ දෙශනා කළ කල්හි සීහ සේනාධිපතියා භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළ කෙළේය. "ස්වාමීන් වහන්ස, ඉතා යෙහෙකි. (මෙහි අංගුත්තර නිකායේ 7 මහා වර්ගයේ 12 සූත්‍රයේ 27 ඡෙදයේ අග කොටස යෙදිය යුතුයි.) (පිට 330)

26. 'සීහය, පරීක්ෂාකර (බලා) එසේ කරව. පරීක්ෂාකර (එසේ) කිරීම තොප වැනි ප්‍රසිද්ධ මනුෂ්‍යයන්ට යහපති"

"ස්වාමීන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මට 'සීහය, පරීක්ෂාකර බලා එසේ කවර. පරීක්ෂාකර (එසේ) කිරීම තොප වැනි ප්‍රසිද්ධ මනුෂ්‍යයන්ට යහපති' කියා යම් වචනයක් වදාරණ

ලදද. එයිනුදු මම භාග්‍යවතුන් වහන්සේට ඉතාමත්ම පැහැදුනෙමි. ඉතාමත්ම සතුටු වූයෙමි.

27. "ස්වාමීන් වහන්ස, අන්‍ය තීර්ථකයෝ සීහ සේනාධිපතියා අපගේ ශ්‍රාවක භාවයට පැමිණියේ යයි මා (වැනි) ශ්‍රාවකයෙක් ලැබී සියලුම විශාලා මහනුවර ප්‍රකටව පරිහරණය කරත්. (හැසිරෙත්) එසේ ඇති කල්හි භාග්‍යවතුන් වහන්සේ 'සීහය, පරීක්ෂා කර බලා එසේ කරව. පරීක්ෂාකාරී වීම තොප වැනි ප්‍රසිද්ධ මනුෂ්‍යයන්ට යහපති කියා' මෙසේ වදාළසේක.

"ස්වාමීන් වහන්ස, ඒ මම දෙවැනිවත් භාග්‍යවතුන් වහන්සේ සරණ යමි. ධර්මයද (සරණ යමි) (සංඝයාද (සරණ යමි) භාග්‍යවතුන් වහන්සේ මා අද පටන් දිවිහිමි කොට සරණ ගියාවූ උපාසකයෙකු ලෙස දරණ සේක්වා.

28. (i) "සීහය, බොහෝ කාලයක් මුළුල්ලෙහි තොපගේ කුලය (ගෙදරට) නිගණ්ඨයින්ට සාදා තුබූ පැන් ශාලාවක් (පින් පැන් තාලියක්) බඳුවිය. ඒ නිසා (නිවසට) පැමිණියාවූ ඔවුන්ටද පිණ්ඩපාතය දියයුතු යයි (ii) සිතන්නෙහිය.

"ස්වාමීන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මට (මෙහි 28 (i) යෙදිය යුතුයි.) යම් වචනයක් වදාරණ ලදද, එයිනුදු මම භාග්‍යවතුන් වහන්සේට ඉතාමත්ම පැහැදුනෙමි. ඉතාමත්ම සතුටු වූයෙමි.

29. "ස්වාමීන් වහන්ස, ශ්‍රමණ භවත් ගෞතමයාණන් වහන්සේ මටම දන් දිය යුතුය, අන්‍යයන්ට දන් නොදිය යුතුය මගේම ශ්‍රාවකයින්ට දන් දිය යුතුය, අන්‍යයන්ගේ ශ්‍රාවකයින්ට දන් නොදිය යුතුය. මට දුන් දානයම මහත්ඵල වන්නේය. අන්‍යයන්ට දුන් දානය මහත්ඵල නොවන්නේය, මගේ ශ්‍රාවකයින්ට දුන් දානයම මහත් ඵල වන්නේය. අන්‍යයන්ගේ ශ්‍රාවකයින්ට දුන් දානය මහත් ඵල නොවන්නේ යයි යන මේ වදාළේ යයි මා විසින් අසන ලදී. එසේදවූවත් භාග්‍යවතුන් වහන්සේ මා නිගණ්ඨයින්ට දන් දීමෙහිද සමාදන් කරවයි. (යොදවයි) ස්වාමීන් වහන්ස, එසේදවුවත් අපි මේ කරුණෙහි කාලය දැන ගන්නෙමු. ස්වාමීන් වහන්ස, ඒ මම තුන් වෙනුවත්

භාග්‍යවතුන් වහන්සේ සරණ යමි. ධර්මයද (සරණ යමි.) (සංඝයාද සරණ යමි.) භාග්‍යවතුන් වහන්සේ මා අද පටන් දිවිහිම් කොට සරණ ගියාවූ උපාසකයෙකු ලෙස දරණ සේක්වා.”

30. “ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සීහ සේනාධිපතියාට අනුපූර්ව කථාව (පිළිවෙළ කථාව) දෙශනා කළසේක. කෙසේද? දානමය පුණ්‍යක්‍රියාව පිළිබඳ කථාවද, සීලමය පුණ්‍යක්‍රියාව පිළිබඳ කථාවද ස්වර්ග සම්පත්තිය පිළිබඳ කථාවද, කාමයන්ගේ ආදීනවය ලාමක බව සහ කෙලෙස් සහිත බවද, ගිහිගෙන් නික්ම පැවිදිවීම හා නිවන් ලැබීමෙහි ආනිශංසද, වදාළසේක. (එසේ දෙශනා කරණ අතර) යම් අවස්ථාවක භාග්‍යවතුන් වහන්සේ සීහ සේනාධිපතියාගේ නිරෝගීවූ සිත ඇති බවද, මෘදුවූ සිත ඇති බවද නීවරණයන්ගෙන් පහවූ සිත ඇති බවද, ඔද වැඩියාවූ සිත ඇති බවද ප්‍රසන්නවූ සිත ඇති බවද දැනගත් සේක්ද, එකල්හි බුදුවරයන්ගේ සාමුක්කංසික ධර්ම දෙශනා නම්වූ දුක්ඛ, සමුදය, නිරොධ, මාර්ග යන (චතුරාර්‍ය්‍ය සත්‍යය) යම් දෙශනාවක් වීනම් ඒ දෙශනාව වදාළසේක.

31. යම්සේ වනාහි පහව ගියාවූ කිලුටු ඇති ශුද්ධවූ වස්ත්‍රයක් මනාකොට රජනය (වර්ණ කිරීම) පිළිගන්නේද එපරිද්දෙන්ම වනාහි සීහ සේනාධිපතියාට ඒ ආසනයෙහිදීම, උපදින ස්වභාවය ඇත්තාවූ යම්කිසිවක් ඇත්නම් ඒ සියල්ලම නැති වන විනාශවන ස්වභාවය යයි, කෙලෙස් රජසින් තොරවූ නිර්මලවූ ධර්ම චක්ෂුස (ධර්ම ඥානය) පහළ වූයේය.

32. ඉක්බිති ඒ දක්නාලද නිර්වාණ ධර්මය ඇත්තාවූ, අවබෝධ කරණ ලද නිර්වාණ ධර්මය ඇත්තාවූ, බැස ගන්නා ලද නිර්වාණ ධර්මය ඇත්තාවූ, තරණය කරණ ලද කථං කථ සංඛ්‍යාත (බුද්ධාදී අට තැන්හි) සැකය ඇත්තාවූ, (විචිකිච්ඡාව පහව ගියාවූ), විශාරද භාවයට පැමිණියාවූ, බුදු සසුනෙහි (නිවන් අවබෝධය සඳහා) බාහිර ප්‍රත්‍යය නොසෙවිය යුතුවූ සීහ සේනාධිපතියා, භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළ කෙළේය.

33. “ස්වාමීන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා සමග හෙට දින මාගේ භික්ෂාදානය ඉවසන සේක්වා.”

භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්ද වීමෙන් (ඒ ආරාධනාව) ඉවසූසේක. ඉක්බිති සීහසේනාධිපතියා භාග්‍යවතුන් වහන්සේ ආරාධනාව පිළිගත්බව දැන හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට මනාකොට වැඳ ප්‍රදක්ෂිණාකොට ගියේය

34. "ඉක්බිති සීහ සේනාධිපතියා එක්තරා පුරුෂයෙකුට ආමන්ත්‍රණය කෙළේය.

'එම්බා පුරුෂය, තෙපි යව, පවත්ත මාංශය දැන ගනුව, (ආපණ ශාලාවෙහි වෙළඳාමට තිබෙන මාංශය ගෙනෙව) ඉක්බිති සීහ සේනාධිපතියා ඒ රැය ඉක්ම ගිය කල්හි සිය නිවසෙහි ප්‍රණීතවූ ඛාද්‍යය භොජ්‍යය සම්පාදනය කොට භාග්‍යවතුන් වහන්සේ (වෙත පැමිණ) 'ස්වාමීන් වහන්ස, භික්ෂා දානය සම්පාදනය කොට නිමවූ වෙමි. (වැඩමවීමට) කාලයයි' කාලය දැන්වූයේය.

35. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරව පාත්‍ර සිවුරු රැගෙන සීහ සේනාධිපතියාගේ නිවස යම් තැනකද එතැන්හි පැමිණිසේක. පැමිණ භික්ෂු සංඝයා සමග පණවන ලද අසුනෙහි වැඩහුන් සේක.

36. එසමයෙහි වනාහි බොහෝ නිගණ්ඨයෝ විශාලා මහනුවර වීදියක් වීදියක් පාසා හන්දියක් හන්දියක් පාසා, 'අද සීහ සේනාධිපතියා විසින් ගෝන මී ඌරු ආදිවූ මහත් සතුන් රාශියක් මරා ශ්‍රමණ භවත් ගෞතමයාට බතක් සම්පාදනය කරණ ලදී. ශ්‍රමණ භවත් ගෞතමයා දැන දැන ඒ තමා උදෙසා කරණලද තමා නිසා කරණලද මාංශය අනුභව කරයි." කියා හිස අත් බැඳ ගෙන කෑගසත්.

37. එකල්හි එක්තරා පුරුෂයෙක් සීහ සේනාධිපතියා යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ "ස්වාමීන් වනහ්ස, කරුණක් දන්නවාද? අද සීහ සේනාධිපතියා විසින් ගෝන මී ඌරු ආදීවූ මහත් සතුන් රාශියක් මරා ශ්‍රමණ භවත් ගෞතමයාට බතක් සම්පාදනය කරණ ලදී. ශ්‍රමණ භවත් ගෞතමයා දැන දැන ඒ තමා උදෙසා කරණ ලද තමා නිසා කරණ ලද මාංශය අනුභව කරයි,' කියා අර බොහෝ නිගණ්ඨයෝ විශාලා මහනුවර

වීදියක් පාසා හන්දියක් පාසා හිස අත් බැඳගෙන කෑ ගසත් යයි" සීහ සේනාධිපතියාගේ කණ සමීපයෙහි (සිට) සැළ කෙළේය.

32. "ආයුෂ්මතුන් වහන්සේ, කමක් නැත ඒ ආයුෂ්මතුන් බොහෝ කලක් මුළුල්ලෙහිම බුදුන්ගේ අගුණ කීමට කැමැත්තෝය. ධර්මයේ අගුණ කීමට කැමැත්තෝය, සංඝයාගේ අගුණ කීමට කැමැත්තෝය. ඒ භාග්‍යවතුන් වහන්සේට අසත්‍යවූ හිස්වූ බොරුවූ සිදු නොවූ (දේ ගැන) බොරු චොදනා කරන්නාවූ ඒ ආයුෂ්මත්හු ඒ (අකුශලය) නොදිරවත්, (නොගෙවත්,) අපි ජීවිතය නිසාවත් දැන දැන සතෙකුගේ ප්‍රාණය තොර නොකරන්නෙමු.

39 ඉක්බිති සීහ සේනාධිපතියා බුදුන් ප්‍රමුඛවූ භික්ෂු සංඝයා ප්‍රණීතවූ ඛාද්‍ය භොජ්‍යයෙන් සියතින් සන්තර්පණය කෙළේය. (පෙරත්ත කොට වැළඳවූයේය.) ඉක්බිති සීහ සේනාධිපතියා, භාග්‍යවතුන් වහන්සේ වළඳා පාත්‍රයෙන් හස්තය ඉවතට ගත්කල්හි එකත්පසෙක්හි හුන්නේය එකත්පසෙක හුන්නාවූ සීහ සේනාධිපතියාට භාග්‍යවතුන්වහන්සේ ධර්ම කථාවෙන් (කරුණු) දක්වා, සමාදන් කරවා, උද්‍යොගී කරවා, ප්‍රසන්න කරවා, හුනස්නෙන් නැගිට වැඩි සේක."

13 **ආජඤ්ඤ සූත්‍රය**:- 1 "මහණෙනි, ගුණාංග අටකින් යුක්තවූ රජුගේ යහපත් ආජානීය අශ්වයා රජුට සුදුසු වෙයි. රජුගේ පරිභොගයට සුදුසු වෙයි. රජුගේ අංගයක්ය යන සංඛ්‍යාවට පැමිණෙයි.

2 "කවර ගුණාංග අටකින්ද යත්? මහණෙනි, මේ ලොකයෙහි රජහුගේ යහපත් ආජානීය අශ්වයා මවු පාර්ශ්වයෙන්ද පිය පාර්ශ්වයෙන්ද යන දෙපසින් යහපත්ව උපන්නේ වෙයි. යම් දිශාවෙක්හි අන්‍යවූ යහපත් ආජානීය අශ්වයෝ උපදිත් නම් ඒ දිශාවෙහි උපන්නේ වෙයි. ඔහුට අමුවූ හෝ වියලුනාවූ යම්කිසි (තෘණාදි) ආහාරයක් දෙත්නම් එය සකස් කොට නොවිසුරුවාම අනුභව කරයි. අසුචියෙහි හෝ මුත්‍රයෙහි හිඳිනට හෝ නිදීමට පිළිකුල් කරයි. අන්‍යවූ අශ්වයන් ගැසීම් සැපීම් ආදියෙන් නොපෙළයි. (තැතිනොගන්වයි)

හීලෑවූයේ වෙයි. සැපසේ (අන්‍යවූ අශ්වයන්) සමග වසයි. ඔහුගේ යම්කිසි කපටි බවක් හෝ කුළු බවක් හෝ ඇද බවක් හෝ වක් බවක් හෝ වේද, ඒ ගති තත්වූ පරිද්දෙන් නියමුවා හට (හික්මවන්නාහට) පහළ කරන්නේ වෙයි. ඔහුගේ ඒ ගති අස්ගොවුතෙම මැඩ පැවැත්වීම පිණිස උත්සාහ කරයි. සිය කැමැත්තෙන්ම බර උසුලයි. අන්‍යවූ අශ්වයෝ බර උසුලන්නාහු හෝ නූසුලන්නාහු හෝ මම ම මෙහි උසුලන්නෙමියි සිත උපදවයි. ගමන් කරන්නේ වනාහි ඍජු මාර්ගයෙන්ම ගමන් කරයි. ශක්තිසම්පන්න වෙයි. ජීවිතයත් මරණයත් අතර වීර්‍ය්‍යය උපදවන්නේ වෙයි. (ජීවිතය හෝ මරණය ගැන නොලසකා උත්සාහ කරන්නේවෙයි) මහණෙනි, මේ ගුණාංග අටින් යුක්තවූ රජුගේ යහපත්වූ ආජානීය අශ්වයා රජුට සුදුසු වෙයි. රජුගේ පරිභොගයට සුදුසු වෙයි. රජුගේ අංගයක්ය යන සංඛ්‍යාවට පැමිණෙයි.

3 "මහණෙනි, එපරිද්දෙන්ම වනාහි ගුණ ධර්ම අටකින් යුක්තවූ භික්ෂුතෙම (මෙහි ඡක්ක නිපාතයේ ආහුනෙය්‍ය වර්ගයේ 10 සූත්‍රයේ 6 (iii) ඡේදය යෙදිය යුතුයි)

4 "ඒ කවර ගුණ ධර්ම අටකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම සිල්වත් වූයේ වෙයි. ප්‍රාතිමොක්ෂ සංවර ශීලයෙන් සංවරණය වූයේ වෙයි. ආචාර ශීලයෙන් හා ගෝචර ශීලයෙන් යුක්තවෙයි. (සිරිත් විරිත් දන්නේ වෙයි.) ස්වල්ප මාත්‍රවූ වරදෙහි පවා බිය දක්නාසුළු වෙයි. ශික්ෂාපද සමාදන්ව (එහි) හික්මෙයි.

"ඔහුට රූක්ෂවූ හෝ ප්‍රණීතවූ යම්කිසි භෝජනයක් දෙත් නම් (එය) නොනසා සකස්කොට වළඳයි. කාය දුශ්චරිතයද වචී දුශ්චරිතයද, මනො දුශ්චරිතයද පිළිකුල් කරයි. අනේක ප්‍රකාරවූ පවිටුවූ අකුශල ධර්මයන්ට පැමිණීම පිළිකුල් කරයි. සුරතවූයේ වෙයි. සැපසේ (අන්‍ය භික්ෂූන්) සමග වසන්නේ වෙයි. අන්‍ය භික්ෂූන් නොපෙළන්නේ වෙයි. ඔහුගේ යම්කිසි කපටි බවක් හෝ කුළු බවක් හෝ ඇද බවක් හෝ වංක බවක් වීනම් ඒ බැව් තත්වූ පරිද්දෙන් තථාගතයන් වහන්සේ සමීපයෙහි හෝ නැණවත් සබ්‍රම්සරුන් සමීපයෙහි ප්‍රකාශ කරන්නේ වෙයි.

ශාස්තෲන් වහන්සේ හෝ නැණවත් සබ්‍රම්සරහු ඔහුගේ ඒ දුර්ගති මැඩ පැවැත්මට උත්සාහ කරත්. සිය කැමැත්තෙන්ම හික්මෙන ලද්දේ වෙයි. අන්‍යවූ භික්ෂූහු හික්මුනා හෝ නොහික්මුනා හෝ මම ම මෙහි හික්මෙමියි' යන සිත උපදවයි. ගමන් කරන්නේ වනාහි ඍජු මාර්ගයේම ගමන් කරයි. එහි මේ ඍජු මාර්ගයයි. ඒ කවරේද? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාවය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධිය (යනුයි) පටන් ගන්නා ලද වීර්‍ය්‍යය ඇත්තේ වෙයි. (කෙසේද) ඒකාන්තයෙන් මාගේ ශරීරයෙහි සම් නහර ඇට අවශෙෂ වේවා, මස් ලේ වියලේවා, පුරුෂ බලයෙන් පුරුෂ වීර්‍ය්‍යයෙන් පුරුෂ පරාක්‍රමයෙන් පැමිණිය යුතුවූ යමක් ඇත්තේද, එයට නොපැමිණ වීර්‍ය්‍යය බහා තැබීමක් නොවන්නේයයි.

5 "මහණෙනි, මේ ගුණ ධර්ම අටින් යුක්තවූ මහණ තෙම (මෙහි ඡක්ක නිපාතයේ ආහුනෙය්‍ය වර්ගයේ 10 සූත්‍රයේ 6 (iii) ඡෙදය යෙදිය යුතුයි)

14 **බළුංක සූත්‍රය**:- 1 "මහණෙනි, පහත් අශ්වයන් අටදෙනෙක්ද, අශ්ව දෝෂ අටක්ද, පහත් පුරුෂයන් අට දෙනෙක්ද පුරුෂ දෝෂ අටක්ද දෙශනා කරන්නෙමි. එය ශ්‍රවණය කරවූ, මනාකොට මෙනෙහි කරවු (සිත්හි ධාරණය කරවු) දෙශනා කරන්නෙමි" "එසේය, ස්වාමීනියි කියා" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍ර ධර්මය වදාළසේක.

2 "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් අශ්ව බළුංකයෙක් අස්ගොවුවා විසින් යවයි කියන ලද්දේ (දක්කනු ලබන්නේ) කෙවිටි කරනු ලබන්නේ චෝදනා කරනු ලබන්නේ පස්සට පසුබසී. පිටෙන් රථය පෙරලයි. මහණෙනි, මේ ලොකයෙහි මෙබඳුවූද ඇතැම් අශ්ව බළුංකයෙක් වෙයි. මහණෙනි, මේ වනාහි පළමුවන අශ්ව දෝෂයයි

3 "මහණෙනි, නැවතද මෙහි ඇතැම් අශ්ව බළුංකයෙක් අස්ගොවුවා විසින් යවයි කියනු ලබන්නේ, කෙවිටි කරනු

ලබන්නේ චෝදනා කරනු ලබන්නේ පසු පා දෙක ඔසවා එයින් ගසා රථයේ කූර්බරය බිඳී. ත්‍රිදණ්ඩය බිඳී. මහණෙනි, මේ ලෝකයෙහි මෙබඳුවූද ඇතැම් අශ්ව බලුංකයෙක් වෙයි. මහණෙනි, මේ වනාහි දෙවැනි අශ්ව දෝෂයයි.

4 "මහණෙනි, නැවතද මේ ලෝකයෙහි ඇතැම් අශ්ව බලුංකයෙක් අස්ගොවුවා විසින් යවයි කියනු ලබන්නේ කෙවිටි කරනු ලබන්නේ චෝදනා කරණු ලබන්නේ හිස නමා වියගස භූමියෙහි හෙලා කලවයෙන් රිය හිසට ගසා පෙර පා දෙකින් වියගස මඩිමින් සිටී. මහණෙනි, මේ ලෝකයෙහි මෙබඳුවූද ඇතැම් අශ්ව බලුංකයෙක් වෙයි මහණෙනි, මේ වනාහි තෙවැනි අශ්ව දෝෂයයි.

5 "මහණෙනි, නැවතද මේ ලොකයෙහි ඇතැම් අශ්ව බලුංකයෙක් අස්ගොවුවා විසින් යවයි කියනු ලබන්නේ කෙවිටි කරනු ලබන්නේ චෝදනා කරනු ලබන්නේ (ii) නොමඟයයි. හෙලක හෝ කටු ලැහැබක රථය නංවයි. මහණෙනි මේ ලෝකයෙහි මෙබඳුවූද ඇතැම් අශ්ව බලුංකයෙක් වෙයි. මහණෙනි, මේ වනාහි සිවුවැනි අශ්ව දෝෂයයි.

6 (මෙහි 5 (i) යෙදිය යුතුයි) ඉදිරි කය (ශරීරය) ලංඝනය කරයි. ඉදිරි පා දෙක දැඩිකොට ගනී. මහණෙනි, මේ ලෝකයෙහි මෙබඳුවූද ඇතැම් අශ්ව බලුංකයෙක් වෙයි. මහණෙනි, මේ වනාහි පස්වැනි අශ්ව දෝෂයයි.

7 (මෙහි 5 (i) යෙදිය යුතුයි) අස්ගොවුවාගේ වචනය නොසලකා කෙවිටි කිරීම නොසලකා කටකලියාව හැරදමා කැමැතිසේ ගමන් කරයි. මහණෙනි, මේ ලෝකයෙහි මෙබඳුවූද ඇතැම් අශ්ව බලුංකයෙක් වෙයි. මහණෙනි, මේ වනාහි සවැනි අශ්ව දෝෂයයි.

8 (මෙහි 5 (i) යෙදිය යුතුයි) ඉදිරියටත් නොයයි. පස්සටත් නොයයි. එහිම නොසෙල්වී සිටියි. මහණෙනි, මේ ලෝකයෙහි මෙබඳුවූද ඇතැම් අශ්ව බලුංකයෙක් වෙයි. මහණෙනි, මේ වනාහි සත්වැනි අශ්ව දෝෂයයි.

9 (මෙහි 5 (i) යෙදිය යුතුයි) ඉදිරි පා දෙක හකුළුවා පසු පා දෙකද හකුළුවා එහිම පා සතර මතුයෙහි හිඳියි. (හොව්යි) මහණෙනි මේ ලොකයෙහි මෙබඳුවූද ඇතැම් අශ්ව බලුංකයෙක් වෙයි. මහණෙනි, මේ වනාහි අටවැනි අශ්ව දෝෂයයි. මහණෙනි, මේ අශ්ව බලුංකයෝ අටදෙනා සහ අශ්වදෝෂ අටද වෙත්.

10 "මහණෙනි, පුරුෂ බලුංකයෝ අටදෙනා සහ පුරුෂ දෝෂ අට කෙසේද? (ii) මහණෙනි, මේ ශාසනයෙහි මහණහට භික්ෂූහු ආපත්තියෙන් චොදනා කරත්. ඒ මහණතෙම භික්ෂූන් විසින් ඇවැතින් චෝදනා කරනු ලබන්නේ (iii) සිහි නොකරමි, සිහිනොකරමි. (අමතකය, අමතකය.) යයි සිහි නැතිව මෙන් පටලවයි. (නන්දොඩවයි.)

(iv) "මහණෙනි, අශ්වබලුංකයා අස්ගොවුවා විසින් යවයි කියනු ලබන්නේ කෙවිටි කරනු ලබන්නේ චෝදනා කරනු ලබන්නේ (v) පස්සට ගමන් කරන්නේ පිටෙන් රථය පෙරලන්නේ යම්සේද, මහණෙනි, මම මේ පුද්ගලයාද එසේ උපමා කොට කියමි. මහණෙනි, මේ ලොකයෙහි මෙබඳුවූද ඇතැම් පුරුෂ කලුංකයෙක් වෙයි. මහණෙනි, මේ පළමු වන පුරුෂ දෝෂයයි.

11 (මෙහි 10 (ii) යෙදිය යුතුයි.) චොදකයාහටම පෙරලා චෝදනා කරයි 'බාලවූ අව්‍යක්තවූ තොපගේ කීමෙන් කවර ප්‍රයෝජනද? තොපටද (අවවාද) කියයුතුයයි' හඟිමි. (මෙහි 10 (iv) යෙදිය යුතුයි) පසු පා දෙක ඔසවා එයින් ගසා රථයේ කූර්බරය බිඳින්නේ ත්‍රිදණ්ඩය බිඳින්නේ යම්සේද? මහණෙනි, මම මේ පුද්ගලයාද එසේ උපමාකොට එසේ උපමාකොට කියමි. මහණෙනි, මේ ලෝකයෙහි මෙබඳුවූද ඇතැම් පුරුෂ බලුංකයෙක් වෙයි. මහණෙනි, මේ දෙවැනි පුරුෂ දෝෂයයි.

12 (මෙහි 10 (ii) යෙදිය යුතුයි) චෝදකයාහටම පෙරලා චෝදනා කරයි. 'තෙපිද මෙනම් ඇවතට පැමිණියේ වෙහිය. තෙපි පළමුකොට (එයට) පිළියම් කරව්. (මෙහි 10 (iv) යෙදිය යුතුයි.) හිසනමා වියගස භූමියෙහි හෙලා කලවයෙන් රිය හිසට ගසා පෙර පා දෙකින් වියගස මඩිමින් සිටින්නේ යම්සේද?

මහණෙනි, මම මේ පුද්ගලයාද එසේ උපමාකොට කියමි. මහණෙනි, මේ ලෝකයෙහි මෙබඳුවූද ඇතැම් පුරුෂ බලුංකයෙක් වෙයි. මහණෙනි, මේ තෙවැනි පුරුෂ දෝෂයයි.

13 (මෙහි 10 (ii) යෙදිය යුතුයි) අනාගවූ කරුණු වලින් චෝදනාව වසත්. බාහිර කථා ගෙනහැර පාත්. කෝපයද ද්වෙෂයද නොසතුටද (හේතු රහිත කථාද) පහළ කරත්. (මෙහි 10 (iv) යෙදිය යුතුයි) නොමග යන්නේ යම්සේද, හෙලක හෝ කටුලැහැබක රථය නංවන්නේ යම්සේද, මම මේ පුද්ගලයාද එසේ උපමාකොට කියමි. මහණෙනි, මේ ලොකයෙහි මෙබඳුවූද ඇතැම් පුරුෂ බලුංකයෙක් වෙයි. මහණෙනි, මේ සිවුවැනි පුරුෂ දෝෂයයි.

14 (මෙහි 10 (ii) යෙදිය යුතුයි.) සඟ මැද අත වැනීමෙන් කථා කරයි. (සාහසිකව කථා කරයි) (මෙහි 10 (iv) යෙදිය යුතුයි) ඉදිරි ශරීරය ලංඝනය කරන්නේ යම්සේද, ඉදිරි පා දෙක දැඩිකොට ගන්නේ යම්සේද, මම මේ පුද්ගලයාද එසේ උපමාකොට කියමි. මහණෙනි, මේ ලෝකයෙහි මෙබඳුවූද ඇතැම් පුරුෂ බලුංකයෙක් වෙයි, මහණෙනි, මේ පස්වැනි පුරුෂ දෝෂයයි.

15 (මෙහි 10 (ii) යෙදිය යුතුයි) සංඝයාට නොදන්වා, චෝදකයාට නොදන්වා, ඇවැත් සහිතවූයේම, කැමති දිශාවකට යයි. (මෙහි 10 (iv) යෙදිය යුතුයි) අස්ගොවුවාගේ වචනය නොසලකා කෙවිටි කිරීම නොසලකා කටකලියාව හැරදමා කැමතිසේ ගමන් කරන්නේ යම්සේද, මම මේ පුද්ගලයාද එසේ උපමා කොට කියමි. මහණෙනි, මේ ලෝකයෙහි මෙබඳුවූද ඇතැම් පුරුෂ බලුංකයෙක් වෙයි. මහණෙනි, මෙ සවැනි පුරුෂ දෝෂයයි.

16 (මෙහි 10 (ii) යෙදිය යුතුයි) හෙතෙම මම ආපත්තියට නොපැමිණියෙමි'යි (හගවනු පිණිස) කථා නොකර නිශ්ශබ්දවීමෙන් සංඝයා වෙහෙසයි. මෙහි 10 (iv) යෙදිය යුතුයි) ඉදිරියටද නොයා පස්සටද නොයා එහිම නොසෙල්වී සිටිනේ යම්සේද, මම මේ පුද්ගලයාද එසේ උපමාකොට කියමි.

මහණෙනි, මේ ලෝකයෙහි මෙබඳු වූද ඇතැම් පුරුෂ බලුංකයෙක් වෙයි. මහණෙනි, මේ සත්වැනි පුරුෂ දෝෂයයි.

17 (මෙහි 10 (ii) යෙදිය යුතුයි.) මෙසේ කියයි. (කෙසේද?) 'ආයුෂ්මත්නි, කුමක් නිසා තෙපි මා ගැන ඉතා දැඩිව ව්‍යාවෘතවන්නාහුද, (වෙහෙසෙන්නාහුද,) දැන් මම ශික්ෂා ප්‍රත්‍යාක්ඛ්‍යාණය කොට (සිවුරු හැර) ගිහිවෙමියි' හෙතෙම සිවුරු හැර ගිහිවී මෙසේ කියයි. 'ආයුෂ්මත්නි, දැන්වත් තෙපි සතුටුවවු. (මෙහි 10 (iv) යෙදිය යුතුයි) ඉදිරි පා දෙක හකුළුවා එහිම පා සතර මතුයෙහි හොවින්නේ යම්සේද? මම මේ පුද්ගලයාද එසේ උපමා කොට කියමි. මහණෙනි, මේ ලෝකයෙහි මෙබඳුවූද ඇතැම් පුරුෂ බලුංකයෙක් වෙයි. මහණෙනි, මේ අටවැනි පුරුෂ දෝෂයයි. මහණෙනි, මේ පුරුෂ බලුංකයෝ අටදෙනාද පුරුෂ දෝෂ අටද වෙත්."

15 මල සූත්‍රය. 1. 'මහණෙනි, මේ මල හෙවත් කිලුටු අටක් වෙත්.

2. "කවර අටක්ද යත්? මහණෙනි, මන්ත්‍රයෝ සජ්ඣායනා නොකිරීමෙන් (පාඩම් නොකීමෙන් හෝ භාවනා නොකිරීමෙන්) මල (බැඳෙන්නාහු) වෙත්. මහණෙනි, (ගෙවල් හෝ ගෘහ වාසීහු උට්ඨානවීර්‍ය්‍යයෙන් තොරවූවාහු මල (බැඳෙන්නාහු) වෙත්. මහණෙනි, කුසීත බව ශරීර වර්ණයට (බාධාවූ) කිලුටවේ, මහණෙනි, ප්‍රමාදය ධන සංරක්ෂණයට (බාධාවූ) කිලුටවේ, මහණෙනි, ස්ත්‍රියට දුශ්චරිතය කිලුටවේ. මහණෙනි, දෙන්නාහට මසුරුකම කිලුටවේ. මහණෙනි, මෙලොව පරලොව දෙක්හිම ලාමකවූ අකුශල ධර්මයෝ-කිලුට වේ. මහණෙනි, ඊටත් වඩා අතිශයින්ම කිලුට වූයේ තද බල කිලුටවූයේ අවිද්‍යාවයි. මහණෙනි, මේ වනාහි අෂ්ටවිධ මලයෝ වෙත්.

3. "මන්ත්‍රයෝ සජ්ඣායනා නොකිරීමෙන් මල (බැඳෙන්නාහු) වෙත්, ගෘහවාසීහු උට්ඨානවීර්‍ය්‍යයෙන් තොරවීමෙන් මල (බැඳෙන්නාහු) වෙත්, ශරීර වර්ණයට කුසීත බව (බාධකවූ) කිලුටවේ, ප්‍රමාදය ධන සංරක්ෂණයට (බාධකවූ) කිලුටවේ, අනාචාරය ස්ත්‍රියට කිලුටවේ,

දායකයාහට මසුරුකම කිලුටවේ. මෙලොව පරලොව දෙක්හිම ලාමකවූ අකුශල ධර්මයෝ කිලුට වෙත්, ඊටත් වඩා අතිශයින්ම තදබල කිලුට වන්නේ අවිද්‍යාවයි.”

**16. දූතෙය්‍ය සූත්‍රය**:- 1. “මහණෙනි, ගුණධර්ම අටකින් යුක්තවූ භික්ෂූ තෙම (ධර්ම දූත) පණිවිඩ ගෙන යෑමට සුදුසුය.

2. “කවර ගුණධර්ම අටකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම (ධර්මදූත) පණිවිඩ කීමෙහි දක්ෂ වෙයි. (උත්තර) පණිවිඩ ගෙනඒමෙහි දක්ෂවෙයි. පණිවිඩය සිතට ගැනීමෙහි දක්ෂවෙයි. පණිවිඩය සිත තබාගැනීමෙහි දක්ෂවෙයි. පණිවිඩය අවබොධ කර ගැනීමෙහි දක්ෂවෙයි. පණිවිඩය අවබෝධ කරවීමෙහි දක්ෂවෙයි. සාහිත්‍යය අසාහිත්‍යය (නිවැරදි භාෂාව හා වැරදි භාෂාව) යන දෙක්හි දක්ෂ වෙයි. කෝලාහල කරුවෙක්ද නොවෙයි. (මෙහි 1 ඡෙදය යෙදිය යුතුයි.)

3. “මහණෙනි, ගුණාංග අටකින් යුක්තවූ ශාරීපුත්‍රය (ධර්ම) දූත මෙහෙවරය පිණිස යෑමට සුදුසුය.

4. “කවර ගුණාංග අටකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි සාරිපුත්‍රතෙම (ධර්මදූත) පණිවිඩ කීමෙහි දක්ෂ වෙයි, (උත්තර) පණිවිඩ ගෙණඒමෙහි දක්ෂ වෙයි. පණිවිඩ සිතට ගැනීමෙහි දක්ෂ වෙයි, පණිවිඩය සිත තබා ගැනීමෙහි දක්ෂ වෙයි, පණිවිඩය අවබෝධකර ගැනීමෙහි දක්ෂ වෙයි, පණිවිඩය අවබෝධ කරවීමෙහි දක්ෂ වෙයි, සාහිත්‍යය අසාහිත්‍යය යන දෙක්හි දක්ෂ වෙයි. කෝලාහල කරුවෙක්ද නොවෙයි, මේ ගුණාංග අටින් යුක්තවූ ශාරිපුත්‍ර තෙම දූත මෙහෙවර පිණිස යෑමට සුදුසුය.

5. “යම් කිසිවෙක් දක්ෂ කථිකයන් ගෙන් යුත් පිරිස (මධ්‍යය) ට පැමිණ ඒකාන්තයෙන් නො වෙවුලයිද, (පණිවිඩයෝ) වචන නොපිරිහෙලාද, පණිවිඩය නොසඟවාද, නිසැකව කථා කරයිද, (යම්කිසි) ප්‍රශ්නයක් අසන ලද්දේ නොකිපේද, ඉඳින් එබඳු භික්ෂුවක් වන්නේ නම් (හෙතෙම) දූත මෙහෙවර පිණිස යෑමට සුදුසුයි.”

**17. පුරුෂ බන්ධන සූත්‍රය**:- "මහණෙනි, ආකාර අටකින් ස්ත්‍රීතොම පුරුෂයා බඳියි. (සිත්ගනී.) කවර අටකින්ද යත්? මහණෙනි, ස්ත්‍රී තොම රූපයෙන් පුරුෂයා බඳී, (පුරුෂයාගේ සිත්ගනී.) මහණෙනි, සිනහවෙන් ස්ත්‍රී තොම පුරුෂයා බඳී, මහණෙනි, කථාවෙන් ස්ත්‍රී තොම පුරුෂයා බඳී, මහණෙනි, ගීතයෙන් ස්ත්‍රී තොම පුරුෂයා බඳී, මහණෙනි, හැඬීමෙන් ස්ත්‍රී තොම පුරුෂයා බඳී, මහණෙනි, ආකල්පයෙන් හැඳීම් පෙරවීම් ආදී විධියෙන් ස්ත්‍රීතොම පුරුෂයා බඳී, මහණෙනි, පලතුරු ආදිය දීමෙන් ස්ත්‍රීතොම පුරුෂයා බඳී, මහණෙනි, ස්පර්ශයෙන් ස්ත්‍රීතොම පුරුෂයා බඳී, මහණෙනි, මේ ආකාර (ක්‍රම) අටින් ස්ත්‍රී තොම පුරුෂයා බඳී, මහණෙනි, යම්කෙනෙක් සත්ත්වයන් ස්පර්ශයෙන් බැන්දාහු නම් ඒ බැඳීම තද බැඳීමයි."

**18. ස්ත්‍රී බන්ධන සූත්‍රය**:- මහණෙනි, ආකාර අටකින් පුරුෂතෙම ස්ත්‍රිය බඳී, (සිත්ගනී) කවර අටකින්ද යත්? මහණෙනි, පුරුෂ තෙම රූපයෙන් ස්ත්‍රිය බඳී (ස්ත්‍රියගේ සිත් ගනී.) මහණෙනි, සිනහවෙන් පුරුෂතෙම ස්ත්‍රිය බඳී, මහණෙනි ගීතයෙන් පුරුෂ තෙම ස්ත්‍රිය බඳී, මහණෙනි, හැඬීමෙන් පුරුෂතෙම ස්ත්‍රිය බඳී, මහණෙනි, ආකල්පයෙන් හැඳීම් පෙරවීම් ආදි විධියෙන් පුරුෂ තෙම ස්ත්‍රිය බඳී, මහණෙනි, පලතුරු ආදිය දීමෙන් පුරුෂ තෙම ස්ත්‍රිය බඳී. මහණෙනි, ස්පර්ශයෙන් පුරුෂතෙම ස්ත්‍රිය බඳී, මහණෙනි, මේ ආකාර (ක්‍රම) අටින් පුරුෂ තෙම ස්ත්‍රිය බඳී, මහණෙනි, යම් කෙනෙක් සත්වයන් ස්පර්ශයෙන් බැන්දාහු නම් ඒ බැඳීම තද බැඳීමයි."

**19. පහාරාද සූත්‍රය**:- 1 එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ වෙරඤ්ජා නුවර නළෙරු නම් යක්ෂයා විසින් අධිගෘහිතවූ කොසඹරුක් මුල වැඩවාසය කරණ සේක. එකල්හි පහාරාද (නම්) අසුරේන්ද්‍රයා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට මනාකොට වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටියාවූ පහාරාද අසුරේන්ද්‍රයාට භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළසේක.-

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. "පහාරාදය, අසුරයෝ වනාහි මහා සමුද්‍රයෙහි සිත් අලවත්ද?" "ස්වාමීන් වහන්ස, අසුරයන් මහා සමුද්‍රයෙහි සිත් අලවත්."

"පහාරාදය, මහා සමුද්‍රයෙහි කෙතෙක් ආශ්චර්‍ය්‍ය අද්භූත කරුණු දැක දැක ඒ අසුරයෝ මහා සමුද්‍රයෙහි සිත් අලවත්ද?"

"ස්වාමීන් වහන්ස, මහා සමුද්‍රයෙහි ආශ්චර්‍ය්‍ය අද්භූතවූ ගුණධර්ම අටක් දැක දැක ඒ අසුරයෝ මහා සමුද්‍රයෙහි සිත් අලවත්, කවර ගුණධර්ම අටක්ද යත්, ස්වාමීන් වහන්ස, මහා සමුද්‍රය තෙම ක්‍රමයෙන් පහත්වූයේය, ක්‍රමයෙන් ගැඹුරු වූයේය, ක්‍රමයෙන් (යටට) නැමීගියේය, කෙලින්ම (පිහිටි) ප්‍රපාතයක් නොවේ.

"ස්වාමීන් වහන්ස, (ii) මහා සමුද්‍රයෙහි ක්‍රමයෙන් පහත් වීමය, ක්‍රමයෙන් ගැඹුරුවීමය, ක්‍රමයෙන් (යටට) නැමීමය, කෙළින්ම (පිහිටි) ප්‍රපාතයක් නොවීමය, (iii) යන මේ ගුණය ආශ්චර්‍ය්‍ය අද්භූතවූ පළමුවැනි ගුණය දැක දැක අසුරයෝ මහා සමුද්‍රයෙහි සිත් අලවත්.

3. "නැවතද ස්වාමීන්වහන්ස, මහා සමුද්‍රය ස්ථිර ස්වභාවයෙන් යුක්තවූවකි, වෙරළ නොයික්මවයි, ස්වාමීන් වහන්ස, මහාසමුද්‍රය ස්ථිර ස්වභාවයෙන් යුක්තවූවකි, වෙරළ නොයික්මවයි, යන මේ ගුණය ආශ්චර්‍ය්‍ය අද්භූතවූ දෙවැනි ගුණය දැක දැක අසුරයෝ මහා සමුද්‍රයෙහි සිත් අලවත්.

4. "නැවත ස්වාමීන්වහන්ස, (ii) මහා සමුද්‍රය මල කුණු සමග නොවසයි. මහා සමුද්‍රයෙහි යම්කිසි මල කුණක් වීනම් වහාම වෙරළට පාකරයි, ගොඩට උස්සාදමයි, (iii) ස්වාමීන් වහන්ස, (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) යන මේ ආශ්චර්‍ය්‍ය අද්භූතවූ තුන් වැනි ගුණය දැක දැක අසුරයෝ මහා සමුද්‍රයෙහි සිත් අලවත්.

5. "නැවතද ස්වාමීන්වහන්ස, (ii) ගංගා, යමුනා, අචිරවතී, සරභූ, මහී යන යම් කිසි මහා ගංගාවෝ වෙත්නම් ඒ ගංගාවෝ මහා සමුද්‍රයට පැමිණ පළමු නම් ගොත් හැර දමත්, මහා සමුද්‍රය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

යන සංඛ්‍යාවට (නාමයට) පැමිණෙත්, (ii) ස්වාමීන් වහන්ස, (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) යන මේ ආශ්චර්‍ය්‍ය අද්භූතවූ සිවුවැනි ගුණය දැක දැක අසුරයෝ මහා සමුද්‍රයෙහි සිත් අලවත්,

**6.** "නැවතද, ස්වාමීන් වහන්ස (ii) ලෝකයෙහි යම් (පමණ) ගංගාවෝ මහා සමුද්‍රයට වදිත්ද, යම් (පමණ) අහස් (වර්ෂා) ධාරාවෝ වැටෙත්ද, මහා සමුද්‍රයට එයින් අඩු බවක් හෝ පිරෙන බවක් හෝ නොපෙනෙයි, (iii) ස්වාමීන් වහන්ස, (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) යන මේ ආශ්චර්‍ය්‍ය අද්භූතවූ පස් වැනි ගුණය දැක දැක අසුරයෝ මහා සමුද්‍රයෙහි සිත් අලවත්.

7. "නැවතද, ස්වාමීන් වහන්ස, (ii) මහා සමුද්‍රය තෙම ලුණු රසය (නම්වූ එකම රස ඇත්තේය. (iii) ස්වාමීන්වහන්ස, මහා සමුද්‍රය තෙම ලුණු රසය (නම්වූ) එකම රස ඇත්තේය යන මේ ආශ්චර්‍ය්‍ය අද්භූතවූ සවැනි ගුණය දැක දැක අසුරයෝ මහා සමුද්‍රයෙහි සිත් අලවත්.

8. "නැවතද, ස්වාමීන් වහන්ස, (ii) මහා සමුද්‍රය තෙම බොහෝ රත්න ඇත්තේ වෙයි. අනේක (ප්‍රකාර) රත්න ඇත්තේ වෙයි, එහි මේ රත්නයෝයි, ඒ කවරහුද? (iii) මුතුය, මැනික්ය, වෙරළුමිණිය (වෛරෝඩිය) හක් බෙල්ලෝය, නොයෙක් වර්ණවත් ගල් ජාතීහුය. පබලුය, රිදීය, රත්රන්ය, රතුමැනික්ය, මැසිරි ගල්ය, (iv) යන මොහුයි. ස්වාමීන්වහන්ස, මහා සමුද්‍රය තෙම (මෙහි 8 (ii) යෙදිය යුතුයි.) යන අනේක ප්‍රකාරවූ බොහෝ රත්න ඇත්තේයයි මේ ආශ්චර්‍ය්‍ය අද්භූතවූ සත්වැනි ගුණය දැක දැක අසුරයෝ මහා සමුද්‍රයෙහි සිත් අලවත්.

**9.** 'නැවතද, ස්වාමීන් වහන්ස, මහා සමුද්‍රය තෙම මහත්වූ සත්ත්වයන්ගේ ආවාසයක්ය. (ii) තිමිය, තිමිංගලය, තිමිරය, පිංගලය, අසුරය, නාගය, ගාන්ධර්වය, යන මේ එහි වසන මහා සත්ත්වයෝයි. මහා සමුද්‍රයෙහි සියක් යොදුන් ශරීර ඇත්තාවූද, දෙසියයක් යොදුන් ශරීර ඇත්තාවූද, තුන් සියයක් යොදුන් ශරීර ඇත්තාවූද, හාරසියක් යොදුන් ශරීර ඇත්තාවූද, පන්සියයක් යොදුන් ශරීර ඇත්තාවූද, සත්ත්වයෝ ඇත්තාහ. (iii) ස්වාමීන් වහන්ස, මහා සමුද්‍රය තෙම මහත්වූ සත්ත්වයන්ගේ ආවාසයක්ය.

(මෙහි 9 (ii) යෙදිය යුතුයි.) මේ ආශ්චර්‍ය්‍ය අද්භූතවූ අටවැනි ගුණය දැක දැක අසුරයෝ මහා සමුද්‍රයෙහි සිත් අලවත්.

10. "ස්වාමීන් වහන්ස, අසුරයෝ මහා සමුද්‍රයෙහි මේ ආශ්චර්‍ය්‍ය අද්භූතවූ ගුණධර්ම අට දැක දැක (එහි) සිත් අලවත්, ස්වාමීන් වහන්ස, භික්ෂූහුද වනාහි මේ ශාසනයෙහි සිත් අලවත්ද?"

"පහාරාදය, භික්ෂූහු මේ ශාසනයෙහි සිත් අලවත්."

"ස්වාමීන් වහන්ස, කෙතෙක් ආශ්චර්‍ය්‍ය අද්භූතවූ ගුණ ධර්මයන් දැක දැක භික්ෂූහු මේ ශාසනයෙහි සිත් අලවත්ද?" පහාරාදය, මේ ශාසනයෙහි ආශ්චර්‍ය්‍ය අද්භූතවූ ගුණධර්ම අටක් දැක දැක භික්ෂූහු (එහි) සිත් අලවත්. කවර ගුණධර්ම අටක්ද යත්?

11. "පහාරාදය, (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) පහාරාදය, එපරිද්දෙන්ම වනාහි (ii) මේ ධර්ම විනයෙහි (ශාසනයෙහිද) ක්‍රමානුකූල ශික්ෂා ඇත්තේ වෙයි. ක්‍රමානුකූල ක්‍රියා ඇත්තේ වෙයි. ක්‍රමානුකූල ප්‍රතිපදා (පිළිපැදීම්) ඇත්තේ වෙයි. ශීලවිශුද්ධිය ආදිය නොමැතිව කෙලින්ම (ලබන්නාවූ) රහත් බවෙක් නැත. (iii) පහාරාදය, යම් හෙයකින් (මෙහි 11 (ii) ඡෙදය යෙදිය යුතුයි.) පහාරාදය, මේ ශාසනයෙහි මේ පළමුවන ආශ්චර්‍ය්‍ය අද්භූතවූ ගුණධර්මයයි. එය දැක දැක භික්ෂූහු ශාසනයෙහි සිත් අලවත්.

12. "පහාරාදය, යම්සේ වනාහි මහා සමුද්‍රය තෙම ස්ථිර ස්වභාවයෙන් යුක්තවූයේ වේද, වෙරළ නොයික්මවාද, පහාරාදය, එපරිද්දෙන්ම වනාහි මා විසින් ශ්‍රාවකයන්ට යම් ශික්ෂාපදයක් පණවන ලදද ඒ ශික්ෂාපදය මාගේ ශ්‍රාවකයෝ ජීවිතය ගැනවත් නොයික්මවත්.

"පහාරාදය, මේ ශාසනයෙහි මේ දෙවන ආශ්චර්‍ය්‍ය අද්භූතවූ ගුණධර්මයයි. එය දැක දැක භික්ෂූහු ශාසනයෙහි සිත් අලවත්.

13. "පහාරාදය, යම්සේ වනාහි (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) පහාරාදය, එපරිද්දෙන්ම වනාහි යම් ඒ පුද්ගලයෙක් තෙම

දුශ්ශීලවූයේද, අකුශල ධර්මයෙන් යුක්තවූයේ වේද, අපවිත්‍රවූ කසල ගොඩක් වැනි පැවතුම් ඇත්තේවේද, සඟවා කරණ ලද පාපකර්ම ඇත්තේ වේද, ශ්‍රමණයෙක් නුවූයේම ශ්‍රමණ භාවය හඟවන්නේවේද, බඹසර නොවූයේම බඹසර ඇත්තේයයි හඟවන්නේවේද, ඇතුළත කුණුවූයේ වේද, (පවිටු සිත් ඇත්තේවේද,) වැගිරෙන හෝ පල්වූ කෙළෙස් ඇත්තේවේද, කෙළෙස් කසල හටගත්තේ වේද ඔහු සමග සංඝයා නොවසයි. වහාම රැස්ව ඔහු (උක්ෂෙපණීය කර්මයෙන්) නෙරපයි. යම් හෙයකින් ඔහු සංඝයා මධ්‍යයෙහි හුන්නේ නමුදු (උක්ෂෙපණීය කර්මයෙන් පසු ඔහු සංඝයා කෙරෙන් ඈත්වූයේමය. (විනයකර්මවලට නොගන්නා හෙයිනි.) සංඝයාද ඔහුගෙන් ඈත්වූයේමය.

14. "පහාරාදය, යම්සේ වනාහි යම් ඒ පුද්ගලයෙක් දුශ්ශීල වූයේ වේද, අකුශල ධර්මයෙන් යුක්තවූයේ වේද, අපවිත්‍රවූ කසල ගොඩක් වැනි පැවතුම් ඇත්තේ වේද, සඟවා කරණ ලද පාපකර්ම ඇත්තේවේද. ශ්‍රමණයෙක් නුවූයේම මහණකම හඟවන්නේ වේද, බඹසර නුවූයේම බඹසර ඇත්තේයයි හඟවන්නේ වේද, ඇතුළත කුණුවූයේ වේද (පවිටු සිත් ඇත්තේ වේද) වැගිරෙන හෝ පල්වූ කෙලෙස් ඇත්තේ වේද, කෙලෙස් කසල හට ගත්තේ වේද, (එහෙයින්) ඔහු සමග සංඝයා නොවසාද, වහාම රැස්ව ඔහු (උක්ෂෙපණීය කර්මයෙන්) නෙරපාද, යම් හෙයකින් ඔහු සඟමැද හුන්නේ සංඝයා කෙරෙන් නමුදු ඈත්වූයේම වේද, සංඝයා ඔහුගෙන් ඈත්වූයේම වේද. පහාරාදය, මේ වනාහි මේ ශාසනයෙහි තෙවැනි ආශ්චර්‍ය්‍ය අද්භූතවූ ගුණධර්මයයි, එය දැක දැක භික්ෂූහු ශාසනයෙහි සිත් අලවයි.

15. "පහාරාදය, යම්සේ වනාහි (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) පහාරාදය, එපරිද්දෙන්ම වනාහි (ii) රජ, බමුණු, වෙළඳ, ගොවි යන මේ සිව් කුලයෝ වෙත්ද, ඔවුහු ගිහිගෙන් නික්ම අනගාරිය සංඛ්‍යාතවූ, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරණ ලද ශාසනයෙහි පැවිදිව පළමු නම් ගොත් හැර දමත්, ශාක්‍ය පුත්‍රවූ ශ්‍රමණයෝය යන සංඛ්‍යාවට පැමිණෙත්, (iii) පහාරාදය, යම්සේ

වනාහි (මෙහි 15 (ii) යෙදිය යුතුයි.) පහාරාදය, මේ වනාහි මේ ශාසනයෙහි සිවුවැනි ආශ්චර්‍ය්‍යවූ අද්භූතවූ ගුණධර්මයයි. එය දැක දැක භික්ෂූහු ශාසනයෙහි සිත් අලවත්,

**16.** "පහාරාදය, යම්සේ වනාහි (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) පහාරාදය, එපරිද්දෙන්ම වනාහි බොහෝවූද භික්ෂූහු අනුපාදිශෙෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පාත් (නිවණට පැමිණෙත්,) එයින් නිර්වාණ ධාතුවෙහි අඩු බවක් හෝ පිරෙන බවක් නොපෙනේ,

**17.** "පහාරාදය, යම්සේ වනාහි බොහෝවූද භික්ෂූහු අනුපාදිශෙෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පාත්ද, (නිවනට පැමිණෙත්ද,) එයින් නිර්වාණ ධාතුවෙහි අඩු බවක් හෝ පිරෙන බවක් නොපෙනේද-පහාරාදය මේ වනාහි මේ ශාසනයෙහි පස්වැනි ආශ්චර්‍ය්‍ය අද්භූතවූ ගුණ ධර්මයයි. එය දැක දැක භික්ෂූහු ශාසනයෙහි සිත් අලවත්.

**18.** "පහාරාදය, යම්සේ වනාහි (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) පහාරාදය, එපරිද්දෙන්ම වනාහි මේ ශාසනයද විමුක්ති රසය (නම්වූ) එකම රස ඇත්තේය, පහාරාදය, යම්සේ වනාහි මේ ශාසනය විමුක්ති රසය (නම්වූ) එකම රස ඇත්තේද, පහාරාදය, මේ වනාහි මේ ශාසනයෙහි සවැනි ආශ්චර්‍ය්‍ය අද්භූතවූ ගුණ ධර්මයයි. එය දැක දැක භික්ෂූහු ශාසනයෙහි සිත් අලවත්.

**19.** "පහාරාදය, යම්සේ වනාහි (මෙහි 8 (ii) ඡෙදය යෙදිය යුතුයි.) යන අනේකප්‍රකාරවූ බෝහෝ රත්න ඇත්තේ වේද, පහාරාදය, එපරිද්දෙන්ම වනාහි (ii) මේ ශාසනයද බොහෝ රත්න ඇත්තේ වෙයි, අනේක ප්‍රකාරවූ රත්න ඇත්තේ වෙයි. ඒ මේ රත්නයෝයි කවරහුද? සතර සතිපට්ඨානය, සතර සම්‍යක් ප්‍රධානය, සතර ඍද්ධි පාදය, පඤ්චෙන්ද්‍රියය, පඤ්චබලය, සප්තබෝද්ධ්‍යංගය, ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය, (යනුයි.) (iii) පහාරාදය, යම්සේ වනාහි (මෙහි 19 (ii) යෙදිය යුතුයි.) යන මේ රත්නයෝයි පහාරාදය, මේ වනාහි මේ ශාසනයෙහි සත්වැනි ආශ්චර්‍ය්‍ය අද්භූතවූ ගුණ ධර්මයයි. එය දැක දැක භික්ෂූහු ශාසනයෙහි සිත් අලවත්.

**20.** "පහාරාදය, යම්සේ වනාහි මහා සමුද්‍රය තෙම මහත්වූ සත්ත්වයන්ගේ ආවාසයක් වේද, (මෙහි 9 (ii) ඡෙදය යෙදිය

යුතුයි.) පහාරාදය, එපරිද්දෙන්ම වනාහි (ii) මේ ශාසනය ද මහත්වූ සත්ත්වයන්ගේ ආවාසය වෙයි. ඒ මේ සත්ත්වයෝයි, සෝවාන් ඵලයට පැමිණි සත්ත්වයාද, සෝවාන් ඵලය ලබා ගැනීම පිණිස පිළිවෙත් පුරණ සත්ත්වයාද, සකෘදාගාමිඵලයට පැමිණි සත්ත්වයාද, සකෘදාගාමීඵලය ලබා ගැනීම පිණිස පිළිවෙත් පුරණ සත්ත්වයාද, අනාගාමීඵලයට පැමිණි සත්ත්වයාද අනාගාමී ඵලය ලබාගැනීම පිණිස පිළිවෙත් පුරණ සත්වයාද, අර්හත් ඵලයට පැමිණි සත්ත්වයාද, අර්හත් ඵලය ලබා ගැනීම පිණිස පිළිවෙත් පුරණ සත්ත්වයාද යනුයි. "පහාරාදය යම්සේ වනාහි (මෙහි 20 (ii) යෙදිය යුතුයි.) යන මේ සත්ත්වයෝ වෙත්ද, පහාරාදය, මේ වනාහි මේ ශාසනයෙහි අටවැනි ආශ්චර්‍ය්‍ය අද්භූතවූ ගුණධර්මයයි, එය දැක දැක භික්ෂූහු ශාසනයෙහි සිත් අලවත්,

**21.** 'පහාරාදය, මේ වනාහි මේ ශාසනයෙහි ආශ්චර්‍ය්‍ය අද්භූතවූ ගුණධර්ම අටයි. එය දැක දැක භික්ෂූහු ශාසනයෙහි සිත් අලවත්"

**20. උපොසථ සූත්‍රයː-** **1** මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර මිගාර මාතාව විසින් කරවන ලද පූර්වාරාමයෙහි ප්‍රාසාදයෙහි වැඩ වාසය කරණ සේක. එසමයෙහි වනාහි භාග්‍යවතුන්වහන්සේ පොහෝ කරණ දිනයක්වූ ඒ දිනයෙහි භික්ෂු සංඝයා විසින් පිරිවරනා ලද්දේ වැඩ හුන්නේ වෙයි,

**2.** එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ රාත්‍රිය ඉක්ම යන කල්හි, ප්‍රථම යාමය ඉක්ම ගිය කල්හි (ii) හුනස්නෙන් නැගිට තනිපට සිවුර ඒකාංශ කොට පොරවා භාග්‍යවතුන්වහන්සේ දෙසට නමස්කාර කොට භාග්‍යවතුන්වහන්සේට මෙසේ සැළකෙළේය. "ස්වාමීන් වහන්ස, රාත්‍රිය ඉක්මයයි. (iii) ප්‍රථම යාමය ඉක්ම ගියේය, භික්ෂු සංඝයා බොහෝ වේලා හුන්නේය, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ භික්ෂුන්ට ප්‍රාතිමොක්ෂය උදෙසන සේක්වා," එසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දවූ සේක.

3. දෙවනුවද ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ රාත්‍රිය ඉක්ම ගිය කල්හි මධ්‍යම යාමය ඉක්ම ගිය කල්හි (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) මධ්‍යම යාමය ඉක්ම ගියේය, භික්ෂු සංඝයා බොහෝ වේලා හුන්නේය, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ප්‍රාතිමොක්ෂය උදෙසන සේක්වා දෙවනුවද භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දවූ සේක.

4. තුන්වෙනුවද ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ රාත්‍රිය ඉක්ම ගිය කල්හි පශ්චිම යාමය ඉක්ම ගිය කල්හි අරුණ නැගි කල්හි (රෑ පහන්දොර) රාත්‍රි තොම සතුටු මුහුණක් ඇති කල්හි (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) අළුයම ඉක්ම ගියේය, අරුණ නැගුනේය. (රෑ පහන් දොර රාත්‍රි තොම සතුටු මුහුණින් ඇතිවූවාය. භික්ෂු සංඝයා බොහෝ වේලා හුන්නේය, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, භික්ෂූන්ට ප්‍රාතිමොක්ෂය උදෙසන සේක්වා,

5. "ආනන්දය, පිරිස අපිරිසිදුය," එකල්හි ආයුෂ්මත් මහා මොග්ගල්ලාන තෙරුන් වහන්සේට මෙසේ අදහස් වූයේය, භාග්‍යවතුන් වහන්සේ 'ආනන්දය, පිරිස. අපිරිසිදුයයි' කවර පුද්ගලයෙකු සඳහා මෙසේ වදාළ සේක්ද?' ඉක්බිති ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ ඒ සියලුම භික්ෂු සංඝයා සිතින් සිත පිරිසිඳ මෙනෙහි කළ සේක.

6. ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ ඒ දුශ්ශීලවූ, ලාමක ස්වභාවය ඇත්තාවූ, අපවිත්‍ර කසල ගොඩක් වැනිවූ පැවතුම් ඇති සැඟවූ පාප කර්ම ඇති අශ්‍රමණවූ, ශ්‍රමණයෙකු ලෙස හඟවන්නාවූ, ශ්‍රේෂ්ඨ හැසිරීම නැත්තාවූ, ශ්‍රේෂ්ඨ හැසිරීම ඇත්තෙකු ලෙස හඟවන්නාවූ, ඇතුළත (කෙලෙස් වලින්) කුණුවූ, කෙලෙස් වැගිරෙන්නාවූ, කෙලෙස් කසල හට ගත්තාවූ, පුද්ගලයා භික්ෂු සංඝයා මද්ධ්‍යයෙහි හුන් බව දැක්කේමය. දැක, හුනස්නෙන් නැගිට ඒ පුද්ගලයා වෙත පැමිණියේය පැමිණ (ii) ඒ පුද්ගලයාට මෙසේ කීවේය. "ඇවැත්නි, නැගිටුව, භාග්‍යවතුන් වහන්සේ විසින් දක්නා ලද්දෙහිය, ඔබට භික්ෂූන් සමග විසීමක් නැත්තේය," එසේ කී කල්හි ඒ පුද්ගලයා නිශ්ශබ්ද වූයේය,

7. දෙවනුවද ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) තෙවනුවද ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) තෙවනුවද ඒ පුද්ගලයා නිශ්ශබ්ද වූයේය,

8. එකල්හි ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ ඒ පුද්ගලයා අතින් (අල්වා) ගෙන බාහිර දොර කොටුවෙන් පිටකරවා යතුරුදමා භාග්‍යවතුන්වහන්සේ වෙත පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැල කෙළේය. "ස්වාමීන් වහන්ස, මම ඒ පුද්ගලයා පිටකර වූයෙමි. පිරිස පිරිසිදුය, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ප්‍රාතිමොක්ෂය උදෙසන සේක්වා."

"මොග්ගල්ලාන ඒ තුච්ඡ (හිස්වූ) පුරුෂයා අතින් අල්වා ගන්නා තුරු නොසලකා සිටීම ආශ්චර්‍ය්‍යයයි, අද්භූතයි."

9. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණය කළ සේක. "මහණෙනි, දැන් තෙපිම පොහොය කරවූ, ප්‍රාතිමොක්ෂය උදෙසවූ, මහණෙනි, දැන් අද පටන් මම පොහොය නොකරන්නෙමි, ප්‍රාතිමොක්ෂය නොදෙසන්නෙමි, "මහණෙනි, තථාගත තෙම අපිරිසිදු පිරිසෙහි පොහොය කරන්නේය. ප්‍රාතිමොක්ෂය දෙසන්නේය, යන මේ කරුණට ස්ථාන නොවන්නේය, (හේතු නොවන්නේය) අවකාශ නැත.

10. "මහණෙනි, මහා සමුද්‍රයෙහි ආශ්චර්‍ය්‍ය අද්භූතවූ මේ ගුණධර්ම අට ඇත්තේය.

(මෙහි 19 සූත්‍රයේ 'පහාරාදය' වෙනුවට 'මහණෙනියි' කියාද, 'ස්වාමීන්වහන්ස' වෙනුවට 'මහණෙනි' කියාද යොදා 11 ඡේදයේ සිට 20 ඡේදය අන්තිම දක්වා යොදා ගත යුතුයි.)

"මහණෙනි, මේ වනාහි මේ ශාසනයෙහි ආශ්චර්‍ය්‍ය අද්භූතවූ ගුණධර්ම අට වෙත්, එය දැක දැක භික්ෂූහු මේ ශාසනයෙහි සිත් අල්වත්."

**(මහාවර්ගය නිමි.)**

---

# 3. ගෘහපති වර්ගය

**21. වෙසාලිකඋග්ග සූත්‍රයඃ-** 1. "එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විශාලාමහනුවර මහා වනයෙහි කූටාගාර ශාලාවෙහි වැඩවාසය කරණසේක. (ii) එහිදී වනාහි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි" කියා භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක. "පින්වතුන් වහන්සැ" යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. (iii) "මහණෙනි, විශාලාමහනුවර උග්ග්‍ර ගෘහපතියා (iv) ආශ්චර්‍ය්‍ය අද්භූත වූ කරුණු අටකින් යුක්තවූයෙකැයි මෙනෙහි කරවුයයි" මෙසේ වදාළසේක. සුගතයන් වහන්සේ මෙසේ වදාරා හුනස්නෙන් නැගිට විහාරයට වැඩිසේක.

2. "ඉක්බිති එක්තරා භික්ෂූන්වහන්සේ නමක් (ඒ) පෙරවරු කාලයෙහි හැඳ පෙරව පාත්‍ර සිවුරු රැගෙන විශාලා මහනුවර උග්ග්‍ර ගෘහපතියාගේ නිවස යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ පණවන ලද අසුනෙහි වැඩහුන්නේය. එකල්හි විශාලාමහනුවර උග්ග්‍ර ගෘහපතියා ඒ භික්ෂූන්වහන්සේ වෙත පැමිණියේය. පැමිණ ඒ භික්ෂූන් වහන්සේට සකසා වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ විශාලා මහ නුවර උග්ග්‍ර ගෘහපතියාට ඒ භික්ෂූන් වහන්සේ මෙසේ ප්‍රකාශ කෙළේය

3. "ගෘහපතිය, ඔබ ආශ්චර්‍ය්‍ය අද්භූතවූ කරුණු අටකින් යුක්තවූයේ යයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාළසේක. ගෘහපතිය, ඔබ කෙරෙහි ඇත්තේයයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද ඒ ආශ්චර්‍ය්‍ය අද්භූතවූ කරුණු අට කවරහුද?'

4. (i) "ස්වාමීන් වහන්ස, මා ආශ්චර්‍ය්‍ය අද්භූතවූ කවර කරුණු අටකින් යුක්තවූවෙකු ලෙස භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේදැයි මම නොදනිමි. ස්වාමීන් වහන්ස, එසේ ද වුවත් මා කෙරෙහි යම්කිසි ආශ්චර්‍ය්‍ය අද්භූතවූ කරුණු අටක් විද්‍යමාන වෙත්. ඒ කරුණු අට ශ්‍රවණය කළ මැනව. (ii) හොඳින් සිතේ තබා ගනු මැනව. මම (එය) ප්‍රකාශකරන්නෙමි."-"එසේය, ගෘහපතියයි" කියා ඒ භික්ෂූන් වහන්සේ විශාලා මහනුවර උග්ග්‍ර

ගෘහපතියාට ප්‍රතිවචන දුන්නේය. "විශාලාමහනුවර උග්‍ර ගෘහපතියා මෙසේ ප්‍රකාශ කෙළේය.

5. "ස්වාමීන්වහන්ස, පළමුකොට මම යම්දිනක භාග්‍යවතුන් වහන්සේ දුරදීම දැක්කෙම්ද, ස්වාමීන් වහන්ස, (ඒ) දැකීමත් සමගම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මාගේ සිත ප්‍රසන්න වූයේය. ස්වාමීන් වහන්ස, මේ පළමුවන ආශ්චර්‍ය්‍ය අද්භූතවූ (ගුණ) ධර්මය වනාහි මා කෙරෙහි ඇත්තේය.

6. "ස්වාමීන්වහන්ස, ඒ මම වනාහි පහන් සිත් ඇත්තේ (ම) භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියෙමි. භාග්‍යවතුන් වහන්සේ (එසේ) පැමිණියාවූ මට අනුපූර්ව කථාව වදාළසේක. ඒ කෙසේදයත්? දාන කථාවය, ශීල කථාවය, ස්වර්ග කථාවය, කාමයන්ගේ ආදීනවය ලාමකබවය, කෙලෙස් සහිත බවය, ගිහිගෙන් නික්ම පැවිදිවීම හා භවයෙන් නික්මීමෙහි අනුසස්ය (මේ අතර) යම් අවස්ථාවෙක්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ, මා නිරොගී සිත් ඇත්තේයයිද, මෘදුවූ සිත් ඇත්තේයයිද, කාමච්ඡන්දාදී නීවරණයන්ගෙන් තොරවූ සිත් ඇත්තේයයිද, ඔදවැඩි සිත් ඇත්තේයයිද ප්‍රසන්නවූ සිත් ඇත්තේයයිද, දැන වදාළසේක්ද, එකල්හි බුදුවරයන් වහන්සේලා විසින් ස්වයම්භූඥානයෙන් අවබොධ කරනු ලබන්නාවූ දුක්ඛ, සමුදය නිරොධ, මාර්ග යන චතුරාර්‍ය්‍යසත්‍යය ධර්ම දෙශනාවක් වීනම් ඒ ධර්මදෙශනාව වදාළ සේක.

7. "යම්සේ වනාහි පහවූ කිලුටු ඇති ශුද්ධවූ වස්ත්‍රයක් තෙම මනාකොට ම රජනය (වර්ණකය) පිළිගන්නේද, එපරිද්දෙන්ම වනාහි එම අසුනෙහිදීම මට ඇතිවන ස්වභාව වූ යම්කිසි ධර්මයක් වේ නම්, ඒ සියල්ල නිරුද්ධවන ස්වභාවයයි. කෙලෙස් රජසින් තොරවූ, කෙලෙස් මලින් තොරවූ මාර්ග ඥානය උපන්නේය.

8. "ස්වාමීන් වහන්ස, ඒ මම වනාහි දක්නාලද ආර්‍ය්‍ය සත්‍යය ධර්මඥානය ඇත්තේ, පැමිණෙන ලද ආර්‍ය්‍යසත්‍යය ධර්මඥානය ඇත්තේ, අවබොධ කරණලද ආර්‍ය්‍යසත්‍යය ධර්ම ඥානය ඇත්තේ හාත්පසින් බැසගන්නාලද ආර්‍ය්‍ය සත්‍යය ධර්මඥානය ඇත්තේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

තරණය කරණලද බුද්ධාදී අට තැන්හි සැක ඇත්තේ (එහෙයින්ම) පහවූ කථංකථ (විචිකිච්ඡා) ඇත්තේ, විශාරද භාවයට, පැමිණියේ, ශාස්තෘ ශාසනයෙහි අන්‍යයෙකුගේ සහායයෙන් ලැබියයුතුවූ ප්‍රත්‍යය රහිතවූයේ එහිදීම බුදුන්ද, ධර්මයද, සංඝයාද, සරණ ගියෙමි. බ්‍රහ්මචරියාව පස්වැනි වූ ශික්ෂාපදයන් සමාදන්වූයෙමි. "ස්වාමීන් වහන්ස, මේ දෙවැනි ආශ්චර්‍ය්‍ය අද්භූතවූ (ගුණ) ධර්මය වනාහි මා කෙරෙහි ඇත්තේය.

**9.** "ස්වාමීන් වහන්ස, ඒ මට තරුණවූ භාර්‍ය්‍යාවෝ සිවු දෙනෙක් වූහ. ස්වාමීන් වහන්ස, එකල්හි මම ඒ භාර්‍ය්‍යාවන් වෙත පැමිණියෙමි. පැමිණ ඒ භාර්‍ය්‍යාවනට මෙසේ කීවෙමි. 'නැගනියනි, මා විසින් වනාහි බ්‍රහ්මචර්‍ය්‍යා පස්වැනිවූ ශික්ෂා පද (බ්‍රහ්මචරිය පඤ්චසීලය) සමාදන්වනලදී. යම් භාර්‍ය්‍යාවක් කැමතිනම් මෙහිම සම්පත් අනුභව කෙරේවා, කුසල්ද කෙරේවා, (එසේ නොහැකි නම්) සිය නෑකුලයට හෝ යේවා. තොප (නැවත) විවාහවනු කැමැත්තහුනම් කවරෙකුට (විවාහකර) දෙම්ද?' 'ස්වාමීන් වහන්ස, මෙසේ කී කල්හි ඒ වැඩිමහළු භාර්‍ය්‍යා තොම 'මා මෙනම් ආර්‍ය්‍යපුත්‍රයාට (ස්වාමිපුත්‍රයාහට) දෙවයි' මට මෙසේ කීවාය, ස්වාමීන් වහන්ස, එකල්හි මම ඒ පුරුෂයා කැඳවා වමතින් භාර්‍ය්‍යාව අල්වාගෙන දකුණතින් කෙණ්ඩිය ගෙන (ඈ) ඒ පුරුෂයාහට (අතපැන් වත් කොට) විවාහකර දුනිමි. ස්වාමීන් වහන්ස, මම තරුණවූ ඒ භාර්‍ය්‍යාව පරිත්‍යාග කරන්නෙම් සිතෙහි වෙනස්බවක් නොදනිමි. ස්වාමීන් වහන්ස, මේ තුන්වෙනි ආශ්චර්‍ය්‍ය අද්භූතවූ (ගුණ) ධර්මය වනාහි මා කෙරෙහි ඇත්තේය,

**10.** "ස්වාමීන් වහන්ස, මාගේ ගෘහයෙහි වනාහි වස්තුව ඇත්තාහ. ඒ වස්තුව වනාහි යහපත් ගුණධර්මයෙන් යුක්තවූ සිල්වතුන් වහන්සේලා සමග බෙදන ලද්දේ (පරිභොගකරණ ලද්දේ) වෙයි. මේ හතරවෙනි ආශ්චර්‍ය්‍ය අද්භූතවූ (ගුණ) ධර්මය මා කෙරෙහි ඇත්තේය.

**11.** "ස්වාමීන් වහන්ස, මම වනාහි යම් භික්ෂූන් වහන්සේ නමක් වෙත පැමිණෙන්නෙම් නම් සකස්වම (යහපත්වම) පැමිණෙන්නෙමි. නො සකස්ව නොපැමිණෙන්නෙමි. ස්වාමීන්

වහන්ස, මේ පස්වැනි ආශ්චර්‍ය්‍ය අද්භූතවූ (ගුණ) ධර්මය වනාහි මා කෙරෙහි ඇත්තේය.

12. "ස්වාමීන් වහන්ස, ඉදින් ඒ ආයුෂ්මතුන් වහන්සේ මට ධර්මය දෙශනා කෙරේ නම් සකස්වම ශ්‍රවණය කරමි. නො සකස්ව ශ්‍රවණය නොකරමි. ඉදින් ඒ ආයුෂ්මතුන් වහන්සේ මට ධර්මය දෙශනා නොකෙරේ නම් මම උන්වහන්සේට ධර්මය දෙශනා කරමි. ස්වාමීන් වහන්ස, මේ සයවැනි වූ ආශ්චර්‍ය්‍ය අද්භූතවූ (ගුණ) ධර්මය වනාහි මා කෙරෙහි ඇත්තේය.

13. "ස්වාමීන් වහන්ස, මා වෙත දේවතාවෝ පැමිණ, 'ගෘහපතිය, භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාකොට දෙශනාකරණ ලද්දේවේයයි' සැලකරත්. ස්වාමීන් වහන්ස, මෙසේ කියනලද කල්හි මම ඒ දේවතාවුන්ට මෙසේ කියමි. 'දේවතාවෙනි, තෙපි කිවුවත් නොකිවුවත් භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාකොට දේශනාකරණ ලද්දේමය, ඒ ආශ්චර්‍ය්‍ය නොවෙයි' ස්වාමීන් වහන්ස, මා වෙත දේවතාවෝ පැමිණෙත්යයි කියා හෝ, මම දේවතාවුන් සමග කථාකරමි කියා හෝ, ඒ හේතුවෙන් මා සිතෙහි උඩඟු බවක් නොම දනිමි. ස්වාමීන් වහන්ස, මේ සත්වැනිවූ ආශ්චර්‍ය්‍ය අද්භූතවූ (ගුණ) ධර්මය වනාහි මා කෙරෙහි ඇත්තේය.

14. "ස්වාමීන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරණ ලද්දාවූ කාම ධාතුව (කාම ලෝකය) භජනය කරන්නාවූ යම් ඒ සඤ්ඤෝජන පසෙක් වෙත් නම් ඔවුන් අතුරෙන් කිසි සඤ්ඤෝජන ධර්මයක් මා කෙරෙහි ප්‍රහීන නොවී ඇත්තේයයි මම නොම දකිමි. ස්වාමීන් වහන්ස, මේ අට වැනි වූ ආශ්චර්‍ය්‍ය අද්භූත වූ (ගුණ) ධර්මය වනාහි මා කෙරෙහි ඇත්තේය.

15. "ස්වාමීන් වහන්ස, මේ ආශ්චර්‍ය්‍ය අද්භූතවූ (ගුණ ධර්ම අට මා කෙරෙහි ඇත්තේය. ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මා කවර ආශ්චර්‍ය්‍ය අද්භූත වූ (ගුණ) ධර්ම අටකින් යුක්තවූවෙකු ලෙස ප්‍රකාශ කරණ ලද්දේදැයි මම වනාහි නොදනිමි."

16 ඉක්බිති ඒ භික්ෂූන් වහන්සේ විශාලාමහනුවර උග්ග්‍රගෘහපතියාගේ නිවසෙහි පිණ්ඩපාතය ගෙන හුනස්නෙන්

නැගිට වැඩියේය. (ii) ඉක්බිති ඒ භික්ෂූන් වහන්සේ දානය වළඳා පස්වරු කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක හුන්නේය. (iii) එකත්පසෙක හුන්නාවූ ඒ භික්ෂූන් වහන්සේ විශාලාමහනුවර උග්‍ර ගෘහපතියා සමග (කරණලද) යම් පමණ කථා සල්ලාපයක්වීද, ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේට සැළකෙළේය.

17. "යහපති, යහපති, මහණ, යම් සේ වනාහි හේතු සහිතව ප්‍රකාශ කරන්නාවූ විශාලාමහනුවර උග්‍ර ගෘහපතියා ප්‍රකාශ කරන්නේද, මහණ, මා විසින්ද විශාලාමහනුවර උග්‍ර ගෘහපතියා ආශ්චර්‍ය්‍ය අද්භූතවූ (ගුණ) ධර්ම අටකින් යුක්තවූයේයයි. ප්‍රකාශ කරණ ලද්දේ ඒ මේ (ගුණ) ධර්ම අටින්මය. මහණ, විශාලා මහනුවර උග්‍ර ගෘහපතියා ආශ්චර්‍ය්‍ය අද්භූතවූ මේ (ගුණ) ධර්ම අටින් යුක්ත වූයේයයි මෙනෙහි කරවූ"

**22. හත්ථිගාමක උග්ග සූත්‍රය:-** 1. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ වැදෑරට හස්ති ග්‍රාමයෙහි වැඩවාසය කරණසේක. (මෙහි මේ වර්ගයේ 21 සූත්‍රයේ 1 (ii) යෙදිය යුතුයි.)

"මහණෙනි, හස්තිග්‍රාමයෙහි උග්‍ර ගෘහපතියා (මෙහි 21 සූත්‍රයේ 1 (iv) යෙදිය යුතුයි.)

ඉක්බිති එක්තරා භික්ෂූන් වහන්සේ නමක් පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු රැගෙන හස්තිග්‍රාමක උග්‍ර ගෘහපතියාගේ නිවසට පැමිණියේය. පැමිණ පණවනලද අසුනෙහි වැඩහුන්නේය. එකල්හි හස්තිග්‍රාම උග්‍ර ගෘහපතියා ඒ භික්ෂූන් වහන්සේ වෙත පැමිණියේය. පැමිණ ඒ භික්ෂූන් වහන්සේට වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ හස්තිග්‍රාමක උග්‍ර ගෘහපතියාට ඒ භික්ෂූන් වහන්සේ මෙසේ සැළකෙළේය.

3. (මේ ඡේදය මේ වර්ගයේ 21 සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

4. (මෙහි 4 (i) යෙදිය යුතුයි.) "ගෘහපතිය, එසේයයි" ඒ භික්ෂූන් වහන්සේ හස්තිග්‍රාමක උග්‍ර ගෘහපතියාට ප්‍රතිවචන දුන්නේය. හස්තිග්‍රාමක උග්‍ර ගෘහපතියා මෙසේ ප්‍රකාශ කෙළේය.

**5.** "ස්වාමීන් වහන්ස, යම් දිනයෙක්හි මම නාග වනයෙහි උද්‍යාන ක්‍රීඩාවෙන් හැසිරෙන කල්හි පළමුකොටම දුරදීම භාග්‍යවතුන්වහන්සේ දුටුයෙම්ද, ස්වාමීන්වහන්ස, ඒ දැකීමත් සමගම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මාගේ සිත ප්‍රසන්න වූයේය. සුරා මදයද පහව ගියේය. ස්වාමීන් වහන්ස, මේ පළමුවන ආශ්චර්‍ය්‍ය අද්භූතවූ (ගුණ) ධර්මය වනාහි මා කෙරෙහි ඇත්තේය.

**6-12.** (මේ ඡෙද මේ වර්ගයේ 21 සූත්‍රයේ 6-12 ඡෙද මෙන් වෙත්.

**13.** "ස්වාමීන් වහන්ස, මා වෙත දේවතාවෝ පැමිණ මා විසින් සංඝයා වෙත ආරාධනා කළ කල්හි දේවතාවෝ ම වෙත පැමිණ 'ගෘහපතිය, අසවල් භික්ෂුතෙම උභතොභාග විමුක්තය, අසවල් භික්ෂුතෙම ශුෂ්කවිදර්ශකක්ෂීණාශ්‍රවය. අසවල් භික්ෂුතෙම කයින් ධ්‍යානය ස්පර්ශ කොට පසුව නිවන් ලැබුවේය. අසවල් භික්ෂුතෙම දිට්ඨප්පත්තය, අසවල් භික්ෂුතෙම ශ්‍රද්ධා විමුක්තය, අසවල් භික්ෂුතෙම ශ්‍රද්ධානුසාරීය, අසවල් භික්ෂුතෙම ධර්මානුසාරීය, අසවල් භික්ෂුතෙම යහපත් ස්වභාව ඇත්තාවූ සිල්වතෙක්ය. අසවල් භික්ෂුතෙම ලාමක ස්වභාව ඇත්තාවූ දුශ්ශීලයෙක්යයි, සැලකරත්.' ඒ ආශ්චර්‍ය්‍ය නොවෙයි. ස්වාමීන් වහන්ස, මම වනාහි සංඝයා වළඳවනකල්හි මුන්වහන්සේට ස්වල්පයක් දෙමි. මුන්වහන්සේට බොහෝකොට දෙමි'යි මෙබඳු සිතක් උපදවන ලද්දේයයි නොම දනිමි.

"ස්වාමීන් වහන්ස, මම වනාහි සමසිත් ඇත්තේම දෙමි. ස්වාමීන් වහන්ස, මේ සවැනි වූ ආශ්චර්‍ය්‍ය අද්භූතවූ (ගුණ) ධර්මය වනාහි මා කෙරෙහි ඇත්තේය.

**14.** (මේ ඡෙදය මේ වර්ගයේ 21 සූත්‍රයේ 13 ඡෙදයමෙනි.

**15.** "ස්වාමීන් වහන්ස, ඉදින් වනාහි මම භාග්‍යවතුන් වහන්සේට පළමුවෙන් කළුරිය කරන්නෙම් නම් යම් සඤ්ඤොජනයකින් යුක්තවූ හස්ති ග්‍රාම උග්‍ර ග්‍රහපතියා නැවත මේ ලෝකයට (උත්පත්ති වශයෙන්) එන්නේද එබඳු සඤ්ඤොජනයක් (ඔහුට) නැතැයි භාග්‍යවතුන් වහන්සේ මා (සඳහා) යමක් වදාරණ ලද්දේද එය ආශ්චර්‍ය්‍ය නොවෙයි.

16. (මේ ඡේදය මේ වර්ගයේ 21 සූත්‍රයේ 15 ඡේදය මෙනි.)

17. "ඉක්බිති ඒ භික්ෂූන් වහන්සේ හස්ති ග්‍රාමක උග්‍ර ගෘහපතියාගේ නිවසෙහි පිණ්ඩපාතය ගෙන හුනස්නෙන් නැගිට වැඩියේය. (මෙහි මේ වර්ගයේ 21 සූත්‍රයේ 16 (ii) යෙදිය යුතුයි.) එකත්පසෙක හුන්නාවූ ඒ භික්ෂූන් වහන්සේ හස්ති ග්‍රාමක උග්‍ර ගෘහපතියා සමග (කරණලද) යම් පමණ කථා සල්ලාපයක් වීනම් ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේට සැළකෙළේය.

18. "ගෘහපති, ගෘහපති, මහණ, යම්සේ වනාහි හේතු සහිතව ප්‍රකාශ කරන්නාවූ හස්ති ග්‍රාමක උග්‍ර ගෘහපතියා ප්‍රකාශ කරන්නේද, මහණ, මා විසින්ද හස්තිග්‍රාමක උග්‍ර ගෘහපතියා ආශ්චර්‍ය්‍ය අද්භූතවූ (ගුණ) ධර්ම අටකින් යුක්තවූයේ යයි ප්‍රකාශ කරණ ලද්දේ ඒ මේ ගුණ ධර්ම අටින්මය. මහණ, හස්තිග්‍රාමක උග්‍ර ගෘහපතියා ආශ්චර්‍ය්‍ය අද්භූතවූ මේ ගුණධර්ම අටින් යුක්තවූයේයයි (සිත්හි ලා) දරවු."

23. **හත්ථක සත්ත ධම්ම සූත්‍රය**:- 1. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ අලව්නුවර අග්ගාලව චෛත්‍ය විහාරයෙහි වැඩ වාසය කරණසේක. (මෙහි මේ වර්ගයේ 21 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි) "මහණෙනි, හත්ථක ආලවකයා ආශ්චර්‍ය්‍ය අද්භූතවූ (ගුණ) ධර්ම සතකින් යුක්ත වූයේයයි සිත්හි ලා දරවු. කවර ගුණ ධර්ම සතකින්ද යත්?

2. (i) "මහණෙනි, හත්ථක ආලවකයා, ශ්‍රද්ධාවන්තයෙකි, මහණෙනි, හත්ථක ආලවකයා සිල්වතෙකි, මහණෙනි, හත්ථක ආලවකයා පාපයෙහි ලජ්ජා ඇත්තෙකි, මහණෙනි, හත්ථක ආලවකයා පාපයෙහි භය ඇත්තෙකි, මහණෙනි, හත්ථක ආලවකයා (ධර්මය) උගතෙකි. මහණෙනි, හත්ථක ආලවකයා ත්‍යාගවන්තයෙකි, මහණෙනි, හත්ථක ආලවකයා ප්‍රඥාවන්තයෙකි, (ii) මහණෙනි, හත්ථක ආලවකයා ආශ්චර්‍ය්‍ය අද්භූතවූ මේ (ගුණ) ධර්ම සතින් යුක්ත වූයේයයි සිත්හි ලා දරවු."

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක. මෙසේ වදාරා හුනස්නෙන් නැගිට විහාරයට වැඩිසේක.

3. "ඉක්බිති එක්තරා භික්ෂූන් වහන්සේ නමක් පෙරවරු කාලයෙහි හැඳ පෙරවා පාත්‍ර සිවුරු රැගෙන හත්ථක ආලවකයාගේ නිවස යම් තැනකද, එතැන්හි පැමිණියේය. පැමිණ පණවන ලද අසුනෙහි වැඩහුන්නේය.

ඉක්බිති හත්ථක ආලවකයා ඒ භික්ෂූන් වහන්සේ වෙත පැමිණියේය. පැමිණ ඒ භික්ෂූන් වහන්සේට වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ හත්ථක ආලවකයාට ඒ භික්ෂූන් වහන්සේ මෙසේ සැල කෙළේය.

(ii) "ඇවැත්නි, ඔබ ආශ්චර්‍ය්‍ය අද්භූතවූ (ගුණ) ධර්ම සතකින් යුක්ත වූයේයයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණලද්දේය. ඒ කවර ගුණ ධර්ම සතකින්ද යත්?" (මෙහි 2 (i) යෙදිය යුතුයි.)

"ඇවැත්නි, ඔබ මේ ආශ්චර්‍ය්‍ය අද්භූතවූ ගුණ ධර්ම සතින් යුක්ත වූයේයයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේය."

4. "කිමෙක්ද, ස්වාමීන් වහන්ස, සුදු වස්ත්‍ර හඳින්නාවූ (එබඳුවූ) කිසි ගිහියෙක් නුවූයේද? ඇවැත්නි, සුදු වස්ත්‍ර හඳින්නාවූ (එබඳුවූ) කිසි ගිහියෙක් නුවූයේය. යහපති, ස්වාමීන් වහන්ස, ඉදින් මේ ශාසනයෙහි සුදු වස්ත්‍ර හඳින්නාවූ (එබඳුවූ) කිසි ගිහියෙක් නුවූයේය."

5. "ඉක්බිති ඒ භික්ෂූන් වහන්සේ හත්ථක ආලවකයාගේ නිවසෙහි පිණ්ඩ පාතය ගෙන හුනස්නෙන් නැගිට වැඩියේය. ඉක්බිති ඒ භික්ෂූන් වහන්සේ දන් වළඳා පස්වරු කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ ඒ භික්ෂූන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේට මෙසේ සැල කෙළේය.

6. "ස්වාමීන් වහන්ස, පෙරවරු කාලයෙහි මම හැඳ පෙරවා පාත්‍ර සිවුරු රැගෙන හත්ථක ආලවකයාගේ නිවසට පැමිණියෙමි. පැමිණ පණවන ලද අසුනෙහි හුන්නෙමි. ස්වාමීන් වහන්ස, එකල්හි හත්ථක ආලවකයා මා වෙත පැමිණියේය. පැමිණ වැඳ එකත්පසෙක හුන්නේය. ස්වාමීන් වහන්ස, එකත්පසෙක

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

හුන්නාවූ හත්ථක ආලවකයාට මම මෙසේ ප්‍රකාශ කෙළෙමි. (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

7. "ස්වාමීන් වහන්ස, මෙසේ කියන ලද කල්හි හත්ථක ආලවකයා මට මෙසේ කීයේය. (මෙහි 4 ඡේදය යෙදිය යුතුයි.)

8. "යහපති, යහපති, මහණ, මහණ, ඒ කුලපුත්‍රයා අල්පෙච්ඡයෙකි, තමා කෙරෙහි ඇත්තාවූද කුශල ධර්මයන් අනුන්ට හැඟවීමට නොකැමැති වෙයි. එසේ වී නම් මහණ, ඔබ මේ අටවැනිවූ ආශ්චර්‍ය්‍ය අද්භූතවූ යම් මේ අල්පෙච්ඡ ගුණ ධර්මයෙන්ද හත්ථක ආලවකයා යුක්ත වූයේයයි සිත්හි ලා දරව."

24. **මහාපරිස හත්ථකාලවක සූත්‍රයඃ-** 1. "එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ අලව් නුවර අග්ගාලව චෛතිය විහාරයෙහි වැඩ වාසය කරණසේක. එසමයෙහි හත්ථක ආලවකයා පන්සියයක් පමණ උපාසකවරුන් පිරිවරණ ලදුව භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ හත්ථක ආලවකයාට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

2. "හත්ථකය, තාගේ මේ පිරිස විශාලය, හත්ථකය, තා මේ විශාල පිරිස කෙසේ සංග්‍රහ කෙළේද"

"ස්වාමීන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ සතර සංග්‍රහ වස්තුවක් දෙශනා කරණ ලදද, මම එයින් මේ විශාල පිරිස සංග්‍රහ කරමි.

3. "ස්වාමීන් වහන්ස, මම යමෙකු ගැන මොහු දානයෙන් සංග්‍රහ කළ යුතුයයි දනිම්ද, ඔහුට දානයෙන් සංග්‍රහ කරමි යමෙකු, ගැන මොහු ප්‍රිය වචනයෙන් සංග්‍රහ කළයුතු යයි දනිම්ද, ඔහුට ප්‍රිය වචනයෙන් සංග්‍රහ කරමි. යමෙකු ගැන මොහු අර්ථචරියාවෙන් (වැඩ කටයුතු ගැන උපකාර කිරීමෙන්) සංග්‍රහ කළ යුතුයයි දනිම්ද, ඔහුට අර්ථචරියාවෙන් සංග්‍රහ කරමි. යමෙකු ගැන මොහු සමානාත්මතායෙන් සංග්‍රහ කළ යුතුයයි දනිම්ද, ඔහුට සමානාත්මතායෙන් සංග්‍රහ කරමි. ස්වාමීන් වහන්ස, මාගේ නිවසෙහි භෝග සම්පත් ඇත්තාහ. (එහෙයින්) දිළින්දෝ වනාහි අපගේ අවවාදය පිළිගතයුතු යයි හඟිත්."

**4.** "ගහපති, ගහපති, හත්ථකය,-හත්ථකය, විශාල පිරිසක් සංග්‍රහ කර ගැනීම සඳහා (එකතුකර ගැනීම සඳහා) මේ තාගේ උපායෙකි. හත්ථකය, අතීත කාලයෙහිද යම්කිසි කෙනෙක් මහත්වූ පිරිසක් රැස් කළාහු නම් ඒ සියල්ලෝම මේ සතර සංග්‍රහ වස්තුවෙන්ම මහත්වූ පිරිස සංග්‍රහ කළාහුය. (රැස් කළාහුය.) හත්ථකය, අනාගත කාලයෙහිද යම්කිසි කෙනෙක් මහත්වූ පිරිසක් රැස් කරන්නාහු නම් ඒ සියල්ලෝම මේ සතර සංග්‍රහ වස්තුවෙන්ම මහත්වූ පිරිස සංග්‍රහ කරන්නාහුය. හත්ථකය, වර්තමාන කාලයෙහිද යම්කිසි කෙනෙක් මහත්වූ පිරිසක් රැස් කෙරෙත් නම් ඒ සියල්ලෝම මේ සතර සංග්‍රහ වස්තුවෙන්ම මහත්වූ පිරිස සංග්‍රහ කෙරෙත්මය."

**5.** ඉක්බිති, හත්ථක ආලවකයා භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමි කථාවෙන් කරුණු දක්වන ලද්දේ, සමාදන් කරවන ලද්දේ උද්‍යොග කරණු ලද්දේ ප්‍රසන්න කරණු ලද්දේ හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ ප්‍රදක්ෂිණා කොට ගියේය.

**6** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ හත්ථක ආලවකයා ගිය නොබෝ වේලාවකින් භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක. "මහණෙනි, හත්ථක ආලවකයා ආශ්චර්‍ය්‍ය අද්භූතවූ ගුණ ධර්ම අටකින් යුක්ත වූයේයයි සිත්හි ලා දරව්. ඒ කවර ගුණ ධර්ම අටකින්ද යත්? (මෙහි මේ වර්ගයේ 23 සූත්‍රයේ 2 (i) යෙදිය යුතුයි) අල්පෙච්ඡයෙකි, මහණෙනි, හත්ථක ආලවකයා මේ ගුණ ධර්ම අටින් යුක්ත වූයේයයි සිත්හි ලා දරව්."

**25. මහානාම (සක්ක) සූත්‍රයː-** 1. "එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජන පදයෙහි කිඹුල්වත් පුර නිග්‍රොධාරාමයෙහි වැඩ වාසය කරණසේක. එසමයෙහි මහානාම ශාක්‍ය (රජතුමා) භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට මනාකොට වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ මහානාම ශාක්‍ය (රජතුමා) භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකෙළේය.

**2.** "ස්වාමීන් වහන්ස, කොපමණකින් උපාසකයෙක් වේද?" (උපාසකයාගේ අංග කොපමණද?)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මහානාමය, යම් දිනක පටන් බුදුන් සරණ ගියේද, ධර්මය සරණ ගියේද, සංඝයා සරණ ගියේද, මහානාමය, මෙපමණකින්ම උපාසක නම් වෙයි"

"ස්වාමීන් වහන්ස, කොපමණකින් උපාසකයා සිල්වත් වේද?"

"මහානාමය, යම් දිනක පටන් ප්‍රාණඝාතයෙන් තොර වූයේ වේද, අදත්තාදානයෙන් තොර වූයේ වේද, කාමයෙහි වරදවා හැසිරීමෙන් තොර වූයේ වේද, බොරු කීමෙන් තොර වූයේ වේද, ප්‍රමාදයට හේතුවූ මත්පැන් පානයෙන් තොරවූයේ වේද, මහානාමය, මෙපමණකින් උපාසකයා සිල්වතෙක් වෙයි."

"ස්වාමීන් වහන්ස, කොපමණකින් උපාසකයා අන්‍යයාගේ හිත වැඩ පිණිස නොව තමාගේ හිත වැඩ පිණිස පිළිපන්නේ වේද?"

3. "මහානාමය, යම් දිනක පටන් උපාසකයා තමා (පමණක්) ශ්‍රද්ධා සම්පත්තියෙන් යුක්තවූයේ වේද, අන්‍යයා ශ්‍රද්ධාසම්පත්තියෙහි නොයොදවාද, තමා (පමණක්) ශීල සම්පත්තියෙන් යුක්තවූයේ වේද, අන්‍යයා සීල සම්පත්තියෙහි නොයොදවාද, තමා (පමණක්) ත්‍යාග සම්පත්තියෙන් යුක්ත වූයේ වේද, අන්‍යයා ත්‍යාග සම්පත්තියෙහි නොයොදවාද, තමා (පමණක්) භික්ෂූන් දැකීමට කැමති වේද, අන්‍යයා භික්ෂූන් දැකීමෙහි නොයොදවාද, තමා (පමණක්) සද්ධර්මය ඇසීමෙහි කැමති වේද, අන්‍යයා සද්ධර්මය ඇසීමෙහි නොයොදවාද, තමා (පමණක්) ඇසූ ධර්මයන් ධාරණය කර ගැනීමෙහි කැමති වේද, අන්‍යයා ධර්මය දරා ගැනීමෙහි නොයොදවාද, තමා (පමණක්) දරා ගත් ධර්මයන්ගේ අර්ථ මෙනෙහි කරන්නේ (පරීක්ෂා කරන්නේ) වේද, අන්‍යයා ධර්මාර්ථය පරීක්ෂණයෙහි නොයොදවාද, තමා (පමණක්) ධර්මාර්ථය දැන, ධර්මය දැන ධර්මානු ධර්ම ප්‍රතිපත්තියෙහි පිළිපන්නේ වේද, අන්‍යයා ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි නොයොදවාද, මහානාමය, මෙපමණකින් උපාසකයා පර හිත වැඩ පිණිස නොව තමා හිත වැඩ පිණිස පිළිපන්නේ වෙයි."

4. "ස්වාමීන් වහන්ස, කොපමණකින් වනාහි උපාසකයා අත් වැඩ පිණිස පිළිපන්නේත් වේද, පර වැඩ පිණිසත් පිළිපන්නේත් වේද,

"මහානාමය, යම් දිනක පටන් තමා විසින්ද, ශ්‍රද්ධා සම්පත්තියෙන් යුක්තවූයේ වේද, අන්‍යයාද ශ්‍රද්ධා සම්පත්තියෙහි යොදවාද, තෙමේ ශීල සම්පත්තියෙන් යුක්තවූයේ වේද, අන්‍යයාද ශීල සම්පත්තියෙහි යොදවාද, තෙමේ ත්‍යාග සම්පත්තියෙන් යුක්තවූයේ වේද, අන්‍යයාද ත්‍යාග සම්පත්තියෙහි යොදවාද, තෙමේ භික්ෂූන් දැකීමෙහි යෙදුනේ වේද, අන්‍යයාද භික්ෂූන් දැකීමෙහි යොදවාද, තෙමේ බණ ඇසීමෙහි යෙදුනේවේද, අන්‍යයාද බණ ඇසීමෙහි යොදවාද, තෙමේ ඇසූ බණ සිත තබා ගැනීමෙහි යෙදුනේවේද, අන්‍යයාද ඇසූ බණ සිත තබා ගැනීමෙහි යොදවාද, තෙමේ සිත තබාගත් ධර්මයෙන් අර්ථ පරීක්ෂා කිරීමෙහි යෙදුනේවේද, අන්‍යයාද සිත තබාගත් ධර්මයෙහි අර්ථ පරීක්ෂා කිරීම පිණිස යොදවාද, තෙමේ අර්ථය දැන ධර්මය දැන ධර්මානුධර්ම ප්‍රතිපදාවෙහි, (බණට අනුව පිළිපැදීමෙහි) යෙදුනේ වේද අන්‍යයාද බණට අනුව පිළිපැදීමෙහි යොදවාද. මහා නාමය, මෙපමණකින් උපාසකයා අත් වැඩ පිණිසත් පර වැඩ පිණිසත් පිළිපන්නේ වෙයි."

**26. ජීවක කොමාරභච්ච සූත්‍රයː-** 1 එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ජීවක අඹ උයනෙහි වැඩ වාසය කරණසේක. එසමයෙහි කෝමාරභච්ච නම්වූ ජීවකයා (වෛද්‍යවරයා) භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට මනාකොට වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ කෝමාරභච්ච නම්වූ ජීවකයා (වෛද්‍යවරයා) භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැල කෙළේය.

2-4 (මේ සූත්‍රයේ 2-4 ඡෙද මේ වර්ගයේ 25 සූත්‍රයේ 2-4 ඡෙද මෙන් වෙත්. 'මහානාමය' වෙනුවට 'ජීවක' කියා යොදාගත යුතුයි.)

**27 අට්ඨබල සූත්‍රයː-** "මහණෙනි, මේ (ලෝකයෙහි) බල අටෙක් වෙත්. කවර අටෙක්ද යත්? මහණෙනි, ළදරුවෝ හැඬීම

බලයකොට වසන්නාහ. ස්ත්‍රීවරු ක්‍රොධය බලයකොට වසන්නාහ. සොරු ආවුධ බලය කොට වසන්නාහ රජවරු ඓශ්වර්‍ය්‍යය බලය කොට වසන්නාහ. අඥානයෝ උසස්ව ඝෝෂාකොට අවඥාකිරීම බලය කොට වසන්නාහ. පණ්ඩිතයෝ ඉවසීම හෝ යුතු අයුතු පරීක්ෂණය බලයකොට වසන්නාහ. ධර්ම ශාස්ත්‍රයන් උගත්තාහු (ඒ අනුව) නුවණින් මෙනෙහි කිරීම බලය කොට වසන්නාහ. නික්ලෙශී උත්තමයෝද පැවිදි උතුමෝද ඉවසීම බලයකොට වසන්නාහ. මහණෙනි, මේ අට බල (ධර්ම) යෝ වෙත්."

28. **ඛීණාසව බල සූත්‍රයඃ**- 1 "ඉක්බිති ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට මනාකොට වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2 "ශාරීපුත්‍රය, යම්කිසි බල ධර්මවලින් යුක්තවූ ආශ්‍රව ක්ෂය කළාවූ (රහත්වූ) භික්ෂුතෙම 'මාගේ (කාමාදී) ආශ්‍රවයෝ ක්ෂය වූවාහු යයි ආශ්‍රවයන්ගේ ක්ෂයවීම ප්‍රතිඥා කෙරේද, (එබඳුවූ) ක්ෂීණාශ්‍රව භික්ෂුවගේ බල ධර්මයෝ කෙතෙක්ද?"

3 "ස්වාමීන් වහන්ස, යම්කිසි බල ධර්මවලින් යුක්තවූ ක්ෂිණාශ්‍රව භික්ෂුතෙම මාගේ (කාමාදී) ආශ්‍රවයෝ ක්ෂයවූවාහු යයි ආශ්‍රවයන්ගේ ක්ෂයවීම ප්‍රතිඥා කෙරේනම් (එබඳුවූ) ක්ෂීණාශ්‍රව භික්ෂුවගේ බල ධර්මයෝ අටදෙනෙක් වෙත්.

4 "කවර අටදෙනෙක්ද යත්? ස්වාමීන් වහන්ස, මේ ශාසනයෙහි ක්ෂීණාශ්‍රව භික්ෂුව විසින් සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍ය වශයෙන් තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් යහපත් ලෙස දක්නා ලද්දෝ වෙත්.

5 "ස්වාමීන් වහන්ස, ක්ෂීණාශ්‍රව භික්ෂුව විසින් සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍ය වශයෙන් තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් යහපත් ලෙස දක්නා ලද්දෝය යන යම් බලයක් වේද, (ii) ස්වාමීන් වහන්ස, ක්ෂීණාශ්‍රව භික්ෂු තෙම යම් බලයකට පැමිණ 'මාගේ කාමාදී ආශ්‍රවයෝ ක්ෂයවූවාහු යයි' ආශ්‍රවයන්ගේ

ක්ෂයවීම ප්‍රතිඥා කෙරේනම්, මෙයද ක්ෂීණාශ්‍රව භික්ෂුවගේ බලයක් වේ.

6 "ස්වාමීන් වහන්ස, නැවතද ක්ෂීණාශ්‍රව භික්ෂුව විසින් කාමයෝ ගිනි අඟුරු වළකට උපමා ඇත්තාහුයයි තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් යහපත්ව දක්නාලද්දෝ වෙත් ස්වාමීන් වහන්ස, ක්ෂීණාශ්‍රව භික්ෂුව විසින් කාමයෝ ගිනි අඟුරු වළකට උපමා ඇත්තාහුයයි තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් යහපත් ලෙස දක්නා ලද්දෝය යන යම් බලයක් වේද, (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

7 "ස්වාමීන් වහන්ස, නැවතද ක්ෂීණාශ්‍රව භික්ෂුවගේ සිත ඵල සමාපත්ති වශයෙන් උපධි විවෙක සංඛ්‍යාතවූ නිර්වාණයට නැමුනේ වේ. නිර්වාණයට යොමුවූයේ වේ. නිර්වාණය දෙසට බරවූයේ වේ. ක්ලෙශයන්ගෙන් තොරවූයේද දුරු වූයේද වේ. ගිහිගෙන් නික්ම පැවිදි වීමෙහි හා භවයෙන් නික්මීමෙහි ඇලුනේවේ. සර්වප්‍රකාරයෙන් (කාමාදී) ආශ්‍රව ධර්මයන්ගෙන් වෙන්වූයේ වේ.

"ස්වාමීන් වහන්ස, ක්ෂීණාශ්‍රව භික්ෂුවගේ සිත ඵල සමාපත්ති වශයෙන් උපධි විවේක සංඛ්‍යාතවූ නිර්වාණයට නැමුනේය, නිර්වාණයට යොමුවූයේය, නිර්වාණය දෙසට බර වූයේය. ක්ලේශයන්ගෙන් තොරවූයේය, දුරුවූයේය, ගිහිගෙන් නික්ම පැවිදි වීමෙහි හා භවයෙන් නික්මීමෙහි ඇලුනේය යන යම් බලයක් වේද, (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

8 "ස්වාමීන් වහන්ස, නැවතද ක්ෂීණාශ්‍රව භික්ෂුව විසින් සතර සති පට්ඨාන ධර්මයෝ යහපත්ව භාවනා කරණ ලද්දාහු වෙත්. (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

9 "ස්වාමීන් වහන්ස, නැවතද ක්ෂිණාශ්‍රව භික්ෂුව විසින් සතර ඍද්ධිපාද ධර්මයෝ යහපත්ව භාවනා කරණ ලද්දාහු වෙත් (මෙහි 5 (ii) ඡෙදය යෙදිය යුතුයි.) ශ්‍රද්ධාදි පඤ්චෙන්ද්‍රිය ධර්මයෝ යහපත්ව භාවනා කරණ ලද්දාහු වෙත්. (මෙහි 5 (ii) ඡෙදය යෙදිය යුතුයි.) සප්තබොධ්‍යංග ධර්මයෝ යහපත්ව භාවනා කරණ ලද්දාහු වෙත්. (මෙහි 5 (ii) ඡෙදය යෙදිය යුතුයි.)

ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයතෙම යහපත්ව භාවනා කරණ ලද්දේ වේ.

"ස්වාමීන් වහන්ස, ක්ෂීණාශ්‍රව භික්ෂුව විසින් ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය තෙම යහපත්ව භාවනා කරණ ලද්දේය යන යම් බලයක් වේද, (මෙහි 5 (ii) යෙදිය යුතුයි.)

10 යම්කිසි බලයකින් යුක්තවූ (මේ ඡේදය 1 ඡේදය මෙනි.)

**29 අට්ඨක්ඛණ සූත්‍රය:-** 1 "මහණෙනි, ධර්මය නොදත් පෘථග්ජනතෙම ලෝකයා අවකාශ ලැබ කටයුතු කරන්නේය, ලෝකයා අවකාශ ලැබ කටයුතු කරන්නේයයි කියයි, (එසේද වුවත්) හෙතෙම අවකාශය හෝ අනවකාශය නොදනී. මහණෙනි, මේ අවස්ථා අට ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාව රැකීමට අනවකාශවූ අකාලයෝ වෙත් කවර අවස්ථා අටෙක්ද යත්?

2 (i) "මහණෙනි, මේ ලොකයෙහි අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ, අෂ්ටවිද්‍යා පසළොස් චරණ ධර්මයන්ගෙන් යුක්තවූ යහපත් ගමන් ඇත්තාවූ, කාමරූප, අරූපාදී ලොකයන් දත්තාවූ, නිරුත්තරවූ, බඹ සුර නර ආදී පුරුෂයන් දමනය කිරීමෙහි සාරථීවූ දෙවි මිනිසුන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නාවූ ස්වයම්භූඥානයෙන් චතුරාර්‍ය්‍ය සත්‍යය අවබොධ කළාවූ (ii) විභජ්ජවාදීවූ තථාගතයන් වහන්සේ පහළවූයේ වේද,

3 (i) "කෙලෙස් සන්සිඳවන්නාවූ, ක්ලෙශ පරිනිර්වාණය කරන්නාවූ, සතර මාර්ගඥාන සංඛ්‍යාතවූ සම්බෝධියට පමුණුවන්නාවූ බුදුරජාණන් වහන්සේ විසින් යහපත්ව දෙශනා කරණ ලද්දාවූ ශ්‍රී සද්ධර්මයද දෙශනා කරණු ලැබේද (ii) (එකල්හි) යම් මේ පුද්ගලයෙක් තෙම නරකයෙහි උපන්නේ වේද, (iii) මහණෙනි, මේ ශාසන බ්‍රහ්මචරියාව රැකීම සඳහා අනවකාශවූ (iv) පළමුවනි අකාලයයි.

4 "නැවතද (මෙහි 2 (i) යෙදිය යුතුයි.) තථාගතයන් වහන්සේ පහළවූයේ වේද, (මෙහි 3 (i) යෙදිය යුතුයි.) යම් මේ පුද්ගලයෙක් තෙම තිරිසන් යොනියෙහි උපන්නේ වේද, (මෙහි 3 (iii යෙදිය යුතුයි.) දෙවෙනි අකාලයයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

5 "නැවතද (මෙහි 2 (i) යෙදිය යුතුයි.) තථාගතයන් වහන්සේ පහළවූයේ වේද යම් මේ පුද්ගලයෙක් තෙම ප්‍රෙත ලොකයෙහි උපන්නේ වේද (මෙහි 3 (iii) යෙදිය යුතුයි.) තුන් වෙනි අකාලයයි.

6 "නැවතද (මෙහි 2 (i) යෙදිය යුතුයි.) තථාගතයන් වහන්සේ පහළවූයේ වේද යම් මේ පුද්ගලයෙක් තෙම අසඤ්ඤසත්ත දෙවනිකාය ආදීවූ යම්කිසි දෙව නිකායෙක්හි උපන්නේ වේද, (මෙහි 3 (iii) යෙදිය යුතුයි) හතරවෙනි අකාලයයි.

7 "නැවතද (මෙහි 2 (i) යෙදිය යුතුයි) තථාගතයන් වහන්සේ පහළවූයේ වේද, යම් මේ පුද්ගලයෙක් තෙම භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිවුවණක් පිරිසට අයොග්‍යවූ අප්‍රසිද්ධවූ පිටිසර මිලෙච්ඡ ජනපදයෙක්හි උපන්නේ වේද, (මෙහි 3 (iii) යෙදිය යුතුයි) පස්වෙනි අකාලයයි.

8 "නැවතද (මෙහි 2 (i) යෙදිය යුතුයි) තථාගතයන් වහන්සේ පහළවූයේ වේද, යම් මේ පුද්ගලයෙක් තෙම මධ්‍ය ජනපදයෙහි උපන්නේ වේද, (එසේද වුවත්) හෙතෙම මිථ්‍යා දෘෂ්ටිකයෙක් වූයේ, දුන් දේ පල නැත, යාග කළ දේ පල නැත. හෝම කළ දේ පල නැත, කුශලා කුශල ධර්මයන්ගේ ඵල විපාක නැත, මෙලොව නැත, පරලොව නැත, මවු නැත, පියා නැත, ඔපපාතිකවූ (දිව්‍ය බ්‍රහ්මාදී) සත්වයෝ නැත, මේ ලොකයෙහි සම්‍යක් මාර්ගයෙහි ගමන් කරන්නාවූ යහපත් ප්‍රතිපත්තියෙන් යුක්තවූ මෙලොව පරලොව ගැන තමා විසින්ම විශිෂ්ට ඥානයෙන් අවබොධ කොට දෙශනා කරන්නාවූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝද නැතැයි විපරීත දෘෂ්ටි ඇත්තේ වේද, (මෙහි 3 (iii) යෙදිය යුතුයි) හයවෙනි අකාලයයි.

9 "නැවතද (මෙහි 2 (i) යෙදිය යුතුයි) තථාගතයන් වහන්සේ පහළවූයේ වේද, යම් මේ පුද්ගලයෙක් තෙම මධ්‍ය ජනපදයෙහි උපන්නේ වේද, (එසේද වුවත්) හෙතෙම අඥානවූයේ වේද, ජඩවූයේ වේද, කෙළතොලුවූයේ වේද, යහපත්වූ හෝ අයහපත්වූ වචනයාගේ අර්ථය අවබොධ කරගැනීමෙහි අපොහොසත් වේද,

මහණෙනි, මේ ශාසන බ්‍රහ්මචරියාව රැකීම සඳහා අනවකාශවූ සත්වැනි අකාලයයි.

10 "නැවතද (මෙහි 2 (i) යෙදිය යුතුයි) තථාගතයන් වහන්සේ පහළවූයේත් නොවේද, (මෙහි 3 (i) යෙදිය යුතුයි) යම් මේ පුද්ගලයෙක් තෙම මධ්‍ය දෙශයෙහි උපන්නේ වේද, හෙතෙම ප්‍රඥාවන්තවූයේද, ජඩනුවූයේද, කෙළතොලු නුවූයේද, යහපත්වූ හෝ අයහපත්වූ වචනයාගේ අර්ථය අවබොධ කර ගැනීමෙහි සමර්ථවේද, මහණෙනි, මේ ශාසන බ්‍රහ්ම චරියාව රැකීම සඳහා අනවකාශවූ අටවැනි අකාලයයි. මහණෙනි, මේ ශාසන බ්‍රහ්ම චරියාව රැකීම සඳහා අනවකාශවූ නොකල් අට වෙත්.

11 "මහණෙනි, ශාසන බ්‍රහ්මචරියාව රැකීම සඳහා (යොග්‍යවූයේ) එකම කාලයයි. කවර එකම කාලයක්ද යත්? (මෙහි 2 (ii) යෙදිය යුතුයි) තථාගතයන් වහන්සේ පහළවූයේ වේද, (මෙහි 3 (i) යෙදිය යුතුයි) ඒ මේ පුද්ගල තෙමේත් මධ්‍ය දෙශයෙහි උපන්නේ වේද, හෙතෙම ප්‍රඥාවන්තවූයේ ජඩනොවූයේ කෙළතොලු නොවූයේ යහපත්වූ හෝ අයහපත්වූ වචනයාගේ අර්ථය අවබොධ කර ගැනීමෙහිත් සමර්ථ වූයේ වේද, මහණෙනි, මේ ශාසන බ්‍රහ්මචරියාව රැකීම සඳහා යොග්‍යවූ එකම කාලයයි."

12 (1) "යම් කිසිවෙක් මනුෂ්‍ය ලාභය ලැබ (මිනිසත් බැව්හි ඉපිද) යහපත්ව දෙශනා කරණ ලද ශ්‍රී සද්ධර්මයද ලැබ එහි ඵලයට නොපැමිණෙත්ද, ඔවුහු ක්ෂණ සම්පත්තිය ඉක්මවත්.

2 "පුද්ගලයාගේ අනතුරට හෙතුවූ අනවකාශ කාලයෝ බොහොමයක් වදාරණ ලදහ. ලොකයෙහි බොහෝ දීර්ඝ කාලයකින් බුදුවරයන් වහන්සේලා උපදිත්. ලොකයෙහි ඉතා දුර්ලභවූ යමක් වේනම් ඒ බුද්ධොත්පාද කාලය ප්‍රමුඛවූ (පළමුවැනිවූ) දුර්ලභ කාලයයි,

3 "මිනිසත් බව ලැබීමද, සද්ධර්ම ශ්‍රවණය ලැබීමද (දුර්ලභයි.) අනර්ථකාමීවූ සත්ත්වයා විසින් ඒ දුර්ලභ කාලයෙහි උත්සාහ කිරීම සුදුසුය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

4 "මේ ක්ෂණ සම්පත්තිය ලැබ ශ්‍රී සද්ධර්මය කෙසේ නම් පැහැර හැරිය යුතුද, ඒකාන්තයෙන්ම මේ ක්ෂණ සම්පත්තිය ඉක්මයා නොදේවා, ක්ෂණ සම්පත්තිය ඉක්මවූවෝ වනාහි නිරයට පැමිණ ශොක කෙරෙත්.

5 'ඉදින් යම්කිසි ප්‍රමාදචාරී පුද්ගලයෙක් මෙලොවදී මේ ක්ෂණ සම්පත්තිය ලැබ ශ්‍රී සද්ධර්මයට නියමවූ ආර්‍ය්‍ය මාර්ගය නොලබාද, ඔහු (ප්‍රමාදයෙන්) පිරිහෙලා ගන්නා ලද වස්තුව ඇති වෙළෙන්දා මෙන් දීර්ඝකාලයක් මුලුල්ලෙහි ඒ අනුව ශොක කරන්නේ වේ.

6 "මොහාන්ධකාරයෙන් වළඳනා ලද්දාවූ සද්ධර්මය (ගැන නොසැලකීමෙන් එයට) අපරාධ කළාවූ ඒ පුරුෂ තෙම ජාති මරණාදී සසර දුක දීර්ඝ කාලයක් මුලුල්ලෙහි අනුභව කරන්නේය.

7 "යම් කිසිවෙක් මිනිසත් බව ලැබ යහපත්ව දෙශනා කරණ ලද ශ්‍රී සද්ධර්මයෙහි (පිහිටියේ) බුද්ධ වචනය කළාහුද, මතුද කරන්නාහුද, දැනුදු කෙරෙත්ද, ඔවුහු ලොකයෙහි නිරුත්තරවූ ශාසන බ්‍රහ්මචරියාව ප්‍රතිවෙධ කළාහුය.

8 "යම් කෙනෙක් තථාගතයන් වහන්සේ විසින් දෙශනා කර වදාළවූ මාර්ගයට පිළිපන්නාහුද, යම් කෙනෙක් සූර්‍ය්‍යබන්ධුවූ දිව්‍ය චක්ෂුසාදී පසැස් ඇත්තාවූ (බුදුරජාණන් වහන්සේ) විසින් දෙශනා කර වදාරණ ලද සංවරයෝ වෙත් නම් ඒ සංවරයන්හි හික්මුනාහු සියලු කල්හි ස්මෘතිමත්වූවාහු කාමාදී ආශ්‍රව රහිතවූවාහු වාසය කරන්නාහු ද, ඔවුහු මාරධෙය්‍ය සංඛ්‍යාතවූ සසර අනුව යන්නාවූ සියලු අනුසය ධර්මයන්හි සිඳ ලොකයෙහි යම්කිසි කෙනෙක් අර්හත්වයට පැමිණියාහුද එමෙන් නිර්වාණයට පැමිණියාහු වෙත්."

**30. අනුරුද්ධ සූත්‍රය:-** 1. "එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ භග්ග ජනපදයෙහිවූ, සුංසුමාරගිර, භෙසකලාවන මෘගදායෙහි, වැඩවාසය කරණසේක. එසමයෙහි වනාහි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ චෙතිය රට ප්‍රාචීන වංශදායෙහි වැඩ වාසය කරණසේක.

2 "එකල්හි රහසිගතව විවේකව වාසය කරන්නාවූ ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේගේ සිතෙහි මෙබඳුවූ මහා පුරුෂ විතර්කයක් උපන්නේය.

(ii) 'මේ ධර්මය, අල්පෙච්ඡයාහටය, මේ ධර්මය මහා තෘෂ්ණා ඇත්තාහට නොවේ. මේ ධර්මය ලද දෙයින් සතුටු වන්නාහටය. මේ ධර්මය ලදදෙයින් සතුටු නොවන්නාට නොවේ. මේ ධර්මය ප්‍රකර්ෂ විවේක ඇත්තාහටය, මේ ධර්මය පිරිසෙහි හා ක්ලෙශ ධර්මයෙන්හි ඇලී ගැලී වාසය කරන්නාහට නොවේ. මේ ධර්මය පටන්ගන්නාලද කායික චෛතසික වීර්‍ය්‍යය ඇත්තාහටය, මේ ධර්මය කුසීතයාහට නොවේ. මේ ධර්මය සතිපට්ඨාන වශයෙන් එළඹ සිටි සිහි ඇත්තාහටය, මේ ධර්මය සිහි මුළාවූවහුට නොවේ, මේ ධර්මය එකඟවූ සිත් ඇත්තාහටය. මේ ධර්මය එකඟනුවූ සිත් ඇත්තාහට නොවේ. මේ ධර්මය ප්‍රඥාවන්තයාහටය, මේ ධර්මය, අඥානයාට නොවේ' යනුයි.

3. "එකල්හි භාග්‍යවතුන්වහන්සේ, තමන්වහන්සේගේ සිතින් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේගේ සිත (හටගත්) විතර්කය පිරිසිඳ දැන (ii) යම් සේ වනාහි බලවත් පුරුෂයෙක් තෙම හකුළුවන ලද අතක් දිගුකරන්නේ යම් වේගයකින්ද, දිගුකරණලද අතක් හකුළුවන්නේ යම්වේගයකින්ද එපමණ වේගයෙන් (iii) භග්ග ජනපදයෙහි සුංසුමාරගිර, භෙසකලා වන මෘගදායෙහි අතුරුදන්වූසේක්, චෙතියරට ප්‍රාචීන වංශදායෙහි ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ ඉදිරියෙහි පහළවූසේක. භාග්‍යවතුන් වහන්සේ එහි පණවනලද අසුනෙහි වැඩහුන්සේක. ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේද භාග්‍යවතුන් වහන්සේට මනාකොට වැඳ එකත්පසෙක හුන්සේක. එකත්පසෙක හුන්නාවූ ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

4. "යහපති, යහපති, අනුරුද්ධය, අනුරුද්ධය, ඔබ මහා පුරුෂ විතර්ක සත කල්පනා කිරීම යහපත්මය, (මෙහි 2 (ii)

යෙදිය යුතුයි.) එසේවීනම් අනුරුද්ධය, ඔබ මේ ධර්මය තෘෂ්ණා මානදෘෂ්ටි නම්වූ ප්‍රමාදයන්ගෙන් තොරවූ හෙයින් නිෂ්ප්‍රපඤ්ච නම් වූ නිර්වාණ පදයෙහි ඇලුනහුටය, මේ ධර්මය ප්‍රමාදයෙහි ඇලුනහුට නොවේයයි, මේ අටවැනිවූ මහා පුරුෂ විතර්කයද කල්පනා කරව.

5. (i) "අනුරුද්ධය, ඔබ යම් දිනක පටන් මේ අෂ්ට මහා පුරුෂ විතර්කයක් කල්පනා කරන්නෙහිද, අනුරුද්ධය ඔබ එතැන්පටන් (ii) වස්තුකාම, ක්ලේශ කාමයන්ගෙන් වෙන්ව ව්‍යාපාදාදී අකුශල ධර්මයන්ගෙන් වෙන්ව, විතර්ක සහිතවූ විචාර සහිතවූ ප්‍රීතිය හා සැපය ඇත්තාවූ ප්‍රථමද්ධ්‍යානයට පැමිණ යම්තාක් වාසය කරන්නෙහිය. (මෙහි 5 (i) යෙදිය යුතුයි.) විතර්ක විචාරයන් සන්සිඳවීමෙන් සිතෙහි පැහැදීම් ඇත්තාවූ චිත්තයාගේ එකග්‍රතාවයයි කියනලද විතර්ක විචාරයන්ගෙන් තොරවූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇත්තාවූ දෙවැනි ධ්‍යානයට පැමිණ යම්තාක් වාසය කරන්නෙහිය. (මෙහි 5 (i) යෙදිය යුතුයි.) ප්‍රීතියෙහිද නොඇලී උපෙක්ෂාසහගතව වාසයකරන්නෙහි, ස්මෘතිමත්වූයේ සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූයේම සැපයද කයින් විඳින්නෙහි, ආර්‍ය්‍යයන් වහන්සේලා යම් ධ්‍යානයකට සමවැදුනෙකු සඳහා උපෙක්ෂාසහගතවූ ස්මෘතිමත්වූ සැපවිර්ණයෙන් යුක්තවූ වෙකැයි ප්‍රකාශකරන්නාහුද ඒ තෘතීය ධ්‍යානයට පැමිණ යම්තාක් වාසය කරන්නෙහිය. (මෙහි 5 (i) යෙදිය යුතුයි.) සැප සිතිවිලිද දුරු කිරීමෙන් දුක් සිතිවිලිද දුරුකිරීමෙන් පෙර මෙන් සොම්නස් දොම්නස් දුරුකිරීමෙන් දුක් සිතිවිලි නැත්තාවූ, සැප සිතිවිලි නැත්තාවූ මැදහත්වූ සිහියෙන් පිරිසිදුවූ සිවුවැනි ධ්‍යානයට පැමිණ යම්තාක් වාසයකරන්නෙහිය. මෙහි 5 (i) යෙදිය යුතුයි.) පිරිසිදු සිත් ඇත්තාවූ මෙලොවම සැප විහරණ ඇත්තාවූ මේ චතුර්විධ ධ්‍යානයන්ද කැමැතිසේ ලෙහෙසියෙන් සුවසේ ලැබුවෙක් වෙහිද,

6. අනුරුද්ධය, ඔබට එතැන්පටන් යම්සේ වනාහි ගෘහපතියෙකුට හෝ ගෘහපති පුත්‍රයෙකුට හෝ නානාප්‍රකාර වර්ණවලින් රඳනාලද වස්ත්‍රයන්ගෙන් පුරවනලද වස්ත්‍ර කරඬුවක්

වන්නේද, එපරිද්දෙන්ම වනාහි යථාලාභ සන්තෝෂයෙන් වාසය කරන්නාවූ ඔබට සිත් ඇලවීම පිණිස, තෘෂ්ණාදෘෂ්ටි ආදියෙන් නොතැවීම පිණිස, සැප විහරණය පිණිස, නිර්වාණ ධර්මයට බැසගැනීම පිණිස සිවුරු අතුරෙන් පංසුකූල චීවරය (සුදුසුයයි) හැඟෙන්නෙහිය.

7 (i) අනුරුද්ධය, ඔබ යම් දිනක පටන් මේ අෂ්ට මහා පුරුෂ විතර්කයන් කල්පනා කරන්නෙහිද, පිරිසිදු සිත් ඇත්තාවූ මේ ආත්මයෙහි සැප විහරණ ඇත්තාවූ මේ චතුර් විධ ධ්‍යානයන්ද කැමතිසේ ලෙහෙසියෙන් සුවසේ ලැබුවෙහිද, (ii) අනුරුද්ධය, එතැන්පටන් ඔබට යම්සේ වනාහි ගෘහපතියෙකුට හෝ ගෘහපති පුත්‍රයෙකුට හෝ නොයෙක් සූප ඇත්තාවූ නොයෙක් ව්‍යඤ්ජන ඇත්තාවූ කළු සහල් ඉවත්කොට (පිසිනලද) ඇල් බතක් වේද, එපරිද්දෙන්ම වනාහි යථාලාභ පිණ්ඩපාත භොජනයෙන් සතුටුවන්නාවූ ඔබට සිත් ඇලවීම පිණිස, තෘෂ්ණා දෘෂ්ටි ආදියෙන් නොතැවීම පිණිස, සැප විහරණය පිණිස නිර්වාණධර්මයට බැසගැනීම පිණිස, ගෙපිළිවලින් ලබනලද පිණ්ඩපාත භොජනය (සුදුසුයයි) හැඟෙන්නෙහිය.

8 (මෙහි 7 (i) යෙදිය යුතුයි.) අනුරුද්ධය, එතැන් පටන් ඔබට යම්සේ වනාහි ගෘහපතියෙකුට හෝ ගෘහපති පුත්‍රයෙකුට හෝ ඇතුළත පිටත සුධාලෙප කරණ ලද්දාවූ වාතාවරණ ඇත්තාවූ, යහපත් දොරඅගුළු ඇත්තාවූ යොදනලද වා කවුළු (ජනෙල්) ඇත්තාවූ කුළු ගෙයක් වේද, එපරිද්දෙන්ම වනාහි යථාලාභ සෙනාසන පරිභොගයෙන් සතුටුවන්නාවූ ඔබට සිත් ඇලවීම පිණිස, තෘෂ්ණා දෘෂ්ටි ආදියෙන් නොතැවීම පිණිස, සැප විහරණය පිණිස, නිර්වාණ ධර්මයට බැසගැනීම පිණිස, රුක්මුල සෙනසුන (සුදුසුයයි) හැඟෙන්නෙහිය.

9 (මෙහි 7 (ii) යෙදිය යුතුයි.) අනුරුද්ධය, එතැන් පටන් ඔබට යම්සේ වනාහි ගෘහපතියෙකුට හෝ ගෘහපති පුත්‍රයෙකුට හෝ සතරඟුලකින් වඩා දික්වූ කළු ලොමින් කරණ ලද ඇතිරිලි අතුරණ ලද හෝ, සුදු එළු ලොමින් කරණ ලද ඇතිරිලි අතුරණ ලද හෝ, ඝන පුෂ්පයන් දක්වා සුදු එළු ලොමින් කරණ ලද

ඇතිරිලි අතුරණ ලද හෝ කෙසෙල්මුව සමින් කරණ ලද උතුම් පසතුරුණු අතුරණ ලද හෝ, මතුයෙහි බඳින ලද රතු වියනින් යුක්තවූ, හිස පය දෙපයෙහි තබන ලද රතු කොට්ට ඇත්තාවූ, ආසනයක්වේද, එපරිද්දෙන්ම වනාහි යථා ලාභ සයනාසන පරිභොගයෙන් සතුටු වන්නාවූ ඔබට සිත් ඇලවීම පිණිස, තෘෂ්ණාදෘෂ්ටි ආදියෙන් නොතැවීම පිණිස, සැප විහරණය පිණිස නිර්වාණ ධර්මයට බැස ගැනීම පිණිස තණ ඇතිරිය (සුදුසුයයි) හැඟෙන්නෙහිය,

10. (මෙහි 7 (i) යෙදිය යුතුයි.) අනුරුද්ධය, එතැන් පටන් ඔබට යම්සේ වනාහි ගෘහපතියෙකුට හෝ ගෘහපති පුත්‍රයෙකුට හෝ, නොයෙක් බෙහෙත් වන්නාහුද, ඒ කවර බෙහෙත්ද යත්? ගිතෙල්ය, වෙඬරුය, තලතෙල්ය, මීපැණිය, පැණිය, යන මොහුයි, එපරිද්දෙන්ම වනාහි යථාලාභ ගිලන්පස පරිභොගයෙන් සතුටුවන්නාවූ ඔබට සිත් ඇලවීම පිණිස, තෘෂ්ණාදෘෂ්ටි ආදියෙන් නොතැවීම පිණිස, සැප විහරණය පිණිස, නිර්වාණ ධර්මයට බැසගැනීම පිණිස, ගොමුත්‍රයෙහි පරිභාවිත අරළු බෙහෙත සුදුසුයයි හැඟෙන්නෙහිය.

11. අනුරුද්ධය, එසේවීනම් ඔබ ලබන වස්විසීමද මේ චෙතියරට ප්‍රාචීන වංශදායෙහිම වසන්නෙහිය,"-"එසේය ස්වාමීනියි" ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේට මේ අවවාදයෙන් අවවාද කොට (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) එපරිද්දෙන්ම චෙතිය රට ප්‍රාචීන වංශදායෙහි අතුරුදන්වූ සේක් භගුරට සුංසුමාරගිර, භෙසකලාවන මෘගදායෙහි පහළවූ සේක. එහි පණවන ලද අසුනෙහි භාග්‍යවතුන් වහන්සේ වැඩ හුන් සේක. (එහි) වැඩ හුන්නාවූ භාග්‍යවතුන් වහන්සේ වනාහි භික්ෂූන්ට ආමන්ත්‍රණය කළ සේක,

"මහණෙනි, තොපට අෂ්ට මහා පුරුෂ විතර්කයන් දෙශනා කරන්නෙමි. (මෙහි 2 වර්ගයේ 14 සූත්‍රයේ 1 ඡේදයේ 'එය ශ්‍රවණය' කියන තැන පටන් යෙදිය යුතුයි.)

12. මහණෙනි, අෂ්ට මහා පුරුෂ විතර්කයෝ කවරහුද? මහණෙනි, (මෙහි 2 (i) යෙදිය යුතුයි.) මහණෙනි, මේ ධර්මය තෘෂ්ණාමාන දෘෂ්ටි නම්වූ ප්‍රමාදයන්ගෙන් තොරවූ හෙයින් නිෂ්ප්‍රපඤ්ච නම්වූ නිර්වාණ පදයෙහි ඇලුනහුටය, මේ ධර්මය ප්‍රමාදයෙහි ඇලුනහුට නොවේ යනුයි (ii) මහණෙනි, මේ ධර්මය අල්පෙච්ඡයාහටය, මේ ධර්මය මහිච්ඡයාහට නොවේ යයි (iii) මෙසේ ප්‍රකාශ කරණලදී. මෙය කුමක් නිසා ප්‍රකාශ කරණ ලදද?

13. "මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම (තමා) අල්පෙච්ඡයෙක් වූයේම 'මා අල්පෙච්ඡයෙක්යයි' දැනගන්නාහු නම් නොකැමැතිවේ. ලද දෙයින් සතුටුවන සුලුවූයේම 'මා ලද දෙයින් සතුටු වන්නෙකැයි' දැනගන්නාහු නම් නොකැමැති වේ. ප්‍රකර්ෂ විවෙකයෙන් යුක්තවූයේම 'මා ප්‍රකර්ෂ විවේකයෙන් යුක්තවූවෙකැයි' දැනගන්නාහු නම් නොකැමැති වේ, පටන් ගන්නා ලද කායික චෛතසික වීර්‍ය්‍යය ඇත්තේම 'මා පටන් ගන්නා ලද කායික චෛතසික වීර්‍ය්‍යය ඇත්තෙකැයි' දැන ගන්නාහු නම් නොකැමැති වේ, සතිපට්ඨාන වශයෙන් එළඹ සිටි සිහි ඇත්තේම 'මා සතිපට්ඨාන වශයෙන් එළඹසිටි සිහි ඇත්තෙකැයි දැන ගන්නාහු නම් නොකැමැති වේ, එකඟවූ සිත් ඇත්තේම මා එකඟවූ සිත් ඇත්තෙකැයි' දැනගන්නාහු නම් නොකැමැතිවේ, ප්‍රඥාවන්තවූයේම 'මා ප්‍රඥාවන්තයෙකැයි' දැනගන්නාහු නම් නොකැමැති වේ, තෘෂ්ණාමාන දෘෂ්ටි නම්වූ ප්‍රමාදයෙන් තොරව නිර්වාණයෙහි ඇලුනේම 'මා තෘෂ්ණාමාන දෘෂ්ටි නම්වූ ප්‍රමාදයෙන් තොරව නිර්වාණයෙහි ඇලුනෙක්යයි' දැනගන්නාහු නම් නොකැමැති වේ. (මෙහි 12 (ii) යෙදිය යුතුයි.) යම් ඒ ධර්මයක් ප්‍රකාශ කරණ ලදද, ඒ ප්‍රකාශය මේ නිසා ප්‍රකාශ කරණ ලදී.

14. (i) "මහණෙනි, මේ ධර්මය ලද දෙයින් සතුටු වන්නා හටය, මේ ධර්මය ලද දෙයින් සතුටු නොවන්නාට නොවේයයි, (ii) මෙසේ ප්‍රකාශ කරණ ලදී. මෙය කුමක් නිසා ප්‍රකාශ කරණ ලදද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම චීවර, පිණ්ඩපාත සෙනාසන, ගිලානප්‍රත්‍යය යන සිවුපසයෙන් යථා ලාභ, යථාබල,

යථාසාරූප්‍ය වශයෙන් සතුටු වෙයි. (මෙහි 14 (i) යෙදිය යුතුයි.) යමක් ප්‍රකාශ කරණ ලදද, ඒ ප්‍රකාශය මේ නිසා ප්‍රකාශකරණ ලදී.

15 (i) "මහණෙනි, මේ ධර්මය ප්‍රකර්ෂ විවේකයෙන් යුක්තවූවහුටය, මේ ධර්මය පිරිසෙහි හා කලේශ ධර්මයන්හි ඇලී ගැලී වාසයකරන්නාහට නොවේයයි (ii) මෙසේ ප්‍රකාශ කරණ ලදී. මෙය කුමක් නිසා ප්‍රකාශ කරණ ලදද? මහණෙනි, මේ ශාසනයෙහි ප්‍රකර්ෂ විවේකයෙන් යුක්තව වාසය කරන්නාවූ භික්ෂුව වෙත භික්ෂු, භික්ෂූනී, උපාසක, උපාසිකා, රාජ, රාජ මහාමාත්‍ය, තීර්ථක, තීර්ථක ශ්‍රාවකයෝ එළඹෙන්නාහු වෙත්. එහි වාසය කරන්නාවූ භික්ෂුතෙම විවේකයට නැමුනාවූ විවේකයට යොමුවූ, විවේකයට නැඹුරුවූ කෙලෙසුන් කෙරෙන් දුරුවූ නෛෂ්ක්‍රම්‍යයෙහි ඇලුනාවූ සිතින් ඒකාන්තයෙන් (ඒ පිරිස) පිටවී යාමට යොග්‍යවූ කථාවක්ම කරන්නේවේ. (මෙහි 15 (i) යෙදිය යුතුයි) යමක් ප්‍රකාශ කරණ ලදද, ඒ ප්‍රකාශය මේ නිසා ප්‍රකාශ කරණ ලදී.

16 (i) "මහණෙනි, මේ ධර්මය පටන් ගන්නා ලද වීර්‍ය්‍යය ඇත්තාහටය, මේ ධර්මය කුසීතයාහට නොවේයයි (ii) මෙසේ ප්‍රකාශ කරණ ලදී. මෙය කුමක් නිසා ප්‍රකාශ කරණ ලදද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම උත්සාහවත්වූයේ දෘඪපරාක්‍රම ඇත්තේ නොපසු බස්නා වීර්‍ය්‍යය ඇත්තේ පටන් ගන්නාලද වීර්‍ය්‍යය ඇත්තේ වාසය කරයි. (මෙහි 16 (i) යෙදිය යුතුයි.) යමක් ප්‍රකාශ කරන ලදද ඒ ප්‍රකාශය මේ නිසා ප්‍රකාශ කරණ ලදී.

17. (i) "මහණෙනි, මේ ධර්මය එළඹසිටි සිහි ඇත්තාහටය, මේ ධර්මය සිහි මුළාවූවහුට නොවේ යයි, (ii) මෙසේ ප්‍රකාශ කරන ලදී. මෙය කුමක් නිසා ප්‍රකාශ කරණ ලදද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ශ්‍රෙෂ්ඨවූ සිහිනුවණින් යුක්තවූයේ පුරාණ කාලයේ කරණ ලද්දාවූද, කියන ලද්දාවූද දෙය සිහි කරන්නේ අනුස්මරණය කරන්නේ එළඹ සිටි සිහි ඇත්තේ වෙයි. (මෙහි 17 (i) යෙදිය යුතුයි.) යමක් ප්‍රකාශ කරණ ලදද, ඒ ප්‍රකාශය මේ නිසා ප්‍රකාශ කරණ ලදී.

18. (i) "මහණෙනි, මේ ධර්මය එකගවූ සිත් ඇත්තාහටය, වික්ෂිප්ත සිත් ඇත්තාහට නොවේයයි (ii) මෙසේ ප්‍රකාශ කරණ ලදී. මෙය කුමක් නිසා ප්‍රකාශ කරණ ලදද? "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම වස්තු කාම ක්ලේශකාමයන්ගෙන් තොරවූයේම ව්‍යාපාදාදී අකුශල ධර්මයන්ගෙන් තොරවූයේම (මෙහි මහාවර්ගයේ 11 සූත්‍රයේ 17, 18 ඡේද යෙදියයුතුයි.) සිවුවැනි ධ්‍යානයට පැමිණ වාසය කරයි. (මෙහි 18 (i) යෙදිය යුතුයි.) යමක් ප්‍රකාශ කරණ ලදද, ඒ ප්‍රකාශය මේ නිසා ප්‍රකාශ කරණ ලදී.

19. (i) "මහණෙනි, මේ ධර්මය ප්‍රඥාවන්තයාහටය, මේ ධර්මය අඥානයාහට නොවේයයි (ii) මෙසේ ප්‍රකාශකරණ ලදී, මෙය කුමක් නිසා ප්‍රකාශ කරණ ලදද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම උදය ව්‍යය පිළිබඳව සිත් යොමුකරවන්නාවූ ප්‍රඥාවෙන් යුක්තවූයේ ආර්‍ය්‍යවූ නිර්වෙධිකවූ (නොසැලෙන) ප්‍රඥාවෙන් යුක්ත වූයේ මනාකොට දුක් කෙළවර කිරීම සඳහා සිත් යොමුකරවන්නාවූ ප්‍රඥාවෙන් යුක්තවූයේ ප්‍රඥාවන්තවෙයි. (මෙහි 19 (i) යෙදිය යුතුයි.) නොවේයයි, මෙසේ යම් ඒ ප්‍රකාශයක් කරණ ලදද, ඒ ප්‍රකාශය මේ හේතුවෙන් ප්‍රකාශ කරණලදී

20. (i) "මහණෙනි, මේ ධර්මය තෘෂ්ණා මාන දෘෂ්ටි නම්වූ ප්‍රමාදයෙන් තොරවූ හෙයින් නිෂ්ප්‍රපඤ්ච නම්වූ නිර්වාණ පදයෙහි ඇලුනහුටය. මේ ධර්මය ප්‍රමදයෙහි ඇලුනහුට නොවේයයි මෙසේ ප්‍රකාශ කරණලදී. මෙය කුමක් නිසා ප්‍රකාශකරණ ලදද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුහුගේ සිත ප්‍රමාදය නිරුද්ධ කිරීමෙහි අරමුණු කිරීම් වශයෙන් (ඉදිරියට) පනී, පහදී, යහපත්ව පිහිටයි. විශෙෂයෙන් මුක්ත වෙයි. (මෙහි 20 (i) යෙදිය යුතුයි.) මෙසේ යම් ඒ ප්‍රකාශයක් කරණලදද, ඒ ප්‍රකාශය මේ හෙතුවෙන් කරණලදී"

21. ඉක්බිති ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ ලබන වස්විසීමද ඒ චෙතියරට ප්‍රාචීන වංශදායෙහිම විසූසේක. එකල්හි ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ (මෙහි අංගුත්තර

නිකායේ තිකනිපාතයේ 3 පණ්ණාසකයේ 28 සූත්‍රයේ 5 ඡේදයේ 'තනිව' යන වචනයේ සිටද 6 ඡේදයද යෙදිය යුතුයි.)

ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන්වහන්සේ වනාහි එක්තරා රහතන් වහන්සේ නමක් වූසේක. ඉක්බිති රහත්බවට පැමිණි ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ ඒ වේලාවෙහි මේ ගාථාවන් ප්‍රකාශ කෙළේය.

22. "ලොකයෙහි නිරුත්ත වූ ශාස්තෘන් වහන්සේ මාගේ සම්‍යක් කල්පනාව දැන ඍද්ධියෙන් මනොමය වූ ශරීරයෙන් (මාවෙත) එළඹිසේක, මාගේ සම්‍යක් කල්පනා යම්සේ වූයේද, එයටත් වඩා (උන්වහන්සේ) දෙශනාකළ සේක. නිෂ්ප්‍රපඤ්ච සංඛ්‍යාත නිර්වාණයෙහි ඇලුනාවූ බුදු රජාණන්වහන්සේ, නිෂ්ප්‍රපඤ්චය දෙශනාකළසේක. මම උන්වහන්සේගේ ධර්මය දැන ශාසනයෙහි සිත් ඇලවූයේ වාසයකෙළෙමි. ත්‍රිවිද්‍යාවට පැමිණියෙමි. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව කෙළෙමි."

---

## 4 දාන වර්ගය.

31. දාන සූත්‍රයः- 1. "මහණෙනි, මේ දානයෝ අටක් වෙත්.

2. "කවර අටක්ද යත්? ඉදිරියට පැමිණියෙකු දැක එකෙනෙහි හිඳුවා සත්කාරකොට දානය දෙයි, ලෝවැස්සාගේ ගැරහීමට හෝ අපාය දුකට භයින් දානය දෙයි, 'පළමු' මට මෙනම් දෙයක් දුන්නේයයි' සලකා දානය දෙයි, 'මතු මට මෙනම් දෙයක් දෙන්නේයයි' සලකා දානය දෙයි, දානය නම් 'බුද්ධාදී උතුමන් විසින් පසස්නා ලද්දේයයි' දානය දෙයි, 'මම ආහාර පිසමි, මොවුහු නොපිසන්නාහ, නො පිසන්නවුන්ට නොදීම නුසුදුසුයයි' දානය දෙයි, 'මේ දානය දෙන්නාවූ මට යහපත්වූ කීර්ති ඝොෂාව පැන නගීයයි' දානය දෙයි. සමථ විදර්ශනාදී සිත මෘදුකිරීම පිණිස අලංකාර කිරීම පිණිස දානය දෙයි. (මෙහි 1 යෙදිය යුතුයි.)

32 සප්පුරිසානුයාතධම්ම සූත්‍රයः- "මහණෙනි, ශ්‍රද්ධාවෙන් දෙන දානයද, (අපකීර්තියට) ලජ්ජාවෙන් දෙන දානයද, කුශල

චෙතනාවෙන් දෙන දානයද යන මේ දාන ධර්මයෝ සත්පුරුෂයන් විසින් අනුගමනය කළාහුය. මේ දන්දීම දෙව්ලොවට පමුණුවන්නාවූ (කුශල ධර්මයක්යයි) කියත්, ඒ දානමය කුශල ක්‍රියාවෙන් දෙව්ලොවට යේ.”

33. **අට්ඨදානවත්ථු සූත්‍රය**:- 1. “මහණෙනි, මේ දානවස්තූහු අටෙක් වෙත්. කවර අටෙක්ද යත්? ඡන්දයෙන් (ප්‍රේමයෙන්) දන්දෙයි. ද්වෙෂයෙන් දන්දෙයි, මොහයෙන් දන්දෙයි, ගර්භාවට බියෙන් දන්දෙයි, පියමුතු පරම්පරාවෙහි දී පුරුදුය, කළ පුරුදුය, පුරාණ කුලසිරිත පිරිහෙලන්නට නුසුදුසුයයි දන්දෙයි, ‘මම මේ දානයදී ශරීරය බිඳීයාමෙන් මරණින් මතු යහපත්ගති ඇති ස්වර්ගලොකයෙහි උපදින්නෙමියි’ දන් දෙයි, මේ දානය දෙන්නාවූ මාගේ සිත පහදී, සිත පැහැදීමෙන් සොම්නස උපදී යයි දන්දෙයි, සමථවිදර්ශනාදී සිත මෘදුකිරීම පිණිස, අලංකාර කිරීම පිණිස, දන් දෙයි, (මෙහි 1 යෙදිය ඡෙදය යුතුයි.)

34. **ඛෙත්තූපම සූත්‍රය**:- 1. “මහණෙනි, අංග අටකින් යුක්තවූ කෙතෙහි වපුරණලද බීජය ධාන්‍යඵල වශයෙන් මහත්ඵල නොවේ. මහත්වූ ආශ්වාදය නොවේ, අභිවෘද්ධියක්ද නොවේ, කෙසේ අංග අටකින් යුක්තවූයේද යත්?

2. “මහණෙනි, මෙහි කෙතෙහි වලගොඩැලි ඇත්තේ වෙයි. ගල් බොරළු ඇත්තේද වෙයි, ජල බහුලවූයේද වෙයි, නගුලෙන් හාන්නට නොහැකිවූ තද භූමිය ඇත්තේද වෙයි. ජලය පමුණුවා ගැනීම දුෂ්කරවූයේද වෙයි. ජලය බැසයාම දුෂ්කරවූයේද වෙයි, (සෑහෙන ප්‍රමාණ) ලොකු කුඩා වේලි (දිය කානු) නැත්තේද වෙයි. (යොග්‍යවූ) නියරවල් නැත්තේදවේ. මහණෙනි, මෙසේ අෂ්ටාංගයෙන් යුක්තවූ කෙතෙහි වපුරණ ලද බීජය ධාන්‍ය ඵල වශයෙන් මහත්ඵල නොවේ. මහත්වූ ආශ්වාදය නොවේ, වී වැඩීමෙන් අභිවෘද්ධියක්ද නොවේ.

3. “මහණෙනි, එපරිද්දෙන්ම වනාහි අෂ්ටාංග සමන්විතවූ මහණ බමුණන් විෂයෙහි දෙන ලද දානය මහත්ඵල නොවේ, මහානිශංස නොවේ, මහත්වූ ප්‍රභාවයක් නොවේ. මහත්වූ පතළවීමක් නොවේ.

4. "කෙසේ අෂ්ටාංග සමන්විතවූ මහණ බමුණන් විෂයෙහිදයත්? මහණෙනි, මේ ලෝකයෙහි ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මිසදිටුවෝ වෙත්, මිථ්‍යා අදහස් ඇත්තෝ වෙත්, මුසාවාදාදී චතුර්විධ වාග්දුශ්චරිතයෙන් යුක්තවූවෝ වෙත්. ප්‍රාණඝාතාදී ත්‍රිවිධ කාය දුශ්චරිතයෙන් යුක්තවූවෝ වෙත්. පවිටුවූ ජීවිකා වෘත්ති ඇත්තාහු වෙත්, පවිටුවූ ව්‍යායාම් ඇත්තාහු වෙත්. පවිටුවූ සිත් ඇත්තාහු වෙත්, පාප අරමුණුවලින් එකඟවූ සිත් ඇත්තාහු වෙත්. (මෙහි 3 ඡේදය යෙදිය යුතුයි.)

5. "මහණෙනි, (අන්‍යවූ) අෂ්ටාංගයකින් යුක්තවූ කෙතෙහි වපුරණ ලද බීජය මහත්ඵල වේ, මහත්වූ ආශ්වාදය වේ, වී වැඩීමෙන් අභිවෘද්ධිය වේ, කෙසේවූ අෂ්ටාංගයෙන් යුක්තවූ කෙතෙහිදයත්?

6. "මහණෙනි, මෙහි කෙත වළගොඩැලි රහිත වෙයි, ගල් බොරළු රහිත වෙයි, ජල බහුල නොවෙයි, ගැඹුරුව හාන්නට හැකිවූ මෘදුවූ බිම වෙයි. ජලය පමුණුවා ගැනීම සුකරවූයේ වෙයි. ජලය බැසයාම සුකරවූයේ වෙයි. සෑහෙන ප්‍රමාණ ලොකු කුඩා දිය වේලි ඇත්තේ වෙයි. (යොග්‍යවූ) නියරවල් ඇත්තේ වේ. මහණෙනි, මෙසේ අෂ්ටාංගයෙන් යුක්තවූ කෙතෙහි වපුරණලද බීජය ධාන්‍ය ඵලවශයෙන් මහත් ඵල වේ, මහත්වූ ආශ්වාදයවේ, වී වැඩීමෙන් අභිවෘද්ධිය වේ.

7. "මහණෙනි, එපරිද්දෙන්ම වනාහි (ii) අෂ්ටාංගයෙන් යුක්තවූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් විෂයෙහි දෙනලද දානයද මහත් ඵල වේ, මහානිශංස වේ, මහත්වූ ප්‍රභාවයවේ, මහත්වූ පතළ වීම වේ, (iii) කෙසේ අෂ්ටාංග සමන්විතවූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් විෂයෙහිද යත්?

8. "මහණෙනි, මේ ශාසනයෙහි ශ්‍රමණ බ්‍රාහ්මණයෝ සම්‍යක් දෘෂ්ටික වෙත්, සම්‍යක් සංකල්පනා ඇත්තාහුවෙත්, මුසාවාදාදියෙන් තොරව සම්‍යක් වචන ඇත්තාහු වෙත්, ප්‍රාණඝාතාදියෙන් තොරව යහපත් කර්මාන්ත ඇත්තාහු වෙත්. එක්විසි අනෙසන ධර්මයන් ගෙන් තොරව යහපත් ජීවිකා ඇත්තාහු වෙත්. සතර සම්‍යක් ප්‍රධාන වීය්‍ර්‍යයෙන් යුක්තවූවාහු

වෙත්. සතර සතිපට්ඨාන ධර්මයෙන් යුක්තවූ සම්‍යක් සිහියෙන් යුක්තවූවාහු වෙත්, ප්‍රථමද්ධ්‍යානාදී සම්‍යක් සමාධියෙන් යුක්තවූවාහු වෙත්.

9. "මහණෙනි, මෙසේ (මෙහි 7 (ii) යෙදිය යුතුයි.)

10 (1) "යම්සේ වනාහි සාරවත්වූ කෙතෙහි වපුරණලද බීජ සම්පත්තිය වර්ෂාව ඇතිවූ කල්හි ධාන්‍ය ඵල සම්පත්තියට හේතුවේ, පණු, මැසි ආදී උවදුරෙන් තොරවීම ඇතිවූ කල්හි අස්වැන්න වැඩිවීම නම්වූ වෘද්ධි සම්පදාව ඇතිවේ. (ඉක්බිති) තුන්වැනිවූ විපුලබව නමැති සම්පදාව ඇතිවේ, ඉන්පසු සම්පූර්ණ ඵලයවූ චිත්ත සම්පදාව ඇතිවේ.

(2) "එපරිද්දෙන්ම වනාහි සමෘද්ධවූ සිල්වතුන් විෂයෙහි දෙනලද භොජන සම්පත්තිතෙම ත්‍රිවිධ කුශල සම්පත්තියට පමුණුවයි, ඒ කරණලද කුශල ධර්මය සම්පූර්ණ හෙයිනි, එහෙයින් මේ ලොකයෙහි ත්‍රිවිධ සම්පත්තිය කැමතිවන්නාවූ පුද්ගලතෙම ක්ෂෙත්‍ර සම්පත්ති ආදියෙන් සමෘද්ධ වෙත්වා.

(3) "පරිපූර්ණ ප්‍රඥා ඇත්තාවූ බුද්ධාදී උතුමන් සෙවනය කෙරෙත්වා, එසේ වූ කල්හි ත්‍රිවිධ සම්පත්තීහු සමෘද්ධවෙත්, ත්‍රිවිද්‍යා පසළොස්චරණ ධර්මයන්ගෙන් යුක්තවූයේ චිත්ත සම්පත්තිය ලැබ සම්පූර්ණ කර්මය කරයි. (එකල) සම්පූර්ණ අර්ථ සම්පත්තියද ලබයි.

(4) 'ලොකය තත්ත්වාකාරයෙන් දැන දෘෂ්ටි විශුද්ධි ඥාන සම්පත්තියට පැමිණෙන්නේය, ශ්‍රොතාපත්ති මාර්ගයට පැමිණ සම්පූර්ණ සිත් ඇත්තේ අර්හත්වයට පැමිණේ. සියලු කෙලෙස්මල කම්පාකොට හැර නිර්වාණ සම්පත්තියට පැමිණ, සියලු දුකින් මිදේ, සියලු දුකින් මිදුනාවූ ඒ නිර්වාණ සම්පත්තිතොම, සර්වසම්පදා නම්වේ."

35. **දානුප්පත්ති සූත්‍රය**:- 1. "මහණෙනි, මේ කරුණු අට දානය ඇතිවීමට හේතුවෙත්.

2. "කවර අටෙක්දයත්? මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක්තෙම ශ්‍රමණයෙකුට හෝ බහා තබනලද (නෙරපන ලද) පවු ඇති හෙයින් බ්‍රාහ්මණ නම්වූ ක්ෂීණාශ්‍රවයෙකුට හෝ,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ආහාර, පාන, වස්ත්‍ර, යානා, මල් ගඳ විලවුන්, සයනාසන, ආවාස, පහන් තෙල් ආදීවූ) දානය දෙයි. හෙතෙම යමක් දේ නම් එය ප්‍රාර්ථනා කරයි. හෙතෙම පඤ්චකාම ගුණයන්ගෙන් සතුටුවන්නාවූ, ඒ ඔවුන්ගේ අංගයක් වශයෙන් සලකන්නාවූ, එය පාවිච්චි කරන්නාවූ, ක්ෂත්‍රිය මහාසාර කුලවතුන් හෝ, බ්‍රාහ්මණ මහාසාරකුලවතුන් හෝ, ගෘහපති මහාසාර කුලවතුන් හෝ, දකියි (එකල්හි) ඔහුට මෙබඳු අදහසක් වෙයි. 'අනේ' මම ඒකාන්තයෙන්ම ශරීරය බිඳී යාමෙන් මරණින් මතු ක්ෂත්‍රිය මහාසාර කුලවතුන්ගේ හෝ, බ්‍රාහ්මණ මහාසාරකුලවතුන්ගේ හෝ ගෘහපති මහාසාර කුලවතුන්ගේ හෝ සම්බන්ධ ඇතිව (ඒ කුලයෙක්හි) උපදින්නෙම් නම්' (ඉතා යෙහෙකි.) හෙතෙම එය සිත තබයි. ඒ සිත ස්ථිරකරයි, ඒ සිත වඩයි. ඔහු ගේ ඒ මතු මාර්ග ඵල පිණිස නො වඩන ලද්දාවූ හීනවූ පඤ්චකාම ගුණයෙහි ඇලුනාවූ සිත එහි ඉපැත්ම පිණිස පවතී (හේතුවෙයි) (ii) හෙද වනාහි සිල්වත්හට යයි කියමි, දුශ්ශීලයාහට නොවේ.

3. "මහණෙනි, සිල්වත්හුගේ ප්‍රාර්ථනා තොම ඉටුවෙයි. පිරිසිදු හෙයිනි, මහණෙනි, මේ ලොකයෙහි ඇතැමෙක් ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ, ආහාර, පාන, වස්ත්‍ර, යානා, මල්ගඳවිලවුන්, සයනාසන, ආවාස, පහන්තෙල් දන් දෙයිද හෙතෙම යමක් දේ නම් එය ප්‍රාර්ථනා කරයි. (ii) ඔහු විසින් චාතුර්මහාරාජික දෙවියෝ (iii) දීර්ඝායුෂ්කයෝය, ශරීරවර්ණ ඇත්තාහුය, සැප බොහෝ කොට ඇත්තාහුයයි අසනලද්දාහුය (එකල්හි) ඔහුට මෙසේවූ සිතක් වෙයි. 'අනේ' මම ශරීරය බිඳීයාමෙන් මරණින්මතු (iv) චාතුර්මහාරාජික දෙවියන්ගේ (v) සහභාවයට උපදින්නෙම්නම්' (යෙහෙකි) යි. හෙතෙම ඒ සිත පිහිටුවයි. ඒ සිත ස්ථිර කරයි, ඒ සිත වඩයි. ඔහුගේ ඒ මතු මාර්ග ඵල පිණිස නොවඩන ලද්දාවූ හීනවූ පඤ්චකාම ගුණයෙහි ඇලුනාවූ සිත එහි ඉපැත්ම පිණිස හේතු වෙයි. ශරීරය බිඳීයාමෙන් මරණින් මතු (vi) චාතුර්මහාරාජික දෙවියන්ට සහභාගීව උපදී. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

4. (මෙහි 3 (i) යෙදිය යුතුයි.) ඔහු විසින් තවුතිසාදෙව්ලෝ වැසි දෙවියෝ (මෙහි 3 (iii) යෙදිය යුතුයි.) තවුතිසා දෙව්ලෝ

වැසි දෙවියන්ගේ (මෙහි 3 (v) යෙදිය යුතුයි.) තවුතිසාදෙව්ලෝ වැසි දෙවියන්ට සහභාගීව උපදී. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

**5.** (මෙහි 3 (i) යෙදිය යුතුයි.) ඔහු විසින් යාම දෙව්ලෝ වැසි දෙවියෝ (මෙහි 3 (iii) යෙදිය යුතුයි.) යාම දෙව්ලෝ වැසි දෙවියන්ගේ (මෙහි 3 (v) යෙදිය යුතුයි.) යාම දෙව්ලෝ වැසි දෙවියන්ට සහභාගීව උපදී. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

**6.** (මෙහි 3 (i) යෙදිය යුතුයි.) ඔහු විසින් තුසිත දෙව්ලෝ වැසි දෙවියෝ (මෙහි 3 (iii) යෙදිය යුතුයි.) තුසිත දෙව්ලෝ වැසි දෙවියන්ගේ (මෙහි 3 (v) යෙදිය යුතුයි.) තුසිත දෙව්ලෝ වැසි දෙවියන්ට සහභාගීව උපදී. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

**7.** (මෙහි 3 (i) යෙදිය යුතුයි.) ඔහු විසින් නිර්මාණ රති දෙව්ලොවවැසි දෙවියෝ (මෙහි 3 (iii) යෙදිය යුතුයි.) නිර්මාණ රති දෙව්ලොවැසි දෙවියන්ගේ (මෙහි 3 (v) යෙදිය යුතුයි.) නිර්මාණ රති දෙව්ලොව වැසි දෙවියන්ට සහභාගීව උපදී. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

**8.** (මෙහි 3 (i) යෙදිය යුතුයි.) ඔහු විසින් පර නිර්මිත වසවර්ති දෙව්ලෝ වැසි දෙවියෝ (මෙහි 3 (iii) යෙදිය යුතුයි.) පරිනිර්මිත වසවර්ති දෙව්ලෝ වැසි දෙවියන්ගේ (මෙහි 3 (v) යෙදිය යුතුයි.) නිර්මාණ රතී දෙව්ලොවැසි දෙවියන්ට සහභාගීව (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

**9.** (මෙහි 3 (i) යෙදිය යුතුයි.) ඔහු විසින් බ්‍රහ්ම කායික දෙවියෝ (මෙහි 3 (iii) යෙදිය යුතුයි.) බ්‍රහ්මකායික දෙවියන්ගේ (මෙහි 3 (v) යෙදිය යුතුයි.) බ්‍රහ්මකායික දෙවියන්ට සහභාගීව උපදී.

**10.** (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) විතරාගීහටයයි කියමි. රාගය සහිතවූවහුට නොවේ, මහණෙනි, සිල්වතාගේ ප්‍රාර්ථනාව ඉටුවෙයි. පහවූ රාග ඇතිහෙයිනි, මහණෙනි, මේ අෂ්ටදානුප්පත්තීහු වෙත්.”

**36. පුඤ්ඤකිරියවත්ථු සූත්‍රයඃ-** “මහණෙනි, මේ පුණ්‍ය ක්‍රියා වස්තූහු තිදෙනෙක් වෙත්, කවර තිදෙනෙක්ද යත්? දානමය

පුණ්‍යක්‍රියා වස්තුවය ශීලමය පුණ්‍ය ක්‍රියා වස්තුවය, භාවනාමය පුණ්‍යක්‍රියා වස්තුවය යන මොහුයි.

2. "මහණෙනි, මේ ලෝකයෙහි ඇතැමෙකු විසින් දානමය (ii) පුණ්‍යක්‍රියා වස්තුව ස්වල්පයක් කරණලද්දේ වෙයි. (iii) ශීලමය පුණ්‍යක්‍රියා වස්තුව ස්වල්පයක් කරණ ලද්දේ වෙයි. භාවනාමය පුණ්‍ය ක්‍රියා වස්තුව නූපදී. හෙතෙම ශරීරය බිඳී යෑමෙන් මරණින් මතු මනුෂ්‍යයන් අතර දුර්භාග්‍යයෙක් වෙයි. වස්තුව නැත්තාවූ පස් වැදෑරුම් නීච කුලවල උපදී.

3. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැමෙකු විසින් දානමය පුණ්‍යක්‍රියා වස්තුව (මද්ධ්‍යම) ප්‍රමාණයක් කරණලද්දේ වෙයි. ශීලමය පුණ්‍යක්‍රියා වස්තුව (මද්ධ්‍යම) ප්‍රමාණයක් කරණ ලද්දේ වෙයි. භාවනාමය පුණ්‍යක්‍රියා වස්තුව නූපදී. හෙතෙම ශරීරය බිඳීයෑමෙන් මරණින් මතු මනුෂ්‍යයන් අතර සෞභාග්‍යයෙක් වෙයි. ධනවත්වූ ක්ෂත්‍රියාදී ත්‍රිවිධ කුලයන්හි උපදී.

4. "මහණෙනි, මෙලොව ඇතැමෙකු විසින් දානමය පුණ්‍ය ක්‍රියා වස්තුව අධික ප්‍රමාණයක් කරණ ලද්දේ වෙයි. ශීලමය පුණ්‍ය ක්‍රියා වස්තුව අධික ප්‍රමාණයක් කරණ ලද්දේ වෙයි. භාවනාමය පුණ්‍ය කියා වස්තුව නූපදී. හෙතෙම ශරීරයාගේ බිඳී යාමෙන් මරණින් මතු (ii) චාතුර්මහාරාජික දෙවියන්ට සහ භාගීව උපදී.

5. "මහණෙනි, එහි සිවු වරම් මහරජ දරුවෝ (ii) දානමය පුණ්‍ය ක්‍රියා වස්තුව අධික වශයෙන් කොට, ශීලමය පුණ්‍ය ක්‍රියා වස්තුව අධික වශයෙන් කොට දිව්‍යමයවූ ආයුෂයෙන්ද, දිව්‍යමයවූ ශරීර වර්ණයෙන්ද, දිව්‍යමයවූ සැපයෙන්ද දිව්‍යමයවූ යසසින්ද, දිව්‍යමයවූ අධිපති භාවයෙන්ද, දිව්‍යමයවූ රූපයෙන්ද, දිව්‍යමයවූ ශබ්දයෙන්ද, දිව්‍යමයවූ සුවඳින්ද දිව්‍යමයවූ රසයෙන්ද දිව්‍යමයවූ ස්පර්ශයෙන්ද යන කරුණු දශයෙන් (iii) සෙසු සිවු මහරජ දෙව්පිරිස අභිභවනය කරත්.

6 (මෙහි 4 (i) යෙදිය යුතුයි.) තවුතිසා දෙව්ලෝ වැස්සන්ට සහභාගීව උපදී, මහණෙනි, එහි සක්දෙව් රජ තෙම (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) තවුතිසා දෙව්ලෝ වැස්සන් අභිභවනය කරත්.

7 (මෙහි 4 (i) යෙදිය යුතුයි.) යාම දෙව්ලෝ වැස්සන්ට සහභාගීව උපදී. මහණෙනි, එහි සුයාම දෙව්පුත් තෙම (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) යාම දෙව්ලෝ වැස්සන් අභිභවනය කරත්. 8. (මෙහි 4 (i) යෙදිය යුතුයි.) තුසිත දෙව්ලෝ වැසි දෙවියන්ට සහභාගීව උපදී. මහණෙනි, එහි සන්තුසිත දෙව්පුත් තෙම (මෙහි 5 (ii) යෙදිය යුතුයි) තුසිත දෙව්ලෝ වැසියන් අභිභවනය කරත්. 9. (මෙහි 4 (i) යෙදිය යුතුයි.) නිර්මාණ රතී දෙව්ලෝ වැස්සන්ට සහභාගීව උපදී. මහණෙනි, එහි සුනිර්මිත දෙව්පුත් තෙම (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) නිර්මාණ රතී දෙව්ලෝවැසියන් අභිභවනය කරත්. (මෙහි 4 (i) යෙදිය යුතුයි,) පරනිර්මිත වසවර්ති දෙවියන්ට සහභාගීව උපදී මහණෙනි, එහි වසවර්ති දෙව් පුත්තෙම (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) පරනිර්මිත වසවර්ති දෙව්ලෝ වැසියන් අභිභවනය කරත්. මහණෙනි, මේ වනාහි ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා වස්තූහුයි,"

37. **සප්පුරිසදාන සූත්‍රය:-** 1 "මහණෙනි, මේ අට සත් පුරුෂ දානයෝ වෙත්, කවර අටෙක්ද යත්? පිරිසිදුව දෙයි, ප්‍රණීතව දෙයි, සුදුසු කාලයෙහි දෙයි, කැපදේ දෙයි, ප්‍රතිග්‍රාහකයන් හෝ දාන වස්තුව පරීක්ෂා කොට දෙයි, නිතර දෙයි. දෙන කල්හි සිත පහදවා දෙයි, දානය දුන් පසු සිත සතුටු කරගනී, මහණෙනි, මේ අට සත්පුරුෂ දානයෝයි.

2 (1) "බ්‍රහ්මචාරීවූ යහපත් පුණ්‍යක්ෂෙත්‍රයෙහි, පිරිසිදුව, ප්‍රණීතව, සුදුසු කාලයෙහි, කැපවූ ආහාරපාන නිතර දන්දෙයි, බොහෝ ආමිස පරිත්‍යාග කොටද, විපිළිසර නොවන්නේය. මෙසේ දෙන ලද දානයන් බුද්ධාදී උතුමෝ වර්ණනා කරණ සේක.

(2) "මෙසේ ප්‍රඥාවන්තවූ ශ්‍රද්ධාවන්තවූ පණ්ඩිත තෙම (ලොභ ද්වෙෂාදියෙන්) මිදුන සිතින් පරිත්‍යාග කොට ව්‍යාපාද රහිතවූ සැප ඇති ලොකයෙහි උපදී,"

38. **මහා මෙඝොපම සූත්‍රය:-** "මහණෙනි, (ii) කුලයෙක්හි සත්පුරුෂයෙක් උපදින්නේ නම්, බොහෝ ජනයාට වැඩ පිණිස, හිත පිණිස, සැප පිණිස, වෙයි. මවුපියන්ට වැඩ පිණිස හිත

පිණිස, සැප පිණිස වෙයි අඹුදරුවන්ට වැඩ පිණිස, හිත පිණිස, සැප පිණිස වෙයි. දාස කම්කරු පුරුෂයන්ට වැඩ පිණිස, හිත පිණිස, සැප පිණිස, වෙයි. මිත්‍රාමාත්‍යයන්ට වැඩ පිණිස හිත පිණිස සැප පිණිස වෙයි. පෙර මළ ගිය නෑයන්ට වැඩ පිණිස හිත පිණිස, සැප පිණිස වෙයි රජහට වැඩ පිණිස, හිත පිණිස, සැප පිණිස වෙයි. දෙවියන්ට වැඩ පිණිස, හිත පිණිස සැප පිණිස වෙයි. ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට වැඩ පිණිස හිත පිණිස, සැප පිණිස වෙයි.

2. "මහණෙනි, යම්සේ වනාහි මහා මෙඝය තෙම සියළු ශෂ්‍යයන් සමෘද්ධකරමින් බොහෝ දෙනාට වැඩ පිණිස, හිත පිණිස, සැප පිණිස වේද, එපරිද්දෙන්ම වනාහි (මෙහි 1 (ii) යෙදිය යුතුයි.)

3. 1 "ගිහිගෙයි වසන්නාවූ පණ්ඩිත පුරුෂ තෙම ඒකාන්තයෙන් බොහෝ දෙනාගේ හිත සැප පිණිස (පිළිපන්නේවේද) පළමුකොට දිවා රෑ දෙක්හි නොමැලිව මව්පියන්ට තමහට පළමුකළ උපකාර සිහි කරමින් (ආහාර පාන වස්ත්‍රාභරණාදී) ප්‍රත්‍යයයෙන් පූජා කෙරේද, අනගාරිය සංඛ්‍යාත මේ ශාසනයෙහි පැවිදිවූ බ්‍රහ්මචාරීවූ පියශීලී භික්ෂූන්ට ධර්මය දැන ශ්‍රද්ධාවෙන් යුක්තවූයේ පූජා කෙරේද, රජහට හිතවත් වූයේ දෙවියන්ට හිතවත් වූයේ නෑයන්ටද මිතුරන්ටද හිතවත් වූයේ වේද, හෙතෙම සද්ධර්මයෙහි යහපත්ව පිහිටියේ සියල්ලන්ට හිතවත්වූයේ වේද, හෙතෙම මසුරු මළ දුරුකොට ශාන්තවූ (දෙව්) ලොව භජනය කරන්නේය. (දෙව්ලොව උපදී,)"

39. අට්ඨපුඤ්ඤාභිසන්ද සූත්‍රයඃ- "මහණෙනි, මේ පින් වැඩෙන්නාවූ කුසල් වැඩෙන්නාවූ සැප ගෙන දෙන්නාවූ සුවගෙන දෙන්නාවූ සැප විපාක ඇත්තාවූ දෙව්ලොව ඉපදීමට හේතුවූ (ii) අකුශල ධර්ම අට ඉෂ්ටවූ කමණීයවූ මනවඩන්නාවූ හිත සැප පිණිස පවතින්නාවූ (ධර්මයෝ) වෙත්.

2. "කවර ධර්ම අටෙක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම බුදුන් සරණ ගියේ වෙයි. (මෙහි 1 (i)

යෙදිය යුතුයි.) පළමුවන ධර්මය තෙම ඉෂ්ටවූ කමණීයවූ මනවඩන්නාවූ හිත සැප පිණිස පවත්නේ වෙයි,

3. "තවද මහණෙනි, ආය්‍යී ශ්‍රාවක තෙම ධර්මය සරණ ගියේ වෙයි. (මෙහි 1 (i) යෙදිය යුතුයි.) දෙවැනි ධර්මය වෙයි,

4. "තවද මහණෙනි, ආය්‍යී ශ්‍රාවකතෙම සංඝයා සරණ ගියේවෙයි. (මෙහි 1 (i) යෙදිය යුතුයි.) තුන්වෙනි ධර්මය වෙයි,

5. මහණෙනි, මේ පස චෙතනා දානයෝ වෙත්, මහා දානයෝ වෙත්, (ඒ දානයෝ) (ii) අග්‍රයයි දන්නා ලද්දාහු වෙත්, චිරකාලිකයයි දන්නා ලද්දාහුවෙත්, පරම්පරාගතයයි දන්නා ලද්දාහු වෙත්' පෞරාණිකයයි දන්නා ලද්දාහු වෙත්, අසංකිණි වෙත්, අසංකීණී පූර්ව වෙත්, ශ්‍රමණයන් විසින්ද බ්‍රාහ්මණයන් (රහතුන්) විසින්ද, පණ්ඩිතයන් විසින්ද සැක නොකරණු ලබත්, සැක නොකරණු ලබන්නාහු වෙත්. පිළිකුල් නොකරණු ලබන්නාහු වෙත්.

6. "කවර දාන පසෙක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි ආය්‍යීශ්‍රාවකතෙම ප්‍රාණඝාතය හැර ප්‍රාණඝාතයෙන් වෙන්වූයේ වෙයි. මහණෙනි, ප්‍රාණඝාතයෙන් වෙන්වූ (iii) ආය්‍යීශ්‍රාවකතෙම අප්‍රමාණවූ සත්ත්වයන්ට අභය දෙයි, අවෛරය දෙයි, අව්‍යාපාදය දෙයි, අප්‍රමාණවූ සත්ත්වයන්ට අභයදී අවෛරයදී අව්‍යාපාදයදී අප්‍රමාණවූ අභයට අවෛරයට අව්‍යාපාදයට සහභාගීවේ.

7. "මහණෙනි, මේ (දානය) (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) (මෙහි 1 (i) යෙදිය යුතුයි.)

8. "තවද මහණෙනි, ආය්‍යීශ්‍රාවකතෙම අදත්තා දානය (හොරකම) හැර අදත්තා දානයෙන් වෙන්වූයේ වෙයි. මහණෙනි, මේ අදත්තා දානයෙන් වෙන්වූ (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) මේ දෙවැනි දානයයි. මහාදානයයි (මෙහි 5 (ii) යෙදිය යුතුයි,) (මෙහි 1 (i) යෙදිය යුතුයි) පස්වැනි ධර්මයයි.

9. "තවද මහණෙනි, ආය්‍යී ශ්‍රාවක තෙම කාමයෙහි වරදවා හැසිරීම හැර කාමයෙහි වරදවා හැසිරීමෙන් තොර වූයේ වෙයි. මහණෙනි, කාමයෙහි වරදවා හැසිරීමෙන් වෙන්වූ (මෙහි 6 (ii)

යෙදිය යුතුයි.) මේ තුන්වෙනි දානයයි, මහා දානයයි, (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) (මෙහි 1 (i) යෙදිය යුතුයි.) ස වැනි ධර්මයයි.

10. "තවද මහණෙනි, ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම බොරුකීම හැර බොරු කීමෙන් තොරවූයේ වෙයි. මහණෙනි, බොරු කීමෙන් වෙන්වූ (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) මේ හතරවැනි දානයයි, මහා දානයයි, (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) (මෙහි 1 (i) ඡෙදය යෙදිය යුතුයි.) සත්වැනි ධර්මයයි

11. "තවද මහණෙනි, ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම ප්‍රමාදයට හේතුවූ රහමෙර (මත්පැන්) පානය හැර රහමෙර මත්පැන් පානයෙන් තොරවූයේ වෙයි. මහණෙනි, රහමෙර මත්පැන් පානයෙන් තොරවූ (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) පස්වැනි දානයයි මහාදානයයි. මෙහි 5 (ii) යෙදිය යුතුයි.) (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) අටවැනි ධර්මයයි.

12. (මේ ඡෙදය 1 ඡෙදය මෙනි.)

**40. අප්පායුකසංවත්තනික සූත්‍රයː-** 1. "මහණෙනි, ප්‍රාණඝාතයතෙම (ii) භාත්පසින් සෙවුනා ලද්දේ-(පුරුදු කරණ ලද්දේ) වර්ධනය කරණ ලද්දේ, බොහෝකොට වර්ධනය කරණ ලද්දේ, නිරයෙහි ඉපැත්මට හේතු වෙයි. තිරිසන් යෝනියෙහි ඉපැත්මට හේතුවෙයි. ප්‍රේතලෝකයෙහි ඉපැත්මට හේතුවෙයි.

2. "ප්‍රාණඝාතය පිළිබඳවූ යම් කිසි ස්වල්පවූ කර්ම විපාකයවූයේ මිනිස් ලොව උපන්නහුගේ ස්වල්ප ආයුෂය පිණිස පැවැත්ම වෙයි.

3. "මහණෙනි, අදත්තාදානය (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) අදත්තාදානය (හොරකම) පිළිබඳවූ යම්කිසි ස්වල්පවූ කර්මවිපාකයවූයේ මිනිස්ලොව උපන්නහුගේ වස්තු හානිය පිණිස පැවැත්ම වෙයි, (මෙහි 1 (ii) යෙදිය යුතුයි.)

4. "මහණෙනි, කාමයෙහි වරදවා හැසිරීම (මෙහි 1 (ii) යෙදිය යුතුයි) කාමයෙහි වරදවා හැසිරීම පිළිබඳවූ යම්කිසි ස්වල්පවූ කර්මවිපාකයවූයේ මිනිස් ලොව උපන්නාහුගේ සතුරන් වැඩීමට හේතුවෙයි.

5. "මහණෙනි, බොරුකීම (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) බොරුකීම පිළිබඳවූ යම්කිසි ස්වල්පවූ කර්මවිපාකය වූයේ මිනිස් ලොව උපන්නහු අභූත චෝදනාවලට භාජනවෙයි. අනුන්කළ වරද ඔහු පිට පැවරේ.

6. "මහණෙනි, කේලාම්කීම (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) කේලාම් කීම පිළිබඳවූ යම්කිසි ස්වල්පවූ කර්මවිපාකය වූයේ මිනිස් ලොව උපන්නහුගේ (නිකරුණේ) මිත්‍ර භෙදයට හේතු වෙයි.

7. "මහණෙනි, පරුෂ වචනය (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) පරුෂ වචනය පිළිබඳවූ යම්කිසි ස්වල්පවූ කර්ම විපාකය වූයේ මිනිස් ලොව උපන්නහුට කර්ණකටුකවූ අමනාප ශබ්ද ගිය ගිය තන්හි අසන්නට හේතුවෙයි.

8. "මහණෙනි, නිෂ්ඵල වචනය (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) නිෂ්ඵල වචනය පිළිබඳ යම්කිසි ස්වල්පවූ කර්මවිපාකය වූයේ මිනිස් ලොව උපන්නහුගේ වචනය අන්‍යයෝ නොපිළිගනිත්.

9. "මහණෙනි, රහමෙර පානය (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) රහමෙර පානය පිළිබඳ යම්කිසි ස්වල්පවූ කර්මවිපාකය වූයේ මිනිස් ලොව උපන්නාහු උමතුවීමට හේතු වෙයි. කෙළතොල්ලෙක් හෝ වෙයි.

---

## 5 උපොසථ වර්ගය.

41. **පඨම අට්ඨංගුපොසථ සූත්‍රය**:- 1 (මේ ඡේදය මේ නිපාතයේ 1 වර්ගයේ 1 සූත්‍රයේ 1 ඡේදය මෙනි)

2 (i) "මහණෙනි, අංග අටකින් යුත් පෙහෙවස සමාදන් වූයේ මහත්ඵලය, මහානිශංසය, මහත් ආලොක ඇත්තේය. මහත් පැතිරීම් ඇත්තේය. (ii) මහණෙනි, මෙහිදී ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ මෙසේ සලකා බලයි.

3 "ජීවිතාන්තය තෙක් රහතුන් වහන්සේ සතුන් නැසීම හැර දමා සතුන් මැරීමෙන් වෙන්වී බහා තැබූ දඬු ඇතිව, බහා තැබූ ආයුධ ඇතිව, ලජ්ජා ඇතිව, දයාවට පැමිණ, සියලු

ප්‍රාණභූතයන්ට හිත අනුකම්පා ඇතිව වසත්. ‘මමත් අද මේ රැය මේ දවස සතුන් මැරීම හැර දමා සතුන් මැරීමෙන් වෙන්ව බහා තැබූ දඬු ඇතිව, බහා තැබූ ආයුධ ඇතිව ලජ්ජා ඇත්තේ දයාවට පැමිණියේ සියලු ප්‍රාණභූතයන්ට හිත අනුකම්පා ඇත්තේ වසමි.

(ii) මේ අංගයෙනුත් රහතුන් වහන්සේ අනුකරණය කරමි. මා විසින් පෙහෙවස් සමාදන්ව විසුයේද වන්නේයයි (iii) මේ පළමුවන අංගයෙන් යුක්තවූයේ වෙයි.

4 “ජීවිතාන්තය තෙක් රහතුන් වහන්සේ අනුන් දෙය ගැනීමෙන් තොරව, දුන්දෙය ගන්නේ දුන්දෙය බලාපොරොත්තු වන්නේ ඉක්බිති මේ පිරිසිදුවූ ආත්මයෙන් වෙසෙත්ද

‘මමත් අද මේ රැය මේ දවස නුදුන් දෙය ගැන්ම හැර දමා නුදුන් දෙය ගැන්මෙන් වෙන්වූයේ දුන්දෙය ගන්නේ දුන් දෙය බලාපොරොත්තු වන්නේ ඉක්බිති මේ පිරිසිදුවූ ආත්මයෙන් වසමි. (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) මේ දෙවන අංගයෙන් යුක්තවූයේ වෙයි.

5 “ජීවිතාන්තය තෙක් රහතුන්වහන්සේ කාමසේවනය (බ්‍රහ්මයා මෙන් නොහැසිරීම) හැරදමා බඹසර රකින්නේ (කාම සේවනය නොකරන්නේ) දුරුව හැසිරෙන්නේ දෙදෙනකුගේ හැසිරීමවූ ගමුන්ගේ ක්‍රියාවෙහි නොඇලුණේද ‘මමත් අද මේ රැය මේ දවාල කාම සේවනය හැර කාම සේවනයෙන් තොර බඹසර රකින්නේ දුරුව හැසිරෙන්නේ දෙදෙනකුගේ හැසිරීමවූ ගමුන්ගේ ක්‍රියාවෙහි නොඇලුණේවෙමි (මෙහි 3 (ii) ඡේදය යෙදිය යුතුයි.) මේ තුන්වන අංගයෙන්ද යුක්තවූයේ වෙයි.

6 “ජීවිතාන්තය දක්වා රහතුන් වහන්සේ බොරුකීම හැරදමා, බොරු කීමෙන් වෙන්වූයේ ඇත්ත කියන්නේ ඇත්තට බැඳී ඇත්තේ ඇදහිය යුතු වූයේ විශ්වාස කළ හැකි වූයේ ලෝකයාට නොගැලපෙන කියුම් නැත්තේ වෙත්. මමද බොරුකීම හැරදමා බොරුකීමෙන් වෙන්ව සත්‍යය කියන්නේ සත්‍යය බලාපොරොත්තු වන්නේ ඉක්බිති මේ ආත්මයෙන් වසමි. (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) (ii) මා විසින් පෙහෙවස්ද සමාදන්

වූයේ වන්නේයයි (iii) මේ සතරවන අංගයෙන් යුක්තවූයේ වෙයි.

7 "ජීවිතාන්තය තෙක් රහතුන් වහන්සේ රා මෙර මත් ද්‍රව්‍යයන්හි පමාව සිටීම හැර රා මෙර මත් ද්‍රව්‍යවල ප්‍රමාදව සිටිමෙන් වෙන්වේද, මමත් අද මේ රැය මේ දාවල රා මෙර පානය හැරදමා රා මෙර පානයෙන් වෙන්ව ඉක්බිති මේ ආත්මයෙන් වසමි. (මෙහි 3 (ii) සහ 6 (ii) යෙදිය යුතුයි.) මේ පස්වන අංගයෙන්ද යුක්තවූයේ වෙයි.

8 "ජීවිතාන්තය තෙක් රහතුන් වහන්සේ එකම බතක් වළඳන්නේ විකාල (නොකල) කෑමෙන් රෑ වෙන්වූයේ නොඇලුණේ වෙත්. මමද මේ රැය මේ දවාල විකාල භෝජනයෙන් වැලකෙන්නේ විකාල භෝජනයෙන් වෙන්ව ඉක්බිති මේ පිරිසිදු ආත්මයෙන් වසමි (මෙහි 3 (ii) සහ 6 (ii) යෙදිය යුතුයි.) මේ හයවන අංගයෙන්ද යුක්තවූයේ වෙයි.

9 "ජීවිතාන්තය තෙක් රහතුන් වහන්සේ නැටීම් ගී කීම්, බෙර ගැසීම් උසුළු විසුළු බැලීම් මල්දම් සුවඳ විලවුන් දැරීම්, පැළඳීම්, සැරසීම යන කරුණු වලින් වැලකුණේ වෙයි. මමද අද මේ රැය මේ දවස නැටීම් ගී කීම් බෙරගැසීම් උසුළු විසුළු බැලීම් මල්දම් සුවඳ විලවුන් දැරීම, පැළඳීම සැරසීම යන කරුණු වලින් වැළකුණේ නැටීම් ගී කීම් බෙර ගැසීම් උසුළු විසුළු බැලීම් මල්දම් සුවඳ විලවුන් දැරීම, පැළඳීම, සැරසීම යන කරුණු වලින් වෙන්ව ඉක්බිති මේ ආත්මයෙන් වසමි. (මෙහි 3 (ii) සහ 6 (ii) යෙදිය යුතුයි.) මේ සත්වන අංගයෙන් යුක්තවූයේ වෙයි.

10 "ජීවිතාන්තය තෙක් රහතුන් වහන්සේ උස් අසුන් මහ අසුන් හැර උස් අසුන් මහ අසුන්වලින් වෙන්ව මැස්සක හෝ තණ ඇතිරියක හෝ පැදුරෙහි නිදීම කරන්නේ වේද 'මමද මේ රැය මේ දවාල උස් අසුන් මහ අසුන් හැර උස් අසුන් මහ අසුන් වලින් වෙන්ව වැලකෙන්නේ උස් අසුන් මහ අසුන් හැර උස් අසුන් මහ අසුන් වලින් වෙන්ව ඉක්බිති මේ ආත්මයෙන් වසමි. (මෙහි 3 (ii) සහ 6 (ii) යෙදිය යුතුයි.) මේ අටවැනි අංගයෙන්ද යුක්ත වූයේ වෙයි (මෙහි 2 (i) යෙදිය යුතුයි.)

**42. දුතිය අට්ඨංගුපොසථ සූත්‍රය:-** 1 (මෙහි මේ වර්ගයේ 41 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.) (ii) අංග අටකින් යුත් පෙහෙවස් කෙසේ සමාදන් වූයේ මහත්ඵලද මහත් ආනිශංසද මහත් ආලොක ඇත්තේද, මහත් පැතිරීම් ඇත්තේද?

2 "මහණෙනි, මෙහි ආර්‍යශ්‍රාවකතෙමේ මෙසේ සලකයි.

3-10. (මේ ඡේද මේ වර්ගයේ 41 සූත්‍රයේ 3-10 ඡේදමෙන් වෙත්.)

11 "මහණෙනි, මෙසේ අංග අටකින් යුත් පෙහෙවස් සමාදන් වූයේ මහත් ඵලය, මහත් ආනිශංසය, මහත් ආලොක ඇත්තේය. මහත් පැතිරීම් ඇත්තේය. මහත්ඵලය කොපමණ වේද, මහත් ආනිශංසය කොපමණ වේද, මහත් ආලොකය කොපමණ වේද, මහත් පැතිරීම් කොපමණ වේද,

12 "මහණෙනි, යම්සේ යමෙක් මේ බොහෝ සත් රුවන් ඇති සොළොස් මහා ජනපදයන්හි ඉසුරු බව අධිපති බවවූ රාජ්‍යය කරන්නේද, කෙබඳු සොළොස් මහා ජනපදයන්ගේද යත්? අංග-මගධ-කාශි-කොශල-වජ්ජී-මල්‍ල-චෙදි-වංග-කුරු-පඤ්චාල-මත්ස්‍ය-ශූරසෙන-අශ්වක-අවන්ති-ගන්ධාර-කාම්බොජ යන මොවුන්ගේය."

13 "මෙය අංග අටකින් යුත් පෙහෙවස්හි සොළොස් වන කලාවටත් නොඅගී. එයට හෙතු කවරේද? (ii) මහණෙනි, දිව්‍ය සුඛය හා සලකන කල මනුෂ්‍ය රාජ්‍යය දිළිඳුය.

14 "මහණෙනි, මිනිසුන්ගේ යම් පණස් අවුරුද්දක් වේද ඒ සිව් මහා රජයේ දෙවියන්ට මේ එක් රෑ දවාලකි. ඒ රැයින් තිස් රැයක් මාසයයි, ඒ මාසයෙන් දොළොස් මසක් අවුරුද්දය. ඒ අවුරුද්දෙන් දිව්‍ය වර්ෂ පන්සියයක් සිවු මහ රජයේ දෙවියන්ට ආයුෂ ප්‍රමාණයයි.

15 "මහණෙනි, මෙහි ඇතැම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ අංග අටකින් යුත් යම් පෙහෙවසක් සමාදන්ව වැස කය බිඳී මරණින් මතු (ii) සතර මහා රජයේ දෙවියන් හා සම භාවයට පැමිණෙයි යන මේ කරුණු විද්‍යමාන වේ.

16 (මෙහි 13 (ii) යෙදිය යුතුයි.) මේ සඳහා කියන ලදි. මහණෙනි, මිනිසුන්ගේ යම් වර්ෂ සියයක් තව්තිසාවේ දෙවියනට මේ එක රෑ දාවලක්වේද, ඒ රැයින් රෑ තිහක් මාසයෙකි. ඒ මාසයෙන් දොළොස්මසක් අවුරුද්දෙකි. ඒ අවුරුද්දෙන් දිව්‍ය වර්ෂ දහසක් තව්තිසාවේ දෙවියන්ගේ ආයුෂ ප්‍රමාණයයි. (මෙහි 1 (i) යෙදිය යුතුයි.) තව්තිසාදෙවියන් හා සමානත්වයට පැමිණෙයි යන මේ කරුණ විද්‍යමාන වේ.

17. "මහණෙනි, මිනිසුන්ගේ යම් අවුරුදු දෙසියයක් යාම දෙවියන්ට මේ එක් රෑ දාවලක් වේද, ඒ රැයින් තිස් රැයක් මාසයෙකි. ඒ මසින් දොළොස් මසක් අවුරුද්දෙකි. ඒ අවුරුද්දෙන් දිව්‍ය වර්ෂ දෙදහසක් යාම දෙවියන්ගේ ආයුෂ ප්‍රමාණයයි (මෙහි 1 (i) යෙදිය යුතුයි.) යාම දෙවියන් හා සමානත්වයට පැමිණෙයි යන මේ කරුණ විද්‍යමානවේ.

18 "මහණෙනි, මිනිසුන්ගේ යම් අවුරුදු හාරසියයක් වේද, තුෂිත දෙවියන්ට මේ එක් රෑ දාවලකි. ඒ රැයින් තිස් රැයක් මාසයෙකි. ඒ මසින් දොළොස් මසක් අවුරුද්දකි. ඒ අවුරුද්දෙන් දිව්‍ය වර්ෂ හාර දහසක් තුෂිත දෙවියන්ගේ ආයුෂ ප්‍රමාණයයි. (මෙහි 1 (i) යෙදිය යුතුයි.) තුෂිත දෙවියන් හා සමානත්වයට පැමිණෙයි යන මේ කරුණ විද්‍යමාන වේ.

19 "මහණෙනි, මිනිසුන්ගේ යම් අවුරුදු අටසියයක් වේද, නිර්මාණ රතී දෙවියන්ට මේ එක් රෑ දාවලෙකි. ඒ රැයින් තිස් රැයක් මාසයෙකි. ඒ මාසයෙන් දොළොස් මසක් අවුරුද්දෙකි. ඒ අවුරුද්දෙන් දිව්‍ය වර්ෂ අටදහසක් නිර්මාණ රතී දෙවියන්ට ආයුෂ ප්‍රමාණයයි. (මෙහි 1 (i) යෙදිය යුතුයි.) නිර්මාණ රතී දෙවියන් හා සමානත්වයට පැමිණෙයි යන මේ කරුණ විද්‍යමාන වේ.

20 "මහණෙනි, මිනිසුන්ගේ යම් අවුරුදු දහසය දහසක් වේද, පරනිර්මිත වසවර්ති දෙවියන්ට මේ එක් රෑ දාවලකි. ඒ රැයින් තිස් රැයක් මාසයෙකි. ඒ මසින් දොළොස් මසක් අවුරුද්දෙකි. ඒ අවුරුද්දෙන් වර්ෂ දහසය දහසක් පරනිර්මිත වසවර්ති දෙවියන්ට ආයුෂ ප්‍රමාණයයි. (මෙහි 1 (i) යෙදිය යුතුයි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

පරනිර්මිත වසවර්ති දෙවියන් හා සමානත්වයට පැමිණෙයි යන මේ කරුණ විද්‍යමාන වේ.

21 (1) "පණ නොනසව. අනුන් දෙය නොගනුව බොරු නොකියව. මත්පැන් බොන්නෙක් නොවව. දෙදෙනකුගේ හැසිරීමවූ අබ්‍රහ්මචර්යාවෙන් වෙන් වෙන්න. රෑය නොකල්හි කෑම නොකව.

2 "මල්දම් නොදරව. සුවඳ නොගනුව. පොළොවේ මෙන් මැස්සෙහිද තණ ඇතිරියේද නිදව. මෙය දුක් කෙළවරට ගිය බුදුන් පැවසූ අංග අටින් යුත් පෙහෙවස යයි කියත්.

3 "ඉරද සඳද දෙදෙනා මනාව පෙනෙමින් එළිය පතුරුවත්ද, අහසේ හැසිරෙන අඳුරු දුරලන දිගුන් බබුළුවන ඔවුහු වනාහි අහසේ දිලිසෙත්.

4 "මේ අතර මුතුය, මැණික්ය, උසස් වෛදූර්යය, රත්රන්ද, එසේම රන්ද, යමක් ජාත රූපය හටකය කියාද එයද සියලු චන්ද්‍ර ප්‍රභාවද ඒ තාරකා සමූහයද අංග අටින් යුත් පෙහෙවීමට දහසයින් අඩකුත් සමාන නොවේ.

5 "එබැවින් ස්ත්‍රීහුද පුරුෂයෝද සිල්වත් වූවාහු අංග අටින් යුත් පෙහෙවීම සමාදන්ව වසත්වා. සැප විපාක ඇති පින් කර නින්දාවට නොගියාහු ස්වර්ග භූමියට එළඹෙත්."

43 **විසාඛුපොසථ සූත්‍රයː-** 1 "එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර මිගාරමාතාව විසින් කරවන ලද පූර්වාරාමයෙහිවූ ප්‍රාසාදයෙහි වාසය කරයි. ඉක්බිති වනාහි මිගාර මාතාව නම්වූ විශාඛාව භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියාය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක හුන්නාය. එකත් පසෙක හුන් මිගාර මාතා නම්වූ විශාඛාවට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

2 "විශාඛාවෙනි, (ii) අංගඅටකින් යුත් පෙහෙවස සමාදන් වූයේ මහත්ඵල වේ. මහත් ආනිශංස වේ. මහත් ආලොක ඇත්තේ වේ. මහත් පැතිරීම් ඇත්තේ වේ.

3 "විශාඛාවෙනි, මෙහි ආර්‍ය්‍ය ශ්‍රාවක තෙමේ මෙසේ සලකයි ජීවිතාන්තය තෙක් රහතුන් වහන්සේ (මෙහි මේ වර්ගයේ 1 වන සූත්‍රයේ 3-10 ඡේද යොදා ගත යුතුයි.)

4. (මේ ඡේදය 2 ඡේදය මෙනි.)

5 "කොපමණ මහත් ඵලවේද, කොපමණ මහත් ආනිශංස වේද, කොපමණ මහත් ආලොක වේද? කොපමණ මහත් පැතිරීම් වේද? 6-15 (මේ ඡේද මේවර්ගයේ 42 සූත්‍රයේ 12-21 ඡේද මෙන් වෙත්.)

**44. වාසෙට්ඨුපොසථ සූත්‍රයః-** 1. 'එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ විශාලා නුවර මහා වනයේ කූටාගාර ශාලාවෙහි වෙසෙන සේක. ඉක්බිත්තෙන් වනාහි වාසෙට්ඨ උපාසකතුමා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් වාසෙට්ඨ උපාසකතුමාට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

2. "වාසෙට්ඨය, (මෙහි 43 සූත්‍රයේ 2 (i) ඡේදය යෙදිය යුතුයි.) නින්දා නොකරනලද්දාහු දෙව් ලොවට යත්." මෙසේ වදාළ කල්හි වාසෙට්ඨ උපාසකතෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය.

3. "ස්වාමීනි, මට නෑයෝ සහලේ නෑයෝ ප්‍රියයෝ වෙත්. (ii) අංග අටින් යුත් පෙහෙවස් සමාදන් වන්නේ නම් (iii) මට ප්‍රියවූ නෑ සහලේ නෑයන්ට (iv) දීර්ඝ කාලයක් හිත පිණිස සැප පිණිස වන්නේය. 4. "ස්වාමීනි, සියලුම ක්ෂත්‍රිහු (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) අංග අටින් යුත් පෙහෙවස් සමාදන් වන්නාහු නම් සියලුම ක්ෂත්‍රියයනට (මෙහි 3 (iv) යෙදිය යුතුයි.) 5. "ස්වාමීනි, සියලුම බමුණෝ (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) සියලුම බමුණන්ට (මෙහි 3 (iv) යෙදිය යුතුයි.) 6. "ස්වාමීනි, සියලුම වෙළෙන්දෝ (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) සියලුම වෙළෙඳුන්ට (මෙහි 3 (iv) යෙදිය යුතුයි.) 7. "ස්වාමීනි, සියලුම ගොවිහු, (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) සියලුම ගොවියන්ට (මෙහි 3 (iv) යෙදිය යුතුයි.) 8. "වාසෙට්ඨය, මෙය මෙසේය. වාසෙට්ඨය,

මෙය මෙසේය. වාසෙට්ඨය, (මෙහි 4-7 ඡේද යෙදිය යුතුයි.) "ස්වාමීනි" වෙනුවට "වාසෙට්ඨය" යෙදිය යුතුයි.)

9. "වාසෙට්ඨය, මරුන් සහිත බඹුන් සහිත මහණ බමුණන් සහිත දෙව් මිනිසුන් සහිත ප්‍රජාව වූ ලොකය අංග අටින් යුත් පෙහෙවස් සමාදන් වන්නේ නම් මරුන් සහිත බඹුන් සහිත මහණ බමුණන් සහිත දෙව් මිනිසුන් සහිත ප්‍රජාව වූ ලොකයාට දීර්ඝ කාලයක් හිත පිණිස සුව පිණිස වන්නේය. වාසෙට්ඨය, මේ මහා ශාලයෝත් අංග අටින් යුත් පෙහෙවස සමාදන්වන්නාහු නම් ඉදින් සිතන්නාහු නමුදු, හිත පිණිස සැප පිණිස වන්නේය. මනුෂ්‍යවූවකුට කවර කථාද?"

**45. බොජ්ඣුපොසථ සූත්‍රයඃ-** 1. "එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනාථ පිණ්ඩික සිටාණන් විසින් කරවන ලද ජෙතවනාරාමයෙහි වසනසේක. ඉක්බිත්තෙන් වනාහි බොජ්ඣා උපාසිකාව භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියාය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නාය. එකත්පසෙක හුන් බොජ්ඣා උපාසිකාවට මෙය වදාළසේක.

2. "බොජ්ඣාවෙනි, අංග අටකින් යුත් පෙහෙවස් සමාදන් වූයේ මහත් ඵල වේ. මහත් ආනිශංස වේ. මහත් ආලොක ඇත්තේ වේ. මහත් පැතිරීම් ඇත්තේ වේ. බොජ්ඣාව, මෙහි ආර්ය ශ්‍රාවකතෙමේ මෙසේ සලකයි.

3-10 (මේ ඡේද මේ වර්ගයේ 41 සූත්‍රයේ 3-10 ඡේද මෙන් වෙත්.)

11. "බොජ්ඣාව, (මෙහි මේ වර්ගයේ 42 සූත්‍රයේ 1 (i) යෙදිය යුතුයි.)

12-21 (මේ ඡේද මේ වර්ගයේ 41 සූත්‍රයේ 12-21 ඡේදමෙන් වෙත්. 'මහණෙනි' වෙනුවට 'බොජ්ඣාව' කියා යෙදිය යුතුයි.)

**46. අනුරුද්ධමනාප කායික සූත්‍රයඃ-** 1. එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ කොසඹෑ නුවර ඝොෂිත නම් ආරාමයේ වැඩ වසනසේක. එසමයෙහි ආයුෂ්මත් අනුරුද්ධයන් වහන්සේ දිවාවිහරණයට ගියේ, විවෙක සහිත වූයේ වෙයි.

2. ඉක්බිත්තෙන් වනාහි බොහෝ (නිර්මාණ රතී) මනාප කායික නම් දෙවතාවෝ ආයුෂ්මත් අනුරුද්ධයන් වහන්සේ කරා පැමුණුනාහ. පැමිණ, ආයුෂ්මත් අනුරුද්ධයන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියහ. එකත්පසෙක සිටි ඒ දෙවගනෝ ආයුෂ්මත් අනුරුද්ධයන් වහන්සේට මෙය කීහ.

3. "ස්වාමීනි, අපි මනාපකායික නම් දෙවතාවෝ වෙමු. තුන් කරුණක (අධිපතිකම) ඓශ්වර්යය කරමු. වසඟය පවත්වමු.

ස්වාමීනි, අනුරුද්ධ, අපි යම්බඳු පාටක් කැමැත්තමුද එබඳු වර්ණයක් ස්ථාන වශයෙන් ලබමු. යම් බඳු ස්වරයක් කැමැත්තමුද එබඳු ස්වරයක් ස්ථාන වශයෙන් ලබමු. යම් බඳු සැපයක් කැමැති වමුද එබඳු සැපයක් ස්ථාන වශයෙන් ලබමු. ස්වාමීනි, අනුරුද්ධ, අපි මනාපකායිකා නම් දෙවතාවෝ වෙමු. මේ තුන් කරුණෙහි අධිපතිභාවය කරමු, වසඟය පවත්වමු."

4. "ඉක්බිති වනාහි ආයුෂ්මත් අනුරුද්ධයන් වහන්සේට මෙය සිතුණේය.

(ii) "අනේ ඇත්තෙන් මේ සියලු දෙවතාවෝ නිල් වෙත්වා, නිල්වන් වෙත්වා, නිල් ඇඳුම්, නිල් පළඳනා ඇත්තෝ වෙත්වා." (iii) ඉක්බිත්තෙන් වනාහි ඒ දෙවතාවෝ ආයුෂ්මත් අනුරුද්ධයන්ගේ සිත දැන සියල්ලෝම නිල් වූහ. නිල්වන් වූහ. නිල් ඇඳුම්, නිල් පළඳනා ඇත්තෝ වූහ.

5. (මෙහි 4 ඡේදය යෙදිය යුතුයි. "නිල්" වෙනුවට "රන්වන්" යෙදිය යුතුයි.)

6. (මෙහි 4 ඡේදය යෙදිය යුතුයි. "නිල්" වෙනුවට "ලේවන්" යෙදිය යුතුයි.)

7. (මෙහි 4 ඡේදය යෙදිය යුතුයි. "නිල්" වෙනුවට "සුදු පාට" යෙදිය යුතුයි.)

8. "ඉක්බිත්තෙන් වනාහි ඒ සමහර දෙවතා කෙනෙක් ගී කීහ. සමහර කෙනෙක් නැටූහ. සමහර කෙනෙක් අසුරු ගැසූහ. දක්ෂයන් විසින් මනාව වාදනය කළ සුවිනීත, මනාව පිළියෙළ

වූ තූර්යයාගේ ශබ්දය, සුන්දර, රම්‍ය, කමනීය, ප්‍රෙමනීය, මදනීය වේද ඒ දෙවතාවන්ගේ ශබ්දයද එසේම විය. ඉක්බිති වනාහි අනුරුද්ධයන් වහන්සේ ඉන්ද්‍රියයන් යට හෙළූ සේක. ඉක්බිති වනාහි ඒ දෙවතාවෝ ආර්ය අනුරුද්ධයන් වහන්සේ ආශ්වාද නො කෙරේ යයි එහිම අතුරුදහන් වූහ.

9. ඉක්බිත්තෙන් වනාහි ආයුෂ්මත් අනුරුද්ධයන් වහන්සේ සවස විවේකයෙන් නැගිටිසේක් භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියහ. පැමිණ භාග්‍යවතුන්වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ආයුෂ්මත් අනුරුද්ධයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ.

10. "ස්වාමීනි, මම මෙහි දිවා විහාරයට ගියේ, විවෙක සහිත වූයේ වෙමි. ඉක්බිති ස්වාමීනි, බොහෝ මනාප කායික දෙවතාවෝ මා කරා පැමුණුණෝය. පැමිණ මා වැඳ එකත් පසෙක සිටියහ. එකත්පසෙක සිටි ඒ දෙවතාවෝ මට මෙය කීහ.

11-16 (මේ ඡෙද මේ සූත්‍රයේ 3-8 ඡෙද මෙන් වෙත්. "ආයුෂ්මත් අනුරුද්ධයන්" වෙනුවට "මා" යෙදිය යුතුයි.)

ස්වාමීනි, ඉක්බිති ඒ සියලු දෙවතාවෝ මගේ සිත දැන නිල් වූහ. නිල්වන් වූහ. (මෙහි 4 (iii) ඡෙදය යෙදිය යුතුයි.) මේ සූත්‍රයේ මුල් කොටස මෙනි.

ස්වාමීනි, කොපමණ කරුණුවලින් යුත් ස්ත්‍රිය කය බිඳී මරණින් පසු මනාපකායික නම් දෙවතාවන් හා සම භාවයට යන්නීද?"

17 "අනුරුද්ධ, (ii) කරුණු අටකින් යුත් ස්ත්‍රිය කය බිඳී මරණින් පසු මනාපකායික නම් දෙවතාවන් හා සම භාවයට යන්නීය. (iii) කවර අටකින් ද යත් අනුරුද්ධය (iv) මෙහි ස්ත්‍රිය, වැඩ කැමැති හිතෛෂී, අනුකම්පාවත් මව්පියවරු අනුකම්පා උපදවා යම් පුරුෂයකුට දෙත්ද, ඒ ස්වාමියාට පළමුව නැගිටින්නී, පසුව නිදන්නී, කීකරුව ඇහුම් කන් දෙන්නී, හිත කැමැත්තට අනුව හැසිරෙන්නී, පිය බස් කථා කියන්නී වේද, ස්වාමියාට මවුය, පියාය, මහණය, බමුණු යයි යම් ඒ ගුරු කෙනෙක් වෙත්ද,

ඔවුනට සත්කාර කෙරේද, ගරු කෙරේද, බුහුමන් කෙරේද, පුදාද, පැමිණි කල්හි අසුන්වලින් ජලයෙන් සලකාද, ස්වාමියාගේ ලොම් වැඩය කපුවැඩයයි යම් ඒ ඇතුළත කර්මාන්ත කොටසක් වේද, එහි දක්ෂ වන්නීද, අලස නැත්තී වේද, එහි වෙහෙස ගන්නී වේද, විමසීමෙන් යුක්ත වූවා කාර්යයට සුදුසු වේද, සංවිධානයට සුදුසු වේද, ස්වාමියාට දාස යයි හෝ දූත යයි හෝ කම්කරු යයි හෝ යම් ඒ අභ්‍යන්තර වූවෙක් ඇතුළත ජනයෙක් වේද, ඔවුන් විසින් කරන ලද්ද කරන ලද්ද වශයෙන් දනීද, නොකරන ලද්ද නොකරන ලද්ද වශයෙන් දනීද, ලෙඩ වූවන්ගේ බැරි පිළිවන් කම් දනීද, ඔවුන්ට කෑ යුත්ත බිදිය යුත්ත කොටස් කොට දේද, ස්වාමියා යම් ධනයක්, ධාන්‍යයක්, රිදියක්, රනක් යන ඒ ද, එය රැක්මෙන් සැඟවීමෙන් සම්පාදනය කරයිද, එහිද සෙර නොවන්නී, සල්ලාල නොවන්නී, සොඬ නොවන්නී, නොනසන්නී වේද, බුදුන් සරණ ගිය උපාසිකාවක් වේද, දහම් සරණ ගිය උපාසිකාවක් වේද, සඟ සරණ ගිය උපාසිකාවක් වේද, සතුන් මැරීමෙන් වෙන්ව, නුදුන් දෙය ගැන්මෙන් වෙන්ව, අනාචාරයෙන් වෙන්ව, බොරු කීමෙන් වෙන්ව, මදයට හා ප්‍රමාදයට හේතුවන රාමෙර (මත්පැන්) බීමෙන් වෙන්ව, සිල් වතියක් වේද, පහවූ මසුරු මලින් යුත් සිතෙන් මිදූ ත්‍යාග ඇත්තී, පිරිසිදු අත් ඇත්තී, පරිත්‍යාගයෙහි ඇලුණී, ඉල්ලීමට සුදුසු වූවා, දාන සංවිභාගයෙහි ඇලුණී, ගිහි ගෙය වෙසේද,

18. "අනුරුද්ධය, මේ අංග අටින් යුක්ත ස්ත්‍රිය කය බිඳී මරණින් පසු මනාපකායිකා නම් දෙවියන් හා සම බවට පැමිණ උපදී.

19. (1) "යමෙක් නිතර සැමදාම තැවෙන්නේ, උත්සුක වන්නේ ඇය පොෂණය කරයිද, සියලු කැමැති දෙය හැරගෙන එන, පොෂණය කරන ඒ පුරුෂයා ඉක්ම නොසිටින්නීද,

(2) "යහපත් ස්ත්‍රිය ස්වාමියාට හිතුවක්කාර වචනයෙන් කොප නොකරන්නීද, ස්වාමියාට ගුරුවූ සියල්ලන් නුවණැත්තීව පුදන්නීද,

(3) "නැගී සිටින්නී, අලස නැත්තී, සංග්‍රහ කරන ලද පිරිවර ජනයා ඇත්තී. ස්වාමියා සතුටු කරන්නී, හැසිරේද, උපයන ලද්ද රකීද,

(4) "ස්වාමියාගේ කැමැත්තට වසඟවන, යම් ස්ත්‍රියක් මෙසේ පවතීද ඕතොමෝ යම් තැනෙක මනාපකායිකා දෙවතාවෝ (නිර්මාන රතී) වෙත්ද එහි උපදී."

47. **විසාඛාමනාපකායික සූත්‍රය:-** 1. (මේ ඡේදය මේ වර්ගයේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. "විශාඛාවෙනි, (46 සූත්‍රයේ 17 (ii) ඡේදය යෙදිය යුතුයි.)

3. "කවර කරුණු අටකින්දයත්? විශාඛාවෙනි, (46 සූත්‍රයේ 17 (iv) ඡේදය යෙදිය යුතුයි.) විශාඛාවෙනි මේ කරුණු අටෙන් යුක්තවූ ස්ත්‍රීතොමෝ ශරීරයාගේ, බිඳීමෙන් මරණින් මතු මනාප කායික නම් දෙවියන් හා එක්ව උපදියි.

4. (1) "යම් පුරුෂයෙක්තෙම සියලු කල්හි නිතර තැවීම් ඇත්තේ උත්සාහවත්ව ස්ත්‍රියක් පොෂ්‍යය කෙරේද ඕතොමෝ සියලු කැමති දෙය දෙන්නාවූ ස්වාමි වූ ඒ පුරුෂයා ඉක්මවා නො සිතන්නීය.

(2) "යහපත් ස්ත්‍රී තොමෝ ස්වාමිපුරුෂයා කැමැත්තෙන් හැසිරීම හේතුකොට ගෙන කෝපද නො කරන්නීය. ස්වාමියාගේද මවුපියාද පිදියයුතු සියල්ලන්ට නුවණැති ස්ත්‍රීතොමෝ පුදන්නීය.

(3) "නැගීසිටි වීය්‍ය ඇති අලස නුවූ සංග්‍රහකරණ ලද පිරිවර ජනයා ඇති ස්ත්‍රී තොමෝ ස්වාමියාගේ සිත සතුටු කරවන්නී හැසිරෙන්නීය. ස්වාමීහු විසින් උපයන ලද දෙය රක්ෂාකරන්නීය.

(4) "ස්වාමියාගේ කැමැත්ත අනුව ගියාවූ යම් ස්ත්‍රියක් තොමෝ මෙසේ පවතින්නීද, ඕතොමෝ මනාප නම් වූ ඒ දෙවියෝ යම් තැනකද ඒ දිව්‍යලෝකයෙහි උපදින්නීය."

48. **නකුලමාතු මනාපකායික සූත්‍රය:-** 1. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ භගුරට සුංසුමාර පර්වතය සමීපයෙහි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මෘගයන්ට අභය දුන් හෙසකලා වනයෙහි වැඩවසනසේක. එකල්හි නකුලමාතා ගෘහපතිනිය භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැන්හි පැමිණියාය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නාහ. එකත්පසෙක හුන්නාවූ නකුල මාතෘ ගෘහපතිනියට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ.

2, 3 4 (මේ ඡේද වර්ගයේ 43 සූත්‍රයේ 2, 3, 4 ඡේද මෙන් වෙත්. 'විශාඛාවෙනි' යනුවට 'නකුලමාතාවෙනි' යෙදියයුතුයි.)

**49. ඉධලොක විජය සූත්‍රයඃ-** (මේ ඡේදය මේ වර්ගයේ 43 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. "විශාඛාවෙනි, කරුණු සතරකින් යුත් ස්ත්‍රීතොමෝ මේ ලොව දිනීම පිණිස පිළිපන්නී වෙයි. මේ ලොව සතුටු වන්නී වෙයි.

3. "කවර සතරකින්දයත්, මනාකොට කරණලද කර්මාන්ත ඇත්තී වෙයි. සංග්‍රහ කරණලද සේවක ජනයා ඇත්තී, ස්වාමියාට හිතවත්ව හැසිරෙයි. ස්වාමියා ගෙන එන ලද්ද ආරක්ෂා කරයි. විශාඛාවෙනි,

4 "සත්‍රීතොමෝ කෙසේ නම් මනාකොට කරණලද කර්මාන්ත ඇත්තීවේද? විශාඛාවෙනි, මේ ලොව ස්ත්‍රීතොමෝ යම් ඒ ස්වාමියාගේ ලෝම කර්මාන්ත හෝ කපු කර්මාන්ත හෝ යන කර්මාන්තයන්හි අලස නොවන්නී දක්ෂ ඇත්තියක් වේද, ඒවායේ අභිවෘද්ධිය පිණිස විමසීමෙන් යුක්තවූවා කටයුතු කරන්නට සුදුසුවේද, පිළියෙළ කරන්නට සුදුසුවේද, විශාඛාවෙනි, මෙසේ වනාහි ස්ත්‍රීතොමෝ මනාව කරණලද කර්මාන්ත ඇත්තී වෙයි.

5. "විශාඛාවෙනි, ස්ත්‍රීතොමෝ කෙසේ නම් සංග්‍රහ කරණලද සේවක ජනයා ඇත්තීවේද, විශාඛාවෙනි, මේලොව ස්ත්‍රීතොමෝ ස්වාමියාගේ අභ්‍යන්තර සේවක ජනයා එනම් දාසයෝ හෝ පණිවුඩකරුවෝ හෝ කම්කරුවෝ හෝ වෙද්ද, ඔවුන්ට කළයුතුදෙය කළයුතුදෙය වශයෙන් දනීද, නොකළ යුතුදෙය නොකළයුතු දෙය වශයෙන් දනීද, ලෙඩ වූවන්ගේද, එලාඑල දනීද, කෑයුතු, බුදියයුතු දේ සුදුසු පරිදි බෙදාද, විශාඛාවෙනි,

මෙසේ වනාහි ස්ත්‍රීතොමෝ සංග්‍රහ කරණලද සේවක ජනයා ඇත්තී වෙයි.

6. "විශාඛාවෙනි, කෙසේ නම් ස්ත්‍රීතොමෝ ස්වාමියාට කැමති සේ හැසිරෙන්නීද, විශාඛාවෙනි, මේ ලොව ස්ත්‍රී තොමෝ දිවි යතත් ස්වාමියාට යමක් අප්‍රිය නම් එය ඉක්මවා නොහැසිරේද, විශාඛාවෙනි මෙසේ වනාහි ස්ත්‍රීතොමෝ ස්වාමියාට කැමතිසේ හැසිරෙන්නීය.

7 "විශාඛාවෙනි, කෙසේ නම් ස්ත්‍රී තොමෝ ස්වාමියා ගෙන එන දේ මනාව රකීද, විශාඛාවෙනි, මේ ලොව ස්ත්‍රී තොමෝ ස්වාමි පුරුෂයා යම් ධනයක් හෝ ධාන්‍යයක් හෝ රන් රිදී මිළ මුදල් හෝ ආරක්ෂාකොට තබාද ඒවායේද ධූර්ත නැත්තී සෙර නැත්තී ගිජු නැත්තී විනාශ නොකරන්නී වේද විශාඛාවෙනි, මෙසේ වනාහි ස්ත්‍රී තොමෝ ස්වාමියා ගෙන එන දෙය රකින්නියක් වන්නීය. (මෙහි 2 ඡේදය යෙදිය යුතුයි.)

8. (i) "විශාඛාවෙනි, කරුණු සතරකින් යුක්තවූ ස්ත්‍රී තොමෝ පරලොව ජයගැනීම පිණිස පිළිපන්නී වෙයි. (ii) පරලොව සතුටු වන්නී වෙයි. "කවර සතරකින්ද යත්, විශාඛාවෙනි, මේ ලොව ස්ත්‍රී තොමෝ ශ්‍රද්ධාව ඇත්තී වේද, ශීලය ඇත්තී වේද, ත්‍යාගය ඇත්තීවේද, ප්‍රඥාව ඇත්තීවේද, විශාඛාවෙනි, මේ ලොව ස්ත්‍රී තොමෝ ශ්‍රද්ධාව ඇත්තී (මෙහි ඡක්කනිපාතයේ ආහුණෙය්‍ය වර්ගයේ 10 සූත්‍රයේ 2 (ii) ඡේදය යෙදිය යුතුයි) විශාඛාවෙනි, මෙසේ වනාහි ස්ත්‍රී තොමෝ ශ්‍රද්ධාව ඇත්තී වෙයි.

9 "විශාඛාවෙනි, කෙසේ නම් ස්ත්‍රී තොමෝ ශීලයෙන් යුක්ත වේද, විශාඛාවෙනි, මේ ලොව ස්ත්‍රී තොමෝ (මෙහි පඤ්චක නිපාතයේ 18 වර්ගයේ 21 සූත්‍රයේ 6 ඡේදයේ "ප්‍රාණඝාතයෙන්" කී තැන සිට යොදාගත යුතුයි) විශාඛාවෙනි, මෙසේ වනාහි ස්ත්‍රී තොමෝ ශීලයෙන් යුක්තවූයේ වෙයි.

10 "විශාඛාවෙනි, කෙසේ නම් ස්ත්‍රී තොමෝ ත්‍යාග සම්පන්න වේද විශාඛාවෙනි, මේ ලොව ස්ත්‍රී තොමෝ ධනය නොසඟවන ත්‍යාග ඇත්තී දීමට සේදූ අත් ඇත්තී පරිත්‍යාග යෙහි ඇළුනී ඉල්ලීමට සුදුසුව සිටින්නී විමසා දන් දීමෙහි ඇළුනී

පහවූ මසුරු මල ඇති සිතින් ගිහිගෙයි වෙසෙන්නීද විශාඛාවෙනි, මෙසේ වනාහි ස්ත්‍රී තොමෝ ත්‍යාගය ඇත්තීවෙයි.

11 "විශාඛාවෙනි, කෙසේ නම් ස්ත්‍රී තොමෝ ප්‍රඥා ඇත්තී වේද, විශාඛාවෙනි, මේලොව ස්ත්‍රී තොමෝ දියුණුව ඇති කරවන ප්‍රඥාවෙන් යුක්තව ආයසීවූ උසස් නුවණැතිව මනාකොට දුක් කෙළවර කිරීමේ නුවණින් යුක්තවේද, විශාඛාවෙනි, මෙසේ වනාහි ස්ත්‍රී තොමෝ ප්‍රඥා ඇත්තී වෙයි.

12 (මෙහි 8 (i) යෙදිය යුතුයි.)

13 "මනාකොට කරණ ලද කර්මාන්ත ඇත්තීද සංග්‍රහ කරණ ලද පිරිවර ජනයා ඇත්තීද ස්වාමියාගේ සිත සතුටු කරමින් හැසිරෙන්නීද ස්වාමියා විසින් රැස් කරණ දෙය ආරක්ෂා කරන්නීද ශ්‍රද්ධාවෙන් හා ශීලයෙන් යුක්තවීද, යාචකයන්ගේ වචනදන්නීද, පහවූ මසුරු මල ඇත්තීද සැපවූ පරලොවට හිත වූ මාර්ගය නිතර පිරිසිදු කරන්නීද මෙසේ මේ අට කාරණයෝ යම් ස්ත්‍රියකට විද්‍යමාන වෙත්ද, කුශල ධර්මයෙහි පිහිටියාවූ සත්‍ය වචන කියන්නාවූ ඒ ස්ත්‍රීද ශීල ව්‍රතයෙන් යුක්තයයි කියත්. සොළොස් ආකාරවන අෂ්ට ගුණාංගයෙන් යුක්තවූ එබඳුවූ සිල්වත් ඒ උපාසිකා තොමෝ මනාපනම්වූ දිව්‍ය ලොකයෙහි (නිර්මාණරතී) උපදින්නීය.'

**50 පරලොක විජය සූත්‍රය**:- 1 "මහණෙනි, කරුණු සතරකින් යුක්තවූ ස්ත්‍රී තොමෝ මේ ලොව ජයගැනීම පිණිස පිළිපන්නී වෙයි.

(මෙහි මේ වර්ගයේ 49 සූත්‍රයේ 3-7 ඡෙද යෙදිය යුතුයි) "විශාඛාවෙනි" වෙනුවට "මහණෙනි" යොදාගත යුතුයි.)

"මහණෙනි, කරුණු සතරකින් යුක්තවූ ස්ත්‍රීතොමෝ පරලොව ජයගැනීම පිණිස පිළිපන්නී වෙයි.

(මෙහි මේ වර්ගයේ 49 සූත්‍රයේ 9-13 ඡෙද යෙදිය යුතුයි. "විශාඛාවෙනි" වෙනුවට "මහණෙනි" යොදාගත යුතුයි.)

**(5 උපොසථ වර්ගය නිමි)**